


Scanned with CamScanner

PERCY JACKSON AND THE OLYMPIANS
BOOK 2

# THE SEA OF MONSTERS

Rick Riordan

# පර්සි ජැක්සන්
# සහ රාක්ෂ සයුර

-පරිවර්තනය -

සවින්දි ආරියතිලක

ආශිර්වාද ප්‍රකාශනයකි

Scanned with CamScanner

# පර්සි ජැක්සන් සහ රාක්ෂ සයුර

පරිවර්තනය : සචින්දි ආරියතිලක

ISBN : 978-955-679-071-5

ප්‍රථම මුද්‍රණය - 2015 පෙබරවාරි

ආශිර්වාද ප්‍රකාශන
නො.70, ගිරිඋල්ල පාර, මීරිගම
දුරකථන : 033 2275419

මෙම සිංහල පරිවර්තනයේ අයිතිය © සචින්දි ආරිතිලක

සියලුම හිමිකම් ඇවිරිණි.

කර්තෘ ගේ අවසරයකින් තොරව මෙම පරිවර්තනය
සම්පූර්ණයෙන්ම හෝ එහි කොටස් හෝ
ඡායාපිටපත්, මුද්‍රිත හෝ ලිඛිත, ඉලෙක්ට්‍රොනික හෝ
කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම, පළ කිරීම, විකාශනය කිරීම,
අනුවර්තනය කිරීම හා වෙනත් ලෙස සැකසූ පිටපත්
අලෙවි කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ

පරිගණක පිටු සැකසුම හා කවර නිර්මාණය
චාමින් වීරේරත්න - 0777 577299

මුද්‍රණය
ආශිර්වාද ප්‍රින්ටර්ස්. 70, ගිරිඋල්ල පාර, මීරිගම.

PERCY JACKSON

## මගේ හොඳම යාළුවාගේ මංගල ඇඳුම් සවාරිය

මගේ නරක හීනය පටන් ගත්තේ මේ විදිහටයි.

ප්‍රංචි වෙරළබඩ නගරයක, පාළුවට ගිය පාරක මම සිටගෙන සිටියා. ඒ රෑ මැදියමයි. කුණාටුවක් හමමින් තිබුණා. සුළඟ සහ වැස්ස පාර දෙපස පාම් ගස් ඉරාගෙන ගියා. ලැලි ගැසූ ජනේල ඇති, රෝස සහ කහ පාට ගොඩනැගිලි පාර දෙපස පෙළගැසී තිබුණා. වීදියකට එහා, වද පඳුරුවලට එපිටින් මුහුද කැලඹුණා.

ෆ්ලොරිඩා, මම හිතුවා. ඒත් මම ඒක දැනගත්තේ කොහොමද කියලා නම් මට හරියටම විශ්වාස නැහැ. මම කවදාවත් ෆ්ලොරිඩාවට ගිහිල්ලා නැහැ. ඒත් එක්කම, පදික වේදිකාව මත කුර ගැටෙන හඬක් මට ඇහෙන්න ගත්තා. හැරිලා බලද්දී මට දකින්න ලැබුණේ මගේ යාළුවා, ග්‍රෝවර් පණ බේරාගන්න දුවන හැටියි.

ඔව්, මම කිවුවේ කුර කියලා තමයි.

ග්‍රෝවර් කියන්නේ සැටර් කෙනෙක්. ඉණෙන් උඩට, එයාව පෙනුණේ පොඩි එළු රැවුලක් තියෙන කල්ලි ගැහෙන සාමාන්‍ය ගැටවරයෙක් වගෙයි. එයා හරිම අමුතු තාලෙකට නොණ්ඩි ගහමින් ඇවිද්දා. ඒත්, බැරි වෙලාවත් එයා කලිසමක් නැතිව ඉන්නවා ඔයාට දකින්න නොලැබුණොත් (එහෙම නොදකින තරමට හොඳයි), එයාගේ මිනිස්-නොවන කොටස ගැන දැනගන්න කවදාවත් ඉඩ ලැබෙන්නේ

නැහැ. ලිහිල් කලිසම් සහ බොරු කකුල්වලින් එයාගේ ලොම් පිරුණු පස්සා ගාත් සහ කුර ආවරණය වුණා.

හය වසරේදී මගේ හොඳම යාළුවා වුණේ ග්‍රෝවර්. එයයි, මමයි, නව ඇනබෙත් කියලා ගැහැනු ළමයෙකුයි ලෝකය බේරාගන්න වික්‍රමයකටත් ගියා. ඒ වුණත් ගිය අවුරුද්දේ ජූලිවල එයා අනතුරුදායක ගවේෂණයකට- ඒ වෙනුවෙන් ගිය කිසිම සැටර් කෙනෙක් ආපහු ඇවිල්ලා නැති ගවේෂණයකට එයා ගියාට පස්සෙම මට එයාව දකින්න ලැබුණේ නැහැ.

කොහොම වුණත් මගේ හීනයේදි ග්‍රෝවර්, එයාට වේගයෙන් දුවන්න ඕනෑ වුණ වෙලාවට කරනවා වගේ සපත්තු දෙක අතට අරන්, එළ වලිගෙත් වනමින් දුවමින් සිටියා. පුංචි සංචාරක කඩ, රළ පදින පුවරු කුලියට දෙන තැන් පසුකරගෙන එයා දිව්වා. හමාගිය සුළඟට පාම් ගස් පොළොවටම නැමුණා. පිටුපසින් ආව මොකක්හරි දේකට ග්‍රෝවර් බය වෙලයි හිටියේ. එයා එන්න ඇත්තේ වෙරළේ ඉඳලා. තෙත වැලි එයාගේ ලොම්වල ඇලී තිබුණා. එයා කොහෙන්හරි පැනලා ඇවිත්. එයා උත්සාහ කරමින් සිටියේ මොකකින් හරි... ගැලවෙන්නයි.

ඇටකටු පවා වෙවුලුවන ගර්ජනාවක් කුණාටුව තුළින් ඇහුණා. ග්‍රෝවර්ට පිටුපසින් විදියේ ඈත කෙළවරකින් නොපැහැදිලි රූපයක් මතුවුණා. ඌ වීදි ලාම්පුවකට පහරක් ගහද්දි එය විදුලි පුපුරු රාශියකට පුපුරා ගියා. ග්‍රෝවර් බයෙන් ඉකිබිඳිමින්, පැකිළෙන ගමනින් ඉදිරියටම ආවා. කොහොමහරි පැනගන්න ඕනෑ. එයාලට අනතුරු අඟවන්න ඕනෑ! එයා, එයාටම කොඳුරා ගත්තා.

එයාව ලුහුබඳින කෙනාව මට දකගන්න බැරිවුණත්, ඌ කොඳුරන සහ ශාප කරන හඬවල් මට ඇහුණා. ඌ ළං වෙද්දී පොළොව දෙදුරුවා. වීදි කොණකින් වේගයෙන් හැරුණු ග්‍රෝවර් හිටිවනම නැවතුණා. එයා දුවගොස් තිබුණේ පාර කෙළවර වන තැනක පිහිටි කඩවලින් පිරුණු අංගනයකටයි. ආපහු හැරෙන්න වෙලාවක් නැහැ. ළඟින්ම වූ වෙළඳ සැලේ දොර කුණාටුවට ඇරී තිබුණා. ඊට ඉහලින් වූ අඳුරු නාම පුවරුවෙන් කියවුණේ: ශාන්ත ඔගස්ටින් මංගල විලාසිතා.

වේගයෙන් ඇතුළට දුවගිය ග්‍රෝවර් මංගල ඇඳුම් රාක්කයක් පිටුපස හැංගුණා.

වෙළඳ සැල ඉදිරියෙන් රාක්ෂයාගේ හෙවණැල්ල ඇදී ගියා. ඌගේ ගඳ - තෙමුණු බැටළු ලොම්වල පිළිකුල් සහගත ගඳත්, කුණු වූ



මස්වල ගඳත් සමග කුණු ගොඩක ලැගපු උරුලෑවෙකුගේ ගඳ වගේ රාක්ෂයින්ටම ආවේණික ගඳ මට දැනෙන්න ගත්තා.

මංගල ඇඳුම්වලට පිටුපසින් ග්‍රෝවර් වෙවුලුවා. රාක්ෂයාගේ හෙවණැල්ල ඉදිරියටම ඇදුණා. වැස්සේ හඬ හැරෙන්න සියල්ල නිහඬ වුණා. ග්‍රෝවර් ගැඹුරු හුස්මක් ගත්තා. සමහරවිට, ඌ යන්න ඇති. ඒත් එක්කම විදුලි කෙටුවා. කඩයේ ඉදිරි කොටස සම්පූර්ණයෙන්ම පුපුරා යද්දී, රාක්ෂ හඬක් මොරගැහුවා: "මගේ!"

වේගයෙන් කෙලින් වුණ මම වෙවුලමින් ඇඳේ වාඩි වුණා. එතැන කිසිම කුණාටුවක්වත්, මොනම රාක්ෂයෙක්වත් නැහැ. මගේ නිදන කාමරයේ ජනේලය හරහා ඉර එළිය පෙරී ආවා.

ජනේල් වීදුරුවට එහා පැත්තෙන් හෙවණැල්ලක් සෙලවෙනවා වගේ මම දක්කා - මිනිස් හෙවණැල්ලක්. ඒත්, එතකොටම මගේ කාමරයේ දොරට තට්ටු කරන හඬක් ඇහුණා. මගේ අම්මා කතා කළා: "පර්සි, ඔයා පරක්කු වෙන්නයි යන්නේ-" ඒත් එක්කම ජනේලය අසල තිබුණු හෙවණැල්ල නොපෙනී ගියා.

ඒක මම හිතේ මවාගත්තක් වෙන්නැති. හෙලවෙන, පරණ හදිසි පිටවීම් පඩිපෙළක් තියෙන පස්වෙනි තට්ටුවේ ජනේලයක් ළඟ - එතැන කවුරුවත් නැතුව ඇති.

"ඉක්මන් කරන්න, පුතේ," මගේ අම්මා නැවතත් කතා කළා. "ඉස්කෝලේ අන්තිම දවස නේ. ඔයා ඒ ගැන සතුටු වෙන්න ඕනෑ! ඔයා කොහොමහරි ඒක කළා නේ."

"මේ එනවෝ," මම අමාරුවෙන් කියාගත්තා.

මම කොට්ටය යටට අත දැමුවා. මම නිතරම ළඟ තබාගෙන නිදාගත් බෝල්පොයින්ට් පෑන වටා මගේ ඇඟිලි දැවටුණා. එය පිටතට ගත් මම එහි පැත්තක වූ පෞරාණික ග්‍රීක අක්ෂර අධ්‍යයනය කළා: ඇනාක්ලුස්මස්. රිප්ටයිඩ්.

එහි කොපුව ගලවන්න මට හිතුණත්, මොකක්දෝ මාව වැළකුවා. මම සෑහෙන කාලයකින් රිප්ටයිඩ් පාවිච්චි කරලා තිබුණේ නැහැ... ඒ ඇරත්, මම හෙල්ලයක් වැරදි පැත්තට වනලා අම්මාගේ චීන කැබිනෙට්ටුව කැඩුවට පස්සේ ගේ ඇතුළේ මාරාන්තික ආයුධ පාවිච්චි කරන්නෑ කියලා අම්මා මාව පොරොන්දු කරවාගෙන තිබුණා.

Scanned with CamScanner

තිබුණු පෙට්ටියට ඇඹරුණා. "අන්, පැටියෝ, ඒක මේ... මට ඊයේ ජ කයිරොන්ගෙන් පණිවුඩයක් ලැබුණා."

මගේ හදවත කඩා වැටුණා. කයිරොන් කියන්නේ අර්ධ-ලෝහිත කඳවුරේ ක්‍රියාකාරකම් අධ්‍යක්ෂක. මොකක්හරි බරපතළ දෙයක් සිද්ධවෙලා නොතිබුණා නම් එයා අපිට කතා කරන්නේ නැහැ. "එයා මොනවද කිව්වේ?"

"එයා හිතන්නේ... දැන්ම කඳවුරට එන එක ඔයාට පරිස්සම් නැති කියලා. අපිට ගමන කල් දාන්න වෙනවා."

"කල් දාන්න? අම්මේ, එතැන පරිස්සම් නැතිවෙන්නේ කොහොම ද? මම අර්ධ-ලෝහිතයෙක් නේ! මේ ලෝකේ මට පරිස්සමෙන් ඉන්න පුළුවන් එකම තැන ඒක නේ!"

"සාමාන්‍යයෙන් නම් එහෙම තමයි, ඩාලිං. ඒත් එයාලට තියෙන ප්‍රශ්නත් එක්ක-"

"මොන ප්‍රශ්න ද?"

"පර්සි, මට හොඳටම කණගාටුයි. අද හවසට මම මේ ගැන ඔයා එක්ක කතා කරන්නම්කෝ. මට දැන් ඔක්කොම විස්තර කරන්න බැහැ. කයිරොන්ටවත් පුළුවන්ද කියලා මට හරියටම විශ්වාස නැහැ. හැමදේම හරිම ඉක්මනට සිද්ධ වෙලා තියෙන්නේ."

මගේ හිත වේගයෙන් කැරකුණා. මට කඳවුරට යන්න බැරි ඇයි? මට අහන්න ප්‍රශ්න මිලියනයක් විතර තිබුණා, ඒත් එනකොටම කාර්ලොක්කුවේ අඩ-හැඩ නාද වුණා.

එවිට මගේ අම්මාට සහනයක් ලැබුණා වගෙයි පෙනුණේ. "හා-හරි, පැටියෝ. ඔයා දැන් යන්න ඕනැ. ටයිසන් බලාගෙන ඇති."

"ඒත් -"

"පර්සි, අපි හවසට මේ ගැන කතා කරමු. දැන් ඉස්කෝලෙ යන්න."

මට කරන්න උවමනා වූ අන්තිම දේ ඒකයි, ඒත් මගේ අම්මාගේ ඇස්වලට අර බියසුලු බැල්ම ඇවිත් තිබුණා - ඒක හරියට, මම තවත් ඇහැරගෙන හිටියොත් එයා අඬන්න පටන් ගනීවි වගේ අනතුරු ඇඟවීමක්. ඒ ඇරත්, එයා මගේ යාලුවා, ටයිසන් ගැන කිව්ව දේත් ඇත්ත. උමං දුම්රිය



නැවතුම්පොළේදී මම එයාව වෙලාවට මුණගැහුණේ නැත්නම් එයා කලබල වේවි. පොළොව යටින් ගමන් කරන්න එයා හොඳටම බයයි.

මම, මගේ පොත් ටික එකතු කරගත්තා. දොර ළඟ ඇනහිට නතර වුණා. "අම්මේ, මේ කඳවුරේ තියෙන ප්‍රශ්නේ. ඒකයි... ඉක්මනට ගැන මම දකපු සිහිනයයි අතරේ මොකක්හරි සම්බන්ධයක් තියෙනවා ද?"

එයා මගේ ඇස් මග ඇරියා. "අපි මේ ගැන හවසට කතා කරමු, පුතේ. මම... මට පුළුවන් තරමට විස්තර කරලා දෙන්නම්කෝ."

අකමැත්තෙන් වුණත් මම එයාට සමුදුන්නා. ඇගේ දෙපා දුම්රිය අල්ලගන්න මම පඩිපෙළ දිගේ පහළට දිව්වා. ඒ වෙලාවේ මම දැන නොසිටියත්, මටයි අම්මාටයි ඒ හවස කතාබහ කරන්න කවදාවත් අවස්ථාවක් ලැබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම, ඉතාමත් කාලයකට මට ගෙදර දකින්න ලැබෙන්නේත් නැහැ.

පිටතට අඩිය තැබූ මම පාරේ අනෙක් පස තිබුණු බ්‍රවුන් ගෙවල් ගොඩනැඟිල්ල දෙසට බැල්මක් හෙළුවා. එක තත්පරයකට, උදේ ඉර එළියෙන් අඳුරු රූපයක් මට දකින්න ලැබුණා - එය ගෙවල් බිත්තිය හරහට වැටුණු මිනිස් හැඩයක්, කිසිවෙකුටවත් අයිති නැති සෙවණැල්ලක්.

ඊට පස්සේ, රැළි නැංවූ එය අතුරුදහන් වුණා.

තිබුණු රෙදිකඩ ඇඹරුවා. "අහ්, පැටියෝ, ඒක මේ... මට ඊයේ ඩී කයිරොන්ගෙන් පණිවුඩයක් ලැබුණා."

මගේ හදවත කඩා වැටුණා. කයිරොන් තමයි අර්ධ-ලෝහිත කඳවුරේ ක්‍රියාකාරකම් අධ්‍යක්ෂක. මොකක්හරි බරපතළ දෙයක් සිදුවෙමින් නොතිබුණා නම් එයා අපිට කතා කරන්නේ නැහැ. "එයා මොනවද කිව්වේ?"

"එයා හිතන්නේ... දැන්ම කඳවුරට එන එක ඔයාට පරිස්සම් මදි කියලා. අපිට ගමන කල් දාන්න වෙනවා."

"කල් දාන්න? අම්මේ, එතැන පරිස්සම් නැතිවෙන්නේ කොහොම ද? මම අර්ධ-ලෝහිතයෙක් නේ! මේ ලෝකේ මට පරිස්සමෙන් ඉන්න පුළුවන් එකම තැන ඒක නේ!"

"සාමාන්‍යයෙන් නම් එහෙම තමයි, වස්තුවේ. ඒත් එයාලට තියෙන ප්‍රශ්නත් එක්ක-"

"මොන ප්‍රශ්න ද?"

"පර්සි, මට ගොඩක්, ගොඩාක් කණගාටුයි. අද හවසට මම මේ ගැන ඔයා එක්ක කතා කරන්නම්කෝ. මට දැන් ඔක්කොම විස්තර කරන්න බැහැ. කයිරොන්ටවත් පුළුවන්ද කියලා මට හරියටම විශ්වාස නැහැ. හැමදේම හරිම ඉක්මනට සිද්ධ වෙලා තියෙන්නේ."

මගේ හිත වේගයෙන් කැරකුණා. මට කඳවුරට යන්න බැරි ඇයි? මට අහන්න ප්‍රශ්න මිලියනයක් විතර තිබුණා, ඒත් එතකොටම ඔරලෝසුවේ අඩ-පැය නාද වුණා.

එයින් මගේ අම්මාට සහනයක් ලැබුණා වගෙයි පෙනුණේ. "හත-හමාරයි, පැටියෝ. ඔයා දැන් යන්න ඕනෑ. ටයිසන් බලාගෙන ඇති."

"ඒත් -"

"පර්සි, අපි හවසට මේ ගැන කතා කරමු. දැන් ඉස්කෝලෙ යන්න."

මට කරන්න උවමනා වූ අන්තිම දේ ඒකයි. ඒත් මගේ අම්මාගේ ඇස්වලට අර බිඳෙනසුලු බැල්ම ඇවිත් තිබුණා - ඒක හරියට, මම තවත් බල කළොත් එයා අඬන්න පටන් ගනීවි වගේ අනතුරු ඇඟවීමක්. ඒ ඇරත්, එයා මගේ යාළුවා, ටයිසන් ගැන කියූ දේත් ඇත්ත. උමං දුම්රිය



නැවතුම්පොළේදී මම එයාව වෙලාවට මුණගැහුණේ නැත්නම් එයා කලබල වේවි. පොළොව යටින් තනියම යන්න එයා ගොඩක් බයයි.

මම, මගේ බඩු ටික එකතු කරගත්තත්, දොර ළඟ ආපසු නතර වුණා. "අම්මේ, මේ කඳවුරේ තියෙන ප්‍රශ්නේ. ඒකයි... ග්‍රෝවර් ගැන මම දැකපු හීනයයි අතරේ මොකක්හරි සම්බන්ධයක් තියෙනවා ද?"

එයා මගේ ඇස් මග ඇරියා. "අපි මේ ගැන හවසට කතා කරමු, පුතේ. මම... මට පුළුවන් තරමට විස්තර කරලා දෙන්නම්කෝ."

අකමැත්තෙන් වුණත් මම එයාට සමුදුන්නා. අංක දෙක දුම්රිය අල්ලගන්න මම පඩිපෙළ දිගේ පහළට දිව්වා. ඒ වෙලාවේ මම දැන නොසිටියත්, මටයි අම්මාටයි ඒ හවස කතාබහ කරන්න කවදාවත් ඉඩක් ලැබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම, සෑහෙන කාලයකට මට ගෙදර දකින්න ලැබෙන්නෙත් නැහැ.

පිටතට අඩිය තැබූ මම පාරේ අනෙක්පස තිබුණු දුඹුරු ගඩොල් ගොඩනැගිල්ල දෙසට බැල්මක් හෙළුවා. එක තත්පරයකට, උදේ ඉර එළියෙන් අඳුරු රූපයක් මට දකින්න ලැබුණා - එය ගඩොල් බිත්තිය මතට වැටුණු මිනිස් ඡායාවක්, කිසිවෙකුටත් අයිති නැති හෙවණැල්ලක්.

ඊට පස්සේ, රැළිති නැංවූ එය අතුරුදහන් වුණා.

Scanned with CamScanner

## 02

# මම මිනී කන්නෝ එක්ක ඩොඩ්ජ්බෝල් සෙල්ලම් කළා

මගේ දවස පටන් ගත්තේ සාමාන්‍ය විදිහට- එහෙමත් නැත්නම්, මෙරිවෙදර් ඉස්කෝලෙදි සාමාන්‍ය වෙන්න පුළුවන් තරමට. ජේනවනේ, ඒක මේ මෑත්කාලවල තිබුණු 'ප්‍රගතිශීලී' ඉස්කෝලයක්. ඒ කියන්නේ අපි ඩෙස්-පුටුවල වාඩි නොවී කුෂන් පුටුවල වාඩිවෙලා ඉගෙන ගන්න එකයි, අපිට පන්තියේ වෙනියා නොලැබෙන එකයි, අපිට උගන්වන්න එන ගුරුවරු ගුරුවරියෝ කලිසම් සහ රොක් කොන්සර්ට් ටී-ෂර්ට් හැඳගෙන එන එකටයි.

එතැන මට හරියටම ගැලපුණා. මං අදහස් කළේ, අනෙක් සෑම අර්ධ-ලෝහිතයෙකුට වගේම මටත් යමකට අවධානය දක්වන්න බැරි ආබාධය (ඒ.ඩී.එච්.ඩී.) සහ වචන අන්ධතාවය තියෙන නිසා සාමාන්‍ය ඉස්කෝලවලදී මට කවදාවත් හොඳින් වැඩ කරන්න පුළුවන් වුණේ නැහැ. මෙරිවෙදර්වල තිබුණු එකම නොහොඳ වුණේ මෙහෙ ගුරුවරු හැම වෙලාවේම, හැම දෙයකම දීප්තිමත් පැත්ත දිහා බලන්න පුරුදු වෙලා හිඳීමයි. ඒත් මෙහෙ හිටිය ළමයි නම්... දීප්තිමත් අය නෙවෙයි.

අද මගේ පළවෙනි පන්තිය අරන් බලමුකෝ: ඉංග්‍රීසි. ළමයි කාණ්ඩයක් දූපතක අතරමං වෙලා, ඊට පස්සේ පිස්සු නටන කතාවක් තියෙන 'ලෝර්ඩ් ඔෆ් ෆ්ලයිස්' කියලා පොතක් මුළු මධ්‍යම ඉස්කෝලෙම ළමයින්ට කියවන්න දීලා තිබුණා. ඉතින්, අපේ අන්තිම වාර විභාගයට ගුරුවරු කළේ වැඩිහිටියෙකුගේ අධීක්ෂණයක් නැතිව අපිට පිටුපස මිදුලේ පැයක් ගත කරන්න ඇරලා මොනවා සිද්ධ වෙයිද බලන එකයි.



සිද්ධ වුණේ හත වසරේ සහ අට වසරේ ළමයි අතරේ ලොකු දබරයකුයි පොර බැදිලි පිරුණු පැසිපන්දු තරගයකුයි.

ඒ හැම ක්‍රියාකාරකමක්ම මෙහෙයවූයේ ඉස්කෝලේ චණ්ඩියා, මැට් ස්ලෝන් විසින්.

ස්ලෝන් උස-මහත, ශක්තිමත් කොල්ලෙක් නොවුණට එයා හැසිරුණේ එහෙම හිතාගෙනයි. පිට්බුල් බල්ලෙකුගේ වගේ ඇස් දෙකකුත්, බූසියට වැවුණු කළු කොණ්ඩයකුත් ඇති එයා මිල අධික එහෙත් කිසිම පිළිවෙළකට නැති ඇඳුම් නිතරම ඇන්දේ එයාගේ පවුලේ සල්ලි ගැන එයා කිසිම සැලකිල්ලක් නොදක්වන බව අනෙක් අයට පෙන්වන්න වගෙයි. එයා තාත්තාගේ පෝෂේ කාරය අරගෙන ජොලියට රවුමක් පදින්න ගිහින්, මාර්ග සංඥා කණුවක හැප්පිලා කටේ ඉස්සරහ දතක් කඩාගෙන තිබුණා.

කොහොමහරි, හැමෝවම මඩවමින් සිටි ස්ලෝන් වැඩ වරද්දා ගත්තේ මගේ යාළුවා, ටයිසන්ගේ කලිසම් පටියෙන් අල්ලා ඔසවන්න ගිය වෙලාවේ දියි.

මෙරිවෙදර් ඉස්කෝලේ සිටි, ඉන්න තැනක් නැති එකම ළමයා වුණේ ටයිසන්. මගේ අම්මාටයි මටයි තේරුම් ගන්න හැකි වූ තරමට, එයා ගොඩාක් චූටි කාලේදීම එයාගේ දෙමව්පියෝ එයාව අතෑරලා ගිහින්. පෙනුණු හැටියට ඒ එයා ගොඩාක්... වෙනස් නිසා වෙන්නැති. අඩි හයකුත් අඟල් තුනක් උස ටයිසන් යෝධයෙක් වගේ ලොකුවට හැදිලා හිටියා. ඒත්, හැම තිස්සෙම අඬන එයා පොඩි දේටත්- අඩු තරමේ එයාගෙම ඡායාවටත් බය වුණා. එයාට තිබුණේ විරූපී, වනචාරී පෙනුමක් ගත් මුහුණක්. එයාගේ ඇස්වල පාට මට කියන්න බැරි එයාගේ බොල්ලෑ දත් ඇන්දෙන් ඉහළට බලාගන්න මට කවදාවත්ම හැකි වෙලා නැති නිසයි. එයාට ගැඹුරු කටහඬක් තිබුණත්, එයා කතා කළේ පුංචි ළමයෙක් වගෙයි - මං හිතන්නේ, ඒකට හේතුව මෙරිවෙදර්වලට එන්න කලින් කවදාවත් වෙන ඉස්කෝලෙකට ගිහින් නැති නිසා වෙන්නැති. කඩමාලු වුණ කලිසමකුත්, හිල් වැටුණු ෆ්ලැනල් කමිසයකුත් හැඳපු එයා කුණු වැකුණු ලොකු ස්නිකර්ස් ජෝඩුවක් පැලඳුවා. එයා ළඟින් නිව්යෝක් මුඩුක්කුවල ගඳ හැමුවේ එහෙ හැත්තෑ දෙවන වීදියේ තිබුණ කාඩ්බෝඩ් ශීතකරණ පෙට්ටියක එයා ජීවත් වුණ නිසයි.

මෙරිවෙදර් ඉස්කෝලේ සමාජ සේවා ව්‍යාපෘතියකට එයාව තෝරාගෙන තිබුණේ එයින් සෑම ශිෂ්‍යයෙකුටම තමන් ගැනම සතුටක්

Scanned with CamScanner

ලැබේවි හිතලයි. අවාසනාවට, ගොඩක් අයට ටයිසන්ව පිස්සුවේ නැහැ. ඇඟපතෙන් ලොකු වුණත් එයා බයාදු කෙනෙක් බව සොයාගත්තට පස්සේ එයාලා තමන් ගැනම සතුටු වුණේ ටයිසන්ට අඩන්තේට්ටම් කරලා. එයාට හිටිය එකම යාළුවා වුණේ මම, ඒ කියන්නේ මට හිටිය එකම යාළුවාත් එයා විතරයි.

ටයිසන්ට උවමනා තරම් උදවු ලැබෙන්නේ නැහැ කියලා මගේ අම්මා ඉස්කෝලෙට ලක්ෂ වාරයක් විතර පැමිණිලි කළා. ඒත් ඒ කිසිවකින් පලක් වෙන බවක් පෙනුණේ නැහැ. සමාජ සේවකයෝ කියා සිටියේ ටයිසන් කියලා කෙනෙක් නැහැ කියලයි. අපි විස්තර කළ මුඩුක්කුවට ගියත්, ටයිසන්ව හොයාගන්න ලැබුණේ නැහැ කියලා එයාලා දහඅතේ දිවුරුවා. ඒත්, ශීතකරණ පෙට්ටියක් ඇතුළේ ජීවත් වෙන යෝධ ළමයෙක්ව එයාලට මග ඇරුණේ කොහොමද කියලා නම් මම දන්නෙ නැහැ.

කොහොමහරි, හොරෙන්ම ටයිසන්ගේ පිටුපසට ගිය ස්ලෝන් එයාගේ කලිසම් පටියෙන් අල්ලා ඔසවන්න උත්සාහ කරද්දී හොඳටෝම බය වුණ ටයිසන් ස්ලෝන්ව තල්ලු කළා. අඩි පහළොවක් විතර ඈතට උඩින් විසිවුණ ස්ලෝන් පුංචි ළමයි ඔංචිල්ලා පදින ටයරයක පැටලුණා.

"විකාරකාරයා!" ස්ලෝන් බෙරිහන් දුන්නා. "ආපහු ඔහේගෙ කාඩ්බෝඩ් පෙට්ටියටම තොලොංචි වෙනවා!"

ටයිසන් ඉකිබිඳින්න ගත්තා. හරහා දමා තිබුණු පොල්ලක් උඩ එයා වාඩිවුණ වේගයට ඒක මැදින් නැමෙද්දී, එයා මුහුණ අත් දෙකේ සඟවාගත්තා.

"ඒක ආපහු ගන්නවා, ස්ලෝන්!" මම කෑගැසුවා.

ස්ලෝන් මට විරිත්තුවා. "ඔහේ මොකටද ඒ ගැන වද වෙන්නේ, ජැක්සන්? ඔය විකාරකාරයාගෙන් ඈත් වෙලා හිටියා නම් ඔහේටත් යාළුවෝ ඉන්ඩ තිබුණා."

මම අත මිටිගුළි කරගත්තා. මට දැනෙමින් තිබුණ තරමටම මගේ මුහුණ රතු වෙලා තියෙන්න එපා කියලා මම ප්‍රාර්ථනා කළා. "එයා විකාරකාරයෙක් නෙවෙයි. එයා..." ගැළපෙන වචනයක් මතක් කරගන්න මම උත්සාහ කළා, ඒත් ස්ලෝන් හිටියේ අහගෙන නෙවෙයි. එයයි, එයාගේ තඩි, කැත යාළුවෝයි මහ හඬින් හිනාවෙන්න ගත්තා. මම පුදුම වුණේ ස්ලෝන්ගේ වටේට වෙනදා ඉන්න මෝඩ රැළ අද තවත් වැඩි වෙලාද, නැත්නම් ඒක මම හිතේ මවාගත්තක්ද හිතලයි.



වෙනදාට නම් එයා වටේ හිටියේ දෙන්නෙක්-තුන්දෙනෙක් විතර වුණත් අද ඒ තඩෙට තවත් දුසිම් බාගයක් විතර එකතු වෙලා හිටියා. හැබැයි, ඒ අලුත් ළමයින්ව මීට කලින් දකින්න ලැබී නැති බව මට සහතික වුණා.

"සෙල්ලම් කරන වෙලාව එනකම් ඉන්නවා, ජැක්සන්," ස්ලෝන් කිවුවා. "ඊට පස්සේ ඔහේ ඉවරෙටම ඉවරයි."

පළවෙනි කාලපරිච්ඡේදය අවසානයේදී අපි කරලා තියෙන සංහාරය පරීක්ෂා කරන්න අපේ ඉංග්‍රීසි ගුරුතුමා, මිස්ටර් ඩී මිලෝ එළියට ආවා. අපි 'ලෝර්ඩ් ඔෆ් ෆ්ලයිස්' පොත සම්පූර්ණයෙන්ම තේරුම් ගෙන ඇති බව එයා කිවුවා. අපි හැමදෙනාම එයාගේ පන්තිය සමත් වුණ නිසා ලොකු වුණාම කවදාවත්ම දරුණු මැරයෝ වෙන්නෙපා කියලත් එයා අපිට කිවුවා. ගොඩක් උනන්දුවෙන් ඒ කතාවට ඔළුව වනපු මැට් ස්ලෝන් ඊට පස්සේ මට කැඩුණු දත තියෙව්වා.

දවල් කෑම වෙලාවට වැඩිපුර පීනට් බටර් දැමූ සැන්ඩ්විච් එකක් අරන් දෙන්න පොරොන්දු වුණාම ටයිසන්ගේ ඇඬිල්ල නැවතුණා.

"මම... මම විකාරයක් ද?" එයා මගෙන් ඇසුවා.

"නෑ," මම කිවුවේ දත්මිටි කමින්. "මැට් ස්ලෝන් තමයි විකාරේ."

ටයිසන් නහය ඉහළට ඇද්දා. "ඔයා හොඳ යාළුවෙක්. ඔයා නැතුව මට පාළු වෙයි... ලබන අවුරුද්දේ මට.... මට එන්න බැරිවුණොත්..." එයාගේ කටහඬ වෙවුලුවා. සමාජ සේවා ව්‍යාපෘතියෙන් ලබන අවුරුද්දට එයාව බඳවා ගනීවිද කියලා එයා නොදන්න බව මට තේරුම් ගියා. අඩු තරමේ එයා එක්ක ඒ ගැන කතා කරන්නවත් විදුහල්පති කරදර වෙන්න ඇති ද හිතලා මම පුදුම වුණා.

"බය වෙන්නෙපා, ලොකු යාළුවා," මම අමාරුවෙන් කියාගත්තා, "හැමදේම හරියාවි." ටයිසන් මට දුන් ස්තුතිය පිරුණු බැල්ම දැක්කාම මට දැනුණේ මම මහා බොරුකාරයෙක් වගෙයි. හැමදේම හරියාවි කියලා එයා වගේ ළමයෙකුට මම පොරොන්දු වුණේ කොහොම ද?

අපේ ඊළඟ විභාගය වුණේ විද්‍යාව. පුපුරණසුලු දෙයක් හදාගන්න හැකිවන තුරු රසායන ද්‍රව්‍ය මිශ්‍ර කරන්න මිසිස් ටෙස්ලා අපිට උපදෙස් දුන්නා. මගේ විද්‍යාගාර සහායකයා වුණේ ටයිසන්. අපිට පාවිච්චි කරන්න දුන්නු පුංචි කුප්පි සහ බෝතල්වලට වඩා

Scanned with CamScanner

එයාගේ අත් සැහෙන ලොකුයි. ඉතින්, අත්වැරදීමකින් රසායන ද්‍රව්‍ය දැමූ බෝතල් රාක්කයක්ම පෙරළු එයා කුණු භාජනය ඇතුළේ තැඹිලි පාට බිම්මලක් වගේ වලාකුළක් හැදුවා. ඊට පස්සේ විද්‍යාගාරය හිස් කරලා, අනතුරුදායක අපද්‍රව්‍ය ඉවත් කරන සේවකයින්ව කැඳවූ මිසිස් වෙස්ලා, සහජයෙන්ම රසායනඥයින් වීම ගැන ටයිසන්ටයි මටයි ප්‍රශංසා කළා. තත්පර තිහක් ඇතුළත එයාගේ විභාගයක් සම්පූර්ණ කළ මුල්ම ළමයි වුණේ අපි.

ඒ උද්‍යාසන ඉක්මනින් ගෙවීයාම ගැන මම සතුටු වුණේ එයින් මගේ ප්‍රශ්න ගැන සිහිපත් නොවෙන නිසයි. කඳවුරේ මොකක් හෝ වැරැද්දක් වෙලා කියන අදහස මට දරාගන්න බැරි වුණා. මම දැකපු නපුරු හීනය හිතෙන් ඉවත් කරගන්න බැරිවීම ඊටත් වඩා නරක වුණා. මගේ හිත මට කිවුවේ ග්‍රෝවර් අනතුරක කියලයි.

සමාජ අධ්‍යයනය පාඩමේදී අපි අක්ෂාංශ/දේශාංශ සිතියම් අඳින අතරේ මම, මගේ සටහන් පොත ඇරලා, ඒක ඇතුළේ තිබුණු පින්තූරය දෙස බලා සිටියා- ඒක මගේ යාළුවා, ඇනබෙත් වොෂින්ටන්වල නිවාඩුවක් ගත කරන අතරේ ගත් ඡායාරූපයක්. කලිසමකුත්, තැඹිලි පාට අර්ධ-ලෝහිත කඳවුරු ටී-ෂර්ට් එකකුත් හැඳ සිටි එයා ඊට උඩින් ඩෙනිම් ජැකට්ටුවක් දමාගෙන සිටියා. එයාගේ තඹ පාට කොණ්ඩය පිටුපසට කර පටලේන්සුවකින් ගැටගසා තිබුණා. එයා ලින්කන් ස්මාරකය ඉදිරියේ අත් බැඳගෙන, තෘප්තිමත් බැල්මකින් බලා සිටියේ හරියට එයා පෞද්ගලිකවම ඒ තැන නිර්මාණය කරලා වගෙයි. මේකනේ වැඩේ, ලොකු වුණාම ගෘහ නිර්මාණ ශිල්පියෙක් වෙන්නයි ඇනබෙත්ට ඕනෑ. ඒ නිසා එයා නිතරම ප්‍රසිද්ධ ස්මාරක, සිහිවටන වගේ දේවල් බලන්න යනවා. ඒ අතින් බලද්දී එයා ටිකක් අමුතුයි. වසන්ත නිවාඩුව අවසානයේ දී එයා මේ පින්තූරය මට ඊ-මේල් කරලා තිබුණා. ඉඳහිට සැරයක් මම ඒක දිහා බලන්නේ එයා ඇත්ත කෙනෙක් බවත්, අර්ධ-ලෝහිත කඳවුර මම හිතේ මවාගත් තැනක් නොවන බවත් මටම ඒත්තු ගන්වන්නයි.

ඇනබෙත් මෙතැන හිටියා නම්, මට හිතුණා, මගේ හීනයේ තේරුම එයා හොයාගනීවි. එයා ළඟදී මම කවදාවත් පිළි නොගත්තට, එයාට මට වඩා මොළේ තිබුණා. හැබැයි, ඒක වදයක් වෙන වෙලාවලුත් නොතිබුණා නෙවෙයි. මම සටහන් පොත වහන්න සූදානම් වෙද්දීම එතැනට ආව මැට් ස්ලෝන් පින්තූරය එළියට ඇදලා ගත්තා.

"හේයි!" මම විරෝධය පෑවා.



පින්තූරය දෙස බැලූ ස්ලෝන්ගේ ඇස් ලොකු වුණා. "වෙන්න බෑ, ජැක්සන්. කවුද මේ? එයා ඔයාගේ -"

"ඕක මෙහාට දෙනවා!" මගේ කන් දෙක රත්වෙනවා වගෙයි මට දැනුණේ.

ස්ලෝන් ඒක එයාගේ කැත යාළුවෝ අතට දුන්නා. එයාලා හිනාවල් තද කරගෙන ඒක කෑලිවලට ඉරන්න ගත්තා. අලුතෙන් ඇවිත් සිටි ඒ ළමයි චාරිකාවකට ආපු අය වෙන්නැති. මොකද, එයාලා හැමෝම ඇතුළුවීමේ කාර්යාලයෙන් දුන් 'මගේ නම:.................' හැඳුනුම්පත් එල්ලාගෙනයි සිටියේ. ඒ වගේම, එයාලා අමුතු තාලේ විහිළුවලට කැමති අය වෙන්නැති. මොකද, එයාලා හැමෝම ලියාගෙන සිටියේ: ඇටමිදුළු උරන්නා, හිස්කබල් කන්නා සහ ජෝ බොබ් වගේ හරිම පුදුම නම්. කිසිම මනුස්සයෙකුට එහෙම නම් තියෙනවද!

"මේ කට්ටිය ලබන අවුරුද්දේ මෙහෙට එනවා," ස්ලෝන් පුරසාරම් දෙඩෙව්වේ මාව බය කරන්න හිතාගෙන වගෙයි. "ඔහේගේ මන්දබුද්ධික යාළුවාට වගේ නෙවෙයි, මෙයාලට නම් පන්ති ගාස්තු ගෙවන්න සල්ලි ඇති කියලා මං ඕනෑ ඔට්ටුවක් අල්ලනවා."

"එයා මන්දබුද්ධික නෑ." ස්ලෝන්ගේ මූණ මැද්දට දෙකක් අනින් නැතුව මම හිටියේ බොහොම අමාරුවෙන්.

"ඔහේ නම් මැට්ටෙක්, ජැක්සන්. ඊළඟ පීරියඩ් එකේ දී මං ඔහේව ඔය කාලකණ්ණිකමෙන් ගලවන්නම්කෝ." එයාගේ යෝධ යාළුවෝ මගේ පින්තූරය කන්න පටන් ගත්තා. එයාලව කුඩුපට්ටම් කරලා දාන්න මට උවමනා වුණා, ඒත් මගේ කේන්තිය කිසිම වෙලාවක සාමාන්‍ය මිනිස්සු මතින් පිට කරන්න එපා කියලා කයිරොන් මට තදින්ම නියෝග කරලා තිබුණා. එයාලා කොයිතරම් ජරා විදිහට හැසිරුණත් එහෙමයි. මගේ සටන්, රාක්ෂයෝ වෙනුවෙන් ඉතිරි කරගන්න මට සිද්ධ වුණා.

ඒ වුණත්, මගේ හිතේ පැත්තක් කිවුවා, ඇත්තටම මම කවුද කියලා ස්ලෝන් දන්නවා නම්...

සීනුව නාද වුණා.

ටයිසනුයි මමයි පන්තියෙන් එළියට යද්දී ගැහැනු ළමයෙක් මට කොඳුරන හඬින් කතා කළා, "පර්සි!" මම අල්මාරි තබා ඇති කොටස වටේටම බැල්මක් හෙළුවත් කිසිවෙක් මං ගැන අවධානයෙන්

Scanned with CamScanner

සිටියේ නැහැ. හරියට මෙරිවෙදර්වල එක ගැහැනු ළමයෙක් හරි මගේ නම කියලා කතා කළොත් එතැනම මැරිලා වැටෙයි වගෙයි.

මේ දේවල් මම හිතෙන් මවා ගත්තාද කියලා කල්පනා කරන්නත් කලින්, ව්‍යායාම ශාලාවට දුවන්න ගත් පන්තියේ ළමයින්ට මැදිවෙලා ටයිසන්ව සහ මාව ඒ දෙසට ඇදී ගියා. ඒ ශාරීරික අභ්‍යාස කරන වේලාව, එහෙමත් නැත්නම් සෙල්ලම් කරන වෙලාව. අපි හැමෝටම ඩොඩ්ජ්බෝල් සෙල්ලම් කරන්න දෙන්න අපේ පුහුණුකරු පොරොන්දු වෙලා තිබුණා. ඒ වගේම මාව මරනවා කියලා මැට් ස්ලෝනුත් පොරොන්දු වෙලා තිබුණා. මෙරිවෙදර්වල ක්‍රීඩා ඇඳුම වුණේ අහස් නිල් පාට කොට කලිසමක් සහ බතික් ටී-ෂර්ට් එකක්. වාසනාවකට වගේ අපි ගොඩක් වෙලාවට මලල ක්‍රීඩා කළේ ඉස්කෝලේ ඇතුළෙම නිසා හිපියෝ ටිකක් වගේ ට්‍රිබෙකා නගරය වටේ දුවන්න අපිට සිද්ධ වුණේ නැහැ.

අපේ බඩුබාහිරාදිය දමන අල්මාරි ඇති කොටසට ගිය මම හැකි ඉක්මනින් ඇඳුම් මාරු කරගත්තේ ස්ලෝන් එක්ක ගනුදෙනු කරන්න උවමනා නොවුණ නිසයි. මම එතැනින් පිටවෙන්න සූදානම් වෙද්දි ටයිසන් කතා කළා, "පර්සි?"

තවමත් ඇඳුම් මාරු කරගෙන නොසිටි එයා ක්‍රීඩා ඇඳුම් පොදිය තදින් බදාගෙන දොර ළඟ හිටගෙන හිටියා.

"ඔයාට පුළුවන් ද.... අත්..."

"ඔත්, හරි." එයාට සැර නොවෙන්න මම උත්සාහ කළා. ''ඔව්, හරි, යාළුවා." ටයිසන් ඇඳුම් මාරු කරන කාමරයට රිංගා ගත්තා. එයා ඇඳුම් අඳින තුරු මම දොර ළඟ මුර කළා. ඒ වෙලාවට මට අමන ගතියක් දැනුණත්, එහෙම කරන්න කියලා ටයිසන් නිතරම මගෙන් ඉල්ලුවා. මට හිතෙන විදිහට ඒකට හේතුව වෙන්න ඇත්තේ එයාගේ මුළු ඇඟේම රෝම තිබුණ නිසාත්, එයාගේ පිට දරුණු තුවාල කැළැල්වලින් වැසී තිබුණ නිසාත් වෙන්නැති. ඒ කැළැල් ගැන එයාගෙන් අහන්න තරම් ධෛර්යයක් මගේ හිතට කවදාවත් ආවේ නැහැ. ටයිසන් ඇඳුම් මාරු කරන අතරේදී කවුරු හරි එයාට කොලොප්පම් කළොත් එයා කලබල වෙලා, අල්මාරිවල දොරවල් පවා ගලවා දමන බව මම අද්දැකීමෙන් දැන සිටියා.

අපි ව්‍යායාම ශාලාවට යද්දි පුහුණුකරු නන්ලි, එයාගේ පුංචි මේසයේ වාඩිවෙලා ක්‍රීඩා සඟරාවක් කියවමින් සිටියා. අවුරුදු



මිලියනයක් විතර වයසක නන්ලි බෝතල්-අඩි කණ්ණාඩි දාන, කටේ එක දතක්වත් නැති, තෙල් බේරෙන අළු පාට කොණ්ඩයක් ඇති කෙනෙක්. එයාව දකිද්දි මට අර්ධ-ලෝහිත කඳවුරේ ඔරැකල්ව - ඒ කියන්නේ, වකුළු ගැසුණු මමියක් - මතක් වුණා. හැබැයි නන්ලි වැඩ කළේ ඊටත් වඩා හෙමින්. ඒ වගේම, එයා කවදාවත් කොළ පාට දුම් පිට කළෙත් නැහැ. අඩු තරමේ, එහෙම කරනවා මට දකින්න ලැබිලා නැහැ.

"කෝච්, මම නායකයා වෙන්න ද?" මැට් ස්ලෝන් ඇසුවා.

"එහ්?" පුහුණුකරු නන්ලි සඟරාවෙන් ඔළුව ඔසවා බැලුවා. "ඔව්," එයා මිමිණුවා. "මිහ්-හ්මම්," දත නියවූ මැට් ස්ලෝන් කණ්ඩායම් බෙදන්න පටන් ගත්තා. අනෙක් කණ්ඩායමේ නායකයා විදිහට එයා මාව පත් කළා. ඒත්, මගේ කණ්ඩායමට මම කාව තෝරගත්තත් වැඩක් නොවුණේ දක්ෂ, ජනප්‍රිය ළමයි ඔක්කොම ස්ලෝන්ගේ පැත්තට මාරු වුණ නිසයි. අලුත් ළමයි ටිකත් ඒ පැත්තටම ගියා.

මගේ කණ්ඩායමට ඉතිරි වුණේ ටයිසන්, කුරේ බේලර් කම්පියුටර් පිස්සා, රාජ් මණ්ඩාලි කියන ඉන්දියානු කොල්ලා, ස්ලෝන් සහ එයාගේ යාළුවන්ගේ අඩන්තේට්ටම්වලට නිතරම ගොදුරු වෙන තවත් ළමයි දුසිම් බාගයක් විතරයි. සාමාන්‍යයෙන් නම් මගේ කණ්ඩායමට ටයිසන් විතරක් හිටියත් මට ඇති. මොකද, කණ්ඩායමෙන් බාගයකගේ වැඩ එයාට තනියම කරන්න පුළුවන්. ඒ වුණත් අද ස්ලෝන්ගේ කණ්ඩායමට එකතු වී සිටි අලුත් ළමයි හයදෙනාත් ටයිසන් තරමටම උස, ශක්තිමත් පෙනුමක් ඇති අය වුණා. මැට් ස්ලෝන් කූඩයක් පුරවා තිබූ බෝල ශාලාව මැදට හැලුවා.

"බයයි," ටයිසන් කෙඳිරුවා. "අමුතු ගඳයි."

මම එයා දිහා බැලුවා. "මොනවද අමුතු ගඳ?" මම ඇසුවේ එයා, එයා ගැනම කියනවා ද කියලා මට හිතාගන්න බැරි වුණ නිසා.

"අර කට්ටිය," ටයිසන් ස්ලෝන්ගේ අලුත් යාළුවෝ දෙසට ඇඟිල්ල දිගු කළා. "අමුතු ගඳයි." මරන්න නියමිත සත්තු දිහා බලනවා වගේ අපේ දෙස බලාගෙන එයාලා අත්වල කරගැට කැඩුවා. එයාලා කොහෙන් ආවාද හිතලා පුදුම නොවී ඉන්න මට බැරි වුණා. සමහරවිට අමු මස් කන්න දීලා, කෝටුවලින් ගහලා ළමයි හදන තැනකින් වෙන්නැති.

Scanned with CamScanner

ස්ලෝන් පුහුණුකරුගේ නළාව පිඹිනාට පස්සේ තරගය පටන් ගත්තා. ස්ලෝන්ගේ කණ්ඩායමේ අය මැද සීමාවට දුවගෙන ආවා. මගේ කණ්ඩායමේ රාජ් මණ්ඩාලි උර්දු භාෂාවෙන් මොනවදෝ මොරදීලා පිටවීම දෙසට දිව්වා. සමහරවිට එයා කියන්න ඇත්තේ, "මට ටොයිලට් යන්න ඕනෑ!" කියලා වෙන්නැති. කුරේ බේලර් බිත්ති කළාලයක් ඇතුළට රිංගා හැංගෙන්න උත්සාහ කළා. මගේ කණ්ඩායමේ අනෙක් අයත් බියෙන් ඇකිළිලා, ඉලක්ක නොවී ඉන්න බැලුවා.

"ටයිසන්," මම කතා කළා. "අපි ය-"

වේගයෙන් ආ බෝලයක් මගේ බඩේ වැදුණා. ව්‍යායාම ශාලාව මැද මාව ඉන්දවෙද්දී අනෙක් කණ්ඩායමේ හිනාවක් පුපුරා ගියා.

මගේ ඇස් දෙක බොඳවුණා. මට දැනුණේ ගෝරිල්ලෙක් මගේ බඩට ගැහුවා වගෙයි. කිසිම කෙනෙකුට ඒ තරම් තදින් බෝලයක් විසි කරන්න පුළුවන් ඇති කියලා මට විශ්වාස කරන්නත් බැරි වුණා.

"පර්සි, පාත් වෙන්න!" ටයිසන් මොරදුන්නා.

මම පැත්තකට පෙරළෙද්දීම මගේ කන ළඟින් බෝලයක් ශබ්දයේ වේගයෙන් ඇදිගියා. වූම්!

එය බිත්ති කළාලයේ වදිද්දී කුරේ බේලර් වේදනාවෙන් කෑගැසුවා.

"ඒයි!" මම ස්ලෝන්ගේ කණ්ඩායමට කෑගැසුවා. "ඔයාලා කාවහරි මරන්නද හදන්නේ!" ජෝ බොබ් නම් අලුත් ළමයා මට යක්ෂ හිනාවක් පෑවා. කොහොමහරි, එයා දැන් ගොඩක් ලොකුයි වගෙයි... ටයිසන්ටත් වඩා උස ගිහින් වගෙයි. එයාගේ ටී-ෂර්ට් එකට යටින් අත්වල මාංශ පේශී ඉලිප්පී පෙනුණා. "මටත් ඕනෑ ඒකම තමයි, පර්සියස් ජැක්සන්! මටත් ඕනෑ ඒකම තමයි!"

එයා මගේ නම කියනවා ඇහෙද්දී මගේ කොඳු ඇටපෙළ දිගේ සීතලක් පැතිරුණා. මගේ සැබෑ අනන්‍යතාවය දන්නා අය ඇර වෙන කිසිම කෙනෙක් මට පර්සියස් කියලා කතා කරන්නේ නැහැ. මගේ යාළුවෝ... සහ හතුරෝ.

ටයිසන් මොකක්ද කිවුවේ? එයාලා අමුතු ගඳයි.

රාක්ෂයෝ.



මැට් ස්ලෝන් වටේ සිටි අලුත් ළමයි ප්‍රමාණයෙන් විශාල වෙන්න ගත්තා. එයාලා තවදුරටත් ළමයි නෙවෙයි. අඩි අටක් උස, වනචාරී ඇස් සහ උල් දත් ඇති යෝධයෝ වුණ එයාලගේ ලොම් පිරුණ අත්වල නයි, හවායි ගැහැනු රූප වගේම වැලන්ටයින් හදවත් රූපත් පච්චා කොටා තිබුණා.

මැට් ස්ලෝන්ගේ අතින් බෝලය බිමට වැටුණා. "හෝව්! ඔයාලා ඩිට්‍රොයිට්වල අය වෙන්න බෑ! කවුද..." එයාගේ කණ්ඩායමේ අනෙක් අය බෙරිහන් දෙමින් පිටවීම දෙසට දුවන්න ගත්තා. ඒත් ඇටමිදුළු උරන්නා කියන යෝධයා නිවැරදිම ඉලක්කයට විසිකළ බෝලය පිටවීමේ දොර ළඟින්ම සිටි රාජ් මණ්ඩාලිවත් පසු කරගෙන ගොස් දොරේ වැදුණාම මායාවකින් වගේ දොර තදින් වැහුණා.

රාජ් සහ තවත් ළමයි කීප දෙනෙක් එයට තඩිබෑවත් දොර හෙලවුණේවත් නැහැ.

"එයාලට යන්න දෙනවා!" මම යෝධයින්ට කෑගැසුවා.

ජෝ බොබ් මට ගෙරෙව්වා. එයාගේ බාහුවේ 'ජේ.බී ලව්ස් බේබි කේක්ස්' කියලා පච්චා කොටා තිබුණා. "එහෙම කරලා අපේ රස කෑම ටික නැති කරගන්න ද? නෑ, සමුද්‍ර දෙවියන්ගේ පුත්‍රයෝ. අපි ලයිස්ට්‍රිගෝනියන්ලාට ඕනෑ නුඹගේ මරණය විතරක් නෙවෙයි. අපිට දවල් කෑමත් ඕනෑ!"

එයා අත වනද්දී මැද සීමාවේ අලුත් ඩොඩ්ජ්බෝල ගොන්නක් මතු වුණා- හැබැයි ඒවා රබර් බෝල නෙවෙයි. කාලතුවක්කු උණ්ඩ තරම් ලොකු ඒවා සාදා තිබුණේ ලෝකඩවලින්. ඒ බෝල වටා තිබුණු සිදුරුවලින් පිටතට ගින්දර දලු දැමුවා. ඒවා ගිනියම් වී තිබෙන්න ඇති වුණත්, යෝධයෝ කිසිම පැකිළීමක් නැතිව ඒවා අතට ගත්තා.

"කෝච්!" මම මොර දුන්නා.

නන්ලි නිදිමතෙන් වගේ ඔළුව එසෙව්වා. ඒත් මේ ඩොඩ්ජ්බෝල තරගයේ මොකක් හෝ අසාමාන්‍ය දෙයක් දකින්න ලැබුණත්, එයා ඒ බව පෙන්නුවේ නැහැ. සාමාන්‍ය මිනිස්සුන්ගේ ප්‍රශ්නය ඒකයි. මීදුම ලෙසින් හඳුන්වන මායා බලයකින් රාක්ෂයින්ගේ සහ දෙවිවරුන්ගේ සැබෑ ස්වරූප එයාලාගේ ඇස්වලින් වසන් කරන නිසා, සාමාන්‍ය මිනිස්සු දකින්නේ එයාලට තේරුම් ගන්න පුළුවන් දේවල් විතරයි. සමහරවිට පුහුණුකරු දකින්න ඇත්තේ වෙනදා වගේම අට වසරේ ළමයි ටිකක් ඇවිත් අපේ ළමයින්ට තඩිබානවා වෙන්නැති. ඒ වගේම

අනෙක් ළමයින් දකින්න ඇත්තේ මැට් ස්ලෝන්ගේ මැර යාළුවෝ පෙට්‍රල් බෝම්බ දාන්න සූදානම් වෙනවා වෙන්නැති. (මොකද, මීට කලිනුත් එහෙම වෙලා තියෙනවා.) ඒ කොහොම වුණත්, මිනීමස් කන, ලේ පිපාසිත රාක්ෂයෝ එක්ක අපිට ගනුදෙනු කරන්න වෙලා තියෙන බව වෙන කවුරුවත්ම තේරුම් නොගත් බව නම් මට සහතික වුණා.

"ඔව්. මින්-හ්මම්." පුහුණුකරු කෙඳිරුවා. "හොඳට සෙල්ලම් කරනවා."

ඊට පස්සේ එයා ආපසු සඟරාවට ඔළුව ඔබාගත්තා.

හිස්කබල් කන්නා කියන යෝධයා, එයාගේ බෝලය විසි කළා. මම පැත්තකට නැමෙද්දි ඒක උල්කාපාතයක් වගේ මගේ උරහිස ළඟින් ඇදී ගියා.

"කුරේ!" මම බෙරිහන් දුන්නා.

ටයිසන් කළාලය පිටුපසින් එයාව එළියට ඇදලා ගන්නකොටම බෝලය එහි වැදිලා, කළාලය දුම් දමන කඩමාල්ලක් බවට පත් කළා.

"දුවන්න!" මම, මගේ කණ්ඩායමේ අයට කිවුවා. "අනිත් දොරෙන් යන්න!"

එයාලා අල්මාරි කාමරය දෙසට දිවුවත්, ජෝ බොබ් නැවත වතාවක් අත වනද්දි ඒ දොරත් තදින් වැසුණා.

"පැරදුණ අයට මිසක් වෙන කාටවත් එළියට යන්න බැහැ!" ජෝ බොබ් ගර්ජනා කළා. "ඔයාලා පැරදුණ අය වෙන්නේ අපි ඔයාලව කෑවම!" එයා අතේ තිබුණු ගිනි බෝලය විසි කළා. එය ව්‍යායාම ශාලාව මැද වළක් සාදද්දි මගේ කණ්ඩායමේ අය සිසිකඩ දිව්වා. මම නිතරම ළඟ තබාගන්න රිප්ටයිඩ් ගන්න මගේ අත සාක්කුව දෙසට ඇදුණා. ඒත් මම ක්‍රීඩා කොට කලිසම ඇඳගෙන ඉන්න බව මතක් වුණේ එතකොටයි. ඒකේ සාක්කු තිබුණේ නැහැ. රිප්ටයිඩ් ඇත්තේ මම අල්මාරියට එබුව කලිසමේ සාක්කුව ඇතුළේ. ඒ මදිවට අල්මාරි කාමරයේ දොරත් වැහිලා. මම සම්පූර්ණයෙන්ම නිරායුධයි.

තවත් ගිනි බෝලයක් එක එල්ලේම මගේ දෙසට ආවා. ටයිසන් මාව පසෙකට ඇද ගත්තත්, එයින් වූ පිපුරුමෙන් මාව උඩින් විසිවුණා. ව්‍යායාම ශාලාවේ පොළොව මත මම හතරගාතෙන් වැටුණාම මගේ ඇස් දුමෙන් වැහිලා, මගේ බතික් ටී-ෂර්ට් එකේ දුම් දමන හිල් සෑදී



තිබුණා. එතැන මැද සීමාව ළඟම බඩගිනිකාර යෝධයෝ දෙන්නෙක් මගේ දිහාවට ඇස් දල්වාගෙන සිටියා.

"මස්!" එයාලා තප්පුලෑවා. "දවල් කෑමට වීරයෙකුගේ මස්!" ඒ දෙන්නම කුරුමානම් ඇල්ලුවා.

"පර්සිට උදවු ඕනෑ!" මොරදුන් ටයිසන් රාක්ෂයෝ බෝල විසි කරද්දීම ඉදිරියට පැන්නා.

"ටයිසන්!" මම බෙරිහන් දුන්නා, ඒත් පරක්කු වැඩියි.

බෝල දෙකම එයාගේ වැදුණා... ඒත් නෑ.... එයා ඒවා අල්ලගත්තා. විද්‍යාගාරයේ බෝතලයක් අතින් අල්ලගන්න බැරි, හැම දවසකම ක්‍රීඩා පිට්ටනියේ සෙල්ලම් බඩු කඩන ටයිසන් පැයට සැතපුම් බිලියනයක විතර වේගයෙන් එයා දෙසට ඇදුණු ගිනි බෝල දෙකක් අල්ලගත්තා. පුදුමයෙන් බලා සිටි අයිතිකරුවන්ටම එයා ඒවා ආපසු යැවුවා. "නපුරා...!" ලෝකඩ බෝල වදිද්දී කෑගැසූ එයාලා ගිනිදලු කඳන් දෙකකට හැරී අළු වී ගියා- ඒ එයාලා රාක්ෂයෝ බව සහතික කරන ලකුණක්. මෙහෙමයි, රාක්ෂයෝ මැරෙන්නේ නැහැ. එයාලා නිකංම දුමකට සහ දූවිල්ලකට හැරිලා අතුරුදහන් වෙනවා විතරයි. ඒක නිසා සටනක් අවසානයේදී වීරයන්ට පිරිසුදු කිරීම ගැන කරදර වෙන්න ඕනෑ නැහැ.

"මගේ සහෝදරයෝ!" ජෝ බොබ් විලාප තැබුවා. එයා මාංශ පේශි සොලවද්දී එයාගේ බේබි කේක් පච්චය රැළි ගැසුණා. "එයාලගේ විනාශයට නුඹට වන්දි ගෙවන්න වෙයි!"

"ටයිසන්!" මම කතා කළා. "බලාගෙන!"

තවත් උල්කාපාතයක් අපේ දෙසට වේගයෙන් ඇදී ආවා. එය පැත්තකට විසි වෙන්න ටයිසන් අතින් පහරක් ගසද්දී පුහුණුකරු නන්ලිගේ ඔළුවට උඩින් පියඹා ගිය බෝලය මහ හඬක් නගමින් වැටුණා.

පොළොවේ තැනින් තැන ඇති දුම් දමන වළවල් මග ඇරීමට උත්සාහ කරමින් ළමයින් බෙරිහන් දෙමින් එහෙ-මෙහෙ දිව්වා. තවත් සමහරු උදවු ඉල්ලා දොරට ගැසුවා. ස්ලෝන් විතරක් ශාලාව මැද ගල් ගැහිලා, වටේට පියාඹන මරණයේ බෝල දෙස අවිශ්වාසයෙන් බලා සිටියා.

Scanned with CamScanner

තන්ලිට තවමත් කිසිවක් පෙනිලා නැහැ. එයාට බාධාවක් වෙනවා වගේ ශ්‍රවණාධාරකයට තට්ටු කළත්, එයා සඟරාවෙන් ඔළුව ඔසවන්න නම් මහන්සි වුණේ නැහැ.

අනිවාර්යයෙන්ම, මුළු ඉස්කෝලෙටම මේ ඝෝෂාව ඇහෙනවා ඇති. විදුහල්පති, පොලිසිය, මේ කවුරුහරි අපේ උදව්වට ඒවි.

"ජය අපිටයි!" ජෝ බොබ් ගර්ජනා කළා. "අපි නුඹලාගේ ඇටකටුවලින් පාටි දානවා!" එයා මේ ඩොඩ්ජ්බෝල තරගය ගැන ඕනෑවටත් වඩා බරපතළ විදිහට හිතනවා කියන්න මට ඕනෑ වුණා. ඒත්, මම කට අරින්නත් කලින් එයා තවත් බෝලයක් අතට ගත්තා. අනෙක් යෝධයෝ තුන්දෙනාත් එයාව අනුකරණය කළා.

දැන් නම් අපිට ගැලවීමක් නැති බව මට තේරුණා. ඒ බෝල ඔක්කොම වෙන පැත්තකට හරවන්න ටයිසන්ට පුළුවන්කමක් නැහැ. කලින් ආපු බෝල ඇල්ලුවාම එයාගේ අත් හොඳටෝම පිච්චෙන්න ඇති. මගේ කඩුව නැතිව... මට පිස්සු අදහසක් පහළ වුණා.

මම අල්මාරි කාමරය දෙසට දිව්වා.

"අයින් වෙන්න!" මම, මගේ කණ්ඩායමේ අයට කිව්වා. "දොරෙන් ඈතට යන්න!" මට පිටුපසින් පිපිරීමක් ඇසුණා.

ටයිසන් බෝල දෙකක් අල්ලාගෙන, ඒවා අයිතිකාරයින්ටම ආපසු හරවා යවලා එයාලව අළු දූවිලි කරලා තිබුණා.

එයින් පස්සේ ඉතිරිව සිටියේ තවත් යෝධයෝ දෙන්නෙක් විතරයි.

තුන්වෙනි බෝලය කෙලින්ම මගේ ඉදිරියට පියඹා ආවා. එය ළඟටම එන තුරු බලා ඉන්න මම, මටම බල කළා- එකයි දෙකයි තුනයි- ඊට පස්සේ මම පැත්තකට පනිද්දීම ගිනි බෝලය වැදිලා දොර කැලිවලට කැඩුණා. මෙහෙමයි, පිරිමි ළමයින්ගේ අල්මාරි කාමර ඇතුළේ හැදෙන ගෑස් පිපුරුමක් සිද්ධ වෙන්න ප්‍රමාණවත් ඇති කියලා මට කලින්ම හිතුණා. ඉතින්, ගිනි බෝලය වදිද්දීම ඇසුණු දඩෝං! හඬට මම පුදුම වුණේ නැහැ.

දෙකට පැළුණු බිත්තිය හරහා අල්මාරි දොරවල්, මේස්, ක්‍රීඩා උපකරණ වගේම එක එක ජාතියේ පුද්ගලික බඩු ව්‍යායාම ශාලාවට වැහි වැස්සා.



ආපසු හැරුණු මට, ටයිසන් හිස්කබල් කන්නාගේ මූණට අනිනවා දකින්න ලැබුණා. ඒ යෝධයා කඩාගෙන වැටුණා. ඒත් අන්තිම යෝධයා- ජෝ බොබ් නුවණක්කාර ලෙස බෝලය අතේ තියාගෙන, අවස්ථාවක් ලැබෙන තුරු බලා සිටියා. එයාට මුහුණ දෙන්න ටයිසන් හැරෙද්දීම යෝධයා බෝලය දැමුවා.

"එපා!" මම මොරදුන්නා.

ඉලක්කයට ඉගිලී ගිය බෝලය ටයිසන්ගේ පපුවේ වැදුණු වේගයට ශාලාව හරහා ලිස්සා ගිය එයා පිටුපස බිත්තියේ හැප්පුණා. ඉරිතැළුණු බිත්තියේ කොටසක් ටයිසන් උඩට කඩා වැටුණේ අනෙක් පස පාරට ඇරුණු අලුත් දොරක් සාදමින්. ටයිසන් තවමත් ජීවතුන් අතර ඉන්නේ කොහොමද කියලා මට හිතාගන්න බැරි වුණා, ඒත් එයා හිටියේ තෝන්තු වෙලා විතරයි. එයාගේ පාමුල ලෝකඩ බෝලය දුම් දමමින් තිබුණා. ටයිසන් එය අහුලගන්න උත්සාහ කළත්, එයාව ආපස්සට ඇද වැටුණා.

"හොඳයි!" ජෝ බොබ් උදම් ඇනුවා. "මම විතරයි ඉතුරු වෙලා ඉන්නේ! දැන් මට පුළුවන් බේබි කේක්ට මස් ගොඩාක් ගෙනියන්න!"

තවත් බෝලයක් අහුලගත් එයා ටයිසන්ට කුරුමානම් ඇල්ලුවා.

"නවත්තනවා!" මම කෑගැසුවා. "ඔහේට ඕනෑ මාව නේ!"

යෝධයා විරිත්තුවා. "මුලින්ම මැරෙන කෙනා වෙන්ඩ කැමතිද, තරුණ වීරයෝ?"

මම මොනවා හෝ කළ යුතුව තිබුණා. මේ ළඟපාතකම රිප්ටයිඩ් තියෙන්න ඕනෑ.

ඒ වෙලාවේ මට දකින්න ලැබුණේ යෝධයාගේ කකුල් ළඟම දුම් දමන රෙදි පොදියක තිබුණු මගේ කලිසම. මට එතැනට යන්න පුළුවන් නම්... ඒක බලාපොරොත්තු රහිත බව දැන දැනම මම ඉදිරියට දිව්වා.

යෝධයා මහ හඬින් හිනාවුණා. "මගේ දවල් කෑම ළඟටම එනවා." එයා බෝලයෙන් පහර දෙන්න සූදානමෙන් අත ඔසවද්දී මම මැරෙන්න හිත හදාගත්තා. ඒත් හදිසියේම, යෝධයාගේ ඇඟ දරදඬු වුණා. එයාගේ මුහුණේ තිබුණු උද්දච්ච බැල්ම පුදුමයකට හැරුණා. එයාගේ බඩේ පෙකණිය තිබිය යුතු තැනින් ටී-ෂර්ට් එක පලාගෙන අඟක් මතුවුණා - නෑ, අඟක් නෙවෙයි - තලයක දිලිසෙන තුඩක්.

එයාගේ අතෙන් බෝලය අතැරුණා. මේ දන් එයාගේ පිටුපසින්, ඇග හරහා ගිය කිණිස්ස දෙස රාක්ෂයා පුදුමයෙන් බලා සිටියා.

"උයි," කෙඳිරූ රාක්ෂයා කොළ පාට ගිනිදැල් ගොඩකට හැරුණා. බෙබිකේක්වට නම් ගොඩාක් දුක හිතෙයි, මට හිතුණා.

පැතිරෙමින් තිබුණු දුම මැද සිටගෙන සිටියේ මගේ යාළුවා, ඇනබෙත්. එයාගේ මුහුණේ තුණු ගෑවිලා, හීරිලා තිබුණා. ඉරී ගිය ගමන් මල්ලක් කරේ එල්ලාගෙන සිටි එයා බේස්බෝල් කැප් එක සාක්කුවක ඔබාගෙන සිටියා. එයා ලෝකඩ කිණිස්ස තදින් අල්ලාගෙන, වියරු බැල්මෙන් බලා සිටියේ හරියට සැකපුම් දහස් ගාණක් පුරාවට සටන් කරමින් ඇවිල්ලා වගෙයි.

එතරම් වෙලා තුෂ්ණිම්භූතව බලා සිටි මැට් ස්ලෝන්ට අන්තිමේදී පියවි සිහිය ආවා. ඇනබෙත් දෙස බැලූ එයා තදින් ඇහිපිය ගැසුවේ මගේ සටහන් පොතේ තිබුණු පින්තූරයෙන් එයාව හඳුනගත්තා වගෙයි.

"එයා තමයි අර ගෑනු ළමයා.... එයා තමයි-"

ඇනබෙත් එයාගේ නහය මැද්දට දුන් පහරෙන් එයාව බිමට සමතලා වුණා. "එතකොට ඔහේ," එයා ස්ලෝන්ට කිවුවා, "මගේ යාළුවාට පාඩුවේ ඉන්න දෙනවා."

ගිනි ගන්නා ව්‍යායාම ශාලාව පුරා ළමයින් තවමත් කෑගසමින් එහෙමෙහෙ දුවමින් සිටියා. සයිරන් නළා හඬකුත්, අන්තර්-සන්නිවේදන ජාලයෙන් කතා කරන ගොරෝසු හඬකුත් මට ඇසුණා. අපේ විදුහල්පති, මිස්ටර් බොන්සායි දොරේ අගුල සමග පොර බදනවාත්, එයාට පිටුපසින් ගුරුවරු රොක්වෙනවාත් පිටවීම් දොරටුවේ වීදුරුව හරහා මට පෙනුණා.

"ඇනබෙත්..." මම ගොත ගැහුවා. "ඔයා කොහොමද... ඔයා කොච්චර වෙලා..."

"මුළු උදේ වරුවම වගේ." එයා ලෝකඩ කිණිස්ස කොපුවට දමාගත්තා. "මම ඔයාට කතා කරන්න හොඳ වෙලාවක් බල බලා හිටියේ. ඒත් ඒ කිසිම වෙලාවක ඔයා හිටියේ තනියම නෙවෙයි."

"අද උදේ මම දැකපු හෙවණැල්ල - ඒ හිටියේ-" මගේ කම්මුල් රත් වෙනවා වගේ මට දැනුණා. "ඔහ්, දෙවියනේ, ඔයා මගේ කාමරේ ජනේලෙන් බලාගෙන හිටියා නේද?"



"ඒවා විස්තර කරන්න වෙලාවක් නැහැ!" එයා මගේ ඇඟට කඩා පැන්නත්, එයාගේ මුහුණත් ටිකක් රතු වෙලයි තිබුණේ. "මට ඕනෑ වුණේ නැහැ- "

"අන්න!" ගැහැනු කෙනෙක් බෙරිහන් දුන්නා. වේගයෙන් ඇරුණු දොරෙන් ඇතුළට වැඩිහිටියෝ රැස්කමින් ආවා.

"එළියෙදි මුණගැහෙමු." ඇනබෙත් මට කිවුවා. "එතකොට අරයා." එයා තවමත් තෝන්තුවෙන් බිත්තියට හේත්තුව වාඩි වී සිටි ටයිසන්ව පෙන්වූවා. ඇනබෙත් එයාට හෙළූ අප්‍රසන්න බැල්ම මට කොහෙත්ම තේරුම් ගන්න බැරි වුණා.

"ඔයා එයාවත් එක්ක ආවොත් හොඳයි."

"මොකට ද?"

"වෙලාවක් නෑ!" එයා කිවුවා. "ඉක්මනට!"

එයාට අම්මාගෙන් ලැබුණු මායා තෑග්ගක් වූ යැන්කී බේස්බෝල් කැප් එක දමාගත් ඇනබෙත්, එසැණින්ම අතුරුදහන් වුණා.

එයින් වුණේ ආචාර්ය මණ්ඩලයෙන් බාගයකුත් පොලිස් නිලධාරීන් දෙන්නෙකුත් සමග විදුහල්පති කඩාගෙන බිඳගෙන ඇතුළට එද්දි, ගිනි ගන්නා ශාලාව මැද මම තනිවුණ එකයි.

"පර්සි ජැක්සන්?" මිස්ටර් බොන්සායි කතා කළා. "මොකක්ද... කොහොමද..." අනෙක් කෙළවරේ කැඩුණු බිත්තිය ළඟ සිටි ටයිසන් කෙඳිරිගාමින්, යබොර ගඩොල් ගොඩක් පෙරළාගෙන නැගිට්ටා. "ඔළුව රිදෙනවා."

මැට් ස්ලෝන් අපේ පැත්තට ආවා. එයා භීතියට පත් වූ බැල්මකින් මගේ දිහා බැලුවා. "පර්සි තමයි ඒක කළේ, මිස්ටර් බොන්සායි! එයා මුළු ගොඩනැගිල්ලටම ගිනි තිබ්බා. බොරු නම් කෝච් නන්ලිගෙන් අහලා බලන්ඩ! එයා හැමදේම දැක්කා!" මහත් උවමනාවෙන් සඟරාව කියවමින් සිටියත්, මගේ වෙලාවටම වගේ ස්ලෝන් එයාගේ නම කියද්දිම නන්ලි ඔළුව ඔසවා බැලුවා. "එහ්? ඔව්. මහ්-හ්ම්ම්." අනෙක් වැඩිහිටියෝ හැමෝම මගේ දිහාවට හැරුණා. එයාලා කීයටවත් මාව විශ්වාස නොකරන බව මට තේරුණා, අඩු තරමේ, එයාලට ඇත්ත කියන්න මට පුළුවන් වුණත් එහෙමයි.

මම විනාශ වුණ කලිසමෙන් රිප්ටයිඩ් ඩැහැගෙන ටයිසන්ට කතා කළා, "ඉක්මනට එන්න!" ඊට පස්සේ, ගොඩනැගිල්ලේ පැත්තකින් සෑදී තිබුණු අලුත් සිදුරෙන් මම පාරට පැන්නා.

Scanned with CamScanner

## 03

# අපි සදාකාලික වධයේ කුලී රියට නැග්ගා

වර්ච් වීදියේ පටු පාරක ඇනබෙත් අපි එන තුරු බලා සිටියා. ගිනි නිවන ට්‍රක් රථයක් මොරගසමින් මෙරිවෙදර් ඉස්කෝලෙ දෙසට ඇදෙද්දී එයා මාවයි, ටයිසන්වයි පදික වේදිකාවෙන් ඇදලා ගත්තා.

"මෙයාව කොහෙන්ද හොයාගත්තේ?" ඇනබෙත් ටයිසන්ව පෙන්වමින් ප්‍රශ්න කළා. වෙන වෙලාවකදි නම් එයාව දකින්න ලැබුණාම මම ගොඩාක් සතුටු වෙන්න තිබුණා. එයාගේ අම්මා ඇතීනායි, මගේ තාත්තායි එදිරිවාදියෝ කියන කාරණේ පැත්තකට දාලා ගිය ගිම්හානයේදි අපි දෙන්නා සමාදාන වුණා. ප්‍රසිද්ධියේ පිළිගන්න අකමැති වුණත්, ඇනබෙත් නැතිව මම ගොඩක් පාළුවෙන් හිටියේ. ඒත්, මම මේ දැන් මිනීමස් කන රාක්ෂයෝ රැනකගේ ප්‍රහාරයට මැදිවුණා, ඒ වෙලාවේ මගේ ජීවිතය තුන්-හතර පාරක්ම බේරගත්තේ ටයිසන්, ඒ ඔක්කොටම පස්සෙත් ඇනබෙත් එයාට රවන්නේ හරියට මෙතැන ප්‍රශ්නය එයා වගෙයි.

"එයා මගේ යාළුවා," මම උත්තර දුන්නා.

"එයා අනාථ කෙනෙක් ද?"

"ඒකෙන් ඇති වැඩේ මොකක් ද? ඔයා දන්නවනේ, එයාගේ කන් හොඳට ඇහෙනවා. ඒ නිසා, ඔයාම එයාගෙන් අහගන්නව ද?"

ඇනබෙත් පුදුම වුණා වගෙයි පෙනුණේ. "එයාට කතා කරන්නත් පුළුවන් ද?"

"මට පුළුවන්," ටයිසන් පිළිගත්තා. "ඔයා ලස්සනයි."

"ඔහ් ෂික්!" ඇනබෙත් එයාගෙන් අඩියක් ඈත් වුණා.



එයා ඔය තරම් නපුරු ලෙසින් හැසිරෙන හේතුව මට හිතාගන්න බැරි වුණා. ගිනිබෝල අල්ලා හොඳටම පිළිස්සී තිබිය යුතු ටයිසන්ගේ දෑත් මම පරීක්ෂා කළා. ඒත් ඒවාට කිසිම දෙයක් වෙලා නැහැ. ඒවා ඉස්සර වගේම කැළැල් පිරුණු, කුණු ගෑවුණු, අල පෙති තරම් ලොකු නියපොතු ඇති අත් දෙකක්. "ටයිසන්," ඇස් අදහාගන්න බැරුව මම කතා කළා. "ඔයාගේ අත් පිච්චිලා නැනේ."

"නෑ තමයි," ඇනබෙත් කෙඳිරුවා. "මෙයා ළඟ ඉන්නකොට ඔයාව මරන්න ලයිස්ට්‍රිගෝනියන්ලා ආපු එකම පුදුමයි."

ඇනබෙත්ගේ තඹ පාට කොණ්ඩයට ටයිසන් වශීවෙලා වගෙයි. එයා ඒක අල්ලන්න හැදුවත්, ඇනබෙත් එයාගේ අත ගසා දැමුවා.

"ඇනබෙත්," මම කතා කළා, "ඔයා මොකක්ද කිවුවේ? ලයිස්ට්‍රි-මොක්කු ද?"

"ලයිස්ට්‍රිගෝනියන්ලා. අර ව්‍යායාම ශාලාවේ හිටපු රාක්ෂයෝ. උන් ඈත උතුරේ ජීවත්වෙන මිනීමස් කන යෝධයෝ ජාතියක්. වතාවක් ඔඩිසියස්ටත් උන් එක්ක හැප්පෙන්න වුණා. ඒත්, උන් නිව්යෝක් තරම් දකුණේ ඈතට ඇවිත් ඉන්නවා මීට කලින් කවදාවත් මම දැකලා නැහැ."

ලයිස්ට්- මට ඒ නම කියවන්නත් බැහැ. ඉංග්‍රීසියෙන් උන්ට කියන්නේ මොකක් ද?" එයා මොහොතක් කල්පනා කළා. ''කැනේඩියානුවෝ," එයා තීරණය කළා. "දැන්, ඉක්මන් කරන්න. අපි මෙහෙන් පිටවෙන්න ඕනෑ."

"පොලිසිය මගෙ පස්සෙන් පන්නයි."

"ඒක ඒ හැටි ප්‍රශ්නයක් නෙවෙයි," එයා කිවුවා. "ඔයාට හීන මොනවත් පෙනුණ ද?"

"හීන... ග්‍රෝවර් ගැන ද?"

එයාගේ මූහුණ සුදුමැලි වුණා. "ග්‍රෝවර්? නෑ, ග්‍රෝවර් ගැන මොනවද?"

මම, මගේ හීනය ගැන එයාට කිවුවා. "ඇයි? ඔයා මොනවද හීනෙන් දැක්කේ?" එයාගේ ඇස් කැළඹෙන්න ගත්තේ හරියට එයාගේ හිත පැයට සැතපුම් මිලියනයක වේගයෙන් දුවනවා වගෙයි.

"කඳවුර," අන්තිමේදි එයා කිවුවා. "කඳවුරේ ලොකු කරදරයක්."

"අම්මත් ඔය කතාවම කිවුවා! ඒත් මොනවගේ කරදරයක් ද?"

Scanned with CamScanner

"මාත් හරියටම දන්නෑ. මොකක්හරි වැරැද්දක් වෙලා. අපි දන්මම එහෙට යන්න ඕනෑ. වර්ජිනියා ඉඳන් එද්දී මග දිගටම රාක්ෂයෝ මාව නවත්තන්න හැදුවා. ඔයාටත් රාක්ෂ කරදර වුණාද?" මම ඔළුව හෙල්ලුවා. "මේ අවුරුද්දටම එක පාරක්වත් නැහැ... අද වෙනකල්ම."

"එක පාරක්වත් නෑ? ඒත් කොහොමද..." එයාගේ ඇස් ටයිසන් දෙසට හැරුණා. "ඕහ්."

"ඇයි ඔයා 'ඕහ්' කිව්වේ?"

තාමත් පන්ති කාමරයේ ඉන්නවා වගේ ටයිසන් අතක් එසෙව්වා. "ව්‍යායාම ශාලාවේ හිටිය කැනේඩියානුවෝ පර්සිට මොකක්දෝ කියලා කතා කළා... සමුද්‍ර දෙවියන්ගේ පුත්‍රයා?"

මම ඇනබෙත් සමග බැල්මක් හුවමාරු කරගත්තා.

ඒ දේවල් කොහොම තේරුම් කරන්නද කියලා මම දන සිටියේ නැහැ. ඒ වුණත් රාක්ෂයෝ අතින් මැරෙන්න ගිය එයාට ඇත්ත දැනගන්න අයිතියක් තියෙනවා කියලා මට හිතුණා.

"ලොකු යාළුවා," මම කිව්වා, "ග්‍රීක දෙවිගොල්ලෝ ගැන කියන පරණ කතන්දර ඔයා අහලා තියෙනවද? සියුස්, පොසෙයිඩන්, ඇතීනා ගැන එහෙම-"

"ඔව්," ටයිසන් උත්තර දුන්නා.

"මෙහෙමයි... ඒ දෙවිවරු තාමත් ජීවත් වෙනවා. එයාලා බටහිර ශිෂ්ටාචාරය යන තැන්වලට ගිහින්, ශක්තිමත්ම රටවල්වල ජීවත් වෙනවා. එතකොට, දැන් එයාලා ඉන්නේ ඇමරිකාවේ. සමහර වෙලාවට එයාලා සාමාන්‍ය මනුෂ්‍යයෝ එක්ක ආදරෙන් බැඳිලා දරුවෝ බිහි කරනවා. ඒ දරුවන්ට කියන්නේ අර්ධ-ලෝහිතයෝ කියලා."

"ඔව්," ටයිසන් කිව්වේ මම ප්‍රධාන කාරණය ගැන කියන තුරු බලාගෙන ඉන්නවා වගෙයි.

"අහ්, හොඳයි, ඇනබෙතුයි මමයි අර්ධ-ලෝහිතයෝ," මම කිව්වා. "අපි හරියට... පුහුණුවෙන වීරයෝ වගෙයි. රාක්ෂයින්ට අපේ ඉව වැටුණොත් උන් අපිව මරන්න එනවා. එහෙම එවුන් වගයක් තමයි ව්‍යායාම ශාලාවේ හිටියෙත්. රාක්ෂයෝ."

"ඔව්."



මම එයා දිහා බලාගෙන හිටියා. මම කියමින් සිටි දේවල්වලට එයා පුදුම වුණේවත් කලබල වුණේවත් නැතිවීම මාව ගොඩක් පුදුමයටත් කලබලයටත් පත් කළා. "එතකොට... ඔයා මාව විශ්වාස කරනවද?"

ටයිසන් ඔළුව වැනුවා. "ඒත් ඔයා... සමුද්‍ර දෙවියන්ගේ පුතාද?"

"ඔව්," මම පිළිගත්තා. "මගේ තාත්තා පොසෙයිඩන්."

ටයිසන් රවාගත්තා. දැන් එයා කලබල වෙලා වගෙයි. "ඒත් එතකොට..."

සයිරන් නළා හඬක් විලාප දෙන්න ගත්තා. පොලිස් කාරයක් අපේ පටු පාර පසුකරගෙන ඇදී ගියා.

"අපිට මේවට වෙලාවක් නැහැ," ඇනබෙත් කිව්වා. "අපි කුලී වාහනේකට නැගලා කතා කරමු."

"කඳවුරට කුලී වාහනේක යන්න?" මම ඇසුවා. "ඔයා දන්නවද ඒකට කොච්චර සල්ලි-"

"මාව විශ්වාස කරන්නකෝ."

මම පසුබෑවා. "එතකොට ටයිසන්?"

මගේ යාළුවාව අර්ධ-ලෝහිත කඳවුරට එක්ක යන්න මම හිතුවා. සාමාන්‍ය සෙල්ලම් පිටියක, සාමාන්‍ය මැර ළමයි දැකලත් එයා බය වෙනවා නම්, උප දෙවිවරුන්ගේ පුහුණු කඳවුරකට ගිහින් එයා කොහොම හැසිරේවි ද? අනෙක් අතට බලද්දී, පොලීසිය අපිව හොයාගෙන එන්නත් ඉඩ තියෙනවා.

"අපිට එයාව දාලා යන්න බැහැ," මම තීරණය කළා. "එයාව කරදරේක වැටෙන්න ඉඩ තියෙනවා."

"ඔව්," ඇනබෙත්ට තිබුණේ බය වුණ පෙනුමක්. "අපිට එයාව අරන් යන්නම වෙනවා. දැන් ඉක්මන් කරන්න."

එයා ඒක කියපු විදිහට නම් මම කැමති වුණේ නැහැ. එයා කතා කළේ ටයිසන් ඉක්මනටම රෝහලකට ගෙනියන්න උවමනා ලෙඩෙක් වගෙයි. ඒ කොහොම වුණත් අපි පටු පාර දිගේ එයා පසුපස ගියා. අපිට පිටුපසින්, මගේ ඉස්කෝලේ ව්‍යායාම ශාලාවෙන් විශාල දුම් කඳක් ඉහළ නගිද්දී අපි තුන්දෙනා හරස් වීදි දිගේ රිංගමින් ඉදිරියට ඇදුණා.

* * * * *

"මෙතැන," ඇනබෙත් එක තැනකදී අපිව නැවැත්තුවා. එයා, එයාගේ ගමන් මල්ල අවුස්සන්න ගත්තා. "තව එකක් ඉතුරු වෙලා ඇති කියලා මං හිතනවා."

මම මුලින් තේරුම් ගත්තාටත් වඩා එයාගේ පෙනුම නරක් වුණා. එයාගේ නිකට කැපිලා, පෝනිටේලයේ කෝටු කැලි සහ තණකොළ පැටලී තිබුණේ හරියට රැයවල් කීපයක්ම එළිමහනේ නිදාගෙන වගෙයි. එයාගේ කලිසම් වාටියේ තිබුණු කැපුම් පහරවල් නම් නිය පහුරුවලින් ඇති වූ ඒවා වගෙයි.

"ඔයා මොනවද හොයන්නේ?" මම ඇසුවා.

අපේ වටෙන්ම සයිරන් හඬ නැගුවා. ව්‍යායාම ශාලාවට බෝම්බ දමූ බාල අපරාධකාරයෝ හොයාගෙන පොලීසිය එන්න වැඩි වෙලාවක් යන්නේ නැති බව මට තේරුණා. දැනටමත් මැට් ස්ලෝන් එයාලට කට උත්තරයක් දීලා ඇති. ටයිසන්වයි, මාවයි ලේ පිපාසිත මිනීමස් කන්නෝ විදිහට කතාව පටලවලා කියන්නත් එයාට බැරිකමක් නැහැ.

"දෙවියන්ට ස්තුති වෙන්න එකක් හම්බ වුණා." ඇනබෙත් ඔලිම්පස් කන්දේ මුදල් ඒකකය වන රන් ඩ්‍රච්මාවක් එළියට ගත්තා. එහි එක් පැත්තක සියුස්ගේ රූපයත්, අනෙක් පැත්තේ එම්පයර් එස්ටේට් ගොඩනැගිල්ලේ රූපයත් මුද්‍රා තබා තිබුණා.

"ඇනබෙත්," මම කතා කළා. "නිව්යෝර්ක්වල කුලී වාහන එළවන අය නම් ඕකට කැමති වෙන එකක් නැහැ."

"ස්ටෙතී," එයා පෞරාණික ග්‍රීක භාෂාවෙන් කෑගැසුවා. "ඕ හර්මා ඩයබොලෙස්!" සුපුරුදු ලෙසටම, එයා ඔලිම්පස්වල භාෂාවෙන් කතා කළ සැණින් මට එය තේරුම් ගියා. එයා කිවුවේ: සදාකාලික නිරයේ රථය, නවතිනු!

ඒක ඇහුවම එයා සැලසුම් කළ දේ මොකක් වුණත් ඒ ගැන මට වැඩි ආසාවක් නම් ඇති වුණේ නැහැ. එයා කාසිය පාරට විසි කළා. ඒත් ගල්තාර උඩට වැටෙනවා වෙනුවට ඒ ඩ්‍රච්මාව ඇතුළට කිඳා බැහැලා අතුරුදහන් වුණා.

මොහොතක් ගතවන තුරු කිසිවක් සිදුවුණේ නැහැ.



ඊට පස්සේ, කාසිය වැටුණු තැන ගල්තාර පාර අඳුරු වුණා. වාහනයක් නතර කළ හැකි තරමේ හතරැස් ඉඩක බුබුළු දමන, ලේ රතු පාට තටාකයක් මතුවුණා. ඊට පස්සේ ඒ ගොහොරුව මැදින් කාරයක් පිටට පැන්නා.

ඒක කුලී කාරයක් වුණත් නිව්යෝර්ක්වල අනෙක් කුලී කාර් වගේ ඒක කහ පාට වුණේ නැහැ. ඒක දුම් වගේ අළු පාටයි. මං අදහස් කළේ, අපිට ඒක හරහා ඇවිදගෙන යන්න පුළුවන් වගෙයි පෙනුණේ. එහි දොරේ වචන කීපයක් මුද්‍රණය කරලා තිබුණත් මගේ වචන අන්ධතාවය නිසා එය කියවා තේරුම් ගන්න මට අමාරු වුණා.

පහත් වූ වීදුරු ජනේලයෙන් නාකි ගෑනු කෙනෙක් ඔළුව එළියට දැමුවා. අළු පාට කොණ්ඩයෙන් එයාගේ ඇස් වැහිලා. එයා කතා කළේ කොඳුරනවා වගේ අමුතු උරුවකට. "යනවද? යනවද?"

"අර්ධ-ලෝහිත කඳවුරට තුන්දෙනෙක් යනවා," ඇනබෙත් කිවුවා. එයා කාරයේ පිටුපස දොර ඇරලා, මට නගින්න අතින් සංඥා කළේ හරියට ඒක හරිම සාමාන්‍ය දෙයක් වගෙයි.

"ආව්!" නාකි ගෑනු කෙනා යටිගිරියෙන් කෑගැසුවා. "අපි මේ ජාතියේ අයව ගෙනියන්නෑ!" එයා ටයිසන්ට කෝටු ඇඟිල්ලක් දිගු කළා.

මේ මොකද මේ? අද ලොකු, කැත ළමයින්ට අරියාදු කරන දවසද?

"වැඩිපුර ගෙවන්නම්," ඇනබෙත් පොරොන්දු වුණා. "එහෙට ගියාම තව ඩ්‍රච්මා තුනක් දෙනවා."

"හරි!" ගෑනු කෙනා බෙරිහන් දුන්නා.

අකමැත්තෙන් වුණත් මම කාරයට ගොඩවුණා. ටයිසන් මිරිකෙමින් මැද වාඩි වුණා. ඇනබෙත් අන්තිමට නැග්ගා. එහි ඇතුළත් දුම් අළු පාට වුණත්, එය උවමනා තරම් ඝනව තිබුණා. සාමාන්‍ය කුලී වාහනවල වගේම පළුදුවෙලා ගල් ගැහුණු ආසනයක් එයටත් තිබුණා. එහි පිටුපස කොටසත්, වාහනය එළවන නාකි ගෑනු කෙනාවත් වෙන් කරන වීදුරුවක් තිබුණේ නැහැ... පොඩ්ඩක් ඉන්න. එතැන එක නාකි ගෑනු කෙනෙක් නෙවෙයි - තුන්දෙනෙක්ම සිටියා. ඉදිරි ආසනයේ හිරවෙලා සිටි එයාලා තුන්දෙනාටම ඇස් ආවරණය වෙන්න

වැටුණු කොණ්ඩාත්, කෝටු අතුත් තිබුණා. එයාලා හැඳගෙන සිටියේ අඟුරු පාට, ගෝනි රෙද්දෙන් මැසූ ඇඳුම්.

"ලෝන්ග් අයිලන්ඩ්! ටවුමෙන් පිට - කුලියයි බෝනසුයි! හා!" රියැදුරු අසුනේ සිටි කෙනා කිවුවා.

එයා ඇක්සලරේටරය පාගද්දි මගේ ඔළුව පසු ඇන්දේ වැදුණා. කලින් පටිගත කළ හඬක් ශබ්ද විකාශනයෙන් ඇසුණා: හායි, මේ සියුස්ගේ සේවකයා, ගැනිමීඩ්. අහසට අධිපති වෙනුවෙන් වයින් මිල දී ගන්න යන හැම වතාවකදිම, මම ගාංචු දමාගන්නවා!''

පහළ බැලූ මට ආසන පටි වෙනුවට දකින්න ලැබුණේ ලොකු, කළු පාට දම්වැලක්. තත්වය එච්චර දරුණු නැහැ කියලා මම තීරණය කළා... තවම නම් නැහැ.

බටහිර මහ පාරේ කෙළවරින් වාහනය වේගය වැඩි කරද්දි, මැද සිටි අළු පාට ආච්චි මොරදුන්නා, "බලාගෙන! වමට කපනවා!"

"හොඳයි, ඔයා මට ඇහැ දෙනවා නම්, ටෙම්පස්ට්, මටම ඒක බලාගන්න තිබ්බා!" රියැදුරු ආච්චි මැසිවිලි නැගුවා. මොකක්? එයාට ඇහැ දෙන්න?

මට ඒක අහන්න වෙලාවක් නැති වුණේ රියැදුරු ආච්චි ඉදිරියට ආ ට්‍රක් රථයක් මග හරින්න පැත්තකට හරවද්දි, ගැටි බැම්මක් උඩින් ගිය වාහනය හකු ඇට පූට්ටු කරවන ගැස්මක් එක්ක අනෙක් වීදියට පියඹා ගිය නිසයි.

"වාස්ප්!" තුන්වෙනි ගැහැනු කෙනා රියැදුරාට කතා කළා. ''කෙල්ල දුන්න කාසිය මට දෙනවා! මට ඒක හපලා බලන්න ඕනෑ."

"අන්තිම වතාවෙත් ඔයා ඒක හැපුවා, ඇන්ගර්!" වාස්ප් විය යුතු රියැදුරු ආච්චි කිවුවා. "දැන් මගේ වාරේ!"

"නෑ, එහෙම නෙවෙයි!" ඇන්ගර් නම් ආච්චි මොර දුන්නා.

මැද සිටි කෙනා, ටෙම්පස්ට් බෙරිහන් දුන්නා, "රතු එළිය!"

"බ්‍රේක්!" ඇන්ගර් මොර දුන්නා.

ඒ වෙනුවට, ඇක්සලරේටරය තවත් තදින් පෑගුව වාස්ප් ගැටි බැම්ම උඩින් අනෙක් පැත්තට හැරෙව්වේ පාරේ තිබුණු පත්තර පෙට්ටියකුත් පෙරළගෙනයි. මට දැනුණේ බෲම් වීදියේ කොතැනකහරි මගේ බඩ හැලිලා වගෙයි.



"මේ අහන්න," මම කතා කළා. "ඔයාට පාර පේනව ද?"

"නෑ!" සුක්කානම කරකවමින් සිටි වාස්ප් බෙරිහන් දුන්නා.

"නෑ!" මැද සිටි ටෙම්පස්ටුත් බෙරිහන් දුන්නා.

"ඇත්තෙන්ම ඔව්!" පැති ජනේලය ළඟ සිටි ඇන්ගර් බෙරිහන් දුන්නා.

මම ඇනබෙත් දිහා බැලුවා. "එයාලා අන්ධයිද?"

"සම්පූර්ණයෙන්ම නෙවෙයි," ඇනබෙත් කිවුවා. "එයාලට එක ඇහැක් තියෙනවා."

"එක ඇහැක්?"

"ඔව්."

"එක්කෙනාට එක ගාණේ?"

"නෑ. තුන්දෙනාටම එකක්."

ටයිසන් කෙඳිරිගාමින් ආසනය අල්ල ගත්තා. "මට අමාරුයි."

"ඔහ්, කොල්ලෝ," මම කිවුවේ ඉස්කෝලේ ක්ෂේත්‍ර චාරිකා යද්දි ටයිසන්ට වමනේ යනවා දැකලා තිබුණු නිසා. එහෙම වෙලාවට එයාගෙන් අඩි පනහක්වත් ඈත්වෙලා ඉන්න එක ඇඟට ගුණයි. "අල්ලගෙන ඉන්න, ලොකු යාළුවා. කාගේ ළඟ හරි කුණු මල්ලක් වගේ දෙයක් තියෙනවද?"

රණ්ඩු කරමින් සිටි ආච්චිලාට මං කියන දේවල් ඇහුණේ නැහැ. ජීවිතේ බේරගන්න එල්ලිලා සිටි ඇනබෙත්ට මම, ඇයි-ඔයා-මට-මෙහෙම-කළේ අහන බැල්මක් හෙළුවා.

"හේයි," එයා කිවුවා. "අළු සහෝදරියන්ගේ වාහනේ තමයි කඳවුරට යන්න තියෙන ඉක්මන්ම ක්‍රමය."

"එහෙනම් ඇයි ඔයා වර්ජිනියාවල ඉඳලම මේකේ ආවේ නැත්තේ?"

"එහෙ මෙයාලගේ සේවා කලාපයෙන් පිට නේ," එයා කිවුවේ හැමෝම දන්න දෙයක් මට මතක් කරලා දෙනවා වගෙයි. "එයාලා වැඩ කරන්නේ නිව්යෝක්වලටයි, අවට පළාත්වලටයි විතරයි."

"අපේ වාහනේ ගොඩක් ප්‍රසිද්ධ අය ගිහින් තියෙනවා!" ඇන්ගර් කෑගැසුවා. "ජේසන්! ඔයාට මතකද එයාව?"

Scanned with CamScanner

"මට මතක් කරන්න එපා!" වාස්ප් අඳෝනා තැබුවා. "ඒ කාලේ අපිට වාහනයක් තිබුණෙත් නෑ. නාකි අම්මණ්ඩියේ. ඕක වුණේ අවුරුදු තුන්දාහකට කලින්!"

"මට දත දෙනවා!" වාස්ප්ගේ කට අල්ලගන්න ඇන්ගර් උත්සාහ කළත් වාස්ප් එයාගේ අත ගසා දැමුවා.

"ටෙම්පස්ට් මට ඇහැ දෙනවා නම් විතරයි!"

"නෑ!" ටෙම්පස්ට් යටිගිරියෙන් කෑගැසුවා. "ඔයා ඊයෙත් ඒක තියාගෙන හිටියා!"

"ඒත් මම නේ එළවන්නේ, නාකිච්චි!"

"නිදහසට කාරණා එපා! වාරේ! ඒක ඔයාගේ වාරේ!"

ටයිසන්ටත් දොරටත් මැදිව මම චප්ප වෙද්දි වාස්ප් වාහනය ඩෙලන්සි විදියට තදින් හැරෙව්වා. එයා තවත් ගෑස් දෙද්දි පැයට සැතපුම් හැත්තෑවක වේගයෙන් අපි විලියම්ස්බර්ග් පාලම උඩින් පියැඹුවා. දත් නාකි සහෝදරියෝ තුන්දෙනා ඇත්තටම රණ්ඩු වුණා. වාස්ප්ගේ මුහුණ ඩැහැගන්න ඇන්ගර් උත්සාහ කරද්දි, ටෙම්පස්ට්ගේ මුහුණ පහුරු ගාන්න වාස්ප් උත්සාහ කරමින් එකිනෙකාගේ කම්මුල්වලට ගසාගත්තා. කෙහෙවලු පටලවාගෙන, කටවල් ඇරගෙන එයාලා කෑගසද්දි, වාස්ප්ගේ කටේ තිබුණු කහට බැඳුණු ඉදිරි දත හැර වෙන එකෙකුගේවත් කටවල්වල දත් නැති බව මට පෙනුණා. ඇන්ගර්ගේ හැර අනෙක් දෙදෙනාගේම ඇස් තිබිය යුතු තැන්වල තිබුණේ ඇතුළට ගිලී වැසුණු ඇහිපිය විතරයි. ඇන්ගර්ගේ ලේ පිරුණු කොළ පාට ඇහැ සෑම දෙසටම කැදර බැල්මෙන් හැරුණේ, එයට පෙනෙන දේවල් උවමනා තරම් බලාගන්න බැහැ වගෙයි.

අන්තිමේදී ඇස් පෙනීමේ වාසිය තිබුණු ඇන්ගර්, එයාගේ සහෝදරී, වාස්ප්ගේ කටින් දත උගුලුවා ගත්තා. තරහවෙන් පිස්සු වැටුණු වාස්ප් විලියම්ස්බර්ග් පාලමේ අද්දරටම වාහනය පදවමින් කෑගසන්න වුණා, "ඒක ආපහු දෙනවා! ආපහු දෙනවා!"

කෙඳිරිගෑව ටයිසන් බඩ අල්ලගත්තා.

"අහ්, කාටහරි දැනගන්න ඕනෑ නම්," මම කිවුවා, "අපි මැරෙන්නයි යන්නේ!"



"බය වෙන්නෙපා," බයෙන් පිරුණ හඬින් ඇනබෙත් මට කිවුවා. "එයාලා කරන්නේ මොකක්ද කියලා අළු සහෝදරියෝ දන්නවා. එයාලා ඇත්තටම ගොඩාක් බුද්ධිමත්."

ඇතීනාගේ දුවෙකුගේ කටින් ඒ කතාව අහන්න ලැබුණත්, මම ඇත්තටම සැනසුනේ නැහැ. නැගෙනහිර ගඟට අඩි එකසිය තිහක් ඉහළ පාලමේ ගැටිය දිගේ අපි ගැස්සෙමින් ඉදිරියට ගියා.

"ඔව්, බුද්ධිමත්!" පසුපස බලන කණ්ණාඩිය හරහා අලුතෙන් ලැබුණු දත පෙන්වමින් ඇන්ගර් විරිත්තුවා.

"අපි එක එක දේවල් දන්නවා!"

"මැන්හැටන්වල තියෙන හැම පාරක්ම!" සහෝදරියකට ගහන අතරේම වාස්ප් පුරසාරම් දෙඩුවා. "නේපාලයේ අගනුවර!"

"ඔයා හොයන ස්ථානය!" ටෙම්පස්ට් එකතු කළා.

ඒත් එක්කම එයාගේ සහෝදරියෝ දෙන්නා අත් මිටමොළවාගෙන එයාට දෙපැත්තෙන්ම ගහන්න පටන් ගත්තා, "කට වහගන්නවා! කට වහගන්නවා! එයා තවම ඒක ඇහුවෙත් නැහැ!"

"මොකක්ද?" මම ඇසුවා. "මොන ස්ථානයද? මම එහෙම මුකුත් -"

"මුකුත් නෑ!" ටෙම්පස්ට් මැදට පැන්නා. "ඔයා හරි, කොල්ලෝ. එහෙම මුකුත් නෑ!"

"මට කියන්න."

"බෑ!" එයාලා තුන්දෙනාම බෙරිහන් දුන්නා.

"අපි කිවුව අන්තිම වතාව, ඒක හරිම දරුණුයි!" ටෙම්පස්ට් කිවුවා.

"ඇහැ විලකට විසි කළා!" ඇන්ගර් එකඟ වුණා.

"ඒක ආපහු හොයාගන්න අවුරුදු ගාණක් ගියා!" වාස්ප් විලාප දුන්නා. "ඒක කියද්දි මතක් වුණේ - ඒක ආපහු දෙනවා!"

"බෑ!" ඇන්ගර් මොරදුන්නා.

"ඇහැ!" වාස්ප් මොරගැසුවා. "මට දෙනවා!"

එයා ඇන්ගර්ගේ පිටට තදින් පහරක් ගැසුවා. ඒත් එක්කම අප්පිරියා සහගත පොප් හඬක් සමග ඇන්ගර්ගේ මුහුණෙන් මොකක්දෝ

විසිවුණා. ඇන්ගර් අතපත ගාමින්, ඒක අල්ලගන්න උත්සාහ කළා. ඒත් එයාට හැකිවුණේ පිටි අත්ලෙන් ඒකට පහරක් ගහන්න විතරයි. එයාගේ උරහිසට උඩින් විසි වී ආ සෙවෙල පිරුණු කොළ පාට ඇස් බෝලය පිටුපස අසුනේ සිටි මගේ ඔඩොක්කුවට වැටුණා.

මම කොච්චර උඩ පැන්නද කියනවා නම්, මගේ ඔළුව වහලයේ වැදිලා ඇස් දෙකත් තොපිට පෙරළුණා.

"මට මුකුත් පේන්නෑ!" සහෝදරියෝ තුන්දෙනාම මොර ගැහුවා.

"මට ඇහැ දෙනවා!" වාස්ප් විලාප දුන්නා.

"එයාට ඇහැ දෙනවා!" ඇනබෙත් බෙරිහන් දුන්නා.

"මගේ ළඟ ඒක නෑ!" මම කිවුවා.

"අර තියෙන්නේ, ඔයාගේ බූට් එක ළඟ." ඇනබෙත් කිවුවා. "ඒක පාගන්න නම් එපා! ඒක ගන්න!"

"මම නම් ඒක අහුලන්නේ නෑ!".

මුර වැටේ වැදුණු කාරය බිහිසුණු ඇඹරුම් හඬක් නගා වැටේ ඇතිල්ලෙමින් ඉදිරියට ඇදුණා. මුළු කාරයම වෙවුලමින්, අළු පාට දුම් පිටින්න ගත්තේ මේ පීඩාවෙන් අන්තර්දාන වෙන්න වගෙයි.

"මට වමනේ යන්න වගේ!" ටයිසන් අනතුරු ඇඟෙව්වා.

"ඇනබෙත්," මම මොරදුන්නා. "ටයිසන්ට ඔයාගේ මල්ල පාවිච්චි කරන්න දෙන්න!"

"ඔයාට පිස්සුද? ඇහැ අහුලගන්න!"

වාස්ප් [illegible] යත්න කරනවිට කුලී කාරය මුර වැටෙන් ඈත් වුණා. මිනිසුන්ගේ කුලී වාහන සියල්ල පරදවන වේගයකින් අපි [illegible] දෙසට විසිවුණා. අළු සහෝදරියෝ යටිගිරියෙන් බෙරිහන් දෙමින් ඇහැ [illegible] ගහගත්තා.

[illegible] මම, මගේ හිත දැඩි කරගත්තා. [illegible] ටී-ෂර්ට් එකෙන් [illegible] ඇස් බෝලය අහුලාගත්තා.

"[illegible]" [illegible] කිවුවේ එයාගේ [illegible] ඇහැ [illegible] "ඒක ආපසු දෙන්න!"



"ඉස්සෙල්ලා කිවුව කතාවේ තේරුම කියනකල් දෙන්නෑ," මම එයාට කිවුවා. "මම හොයන ස්ථානයක් ගැන ඔයාලා මොකක්ද කිවුවේ?"

"වෙලාවක් නෑ!" ටෙම්පස්ට් හඬනැගුවා. "වේගය වැඩි වෙනවා!"

මම ජනේලයෙන් පිටත බැලුවා. කිවුවත් වගේම ගස්, වාහන සහ ගොඩනැගිලි අළු පාටින් බොඳවෙලා පිටුපසට පියාඹනවා පෙනුණා. අපි දනටමත් බෲක්ලින්වලින් පිටවෙලා, ලෝන්ග් අයිලන්ඩ්වලට කිට්ටු කරමින් සිටියේ.

"පර්සි," ඇනබෙත් අනතුරු ඇඟෙව්වා. "ඇහැ නැතුව අපිට යන්න ඕනෑ තැන හොයාගන්න එයාලට බැහැ. අපිව කෑලි මිලියන ගාණකට කුඩුවෙනකල්ම එයාලා වේගය වැඩි කරගෙන ඉස්සරහට යයි."

"මුලින්ම එයාලා මට කියන්න ඕනෑ," මම කිවුවා. "එහෙම නැත්නම් මම ජනේලෙ ඇරලා මේක පාරට විසි කරනවා."

"එපා!" අළු සහොදරියෝ අඳෝනා නැගුවා. "ඒක ගොඩාක් අනතුරුදායකයි!"

"ඔන්න මම ජනේලෙ අරිනවා."

"පොඩ්ඩක් ඉන්න!" අළු සහොදරියෝ කෑගැසුවා. "30, 31, 75, 12!" එයාලා තුන්දෙනාම කියාගෙන ගියේ කටපාඩමෙන් වගෙයි.

"මොකක්ද ඒකෙ තේරුම?" මම ඇසුවා. "ඒකෙ කිසිම තේරුමක් නැනේ!"

"30, 31, 75, 12!" ඇන්ගර් විලාප නැඟුවා. "අපිට කියන්න පුළුවන් එච්චරයි. දැන් අපිට ඇහැ දෙනවා! කඳවුරට අත ළඟයි!"

අධිවේගී පාරෙන් පිටවී සිටි අපි දැන් ලෝන්ග් අයිලන්ඩ් උතුරු ප්‍රදේශයේ ගම්බද පාරක් දිගේ හැල්මේ දුවමින් සිටියා. මැරුණු වීරයෙකුගේ ජීව බලය දරාගෙන ඉන්නා තාලියාගේ පයින් ගස ඇති අර්ධ-ලෝහිත කන්ද අපිට ඉදිරියෙන් දිස්වුණා.

"පර්සි!" පෙරටත් වඩා හදිස්සියකින් ඇනබෙත් කතා කළා. "දැන් එයාලට ඇහැ දෙන්න!" තව දුරටත් වාද කරන්න උවමනා නැති බව තීරණය කළ මම වාස්ප්ගේ ඔඩොක්කුවට ඇහැ දැමුවා.

ඉක්මනින් එය ඩැහැගත් නාකි ආච්චි, ඇස් කෙවෙණිය තුළට එය ඔබාගෙන තදින් ඇහිපිය ගැසුවා. "වෝහ්!"

එයා හිරිංග තද කරද්දි දුම් වලාවකට මැදිව හතර-පස් වතාවක් කැරකුණු කාරය අර්ධ-ලෝහිත කන්ද පාමුල ගොවිපළ පාර මැද හඬ නගමින් නතර වුණා. ටයිසන් මහ හඬින් රාමතෙල් පිටකළා. "දූන් හරි."

"බොහොම හොඳයි," මම අළු සහෝදරියන්ට කිව්වා. "දූන්, අර අංකවල තේරුම මොකක්ද කියලා මට කියන්න."

"වෙලාවක් නෑ!" ඇනබෙත් දොර ඇරියා. "අපි දූන්ම යන්න ඕනෑ." ඒ ඇයි අහන්න මම ලෑස්ති වුණත්, අර්ධ-ලෝහිත කන්ද උඩ බලද්දි මට කාරණය තේරුම් ගියා. කඳු මුදුනේ කඳවුරුකරුවෝ කණ්ඩායමක් සිටියා. එයාලා ප්‍රහාරයකට මැදි වෙලා.

# 04
# ටයිසන්ගේ ගින්දර සමග සෙල්ලම්

පුරාණ ප්‍රවාදවලට අනුව කතා කරද්දි, නාකි ආච්චිලා තුන් කට්ටුවලටත් වඩා මට පේන්න බැරි දෙයක් තියෙනවා නම් ඒ ගොන්නු. ගිය ගිම්හානයේ මම අර්ධ-ලෝහිත කන්ද මුදුනේදී මිනටෝර් එක්ක සටන් කළා. මේ වතාවේ මට එතැන දකින්න ලැබුණේ ඊටත් වඩා නරක දෙයක්. ගොන්නු දෙන්නෙක්. උන් සාමාන්‍ය ගොන්නු නෙවෙයි - අලියෙක් තරම් විශාල ලෝකඩ ගොන්නු. ඒ මදිවට උන්ට නහයෙන් ගිනි පිඹින්නත් පුළුවන්කම තිබුණා. අපි කුලී කාරයෙන් බැස්ස හැටියේම අළු සහෝදරියෝ එතැනින් පිටවෙලා, මීට වඩා පරිස්සම් සහගත නිවියෝක් දෙසට හැල්මේ යන්න ගියා. අඩු තරමේ එයාලට වැඩිපුර ගෙවන්න පොරොන්දු වුණ ඩ්‍රච්මා තුන ගන්නවත් එයාලා නතර වුණේ නැහැ. ගමන් මල්ල කරේ එල්ලාගෙන, කිණිස්සක් අතේ තියාගෙන සිටි ඇනබෙත්වත්, බාගෙට පිළිස්සුණ බතික් ක්‍රීඩා ඇඳුම් හැඳගෙන සිටි ටයිසන්ව සහ මාවත් පාර අයිනේ තනි කරමින් එයාලා යන්න ගියා.

"ඔහ්, මිනුස්සයෝ," කඳු මුදුනේ සිදුවෙන යුද්ධය දෙස බලමින් ඇනබෙත් කෙඳිරුවා.

මම ගොඩක්ම කලබල වුණේ ගොන්නු දෙන්නා ගැනවත්, සම්පූර්ණ යුද සන්නාහවලින් සන්නද්ධ වූ වීරයෝ දසදෙනා ගැනවත් නෙවෙයි මම වද වුණේ ගොන්නු මුළු කන්ද පුරාම, පයින් ගහෙන් එහා පැත්තේ පවා නිදැල්ලේ දුවනවා දැකලයි. ඒක වෙන්න බැරි දෙයක්. කඳවුරේ මායා බැම්ම නිසා තාලියාගේ පයින් ගහෙන් එහාට යන්න

Scanned with CamScanner

කිසිම රාක්ෂයෙක්ට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒත් මේ ලෝකඩ ගොන්නු කොහොමදෝ ඒකත් කරලා තිබුණා.

වීරයෝ අතරින් ගැහැනු ළමයෙකුගේ හුරුපුරුදු රළු කටහඬක් ඇහුණා. "සීමා මුරකරන අය, මාත් එක්ක එන්ඩ!"

සීමා මුරකරන අය? මම හිතුවා. කඳවුරේ සීමා මුර කළේ නැහැනේ.

"ඒ ක්ලැරිස්," ඇනබෙත් කිවුවා. "ඉක්මනට එන්න, අපි එයාට උදවු කරන්න ඕනෑ." සාමාන්‍යයෙන් නම්, ක්ලැරිස්ට පිහිට වෙන්න දුවන එක මම කරන්න ආසම වැඩවලින් එකක් නෙවෙයි. එයා කඳවුරේ සිටි ලොකුම චණ්ඩියෙක්. අපි මුලින්ම මුණගැහුණු වතාවේ මගේ ඔළුව වැසිකිළි පෝච්චියක් ඇතුළට ඔබන්න එයා උත්සාහ කළා. ඒ වගේම එයා ඒරීස්ගේ දුවක්. පහුගිය ගිම්හානයේදි එයාගේ තාත්තා එක්ක මම බරපතළ ප්‍රශ්නයක් ඇති කරගත්තා. ඉතින් දැන් යුද්ධයට අධිපති දෙවියෝයි, එයාගේ ළමයි ටිකයි මගේ ධෛර්යයට වෛර කරනවා. ඒ මොනවා වුණත්, දැන් එයා කරදරේක වැටිලා. ගොන්නු පහර දෙන්න එද්දී එයාගේ මිත්‍ර සෙබළු බයවෙලා සීසීකඩ දුවන්න වුණා. පයින් ගහ වටේ තණ පඳුරු ගිනි ගනිමින් තිබුණා. එක් අර්ධ-ලෝහිතයෙකුගේ යුද හිස්වැසුම මුදුනේ වූ අශ්ව ලොම් රැල්ල ගිනි ගනිද්දි එයා මරහඬ දිදී අත් වනමින් එක තැන රවුමට දිව්වා. ක්ලැරිස්ගේ සන්නාහයත් අඟුරු වෙලා. එයා සටන් කරමින් සිටි කැඩුණු හෙල්ලයේ අනෙක් කෙළවර ගොනෙකුගේ ලෝහ සන්ධියක එල්ලෙමින් තිබුණා. මම, මගේ බෝල්පොයින්ට් පෑනේ කොපුව ගලවද්දි එය දිලිසෙමින් දිගුවෙලා මගේ ලෝකඩ කඩුව, ඇනාක්ලුස්මස් බවට හැරුණා. "ටයිසන්, මෙතැනට වෙලා ඉන්න. ඔයාව තවත් කරදරේ දාන්න මට බැහැ."

"නෑ!" ඇනබෙත් කිවුවා. "අපිට එයාව ඕනෑ."

මම එයාට රැව්වා. "එයා මනුස්සයෙක්, ඩොඩ්ජ්බෝල අල්ලද්දි එයාගේ වාසනාව වැඩ කළාට එයාට බැහැ-"

"පර්සි, අතන ඉන්නේ මොක්කුද කියලා ඔයා දන්නවද? උන් තමයි කොල්කිස් ගොන්නු. උන්ව හදලා තියෙන්නේ හෙෆාස්ටස්ගේ අතින්මයි. මිඩියා එස්.පී.එෆ්.50000 හිරු කිරණ ආවරණ ක්‍රීම් එක නැතුව අපිට උන් එක්ක සටන් කරන්න බැහැ. අපිව කරවෙලා යයි."

"මිඩියා මොකක්?"



ගමන් මල්ල ඇවිස්සූ ඇනබෙත් එයාටම ශාප කරගත්තා. "නිවර්තන පොල් සුවඳ ක්‍රීම් බෝතලයක්ම මගේ ඇඳ ළඟ මේසෙ උඩ තිබුණා. ඇයි මට ඒක ගේන්න බැරි වුණේ?"

ඇනබෙත්ගෙන් ඕනෑවට වඩා ප්‍රශ්න නාහා ඉන්න මම ඉගෙන ගත්තේ ගොඩක් කාලෙකට කලින්. නැත්නම් වෙන්නේ මාව තවත් අවුල් වෙන එක විතරයි.

"බලන්න, ඔයා මොනවා කියවනවද මං දන්නෑ. හැබැයි ටයිසන්ව රෝස් වෙන්න මම ඉඩ තියන්නෑ."

"පර්සි-"

"ටයිසන්, මෙතනම ඉන්න." මම, මගේ කඩුව එසෙව්වා. "මම ඇතුළට යනවා." ටයිසන් විරෝධය පාන්න උත්සාහ කළා, ඒත් ඒ වෙනකොට සෙබළු ටික එක තැනකට ගන්න උත්සාහ කරමින් මොරදෙන ක්ලැරිස් දෙසට මම දුවන්න පටන්ගෙන ඉවරයි. ඒක හොඳ අදහසක්. ක්ලැරිස්ට ඇහුම්කන් දුන් කීපදෙනා උරහිසට උරහිස තබාගෙන, පලිහවල් එකටෙක හේත්තු කරගෙන, ඉත්තෑ කූරු වගේ හෙලි ඉහළට ඔසවා ගත්තා.

අවාසනාවකට, ක්ලැරිස්ට එකතු කරගන්න හැකිව තිබුණේ කඳවුරුකරුවෝ හයදෙනෙක් විතරයි. අනෙක් හතරදෙනාගේ හිස්වැසුම ගිනි ගනිද්දි, එයාලා ගහ වටේට දුවමින් සිටියා. එයාලට උදවු කරන්න ඇනබෙත් ඒ පැත්තට දිව්වා.

එයාව ලුහුබඳින්න ගොනෙක්ව පොලඹවාගත් ඇනබෙත්, ඊට පස්සේ රාක්ෂයාව මුළුමනින්ම අන්දමන්ද කරමින් අදෘශ්‍යමාන වුණා. අනෙකා ක්ලැරිස්ගේ පේළියට පහර දෙන්න දිව්වා.

ඒ වෙද්දි මම කන්දේ බාගයක් දුර ගිහින් සිටියා- ඒත් උදවු කරන්න තරම් කිට්ටුවෙන් නෙවෙයි. ක්ලැරිස් තවමත් මාව දැක්කේ නැහැ.

ඒ තරම් ලොකු සතෙකුගෙන් බලාපොරොත්තු වෙන්නත් බැරි තරමට ගොනා වේගවත්. ඌගේ ලෝහ හම ඉර එළියට දිලිසුණා. මිට මෙළවූ අතක් තරම් විශාල රතු කැට එබ්බවූ දෑසකුත්, ඔප දැමූ රිදියෙන් කළ අං දෙකකුත් ඒ සතාට තිබුණා. ඌගේ අසවු සවිකළ කට අරිද්දී, සුදු පාට ගිනිදැල් කඳක් එයින් පිටතට විදුණා.

Scanned with CamScanner

"පේළිය තියාගන්න!" ක්ලැරිස්, එයාගේ රණශූරයින්ට අණ කළා.

ක්ලැරිස්ගේ මොන වැරදි තිබුණත්, එයා ගොඩක් නිර්භීතයි. එයාගේ තාත්තාට වගේම කෲර ඇස් දෙකක් තිබුණු එයා ගොඩක් උස-මහත ගැහැනු ළමයෙක්. ග්‍රීක යුද සන්නාහ අඳින්නම ඉපදිලා වගේ පෙනුණත්, එයා වුණත් මේ ගොනාගේ ප්‍රහාර දරාගන්නේ කොහොමද හිතලා මම පුදුම වුණා.

අවාසනාවට වගේ, ඒ මොහොතේම අනෙක් ගොනාට ඇනබෙත්ව හොයාගන්න තිබුණු උනන්දුව නැති වුණා. ආපසු හැරුණු ඌ ක්ලැරිස්ගේ අනාරක්ෂිත පිටුපස ඉලක්ක කරගෙන දුව ආවා.

"ඔයාගේ පිටිපස්සෙන්!" මම කෑගැසුවා. "බලාගෙන!"

මට තිබුණේ කිසිවක් නොකියා ඉන්න, මොකද මම කළ දෙයින් වුණේ එයාව ගැස්සුණ එක විතරයි. පළවෙනි ගොනා එයාගේ පලිහේ හැපෙද්දී, සෙබළ පේළිය කැඩී ගියා. උඩින් විසිවුණ ක්ලැරිස් ගිනි ගන්නා තණගොල්ලක් උඩට වැටුණා. දෙවෙනි ගොනා එයාව පහුකරගෙන ගියත්, ඊට කලින් අනෙක් වීරයෝ දෙසට ගිනි කඳක් පිඹින්න ඌ අමතක කළේ නැහැ. එයාලගේ පලිහවල් අත්වලම උණු වී වැගිරුණා. ඌ ක්ලැරිස්ව මරන්න කිට්ටු වෙද්දී ආයුධ බිම දැමූ එයාලා පැනලා දිව්වා.

ඉදිරියට පැන්න මම ක්ලැරිස්ගේ සන්නාහයේ පටියකින් අල්ලගත්තා. බඩු කෝච්චියක් වගේ ගොනා දුවගෙන එද්දි මම එයාව පැත්තකට ඇදලා ගත්තා. ඒ අතරේම රිප්ටයිඩ්ගෙන් හොඳ පාරක් දීලා, ඌගේ ඇලපතෙන් පදාසයක්ම කපා දමන්නත් මට හැකි වුණා. ඒත් කිරිකිරි හඬින් ගෙරවූ රාක්ෂයා නොනැවතී දිව්වා. ඌ මගේ ඇඟේ ගෑවුණේවත් නැතත්, ලෝහ හමේ උණුසුම මට හොඳින්ම දැනුණා. ගල්වුණ අයිස් කුට්ටියක් වුණත් උණු කරන්න ඒ උණුසුම ප්‍රමාණවත්.

"මට යන්න දෙනවා!" ක්ලැරිස් මිටමොළවාගත් අතින් මට ගැසුවා. "පර්සි, ඔහේට නම් හොඳක් වෙන්නෙපා!" පයින් ගහ අසල කොළ ගොන්නක් උඩට එයාව අත ඇරිය මම ගොනුන්ට මුහුණ දෙන්න හැරුණා. අපි දැන් සිටියේ කඳවුරේ ඇතුළු පැත්තට ඇති බෑවුමෙයි. අර්ධ-ලෝහිත කඳවුර ඇති දෙණිය අපිට පහළින් තිබුණා- කැබින්, පුහුණුවීම් කරන තැන්, මහ ගෙදර- ගොන්නු අපිව පසුකරගෙන



ගියොත් මේ සියල්ල අවදානමේ. විසිරී ගිහින් ගොනුන්ව කලබල කරන්න කියලා ඇනබෙත් අනෙක් වීරයින්ට කෑගසා උපදෙස් දුන්නා.

ලොකු අඩකවයක දිවූ පළවෙනි ගොනා නැවතත් මගේ පැත්තට හැරුණා. කඳු මුඳුනේ මැද, රාක්ෂයින්ට යන්න බැරි අදෘශ්‍යමාන බැම්ම තිබිය යුතු තැන පසු කරද්දි ඌගේ වේගය ටිකක් අඩුවුණේ හරියට ප්‍රබල සුළඟකට එදිරිව යන්න දඟලනවා වගෙයි; ඒත් ඊට පස්සේ ඌ එතැන කඩාගෙන ඉදිරියටම ආවා. දෙවෙනි ගොනා මගේ පැත්තට හැරෙද්දී ඌගේ ඇලපතේ මම කැපූ තැනින් ගින්දර පිටට විසිවුණා. ඌට කිසිම වේදනාවක් දැනෙනවාද, මට නොතේරුණත්, ඌගේ රතු කැට ඇස්දෙක මගේ දිහාවට රවාගෙන ඉන්නවා වගේ පෙනුණේ හරියට මම මේක පෞද්ගලික කෝන්තරයක් කරගත් බව අඟවන්න වගෙයි.

එක පාර ගොන්නු දෙන්නෙක් සමග සටන් කරන්න මට හැකියාවක් නැහැ. පළවෙනි ගොනා එතැනට එන්න කලින් මම දෙවෙනි ගොනාගේ බෙල්ල කපලා, ඌව ඉවරයක් කරන්න ඕනෑ. මගේ අත් දැනටමත් රිදෙන්න පටන්ගෙන තිබුණා. මම රිප්ටයිඩ් පාවිච්චි නොකර සෑහෙන කාලයක් සිටි නිසා මගේ පුහුණුව හොඳටෝම මදි බව මට තේරුම් ගියා. මම ඉදිරියට පැන්නා, ඒත් දෙවෙනි ගොනා මට ගින්දර පිම්බා. වාතය මුළුමනින්ම ගිනියම් වෙද්දී මම පැත්තකට පෙරළුණා. මගේ පෙණහලු තුළ වූ ඔක්සිජන් සියල්ල පිටතට ඇදී ගියා. මගේ කකුල මොකකදෝ වැදුණා - සමහරවිට ගස් මුලක වෙන්නැති - ඒත් එක්කම මගේ වළලුකර දක්වාම තද වේදනාවක් පැතිරුණා. කොහොම වුණත්, මගේ කඩුවෙන් කපලා රාක්ෂයාගේ හොම්බෙන් කෑල්ලක් කොට කරන්න මට පුළුවන් වුණා. අන්දමන්ද වූ සතා වියරු වැටිලා, පිම්මේ දුවන්න ගත්තා. ඒ ගැන සතුටු වෙන්න කලින්, මම හිටගන්න උත්සාහ කරද්දී මගේ වම් කකුල බකල ගැසුණා. මගේ වළලුකර උළුක් වෙලා, කැඩිලද දන්නෙත් නෑ.

පළවෙනි ගොනා කෙලින්ම මගේ ඉදිරියට දුවගෙන ආවා. බඩගාගෙන ගිහින් ඌගේ පාරෙන් ඉවත් වෙන්න මට කොහෙත්ම පුළුවන්කමක් නැහැ. "ටයිසන්, එයාට උදවු කරන්න!" ඒ වෙලාවේ ඇනබෙත් කෑගැසුවා.

කඳු මුඳුනට කිට්ටු තැනක ටයිසන් විලාප දෙනවා ඇසුණා, "මට මේක හරහා එන්න බැරියෝ!"

Scanned with CamScanner

"ඇනබෙත් චෙස් වන මම, කඳවුරට ඇතුළුවීමට ඔබට අවසර දෙනවා!"

අතුණු හඬකින් කඳු බෑවුම දෙදරා ගියා. ඒත් එක්කම, ටයිසන් මොරදෙමින් මගේ පැත්තට දුවගෙන එනවා පෙනුණා: "පර්සිට උදව් ඕනෑ!"

මම එයාව නවත්වන්න කලින්, ගොනා නෘෂ්ටික ගිනි කුණාටුවක් නිදහස් කරද්දිම ටයිසන් මගේ ඉදිරියට පැන්නා.

"ටයිසන්!" මම බෙරිහන් දුන්නා.

ගිනිදලු රතු පාට ටොනේඩෝවක් වගේ එයා වටේට සුළි හැංවුවා. මට දකගන්න ලැබුණේ එයාගේ කළු පාට ඡායාවක් විතරයි. මේ දැන් මගේ යාළුවා අළු ගොඩකට හැරුණු බව මට සහතික වුණා.

ඒත්, ගින්දර නිවී යද්දි කිසිම ආපදාවක් නැතිව ටයිසන් එතැනම සිටගෙන සිටියා. අඩු තරමේ එයාගේ කිලුටු ඇඳුම්වත් පිච්චිලා නැහැ. මම තරමටම ගොනාත් පුදුම වෙන්නැති, තවත් වරක් ගිනි පිඹින්න ඌට ඉඩක් ලැබෙන්න කලින්, අත මිට මොළවාගත් ටයිසන් ඌගේ හොම්බට ඇන්නා. "නරක ගොනා!"

ඒ පහරට ලෝකඩ ගොනාගේ හොම්බ ඇතුළට ඇබුණා. ඌගේ කන් දෙකෙන් ගින්දර එළියට පැන්නා. ටයිසන් ඌට තවත් පහරක් ගසද්දි, එයාගේ අත්වලට මැදිවුණු ලෝකඩ ඇලුමිනියම් පත්‍ර වගේ ඇකිළුණා. දැන් ගොනාව පෙනුණේ කණපිට හැරවූ රෙදි රූකඩයක් වගෙයි.

"වැටෙනවා!" ටයිසන් මොර දුන්නා.

දෙපැත්තට වැනුණ ගොනා උඩුබැලි අතට බිම වැටුණා. ඌගේ අබලන් කකුල් උඩ වැනෙද්දි, ඌගේ තැළුණු ඔළුවේ තැන් තැන්වලින් දුම් දැමුවා.

ඇනබෙත් මගේ ළඟට දුවගෙන ආවා.

මගේ වළලුකර ඇතුළේ ඇසිඩ් පිරිලා වගේ දැනුණත්, ඇනබෙත් මට දුන් ඔලිම්පියානු නෙක්ටාර් බිවූ හැටියේම මට ආපසු සුවයක් දැනෙන්න ගත්තා. මට දැනුණ පිච්චෙන ගඳ ආවේ මගේ ඇඟෙන්මයි කියලා මම දැනගත්තේ පස්සේ. මගේ අත්වල රෝම සම්පූර්ණයෙන්ම පිළිස්සිලා.



"අනිත් ගොනා?" මම ඇසුවා.

ඇනබෙත් කන්ද පහළට අත දිගු කළා. දෙවෙනි ගොනා ගැන ක්ලැරිස් වගබලාගෙන තිබුණා. එයා දිව්‍යමය ලෝකඩ හෙල්ලයකින් ඌගේ පස්සා ගාතයට ඇන තියලා. දැන්, හොම්බෙන් බාගයකුත්, ඇලපතෙන් පදාසයකුත් නැතිව ඒ සතා එක තැන රවුමට දුවමින් සිටියේ මෙරි-ගෝ-රවුන්ඩ් එකක සතෙක් වගෙයි.

සුද හිස්වැසුම ගලවා අතට ගත් ක්ලැරිස් අපේ දිහාවට ආවා. එයාගේ දුඹුරු පාට පොල් කෙඳි වගේ කෙස් කැරැල්ලක් පිළිස්සෙමින් තිබුණත්, එයාට නම් ඒ ගැන වගක් නැහැ වගෙයි. "මම උන්ව පාලනය කරගෙනයි හිටියේ!"

එයාට ප්‍රතිචාර දක්වන්නත් බැරි තරමට මම පුදුම වුණා. "ඔයාවත් දකින්න ලැබුණට සතුටුයි, ක්ලැරිස්." ඇනබෙත් අවලාදාත්මක හඬින් කිවුවා.

"ආහ්!" ක්ලැරිස් බෙරිහන් දුන්නා. "ආයේ කවදාවත්, කවමදාකවත් මාව බේරගන්න හදන්ඩ එපා!"

"ක්ලැරිස්," ඇනබෙත් කතා කළා, "ඔයා තුවාල වුණ කඳවුරුකාරයෝ ගැන බලන්නැද්ද?" එයින් එයාව සන්සුන් වුණා. අඩු තරමේ ක්ලැරිස් පවා එයා යටතේ ඉන්න සොල්දාදුවෝ ගැන හොයලා බලනවා.

"මම ආපහු එනවා," ගෙරවූ එයා හානිය ගැන සොයා බලන්න ගාටමින් ගියා.

මම ටයිසන් දිහා බැලුවේ පුදුමයෙන්. "ඔයා මැරුණේ නැහැ."

ටයිසන් අපහසුවෙන් බිම බලාගත්තා. "මට දුකයි. මං ඔයා කියපු දේ ඇහුවේ නෑ. මම උදව් කරන්න ආවේ."

"මගේ වැරැද්ද," ඇනබෙත් කිවුවා. "මට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. ඔයාව බේරගන්න ටයිසන්ට සීමාව හරහා එන්න මට ඉඩ දෙන්න සිද්ධ වුණා. එහෙම නොකළා නම්, ඔයා මෙලහකටත් මැරිලා."

"සීමාව හරහා එන්න ඉඩ දුන්නා?" මම ඇසුවා. "ඒත් -"

"පර්සි," එයා කිවුවා. "ඔයා කවදාවත් ටයිසන්ගේ ළඟටම ගිහින් බලලා තියෙනව ද? මං කිවුවේ... එයාගේ මූණ දිහා. මීදුම නොසලකා හැරලා, ඇත්තටම එයා දිහා බලන්න."

මීදුමෙන් සිද්ධ වෙන්නේ මිනිස් මොළයට තේරුම් ගත හැකි දේවල් විතරක් පෙන්වන එකයි... උප දෙවිවරුන්වත් රවටන්න එයට හැකි බව මම දන සිටියා. ඒත්...

මම ටයිසන්ගේ මුහුණ දෙස බැලුවා. ඒක ලේසි වුණේ නැහැ. එයා දෙස එක එල්ලේ බලන්න මට හැමදාමත් අපහසු වුණත්, ඒ ඇයි කියලා මට කවදාවත් තේරුණේ නැහැ. මං හිතුවේ එයාගේ බොල්ලෑ දත්වල නිතරම වගේ පීනට් බටර් රැඳිලා තියෙන නිසා වෙන්නැති කියලයි. එයාගේ තඩි නහය දිහා බලන්න මම, මටම බල කළා, ඊට පස්සේ ඊට ටිකක් උඩින් ඇති එයාගේ ඇස් දිහා මම බැලුවා.

නෑ, ඇස් නෙවෙයි.

ඇසක්. ගන පිල්ලම් ඇති, වහු පැටියෙකුගේ වගේ දුඹුරු පාට ලොකු එක ඇහැක් එයාගේ නළල මැද තිබුණා. එයින් වැටුණු කඳුළු බිංදු එයාගේ කම්මුල් දෙපැත්තෙන් ගලා බැස්සා.

"ටයිසන්," මට ගොත ගැහුණා. "ඔයා..."

"සයික්ලොප්ස් කෙනෙක්," ඇනබෙත් කිවුවා. "පෙනුමේ හැටියට තවම පැටියෙක්. ඒ නිසා වෙන්නැති ගොන්නුන්ට තරම් ලේසියෙන් එයාට සීමා බැම්ම හරහා එන්න බැරිවුණේ. ටයිසන් කියන්නේ ඉන්න තැනක් නැති, අනාථයන්ගෙන් කෙනෙක්."

"මොන කෙනෙක්?"

"එයාලා ලොකු නගර හැම එකකම වගේ ඉන්නවා," ඇනබෙත් අප්පිරියාවෙන් වගේ කිවුවා. "එයාලා... අත්වැරදීම්, පර්සි. ස්වාභාවික බලවේගවලයි දෙවිවරුන්ගෙයි ළමයි... හොඳයි, විශේෂයෙන්ම එක දෙවියෙකුගේ... ඒ වගේම එයාලා කවදාවත් හොඳ විදිහට පිටට එන්නෙ නෑ. කාටවත් එයාලව උවමනා නෑ. ඒ නිසා එයාලව පැත්තකට විසි කරනවා. ඉතින් එයාලා පාරවල්වල සත්තු වගේ ලොකු වෙනවා. මෙයා කොහොම ඔයාව හොයාගත්තද කියලා මං දන්නෑ, හැබැයි පේන විදිහට නම් එයා ඔයාට කැමතියි වගේ. අපි එයාව කයිරොන් ළඟට අරන් යන්න ඕනෑ. එතකොට, කරන්න ඕනෑ දේ එයා තීරණය කරයි."

"ඒත් ගින්දර. කොහොමද-"



"එයා සයික්ලොප්ස් කෙනෙක්." ඇනබෙත් නතර වුණේ, එයාට මොකක්හෝ අප්‍රසන්න දෙයක් මතක් වුණා වගෙයි. "දෙවිවරුන්ගේ කම්මල්වල වැඩ කරන්නේ එයාලා. ඉතින් එයාලාව ගින්දරට පිච්චෙන්නෙ නෑ. මම ඔයාට කියන්න හැදුවේ ඒකයි."

මම මුළුමනින්ම කම්පනයට පත්වුණා. ටයිසන් කවුද කියලා මට කවදාවත් නොතේරුණේ කොහොමද?

ඒත් ඒ ගැන වැඩිදුර කල්පනා කරන්න මට වෙලාවක් තිබුණේ නැහැ. මුළු කඳු බෑවුමම ගිනි ගනිමින් තිබුණා. අපිට තුවාල වුණු වීරයෝ ගැන බලන්න තිබුණා. තව, වප්ප වුණ ගොන්නු දෙන්නෙක් ගැන බලාගන්නත් තිබුණා. අපේ සාමාන්‍ය කුණු භාජනවලට උන්ව කොහොම ඔබන්නද කියලා මට හිතාගන්න බැරිවුණා.

ආපසු ආව ක්ලැරිස් නළලේ වූ දැලි පිසදමා ගත්තා. "ජැක්සන්, ඔහේට හිටගන්න පුළුවන් නම් නැගිටින්ඩ. අපි තුවාලකාරයන්ව මහ ගෙදරට අරන් ගිහිල්ලා, සිද්ධ වෙච්ච දේවල් ටන්ටලස්ට කියන්න ඕනෑ."

"ටන්ටලස්?" මම ඇහුවා.

"ක්‍රියාකාරකම් අධ්‍යක්ෂක," ක්ලැරිස් නොඉවසිල්ලෙන් කිවුවා.

"ක්‍රියාකාරකම් අධ්‍යක්ෂක කයිරොන් නේ. එතකොට, ආර්ගස් කොහෙද? ප්‍රධාන ආරක්ෂක නිලධාරියා විදිහට එයා මෙතැන ඉන්න එපැයි."

ක්ලැරිස් මුහුණ පුළුටු කරගත්තා. "ආර්ගස්ව අස් කළා. ඔහේලා දෙන්නා ඕනෑවටත් වඩා කල් මෙහෙන් පිට හිටියා. දූත් මෙහෙ දේවල් වෙනස් වෙනවා."

"ඒත් කයිරොන්... අවුරුදු තුන්දාහකටත් වැඩි කාලයක් තිස්සේ රාක්ෂයෝ එක්ක සටන් කරන්න ළමයින්ව පුහුණු කළේ එයා. එයාට එහෙම නිකංම යන්න බැහැ. මොනවද සිද්ධ වුණේ?"

"සිද්ධ වුණේ අරක," ක්ලැරිස් කඩා පැන්නා.

එයා තාලියාගේ ගහ දෙසට ඇඟිල්ල දිගු කළා.

මේ ගහේ අතීතය හැම කඳවුරුකරුවෙක්ම දන්න කතාවක්. අවුරුදු හයකට කලින් ග්‍රෝවර්, ඇනබෙත් එක්ක තාලියා සහ ලූක් කියලා තවත් උප දෙවිවරු දෙන්නෙක් අර්ධ-ලෝහිත කඳවුරට එද්දි

රාක්ෂ හමුදාවක් එයාලව මරන්න පැන්නුවා. මේ කන්ද මුදුනේදි එයාලව කොටු වුණාම, සියුස්ගේ දුවෙක් වුණ තාලියා, එයාගේ යාළුවන්ට බේරිලා යන්න වෙලාව ලබා දෙන්න මෙතැන තනියම නැවතුණා. එයා මැරෙන්න පණ අදිද්දී, එයාගේ තාත්තා, සියුස්ට එයා ගැන අනුකම්පා හිතිලා එයාව පයින් ගහකට හැරෙව්වා. එයාගේ ආත්මය කඳවුරේ මායා බැම්ම ශක්තිමත් කරලා, කඳවුර රාක්ෂයන්ගෙන් ආරක්ෂා කළා. එදා ඉඳන් මේ පයින් ගහ ශක්තිමත්ව සහ නීරෝගීව මෙතැන තිබුණා.

ඒත් දැන්, එහි ඉඳිකටු වගේ කොළ කහ පාටට හැරිලා. මැරුණු කොළ තට්ටුවක්ම ගහ මුල හැලිලා. කඳේ මැද, පොළොවේ සිට අඩි තුනක් විතර ඉහළින්, උණ්ඩ සිදුරක් තරමට හැරූ සිදුරකින් කොළ පාට ඕජස ගලමින් තිබුණා.

මගේ පපුව පුරා සීතල හිරියක් පැතිරුණා. කඳවුර අනතුරේ වැටී ඇති හේතුව දැන් මට පැහැදිලි වුණා. මායා බැමි දුර්වල වෙමින් තිබුණේ තාලියාගේ ගස මිය යන නිසයි.

කවුරුහරි ඒකට වස කවලා.

# 05

# මගේ අලුත් කැබින් සහායකයා

කවදාහරි දවසක ඔයා ගෙදර එද්දී ඔයාගේ කාමරය සම්පූර්ණයෙන්ම කණපිට හැරිලා තිබිලා නැද්ද? කවුරුහරි උදවු කරන්න කැමති කෙනෙක් (හායි, අම්මේ) ඒක අස් කරන්න උත්සාහ කරලා; ඊට පස්සේ ඔයාට, ඔයාගේ බඩු එකක්වත් හොයාගන්න බැරිවෙලා නැද්ද? කිසිවක් නැතිවෙලා නැතත්, කවුරුහරි ඔයාගේ පෞද්ගලික බඩු ඇදලා බලලා, හැමදේකම දූවිලි පිහදාලා, සුද්ධ පවිත්‍ර කරලා තියෙනවා දක්කාම ඇතිවෙන බියජනක හැඟීම දැනිලා තියෙනව ද?

අර්ධ-ලෝහිත කඳවුර ආපසු දකිද්දී මට ඇති වුණෙත් අන්න ඒ වගේ හැඟීමක්.

මතුපිටින් බලද්දී එහි එතරම් වෙනසක් පෙනුණේ නැහැ. නිල් පාට දෙපළ වහලයත්, වටේටම දිවෙන පියස්සත් එක්ක මහ ගෙදර තවමත් එතැනම තිබුණා. ස්ට්‍රෝබෙරි යායවල් තවමත් අව්වේ කර වුණා. සුදු පාට කුලුනු ඇති පරණ-පුරුදු ග්‍රීක ගොඩනැගිලි තවමත් දෙණිය පුරා විසිරී තිබුණා- රංගාවාටය, මල්ලව පිටිය, ලෝන්ග් අයිලන්ඩ් වෙරළට මුහුණලා පිහිටි කෑම ගන්නා මණ්ඩපය වගේම කැලයත් ඉස්සර වගේමයි. සෑම ඔලිම්පියානු දෙවියෙක්වම නියෝජනය වෙන පරිදි විකාර මෝස්තරවලට සෑදූ කැබින් දොළහත් ඒ ඒ තැන්වලම තිබුණා.

ඒ වුණත් වටපිටාවේ අන්තරායක බවක් දැනුණා. මොකක් හෝ වරදක් ඇති බව අපිට තේරුණා. වැලිපිටියේ අත්පන්දු සෙල්ලම් කරනවා වෙනුවට සැටර්ලා සහ උපදේශකයින් උපකරණ ගබඩාවේ ආයුධ රැස් කරමින් සිටියා. දුනු ඊතලවලින් සන්නද්ධ වූ වන දේවතාවෝ

කැලය අද්දර කතා බහ කරමින් සිටියේ බයෙන් සැකයෙන් වගෙයි. කැලෑව ලෙව පාටින් දිස්වෙද්දී, දෙණිසිමේ කණකොළ ලා කහ පාටට හැරෙමින් තිබුණා. අර්ධ-ලෝහිත කන්දේ තැනින් තැන පිළිස්සුණු කොටස් පෙනුණේ කැත තුවාල කැළැල් වගෙයි.

මම මේ ලෝකේ ආසම තැන කවුරුහරි අවුල් කරලා. ඉතින් මම... ප්‍රීතිමත් කඳවුරුකාරයෙක් වුණේ නැහැ.

අපි මහගෙදරට යන අතරමගදී, පහුගිය ගිම්හානයේදී දැන හඳුනාගත් ළමයි ගොඩක් මට දකින්න ලැබුණා. ඒ කිසිවෙක් කතා කරන්න නැවතුණේ නැහැ. "ආපහු දකින්න ලැබුණට සතුටුයි" කියලා කිව්වෙත් නැහැ. ටයිසන්ව දකපු සමහරු දෙවරක් හැරිලා බැලුවත්, වැඩි දෙනෙක් මුහුණු බර කරගෙන තම තමන්ගේ වැඩ- ඒ කියන්නේ, පණිවුඩ ගෙනයෑම්, මුවහත තැබිය යුතු කඩු එකතු කිරීම වගේ දේවල් කළා.

කඳවුර යුද අභ්‍යාස පාසැලක් වගෙයි පෙනුණේ. මාව විශ්වාස කරන්න. ඒ ජාතියේ පාසැල් දෙකකිනුත් මාව දොට්ට දාලා තියෙනවා.

මේ කිසිවක් ටයිසන්ට නම් ප්‍රශ්නයක් වුණේ නැහැ. දකින්න ලැබුණු හැමදේකින්ම එයා සහමුලින්ම වශී වෙලයි හිටියේ.

"අර මොකක්ද?" එයා හුල්ලමින් ඇසුවා.

"පෙගසිලාගේ ඉස්තාලේ." මම උත්තර දුන්නා. "තටු තියෙන අශ්වයින්ගේ."

"අර මොකක්ද!"

"ම... ඒවා ටොයිලට්."

"අර මොකක්ද!"

"කඳවුරුකාරයින්ගේ කැබින්. ඔයාගේ ඔලිම්පියානු අම්මා හෝ තාත්තා කවුද කියලා ඔයා දන්නෙ නැත්නම් එයාලා ඔයාව හර්මීස් කැබින් එකට- අර තියෙන දුඹුරු පාට එකට- දානවා. ඔයා ගැන තීරණය කරනකල් ඒකෙ ඉන්න වෙනවා. ඊට පස්සේ, ඔයා කවුද කියලා හොයාගත්තම එයාලා ඔයාව, ඔයාගේ අම්මාගේ හරි තාත්තාගේ හරි කණ්ඩායමට දානවා."

එයා ගරුසරු ඇතිව මගේ දිහා බැලුවා. "ඔයාටත්... කැබින් එකක් තියෙනවද?"



"අංක තුන." මුහුදු ගල්වලින් සෑදූ අළු පාට, කොට ගොඩනැගිල්ල පෙන්වමින් මම කිවුවා.

"ඒ කැබින් එකේ ඔයාට යාළුවෝ ඉන්නවද?"

"නෑ, නෑ. මං විතරයි." ඒ ගැන වැඩිදුර කතා කරන්න මම කැමති වුණේ නැහැ. හෙළි කරන්න අපහසු සත්‍යය වුණේ ඒ කැබින් එකේ සිටි එකම කෙනා මම වෙන්න හේතුව, මම ජීවතුන් අතර නොසිටිය යුතු කෙනෙක් නිසයි. දෙවිවරුන්ගේ ලොකු තුන්කට්ටුව- සියුස්, පොසෙයිඩන් සහ හේඩීස්- දෙවෙනි ලෝක යුද්ධයෙන් පසුව තවත් මනුෂ්‍ය දරුවෝ බිහි නොකරන්න ප්‍රතිඥා දුන්නා. එයට හේතුව වුණේ සාමාන්‍ය අර්ධ-ලෝහිත ළමයින්ට වඩා අපි ගොඩාක් බලවත් නිසයි. අපි ගැන කලින් අනාවැකි කියන්න අපහසු වුණා. කේන්ති ගියාම අපි එක එක ප්‍රශ්න ඇති කළා... හරියට, දෙවෙනි ලෝක යුද්ධය වගේ ඒවා. ලොකු තුන්කට්ටුවේ ගිවිසුම කඩවෙලා තියෙන්නේ දෙවතාවකදී විතරයි- එක් වතාවක් සියුස් තාලියාව බිහි කළා. අනෙක් වතාවේ පොසෙයිඩන් මාව බිහි කළා. අපි දෙන්නම ඉපදිය යුතු අය නෙවෙයි.

වයස අවුරුදු දොළහේදී තාලියා පයින් ගහකට හැරුණා. එතකොට මම... මෙහෙමයි, මම, මට පුළුවන් උපරිමයෙන් උත්සාහ කරමින් සිටියේ එයාගේ පාරේ නොයා ඉන්න. මම මරණාසන්න වුණොත් පොසෙයිඩන් මාව මොකකට හරවයිද හිතලා මම හීනෙනුත් බය වුණා. සමහරවිට, මාව මුහුදු ප්ලවාංගයක් කරයි. නැත්නම් පාවෙන මුහුදු පැළෑටියක් කරන්නත් ඉඩ තියෙනවා.

මහගෙදරට ගිය අපිට දකින්න ලැබුණේ හැටේ දශකයේ ප්‍රියතම සින්දුවලට සවන්දෙමින්, සැදල මලුවලට බඩු අහුරන කයිරොන්ව. මං හිතන්නේ, කයිරොන් නරාශ්වයෙක් බව ඔයාට මතක් කරලා දුන්නොත් හොඳයි. එයාගේ ඉණෙන් ඉහළ කොටස පෙනුණේ දුඹුරු පාට කැරලි කොණ්ඩයකුත්, රළු රැවුලකුත් ඇති සාමාන්‍ය මැදිවියේ මනුස්සයෙක් වගෙයි. ඒත්, ඉණෙන් පහළට එයා සුදු පාට, කප්පාදු නොකළ අශ්වයෙක්. එයා මිනිස්සු අතරට යන්නේ මායා රෝද පුටුවක් ඇතුළේ යටිකය සඟවාගෙන. ඒත්, සිවිලිම උසට තියෙනවා නම් සම්පූර්ණ නරාශ්ව ස්වරූපයෙන් ඉන්නයි එයා වැඩිපුර කැමති.

එයාව දැකපු හැටියේම ටයිසන් ගල් ගැසුණා. "පෝනියෙක්" එයා සතුට ඉහවහා ගොස් කෑගැසුවා. කයිරොන් අමනාපයෙන් හැරිලා බැලුවා. "මොකක්ද කිවුවේ?"

ඇනබෙත් දුවලා ගිහින් එයාව වැලඳගත්තා. "කයිරොන්, මොනවද මෙහෙ සිද්ධ වෙන්නේ? ඔයා.... යන්නද හදන්නේ?" එයාගේ කටහඬ සැලුණා. කයිරොන් එයාට තාත්තා කෙනෙක් වගෙයි.

එයාගේ කොණ්ඩය ඇවිස්සූ කයිරොන් කාරුණික හිනාවක් පෑවා. "කොහොමද දරුවෝ. පර්සි. මගේ දෙයියනේ, මේ අවුරුද්දට ඔයා සෑහෙන ලොකු වෙලා නේ!"

මම තදින් කෙළ ගිල්ලා. "ක්ලැරිස් කිවුවා ඔයාව... ඔයාව...."

"අස් කළා," කයිරොන්ගේ ඇස් සරදමින් දිලිසුණා. "අහ්, හොඳයි, බැණුම් අහන්නත් කවුරුහරි ඉන්න එපැයි. සියුස් උතුමා සෑහෙන කලබල වෙලා. එයාගේ දුවගේ ආත්මයෙන් එයා හැදුව ගහට වස දාලා ඉතින්, කාටහරි දඬුවම් කරන්න මිස්ටර් ඩීට සිද්ධ වුණා."

"ඒ කියන්නේ එයා ඇඟ බේරගෙන," මම ගෙරෙව්වා. කඳවුරු අධ්‍යක්ෂක, මිස්ටර් ඩී ගැන මතක් වෙද්දිත් මගේ කේන්තිය ඇවිස්සුණා.

"ඒත් මේක මහ පිස්සුවක්!" ඇනබෙත් කෑගැසුවා. "කයිරොන්, තාලියාගේ ගහට වස දාපු එකට ඔයා මොනවා කරන්නද!"

"ඒ කොහොම වුණත්," කයිරොන් සුසුමක් හෙළුවා. "මේ තියෙන තත්වෙ නිසා දැන් ඔලිම්පස්වල සමහරු මාව විශ්වාස කරන්නෑ."

"මොන තත්වෙද?" මම ඇසුවා.

කයිරොන්ගේ, මුහුණ අඳුරු වුණා. එයා ලතින්-ඉංග්‍රීසි ශබ්දකෝෂය සෑදල මල්ලට එබුවා.

ටයිසන් තවමත් කයිරොන් දිහා පුදුමයෙන් බලා සිටියා. එයා කංකෙඳිරි ගෑවේ කයිරොන්ගේ ඇලපතට තට්ටුවක් දාන්න ඕනෑ වුණත්, කිට්ටුවට යන්න බයයි වගෙයි. "පෝනියෝ?"

කයිරොන් තදින් හුස්මක් ගත්තා. "මගේ පුංචි සයික්ලොප්ස් පැටියෝ! මම නරාශ්වයෙක්."

"කයිරොන්," මම කතා කළා. "ගහට මොකද වුණේ? මොනවද සිද්ධ වුණේ?" එයා දුකෙන් ඔළුව හෙල්ලුවා.



"තාලියාගේ ගහට පාවිච්චි කරලා තියෙන විෂ පාතාල ලෝකයෙන් ගෙනාව එකක්, පර්සි. ඒක මමවත් දැකලා නැති ජාතියක්. ඒක ගන්න ඇත්තේ ටාටරස්වල පතුලේම ඉන්න රාක්ෂයෙකුගෙන්."

"එහෙනම් මේකට වග කියන්න ඕනෑ කෙනාව අපි දන්නවා නේ. ක්‍රෝ-"

"ටයිටන් රජාගේ නම කියන්නෙපා, පර්සි. විශේෂයෙන්ම මෙහෙදි, මේ වෙලාවේ එපා."

"ඒත් ගිය ගිම්හානේ ඔලිම්පස්වල සිවිල් යුද්ධයක් ඇති කරන්නයි එයා හැදුවේ! එයාගේ අදහස ඒක වෙන්න ඕනෑ. ඒ වැඩේ කරන්න අර ද්‍රෝහියා, ලූක්ව යවන්න ඇති."

"වෙන්න පුළුවන්," කයිරොන් කිවුවා. "ඒත් මට ඒක සිද්ධවීම වළක්වන්නවත්, ගහට බෙහෙත් කරන්නවත් බැරි වුණා. ගහේ ජීවය තියෙන්නේ තව සති කීපයක් විතරයි. එහෙම නැත්නම්..."

"එහෙම නැත්නම් මොකක්ද?" මම ඇසුවා.

"නෑ," කයිරොන් කිවුවා. "මෝඩ හිතලුවක් විතරයි. මුළු දෙණියටම විසේ සැර දැනෙනවා. මායා බැම්ම පිරිහෙනවා. කඳවුරම පණ අදිනවා. මේ විෂ පරාජය කරන්න පුළුවන් එකම එක මායාවකට විතරයි, ඒකත් සියවස් ගාණකට කලින් නැති වුණා."

"මොකක්ද ඒක?" මම ඇසුවා. "අපි ගිහින් ඒක හොයාගෙන එන්නම්!"

කයිරොන් සෑදල මල්ල වහලා, සංගීත පෙට්ටිය නතර කළා. ඊට පස්සේ ආපසු හැරුණු එයා මගේ ඇස් දෙස එක එල්ලේ බලාගෙන, මගේ උරහිස මතින් අතක් තැබුවා. "පර්සි, ඔයා කලබලේට වැඩ කරන්න යන්නෑ කියලා මට පොරොන්දු වෙන්න ඕනෑ. මේ ගිම්හානයේදි ඔයාව මෙහෙට එවන්න එපා කියලයි මං ඔයාගේ අම්මට කිවුවේ. ඒක ගොඩක් අනතුරුදායකයි. ඒත් දැන් ඔයා මෙහෙට ආව නිසා මෙහෙ ඉන්න. මහන්සි වෙලා පුහුණුවීම් කරන්න. සටන් කරන්න ඉගෙන ගන්න. හැබැයි මෙහෙන් එළියට යන්න එපා."

"ඇයි?" මම ඇසුවා. "මට මොනවහරි කරන්න ඕනෑ! බැම්ම කඩා වැටෙනකල් මට බලාගෙන ඉන්න බැහැ. ඊට පස්සේ මුළු කඳවුරම-"

"රාක්ෂයින්ගෙන් පිරේවි," කයිරොන් කිවුවා. "ඔව්, මටත් බය ඒකමයි. ඒත් කඩිමුඩියේ වැඩ කරන ඇමට අහුවෙන්න එපා! මේකත්

Scanned with CamScanner

ටයිටන් රජාගේ උගුලක් වෙන්න පුළුවන්. පහුගිය ගිම්හානේ මතකයි නේ තව පොඩ්ඩෙන් එයා ඔයාගේ ජීවිතය ගන්නවා."

ඒක ඇත්තක් වුණත්, උදවු කරන්න මට තවමත් තදින්ම උවමනා වුණා. ඒ වගේම, කළු දේවල්වලට ක්‍රෝනොස් වන්දි ගෙවනවා දකින්නත් මට ඕනෑ වුණා. මං අදහස් කළේ, යුග ගාණකට කලින් දෙවිවරු එයාව පරාජය කළාම එයා පාඩමක් ඉගෙන ගන්න ඇති; කෑලි මිලියන ගාණකට කපලා, පාතාලයේ අඳුරුම වළට තල්ලු කළාට පස්සෙවත් කවුරුවත් එයාට කැමති නැති බව එයා තේරුම් ගන්න ඇති කියලා ඔයා හිතනවා ඇති. ඒත් නැහැ. මොකද, අමරණීය කෙනෙක් නිසා එයා තවමත් ටාටරස්වල ජීවත් වෙනවා - සදාකාලික වධ වේදනා විඳිමින්, ආපසු ඇවිත් ඔලිම්පියානුවන්ගෙන් පළිගන්න ආශාවෙන් එයා තවමත් ඉන්නවා. එයාට තනිව වැඩකරන්න බැරි වුණත්, මනුෂ්‍යයන්ගේ සහ දෙවිවරුන්ගේ හිත්වලට විෂ කවා එයාගේ කුණු වැඩවලට යොදාගන්න එයා හරිම දක්ෂයි. මේ වස දීමත් එයාගේ වැඩක් වෙන්න ඕනෑ. යාළුවන්ව බේරාගන්න තමන්ගේ ජීවිතය කැප කළ වීරයෙකුගෙන් ඉතිරි වූ එකම දේ වුණ තාලියාගේ පයින් ගහට වස කවන්න තරම් නීච වෙන්නේ වෙන කවුද?

ඇනබෙත් නාඩා ඉන්න තදින් උත්සාහ කළා. එයාගේ කම්මුලට වැටුණු කඳුළු බිංදුවක් කයිරොන් පිස දැමුවා. "පර්සි එක්කම ඉන්න, දරුවෝ," කයිරොන් එයාට කිවුවා. "එයාව පරිස්සම් කරන්න. අනාවැකිය- ඒක මතක තියාගන්න!"

"ම-මම එහෙම කරන්නම්."

"මේ..." මම කතා කළා, "ඔය කියන්නේ අර මං ගැන කියලා තියෙන, ඒත් දෙවිවරු මට හෙළි කරන්න තහනම් කරපු අති භයානක අනාවැකිය ගැන ද?"

කාගෙන්වත් උත්තර නැහැ.

"හරි," මම කෙඳිරුවා. "ඒකමද කියලා බැලුවේ."

"කයිරොන්..." ඇනබෙත් කතා කළා. "දෙවිවරු ඔයාව අමරණීය කළේ වීරයෝ පුහුණු කරවන්න ඔයාව උවමනා වෙන තුරු විතරයි කියලා ඔයා මට කිවුවා නේද? එයාලා ඔයාව කඳවුරෙන් අස් කළා නම්-"



"අනතුරුවලින් පර්සිව ආරක්ෂා කරන්න ඔයාට පුළුවන් උපරිමය කරනවා කියලා දිවුරන්න," එයා ඇනබෙත්ගෙන් බල කර ඉල්ලුවා. "ස්ටයික්ස් ගඟ මත දිවුරන්න."

"ම-මම එහෙම කරන්න ස්ටයික්ස් ගඟ මත දිවුරනවා," ඇනබෙත් කිවුවා.

අකුණක් මහ හඬින් පුපුරා ගියා.

"බොහොම හොඳයි," කයිරොන් කිවුවා. එයා චුට්ටක් විතර සැහැල්ලු වුණා වගෙයි. "බාගදා, මගේ නම පිරිසිදු වෙලා, මට ආපහු එන්න ලැබේවි. ඒ වෙනතුරු මගේ වනචාරී නෑයෝ බැහැදකින්න මම එවර්ග්ලේඩ්ස්වලට යනවා. වස කැවුණු ගහට කරන්න මට අමතක වෙච්ච බෙහෙතක් එයාලා දන්නවද දන්නෑ නේ. ඒ මොනවා වුණත්, මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනකල් මම මෙහෙන් පිටමං වෙලාම ඉන්නවා... එක විදිහකින් නැත්නම් අනෙක් විදිහෙන්."

ඇනබෙත් ඉකියක් ගිලගත්තා. කයිරොන් නුහුරු ලෙස එයාගේ උරහිසට තට්ටු කළා. "ඔන්න, ඉතින්, දරුවෝ. මම ඔයාලගේ ආරක්ෂාව මිස්ටර් ඩීටයි අලුත් ක්‍රියාකාරකම් අධ්‍යක්ෂකටයි පවරන්න ඕනෑ. අපි බලාපොරොත්තු වෙමු... හොඳයි, බාගදා, මම බය වෙලා ඉන්න තරම් ඉක්මනින් එයාලා කඳවුර විනාශ කරන්නෙ නැති වෙයි."

"කොහොමහරි, කවුද මේ ටන්ටලස් කියන හාදයා?" මම ප්‍රශ්න කළා. "ඔයාගේ රස්සාව ගන්න එයා කොහෙන්ද කඩාපාත් වුණේ?"

දෙණියේ එහා කෙළවරෙන් හක් ගෙඩියක් පිඹින හඬ ඇසුණා. කොයි තරම් වෙලාවක් ගතවුණාද කියලා මට තේරුණේ එතකොටයි. ඒ රෑ කෑම සඳහා කඳවුරුකරුවෝ රැස්වෙන වෙලාව.

"යන්න," කයිරොන් කිවුවා. "මණ්ඩපයේදී ඔයාලට එයාව මුණගැහෙයි. මම ඔයාගේ අම්මට කතා කරන්නම්, පර්සි. ඔයා පරිස්සමෙන් ඉන්නවා කියලා එයාට දන්වන්නම්. කිසිම සැකයක් නෑ, මේ වෙද්දී එයා කලබල වෙලා ඇති. මගේ අවවාදෙ මතක තියාගන්න! ඔයා ඉන්නේ බරපතළ අවදානමක. ටයිටන් රජාට ඔයාව අමතක වෙලා ඇති කියලා එක තත්පරේකටවත් හිතන්නෙපා!"

ඒත් එක්කම ආපසු හැරුණු එයා කාමරයෙන් පිටවෙලා ශාලාව දිගේ යද්දි ටයිසන් කෑගැසුවා, "පෝනියෝ! යන්න එපෝ!"

Scanned with CamScanner

ග්‍රෝවර් ගැන මම දකපු හීනය කයිරොන්ට කියන්න අමතක වුණු බව මට සිහි වුණා. දන් ඒකට පරක්කු වැඩියි. මට සිටි හොඳම ගුරුතුමා යන්න ගියා, සමහරවිට ආයේ නොඑන්නම ගියා.

ටයිසනුත් ඇනබෙත් තරමටම කැමෝරදෙමින් අඬන්න ගත්තා. හැමදෙයක්ම හරියාවි කියලා එයාලව සනසන්න මට ඕනෑ වුණත්, මම වුණත් ඒක විශ්වාස කළේ නැහැ.

කඳවුරුකරුවෝ කැබින්වලින් පිටතට එද්දී කෑම ගන්නා මණ්ඩපයට පිටුපසින් ඉර ගිලෙමින් තිබුණා. කිරිගරුඬ කුලුනක හෙවණැල්ල යට සිටගත් අපි එයාලා පෙළගැසෙන දෙස බලා සිටියා. ඇනබෙත් තවමත් සිටියේ තැතිගැන්විලා වගෙයි. පසුව අපිට කතා කරන්න පොරොන්දු වූ එයා, එයාගේ සහෝදර සහෝදරියන්ට- එයාගේ වගේම තඹ පාට කොණ්ඩාත්, අළු පාට ඇසුත් ඇති කොල්ලෝ කෙල්ලෝ දූසිමකට එකතු වෙන්න ඇතීනාගේ කැබිනයට ගියා. එයාලා අතරින් වැඩිමහල්ම කෙනා ඇනබෙත් නොවුණත්, අනෙක් හැමෝටම වඩා වැඩි කාලයක් එයා මේ කඳවුරේ ඉඳලා තිබුණා. එයාගේ කඳවුරු මාලයේ එක ගිම්හානයකට එක පබළුව බැගින් පබළු හයක් අමුණා තිබුණා. ඉතින්, පේළියේ පෙරමුණ ගන්න එයාට ඇති අයිතිය ගැන කිසිවෙක් ප්‍රශ්න කළේ නැහැ.

ඊට පිටුපසින් ඒරීස් කැබිනය මෙහෙයවමින් ක්ලැරිස් ආවා. එක අතක් බෙල්ලේ එල්ලාගෙන සිටි එයාගේ කම්මුලක දරුණු කැපුමක් දකින්න ලැබුණා. ඒත් ඒ ඇරෙන්න ලෝකඩ ගොන්නු එක්ක කළ පොරයෙන් එයාට ලොකු ආපදාවක් නැහැ වගෙයි. 'උම්බෑ ගාන කෙල්ල!' කියලා ලියපු කඩදාසියක් කවුදෝ එයාගේ පිටේ අලවා තිබුණත්, එයාගේ කැබිනයේ කිසිවෙක් ඒ ගැන එයාට කියන්න කරදර වුණේ නැහැ.

ඒරීස් ළමයින්ට පිටුපසින් හෙෆාස්ටස් කැබිනයේ කොල්ලෝ හයදෙනාව පෙරටු කරගෙන චාර්ල්ස් බෙකන්ඩෝර්ෆ් ආවා. අවුරුදු පහළොවක හැඩිදැඩි කොල්ලෙක් වූ එයා අප්‍රිකානු-ඇමරිකානු ළමයෙක්. බේස්බෝල් අත්මේස් තරම් ලොකු දෑතකුත්, දවස පුරා කම්මලේ උඳුන දෙස බලා හිඳීමෙන් වපර වූ මුහුණකුත් එයාට තිබුණා. එකිනෙකා හඳුනාගත් පසු එයා ප්‍රියමනාප ලෙස හැසිරුණත්, කවුරුවත් කවදාවත් එයාට චාලි, චක් හෝ චාර්ල්ස් කියලා කතා කළේ නැහැ. වැඩි දෙනෙක් එයාට කතා කළේ බෙකන්ඩෝර්ෆ් කියලා විතරයි. කට කතාවට කිවුවේ නම් එයාට ඕනෑම දෙයක් හදන්න පුළුවන් කියලා. එයාට ලෝහ



කුට්ටියක් දුන්නොත් දළිපිහියක් තරම් තියුණු කඩුවක්, රොබෝ යුද හටයෙක්, එහෙමත් නැත්නම් ඔයාගේ ආච්චි අම්මාගේ මිදුලේ තියන්න සින්දු කියන කුරුලු බේසමක් වුණත් හදලා දෙන්න එයාට පුළුවන්ලු.

අනෙක් කැබින්වල අයත් පෙළගැසුණාඃ ඩිමීටර්, ඇපලෝ, ඇෆ්‍රොඩයිටි, ඩයනයිසියස්. ඔරු පදින විලෙන් ජල දෙවඟනෝ මතුවුණා. වන දේවතාවෝ ගස්වලින් පිටතට දියවී ආවා. දෙණිබිමෙන් ආ සැටර්ලා දූසිම දකිද්දී ග්‍රෝවර්ව සිහිවෙලා මට දුක හිතුණා.

සැටර්ලා ගැන මගේ හිතේ නිතරම තෙතමනයක් තිබුණා. කඳවුරේ ඉන්නකොට මිස්ටර් ඩීගේ කුණුවැඩ ඔක්කොම කරන්න එයාලට සිද්ධ වුණත්, එයාලගේ වැදගත්ම රාජකාරිය තිබුණේ පිටත ලෝකයේයි. කඳවුරේ සොයන්නෝ වුණේ එයාලා. ලෝකය පුරාම ඇති ඉස්කෝලවලට හොර රහසේ ගිහින්, අර්ධ-ලෝහිතයෝ විය හැකි ළමයින්ව හොයාගෙන, කඳවුරට කැඳවාගෙන එන වගකීම පැවරී තිබුණේ සැටර්ලාට. මට ග්‍රෝවර්ව මුණගැහුණෙත් ඒ විදිහට. මම උප දෙවියෙක් බව මුලින්ම හඳුනා ගත්තෙත් එයයි.

සැටර්ලට පිටුපසින් අවසානයට ආවේ හර්මීස් කැබිනයේ අයයි. කඳවුරේ ලොකුම කැබිනය වුණේ එයාලා. පහුගිය ගිම්හානයේදී ඒක මෙහෙයවූයේ ලූක්- ඒ කියන්නේ අර්ධ-ලෝහිත කඳු මුදුනේදී තාලියා සහ ඇනබෙත් එක්ක සටන් කළ කොල්ලා. පොසෙයිඩන් මට හිමිකම් කියන්න කලින්, මම හර්මීස් කැබින් එකේ සෑහෙන දවසක් තවාතැන් ගෙන සිටියා. ඒ කාලේ ලූක් මගේ යාළුවෙක් වුණා... ඊට පස්සේ එයා මාව මරන්න උත්සාහ කළා. දන් හර්මීස් කැබිනය මෙහෙයවූයේ ට්‍රැවිස් සහ කොනර් ස්ටොල් දෙන්නයි. නිවුන්නු නොවුණත් ඒ දෙන්නා පෙනුමෙන් කොයිතරම් සමානද කියනවා නම්, වැඩිමල් කෙනා කවුද කියලා මට කවදාවත් මතක තියාගන්න බැරි වුණා. කෙට්ටු, උස සිරුරු ඇති ඒ දෙන්නටම ඇස්වලට කඩා හැලෙන දුඹුරු පාට කොණ්ඩා තිබුණා. ලිහිල් කොට කලිසම් උඩින් දමූ තැඹිලි පාට අර්ධ-ලෝහිත කඳවුරු ටී-ෂර්ට් හැඳ සිටි ඒ දෙන්නාටත් හැම හර්මීස් ළමයෙකුටම පිහිටා ඇති දඩබ්බර මුහුණුවර නොඅඩුවම පිහිටා තිබුණාඃ ඉහළට එසවුණු ඇහිබැම්, උපහාසාත්මක හිනාව, ඔයාගේ කමිසය ඇතුළට රතිඤ්ඤයක් දාන්න හිතනවා වගේ එයාලා ඔයාට හෙළන බැල්ම. හොරුන්ට අධිපති දෙවියන්ට 'ස්ටොල්' වාසගම ඇති ළමයි ඉන්න එක විහිළුවක් වගේ කියලයි මට නිතරම හිතුණේ. ඒත්, ඔය කතාව මම

ට්‍රැවිස්, කොනර් දෙන්නට කිවුව වෙලාවේ ඒ දෙන්නා මට රැවුවේ ඒ විහිළුව තේරුණේ නැහැ වගෙයි.

අන්තිම කඳවුරුකරුවාත් වාඩිවුණු ඉක්මනින්ම, මම ටයිසන්ව මණ්ඩපය මැදට කැඳවාගෙන ගියා. සියලු කතාබහ නතර වුණා, හැමදෙනාගේම ඔළු අපේ පැත්තට හැරුණා. "ඒකව කවුද ඇතුළට ගත්තේ?" ඇපලෝ මේසයේ කෙනෙක් කෙඳිරුවා.

මම ඒ දෙසට රවා බැලුවත්, කතා කළ කෙනාව හොයාගන්න මට බැරිවුණා. ප්‍රධාන මේසයෙන් හුරුපුරුදු කටහඬක් නැගුණා, "හොදායි, හොදායි, මේ ඇවිත් ඉන්නේ පීටර් ජොන්සන් නෙවෙයි නම්, මගේ හොඳ කාලේ ඉවරයි."

මම දත්මිටි කෑවා. "පර්සි ජැක්සන්... සර්."

මිස්ටර් ඩී, එයාගේ ඩයට් කෝක් එක තොලගෑවා. "ඔව්. හොඳයි, මේ කාලේ ඔය හාදයෝ කියනවත් වගේ: ඕනෑ එකක්." සුපුරුදු විදිහට කොට් පුල්ලි වැටුණු හවායි කමිසයක් සහ කොට කලිසමක් හැඳ සිටි එයා කළු මේස්වලට උඩින් ටෙනිස් සපත්තු ජෝඩුවක් පැළඳගෙන සිටියා. තඩි බඩ ගෙඩියත්, පැල්ලම් වැටුණු රතු මූහුණත් එක්ක එයාව පෙනුණේ රෑ එළිවන තුරු කැසිනෝවල ගත කළ ලාස් වේගාස් සංචාරකයෙක් වගෙයි. එයාට පිටුපසින් බයාදු පෙනුමක් ඇති සැටර් කෙනෙක් මිදි ගෙඩිවල පොතු අරිමින්, එකින් එක මිස්ටර් ඩී අතට දුන්නා. මිස්ටර් ඩීගේ ඇත්ත නම ඩයනයිසියස්, වයින්වලට අධිපති දෙවියා. එයා සීමාවෙන් එපිට සිටි වන දෙවඟනක් පස්සේ යන්න ගියාට දඬුවමක් විදිහට සියුස් එයාව අර්ධ-ලෝහිත කඳවුරේ අධ්‍යක්ෂක ලෙසට අවුරුදු සියයක් වෙලි වෙලි ඉන්න එවලා තිබුණා.

එයාට එහා පැත්තේ, සාමාන්‍යයෙන් කයිරොන් වාඩිවෙන තැන (නැත්නම්, තරාශ්වයෙක් විදිහට හිටගෙන ඉන්න තැන) සිටියේ මීට කලින් කවදාවත් මම දකලා නැති කෙනෙක් - තුල් ඇඳුණ තැඹිලි පාට සිරකරු ඇඳුමක් හැඳගත් සුදුමැලි, අසාමාන්‍ය ලෙස කෙට්ටු පිරිමියෙක්. එයාගේ සාක්කුවට ඉහළින් අංකː0001 සටහන් කර තිබුණා. එයා කුණු පිරුණු නියපොතුත්, වල් කපන කතුරකින් කැපූ පෙනුම ඇති අළු පාට කොණ්ඩයකුත් ඇති, ඇස් වටේට නිල් පාට සෙවණැලි වැටුණු කෙනෙක්. එයා කන්න වගේ මගේ දිහා බලන් සිටි බැල්ම මාව කලබල කළා. එයාට තිබුණේ... බිඳුණු පෙනුමක්. හරියට එකම



වෙලාවේ තරහවෙන්, අපේක්ෂා භංගත්වයෙන් සහ බඩගින්නෙන් පෙළෙනවා වගෙයි.

"මේ කොල්ලා ගැන," ඩයනයිසියස් එයාට කිවුවා, "ඔයා ඇහැ ගහගෙන හිටියොත් හොඳයි. පොසෙයිඩන්ගේ ළමයා, ඔයා දන්නවනේ."

"අහ්!" සිරකරුවා කිවුවා. "එයාද?"

එය කියූ විදිහෙන් මට පැහැදිලි වුණේ එයාලා දෙන්නා දැනටමත් මං ගැන සෑහෙන්න කතාවෙලා තියෙන බවයි.

"මම ටන්ටලස්," සිරකරුවා සීතල හිනාවක් එක්ක කිවුවා. "විශේෂ පැවරුමකට ආවේ, මගේ ඩයනයිසියස් උතුමාට උවමනා කාලයක් සේවය කරන්න. එතකොට පර්සියස් ජැක්සන්, ඔයා තවත් කරදර ඇති නොකර ඉන්න වගබලා ගනී කියලා මං බලාපොරොත්තු වෙනවා."

"කරදර?" මම ප්‍රශ්න කළා.

ඩයනයිසියස් අසුරක් ගසද්දී මේසය උඩ පුවත්පතක් මතු වුණා- අද නිව්යෝක් පෝස්ට් පත්තරේ මුල් පිටුව. මෙරිවෙදර් ඉස්කෝලේ වාර්ෂික සංග්‍රහයෙන් ගත් මගේ පින්තූරයක් එහි පළවී තිබුණා. සිරස්තලය කියවාගන්න මට අපහසු වුණත්, එයින් කියවෙන දේ හිතාගන්න මට අපහසු වුණේ නැහැ. එහි තියෙන්න ඇත්තේː දහතුන් වියැති උන්මත්තකයා ක්‍රීඩාගාරයට ගිනි තබයි.

"ඔව්, කරදර," ටන්ටලස් තෘප්තිමත් හඬින් කිවුවා. "පහුගිය ගිම්හානෙදිත් ඔයා ඇති තරම් ඒවා කළා නේ, මට තේරෙනවා."

කේන්තිය වැඩිකමට මට කතා කරගන්නත් බැරිවුණා. හරියට දෙවිවරු සිවිල් යුද්ධයක් ඇති කරගන්න ගියේ මගේ වැරැද්දෙන් වගෙයි?

බයාදු ලෙස අඟලෙන් අඟල කිට්ටු වුණ සැටර් කෙනෙක් ටන්ටලස් ඉදිරියේ බාබකියු පිඟානක් තැබුවා. අලුත් ක්‍රියාකාරකම් අධ්‍යක්ෂක තොල කට ලෙවකෑවා. හිස් කුසලානය දෙස බැලූ එයා, "නමසිය හැට හතේ, බාක්ගේ විශේෂ තොගයේ රූට් බියර්," ඇණවුම් කළා.

පෙණ නගින සෝඩා වර්ගයකින් වීදුරුව පිරුණා. ටන්ටලස් පැකිළෙමින් අත දිගු කළේ, කුසලානය උණු ඇති හිතලා බයෙන් වගෙයි.

"හරි එහෙනම්, පරණ යාළුවා," ඩයනයිසියස් කියද්දි එයාගේ ඇස් ආගන්තුක දිස්නයකින් දිලිසුණා. "බාගදා, දැන් ඒක වැඩ කරයි."

ටන්ටලස් වීදුරු කුසලානය අතට ගන්න හැදුවත් එයා අල්ලන්න කලින් ඒක පැත්තකට පැන්නා. එයින් විසිරුණු රූට් බිර බිංදු කීපයක් ඇඟිලිවලින් අල්ලන්න උත්සාහ කරද්දි, එයාගේ ඇඟිලි ගෑවෙන්න කලින් ඒවා රසදිය බිංදු වගේ ඈතට පෙරළුණා. තරහෙන් ගෙරවූ එයා බාබකියු පිඟානට හැරුණා. එයා ගෑරුප්පුවක් අරන් මස් කෑල්ලකට අනින්න හැදුවත්, ඊට කලින් මේසයේ පහළට පලාගිය පිඟාන කෙලින්ම ගිනි උඳුනේ අඟුරු මැදට පැන්නා.

"හෙණ ගහපි!" ටන්ටලස් කෙඳිරුවා.

"අහ්, හොඳයි," බොරු කණගාටුවකින් කටහඬ පුරවාගෙන ඩයනයිසියස් කිව්වා. "බාගදා, තව දවස් තුන-හතරකින්. මාව විශ්වාස කරන්න, පරණ හාදයෝ, මේ කඳවුරේ වැඩ කරද්දි විඳින වධය හොඳටම ඇති. මට විශ්වාසයි, අන්තිමට ඔයාගේ පරණ ශාපය මැකිලා යයි."

"අන්තිමට?" ඩයනයිසියස්ගේ ඩයට් කෝක් එක දිහා බලාගෙන ටන්ටලස් කෙඳිරුවා. "අවුරුදු තුන්දාහකට පස්සේ කෙනෙක්ගේ උගුර කොච්චර වේළිලා ඇතිද කියලා ඔයාට හිතාගන්නවත් පුළුවන් ද?"

"ඔයා තමයි අර වධක භූමියේ හිටිය ආත්මය," මම කිව්වා. "විලක් මැද තියෙන පලතුරු ගහක් යට හිටගෙන ඉන්න කෙනා, ඒත් ඔයාට කන්න බොන්න බෑ." ටන්ටලස් මට විරිත්තුවා. "මේ නම් හරිම පණ්ඩිත ළමයෙක් නේ, නේද, කොල්ලෝ?"

"ජීවත් වෙලා ඉන්න කාලේ ඔයා ගොඩාක් දරුණු දෙයක් කරන්න ඇති," මම කිව්වේ තරමක් පුදුමයෙන්. "මොකක්ද ඒ?"

ටන්ටලස්ගේ ඇස් හීනි වුණා. එයාට පිටුපසින් සිටි සැටර්ලා ඔළු සොලවමින් මට අනතුරු අඟවන්න උත්සාහ කළා.

"මං ඔයා ගැන බලාගන්නම්, පර්සි ජැක්සන්," ටන්ටලස් කිව්වා. "මගේ කඳවුරේ ප්‍රශ්න ඇතිවෙනවා දකින්න මට ඕනෑ නැහැ."

"ඔයාගෙ කඳවුරේ දැනටමත් ප්‍රශ්න ඇතිවෙලා... සර්."



"අහ්, ගිහිල්ලා ඉඳගන්නවා, ජොන්සන්," ඩයනයිසියස් සුසුමක් හෙළුවා. "මං හිතන්නේ අතන තියෙන මේසය ඔයාගේ - අර... වෙන කාටවත් වාඩිවෙන්න ඕනෑ නැති එක."

මගේ මූහුණ පිච්චෙනවා වගේ දැනුණත් එකටෙක නොකියා ඉන්න මම ප්‍රවේසම් වුණා. ඩයනයිසියස් කියන්නේ ඇගෙන් විතරක් වැඩුණු ළමයෙක්. අමරණීය, සුපිරි බල ඇති ළමයෙක්. "මෙහෙ එන්න, ටයිසන්." මම කතා කළා.

"ඔහ්, නැහැ," ටන්ටලස් කිව්වා. "රාක්ෂයා මෙතැන හිටපුදෙන්. ඌට මොනවද කරන්නේ කියලා අපි තීරණය කරන්න ඕනෑ."

"එයා," මම කඩා පැන්නා. "එයාගේ නම ටයිසන්."

අලුත් ක්‍රියාකාරකම් අධ්‍යක්ෂක ඇහිබැමක් එසෙව්වා.

"ටයිසන් කඳවුර බේරගත්තා," මම කියා සිටියා. "ලෝකඩ ගොන්නු දෙන්නව නතර කළේ එයා. එයා නොහිටින්න උන් මේ ඔක්කොම පුච්චලා දාන්න තිබුණා."

"ඔව්," ටන්ටලස් සුසුමක් හෙළුවා. "එහෙම කළා නම් කොච්චර දුක හිතෙන වැඩක් වෙයිද?" ඩයනයිසියස් හිනාවක් තද කරගත්තා.

"මෙතැනින් යනවා," ටන්ටලස් අණ කළා, "මේ සතාගේ ඉරණම අපි තීරණය කරන්නම්," ටයිසන්, එයාගේ ලොකු ඇහේ බය පුරවාගෙන මගේ දිහා බැලුවා. ඒත් කඳවුරු අධ්‍යක්ෂකගේ සෘජු නියෝගයකට අකීකරු වෙන්න මට බැරි බව මම දැන සිටියා. කොහොමහරි, එළිපිට බැහැ.

"මම මේ ළඟම ඉන්නවා, ලොකු යාළුවා," මම පොරොන්දු වුණා. "බය වෙන්නෙපා, අද රෑට ඔයාට නිදාගන්න අපි හොඳ තැනක් හොයාගමු."

ටයිසන් ඔළුව වැනුවා. "මට ඔයාව විශ්වාසයි. ඔයා මගේ යාළුවා නේ."

ඒ කතාව ඇහුවාම මට වරදකාරී හැඟීමක් තදින්ම දැනුණා.

පොසෙයිඩන්ගේ මේසයට ගාටමින් ගිය මම බංකුවක් මතට කඩා වැටුණා. වන දෙවඟනක් පෙපරෝනි පීසා සහ ඔලිම්පියානු ඔලිව් පිරවූ පිඟානක් ගෙනත් දුන්නත්, මට බඩගින්නක් දැනුණේ නැහැ. අද දවසට මම දෙසැරයක්ම මැරෙන්න ගියා. මම, මගේ මේ

පාසැල් අවුරුද්ද විනාශයකින් අවසන් කරගත්තා. අර්ධ-ලෝහිත කඳවුර බරපතළ ප්‍රශ්නයකට මැදිවෙලා, ඒ මදිවට ඒකට මුකුත් කරන්න යන්න එපා කියලා කයිරොන් මට කිවුවා. ස්තුතිවන්ත හැඟීමක් හිතට නොදැනුණත්, මගේ රෑ කෑම පිඟාන අතට අරන් සිරිත් පරිදි ලෝකඩ උඳුන ළඟට ගිය මම එයින් කොටසක් ගින්නට දැමුවා.

"පොසෙයිඩන්," මම මිමිණුවා, "මගේ පූජාව බාරගන්න."

ඒ ගමන්ම මට උදවුවකුත් එවන්න, මම හිතෙන් යාඥා කළා. කරුණා කරලා. පීසා කැලි පිච්චෙන දුම මොකක්දෝ සුවඳකට හැරුණා - පිරිසිදු මුහුදු සුළඟට මුසු වූ කැලෑ මල්වල සුවඳ- ඒත්, එයින් අදහස් වුණේ මගේ තාත්තා ඇත්තටම සවන් දෙනවා කියන එකද, මට කිසිම අදහසක් තිබුණේ නැහැ.

මම ආපසු මගේ අසුනට ගියා. පැවතුණ තත්ත්වය මීටත් වඩා නරක අතට හැරෙන්න පුළුවන්කමක් ඇති කියලා මම හිතුවේ නැහැ. ඒත් ඒ වෙලාවේ නිවේදනවලට අවධානය ලබාගන්න ටන්ටලස් සැටර් කෙනෙක් ලවා හක් ගෙඩිය නාද කරවූවා.

"ඔව්, හොඳයි," කතාබහ නැවතුණාට පස්සේ එයා කිවුවා. "තවත් රසවත් කෑම වේලක්! මට දැනගන්න ලැබුණ විදිහට." කතා කරන අතරේම, නැවත පුරවා තිබුණු කෑම පිඟාන දෙසට එයාගේ අත හෙමින් හෙමින් ඇදුණේ එයා කරන දේ කෑමවලට නොතේරෙන්න වගෙයි. ඒත් වැඩේ හරිගියේ නැහැ. එයාගේ අත ළංවුණ හැටියේම කෑම පිඟාන මේසයේ ඈතටම විසි වුණා.

"ඒ වගේම, මෙහෙ බලධාරියා විදිහට කටයුතු කරන පළවෙනි දවසේ," එයා කියාගෙන ගියා, "මෙහෙ ඉන්න එක ප්‍රියජනක දඬුවමක් කියලා මම කියන්න කැමතියි. මේ ගිම්හානය පුරාවට, මම බලාපොරොත්තු වෙනවා මේ ළමයින්ට වද දෙන්- එර්... එකතු වෙන්න. ඔයාලා හැමෝටම තියෙන්නේ කන්න හිතෙන පෙනුමක්." ඩයනයිසියස් ආචාර සම්පන්නව අත්පුඩි ගසද්දි, එයාව අනුගමනය කළ සැටර්ලාගෙනුත් උදාසීන අත්පොළසන් හඬක් නැගුණා. ටයිසන් තවමත් අපහසුවෙන් ප්‍රධාන මේසය ළඟ සිටගෙන සිටියා. ඒත් එයා එතැනින් යන්න හදන හැම වතාවකදීම ටන්ටලස් ආපසු ඇදලා ගත්තා.

"දැන්, පොඩි වෙනසක්!" ටන්ටලස් කඳවුරුකරුවෝ දෙසට ඇඳවුණ හිනාවක් පෑවා. "අපි කරත්ත තරග නැවත ආරම්භ කරනවා!



මේස සියල්ලෙන්ම මිමිණුම් හඬවල් නැගෙන්න ගත්තා - උද්‍යෝගය, බය, අවිශ්වාසය.

"දැන්, මම දන්නවා," කටහඬ ඉහළ නංවමින් ටන්ටලස් කියාගෙන ගියා, "අවුරුදු ගාණකට කලින් මේ තරගය පැවැත්වීම අත්හිටෙව්වේ, අහ්, තාක්ෂණික ප්‍රශ්න වගයක් නිසා."

"තුන්දෙනෙක් මැරිලා, විසි හයදෙනෙක් අංගවිකල වුණ නිසා," ඇපලෝ මේසයේ කෙනෙක් කිවුවා.

"ඔව්, ඔව්!" ටන්ටලස් කිවුවා. "ඒත් මං දන්නවා, මේ කඳවුරු සම්ප්‍රදාය නැවත පිළිගන්න ඔයාලා හැමෝම මාත් එක්ක එකතු වෙනවා කියලා. හැම මාසයකම ජයග්‍රාහී රියැදුරන්ට රන් ලෝරල් ලැබෙනවා. කණ්ඩායම් ලියාපදිංචිය උදේට කරනවා! තව දවස් තුනකින් පළවෙනි තරගය පවත්වනවා. ඔයාලගේ රථ ලෑස්ති කරගෙන, අශ්වයෝ තෝරගෙන, තරගයට සූදානම් වෙන්න ඔයාලව දිනපතා ක්‍රියාකාරකම් ගොඩකින් නිදහස් කරනවා. ඔහ්, මම කලින් මතක් කළාද, ජයග්‍රාහී කණ්ඩායමේ කැබින් එකට මාසයකට කඳවුරු රාජකාරිවලින් නිවාඩු ලැබෙනවා කියලා?"

උද්‍යෝගිමත් කටහඬවලින් මණ්ඩපය වැසුණා - මාසයකට කඳවුරු වැඩ නැහැ? ඉස්තාල සුද්ධ කරන්නත් නැහැ? එයා ඇත්තටමද කියන්නේ?

ඊට පස්සේ, ඒකට විරුද්ධ වෙයි කියලා මම කොහෙත්ම හිතුවේ නැති කෙනා විරෝධය පෑවා.

"ඒත්, සර්!" ක්ලැරිස් කිවුවා. කලබල වෙලා වගේ පෙනුණත් එයා කතා කරන්න ඒරිස් මේසයෙන් නැගිට්ටා. එයාගේ පිටේ තිබුණු 'උම්බෑ කියන කෙල්ල!' කොළේ දැකලා සමහර කඳවුරුකරුවෝ කටවල් තද කරගෙන හිනා වුණා.

"එතකොට මුර සංචාරවලට මොකද කරන්නේ? මං කියන්නේ, කරත්ත ලෑස්ති කරගන්න අපි අනිත් වැඩ ඔක්කොම නතර කළොත්-"

"අහ්, දවසේ වීරයා," ටන්ටලස් කෑගැසුවා. "නිර්භීත ක්ලැරිස්, ලෝකඩ ගොන්නු තනියම මෙල්ල කළ කෙනා!"

තදින් ඇහිපිය ගැසූ ක්ලැරිස් ඊට පස්සේ රතුවුණා. "ම්... මම නෙවෙයි-"

"ඒ වගේම, නිරහංකාරයි." ටන්ටලස් දත් තියෙව්වා. "බය වෙන්නෙපා, මගෙ දරුවෝ! මේක ගිම්හාන කඳවුරක්. අපි මෙහෙට ආවේ විනෝද වෙන්න, නේද?"

"ඒත් ගහ-"

"දැන් එතකොට," ටන්ටලස් කියන අතරේ, ක්ලැරිස්ගේ කැබිනයේ කීප දෙනෙක් එයාව ආපසු ආසනයට ඇදලා ගත්තා. "කඳවුරු ගිනිමැලය දල්වලා සාජ්ජේ පටන් ගන්න කලින්, තව පුංචි දෙයක් කරන්න තියෙනවා. මොකක්හරි හේතුවක් නිසා, මේකව මෙහාට අරන් එන එක හොඳයි කියලා පර්සි ජැක්සන් සහ ඇනබෙත් වෙස් හිතලා තියෙනවා." ටන්ටලස් ටයිසන් දෙසට අතක් වනමින් කිවුවා.

කඳවුරුකරුවෝ අතරේ නොසන්සුන් කංකෙඳිරියක් පැතිරුණා. වැඩිදෙනෙකුගේ ඇස් මගේ දිහාවට හැරුණා. මට ටන්ටලස්ව මරන්න තරම් කේන්තියක් ආවා.

"දැන්, ඇත්ත වශයෙන්ම," එයා කිවුවා. "චූටි මොළයක් තියෙන ලේ පිපාසිත රාක්ෂයෝ විදිහට සයික්ලොප්ස්ලා ප්‍රසිද්ධයි. සාමාන්‍ය තත්වයක් යටතේ නම්, මේ සතාව කැලේට නිදහස් කරලා, උල් ලීවලිනුයි පන්දම්වලිනුයි ඌව දඩයම් කරන්න ඔයාලට ඉඩ දෙන්න තිබුණා. ඒ වුණත්, කවුද දන්නේ? බාගදා, ඌගේ නෑයෝ තරම් මේ සයික්ලොප්ස් දරුණු නැතුව ඇති. විනාශ කරන්න තරම් වටින එකෙක් බව ඔප්පු වෙනකල්, මූව තියාගන්න අපිට තැනක් ඕනැ! ඉස්තාලෙට දාන්න මං කල්පනා කළා, ඒත් ඒකෙන් අශ්වයෝ කුලප්පු වෙයි. හර්මීස් කැබින් එකේ පුළුවන් වෙයිද?"

හර්මීස්ගේ මේසය නිහඬ වුණා. ට්‍රැවිස් සහ කොනර් ස්ටොල්ට හදිසියේම මේස රෙද්ද ගැන උනන්දුවක් පහළ වෙලා. එයාලට දොස් කියන්නත් මට බැහැ. හර්මීස් කැබින් එක නිතරම තිබුණේ පිපිරෙන තරමට පිරිලා. අඩි හයයි අඟල් තුනක් උස සයික්ලොප්ස් කෙනෙක්ව දාන්න තරම් ඉඩක් හොයාගන්න එයාලට කොහෙත්ම පුළුවන්කමක් නැහැ.

"ඕං ඉතින්," ටන්ටලස් දොස් කිවුවා. "මේ රාක්ෂයා පොඩි පොඩි වැඩ වුණත් කරලා දෙයි. මෙයාව දාන්න තැනක් ගැන යෝජනා මුකුත් තියෙනව ද?"

හදිසියේම, හැමදෙනාම පුදුමයෙන් හීල්ලුවා.



ටයිසන් ළඟ සිටි ටන්ටලස් පුදුමයෙන් ඉවතට පැන්නා. මගේ ජීවිතේ වෙනස් කරන්න සූදානමින් දිලිසුණ ඒ කොළ පාට එළිය-ටයිසන්ගේ හිසට ඉහළින් මතුවුණ ඒ දීප්තිමත් ප්‍රක්ෂේපිත රූපය දෙස මම පුදුමයෙන් ඇස් දල්වාගෙන බලා සිටියා.

සයික්ලොප්ස්ලා ගැන ඇනබෙත් කියූ කතාව මතක්වෙලා මගේ බඩ පෙරළෙන්න ගත්තා: එයාලා ස්වාභාවික බලවේගවලයි දෙවිවරුන්ගෙයි ළමයි... හොඳයි, විශේෂයෙන්ම එක දෙවියෙකුගේ...

ටයිසන්ගේ ඔළුවට ඉහළින් සුළි නංවමින් තිබුණේ දිලිසෙන කොළ පාට ත්‍රිශූලයක්- පොසෙයිඩන් මට හිමිකම් කියූ දවසේ මගේ ඔළුවට උඩින් මතු වූ සංකේතය වගේම එකක්.

මොහොතක් ගතවන තුරු හැමදෙනාම පුදුමයෙන් ගොළු වුණා.

දෙවියෙක් විසින් හිමිකම් කීම දුර්ලභ දෙයක්. සමහර කඳවුරුකරුවෝ මුළු ජීවිත කාලය පුරාම ඒ වෙනුවෙන් බලා ඉන්නවා. පසුගිය ගිම්හානයේදී පොසෙයිඩන් මාව පුතා ලෙසට බාරගත් අවස්ථාවේ මගේ වටේ සිටි හැමදෙනාම ගෞරවයෙන් දණ ගැසුවා. ඒත් දැන් එයාලා කළේ උඩ පැන පැන හිනාවෙන ටන්ටලස්ව අනුගමනය කළ එකයි. "හොඳයි! මං හිතන්නේ මේ සතාව කොහෙටද දාන්න ඕනැ කියලා දැන් අපි දන්නවා. දෙයියන්ටම ඔප්පු වෙච්චාවේ, එයාටත් පවුලේ පෙනුම අඩු නැතුව තියෙනවා නේ!" ඇනබෙත් සහ තවත් මගේ යාළුවෝ කීප දෙනෙක් ඇර අනෙක් හැමෝම එයාගේ කතාවට හිනා වුණා.

ඒත් ටයිසන් ඒ ගැන සැලකිල්ලක් දැක්වූයේ නැහැ. අන්දමන්දව සිටි එයා උත්සාහ කළේ ඔළුවට ඉහළින් මැකීයමින් තිබුණු දිලිසෙන ත්‍රිශූලයට අතින් ගසා ඉවත් කරන්නයි. අනෙක් අය එයාව විහිළුවකට ගෙන ඇති බව තේරුම් ගන්නවත්, මිනිස්සු කොයි තරම් කෲරද කියලා තේරුම් ගන්නවත් ඒ අහිංසකයට බැරි වුණා.

ඒත් මට නම් හැම දේම තේරුම් ගියා.

මට අලුත් කැබින් සහායකයෙක් ලැබිලා. මට අර්ධ-සොහොයුරෙක් විදිහට රාක්ෂයෙක් ලැබිලා.

Scanned with CamScanner

## 06

# යක්ෂ පරෙවි ප්‍රහාරය

ටන්වලස්ට උවමනා වුණ විදිහටම ඊළඟ දවස් කීපය එකම වධයක් වුණා.

මුලින්ම, ටයිසන් පොසෙයිඩන්ගේ කැබිනයේ පදිංචියට ආවා. හැම තත්පර පහළොවකට සැරයක්ම තනියම හිනාවෙන එයා, "පර්සි මගේ සහෝදරයා?" කියන්නෙ හරියට එයාට ලොතරැයියක් ඇදිලා වගෙයි.

"අයියෝ, ටයිසන්," ඒ වෙලාවට මම කියනවා. "ඒක එච්චර සරල නැහැ."

ඒත් එයා ඒක තේරුම් ගත්තෙ නැහැ. එයා හිටියේ දිව්‍යලෝකෙ ගිහින් වගෙයි. එතකොට මම... මේ යෝධ කොල්ලට මම කැමති වුණත්, මට දැනුණ අපහසුව, ලැජ්ජාව එයින් අඩු වුණේ නැහැ. ඔන්න මම කියලා දැම්මා. මගේ තාත්තා, මහා බලගතු පොසෙයිඩන් සොභාවික බලවේගයක් ගැන පිස්සු වැටිලා, ප්‍රතිඵලේ වුණේ ටයිසන්. මං කිවුවේ, මම සයික්ලොප්ස්ලා ගැන පුරාණ කතන්දර කියවලා තියෙනවා. හුගක් වෙලාවට එයාලා පොසෙයිඩන්ගේ ළමයි බවත් මගේ මතකයේ තිබුණා. ඒත් ඒකෙන් එයාලා මගේ... පවුලේ අය වෙනවා කියලා ටයිසන් මගේ අසල්වාසියා වෙන තුරුම මම හිතලා තිබුණේ නැහැ.

එතකොට, අනෙක් කඳවුරුකාරයෝ කියපු කතා. ගිය ගිම්හානයේදි සියුස්ගේ ප්‍රධාන අකුණ සොයාදුන් වීර පර්සි ජැක්සන්ට තිබුණු තැන හදිසියේම නැති වුණා. දැන් මම කැත රාක්ෂ සහෝදරයෙක් ඉන්න, වැදගැම්මකට නැති පර්සි ජැක්සන් බවට පත්වෙලා.



"එයා මගේ ඇත්ත සහෝදරයා නෙවෙයි!" ටයිසන් ළඟපාතක නැති හැම අවස්ථාවකම මම කිවුවා. "එයා හරියට පවුලේ භයානක පැත්තේ අර්ධ-සහෝදරයෙක් වගේ. හරියට... ගොඩාක් දුර නෑකමකින් අර්ධ-සහෝදරයෙක් වගේ කෙනෙක්."

කාටවත් ඒ කතාව තේරුණේ නැහැ.

මම පිළිගන්නවා- මම, මගේ තාත්තා එක්ක කේන්තියෙන් හිටියේ. මට දැනුණේ එයාගේ පුතා වීම දැන් විහිළුවක් වගෙයි. ඇනබෙත් මගේ හිත හදන්න උත්සාහ කළා. අපේ ප්‍රශ්න අමතක වෙන්න කරත්ත තරගයට සහභාගී වෙමු කියලා එයා යෝජනා කළා. මාව වැරදියට තේරුම් ගන්න එපා- අපි දෙන්නම ටන්ටලස්ට වෛර කළා වගේම කඳවුර ගැනත් අපි ගොඩක් දුක්වුණා- ඒත් ඒකට මොනවා කරන්නද කියලා අපි දැනගෙන හිටියෙ නැහැ. තාලියාගේ ගහ බේරගන්න අතිදක්ෂ සැලසුමක් හොයාගන්න තුරු අපිත් තරගයට සම්බන්ධ වෙන්න හිතුවා. කොහොම වුණත්, කරත්ත නිර්මාණය කරලා තියෙන්නේ ඇනබෙත්ගේ අම්මා, ඇතීනා; අශ්වයෝ නිර්මාණය කරලා තියෙන්නේ මගේ තාත්තා. අපි දෙන්නා එකතු වුණොත් මුළු පිටියම වුණත් අල්ලන්න පුළුවන්.

එක දවසක් උදේ ඇනබෙතුයි මමයි විල් ඉවුරේ වාඩිවෙලා කරත්ත මෝස්තරයක් අඳිමින් ඉන්න අතරේ එතැනට ආව ඇෆ්‍රොඩයිට් කැබිනයේ ජෝකර්ලා කීපදෙනෙක් මගේ 'ඇහැට' අයි-ලයිනර් ඕනෑද කියලා මගෙන් ඇහුවා.... "ඔන් වැරදුණා, ඇස්වලට."

එයාලා හිනාවෙවී යද්දි ඇනබෙත් ගෙරෙව්වා, "එයාලව ගණන් ගන්නෙපා, පර්සි. සහෝදරයෙක් විදිහට රාක්ෂයෙක් ලැබුණේ ඔයාගේ වැරැද්දෙන් නෙවෙයි නේ."

"එයා මගේ සහෝදරයා නෙවෙයි!" මම එයාට කඩා පැන්නා. "එයා රාක්ෂයෙකුත් නෙවෙයි!"

ඇනබෙත් ඇහිබැම් එසෙව්වා. "හේයි, මගේ ඇඟට ගොඩවෙන්නෙපා! හරියට බැලුවොත්, එයා රාක්ෂයෙක් තමයි."

"ඔව් ඉතින්, කඳවුර ඇතුළට එන්න එයාට අවසර දුන්නේ ඔයා නේ."

"එහෙම කළේ, ඔයාගේ ජීවිතේ බේරගන්න තිබ්බ එකම ක්‍රමේ ඒක නිසා! මං කිවුවේ... මට කණගාටුයි, පර්සි. පොසෙයිඩන් එයාට

හිමිකම් කියයි කියලා මං හිතුවෙ නැහැ. සයික්ලොප්ස්ලා කියන්නේ කපටි. විශ්වාස කරන්න බැරි-"

"එයා එහෙම නෑ! ඔයාට සයික්ලොප්ස්ලා එක්ක ඔච්චරටම තියෙන තරහා මොකක්ද?"

ඇනබෙත්ගේ කන් දෙක රෝස පාට වුණා. එයා මට නොකියා මොකක් හෝ හංගන බව මට හැඟුණා- මොකක් හෝ නරක දෙයක්.

"ඒක අමතක කරලා දාන්න," එයා කිව්වා. "දැන්, මේ කරත්තේ බෝන් ලීය-"

"ඔයා එයාට සලකන්නේ හරියට එයා මහා භයානක සතෙක් වගෙයි," මම කිව්වා. "එයා මගේ ජීවිතේ බේරුවා." පැන්සල විසි කළ ඇනබෙත් සිටගත්තා. "එහෙනම්, ඔයා එයා එක්කම මේ කරත්තේ හදාගන්න එකයි ඇත්තේ."

"මං එහෙම කරනවා තමයි."

"ලොකු දෙයක්!"

මගේ තත්වය තිබුණාටත් වඩා නරක් කරමින් එයා යන්න ගියා.

ඊළඟ දවස් දෙකේදී, මගේ ප්‍රශ්නවලින් හිත නිදහස් කරගන්න ක්‍රමයක් මම හෙව්වා.

ඇෆ්‍රොඩයිට් කැබිනයේ හොඳ ගැහැනු ළමයින්ගෙන් කෙනෙක් වුණ සිලේනා බියුරිගාඩ් පෙගසස් කෙනෙක්- ඒ කියන්නේ පියාඹන අශ්වයෙක් පිටේ යන්න මට පළවෙනි පාඩම කියා දුන්නා. එයා කිවූ විදිහට ඉස්සර කාලේ හිටියේ එක අමරණීය, පියාඹන අශ්වයෙක් විතරලු. එයාගේ නම පෙගසස්. එයා තවමත් සමහර වෙලාවට අහසේ නිදහසේ පියාඹනවලු. ඒත් ගෙවුණ යුග ගණනාව පුරාවට එයා පැටවු ගොඩාක් බෝ කරලා. පෙගසස් තරමට එයාලා වේගවත් හෝ වික්‍රමාන්විත නොවුණත්, එයාලා හැමෝවම තාත්තාගේ නමින්ම හඳුන්වනවාලු.

සමුද්‍ර දෙවියන්ගේ පුතා වුණ මම අහසේ ඉගිල්ලෙන්න කවදාවත් කැමති වුණේ නැහැ. මගේ තාත්තයි සියුස්යි අතරේ එදිරිවාදිකමක් තියෙන නිසා, අහසට අධිපති දෙවියන්ගේ බල ප්‍රදේශයෙන් හැකි තරම් ඈත්වෙලා ඉන්නයි මම නිතරම උත්සාහ කළේ. ඒත් පියාඹන අශ්වයෙකුගේ පිටේ යද්දී දැනුණේ ඊට වඩා වෙනස් හැඟීමක්. ගුවන් යානයක යද්දී …



නැහැ. සමහරවිට ඒකට හේතුවක් වෙන්න ඇත්තේ මගේ තාත්තා මුහුදු රළවලින් අශ්වයන්ව නිර්මාණය කරලා තිබුණ නිසා වෙන්න ඇති. එතකොට පෙගසිලා කියන්නේ හරියට... යුද මුක්ත කලාපයක් වගෙයි. එයාලගේ සිතුවිලි තේරුම් ගන්න මට පුළුවන් වුණා. මගේ පෙගසස් ගස් මුදුන් මතින් පිමි පනින්න හෝ මුහුදු ළිහිණි රංචුවක් වලාකුළු අතරට පන්නන්න ගියත් මම පුදුම වුණේ නැහැ. ප්‍රශ්නයකට තිබුණේ ටයිසන්ටත් 'කුකුල් පෝනියෝ' පදින්න උවමනා වුණු එකයි. ඒත් එයා ළඟට එන හැම වතාවකදීම පෙගසිලා කුලප්පු වුණා. ටයිසන් එයාලට කරදර නොකරන බව මම හිතෙන් දැන්වූවත්, එයාලා මාව විශ්වාස කළ පාටක් පෙනුණේ නැහැ. ඒකෙන් වුණේ ටයිසන් අඬන්න පටන්ගත් එකයි.

කඳවුරේ සිටි අයගෙන් ටයිසන් සමග කිසිම ප්‍රශ්නයක් නොතිබුණේ හෙෆාස්ටස් කැබිනයේ බෙකන්ඩොර්ෆ්ට විතරයි. කම්මල් දෙවියා, එයාගේ කම්මල්වලදී නිතරම සයික්ලොප්ස්ලා සමග වැඩ කරනවා, ඒ නිසා බෙකන්ඩොර්ෆ් ටයිසන්ට ලෝහ කර්මාන්තය උගන්වන්න ආයුධ ගබඩාවට කැඳවාගෙන ගියා. ඉක්මනින්ම ටයිසන්ට මායා උපකරණ හදන්න උගන්වනවා කියලා එයා මට කිවූවා.

දවල් කෑමෙන් පසු මල්ලව පිටියට ගිය මම ඇපලෝ කැබිනයේ අය සමග පුහුණුවීම් කළා. මම වඩාත්ම දක්ෂ වුණේ කඩු සටන්වලටයි. සමහරවිට, ලූක් ඇරුනාම පහුගිය අවුරුදු සියයට සිටි ඕනෑම කඳවුරුකරුවෙක්ට වඩා මම කඩු සටන්වලට දක්ෂ බවයි හැමෝම කිවුවේ. එයාලා නිතරම මාව ලූක් සමග සංසන්දනය කළා.

මම පහසුවෙන්ම ඇපලෝ කොල්ලන්ව පැරදුවා. හරිනම් මම, මාව පරීක්ෂා කළ යුතු වුණේ දක්ෂතම කඩු සටන්කරුවෝ සිටි ඒරීස් සහ ඇතීනා කැබින්වල අය සමගයි. ඒත්, ක්ලැරිස් සහ එයාගේ සහෝදර සහෝදරියෝ එක්ක වැඩ කරන්න මගේ කැමැත්තක් තිබුණේ නැහැ. ඇනබෙත් එක්ක සිදු වූ වාදයෙන් පස්සේ මට එයාව දකින්නත් උවමනා වුණේ නැහැ. ඉතින්, මගේ හැකියාව අන්තිම සවුත්තු වුණත් මම දුනු ශිල්ප පන්තියට ගියා. ඒත් කයිරොන් නැතිව එතැන ඉස්සර වගේ නැහැ. චිත්‍ර හා නිර්මාණ පන්තියේදී මම කිරිගරුඬවලින් පොසෙයිඩන්ගේ උඩුකය නෙළන්න පටන් ගත්තත්, ඒක සිල්වෙස්ටර් ස්ටැලෝන් වගේ පේන්න පටන් ගනිද්දී මම ඒකත් අතහැර දැමුවා. ඊට පස්සේ මම සම්පූර්ණ-භූමිකම්පා-සහ-ලෝදිය තත්වයේ තිබුණු බිත්ති දිගේ නැග්ගා. හවස් වරුවේ මම සීමා මුර සංචාරයට එකතු වුණා.

කඳවුර ආරක්ෂා කරන්න උත්සාහ කිරීම අපි අමතක කළ යුතුයි කියලා ටන්ටලස් තදින්ම කියා සිටියත්, සමහර කඳවුරුකරුවෝ කාලසටහනකට අනුව විවේක කාලවලදී තවමත් රහසේම එය කරගෙන ගියා.

අර්ධ-ලෝහිත කන්ද මුදුනේ වාඩිවූ මම වන දේවතාවන් විටින් විට ඇවිත් පණ අදින පයින් ගහට සින්දු කියන දෙස බලා සිටියා. බටනලා රැගෙන ආ සැටර්ලා සොබාදහමේ මායා ගීත වාදනය කරද්දී සැහෙන වෙලාවක් ගතවන තුරු පයින් කොළ පණගසා තිබෙනවා දකින්න ලැබුණා. කන්දේ වූ මල්වල සුවඳ ටිකක් වැඩිවෙනවාත්, තණ පඳුරු කොළ පාටට හැරෙනවාත් වගේ පෙනුණා. ඒත් සංගීතය නැවතුණු සැණින් ලෙඩ පෙනුම නැවතත් පරිසරය අරක් ගත්තා. ගහේ මුල්වලට බැස තිබුණු විෂෙන් මුළු කන්දම ලෙඩ වෙලා වගෙයි. මම එතැන වාඩිවී සිටි කාලය වැඩි වෙද්දී, මගේ කේන්තියත් වැඩි වුණා.

මේක කරලා තියෙන්නේ ලූක්. එයාගේ කපටි හිනාවත්, කම්මුලක් හරහා වූ මකර නිය-කැළැලත් මට මතක් වුණා. මගේ යාළුවෙක් වගේ රඟපෑව එයා, ඒ මුළු කාලය පුරාවටම ක්‍රෝනොස්ගේ අංක එකේ දාසයා ලෙස වැඩ කරලා තිබුණා. මම, මගේ අත්ල දිගහැර බැලුවා. පසුගිය ගිම්හාන කාලයේදී ලූක් මට දුන් තුවාල කැළැල- එයාගේ වළ ගෝනුස්සා මට දෂ්ට කළ තැන වූ තරු ලකුණක හැඩය ගත් සුදු පාට කැළැල දුන් මැකෙමින් තිබුණත්, මට තවමත් එය දකගත හැකි වුණා. මාව මරන්න උත්සාහ කරන්න මොහොතකට කලින් එයා කියූ දේ මගේ සිහියට නැගුණාඃ සුබ පැතුම්, පර්සි. අලුත් ස්වර්ණ යුගයක් ඉස්සරහට එනවා. ඒත් ඔයා ඒකෙ කොටස්කාරයෙක් වෙන්නෙ නැහැ.

* * * * * * *

එදා රෑ, මම ග්‍රෝවර්ව නැවතත් හීනෙන් දැක්කා. විටින් විට මට එයාගේ කටහඬත් ඇසුණා. එක වතාවක්ඃ ඒක මෙහෙ, කියලා එයා කිවුවා. තවත් වතාවක්ඃ එයා බැටළුවන්ට ආසයි, කියලා කිවුවා.

මගේ හීන ගැන ඇනබෙත්ට කියන්න මට හිතුණා, ඒත් එතකොට මාව මෝඩයෙක් වගේ පෙනේවි. මං කියන්නේ, එයා බැටළුවන්ට ආසයි? මට පිස්සු හැදිලා කියලා ඇනබෙත් හිතාවි.

තරගයට කලින් දවසේ රෑ, ටයිසනුයි මමයි අපේ කරත්තයේ වැඩ අවසන් කළා. ඒක මාර ලස්සනයි. කරත්තයට උවමනා ලෝහ කොටස් ටයිසන් ආයුධ ගබඩාවේ කම්මලෙන් හදාගෙන ආවා. මම



දැව කොටස් ටික වැලි කඩදාසිවලින් මැදලා, ගැල එකට සවිකළා. එහි නිල් සහ සුදු පාට බඳ දෙපස මුහුදු රැල්ලක මෝස්තරයකුත්, ඉදිරියේ ත්‍රිශූලයකුත් පින්තාරු කළා. වැඩ සියල්ල අවසන් වුණාට පස්සේ, මාත් එක්ක ටයිසනුත් කරත්තයේ නොගියොත් ලොකු අසාධාරණයක් වගෙයි පෙනුණේ. ඒත් ඒකට අශ්වයෝ නම් කැමති නොවෙන බව මම දැන සිටියා, ඒ වගේම ටයිසන්ගේ බරට අපේ වේගයත් අඩු වේවි.

"ඔයා තරහෙන් ද?" අපි නිදාගන්න ඇඳට යද්දී ටයිසන් ඇසුවා. මම රවාගෙන සිටි බව මටම තේරුණේ එතකොටයි. "නැහ්, මට තරහ ගියේ නෑ."

ඇඳේ වැතිරුණ ටයිසන් අඳුරේ නිහඬව සිටියා. ඇඳට වඩා දිග එයාගේ කකුල් පොරෝනාවෙන් පිට පැනලා. "මම රාක්ෂයෙක් නේ."

"එහෙම කියන්න එපා."

"ඒකට කමක් නෑ. මම හොඳ රාක්ෂයෙක් වෙන්නම්කෝ. එතකොට ඔයාට තරහා යන්නෑ නේ." ඒකට මොනවා කියන්නද මම දැන සිටියේ නැහැ. සිවිලිම දෙස බලා සිටි මට දැනුණේ තාලියාගේ ගහත් එක්කම මාවත් හෙමින් හෙමින් මැරෙනවා වගෙයි.

"ඒක මේ... මට කවදාවත් සහෝදරයෙක් ඉඳලා නැනේ." මගේ හඬ නොබිඳී පවත්වා ගන්න උත්සාහ කරමින් මම කිවුවා. "ඒක මට ලොකු වෙනසක්. ඒ වගේම මම කඳවුර ගැනත් වද වෙනවා. තව, මගේ යාළුවෙක් ඉන්නවා ග්‍රෝවර් කියලා... එයාව කරදරේක වැටිලා වගෙයි. එයාව බේරගන්න මොනවාහරි කරන්න ඕනෑ කියලා මට හැම වෙලාවෙම දැනෙනවා, ඒත් මොනවා කරන්නද කියලා මම දන්නේ නෑ."

ටයිසන් කිසිවක් කිවුවේ නැහැ.

"මට සමා වෙන්න," මම එයාට කිවුවා. "ඒක ඔයාගේ වැරැද්ද නෙවෙයි. මට තරහා පොසෙයිඩන් එක්ක. එයා මට ලැජ්ජා කරන්න හදනවා වගෙයි මට දැනෙන්නේ, හරියට එයා අපිව සමාන කරන්න හදනවා වගෙයි. ඒ ඇයි කියලා මට තේරෙන්නෑ." මට ගැඹුරු ගෙරවුම් හඬක් ඇසුණා. ටයිසන්ට නින්ද ගිහින්.

මම සුසුමක් හෙළුවා. "සුබ රාත්‍රියක්, ලොකු යාළුවා."

ඊට පස්සේ මමත් ඇස් පියාගත්තා.

Scanned with CamScanner

එදා රෑ මම දකපු හීනයේ ග්‍රෝවර් මංගල ඇඳුමකින් සැරසී සිටියා.

ඒක එයාට ගැළපුනේ නම් නැහැ. ඕනෑවටත් වඩා දිගු ඒ ගවුමේ වාටියේ වේළුණු මඩ තට්ටුවක්ම ඇලී තිබුණා. ගවුම කර එයාගේ උරහිස්වලින් පහළට එල්ලා වැටුණා. කඩමාලු වූ වේලයකින් එයාගේ මුහුණ ආවරණය වෙලා. පන්දම් එළිය පමණක් ඇති, තෙත් ගොහොරු වූ ගුහාවක් තුළ එයා සිටගෙන සිටියා. එහි එක් මුල්ලක පුංචි ඇඳකුත්, අනෙක් මුල්ලේ පරණ පන්නයේ රෙදි වියන යන්ත්‍රයක් හා රාමුවට සවි කළ බාගෙට වියූ සුදු රෙද්දකුත් තිබුණා. ග්‍රෝවර් කෙලින්ම මගේ දිහා බලාන හිටියේ හරියට මම එයා බලාපොරොත්තුවෙන් සිටි රූපවාහිනී වැඩසටහනක් වගෙයි. "දෙවිවරුන්ට ස්තුති වේවා!" එයා කෑගැසුවා. "ඔයාට මාව ඇහෙනව ද?"

මගේ සිහින ස්වරූපය ප්‍රතිචාර දක්වන්න ප්‍රමාද වුණා. මම තවමත් වටපිට බලමින් හිරිලඹ සිවිලිමත්, එළුවන්ගේ සහ බැටළුවන්ගේ ගඳත්, කාමරයේ එකම දොරටුව අවහිර කරමින් තිබුණු ශීතකරණයක් තරම් විශාල ගල් කුට්ටිය පිටුපසින් දෝංකාර දෙනවා ඇසුණු ගොරවන, කෙඳිරිගාන සහ එළුවන්ගේ බෑගාන හඬවල් ගැනත් සෝදිසි කරමින් සිටියා. මේ ගල් ගුහාව මීටත් වඩා විශාල ලෙනකට සම්බන්ධ වෙනවා වගෙයි පෙනුණේ.

"පර්සි?" ග්‍රෝවර් කතා කළා. "අනේ, මීටත් වඩා හොඳට ප්‍රක්ෂේප කරන්න තරම් හයියක් මට නැහැ. මං කියන දේ ඔයාට අහන්නම වෙනවා!"

"මට ඔයාව ඇහෙනවා," මම කිවුවා. "ග්‍රෝවර්, මොනවද සිද්ධ වෙන්නේ?" ගල් කුට්ටිය පිටුපසින් රාක්ෂ හඬක් මොර ගැසුවා. "පැටියෝ! ඔයාගේ වැඩේ ඉවර ද?" ග්‍රෝවර් බයෙන් ඇකිළුණා. එයා මවාගත් ගැහැනු හඬකින් උත්තර දුන්නා, "තාම නෑ, වස්තුවේ! තව ටික දවසයි!"

"බාහ්! තාම සති දෙක ඉවර නැද්ද?"

"න්-නෑ, වස්තුවේ. තවම දවස් පහයි ගියේ. ඒ කියන්නේ තව දවස් දොළහක් තියෙනවා."

රාක්ෂයා නිහඬ වුණා, සමහරවිට ගාණ හදලා බලන්න ඇති. අංක ගණිතයට එයා මටත් වඩා දුර්වල බව එයා දුන් උත්තරයෙන්ම



තේරුණා. "හරි එහෙනම්. ඒත්, ඉක්මන් කරන්න! මට ඔය වේල් එක අයින් කරලා බලනකම් ඉවසිල්ලක් නෑ. හෙහ්-හෙහ්-හෙහ්."

ග්‍රෝවර් ආපසු මගේ පැත්තට හැරුණා. "ඔයා මට උදවු කරන්න ඕනෑ! මාව මේ ගුහාවේ හිරවෙලා! මුහුද මැද තියෙන දූපතක."

"කොහේ ද?"

"මං හරියටම දන්නේ නෑ! මම ෆ්ලොරිඩාවට ගිහින් වමට හැරුණා."

"මොකක්? ඔයා කොහොමද-"

"ඒක උගුලක්!" ග්‍රෝවර් කිවුවා. "මේ ගවේෂණයට ගිය කිසිම සැටර් කෙනෙක් ආපහු ඇවිල්ලා නැත්තේ ඒකයි. එයා එඬේරෙක්, පර්සි! එයා ළඟ ඒක තියෙනවා. ඒකේ ස්වභාවික මායාව කොච්චර බලගතු ද කියනවා නම්, ඒකේ සුවඳත් හරියටම ශ්‍රේෂ්ඨ දෙවියා පෑන් වගෙයි! පෑන්ව හොයාගන්න ලැබුණා කියලා හිතාගෙන සැටර්ලා මෙහෙට එනවා, ඊට පස්සේ එයාලා උගුලට අහුවුණාම, පොලිෆිමස් එයාලව කනවා!"

"පොලි - මොකා ද?"

"සයික්ලොප්ස්!" ග්‍රෝවර් කිවුවේ තරහෙන්. "මම බේරිලා යන්න ඔන්න-මෙන්න හිටියේ. ශාන්ත ඕගස්ටින්වලටම මම ගියා."

"ඒත් එයා ඔයාගේ පස්සෙන් පැන්නුවා," මගේ මුල්ම හීනය මතක්වෙලා මම කිවුවා. "ඊට පස්සේ මංගල විලාසිතා කඩයක් ඇතුළෙදි ඔයාව අහුවුණා."

"අන්න හරි," ග්‍රෝවර් කිවුවා. "ඒ කියන්නේ මගේ පළවෙනි සහකම්පන සම්බන්ධය වැඩ කරලා. බලන්න, මට පණපිටින් ඉන්න තියෙන එකම විදිහ තමයි මේ මංගල ඇඳුම. මට කන්න හිතෙන සුවඳක් තියෙනවා කියලා එයා හිතනවා, ඒත් මං එයාට කිවුවා ඒක එළු-සුවඳ සෙන්ට් එකක් කියලා. දෙයියන්ට ස්තුති වෙන්න, එයාගේ පෙනීම හොඳ නැහැ. කවුදෝ එයාගේ ඇහැට ඇනලා, එයා බාගෙට අන්ධ වෙලා ඉන්නේ. ඒත් මං කවුද කියලා එයා ඉක්මනටම තේරුම් ගනී. මගේ මඟුල් සේලය හදන්න එයා මට දුන්නේ සති දෙකක් විතරයි, එයාගේ ඉවසීමත් ටික ටික අඩු වෙනවා!"

"පොඩ්ඩක් ඉන්න. මේ සයික්ලොප්ස් හිතන්නේ ඔයා-"

"ඔව්!" ග්‍රෝවර් අඳෝනා නැගුවා. "එයා හිතන්නේ මම ඇතු සයික්ලොප්ස් කෙනෙක් කියලා. එයාට මාව කසාද බඳින්න ඕනැලු" වෙන වෙලාවක නම් හිනාවෙලාම මගේ පණ යන්න තිබුණා. ඒත් ග්‍රෝවර්ගේ හඬේ තිබුණේ මාරාන්තික බරපතලකමක්. එයා බලේ වෙවුලමිනුයි සිටියේ.

"ඔයාව බේරගන්න මම එනවා," මම පොරොන්දු වුණා. "ඔයා කොහෙද ඉන්නේ?"

"රාක්ෂ සයුරේ. ඇත්තටම!"

"මොන සයුරේ?"

"මම ඔයාට කිවුවනේ! කොහෙද කියලා මමත් හරියටම දන්නේ නෑ! බලන්න, පර්සි... අර්... ම්, මේ ගැන මට හරිම කණගාටුයි, ඒත් මේ සහකම්පන සම්බන්ධෙ... හොඳයි, මට වෙන කරන්න දෙයක් තිබුණෙ නැහැ. දැන් අපේ චිත්තවේග එකට සම්බන්ධ වෙලා තියෙන්නේ. බැරි වෙලාවත් මම මැරුණොත්..."

"මාත් මැරෙනවා කියලා නම් කියන්නෙපා."

"ඔන්, හොඳයි, සමහරවිට එහෙම වෙන්නැති වෙයි. ඔයා තව අවුරුදු ගාණක් පැළයක් විදිහටවත් ජීවත් වෙන්නත් ඉඩ තියෙනවා. ඒත්, අන්, ඔයා මාව මෙහෙන් ගලවගත්තොත් ඊට වඩා ගොඩක් හොඳයි නේ."

"මගේ පැටියෝ!" රාක්ෂයා ගිගුරුවා. "රෑ කෑම වෙලාව! රසම රස බැටළු මස්!" ග්‍රෝවර්ට කෙඳිරි ගෑවුණා. "මට යන්න වෙනවා. ඉක්මන් කරන්න!"

"පොඩ්ඩක් ඉන්න! ඔයා කිවුවේ 'ඒක' ඔහේ තියෙනවා කියලා. මොකක්ද?"

ඒත් ඒ වෙද්දී ග්‍රෝවර්ගේ හඬ වියැකෙමින් තිබුණේ. "ස්වීට් ඩ්‍රීම්ස්. මට මැරෙන්න දෙන්නෙපා!" හීනය බොඳවී යද්දී මම තිගැස්සී ඇහැරුණා. ඒ වෙද්දී පාන්දර වෙලා. මගේ දෙසට නැමීගෙන බලා සිටි ටයිසන්ගේ ලොකු, දුඹුරු පාට ඇහැ කල්පනාබර වෙලා.

"ඔයා හොඳින් ද?" එයා ඇසුවා.



එයාගේ හඬ ඇසෙද්දි මගේ කොඳු නාරටිය දිගේ සීතලක් පැතිරුණා. මොකද, එයාගේ කටහඬත් මට හීනෙන් ඇසුණු රාක්ෂයාගේ හඬ වගේමයි.

තරගය පැවැත්වූ උදෑසන උණුසුම් සහ තෙත්බර වුණා. මීදුම පොළොවට කිට්ටුවෙන්ම රැඳී තිබුණේ හුමාලය වගෙයි. අවට ගස් මත කුරුල්ලෝ මිලියන ගාණක් වසා සිටියා- මහත අළු-සුදු පරෙවියෝ, හැබැයි උන් සාමාන්‍ය පරෙවියෝ වගේ නම් පෙනුණේ නැහැ. සබ්මැරීනයක රේඩාර් හඬ සිහිපත් කරවන කරදරකාරී ලෝහමය හඬකින් උන් කෑගැසුවා.

දුනු විදින අංගනයත් කැලෑවත් අතර වූ තණබිමේ ධාවනපථ සකසා තිබුණා. ඊළගෙඩි වප්ප වුණාට පස්සේ මුළුමනින්ම හීලෑ වී සිටි ලෝකඩ ගොන්නු යොදාගෙන හෙෆාස්ටස් කැබිනයේ ළමයි විනාඩි ගාණක් තුළ ඕවලාකාර ධාවනපථ සමතලා කර තිබුණා. ප්‍රේක්ෂකයෝ- ටන්ටලස්, සැටර්ලා, වන දේවතාවන් දෙතුන් දෙනෙක් සහ තරගයට සහභාගී නොවෙන කඳවුරුකරුවන් වෙනුවෙන් ගල්පඩි සාදා තිබුණා. මිස්ටර් ඩී පේන්න හිටියේ නැහැ. උදේ දහයට කලින් එයා කවදාවත් නැගිට්ටින්නේ නැහැ.

"හරි!" කණ්ඩායම් රැස්වෙද්දී ටන්ටලස් නිවේදනය කළා. ජල දේවඟනක් පේස්ට්‍රි පිරවූ ලොකු පිඟානක් එයාට ගෙනැවිත් දුන්නා. ටන්ටලස් කතා කරන අතරේ එයාගේ දකුණු අත විනිසුරු මේසය පුරා චොකලට් ඉක්ලෙයාර් එකක් ලුහුබැන්දා.

"ඔයාලා හැමෝම නීතිරීති දන්නවා. ධාවන පථය සැතපුම් කාලක් දිගයි. ඒක වටේ මුලින්ම දෙවරක් යන කණ්ඩායම ජයග්‍රහණය කරනවා. එක කරත්තයකට අශ්වයෝ දෙන්නයි. හැම කණ්ඩායමක්ම රියැදුරෙක්ගෙන් සහ සටන්කරුවෙකුගෙන් සමන්විතයි. ආයුධ පාවිච්චි කරන්න අවසර තියෙනවා. නරක වැඩ කළාට කමක් නෑ, හැබැයි කාවවත් නොමරා ඉන්න උත්සාහ කරන්න!" ටන්ටලස් හිනාවුණේ අපි දඟකාර ළමයි ටිකක් වගෙයි. "කාවහරි මැරුවොත්, එයාට දැඩි දඬුවම් ලැබෙනවා. එයාට කඳවුරු ගිනිමැලය ළඟදි දෙන මාෂ්මෙලෝස් සතියකට නැති වෙනවා! දැන්, ඔයාලගේ කරත්ත සූදානම් කරගන්න!"

බෙකන්ඩෝර්ෆ් හෙෆාස්ටස් කණ්ඩායම පථයට මෙහෙයවූවා. එයාලා ලෝකඩ සහ යකඩවලින් ලස්සන වාහනයක් සාදා තිබුණා- එහි අශ්වයෝ පවා සාදා තිබුණේ කොල්කිස් ගොන්නු වගේ මායා-

යාන්ත්‍රික ලෙසයි. එයාලගේ කරත්තයේ හැම වර්ගයකම යාන්ත්‍රික උගුල් වගේම සුබෝපභෝගී මැසරාටි කාරයකටත් වඩා අංගෝපාංග ඇති බවට මට කිසිම සැකයක් නැති වුණා.

ලේ රතු පාටින් පින්තාරු කළ ඒරීස් කරත්තය ඇද්දේ භයානක පෙනුමක් ඇති ඇටසැකිලි අශ්වයෝ දෙන්නෙක් විසින්. හෙල්ල මිටියක්, උල් සහිත බෝල, කැල්ට්‍රොප් (අශ්වයින්, අලි ඇතුන් වැනි යුද්ධයට ගමන් කරන සතුන්ගේ පාදවල ඇනී වේගය අඩාල කිරීම සඳහා පොළොව මත විසුරුවන කුඩා උල් විශේෂයක්.) සහ තවත් නපුරු සෙල්ලම් බඩු පොදියක් අරන් ක්ලැරිස් කරත්තයට ගොඩවුණා.

තනි රනින් සෑදූ පිළිවෙළ, සුන්දර පෙනුමක් ගත් ඇපලෝ කරත්තය ලස්සන රන් පාට අශ්වයෝ දෙන්නෙක් විසින් ඇද්දා. එයාලගේ සටන්කරුවා දුන්නකින් සන්නද්ධව සිටියත්, සාමාන්‍ය උල් ඊතලවලින් අනෙක් රියැදුරන්ට නොවිදින්න එයා පොරොන්දු වෙලා තිබුණා.

හර්මීස් කැබිනයේ පරණ, කොළ පාට කරත්තයට තිබුණේ අවුරුදු ගාණකින් ගරාජයෙන් පිටට නොගත් පෙනුමක්. එහි කිසිම විශේෂත්වයක් නොතිබුණත්, එය හසුරුවමින් සිටි ස්ටෝල් සහෝදරයෝ දකලා මාව වෙව්ලුවේ එයාලා මොන ජාතියේ කපටි උප්පරවැට්ටි යොදවයි ද හිතලයි.

තවත් ඉතිරිව තිබුණේ කරත්ත දෙකක් විතරයි: එකක් ඇනබෙත්ගේ, අනෙක මගේ. තරගය පටන් ගන්න කලින් මම ඇනබෙත් ළඟට ගිහින් මගේ හීනය ගැන එයාට කියන්න හැදුවා. ග්‍රෝවර් ගැන කියද්දී එයා ටිකක් උනන්දු වුණත්, ග්‍රෝවර් කියූ දේවල් ගැන මම විස්තර කරද්දී එයා ආයෙමත් අවිශ්වාසයෙන් මගේ දෙස බැලුවා.

"ඔයා හදන්නේ මගේ හිත අවුල් කරන්න," එයා තීරණය කළා.

"මොකක්? නෑ, එහෙම නෑ!"

"ඔහ්, හරි. හරි හදිස්සියේම ග්‍රෝවර් ගිහිල්ලා, කඳවුර බේරගන්න පුළුවන් එකම දේ ළඟටම වැටෙන්න ඇති."

"ඒ කියන්නේ?"

එයා ඇස් දෙක කැරකුවා. "ආපු අතක් බලාගෙන යන්ඩ, පර්සි."



"මේක මං හදලා කියන කතාවක් නෙවෙයි. එයා කරදරේක වැටිලා, ඇනබෙත්."

එයා පැකිළුණා. මාව විශ්වාස කරනවද, නැද්ද තීරණය කරන්න එයා දෙපැත්තට වැනෙන බව මට තේරුණා. අපි ඉඳහිට රණ්ඩු කරගත්තා වුණත්, ඊට වඩා ගොඩාක් අමාරු අවස්ථාවලට අපි එක්ව මුහුණදී තිබුණා. ඒ වගේම, ග්‍රෝවර්ට කිසිම නපුරක් වෙනවා දකින්න එයා අකමැති බවත් මම දැන සිටියා.

"පර්සි, සහකම්පන සම්බන්ධයක් හදන එක ගොඩක් අමාරු වැඩක්. ඒක ඔයා දකපු හීනයක් වෙන්නත් බැරි නැහැ."

"ඔරකල්," මම කිවුවා. "අපි ඔරකල්ගෙන් උපදෙස් ගමු."

ඇනබෙත් ඇහිබැම ඇකිළුවා.

පසුගිය ගිම්හානයේ, මගේ ගවේෂණයට කලින් මහ ගෙදර අට්ටාලයේ ඉන්න අද්භූත ආත්මය ළඟට මට යන්න වුණා. එදා එයා මට දුන් අනාවැකිය මම කොහෙත්ම නොසිතූ විදිහට සැබෑ වුණා. ඒ අද්දැකීම මාස ගාණක් යන තුරු මගෙ හිතේ හොල්මන් කළා. බරපතළම කාරණාවකට ඇර ආපසු එතැනට යන්න මම කිසිම වෙලාවක යෝජනා නොකරන බව ඇනබෙත් දැන සිටියා.

එයා ඊට උත්තර දෙන්න කලින් හක් ගෙඩිය නාද වුණා.

"රියැදුරනි!" ටැන්ටලස් කතා කළා. "තරග ආරම්භයට යන්න!"

"අපි පස්සේ කතා කරමු," ඇනබෙත් මට කිවුවා, "මම දිනුවට පස්සේ."

මම, මගේ කරත්තයට යන අතරේ ගස්වල වසා සිටි පරෙවියෝ ගණන වැඩි වී ඇති බව මට පෙනුණා. පිස්සුවෙන් වගේ කෑගසමින් සිටි උන්ගේ හඬ මුළු වනය පුරාම රැව් දුන්නා. ඒ ගැන වෙන කාගේවත් අවධානය යොමුවී ඇති බවක් නොපෙනුණත්, ඒ සතුන් නිසා මගේ සිත කලබල වුණා. උන්ගේ හොටවල් අසාමාන්‍ය ලෙස දිලිසුණා. සාමාන්‍ය කුරුල්ලන්ගේ ඇස්වලට වඩා උන්ගේ ඇස් දීප්තිමත් වගෙයි පෙනුණේ.

ටයිසන් අපේ අශ්වයින්ව ආම්බාං කරගන්න දඟලමින් සිටියා. එයාලව සන්සුන් කරන්න මට ගොඩක් වෙලා කතා කරන්න සිද්ධ වුණා.

එයා රාක්ෂයෙක්, ස්වාමීනි! එයාලා මට පැමිණිලි කළා.

එයා පොසෙයිඩන්ගේ පුතෙක්. මම එයාලට කිවුවා. හරියට... හොඳයි, හරියට මං වගේ.

නෑ! එයාලා තරයේ කියා සිටියා. රාක්ෂයෙක්! අශ්වයෝ කඩ එකෙක් විශ්වාස නෑ!

තරගෙ ඉවර වුණාම මම ඔයාලට සූකිරි දෙන්නම්, මම කිවුවා.

සූකිරි?

ලොකුම ලොකු සූකිරි කැට. තව ඇපලුත් දෙනවා. ඇපල් ගැන මම කලින් මතක් කළේ නෑ නේද?

අන්තිමේදී, එයාලව කරත්තයට බඳින්න දෙන්න අශ්වයෝ එකඟ වුණා.

දැන්, ඔයාලා කවදාවත් ග්‍රීක අශ්ව කරත්තයක් දැකලා නැත්නම්, ඒක හදලා තියෙන්නේ වේගයෙන් යන්න මිසක් සුව පහසුවට හෝ ආරක්ෂාවට නෙවෙයි. මූලික වශයෙන් එය සාදා ඇත්තේ, පිටුපස විවෘත ලී කූඩයක් රෝද දෙකක් මැද ඇති අක්ෂ දණ්ඩ මත සවි කිරීමෙන්. මුළු ගමන පුරාවට සිටගෙන යන රියැදුරාට පාරේ ඇති සෑම ගැස්සීමක්ම හොඳින් දැනෙනවා. ගැල සෑදීමට ගන්නා දැව කොයි තරම් සැහැල්ලු ඒවාද කියනවා නම්, ධාවන පථය කෙළවරදී ඔයා වැළමිටි වංගුවක් ගැනීමට උත්සාහ කළොත් කරත්තය එක් පසෙකට ඇලවී ඔයාවයි කරත්තයයි දෙකම කුඩු වෙන්න වුණත් පුළුවන්.

තෝන් ලණු අතට ගත් මම ආරම්භක සීමාවට අසුන් මෙහෙය වූවා. මම අඩි දහයක් දිග රිටක් ටයිසන් අතට දීලා, අපිට ගොඩාක් කිට්ටු වෙන කරත්ත ඈතට තල්ලු කරන්නත්, එයාලා අපේ දිහාවට විසි කරන ඕනෑම දෙයක් වෙනතකට හරවන්නත් උපදෙස් දුන්නා.

"කෝටියෙන් පෝනියොන්ට ගහන්න හොඳ නෑ," එයා කිවුවා.

"ඔව්," මම එකඟ වුණා. "ඔයාට පුළුවන් නම් ළමයින්ටත් ගහන්නේ නැතුව ඉන්න බලන්න. අපි පිරිසිදුව තරග කරන්නයි යන්නේ. අපේ පැත්තට කරදරවලට එන්න නොදී, මට කරත්තෙ පදවන එක ගැන විතරක් හිතන්න දෙන්න."

"අපි දිනනවා," එයා කෑගැසුවා.

අපි අන්තෙටම පරදින්නයි යන්නේ, මම තනියම හිතුවා. ඒත් මට උත්සාහ කරන්නම වෙනවා. මට අතීත් අයට පෙන්වන්න උවමනා



වුණේ... අනේ මන්දා. ඒ මොකක්ද කියලා මටම විශ්වාස නැහැ. ටයිසන් කියන්නේ නරක කොල්ලෙක් නෙවෙයි කියල ද? එයා සමග ප්‍රසිද්ධියේ පෙනී සිටීම මට ලැජ්ජාවක් නෙවෙයි කියල ද? එහෙමත් නැත්නම් එයාලගේ විහිළුවලටවත්, ඇනුම්පදවලටවත් මට රිද්දන්න බැහැ කියල ද?

කරත්ත පෙළ ගැසෙද්දී, දිලිසෙන ඇස් ඇති පරෙවියෝ තව තවත් කැලයට රැස් වුණා. උන් කළ ඝෝෂාව නිසාම කඳවුරුකරුවන්ගේ අවධානයත් උන්ට යොමු වුණා. කුරුල්ලන්ගේ බරට සැලුණ ගස් දෙසට එයාලා කලබලයෙන් බැලුම් හෙළුවා. ඒ ගැන ටන්ටලස් නම් සැලකිල්ලක් දැක්වූ බව නොපෙනුණත්, උන්ගේ ඝෝෂාවට ඉහළින් කෑගසා කතා කරන්න එයාට සිදුවුණා.

"රියැදුරනි!" එයා කෑගැසුවා. "සැරසේන්!" එයා අතක් වනද්දී ආරම්භක සංඥාව පහත වැටුණා. කරත්ත සියල්ල පණගසා ඉදිරියට පැන්නා. දූවිලි අවුස්සමින් පොළොවේ කුර ගැටෙද්දී රැස්ව සිටි සෙනඟ ඔල්වරසන් දුන්නා.

ඒ ඉක්මනින්ම, මහ හඬින් බිඳෙන හඬක් ඇසුණා - කරබරාස්! මම හැරී බලද්දීම ඇපලෝ කරත්තය උඩ විසි වී පෙරළුණා. හර්මීස් කරත්තය එහි ගැටිලා- අත්වැරදීමක්, නැත්නම් උවමනාවෙන්ම කළ දෙයක්. එහි සිටි අශ්වාරෝහකයෝ පැත්තකට විසිවුණත්, භීතියෙන් කුලප්පු වූ අශ්වයෝ දෙන්නා ධාවන පථ හරහා රන් කරත්තය ඇදගෙන දිව්වා.

හර්මීස් කණ්ඩායමේ ට්‍රැවිස් සහ කොනර් ස්ටොල් දෙන්නා, එයාලගේ වාසනාව ගැන උදම් වුණත්, ඒ වැඩි වෙලාවකට නෙවෙයි. ඇපලෝ අශ්වයින් ගැටීමෙන් උඩ විසි වූ හර්මීස් කරත්තය ලී කෑලි ගොඩකට කැඩෙද්දී, කුලප්පු වූ අශ්වයෝ හතර දෙනා ධාවන පථයේ දූවිලි අවුස්සන්න වුණා.

මුල් අඩි විස්සෙදිම කරත්ත දෙකක් බිම. මේ ක්‍රීඩාවට මම ගොඩාක් කැමති වුණා.

මම නැවතත් අවධානය ඉදිරියට යොමු කළා. ඒරිස්ව පසු කරගෙන, හොඳ කාලයක් වාර්තා කරමින් අපි ඉදිරියට ඇදුණා. ඒත් ඇනබෙත්ගේ කරත්තය තවමත් අපිට වඩා ගොඩාක් ඉදිරියෙන්, එයා දැනටමත් පළමු කණුව අසලින් හැරෙන්න පටන්ගෙන. එයාගේ සටන්කරුවා දත් නියවමින් අපිට අත වැනුවා: "පස්සේ හම්බ වෙමු!"

Scanned with CamScanner

හොස්ටස් කරත්තයත් අපිට ළං වේගෙන ආවා. බෙකන්ඩෝර්ෆ් බොත්තමක් ඔබද්දී, එයාගේ කරත්තයේ පැත්තකින් පළුවක් විවර වුණා.

"කණගාටුයි, පර්සි!" එයා මොර දුන්නා. ඒත් එක්කම දම්වැල් ඇමුණු යකඩ බෝල කට්ටල තුනක් එක එල්ලේම අපේ රෝදවලට විදුණා. ඒවාගෙන් අපිව මුළුමනින්ම විනාශ වෙන්න තිබුණත්, ඊට වඩා වේගවත් වූ ටයිසන් එයාගේ රිටෙන් කඩිසර පහරක් එල්ල කරමින් ඒවා ඉවතට විසි කළා. අපි ඉදිරියටම ඇදෙන අතරේ, හොස්ටස් කරත්තයට හොඳ තල්ලුවක් දුන් ටයිසන් එයාලව පිටුපසට තල්ලු කර දැමුවා.

"නියම වැඩේ, ටයිසන්!" මම මොර දුන්නා.

"කුරුල්ලෝ!" එයා කෑගැසුවා.

"මොකක්?"

අපි ඉදිරියට ඇදෙමින් සිටි වේගයට කිසිවක් ඇහෙන්න හෝ පෙනෙන්න නැති වුණත්, ටයිසන් ඇඟිල්ල දිගු කළ කැලෑව දෙස බලද්දී එයා වද වුණු දේ මට දකින්න ලැබුණා. පරෙවියෝ ගස්වලින් ඉහළ නැගලා, යෝධ ටොනේඩෝවක් වගේ සර්පිලාකාරව කැරකුණ උන් ධාවන පථය දෙසට එන්න ගත්තා.

ඒක ඒ හැටි දෙයක් නෙවෙයි, මම, මටම කියාගත්තා. උන් පරෙයියෝ විතරයි.

තරගයට හිත යොමු කරන්න මම උත්සාහ කළා.

කරත්තයේ රෝද කිරිකිරි ගාමින් බිඳෙන්න තර්ජනය කරද්දි අපි පළමු වටය හැරුණා. අපිත් ඇනබෙත්ගේ කරත්තයත් අතර තිබුණේ තවත් අඩි දහයක පරතරයක් විතරයි. මට තව චුට්ටක් ළංවෙන්න පුළුවන් වුණා නම්, ටයිසන්ට, එයාගේ රිට පාවිච්චි කරන්න තිබුණා...

ඇනබෙත්ගේ සටන්කරුවාගේ හිනාව දැන් නැතිවෙලා ගිහින්. එයාගේ එකතුවෙන් හෙල්ලයක් ඇදගත් එයා මට මාන ඇල්ලුවා. එයා හෙල්ලය විසි කරන්න සූදානම් වෙද්දීම අපිට බෙරිහන් දෙන හඬක් ඇහුණා.

රංචු පිටින් ආ පරෙවියෝ දහස් ගාණක් ප්‍රේක්ෂකයන්ටත්, අනෙක් කරත්තවලටත් පහර දෙන්න ගත්තා. උන් බෙකන්ඩෝර්ෆ්ව වටකර තිබුණා. එයාගේ සටන්කරුවා කුරුල්ලන්ට පහර දෙන්න උත්සාහ කළත්, එයාට කිසිවක් පෙනුණේ නැහැ. පථයෙන් ඉවතට



පැන්න කරත්තය ස්ට්‍රෝබෙරි යායවල් හාමින් ඉදිරියට ඇදෙද්දී යාන්ත්‍රික අශ්වයින්ගෙන් දුම් පිටවුණා.

ක්ලැරිස්ගේ නියෝගයෙන් ඒරීස් කරත්තයේ සටන්කරුවා එයාලගේ ගැලට උඩින් දැල් රෙද්දක් දැමුවා. කුරුල්ලෝ රංචු පිටින් එය වටේ කැරකෙමින්, දැල අල්ලාගෙන සිටීමට උත්සාහ කරන සටන්කරුවාගේ අත්වලට කොටමින් පහුරු ගෑවත්, ක්ලැරිස් දත්මිටි කාගෙන කරත්තය ඉදිරියටම පැදවූවා. එයාගේ ඇටසැකිලි අශ්වයෝ කිසිම දේකින් කලබල වෙන පාටක් පෙනුණේ නැහැ. පරෙවියෝ උන්ගේ හිස් ඇස් කෙවෙණිවලට කොටමින්, ඉළ ඇට කූඩු හරහා පියඹා ගියත් අශ්වයෝ නොනැවති ගමනේ යෙදුණා.

ප්‍රේක්ෂකයෝ නම් එතරම් වාසනාවන්ත වුණේ නැහැ. කුරුල්ලෝ එයාලගේ නිරාවරණය වූ සමට කොටමින් සියලු දෙනාවම භීතියෙන් කලබල කරවූවා. දැන් කිට්ටුවටම ඇවිත් සිටි කුරුල්ලෝ දෙස බලද්දී, උන් සාමාන්‍ය පරෙවියෝ නොවෙන බව පැහැදිලිවම පෙනුණා. උන්ගේ පබළු වගේ ඇස්වල තිබුණේ යක්ෂ බැල්මක්. උන්ගේ හොටවල් ලෝකඩින් සාදා තිබුණා. කඳවුරුකරුවෝ වේදනාවෙන් මොරදුන් හැටියට ඒවා දැළිපිහි තරම් මුවහත්ව තියෙන්න ඇති.

"ස්ටයිම්ෆලියන් කුරුල්ලෝ!" ඇනබෙත් මොරදුන්නා. වේගය අඩු කළ එයා මගේ ළඟටම කරත්තය ගෙන ආවා. "අපි උන්ව එළෙවුවෙ නැත්නම් උන් හැමෝවම ඇටසැකිලිවලට යනකල් හම ගහයි!"

"ටයිසන්," මම කතා කළා. "අපි ආපහු හැරෙනවා!"

"වැරදි පැත්තටද යන්නේ?" එයා ඇසුවා.

"හැම වෙලාවෙම," කෙඳිරූ මම නරඹන්නන්ගේ වේදිකා දෙසට කරත්තය හැරවූවා. ඇනබෙත් මගේ ළඟින්ම ආවා. "වීරයිනී, ආයුධ ගන්න!" එයා කෑගැසුවත් කුරුල්ලන්ගේ ඝෝෂාවත්, රැස්ව සිටි සෙනගේ කලබලයත් නිසා එය කාටවත් ඇහුණද කියලා නම් මට විශ්වාස නැහැ. ලෝහ හොටවල් දිගු කරගෙන කුරුලු රැනක්ම මගේ මුහුණට එද්දි, තෝන් ලණු එක අතකට අරන් අනෙක් අතින් රිප්ටයිඩ් ඇදගන්න මට පුළුවන් වුණා. මම උන්ට පහර දෙද්දී උන් පිහාටු දූවිලි ගොඩකට පුපුරා ගියත්, තවත් මිලියන ගාණක් ඉතිරිව සිටියා. එකෙක් මගේ පිටට අනිද්දි මම උඩ පැන්න වේගයට තව පොඩ්ඩෙන් මාව කරත්තයෙන් එළියටම විසිවෙනවා.

ඇනබෙත්ගේ වෙලාවත් මට වඩා සුබ වුණේ නැහැ. අපි වේදිකාවලට කිට්ටු වෙද්දී, කුරුලු වලාවේ ඝනකමත් ටිකෙන් ටික වැඩි වුණා.

සමහර ප්‍රේක්ෂකයෝ ප්‍රතිප්‍රහාර එල්ල කරන්න උත්සාහ කළා. ඇතීනාගේ කදවුරුකරුවෝ ආරක්ෂකයින් කැඳෙව්වා. කුරුලු තර්ජනය වනසා දමීමට ඇපලෝ කැබිනයේ දුනුවායෝ දුනු ඊතල පිටට ගත්තත්, එතැන කදවුරුකරුවෝ ගොඩක් කුරුල්ලන් සමග මිශ්‍රවී සිටි නිසා ඊතල විදීම ආරක්ෂාකාරී වුණේ නැහැ.

"මෙතැන ගොඩක් ඉන්නවා!" මම ඇනබෙත්ට මොර දුන්නා. "කොහොමද මුන්ව එළවන්නේ?" එයා එක් පරෙවියෙකුට කිණිස්සෙන් ඇන්නා. "හර්කියුලිස් පාවිච්චි කළේ ශබ්දය! පිත්තල ඝණ්ටාර! එයාට ඇති කරන්න පුළුවන් දරුණුම ඝෝෂාවෙන් උන්ව බය කරලා-"

එයාගේ ඇස් ලොකුවුණා. "පර්සි... කයිරොන්ගේ එකතුව!"

එයා කිවූ දේ එසැණින්ම මට තේරුම් ගියා. "ඒක වැඩ කරයි කියලා ඔයා හිතනවද?"

එයාගේ සටන්කරුවා අතට තෝන් ලණු දුන් ඇනබෙත් මගේ කරත්තයට පැන්නේ ඒක මේ ලෝකෙ තියෙන ලේසිම වැඩේ වගෙයි. "මහගෙදරට යමු! මේක තමයි අපේ එකම අවස්ථාව!" කිසිම ප්‍රතිමල්ලවයෙක් නැතිව තරගය අවසන් කළ ක්ලැරිස් කුරුලු ප්‍රශ්නය කොයිතරම් බරපතළ වෙලාද කියලා දක්කේ ඒ වෙලාවෙදියි.

අපි එතැනින් පිටතට රිය පදවාගෙන යනවා දකපු එයා කෑගසන්න වුණා. "ඔහෙලා පැනලා යනවදෝ? සටන තියෙන්නෙ මෙතෙන්. බයගුල්ලෝ!" කඩුව ඇදගත් එයා වේදිකාව දෙසට දිව්වා.

මම අපේ අශ්වයින්ට පිම්මේ යන්න සන් කළා. ස්ට්‍රෝබෙරි යායවල් හරහා ගොරවමින් ගිය කරත්තය අප්පන්දු පිටිය පසුකරමින් ගොස් මහගෙදර ඉදිරියේ පසෙකට ඇලවෙමින් නැවතුණා. ඇතුළට දිවූ අපි කොරිඩෝ පසු කරමින් කයිරොන්ගේ කාමරයට ගියා.

එයාගේ සංගීත පෙට්ටිය තවමත් ඇඳ අසල මේසය මත තිබුණා. ඒ වගේම එයාගේ ප්‍රියතම සී.ඩී. එකතුවත් තිබුණා. ඒ අතරින් මට සොයාගත හැකි වූ අප්පිරියා සහගතම තැටිය මම අතට ගනිද්දී, ඇනබෙත් සංගීත පෙට්ටිය ඩැහැගත්තා. ඉන්පසු අපි දෙන්නා නැවතත් එළියට දිව්වා.



ධාවන පථයේ කරත්ත ගිනි ගනිමින් තිබුණා. තුවාල වූ කදවුරුකරුවෝ හිස් හැරුණු අතේ දුවද්දී, කුරුල්ලෝ එයාලගේ ඇඳුම් හීරුවලට ඉරමින්, කෙස් උගුල්ලන අතරේ ටන්ටලස් වේදිකාව දිගේ පේස්ට්‍රියක් ලුනුබදිමින් දිව්වා. "තත්ත්වය පාලනේ කරලයි තියෙන්නේ! කලබල වෙන්න එපා!" එයා සැරින් සැරේට කෑගසා කිවුවා.

අපි තරගාවසාන සීමාවට ළඟා වුණා. ඇනබෙත් සංගීත පෙට්ටිය සූදානම් කළා. ඒකෙ බැටරි බැහැලා තියෙන්න එපා කියලා මම ප්‍රාර්ථනා කළා.

මම 'ප්ලේ' බොත්තම ඔබද්දී කයිරොන්ගේ ප්‍රියතම ඩීන් මාර්ටින්ගේ ගීත වාදනය වෙන්න ගත්තා. ඒත් එක්කම වයලින් හඬින් සහ පිරිමි රංචුවක් ඉතාලි භාෂාවෙන් විලාප තියන හඬින් පරිසරය පිරුණා. යක්ෂ කුරුල්ලන්ට පිස්සු හැදුණා. උන් එක තැන රවුමට කැරකෙමින්, එකිනෙකාගේ හැප්පුණේ උන්ගේ ඔළු පොඩි පට්ටම් කරගන්න උවමනා වෙලා වගෙයි. ධාවන පථය සහමුලින්ම අත් හැරිය උන් යෝධ අඳුරු රැල්ලක් වගේ අහසට පියෑඹුවා.

"දැන්!" ඇනබෙත් කෑගැසුවා. "දුනුවායනි!"

පැහැදිලි ඉලක්කවලට ඇපලෝ දුනුවායන් පහසුවෙන්ම කුරුමානම් ඇල්ලුවා. එයාලගෙන් වැඩි දෙනෙකුට එකවර ඊතල පහක්-හයක් විදීමේ හැකියාව තිබුණා. විනාඩි ගාණක් තුළදී, මැරුණු ලෝකඩ-හොට පරෙවියන්ගෙන් පොළොව හැඩි වුණා. ජීවිත බේරාගත් එවුන් ඈත අහස් ඉමේ දුම් රැල්ලක් වගේ නොපෙනී ගියා.

කදවුර මුදා ගත්තත්, සුන්බුන් ගොඩවල් ප්‍රියමනාප දසුනක් මැවුවේ නැහැ. කරත්ත බොහෝමයක් මුළුමනින්ම විනාශ වෙලා. හැම දෙනාටම වගේ කුරුල්ලෝ කොටපු, ලේ ගලන තුවාල තිබුණා. ඇෆ්‍රොඩයිට් කැබිනයේ ළමයි මරහඬ දුන්නේ එයාලගේ කොණ්ඩා මෝස්තර අවුල් වෙලා, ඇඳුම්වලට පරෙවි වසුරු වැටී තිබුණු නිසයි.

"හුරේ!" ටන්ටලස් කිවුවත්, එයා බලා උන්නේ මගේ දිහාවත් ඇනබෙත් දිහාවත් නෙවෙයි. "අපේ පළවෙනි ජයග්‍රාහකයා මෙන්න ඉන්නවා!" තරගාවසාන සීමාවට ඇවිද ගිය එයා තෝන්තුවෙන් බලා සිටි ක්ලැරිස්ට රන් ලෝරල් පිරිනැමුවා.

ඊට පස්සේ එයා මගේ දිහාවට හැරිලා හිනාවක් පෑවා. "එතකොට දැන්, තරගෙ කඩාකප්පල් කරපු කරදරකාරයන්ට දඬුවම් කරන වෙලාව."

## 07

# මට ආගන්තුකයෙකුගෙන් ලැබුණු තෑගි

ටන්ටලස් කියපු විදිහට, ස්ටයිම්ෆලියන් කුරුල්ලෝ කැලේට වෙලා උන්ගේ පාඩුවේ ඉඳලා තියෙන්නේ. ඇනබෙතුයි, ටයිසනුයි, මමයි නරක විදිහට කරන්න පදවලා උන්ට බාධා නොකළා නම් උන් අපිට පහර දෙන්නේ නැලු.

ඒ අසාධාරණ කතාව ඇහුවාම, 'ගිහින් ඩෝනට් එකක් පස්සේ එළවනවා' කියලා මම ටන්ටලස්ට කිවුවා. ඒකෙන් උදවුවක් නම් වුණේ නැහැ. දඬුවම ලෙසට එයා අපිව මුළුතැන්ගෙයි රාජකාරිවලට නියම කළා- ඒ කියන්නේ මුළු හවස් වරුවම පිරිසුදු කිරීම් කරන හාර්පිලා එක්ක භූගත මුළුතැන්ගෙයි වළං-පිඟන් අතුල්ලන්න වෙනවා. පිඟන් බඩුවලට වැඩි ඔපයක් ලබා දෙන්නත්, විෂබීජ සියයට අනූ නමයයි දශම නමයක්ම විනාශ කරන්නත් හාර්පිලා සේදීම්වලට වතුර වෙනුවට පාවිච්චි කළේ ලෝදිය. ඉතින්, ඇස්බැස්ටෝස්වලින් සෑදූ අත්මේස් සහ ඒප්‍රන් පැලඳගෙන වැඩ කරන්න ඇනබෙත්ටයි මටයි සිද්ධ වුණා.

ටයිසන්ට නම් ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ. අත් දෙක කෙලින්ම ලෝදියට ඔබාගත් එයා අතුල්ලන්න පටන් ගත්තා. ඒත් ඇනබෙත්ටයි මටයි අනතුරුදායක ගිනියම ඉවසාගෙන පැය ගාණක් වැඩ කරන්න වුණේ එතැන අතිරේක පිඟන් ටොන් ගාණක් තිබුණු නිසයි. ක්ලැරිස්ගේ ජයග්‍රහණය සමරන්න ටන්ටලස් විශේෂ දිවා භෝජන සංග්‍රහයක් සංවිධානය කර තිබුණා- දේශීය ක්‍රමයට සැකසූ ස්ටයිම්ෆලියන් කුරුලු මස් ඇතුළත් අංග සම්පූර්ණ භෝජන සංග්‍රහයක්. අපිට ලැබුණු දඬුවමෙන් වූ එකම හොඳ දේ වුණේ එයින් ඇනබෙත්ටයි මටයි පොදු හතුරෙක් ලැබීම සහ කතා කරන්න ඕනෑ තරම් වේලාව



ලැබීමයි. ග්‍රෝවර් ගැන මම දුටු හීනය නැවත වතාවක් ඇසුවාම, එයා මාව විශ්වාස කරන්න පටන්ගත් බව පෙනුණා.

"එයා ඇත්තටම ඒක හොයාගෙන නම්," එයා මිමිණුවා, "අපිට ඒක අරන් එන්න පුළුවන් වුණොත්-"

"පොඩ්ඩක් ඉන්න," මම කිවුවා. "ඔයා හැසිරෙන්නේ ග්‍රෝවර් මේ හොයාගෙන තියෙන එක- ඒක මොකක් වුණත්- කඳවුර බේරගන්න මේ ලෝකේ තියෙන එකම දේ වගෙයි නේ. මොකක්ද ඒක?"

"මම ඔයාට ඉඟියක් දෙන්නම්. බැටළුවෙක් හම ගැහුවොත් ඔයාට ලැබෙන්නේ මොනව ද?"

"මස් ගොඩක්?"

එයා සුසුමක් හෙළුවා. "ලොම්. බැටළු ලොම්. බැරිවෙලාවත්, ඒ බැටළුවාට තිබුණේ රත්තරන් ලොම් නම්-"

"රන් බැටළු ලොම් සළුව. ඔයා ඇත්තටමද කියන්නේ?"

ඇනබෙත් පිඟානක තිබුණු මස් කටු ලෝදියට හැලුවා. "පර්සි, අළු සහෝදරියෝ මතක ද? එයාලා කිවුවේ ඔයා හොයන දේ තියෙන තැන එයාලා දන්නවා කියලා. තව, එයාලා ජේසන්වත් මතක් කළා. අවුරුදු තුන්දාහකට කලින් එයාට රන් සළුව හොයාගන්න පාර කිවුවේ අළු සහෝදරියෝ. ජේසන් සහ ආර්ගෝනට්ගේ කතාව ඔයා දන්නවා නේ?"

"ඔව්," මම කිවුවා. "අර මැටිවලින් හදපු ඇටකෝට්ටෝ ඉන්න පරණ චිත්‍රපටිය නේ." ඇනබෙත් ඇස් දෙක කැරකුවා. "ඔන්, මගෙ දෙයියනේ, පර්සි! ඔයා එක්ක මං මොනවා කරන්න ද මන්දා."

"මොකක් ද?" මම සැරෙන් ඇසුවා.

"අහන්නකෝ. රන් සළුවේ ඇත්ත කතාවේ තියෙන විදිහට: කැඩ්මස් සහ යුරෝපා කියලා සියුස්ගේ ළමයි දෙන්නෙක් හිටියා, හරි ද? එයාලව මිනිස් බිලි පූජාවකට මරන්න හදනකොට, එයාලව බේරගන්න කියලා එයාලා සියුස්ට යාඥා කළා. ඒ වෙලාවේ සියුස් රත්තරන් ලොම් තියෙන පියාඹන බැටළුවෙක් එව්වා, ඒ බැටළුවා එයාලව ග්‍රීසියේ ඉඳන් කොලකිස්වලටම අරගෙන ගියා. හොඳයි, ඇත්තටම නම් ඌ අරගෙන ගියේ කැඩ්මස්ව විතරයි. යන අතරමගදී යුරෝපා බිමට වැටිලා මැරුණා, ඒත් ඒක එච්චර වැදගත් නැහැ."

Scanned with CamScanner

"මට හිතෙන්නේ ඒ ගැනු ළමයට නම් ඒක සෑහෙන වැදගත් වෙන්නැති."

"ප්‍රධාන කාරණේ තමයි, කැඩ්මස් කොල්කිස්වලට ගියාට පස්සේ එයා රත්තරන් බැටළුවාව දෙවිවරුන්ට පූජා කරලා, රාජධානිය මැද ගහක බැටළු ලොම් සළුව එල්ලුවා. සළුව ඒ පළාතට සෞභාග්‍ය ගෙනාවා. සත්තු ලෙඩ වෙන එක නතර වුණා. වගාවන් සරු වුණා. ගොවින්ගේ අස්වනු වැඩි වුණා. විසංගත කවදාවත් පැතිරුනේ නැහැ. අන්න ඒ නිසයි ජේසන්ටත් සළුව ඕනෑ වුණේ. ඒක තියෙන ඕනෑම පළාතක් සරුසාර වෙනවා. ලෙඩ රෝග සුවවෙලා, සොබාදහම ශක්තිමත් වෙනවා, දූෂණය වුණ පරිසරය පිරිසිදු වෙනවා-"

"තාලියාගේ ගහ සනීප කරන්නත් ඒකට පුළුවන් වෙයි."

ඇනබෙත් ඔළුව වැනුවා. "ඒ වගේම අර්ධ-ලෝහිත කඳවුරේ බැමි ආපහු ශක්තිමත් කරන්නත් ඒකට පුළුවන් වෙයි. ඒත් පර්සි, මේ සළුව සියවස් ගාණක් තිස්සේ අතුරුදහන් වෙලා තිබුණේ. වීරයෝ දහස් ගාණක් ඒක හොයාගෙන ගියත් හම්බ වුණේ නැහැ."

"ඒත් ග්‍රෝවර් ඒක හොයාගත්තා," මම කිවුවා. "එයා පෑන්ව හොයාගෙන ගිහින් ඒ වෙනුවට සළුව හොයාගත්තේ ඒ දෙකෙන්ම සොබාදහම් මායාවෙ රැස් පැතිරෙන නිසා. ඇනබෙත්, අපිට එක ගමනෙන්ම එයාවත් ගලවාගෙන, කඳවුරත් බේරගන්න පුළුවන්. ඒක නම් නියමයි!"

ඇනබෙත් පැකිළුණා. "ඒක ඕනෑවටත් වඩා නියමයි කියලා ඔයාට හිතෙන්නැද්ද? මේක උගුලක් නම්?"

පහුගිය ගිම්හානයේදී ක්‍රෝනොස් අපේ ගවේෂණය මෙහෙයවා තිබූ ආකාරය මට මතක් වුණා. මුළු බටහිර ශිෂ්ටාචාරයම විනාශ කළ හැකි යුද්ධයකට මුල පුරන්න එයාට උදවු කරන තැනට එයා අපිව රැවැට්ටුවා.

"අපිට වෙන කරන්න දෙයක් නැනේ?" මම ඇහුවා. "ග්‍රෝවර්ව බේරගන්න ඔයා මට උදවු කරනවද, නැද්ද?" අපේ කතාබහ ගැන උනන්දුව නැති වී, කෝප්ප සහ හැඳිවලින් සෙල්ලම් බෝට්ටු සාදා, ලෝදියේ පා කරමින් විනෝද වූ ටයිසන් වෙතට එයා බැල්මක් හෙළුවා.



"පර්සි," එයා කට යටින් කිවුවා. "අපිට සයික්ලොප්ස් කෙනෙක් එක්ක සටන් කරන්න වෙනවා. පොලිෆිමස්, සයික්ලොප්ස්ලාගෙන් නරකම එකා. තව, එයාගේ දූපත තියෙන්න පුළුවන් එකම තැනක විතරයි. ඒ රාක්ෂ සයුරේ."

"ඒක කොහෙද තියෙන්නේ?"

මම මෝඩයෙක් වගේ රඟපානවා හිතලා එයා මට රැව්වා. "රාක්ෂ සයුර අනේ. ඔඩිසියස් යාත්‍රා කළේ, තව ජේසන්, ඊනියාස් වගේ ගොඩාක් අය යාත්‍රා කළ එකමයි."

"ඔය කියන්නේ මධ්‍යධරණී මුහුද ද?"

"නෑ. හොඳයි, ඔව්... ඒත් නෑ."

"තවත් පැහැදිලි උත්තරයක්. බොහෝම ස්තුතියි."

"බලන්න, පර්සි, රාක්ෂ සයුර කියන්නේ වික්‍රමාන්විත ගවේෂණවල යන හැම වීරයෙකුටම යාත්‍රා කරන්න වෙන මුහුද. කලින් නම් ඒක මධ්‍යධරණී මුහුද තමයි. ඒත් අනිත් හැමදෙයක්ම වගේම, බටහිර බලවේගයේ කේන්ද්‍රයත් එක්ක ඒකත් පිහිටන තැන මාරු වෙනවා."

"හරියට ඔලිම්පස් කන්ද එම්පයර් එස්ටේට් ගොඩනැගිල්ල මුදුනට ඇවිත් තියෙනවා වගේ," මම කිවුවා. "තව, පාතාලය ලොස් ඇන්ජලීස්වලට යටින් තියෙනවා වගේ."

"අන්න හරි."

"ඒත් රාක්ෂයෝ පිරුණ මුහුදක්- ඒ වගේ තැනක් හංගන්නේ කොහොම ද? අමුතු, අද්භූත දේවල් වෙනවා කියලා සාමාන්‍ය මිනිස්සුන්ට පේන්නේ නැද්ද... හරියට, නැව් පිටින් ගිලිනවා වගේ දේවල්?"

"ඇත්ත වශයෙන්ම එයාලා දකිනවා. එයාලට තේරුම් ගන්න බැරි වුණත්, සාගරේ ඒ කොටසේ අසාමාන්‍ය දේවල් වෙනවා කියලා එයාලා දන්නවා. දැන් රාක්ෂ සයුර තියෙන්නේ ඇමරිකාවේ නැගෙනහිර වෙරළෙන් එහා, ෆ්ලොරිඩාවෙන් ගිනිකොන දිශාවට වෙන්න. මිනිස්සු එතැනට වෙනම නමක් පවා කියනවා."

"බර්මියුඩා ත්‍රිකෝණය?"

"අන්න හරි."

ඒක මගේ හිත් පතුලට කිඳාබහින්න මම ඉඩ හැරියා. ඉ, මීයන්නේ, අර්ධ-ලෝහිත කඳවුරට ආව දවසේ ඉඳන් මට ඉමහත ලැබුණ දේවල් එක්ක බලද්දී ඒක ඒ තරම් අමුතු දෙයක් නෙවෙයි. "හරි... එහෙනම්, අපි කරමු හොයන්න ඕනෑ කොහෙද කියලවත් අපි දන්නවනේ."

"ඒත් ඒකත් ලොකු පළාතක්, පර්සි. රාක්ෂයෝ පිරුණ වතුර යටි ලෝකයක් හොයන එක-"

"හේයි, මම සමුද්‍ර දෙවියන්ගේ පුතා. මේක මගේ ගෙදර වැඩක්. ඉතින් කොහොමද ඒක අමාරු වෙන්නේ?" ඇනබෙත්ගේ ඇහිබැමි එකට ඇඹුළුණා. "අපිට ටැන්ටලස්ට කතා කරලා ගවේෂණයකට අවසර ඉල්ලන්න වෙනවා. එයා ගත් කට්ට එපා කියයි."

"අද ඒ කඳවුරු ගිනිමැලේ ළඟ, හැමෝම ඉස්සරහ ඒක කිවුවොත් එයාට එපා කියන්න බැරි වෙනවා. මුළු කඳවුරේම අයට ඒක ඇහුණොත්, එයාලා ටැන්ටලස්ට බල කරයි. එතකොට ඒක අහක දාන්න එයාට බැහැ."

"සමහරවිට," ඇනබෙත්ගේ කටහඬට බලාපොරොත්තුවක පුංචි ලකුණක් ආවා. "අපි ඉක්මනට මේ පිඟන් හෝදලා ඉවර කළොත් හොඳයි. මට අර ලෙඩිය ස්ප්‍රේ එක දෙනව ද?"

* * * * * *

එදා ඒ කඳවුරු ගිනිමැලය ළඟදී ඇපලෝ කැබිනයේ ළමයි සාප්පයේ මුල් තැන ගත්තා. කට්ටියගේ උනන්දුව ඉහළ නංවන්න එයාලා උත්සාහ කළත්, දහවලේ සිද්ධවූ කුරුලු ප්‍රහාරය නිසා ඒක ලේසි වුණේ නැහැ. අපි කව හැඩැති ගල් පඩිවල වාඩි වූ අපි ඇපලෝ කොල්ලෝ නීරස ලෙසින් ගිටාර් සහ වීණා වාදනය කරද්දී, උදාසීන ලෙස සින්දු කිවුවා.

අපි ප්‍රසිද්ධ කඳවුරු ගීත ඔක්කොම වගේ ගායනා කළා. කඳවුරු ගිනිමැලයට ඉන්ද්‍රජාලයක් කර ඇති නිසා, අපි ගායනා කරන හඬ වැඩිවන තරමට, ගිනිදලුවල උසත් වැඩිවුණේ සෙනගේ චිත්ත ස්වභාවයට අනුව පාට සහ උණුසුම වෙනස් වෙමින්. සතුටින් පිරුණු රෑවලදී මේ ගිනිමැලය දම් පාටට හැරිලා, අඩි විස්සක් තරම් උසට ගිනිදලු විහිදුවමින් ඉදිරි පේළියේ මාෂ්මෙලෝස්වලට පවා ගිනි ඇවිළෙනවා මම දකලා තිබුණා. ඒත් එදා රෑ යාන්තමින් අඩි පහක් විතර



උසට නැඟුණු පිළාතික කහ පාට ගිනිදලුවලින් උණුසුමක් දැනුණේම නැති තරම්.

ඩයොනිසියස් කලින්ම එතැනින් යන්න ගියා. සින්දු කීපයක් ඉවසීමෙන් අහගෙන හිටියට පස්සේ, කයිරොන් එක්ක කාඩ් සෙල්ලම් කරන එකවත් මෙච්චර කම්මැලි නැහැ කියලා කෙඳිරූ එයා ටැන්ටලස්ට අප්‍රසන්න බැල්මක් හෙළා මහ ගෙදර පැත්තට යන්න ගියා.

"හොඳයි, ඒක නම් නියමයි!" අවසාන ගීතයත් ඉවර වුණාට පස්සේ එහෙම කියපු ටැන්ටලස් කූරක ගසා තිබුණු මාෂ්මෙලෝවක් අරන් ඉදිරියට ආවා. එයා හරිම සාමාන්‍ය විදිහට එයින් එකක් ගලවගන්න හැදුවත්, එයාගේ අත වදින්න කලින් මාෂ්මෙලෝව කූරෙන් ඉවතට පැන්නා. ටැන්ටලස් එය අල්ලගන්න හැදුවත්, ඊට කලින් ගින්නට පැන්න මාෂ්මෙලෝව සියදිවි නසාගත්තා.

උදාසීන හිනාවක් පාමින් ටැන්ටලස් අපේ පැත්තට හැරුණා. "දැන් එතකොට, හෙට වැඩසටහන් ගැන නිවේදන කීපයක් කරන්න තියෙනවා."

"සර්," මම කතා කළා.

ටැන්ටලස්ගේ ඇසක් තදින් ගැහුණා. "අපේ කුස්සි කොල්ලට මොනවාහරි කියන්න තියෙනව ද?" ඒරීස් කඳවුරුකාරයෝ කීපදෙනෙක් හිනාවෙනවා ඇහුණත්, මාව අපහසුවට පත් කරලා නිහඬ කරවන්න කාටවත් ඉඩ දෙන්න මම සූදානම් වුණේ නැහැ. මම නැඟිටලා ඇනබෙත් දිහා බැලුවා. දෙවිවරුන්ට ස්තූති වෙන්න, එයත් මාත් එක්කම නැඟිට්ටා. "කඳවුර බේරගන්න අදහසක් අපි ළඟ තියෙනවා." මම කිවුවා.

හැමෝම නිහඬ වුණා, ඒත් මම හැමදෙනාගේම අවධානය ලබාගත් බව තේරුණේ කඳවුරු ගිනිමැලය දීප්තිමත් කහ පාටින් දල්වෙන්න ගත් නිසයි.

"ඒ ගැන මොකට කියනවද," ටැන්ටලස් මෘදුව කිවුවා. "හොඳයි, මේක කරන්න ගැන මොනවාහරි නම්-"

"රන් බැටළු ලොම් සළුව," මම කිවුවා. "ඒක තියෙන තැන අපි දන්නවා." ගිනිදලු නැඹිලි පාටට හැරුණා. ටැන්ටලස් මාව නවත්වන්න කලින් ග්‍රෝවර් ගැනත්, පොලිෆිමස්ගේ දූපත ගැනත් දැකපු හීනය මම කියාගෙන ගියා. කතාවට මැදිහත් වූ ඇනබෙත් රන් සළුවට කළ හැකි

දේ හැමෝටම මතක් කර දුන්නා. හැමදෙනාටම එය ඒත්තු ගන්වන්න එයාට හැකි වූ බව පැහැදිලිවම පෙනුණා.

"කදවුර බේරගන්න රන් සළුවට පුළුවන්," එයා කතාව අවසන් කළා, "මට ඒක සහතිකයි."

"විකාර," ටන්ටලස් කිවුවා. "මේක මොකටද බේරගන්නේ." හැමදෙනාම එයාට රවපු රැවිල්ලට අන්තිමේදි ටන්ටලස් අපහසුවට පත්වූ බව පෙනුණා.

"ඇරත්," එයා ඉක්මනින්ම එකතුවක් කළා, "රාක්ෂ සයුරේ! ඒක එසේ-මෙසේ තැනක්යැ. ඔයාලා ඒකේ කොහේ හොයන්නද කියලවත් දන්නව ද?"

"ඔව්, මං දන්නවා." මම කිවුවා.

"ඔයා දන්නවා?" මගේ දෙසට නැමුණු ඇනබෙත් කොඳුරා ඇසුවා.

මම ඔළුව වැනුවා, මොකද අළු සහෝදරියෝ එක්ක අපි ආව ගමන මතක් කරලා ඇනබෙත් මගේ මතකයේ වූ යමක් ඇවිස්සුවා. එයාලා දුන් හෝඩුවාවේ අරුත තේරුම් ගන්න ඒ වෙලාවේ මට බැරි වුණා. ඒත් දැන්....

"30, 31, 75, 12," මම කිවුවා.

"හොඳා...යි," ටන්ටලස් කිවුවා. "ඒ තේරුමක් නැති ඉලක්කම් ටික අපිටත් කිවුවට ස්තුතියි."

"ඒවා මාලිමා ඛණ්ඩාංක," මම කිවුවා. "අක්ෂාංශ සහ දේශාංශ. මම, අන්, සමාජ අධ්‍යයනයට ඒවා ඉගෙනගෙන තියෙනවා."

එයින් ඇනබෙත් පවා පුදුමයට පත්වුණා වගෙයි. "අංශක 30ත්, විනාඩි 31ක් උතුරට; අංශක 75ත්, විනාඩි 12ක් බටහිරට. එයා හරි! අපිට ඒ ඛණ්ඩාංක දුන්නේ අළු සහෝදරියෝ. ඒක ෆ්ලොරිඩා වෙරළෙන් එහා, අත්ලාන්තික් සාගරේ මැද තැනක් වෙන්න ඕනෑ. රාක්ෂ සයුරේ. අපිට ගවේෂණයක් ඕනෑ!"

"පොඩ්ඩක් ඉන්න," ටන්ටලස් කිවුවා.

ඒත් කඳවුරුකරුවෝ උද්ඝෝෂණය කරන්න ගත්තා. "ගවේෂණයක් ඕනෑ! ගවේෂණයක් ඕනෑ!" ගිනිදළු ඉහළටම නැගුණා.

"ඒක උවමනා දෙයක් නෙවෙයි!" ටන්ටලස් කියා සිටියා.



"අපිට ගවේෂණයක් ඕනෑ! ගවේෂණයක් ඕනෑ!"

"හරි!" තරහෙන් පුපුරමින් ටන්ටලස් කිවුවා. "මේ දඩබ්බරයෝ ටිකට ඕනෑ මම ගවේෂණයක් නියම කරනවට ද?"

"ඔව්...!"

"බොහොම හොඳයි," එයා එකඟ වුණා. "මේ භයානක චාරිකාව බාර අරන්, රන් සළුව හොයාගෙන, ඒක ආපහු අරන් එන්න, බැරි නම් මඟදි මැරෙන්න මම වීරයෙකුට අවසර දෙනවා." මගේ හදවත් උද්වේගයෙන් පිරුණා. මාව බය කරන්න මම ටන්ටලස්ට ඉඩ දෙන්නේ නැහැ. මට කරන්න උවමනා වුණේ මේකයි. ග්‍රෝවර්වත්, කඳවුරත් බේරගන්න මම යනවා. මාව නවත්වන්න කිසි දේකට බැහැ.

"අපේ වීරයාට ඔරැකල්ගෙන් උපදෙස් ගන්න මම අවසර දෙනවා!" ටන්ටලස් නිවේදනය කළා. "ඒ වගේම තවත් වීරයෝ දෙන්නෙක් ගමනට තෝරාගන්නත්. මං හිතන්නේ තෝරාගන්න වීරයා කවුද කියලා හැමෝම දන්නවා."

ටන්ටලස් මගේ දිහාවත්, ඇනබෙත් දිහාවත් බැලුවේ හරියට අපිව පණපිටින් හම ගහන්න හිතිලා වගෙයි. "වීරයා විය යුත්තේ කඳවුරට ගෞරවයක් ලබා දුන්නු, කරත්ත තරඟවලදි උපාය දක්ෂතාවයක් පෙන්වපු, කඳවුර ආරක්ෂා කිරීමට තරම් ධෛර්යවන්ත කෙනෙක්. මේ ගවේෂණය මෙහෙයවන්නේ ඔබයි... ක්ලැරිස්!" ගිනිමැලය පාට දහස් ගාණකින් ඇවිළෙන්න ගත්තා. ඒරිස් කැබිනයේ අය නටමින් ජයඝෝෂා නගන්න පටන් ගත්තා. "ක්ලැරිස්! ක්ලැරිස්!"

ක්ලැරිස් පුදුමයෙන් තිගැස්සිලා නැගිට්ටා. ඉන්පසු තදින් කෙළ ගිල්ල එයා, ආඩම්බරයෙන් පපුව පුම්බගත්තා. "මම ගවේෂණය බාරගන්නවා!"

"ඉන්න!" මම කෑගැසුවා. "ග්‍රෝවර් කියන්නේ මගේ යාළුවා. හීන පෙනුණේ මට."

"වාඩි වෙනවා!" ඒරිස් කඳවුරුකරුවෝ මොරදුන්නා. "ගිය ගිම්හානෙදි ඔහේට වාරයක් ලැබුණනේ!"

"ඔව්, එයාට ඕනෑවෙලා තියෙන්නේ ආයෙමත් කැපිලා පේන්ඩ!" තවත් කෙනෙක් කිවුවා. ක්ලැරිස් මට එරෙව්වා. "මම මේ ගවේෂණය ඒරිස්ගේ දුව, ක්ලැරිස් වන මම බාරගන්නවා!" එයා නැවතත් කිවුවා. "ඒරිස්ගේ දුව, ක්ලැරිස් වන මම මේ කඳවුර බේරගන්නවා!"

කදවුරුකරුවෝ පෙරටත් වඩා සද්දෙට ඔල්වරසන් හඬ දුන්නා. ඇනබෙත් විරෝධය පාද්දී, ඇතීනා කඳවුරුකරුවෝ එයාට එකතු වුණා. අනෙක් හැමදෙනාම කෑගසමින්, වාද කරමින්, මාෂ්මෙලෝස්වලින් ගහගනිමින් පිල් බෙදෙන්න ගත්තා. ඒක සුදුසුකම් සියල්ල සපිරූ මාෂ්මෙලෝස් යුද්ධයක් වෙයි කියලා මම හිතද්දි ටන්ටලස් කෑගැසුවා. "නිශ්ශබ්ද වෙනවා, හිතුවක්කාරයෝ ටික!"

එයාගේ හඬින් මාවත් තිගැස්සුණා.

"වාඩි වෙනවා!" එයා නියෝග කළා. "දැන් මම ඔයාලට හොල්මන් කතාවක් කියන්න යන්නේ."

එයා මොනවා කරන්න හදනවද මට නොතේරුණත්, අපි හැමෝම අකමැත්තෙන් වුණත් ආපසු වාඩි වුණා. ටන්ටලස්ගෙන් පැතිරුණ දුෂ්ට ප්‍රභාව මට මුහුණ දීමට ලැබුණු රාක්ෂයෝ සියල්ලටම වඩා ප්‍රබල වුණා.

"එකමත් එක කාලෙක දෙවිගොල්ලෝ ආදරේ කරපු මනුෂ්‍ය රජෙක් හිටියා!" ටන්ටලස් පපුව මත අතක් තබාගත්තා. එයා කියන්නේ එයා ගැනමයි කියලා මට හැඟීමක් ආවා. "මේ රජාට," එයා කියාගෙන ගියා, "ඔලිම්පස් කන්දේ භෝජන සංග්‍රහවලට සහභාගී වෙන්න පවා අවසර ලැබුණා. ඒත් එක වතාවක් එයා වට්ටෝරුව ඉගෙන ගන්න හිතලා ඇම්බ්‍රෝසියා ටිකකුයි නෙක්ටාර් ටිකකුයි- බොහෝම පොඩි මල්ලකින් එකක් විතර- ගෙදර ගේන්න උත්සාහ කළාට දෙවිවරු එයාට දඬුවම් කළා. දෙවිවරු, එයාලගේ ශාලාවලින් අර මනුස්සයව සදාකාලයටම පිටුවහල් කළා! එයාගෙම මිනිස්සු පවා එයාට සමච්චල් කළා! එයාගේ දරුවෝ එයාට දොස් කීවා! තව, ඔන්. ඔව්, කඳවුරුකාරයෝ, එයාට හිටියේ හරිම දරුණු ළමයි ටිකක්. හරියට ඔයාලා වගේ."

එයාගේ වක ගැසුණු ඇඟිල්ලක් කතාව අසා සිටි මම ඇතුළු තවත් කීප දෙනෙකුට දිගු වුණා.

"ඒ ගුණමකු ළමයින්ට එයා කළේ මොකක්ද කියලා ඔයාලා දන්නව ද?" ටන්ටලස් මෘදුව ඇසුවා. "දෙවිවරු දුන්න කෲර දඬුවමට එයා පළිගත්තේ කොහොමද කියලා ඔයාලා දන්නව ද? තමන්ගෙ හිතේ තරහක් නැති බව පෙන්වන්න එයා ඔලිම්පියානුවන්ට භෝජන සංග්‍රහයකට එයාගේ මාලිගාවට ආරාධනා කළා. එයාගේ දරුවෝ අතුරුදහන් වෙලා කියලා කාටවත්ම තේරුණේ නැහැ. ඊට පස්සේ



එයා දෙවිවරුන්ට රෑ කෑම පිළිගැන්වූවාම, ඒ මස් ඉස්ටුවේ තිබුණේ මොනවද කියලා ඔයාලට හිතාගන්න පුළුවන් ද?"

ඊට උත්තර දෙන්න කවුරුවත් එඩිතර වුණේ නැහැ. තද නිල් පාටින් දැල්වුණු ගිනිමැලයේ එළිය ටන්ටලස්ගේ ඇද වුණ මුහුණ මතින් දුෂ්ට ලෙස පරාවර්තනය වුණා.

"ඔන්, එයා පරලොව ගියාම දෙවිවරු එයාට දඬුවම් කළා," ටන්ටලස් රළුව කිවුවා. "ඇත්තටම එයාලා එහෙම කළා. ඒත් එයා, එයාගේ චන්දිය අරගෙන තිබුණේ, නේද? එයාගේ දරුවෝ ආයේ කවදාවත් එයාට එකටෙක කියන්නවත්, එයාගේ බලය ගැන ප්‍රශ්න කරන්නවත් ආවෙ නැහැ. ඒ වගේම, දන්නවද වැඩක්? ඒ රජාගේ ආත්මය දැන් මේ කඳවුරට ඇවිල්ලා ගුණමකු, හිතුවක්කාර ළමයින්ගෙන් පළිගන්න බලන් ඉන්නවලු. දැන් එතකොට... ක්ලැරිස් මේ ගවේෂණයට යනවට තව ආඩපාලි එහෙම කියන්න තියෙනව ද?" හැමදෙනාම නිහඬයි.

ටන්ටලස් ක්ලැරිස්ට ඔළුව වැනුවා. "ඔරකල් ළඟට, මගෙ දරුවෝ. දැන් යන්න." එයා අපහසුවෙන් වගේ කකුල් මාරු කළේ, ටන්ටලස්ගේ හුරතලෙක් වෙලා කීර්තිය ලබාගන්න එයාටවත් උවමනා නැහැ වගෙයි.

"සර්-"

"යනවා!" එයා ගිගුරුවා.

නුහුරු ලෙස නැමී ආචාර කළ එයා මහගෙදර පැත්තට ලහිලහියේ ගියා.

"ඔයා මොකද, පර්සි ජැක්සන්?" ටන්ටලස් ඇසුවා. "අපේ පිගන් හෝදන ළමයට කියන්න දෙයක් නැද්ද?" මම මුකුත් කියන්න ගියේ නැහැ. මට ආපහු දඬුවම් කරලා සතුටු වෙන්න මම එයාට ඉඩ දුන්නේ නැහැ.

"හොඳයි," ටන්ටලස් කිවුවා. "තව දෙයක් මතක් කරන්න ඕනෑ- මගේ අවසර නැතුව කාටවත් කඳවුරෙන් පිටවෙන්න තහනම්. කවුරුහරි එහෙම කරන්න හැදුවොත්... හොඳයි, එහෙම කරන්න උත්සාහ කරලා එයා නොමැරී බේරුණොත්, එයාව සදහටම පිටුවහල් කරනවා, ඒත් ඒකට ඉඩක් නැති වෙයි. දැන් ඉඳන් හාර්පිලා ඇඳිරි නීතිය බලාත්මක

Scanned with CamScanner

කරාවි. ඒ වගේම, එයාලා හැම වෙලාවෙම ඉන්නේ බඩගින්නේ සුබ රාත්‍රියක්, ආදරණීය කඳවුරුකරුවනි. හොඳට නිදාගන්න."

ටන්ටලස් අත වනද්දී ගිනිමැලය නිවී ගියා. කඳවුරුකරුවෝ අඳුරේම කැබින්වලට ඇදුණා.

සිදුවූ දේවල් ටයිසන්ට පැහැදිලි කරන්න මට බැරි වුණා. මම දුකෙන් බව එයා දන සිටියා. මට ගමනක් යන්න උවමනා බවත්, ටන්ටලස් ඊට ඉඩ නොදෙන බවත් එයාට තේරුණා.

"ඔයා කොහොමහරි යනව ද?" එයා ඇහුවා.

"මන්දා," මම පිළිගත්තා. "ඒක අමාරු වැඩක් වෙයි. ගොඩාක් අමාරු වෙයි."

"මම උදවු කරන්නම්."

"නෑ. මට - අහ්, ඒකට ඔයාට ඉඩ දෙන්න බැහැ, ලොකු යාළුවා. ඒක ගොඩාක් භයානකයි." ටයිසන් ඔඩොක්කුවේ තබාගෙන එකලස් කරමින් සිටි ලෝහ කෑලි දෙස බැලුවා- දුනු, දතිරෝද සහ චූටි වයර් කෑලි. බෙකන්ඩෝර්ෆ් එයාට ආම්පන්න කීපයකුත්, අමතර කොටස් වගයකුත් දීලා තිබුණා. ඉතින් දැන් ටයිසන් හැම රෑකම ඒවා අතපත ගාමින් ගත කළත්, එයාගේ යෝධ අත්වලින් ඒ තරම් සියුම්, පුංචි කොටස් හසුරුවන්නේ කොහොමද කියලා නම් මට හිතාගන්නවත් බැරි වුණා.

"ඔයා මොකක්ද හදන්නේ?" මම ඇහුවා.

ටයිසන් එයට උත්තර දුන්නේ නැහැ. ඒ වෙනුවට එයා උගුර යටින් කෙඳිරිලි හඬක් පිට කළා.

"ඇනබෙත් සයික්ලොප්ස්ලට කැමති නැහැ. ඔයාට... මාව එක්ක යන්න ඕනෑ නැද්ද?"

"ඔහ්, ඒ හින්දා නෙවෙයි," ඇත්ත නොවුණත් මම කිවුවා. "ඇනබෙත් ඔයාට කැමතියි. ඇත්තමයි." එයාගේ ඇහේ කොණක කඳුළු පිරුණා.

මට ග්‍රෝවර් මතක් වුණා, හැම සැටර් කෙනෙකුටම වගේ එයාටත් චිත්තවේග කියවීමේ හැකියාව තිබුණා. ඒ හැකියාව සයික්ලොප්ස්ලාටත් ඇති ද හිතලා මම පුදුම වුණා.



ටයිසන්, එයාගේ අඩුම-කුඩුම ටික ඉටි රෙද්දක එතුවා. ඇඳේ වැතිරුණ එයා ටෙඩි බෙයාර් කෙනෙක් වගේ ඒ පොදිය තුරුළු කරගත්තා. එයා බිත්තිය පැත්තට හැරුණාම, එයාගේ පිටේ වූ තුවාල කැළැල් මට හොඳින්ම පෙනුණා. ඒවා හරියට කවුරුහරි එයාගේ පිට නගුල් ගාලා වගෙයි. එයාට ඒ තුවාල ලැබුණේ කොහොමද හිතලා මම ආයෙමත් පුදුම වුණා.

"තාත්ති හැම වෙලාවෙම ම-මං ගැන බැලුවා," එයා නහය ඉහළට ඇද්දා. "දැන්... මට හිතෙනවා එයා සයික්ලොප්ස් බබෙක් හැදුවේ අපරාදෙ කියලා. මං ඉපදෙන්නෙ නැතුව ඉන්න තිබ්බේ."

"ඒ විදිහට කතා කරන්න එපා! පොසෙයිඩන් ඔයාට හිමිකම් කිවුවා, නැද්ද? ඉතින්... එයා ඔයා ගැන බලනවා ඇති... ගොඩාක්..."

මේ තරම් කාලයක් ටයිසන් ජීවත් වුණේ නිව්යෝක් නගරයේ පාරක ශීතකරණ පෙට්ටියක් ඇතුළේ බව සිහි වෙද්දී මගේ කතාව අතරමග ඇනහිටියා. පොසෙයිඩන් එයා ගැන හොයලා බලනවා කියලා ටයිසන් කොහොම හිතන්න ද? තමන්ගේ ළමයට ඒ වගේ දෙයක් සිද්ධ වෙන්න ඉඩ අරින්නේ මොන වගේ තාත්තෙක් ද, අඩු තරමේ ඒ ළමයා රාක්ෂයෙක් වුණත්?

"ටයිසන්... මේ කඳවුර ඔයාට හොඳ ගෙදරක් වෙයි. අනිත් අය ඔයාට පුරුදු වෙයි. මම පොරොන්දු වෙනවා." ටයිසන් සුසුමක් හෙළුවා. එයා මොනවා හෝ කියන තුරු මම බලා සිටියා. ඒත්, එයාට නින්ද ගිහින් කියලා මට තේරුණේ ටිකකින්. මගේ ඇඳේ වැතිරුණ මම ඇස් පියාගන්න උත්සාහ කළත්, මට බැරිවුණා. මට ආයෙමත් ග්‍රෝවර්ව හීනෙන් පෙනේවි කියලා මං බය වුණා. සහකම්පන සම්බන්ධය ඇත්තක් නම්... ග්‍රෝවර්ට මොනවාහරි සිද්ධ වුණොත්.... නින්දෙන් ඇහැරෙන්නවත් මට ඉඩක් ලැබේවි ද?

පුර හඳේ එළිය ජනේලය හරහා කාමරයට ගලා ආවා. රළ ගෙඩි පෙරළී ඇවිත් වෙරළේ හැපෙන හඬ ඇසුණා. ස්ට්‍රෝබෙරි යායේ උණුසුම් සුවඳ සමග වනාන්තරය හරහා බකමූණන් ප්‍රහුබඳින වන දේවතාවන්ගේ මුකුළු හිනා හඬ ඇදී ආවා. ඒ වුණත් රැයේ මොකක්දෝ වරදක් මට දැනුණා- තාලියාගේ ගහේ අසනීපය දෙණිය පුරාම පැතිරෙමින් තිබුණා.

අර්ධ-ලෝහිත කඳවුර බේරාගන්න ක්ලැරිස්ට පුළුවන් වෙච්ච දා ටන්ටලස්ගෙන් 'හොඳම කඳවුරුකාරයාට හිමි සම්මානය' ගන්න මට ඉඩක් නැති බව මම හොඳින්ම දන සිටියා.

ඇඳෙන් බිමට පැන්න මම ඇඳුම් හැඳගෙන, මගේ ඇඳ යටින් බීම එළන බිලැන්කෙට්ටුවකුත් කෝක් දුසිම් බාගයේ අසුරනයකුත් පිටතට ගත්තා. කඳවුරේ නීතිවලට අනුව කෝක් වගේ පිටතින් ගෙනෙන බීම වර්ග තහනම් වුණත්, හර්මීස් කැබිනයේ හරි කෙනාට කතා කරලා, රන් ඩ්‍රච්මා කීපයක් දුන්නොත් ළඟපාත කඩේකින් ඕනෑම දෙයක් හොරෙන් ගෙන්වා ගන්න ඔයාට බැරිකමක් නැහැ.

ඇඳිරි නීතිය පැනෙව්වාට පසු හොරෙන් එළියට යන එකත් නීතියට පටහැනි වැඩක් තමයි. අහුවුණොත් මාව ලොකු කරදරේක වැටෙන්න ඉඩ තිබුණා. නැත්නම් හාර්පිලාගේ රෑ කෑම වෙන්නත් ඉඩ තිබුණා. ඒ මොනවා වුණත් මට මුහුද බලන්න ඕනෑ වුණා. එතැනදි නිතරම මට සුවයක් දනෙනවා. මගේ සිතුවිලි පැහැදිලි වෙනවා. කැබිනයෙන් පිටවූ මම වෙරළ දෙසට හැරුණා.

වැල්ලේ බිලැන්කෙට්ටුව ඇතිරූ මම කෝක් කෑනයක් විවෘත කළා. මොකක්දෝ හේතුවකට සීනි සහ කැෆේන්වලින් නිතරම මගේ අතික්‍රියාශීලී මොළය සන්සුන් වෙනවා. කඳවුර බේරාගන්න කළ යුතු දේ තීරණය කරන්න මම උත්සාහ කළත්, මගේ හිතට කිසිම අදහසක් ආවේ නැහැ. පොසෙයිඩන් මට කතා කරලා, උපදේශයක්වත් දෙනවා නම්, සියලා මට හිතුණා.

පැහැදිලි අහස පුරා තරු විසිරී තිබුණා. මම ඇනබෙත් කියා දුන් තරු රටා සොඳිසි කරමින් සිටියා- ධනු රාශිය, හර්කියුලිස්, මහ වලහා- "ඒවා ලස්සනයි, නේ?" එකපාරටම කවුදෝ අහද්දි මගේ සෝඩා එකත් පිට උගුරේ යන්න ගියා.

මට එහා පැත්තෙන් හිටගෙන හිටියේ නයිලෝන් කොට කලිසමකින් සහ නිව්යෝක් මැරතන් ටී-ෂර්ට් එකකින් සැරසුණු පිරිමියෙක්. සිහින් ශක්තිමත් කෙනෙක් වූ එයාට අළු-සුදු කොණ්ඩයකුත් කපටි හිනාවකුත් තිබුණා. එයාගේ පෙනුම හුරුපුරුදු වුණත්, ඒකට හේතුව නම් මට හිතාගන්න බැරි වුණා.

මුලින්ම මගේ හිතට ආවේ එයා රෑ මැද වෙරළේ දුවන්න ඇවිත්, පාර වැරදිලා කඳවුරු සීමාව තුළට එන්න ඇති කියලයි. කලින් නම් එහෙම වෙලා නැහැ. සාමාන්‍ය මනුෂ්‍යයින්ට මේ දෙණියට ඇතුළු



වෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒත් දූත් ගහේ මායාව දුර්වල වෙමින් තිබුණු නිසා එයාට කොහොමහරි එන්න ලැබෙන්න ඇති. ඒත් මේ යක්කු ගස් නගින වෙලාවේ? ඇරත්, කඳවුර අවට ගොවි බිම් සහ රක්ෂිත වනාන්තර හැර වෙන කිසිවක් නැහැ. එතකොට මේ මනුස්සයා කොහෙ ඉඳලද දුවගෙන ආවේ?

"මාත් මෙතැනින් ඉඳගන්න ද?" එයා ඇහුවා. "මට කල්පෙකින් විතර ඉඳගන්න ලැබිලා නැහැ." දන්, මං දන්නවා- රෑ මැද ආව ආගන්තුක මනුස්සයෙක්. සාමාන්‍ය දනීමේ හැටියට නම්ඃ මම මෙතැනින් දුවලා, උදවු ඉල්ලා මොරදෙන්න ඕනෑ. ඒත් මේ මනුස්සයා හැසිරුණේ කොයි තරම් සන්සුන්වද කියනවා නම්, එයාට බය වෙන්න මට අමාරු වුණා.

"අහ්, කමක් නෑ." මම උත්තර දුන්නා.

එයා හිනාවුණා. "ඔයාගේ ආගන්තුක සත්කාර කරන පුරුද්ද වටිනවා. ඔහ්, කොකාකෝලා! මටත් එකක්?"

බිලැන්කෙට්ටුවේ අනෙක් කෙළවරේ වාඩි වූ එයා සෝඩා කෑනයක් ඇරලා උගුරක් බිව්වා. "අහ්... ඒක නම් මරු. සමාදානය සහ සැනසීම අහ්-"

එයාගේ සාක්කුවේ ජංගම දුරකථනයක් මොරදුන්නා.

පිරිමියා සුසුමක් හෙළුවා. එයා පිටට ගත් ජංගම දුරකථනය දකලා මගේ ඇස් ලොකු වුණේ එය නිල්වන් එළියකින් දිලිසුණ නිසයි. එයා එහි ඇන්ටෙනාව දිගු කරද්දී, සත්තු දෙන්නෙක් එය වටේ ඇඹරෙමින් වෙළෙන්න ගත්තා- ගැඩවිලෙක් තරමේ කොළ පාට සර්පයෝ දෙන්නෙක්.

පිරිමියාට නම් ඒ ගැන වගක්වත් නැහැ වගෙයි. ජංගම දුරකථනයේ එල්.සී.ඩී. තිරය පරීක්ෂා කළ එයා ශාප කළා. "මට මේක ගන්න වෙනවා. තත්පරයක් දෙන්න..." ඊට පස්සේ එයා දුරකථනයට කතා කළාඃ "හෙලෝ?" එයා ඇහුම්කන් දෙන අතරේ එයාගේ කත අසලින්ම චූටි සර්පයෝ දෙන්නා ඉහළ පහළ ඇඹරුණා.

"ඔව්," පිරිමියා කිවුවා. "අහන්න- මං දන්නවා, ඒත්... එයාව ගලක ගැටගහලා, ගිජු ලිහිණියෝ අක්මාවට කෙටුවත් මට කරන්න දෙයක් නැහැ. එයාව අල්ල ගන්න අංකයක් නැත්නම්, එයාගේ පැකේජ් එක තියෙන තැන හොයාගන්න අපිට බැහැ. මිනිස් වර්ගයාට තෑග්ගක්? තියමයි... ඔයා දන්නවද ඒවා කීයක් යවලා තියෙනවද කියලා- ඔහ්,

ඒකෙන් වැඩක් නෑ. අහන්න, පාරිභෝගික සේවා අංශෙ ඉන්න ඉරිස්ට එයාව දාන්න. මට වැඩ තියෙනවා." එයා ඇමතුම විසන්ධි කළා. "කණගාටුයි. සීඝ්‍රගාමී රාත්‍රී වෙළඳාම ඔහොම තමයි. දැන්, මම කියකියා හිටිය විදිහට-"

"ඔයාගෙ ෆෝන් එකේ සර්පයෝ ඉන්නවා."

"මොකක්ද? ඕහ්, එයාලා හපන්නේ නෑ. මාර්තා ජෝර්ජ් හලෝ කියන්න."

''මාර්තා ජෝර්ජ් හලෝ,'' මගේ ඔළුව ඇතුළේ පිරිගානවා වගේ පිරිමි හඬක් කිවුවා.

''කෝලං කරන්නෙපා,'' ගැහැනු හඬක් කිවුවා.

''ඇයි එපා කියන්නේ?'' ජෝර්ජ් ප්‍රශ්න කළා. ''අමාරු වැඩ ඔක්කොම කරන්නේ මම නේ.''

"ඕහ්, ඕක ආයෙත් පටන් ගන්නද යන්නේ!" පිරිමියා දුරකථනය සාක්කුවට ඔබාගත්තා. "දැන්, අපි කොතනද හිටියේ... අහ්, ඔව්. සමාදානය සහ සැනසීම."

කකුල් නමාගත් එයා තරු දිහා බලා සිටියා. "මට මෙහෙම විවේකයක් ලැබුණේ ගොඩාක් කාලෙකට පස්සේ. ටෙලිග්‍රාෆ් පටන් ගත්ත දවසේ ඉඳලා- දුවනවා, දුවනවා, දුවනවා. ඔයා ආසම තරු රටාවක් තියෙනවද, පර්සි?" එයා සාක්කුවට ඔබාගත් චූටි සර්පයෝ ගැන තවමත් පුදුම වෙමින් හිටියත්, මම එයාට උත්තර දුන්නා, "ම්..ම්... මම කැමති හර්කියුලිස්ට."

"ඇයි?"

"මොකද... එයාටත් තිබුණේ කුණු වෙච්ච වාසනාවක්. මගේ එකටත් වඩා සවුත්තු එකක්. ඒකෙන් මට සහනයක් දැනෙනවා." පිරිමියා තනියම හිනා වුණා. "එයා ශක්තිමත්, ප්‍රසිද්ධ කෙනෙක් නිසා නෙවෙයි?"

"නෑ."

"ඔයා නම් ෂෝක් කොල්ලෙක්. ඉතින්, දැන් මොකද කරන්නේ?"

එයා අහන්නේ මොකක්ද කියලා මට එසැණින්ම තේරුණා. රන් සළුව ගැන මම කරන්න අදහස් කරන්නේ මොනවා ද?



ඊට උත්තර දෙන්න කලින්, මාර්තා සර්පයාගේ හිරවුණු හඬ සාක්කුවෙන් ඇහුණාඃ ඩිමීටර් දෙවැනි ලයින් එකේ ඉන්නවා.

"දැන් බැහැ," පිරිමියා කිවුවා. "එයාට කියන්න පණිවුඩයක් තියන්න කියලා."

එයා නම් ඒකට කැමති වෙන එකක් නැහැ. කලින් වතාවේ ඔයා එයාට එහෙම කළාම, මල් ප්‍රවාහන අංශේ මල් ඔක්කොම පරවුණා.

"එහෙනම් එයාට කියන්න මම රැස්වීමක කියලා!" පිරිමියා ඇස් කැරකුවා. "ආයෙමත් කණගාටුයි, පර්සි. ඔයා කියකියා හිටියේ..."

"මේ... ඔයා කවුද, ඇත්තටම?"

"ඔයා වගේ දක්ෂ කොල්ලෙක්ට තවම ඒක හිතාගන්න බැරි වුණා ද?"

''එයාට පෙන්වන්න!'' මාර්තා බැගෑපත් වුණා. මම මාස ගාණකින් නියම ප්‍රමාණෙට ඉඳලා නැහැ.

''එයා කියන ඒවා අහන්නෙපා!'' ජෝර්ජ් කිවුවා. ''එයාට ඕනෑ ප්‍රදර්ශනේ කරන්න!''

පිරිමියා නැවතත් දුරකථනය එළියට ගත්තා. "නියම ප්‍රමාණේ, කරුණාකරලා," දුරකථනය දීප්තිමත් නිල් පාටින් බැබළෙන්න ගත්තා. අඩි තුනක් දිග ලී පොල්ලක් වන තුරු දිග ඇදුණු එහි ඉහළ කෙළවරෙන් පරෙවි තටු දෙකක් පිටට පැන්නා. දැන් සාමාන්‍ය ප්‍රමාණයේ කොළ පාට සර්පයෝ දෙන්නෙක් වී සිටි ජෝර්ජ් සහ මාර්තා එහි මැද දඟර ගැසී සිටියා. ඒ කැබිත් අංක එකොළහේ සංකේතය, කැඩූසියස් එකක්.

මගේ උගුර හිර වුණා. දඩබ්බර මුහුණුවරත්, දඟකාර දීප්තියක් ඇති ඇස් දෙකත් එක්ක මේ පිරිමියාගේ පෙනුම හුරුපුරුදු ලෙස දැනුණු හේතුව මට තේරුම් ගියා...

"ඔයා ලූක් තාත්තා," මම කිවුවා. "හර්මීස්."

දෙවියා තොල් තද කරගත්තා. එයා කැඩූසියස් එක වැල්ලේ සිටවූවා. "'ලූක්ගේ තාත්තා.' සාමාන්‍යයෙන් නම්, මිනිස්සු මාව හඳුන්වන මුල්ම විදිහ ඒක නෙවෙයි. හොරුන්ගේ දෙවියා, ඔව්. එයාලා කාරුණික වෙන්න කැමති නම්, පණිවුඩකරුවන්ගේ සහ සංචාරකයන්ගේ දෙවියා කියලත් කියනවා."

''හොර වැඩවල දෙවියා,'' ජෝර්ජ් කිවුවා.

Scanned with CamScanner

''ඔහ්, ජෝර්ජ්ව ගණන් ගන්නෙපා,'' මාර්තා මට දිව දිගු කළා. ''එයා නපුරු වෙලා තියෙන්නේ හර්මීස් වැඩිපුර කැමති මට හින්දා.''

''එයා එහෙම නෑ!''

''එහෙම තමයි!''

"ඔය දෙන්නා හැසිරෙන්න ඉගෙන ගත්තොත් හොඳයි," හර්මීස් අනතුරු ඇඟෙව්වා. "නැත්නම් මම ඔයාලව ආපහු ෆෝන් එකට හරවලා, වයිබ්‍රේට් වෙන්න දානවා! දැන්, පර්සි, ඔයා තවම මගේ ප්‍රශ්නෙට උත්තරයක් දුන්නේ නෑ. ඔයා ගවේෂණය ගැන කරන්න හිතාගෙන ඉන්නේ මොකක් ද?"

"ම-මට යන්න අවසර නැහැ."

"ඇත්ත වශයෙන්ම, නැහැ. එහෙම කියලා ඔයා නතර වෙනව ද?"

"මට යන්න ඕනෑ. මට ග්‍රෝවර් බේරගන්න තියෙනවා."

හර්මීස් හිනාවුණා. "ඉස්සර මම දන්න කොල්ලෙක් හිටියා... ඔහ්, ඔයාට වඩා ගොඩාක් පොඩි කොල්ලෙක්. හරියටම කියනවා නම්, චූටි බබෙක්."

''මෙන්න ආයෙමත්,'' ජෝර්ජ් කිවුවා. ''හැමවෙලාවෙම තියවන්නේ තමන් ගැනමයි.''

''කට වහගන්න!'' මාර්තා සැර කළා. ''ඔයාට වයිබ්‍රේට් වෙන්න ඕනෑ වෙලා ද?''

හර්මීස් එයාලව නොසලකා හැරියා. "එක දවසක් ඊ, අම්මා ළඟපාත නැති වෙලාවක එයාලගේ ගුහාවෙන් හොරෙන් පිටවෙලා ගිය කොල්ලා ඇපලෝට අයිති එළහරක් වගයක් හොරකම් කළා."

"ඊට පස්සේ එයාව කෑලිවලට කුඩු වුණා ද?" මම ඇසුවා.

"හ්ම්ම්... නෑ. ඇත්තටම, හැමදේම හොඳට සිද්ධ වුණා. හොරකමට වන්දි ගෙවන්න මේ කොල්ලා, එයා විසින් ම සොයාගත් භාණ්ඩයක් ඇපලෝට දුන්නා - වීණාවක්. ඇපලෝ සංගීතයට කොච්චර වශී වුණා ද කිව්වොත්, එයාට තරහා ගන්නත් අමතක වුණා."

"ඉතින්, ඒ කතාවෙන් ගන්න තියෙන ආදර්ශය මොකක් ද?"



"ආදර්ශය?" හර්මීස් ඇසුවා. "අනේ අපොයි, ඔයා කතා කරන්නේ ඒක උපමා කතාවක් වගෙයිනේ. ඒක ඇත්ත කතාවක්. ඇත්ත කතාවලත් ආදර්ශයක් තියෙනව ද?"

"ම්ම්..."

"මෙහෙම කිවුවොත්: හොර වැඩ හැම වෙලාවෙම නරක නැහැ?"

"මගේ අම්මා නම් ඒ ආදර්ශෙට කැමති වෙන්නේ නැති වෙයි."

''මීයෝ හරිම රසවත්,'' ජෝර්ජ් යෝජනා කළා.

''ඒකයි කතාවයි අතරෙ තියෙන සම්බන්ධෙ මොකක් ද?'' මාර්තා ප්‍රශ්න කළා.

''මොකක්වත් නෑ,'' ජෝර්ජ් කිවුවා. ''ඒත් මට බඩගිනියි.''

"මම හොයාගත්තා," හර්මීස් කිවුවා. "තරුණ කට්ටිය හැම වෙලාවෙම එයාලට උපදෙස් ලැබුණු විදිහට වැඩ කරන්නේ නෑ, ඒත් එයින් ජයගෙන, ආශ්චර්යමත් දෙයක් කරන්න එයාලට පුළුවන් නම්, සමහර වෙලාවට එයාලා දඬුවමෙන් ගැලවෙනවා. ඒක කොහොම ද?"

"ඔයා කියන්නේ මම කොහොමහරි යන්න ඕනෑ කියලා," මම කිවුවා. "අවසර නැතුව හරි." හර්මීස්ගේ ඇස් දිලිසුණා. "මාර්තා, කරුණාකරලා මට පළවෙනි පාර්සලේ දෙනවද?" මාර්තා කට ඇරියා... මගේ අතක් තරම් පළල් වෙන තුරුම ඇරියා. ඊට පස්සේ එයා මළ නොබැඳෙන වානේ බෝතලයක් වැමෑරුවා- කළු පාට ප්ලාස්ටික් පියනක් ඇති පරණ තාලයේ උණු වතුර බෝතලයක්. එහි දෙපස රතු, කහ පාටවලින් පෞරාණික ග්‍රීක දර්ශන ඇඳ තිබුණා- සිංහයෙක්ව මරණ වීරයෙක්; ඔළු තුනේ බල්ලා, සර්බෙරස්ව ඔසවාගෙන ඉන්න වීරයෙක්.

"ඒ හර්කියුලිස්," මම කිවුවා. "ඒත් කොහොම ද-"

"කිසිදාක ත්‍යාගයක් ප්‍රශ්න කරන්න එපා," හර්මීස් තාලෙට කිවුවා. "'හර්කියුලිස් ඔළු ගෙඩි කම්මුතු කරයි' කතා මාලාවේ මතක සටහන්වලට අයිති භාණ්ඩයක්."

"හර්කියුලිස් ඔළු ගෙඩි කම්මුතු කරයි?"

"නියම නාට්‍යයක්." හර්මීස් සුසුමක් හෙළුවා. "හෙෆාස්ටස් ටීවී එන්න කලින් කාලේ තිබුණේ ඔක්කොම රියැලිටි වැඩසටහන් විතරයි.

ඇත්ත වශයෙන්ම, සම්පූර්ණ උණු වතුර බෝතලයම තිබුණා නම් මේක ඊට වඩා ගොඩක් වටිනවා-"

"මාර්තාගේ කට තිබ්බෙ නැත්නම්," ජෝර්ජ් එකතු කළා.

"ඉන්නවා ඒකට ඔහේව අල්ලගන්නම්." මාර්තා කැඩූසියස් එක වටේට එයාව එළවන්න ගත්තා.

"පොඩ්ඩක් ඉන්න," මම කිවුවා. "මේක තෑග්ගක් ද?"

"දෙකෙන් එකක්," හර්මීස් කිවුවා. "ඒක අතට අරන් බලන්න." ඒක මගේ අතෙන් අත හැරෙන්න ගියේ බෝතලයේ එක පැත්තක් අයිස් වගේ සීතලටත්, අනෙක් පැත්ත පිච්චෙන තරම් උණුසුම්වත් අතට දැනුණු නිසයි. අමුතුම දේ වුණේ, මම ඒක කොයි පැත්තට හැරවුවත්, මුහුද දෙසට- ඒ කියන්නේ උතුරට මුහුණලන පැත්ත හැම වෙලාවෙම සීතල වීමයි...

"මේක මාලිමාවක්!" මම කිවුවා.

හර්මීස් පුදුම වුණා වගෙයි. "හරිම දක්ෂයි. මට කවදාවත් ඒක කල්පනා වුණේ නැහැ නේ. ඒත් මේකෙන් ඊටත් වඩා දෙයක් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ. මේකේ පියන ගැලෙව්වොත්, ලෝකයේ හතර දිශාවෙන් හමන සුළඟෙන් ඔයාගේ ගමන වේගවත් වේවි. හා.. හා! දැන්ම එපා! වෙලාව ආවම, කරුණාකරලා, මේ පියන බොහෝම පොඩ්ඩක් විතර අරින්න. මේ හුළඟත් ටිකක් මං වගේ- හැම වෙලාවෙම කලබලයි. හතරම එක පාර පිට වුණොත්... අහ්, ඒත් ඔයා ඊට වඩා පරිස්සම් වෙයි කියලා මට විශ්වාසයි. එතකොට දැන් මගේ දෙවෙනි තෑග්ග. ජෝර්ජ්?"

මෙයා මගේ ඇඟේ ඇතිල්ලෙනවා, මාර්තා පොල්ල වටේ ලිස්සා යද්දි ජෝර්ජ් පැමිණිලි කළා.

"එයා කොහොමත් ඔයාගේ ඇතිල්ලෙනවා තමයි," හර්මීස් කිවුවා. "ඔයාලා එකට වෙළිලා නෙ ඉන්නේ. දැන් ඔය වැඩේ නතර නොකළොත් දෙන්නව ආයෙමත් ගැට ගැහෙයි!"

සර්පයෝ දෙන්නා පොර බැදීම නතර කළා.

කට ඇරිය ජෝර්ජ් හපලා කන විටමින් පෙති පිරවූ පුංචි ප්ලාස්ටික් බෝතලයක් වැමැරුවා.



"ඔයා විහිළු කරනවා," මම කිවුවා. "ඒවා මිනටෝර් හැඩේ පෙති ද?" බෝතලය අහුලාගත් හර්මීස් එය සෙලවූවා. "ඔව්, ලෙමන් ඒවා. මං හිතන්නේ මිදි රස ඒවා නම් ෆියුරිලාගේ හැඩේ ද කොහෙදෝ. නැත්නම් හයිඩ්‍රාද මන්දා? කොහොම වුණත්, මේවා ගොඩක් බලසම්පන්නයි. ලොකුම ලොකු උවමනාවකදි ඇරෙන්න මේවා ගන්නෙපා."

"ලොකුම ලොකු උවමනාවක්ද කියලා මම දැනගන්නෙ කොහොම ද?"

"මාව විශ්වාස කරන්න, ඒ වෙලාවට ඔයා දැනගනී. අත්‍යවශ්‍ය විටමින් වර්ග නමයක්, ඛනිජ වර්ග, ඇමයිනෝ අම්ල... ඔහ්, ඔයාට ආපහු ඔයාම වෙන්න උවමනා හැමදේම තියෙනවා."

එයා බෝතලය මට දැමුවා.

"ම්... ස්තූතියි," මම කිවුවා. "ඒත්, හර්මීස් උතුමාණෙනි, ඔබතුමා මට උදවු කරන්නේ ඇයි?"

එයා දුකෙන් පිරුණු හිනාවක් පෑවා. "බාගදා, මේ ගවේෂණයෙන් ඔයාට ගොඩක් අයව ගලවගන්න පුළුවන් කියලා මම බලාපොරොත්තු වෙන නිසා වෙන්නැති, පර්සි. ඔයාගේ යාළුවා ග්‍රෝවර්ව විතරක් නෙවෙයි."

මම එයා දිහා බලාගෙන හිටියා. "ඔයා කියන්නේ... ලූක් ගැන නෙවෙයි නේ?"

හර්මීස් එයට උත්තර දුන්නේ නැහැ.

"බලන්න," මම කිවුවා. "හර්මීස් උතුමාණෙනි, මම කියන්නේ, මේ හැමදේටම ස්තූතියි. ඒත් ඔයා මේවා ආපහු ගත්තොත් හොඳයි. ලූක්ව ගලවගන්න බැහැ. මට එයාව හොයාගන්න පුළුවන් වුණත්... එයා මට කිවුවේ ඔලිම්පස් ගලෙන් ගලට ගලවලා විනාශ කරන්න එයාට ඕනෑ කියලා. එයා දන්න කියන හැමෝටම ද්‍රෝහී වුණා. විශේෂයෙන්ම ඔයාට එයා වෛර කරනවා."

හර්මීස් තරු දෙස බලා සිටියා. "මගේ ආදරණීය පුංචි මස්සිනේ, ගෙවුණු යුග ගාණ පුරාවට මම ඉගෙන ගත්ත දෙයක් තියෙනවා නම්, ඒ ඔයාට; ඔයාගේ පවුල අත හරින්න බැහැ කියන එක. ඔයාට එහෙම කරන්නම හිතෙන තැනට එයාලා වැඩ කළත් ඔයාට එයාලව අත අරින්න බැහැ. එයාලා ඔයාට වෛර කළත්, ඔයාව අපහසුවට පත්

කළත්, අඩු තරමේ අන්තර්ජාලය නිර්මාණය කරපු බුද්ධිමතා වෙලත් එයාලා ඔයාව අගය නොකළත් ඒක එහෙමයි."

"අන්තර්ජාලය නිර්මාණය කළේ ඔයා?"

"ඒක මගේ අදහසක්," මාර්තා කිව්වා.

"මීයෝ හරිම රසවත්," ජෝර්ජ් කිව්වා.

"ඒ අදහස මගේ!" හර්මීස් කිව්වා. "මං කිව්වේ අන්තර්ජාලේ, මීයෝ නෙවෙයි. ඒත් ප්‍රධාන කාරණේ ඒක නෙවෙයි, පර්සි, පවුල ගැන මම කියන දේ ඔයාට තේරෙනව ද?"

"මට හරියටම විශ්වාස නැහැ."

"කවදාහරි ඔයා තේරුම් ගනීවි." නැගී සිටි හර්මීස් කකුල්වල වැලි පිස දැමුවා. "ඒ අතර කාලයේදී, මම යන්න ඕනෑ."

"ඔයාට ආපහු ගන්න කෝල් හැටක් තියෙනවා," මාර්තා කිව්වා.

"තව, ඊ-මේල් එක්දාස් තිස් අටකුත් තියෙනවා," ජෝර්ජ් එකතු කළා. ඇම්බ්‍රෝසියාවලට අන්තර්ජාල වට්ටම් දෙනවා කියන ඊ-මේල් ටික අතැරලා.

"එතකොට ඔයාට, පර්සි," හර්මීස් කිව්වා. "ගවේෂණය සම්පූර්ණ කරන්න තියෙන්නේ ඔයා හිතනවාටත් වඩා අඩු කාලයක්. ඔයාගේ යාළුවෝ දන්... එනවා ඇති."

මගේ නම කියමින් ඇනබෙත් කතා කරන හඬ වැලිපර දෙසින් ඇසුණා. ඊට ටිකක් ඈතින් ටයිසනුත් කතා කරනවා ඇසුණා.

"මං හිතන්නේ ඔයාලට උවමනා විදිහට මම ගමන් මලු ඇහිරුවා," හර්මීස් කිව්වා. "ගමන් ගිහිල්ලා මට ටිකක් අද්දැකීම් තියෙනවා නේ." එයා අසුරක් ගසද්දී කහ පාට කැන්වස් ගමන් මලු තුනක් මගේ පාමුල මතුවුණා. "ඇත්තටම මේවා වතුර නොයන ඒවා. හරි විදිහට ඇහුවොත්, ඔයාගේ තාත්තා ඔයාට නැවට යන්න උදව් නොකර ඉන්නේ නැති වෙයි."

"නැව?"

හර්මීස් ඇඟිල්ලක් දිගු කළා. කිව්වත් වගේම, ලොකු සංචාරක නැවක් ලෝන්ග් අයිලන්ඩ් මුහුද දෙබෑ කරගෙන ගමන් කරමින් තිබුණා. එහි සුදු සහ රන් පාට විදුලි එළි අඳුරු වතුරට එපිටින් දිලිසුණා.



"ඉන්න," මම කිව්වා. "මට මේ මොනවත් තේරෙන්නෙ නැහැ. මම නාම ගමන යන්න කැමති වුණේවත් නැහැ!"

"මම ඔයා වුණා නම්, ඊළඟ විනාඩි පහ ඇතුළත ගමන යන්න හිත හදාගන්නවා," හර්මීස් උපදෙස් දුන්නා. "ඒ වෙලාවට තමයි ඔයාව කන්න හාර්පිලා එන්නේ. එහෙනම්, සුබ රාත්‍රියක්, මස්සිනා. තව, කිව්වට කමක් නැද්ද මන්දා? දෙවිවරු ඔයාව ආරක්ෂා කරන්වා."

එයා අත්ල දිග අරිද්දි කැඩූසියස් එක එයට ඇදී ගියා.

"සුබ පැතුම්," මාර්තා කිව්වා.

"එනකොට මට මීයෙක් ගේන්න," ජෝර්ජ් කිව්වා.

ආපසු ජංගම දුරකථනයකට හැරුණු කැඩූසියස් එක හර්මීස් සාක්කුවට දමාගත්තා. වැල්ල දිගේ දිවගිය එයා පියවර විස්සකට පසු දිලිසී චුත වුණේ උණු වතුර බෝතලයත්, හපලා කන විටමින් බෝතලයත්, කොහෙත්ම ගන්න බැරි තීරණයක් ගන්න විනාඩි පහකුත් මට ඉතිරි කරමින්.

08

# අපි ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැවට ගොඩවුණා

මම රළ දෙස බලා ඉන්න අතරේ ඇනබෙත් සහ ටයිසන් මාව හොයාගෙන ආවා.

"මොනවද වුණේ?" ඇනබෙත් ඇසුවා. "ඔයා උදව් ඉල්ලල කෑගහනවා මට ඇහුණා!"

"මටත් ඇහුණා!" ටයිසන් කිවුවා. "'නරක එවුන් කරදර කරනවා' කියලා ඔයා කෑගැහුවා."

"මම ඔයාලට කතා කළේ නැහැ," මම කිවුවා. "මම හොඳින්."

"එතකොට කවුද..." කහ පාට ගමන් මලු තුනත්, මගේ අතේ තිබුණු උණු වතුර බෝතලය සහ විටමින් බෝතලයත් ඇනබෙත් දැක්කේ එවිටයි. "මොනව ද- "

"අහන්න," මම කිවුවා. "අපිට වැඩි වෙලාවක් නැහැ." හර්මීස් මාත් අතර ඇතිවූ කතාබහ මම එයාලට විස්තර කළා. ඒක අවසන් වෙද්දීම වගේ යටිගිරියෙන් කෑගසන හඬවල් ඈතින් ඇසෙන්න ගත්තා. මුර සංචාරයේ යෙදෙන හාර්පිලාට අපේ ඉව දැනිලා.

"පර්සි," ඇනබෙත් කිවුවා, "අපිට මේ ගවේෂණය කරන්නම වෙනවා."

"අපිව මෙහෙත් පන්නලා දායි. ඔයා දන්නවනේ, මම පිටුවහල් වීමේ විශේෂඥයෙක්."



"ඉතින්? අපිට මේක කරන්න බැරිවුණොත් ආපහු එන්න කඳවුරක් ඉතුරු වෙන්නෙ නැති වෙයි."

"ඔව්. ඒත් ඔයා කයිරොන්ට පොරොන්දු වුණා-"

"මම පොරොන්දු වුණේ ඔයාව අනතුරුවලින් ආරක්ෂා කරනවා කියලා. මට ඒක කරන්න පුළුවන් වෙන්නේ ඔයත් එක්ක මේ ගමන ආවොත් විතරයි! ටයිසන්ට පුළුවන් නතර වෙලා එයාලට කියන්න-"

"මටත් එන්න ඕනෑ," ටයිසන් කිවුවා.

"නෑ!" ඇනබෙත්ගේ හඬ භීතියෙන් පිරිලා. "මං කියන්නේ... පර්සි, බලන්නකෝ. ඒක කරන්න බැරි වැඩක් කියලා ඔයාම දන්නවනේ."

එයාට සයික්ලොප්ස්ලා එක්ක ඒ තරම් එදිරිවාදිකමක් ඇත්තේ ඇයි හිතලා මම ආයෙත් පුදුම වුණා. එතැන එයා මට නොකියන මොකක් හෝ තිබුණා.

උත්තරයක් බලාපොරොත්තුවෙන් එයාලා දෙන්නම මගේ දිහා බලන් හිටියා. ඒ අතරේ සංචාරක නැව ටිකෙන් ටික ඈතට ඇදුණා.

ඇත්තම කියනවා නම්, මගේ කොටසකටත් ටයිසන්ව ගෙනයන්න උවමනා වුණේ නැහැ. අනෙක් කඳවුරුකරුවන්ගේ සරදම්වලට ලක්වෙමින්, දවසකට මිලියන වතාවක් විතර ලැජ්ජාවට පත්වෙමින්, මේ කොල්ලා එක්ක දවස් තුනක් මම එක තැන ජීවත් වුණා. ඒ හැම මොහොතකම එයයි මමයි නෑයෝ බව මට නැවත නැවතත් සිහිපත් වුණා. ඒවායින් මට ඉස්පාසුවක් ඕනෑ වුණා. ඇරත්, එයාගෙන් මොන වගේ උදව්වක් ලැබෙයි ද, නැත්නම් එයාව කොහොම පරිස්සම් කරන්න ද කියලවත් මම දැන සිටියේ නැහැ. එයා ශක්තිමත් බව ඇත්ත වුණත්, සයික්ලොප්ස්ලා අනුව බලද්දී එයා තවම පොඩි ළමයෙක් විතරයි. සමහරවිට, මානසික මට්ටමෙන් අවුරුදු හතක හෝ අටක ළමයෙක් වගෙයි. අපි හොර රහසේ රාක්ෂයෙක් පසුකර යන්න හදද්දී එයා බයවෙලා අඬන්න පටන් ගන්නවා මට මැවිලා පෙනුණා. එයා නිසා අපි හැමෝටම මැරෙන්න වේවි.

අනෙක් අතට බලද්දී, හාර්පිලා ළඟ ළඟම එන හඬ ඇසුණා...

"අපිට එයාව දාලා යන්න බැහැ," මම තීරණයක් ගත්තා. "අපි ගියාට ටන්ටලස් එයාට දඬුවම් කරයි."

"පර්සි," ඇනබෙත් බය නොවී ඉන්න උත්සාහ කරමින් කතා කළා, "අපි යන්න හදන්නේ පොලිෆීමස්ගේ දූපතට! පොලිෆීමස් කියන්නේ සි-ක්... සයි-ක්..." එයා කේන්තියෙන් කකුල් පොළොවේ ගැසුවා. කොයි තරම් දක්ෂ කෙනෙක් වුණත් ඇනබෙත්ටත් වචන අන්ධතාවය තිබුණා. එයා සයික්ලොප්ස් කියලා කියනකල් මුළු රෑම එතැනට වෙලා ඉන්නයි අපිට සිද්ධ වෙන්නේ. "මං කියන දේ ඔයා දන්නවනේ!"

"ටයිසන්ට එන්න පුළුවන්," මම ස්ථිර ලෙසින් කිවුවා, "එයා එන්න කැමති නම්."

ටයිසන් අත්පුඩියක් ගැසුවා. "මම කැමතියි!"

ඇනබෙත් මට යක්ෂ බැල්මක් හෙළුවත්, මගේ හිත වෙනස් කරන්න බැරි බව එයා තේරුම් ගන්න ඇති. එහෙමත් නැත්නම්, අපිට වාද කරකර ඉන්න වෙලාවක් නැති බව එයා දැනගෙන ඉන්න ඇති.

"හරි එහෙනම්," එයා කිවුවා. "අපි කොහොමද අර නැවට යන්නේ?"

"හර්මීස් කිවුවා මගේ තාත්තා උදවු කරයි කියලා."

"එහෙනම් ඉතින්, පාසි මොළේ? ඔයා මොනවට ද බලාගෙන ඉන්නේ?"

මගේ තාත්තාට කතා කරන එක- නැත්නම් ඔයා කියන විදිහට යාඥා කරන එක මට නිතරම අපහසු දෙයක් වුණා. ඒ කොහොම වුණත් මම රැල්ලට අඩිය තැබුවා.

"අ...ර්...ම්, තාත්තේ?" මම කතා කළා. "ඉතින් කොහොම ද?"

"පර්සි!" ඇනබෙත් කෙඳිරුවා. "අපිට පරක්කු වෙනවා!"

"අපිට ඔයාගේ උදවු ඕනෑ," මම හඬ ටිකක් වැඩි කර කතා කළා. "අපිව කාලා දාන්න කලින් අර නැවට යන්න ඕනෑ, ඉතින්..."

මුලදී කිසිවක් සිදුවුණේ නැහැ. සාමාන්‍ය ලෙසම පෙරළී ආ රළ ගෙඩි වෙරළේ හැපෙද්දී හාර්පිලාගේ හඬ වැලිපර අසලින්ම වගේ ඇසුණා. ටිකකින්, යාර සියයක් විතර ඈත මුහුදේ සුදු පාට ඉරි තුනක් මතු වුණා. තිය පහුරුවලින් මුහුද මතුපිට සූරනවා වගේ ඒවා වේගයෙන් වෙරළ දෙසට ඇදී ආවා. ඒවා වෙරළට ළං වෙද්දී සුදු අශ්වයින් තුන්දෙනෙක් රළ බිඳගෙන ඉහළට මතු වුණා.



ටයිසන් හීල්ලුවා. "මාළු පෝනියෝ!"

එයා කිවුවා හරි. ඒ සතුන් වැල්ලට ඇදෙද්දි, අශ්ව ස්වරූපය ගත්තේ උන්ගේ ඉදිරි කය පමණක් බව මට දකින්න ලැබුණා; දිලිසෙන කොරපොතුත්, දේදුනු පාට වරලුත් ඇති රිදී පාට මාළු කඳන් ඒට පිටුපසින් තිබුණා.

"හිපොකැම්පිලා!" ඇනබෙත් කිවුවා. "එයාලා ලස්සනයි නේ." ළඟින්ම සිටි සතා ඒ කතාව අගය කරමින් හේෂාරාවය කර, ඇනබෙත්ගේ ඇගේ නාසය පිරිමැද්දා.

"එයාලගේ ලස්සන පස්සෙ බලන්න බැරියෑ," මම කිවුවා. "ඉක්මන් කරන්න!"

"අන්න!" අපිට පිටුපසින් කටහඬක් මොරගැසුවා. "කැබින්වලින් එළියට ආව නරක ළමයි! වාසනාවන්ත හාර්පිලාට කටගැස්මක්!"

පුංචි මුහුණු, තිය පහුරු සහ ඇඟට වඩා ගොඩාක් පොඩි පියාපත් ඇති කොට, මහත මැහැලියෝ පස්දෙනෙක් වැලිපරවලට ඉහළින් තටු සලමින් සිටියා. දෙවිවරුන්ට ස්තුති වෙන්න, එයාලා එතරම් වේගවත් වුණේ නැහැ, ඒත් බැරිවෙලාවත් එයාලට ඔයාව අහුවුණෝතින් නම් බේරෙනවා බොරු.

"ටයිසන්!" මම කතා කළා. "කැන්වස් මල්ලක් ගන්න!"

එයා තවමත් කට ඇරගෙන හිපොකැම්පිලා දෙස බලා සිටියා, "ටයිසන්!"

"ඈහ්?"

"ඉක්මනට!"

ඇනබෙත්ගේ උදවු ඇතිව මම එයාව ඇදගෙන ගියා. ගමන් මලු එකතු කරගත් අපි, අපේ අශ්වයෝ පිටට නැග්ගා. ටයිසනුත් ගමනට එකතු වෙන බව පොසෙයිඩන් දැනගෙන ඉන්න ඇති, මොකද එක හිපොකැම්පියෙක් අනෙක් දෙන්නට වඩා ගොඩක් ලොකුයි- සයික්ලොප්ස් කෙනෙක්ව ගෙන යා හැකි තරම් ලොකුයි.

"යමං පුතා!", මම අණ කළා. මගේ හිපොකැම්පියා ආපසු හැරී රළ අතරට පැන්නා. ඇනබෙත්ගේ සහ ටයිසන්ගේ අශ්වයිනුත් ඊට පිටුපසින් ආවා.

Scanned with CamScanner

නැතිවූ කටගැස්මට අඩගසමින් හාර්පිලා අපිට ශාප කළා. ඒත් අපේ හිපොකැම්පිලා ජෙට් බෝට්ටුවක වේගයෙන් රළ දෙබෑ කරගෙන නොනැවතී ඇදුණා. ඉක්මනින්ම අර්ධ-ලෝහිත කඳවුරු වෙරළ බොඳ වූ පැල්ලමක් පමණක් වෙද්දී, ආයේ කවදාවත් මට ඒක දකින්න ලැබේවිද හිතලා මම පුදුම වුණා. ඒත් ඒ වෙලාවේ මට තිබුණු ලොකුම ප්‍රශ්නය ඒක නෙවෙයි.

දැන් සංචාරක නැව අපිට ඉදිරියෙන් ටිකෙන් ටික විශාල වෙමින් පෙනුණා- ඒක යාත්‍රා කරමින් තිබුණේ ෆ්ලොරිඩාවත් රාක්ෂ සයුරත් අතරයි.

හිපොකැම්පසයෙක් පදවාගෙන යෑම පෙගසස් කෙනෙක් පදිනවාටත් වඩා ලේසි වැඩක්. මුහුදු සුළඟ අපේ මුහුණුවල හැපෙද්දී අපි රළ අතරින් කොයි තරම් සුමටව සහ නොසැලී ගියාද කියනවා නම්, මට අල්ලාගෙන ඉන්න උවමනා වුණේම නැති තරම්.

සංචාරක නැව කොයි තරම් විශාල ද කියලා තේරුණේ අපි එයට ළං වෙද්දියි. මට දැනුණේ මම මැන්හැටන්වල ගොඩනැගිල්ලක් දිහා බලන් ඉන්නවා වගෙයි. අඩු තරමේ තට්ටු දහයක්වත් උස් වූ සුදු පාට නැව් කඳට ඉහළින් දිප්තිමත් එළි දැල්වෙන සඳලුතල සහ කවුළු ඇති තවත් මහල් දුසිමක් විතර දකින්න ලැබුණා. නැව් ඇණියට ඉහළින්, කළු පාටින් පින්තාරු කළ නැවේ නම පිරික්සුම් පහනකින් ආලෝකමත් කර තිබුණා. එය කියවා තේරුම් ගන්න මට තත්පර කිහිපයක් ගියා: ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා.

සුදු පාට ග්‍රීක කයිටොනයකින් (ග්‍රීක මෝස්තරයේ සරල ගවුමක්) සැරසුණු කාන්තාවකගේ තට්ටු තුනක් උස ප්‍රතිමාවක් නැව් ඇණියට අමුණා තිබුණා. එයාව නෙලා තිබුණේ නැවේ ඉදිරි කොටසේ දම්වැල්වලින් බැඳ දමලා වගේ පේන්නයි. ලස්සන තරුණියක් වූ එයාට කඩා හැලෙන කළු කෙස් කළඹක් තිබුණා. ඒත් එයාගේ මූණෙන් පළ වුණේ නම් මුළුමනින්ම භීතිය විතරයි. තමන්ගේ සංචාරක නැව ඉදිරිපස බෙරිහන් දෙන කුමාරිකාවක් තියාගෙන යන්න උවමනා කාට ද, මට නම් හිතාගන්නවත් බැරි වුණා. මට ඇන්ඩ්‍රොමීඩාගේ කතන්දරේ මතක් වුණා: එයාගේම දෙමව්පියෝ එයාව දම්වැල්වලින් ගලක ගැට ගහලා, මුහුදු රාක්ෂයෙකුට බිලි දුන්නා. සමහරවිට, එයාගේ ප්‍රගති වාර්තාව එෆ් ගොඩකින් පිරිලා තියෙන්නවත් ඇති. කොහොමහරි, මගේ නමම තිබුණු පර්සියස් කියන වීරයා වෙලාවට ඇවිත්, මෙඩූසාගේ ඔළුවෙන් මුහුදු රාක්ෂයාව ගල් කරලා, කුමාරිකාව බේරගත්තා.



ඒ පර්සියස් හැමදේකින්ම ජයග්‍රහණය කළා. අන්න ඒ නිසයි එයා සියුස්ගේ පුතෙක් වෙලා, මම පොසෙයිඩන්ගේ පුතෙක් වුණත්, මගේ අම්මා මටත් එයාගෙ නම ම දාලා තියෙන්නේ. පළවෙනි පර්සියස් කියන්නේ සතුටුදායක අවසානයක් ලැබුණු ග්‍රීක වීරයෝ දෙතුන් දෙනාගෙන් කෙනෙක්. අනෙක් හැමෝම මැරිලා, ද්‍රෝහිවෙලා, තැළිලා පොඩිවෙලා, අබ්බගාත වෙලා, වස කැවිලා, නැත්නම් දෙවියන්ගේ ශාපයකට හසුවෙලා. ඒ පර්සියස්ගේ වාසනාව මටත් උරුම වෙයි කියලා මගේ අම්මා බලාපොරොත්තු වෙන්න ඇති. මගේ ජීවිතය දැනට ගතවෙමින් තිබුණු විදිහ බලද්දී, මම නම් එච්චර සර්වශුභවාදී වුණේ නැහැ.

"අපි කොහොමද නැවට නගින්නේ?" රළ ගසන ඝෝෂාවට ඉහළින් ඇනබෙත් කෑගසා ඇසුවත්, අපිට අවශ්‍ය දේ හිපොකැම්පිලා දැන සිටියා වගෙයි. නැවේ දකුණු පස බඳ අසලින් වේගයෙන් ඉදිරියට ඇදුණු එයාලා, නැව් බඳට සවිකර තිබූ සේවා ඉණිමගක් ළඟ නැවතුණා.

"ඔයා ඉස්සෙල්ලම," මම ඇනබෙත්ට කිවුවා.

කැන්වස් මල්ල උරහිසක එල්ලා ගත් එයා යටම ඉණි පෙත්ත අල්ලගත්තා. එයා ඉණිමගට ගොඩවුණාම, එයාගේ හිපොකැම්පියා හේෂාරාවයකින් සමුදීලා වතුර යටට කිමිදුණා. ඇනබෙත් උඩට නගින්න පටන් ගත්තා. එයා ඉණි පෙති කීපයක් නගින තුරු ඉඳලා මමත් එයාව අනුගමනය කළා. අන්තිමේදී, වතුරේ ඉතුරු වුණේ ටයිසන් විතරයි. එයාගේ හිපොකැම්පියා උඩු කරණම්, පසු කරණම් ගසමින් ශිල්ප දක්වමින් සිටියා. ඒවාට ටයිසන් පිස්සුවෙන් වගේ හිනාවෙද්දී, එයාගේ හඬ නැව් බඳේ වැදී දෝංකාර දුන්නා.

"ටයිසන්, ෂ්... ෂ්...!" මම කිවුවා. "ඉක්මනට එන්න, ලොකු යාළුවා!"

"අපිට 'රේන්බෝ'වත් අරන් යන්න බැරි ද?" එයා මූණ කළු කරගෙන ඇහුවා.

මම එයා දිහා පුදුමයෙන් බලා සිටියා. "රේන්බෝ?"

අලුත් නමට කැමති බව අඟවන්න වගේ හිපොකැම්පියා හේෂාරාවය කළා.

"ම්, අපි දැන් යන්න ඕනෑ," මම කිවුවා. "රේන්බෝ... මෙහෙමයි, එයාට ඉණිමගේ නගින්න බෑනේ." ටයිසන් නහය ඉහළට

අදිමින් හිපොකැම්පියාගේ කේශර තුළ මුහුණ සඟවාගත්තා. "මට ඔයා නැතුව පාළු හිතෙයි, රේන්බෝ!" හිපොකැම්පියා නැගූ හේෂාරාවය මට ඇසුණේ හැඩුමක් වගේමයි.

"අපිට ආයෙ වෙලාවක එයාව බලන්න පුළුවන් වෙයි," මම යෝජනා කළා.

"අනේ, එහෙනම්," ටයිසන් උඩ පනිමින් කිවුවා. "හෙට!"

මම කිසිවක් පොරොන්දු වුණේ නැතත්, අන්තිමේදී හිපොකැම්පියාට සමුදීලා, ඉණිමගට නගින්න ටයිසන්ව පොලඹවා ගන්න මට පුළුවන් වුණා. තවත් දුක්බර හේෂාරාවයක් එක්ක පසුපසට පැන්න හිපොකැම්පියා මුහුද තුළට කිමිදුණා.

ඉණිමග යොමුවී තිබුණේ කහ පාට ජීවිතාරක්ෂක බෝට්ටු ගොඩ ගැසූ නඩත්තු කටයුතු සඳහා වෙන් වූ නැව් තට්ටුවකටයි. එහි අගුළු දැමූ පළු දෙකේ දොරක් තිබුණා. කිණිස්සෙනුත්, පෞරාණික ග්‍රීක භාෂාවෙන් කළ දෙස් දෙවොල් තැබීම් මාලාවකිනුත් එය බලෙන් විවර කරගන්න ඇනබෙත්ට හැකි වුණා.

මම සිතා සිටියේ අපිට හැංගෙමින්, හොර රහසේ යන්න වෙයි කියලයි. ඒත් කොරිඩෝ කීපයක් සෝදිසි කරමින් ගොස්, වසා දැමූ කඩ සාප්පු ඇති මැද මළුවකට එබිකම් කළ පසු මට අවබෝධ වෙන්න ගත්තේ එතැන සැඟවීමට කිසිවෙක් නැති බවයි. මං අදහස් කළේ, රෑ මැද වුණත්, නැව හරහා බාගයක් දුර ගමන් කළ අපිට කිසිවෙක් මුණගැසුණේ නැහැ. කැබින් දොරවල් හතලිහක් හෝ පනහක් විතර පසු කරමින් ආවත් ඒවා එකකින්වත් කිසිම හඬක් නැඟුණෙත් නැහැ.

"මේක හොල්මන් නැවක්," මම මිමිණුවා.

"නෑ," කැන්වස් බෑගයේ පටියක් අඹරමින් ටයිසන් කිවුවා. "නරක ගඳයි." ඇනබෙත් රැව්වා. "මට කිසිම ගඳක් දැනෙන්නේ නැනේ."

"සයික්ලොප්ස්ලත් සැටර්ලා වගේ," මම කිවුවා. "එයාලට රාක්ෂයින්ගේ ගඳ දැනෙනවා. එහෙම නේද, ටයිසන්?" එයා බයෙන් ඔළුව වැනුවා. දැන් අපි අර්ධ-ලෝහිත කදවුරෙන් පිටවී සිටි නිසා, එයාගේ මුහුණ ආයෙමත් මීදුමෙන් ආවරණය වෙලා. මම තදින්ම හිත එකඟ කරගෙන බැලුවේ නැත්නම්, එයාට එක ඇසක් වෙනුවට ඇස් දෙකක් තියෙනවා වගෙයි පෙනුණේ.



"හරි," ඇනබෙත් කිවුවා. "ඇත්තටම ඔයාට මොන වගේ ගඳක් ද දැනෙන්නේ?"

"මොකක් හරි නරක දෙයක්," ටයිසන් උත්තර දුන්නා.

"නියමයි," ඇනබෙත් අවලාද නැඟුවා. "ඒකෙන් ඔක්කොම පැහැදිලි වුණා." අපි නාන තටාක ඇති තට්ටුවේ පිටතට ආවා. එතැන හිස් අකුළන පුටු පේළියකුත්, දම්වැල් තිරයකින් වසා දැමූ බීමහලකුත් තිබුණා. නැව් ගමනට සමාන්තරව ඉදිරියටත් පසුපසටත් කැලතුණු තටාකයේ වතුර බිය උපදවන ලෙස දිලිසුණා. අපිට ඉහළින්, නැවේ පෙර පසු භාගයන්වල තවත් තට්ටු දකින්න ලැබුණා- විනෝදයට නගින බිත්තියක්, ගොල්ෆ් පිටියක්, කැරකෙන ආපන ශාලාවක්, ඒත් ජීවයක කිසිම ලකුණක් නැහැ.

ඒ වුණත්... මට මොකක්දෝ හුරුපුරුදු දෙයක් දැනුණා. මොකක්හෝ අනතුරුදායක දෙයක්. මම මහන්සියෙන් හෙම්බත්වෙලා නොසිටියා නම්, ඒක මොකක්ද, සිහිපත් කරගන්න තිබුණා කියලා මට හිතුණා.

"අපිට හැංගෙන්න තැනක් ඕනෑ," මම කිවුවා. "නිදාගන්න තරම් පරිස්සම් තැනක්."

"නිදාගන්න." ඇනබෙත් විඩාබරව එකඟ වුණා.

තවත් කොරිඩෝ කීපයක් විපරම් කරමින් ගිය අපිට නමවෙනි තට්ටුවේ වූ හිස් කාමර කට්ටලයක් සොයාගන්න ලැබුණා. එහි දොර ඇර දමා තිබීම නම් අමුතු දෙයක් වගෙයි මට හිතුණේ. එහි මේසයක් උඩ චොකලට් ජාති පිරවූ කූඩයකුත්, ඇඳ අසල දිප්තිමත් සයිඩර් බෝතලයකුත්, කොට්ටය මත අතින් ලියූ තුණ්ඩුවකුත් තිබුණා: ඔබේ චාරිකාව විනෝදයෙන් ගත කරන්න!

පළමු වතාවට කැන්වස් මලු ඇර බැලූ අපිට දකින්න ලැබුණේ හර්මීස් ඇත්තටම හැම දෙයක් ගැනම කල්පනා කර ඇති බවයි- අමතර ඇඳුම්, සනීපාරක්ෂක ද්‍රව්‍ය, කඳවුරු සලාක කෑම, වතුර නොයන මල්ලක් පිරවූ සල්ලි, රන් ඩ්‍රැච්මා පිරවූ ලෙදර් මල්ලක්. අඩු තරමේ, ටයිසන්ගේ ඉටි රෙද්දක එතූ ආම්පන්න කට්ටලය සහ ඇනබෙත්ගේ අදෘශ්‍යමාන වන කැප් එක පවා මල්ලට දාන්න එයා අමතක කරලා නැහැ. එයින් ඒ දෙන්නගෙම හිත් සැනසුණා.

Scanned with CamScanner

"මම අතිත් කාමරේ ඉන්නම්," ඇනබෙත් කිවුවා. "ඔයාලා දෙන්නා මුකුත් කන්න බොන්න එහෙම එපා."

"ඔයා හිතන්නේ මේක වයි කරපු තැනක් කියල ද?"

එයා ඇහිබැම් අකුළා ගත්තා. "මං දන්නෑ. මොකක්දෝ වැරැද්දක් තියෙනවා. කොහොමත්... පරිස්සමින් ඉන්න." අපි, අපේ දොරවල් අගුළු දමාගත්තා.

ටයිසන් කට්ටිලිය උඩට ඇද වැටුණා. විනාඩි කීපයක් ගතවන තුරු ලෝහ අත්කමේ- මට තවමත් පෙන්වා නැති- වැඩ කළ එයා ඉක්මනින්ම ඇනුම් අරින්න වුණා. ඉටි රෙද්ද ඔතා තැබූ එයා නින්දට වැටුණා.

ඇඳේ වැතිරුණු මම නැව් කවුළුවෙන් එපිට බලා සිටියා. කොරිඩෝව දෙසින් කටහඬවල් ඇසුණා වගේ මට හිතුණා, හරියට කෙඳිරුම් හඬවල් වගෙයි. ඒක වෙන්න බැරි බව මම දැන සිටියා. මේ නැව පුරා ඇවිද්දත් අපිට කාවවත් දකින්න ලැබුණේ නැහැ. ඒත් ඒ හඬවල් මාව අවදියෙන් තැබුවා. ඒවා මම පාතාලයට ගිය ගමන සිහිපත් කළා- මළගිය ආත්ම පාවී යද්දි ඇසුණෙත් ඒ වගේ හඬවල්මයි.

අන්තිමේදී මගේ මහන්සිය ජයගත්තා. මම නින්දට වැටුණා... ඒත් එක්කම, මේ තරම් දවසකට මගේ නරකම හීනය මට දකින්න ලැබුණා. අපරිමාණ ආවාටයක් අද්දර වූ ගුහාවක් තුළ මම හිටගෙන හිටියා. මේ තැන මම ඕනෑවටත් වඩා හොඳින් දන්නවා. ඒ ටාටරස්වල ඇතුළුවීමේ දොරටුව. ඒ වගේම, පහළ ගැඹුර තුළින් දෝංකාර දුන් කෲර හිනාවත් මම හඳුනාගත්තා. මේ පුංචි වීරයා නේ. පිහි තලයක් ගලක අතුල්ලනවා වගේ හඬක් කිවුවා. තවත් ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයකට යනවා.

මට, මගේ පාඩුවේ ඉන්න දෙනවා, කියලා ක්‍රෝනොස්ට කෑගහන්න මට ඕනෑ වුණා. රිප්ටයිඩ් ඇදලා අරන් එයාට පහර දෙන්න මට ඕනෑ වුණා. ඒත් මට හෙලවෙන්නවත් බැරිවුණා. එහෙම පුළුවන් වුණත්, දැනටමත් විනාශ කළ- කෑලිවලට කපලා සදාකාලික අන්ධකාරය තුළට විසිකළ දෙයක් මම ආයෙමත් මරන්නෙ කොහොම ද?

මට නුඹව නවත්තන්න දෙන්න එපා, ටයිටන් කිවුවා. බාගදා මේ වතාවේ නුඹ පැරදුණාම, දෙවිවරුන්ට දාසකම් කරන එක ප්‍රයෝජනවත්ද කියලා නුඹම පුදුම වෙයි. පහුගිය දවස්වල නුඹේ තාත්තා, එයාගේ අගය කිරීම කොච්චර හොඳට පෙන්නුව ද?



එයාගේ හිනාවෙන් ගුහාව පිරී යද්දි, හදිසියේම දර්ශනය වෙනස් වුණා.

ඒ වෙනත් ගුහාවක්- සයික්ලොප්ස්ගේ බෙනය තුළ වූ ග්‍රෝවර්ගේ හිර කුඩුව.

කිලුටු මංගල ගවුම හැඳගෙන රෙදි වියන යන්ත්‍රය ළඟ වාඩි වී සිටි ග්‍රෝවර්, අවසන් නොකළ මංගල සළුවේ නූල් පිස්සුවෙන් වගේ ලිහමින් සිටියා.

"චූටි පැටියෝ!" ගල් කුට්ටිය පිටුපසින් රාක්ෂයා මොරගැසුවා. තිගැස්සී කෑගැසූ ග්‍රෝවර් ආපසු නූල් එකට වියන්න පටන්ගත්තා.

ගල් කුට්ටිය පසෙකට තල්ලු වෙද්දි කාමරය දෙදුරුවා. දොරෙන් එබිකම් කළ සයික්ලොප්ස් එක්ක බලද්දි ටයිසන් අගුටුමිට්ටෙක් වගෙයි. එයාට කහ පාට කඩතොලු වූ දතුත්, මගේ ඇඟ තරම් ලොකු අතුත් තිබුණා. එයා හැඳ සිටි පාට මැකුණු දම් පාට ටී-ෂර්ට් එකේ 'ලෝක බැටළු ප්‍රදර්ශනය - 2001' මුද්‍රණය කර තිබුණා. එයා අඩු තරමේ අඩි පහළොවක්වත් උස් වෙන්න ඇති. ඒත් පුදුමාකාරම දේ වුණේ කැළැල් පිරුණු, කාවයේ සුදු බැඳුණු, එයාගේ කිරි පාට ඇසයි. එයා මුළුමනින්ම අන්ධ නැත්නම්, ඊට ගොඩාක් කිට්ටුව ඉන්න ඇති.

"ඔයා මොනවද කරන්නේ?" රාක්ෂයා තදින් ඇසුවා.

"මුකුත් නෑ!" ග්‍රෝවර් මවාගත් ගැහැනු හඬින් උත්තර දුන්නා. "ඔයාට පේනවත් වගේ, මගේ මංගල සළුව වියනවා."

අතක් ඉදිරියට දිගු කරගත් සයික්ලොප්ස් රෙදි වියන යන්ත්‍රය හසුවන තුරුම අත එහෙ මෙහෙ කළා. එයා රෙද්ද අතගා බැලුවා. ''ඒකෙ දිග වුට්ටක්වත් වැඩිවෙලා නැහැ!"

"ඔහ්, ම්... ඔව් ඒක දික්වෙලා තියෙන්නේ, වස්තුවේ. පේනව ද? මම තවත් අඟලක් විතර වියලා තියෙන්නේ."

"හොඳටම පරක්කුයි!" රාක්ෂයා ගර්ජනා කළා. ඊට පස්සේ එයා වාතය ඉව කළා. "ඔයා ළඟ හරි සුවඳයි! හරියට එළුවෙක් වගේ!"

"ඔහ්." ග්‍රෝවර් දියාරු මුකුළු හිනාවක් පෑවා. "ඔයා ඒකට කැමති ද? ඒක 'එයු ඩි චෙවර්.' මම ඒක ඔයා නිසාමයි ගාන්නේ."

"ම්...ම්...!" සයික්ලොප්ස් උල් දත් විලිස්සුවා. "කන්ඩ හිතෙනවා!"

"ඔහ්, ඔයා නම් හරිම මනමාලයෙක් තමයි!"

Scanned with CamScanner

"තවත් පරක්කු වෙන්ඩ නම් බැහැ!"

"ඒත් වස්තුවේ, මේ වැඩේ තවම ඉවර නැහැනේ!"

"හෙට!"

"බෑ, බෑ, තව දවස් දහයකින්."

"පහයි!"

"ඔන්, හොඳයි, ඔයා ඔච්චරටම කියනවා නම්, දවස් හතකින්."

"හතක් ඒක පහට වඩා අඩුයි, නේද?"

"ඇත්තටම, ඔව්."

ගනුදෙනුව ගැන තවමත් අසතුටෙන් රාක්ෂයා ගෙරෙව්වත්, එයා ග්‍රෝවර්ට වියන්න ඉඩ ඇරලා, ගල් කුට්ටිය ආපසු තිබුණු තැනටම තල්ලු කළා.

ඇස් දෙක වසාගත් ග්‍රෝවර් සැලෙන හුස්මක් ගනිමින් හිත සන්සුන් කරගන්න උත්සාහ කළා.

"ඉක්මන් කරන්න, පර්සි," එයා කෙඳිරුවා. "අනේ, අනේ, ඉක්මනට!"

* * * * * *

නැවේ නළා හඬටත්, අන්තර්-සන්නිවේදකය හරහා ඕස්ට්‍රේලියානු උරුවකින් කතා කළ කොල්ලෙකුගේ සතුටින් පිරුණු හඬටත් මම නින්දෙන් ඇහැරුණා.

"හැමෝටම සුබ උදෑසනක්! අදත් මුළු දවසම අපි ගත කරන්නේ මුහුදේ. අද තටාකය ළඟ මැම්බෝ සාදයක් පවත්වන්න කියාපු කාලගුණයක් තියෙනවා! අද පස්වරු එකට ක්‍රැකන් ශාලාවේ පවත්වන ඩොලර් මිලියනයේ ක්‍රීඩාවට සහභාගී වෙන්න අමතක කරන්න එපා. ඒ වගේම, අපේ විශේෂ අමුත්තන්ට, බඩවැල් ඇදීමේ පුහුණුවක් මැද ශාලාවේ සූදානම් කරලා තියෙනවා!"

මම ඇඳේ වාඩි වුණා. "මොකක්ද එයා කිවුවේ?"

තවමත් අඩ නින්දේ පසුවූ ටයිසන් කෙඳිරි ගෑවා. කවිච්චිය මත මුනින්තලාව සිටි එයාගේ කකුල් නාන කාමරය තුළටම දිගු වී තිබුණා. "ජොලි මිනිහා කිවුවේ... දූල් ඇදීමේ පුහුණුවක් කියලද කොහෙදෝ?" එයා හරි ඇති කියලා මම බලාපොරොත්තු වුණා.



ඒත් එනකොටම අපේ කාමරේ දොරට තඩිබාන සද්දයක් ඇහුණා. ඇනබෙත් ඇතුළට එබුණා- එයාගේ තඹ පාට කොණ්ඩේ මී කූඩුවක් වගේ වෙලා. ''බඩවැල් අදින පුහුණුවක්?"

ඇඳුම් හැඳගත්තාට පස්සේ, බයෙන් සැකෙන් කාමරෙන් පිටවුණ අපි පුදුම වුණේ අනෙක් මිනිස්සු දැකලයි. වයස්ගත උදවිය දුසිමක් විතර උදේ කෑමට යමින් සිටියා. තාත්තා කෙනෙක් දරුවන්ව උදෑසන පිහිනුම් සඳහා කැඳවාගෙන ගියා. රැළි වැටුණු සුදු නිල ඇඳුමෙන් සැරසුණු නාවිකයෝ නැව් තට්ටුව හරහා යන අතරේ ඉදිරියට හමුවන මගීන්ට තොප්පිය ඇල කරමින් ආචාර කළා.

ඒ කිසිවෙක් අපි කවුද කියලා ඇහුවේ නැහැ. කිසිවෙක් අපි ගැන අවධානයක් දැක්වූයෙත් නැහැ. ඒත් එතැන මොකක් හෝ වරදක් තිබුණා.

පිහිනීමට ගිය පවුලේ උදවිය අපිව පසුකරගෙන යද්දී, තාත්තා එයාගේ ළමයින්ට කතා කළා: "අපි ඉන්නේ විනෝද නැවක. අපි විනෝද වෙනවා."

"ඔව්," ළමයි තුන්දෙනා එකටම උත්තර දුන්නත්, එයාලගේ මුහුණුවලින් කිසිම හැඟීමක් පළ වුණේ නැහැ. "අපිට ගොඩක් සතුටුයි. අපි තටාකයේ පීනන්න යනවා."

එයාලා මංමුළාවෙලා වගේ ඇවිදගෙන ගියා.

"සුබ උදෑසනක්." නාවිකයෙක් අපිට කියද්දී, එයාගේ ඇස් වීදුරු වගේ දිලිසුණා. "ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැවේ අපි හැමෝම විනෝද වෙනවා. ඔයාලට සුබ දවසක්." එයා ඉවතට ඇදුණා.

"පර්සි, මේක නම් අමුතුයි," ඇනබෙත් කෙඳිරුවා. "එයාලා හැමෝම ඉන්නේ මෝහනයකට අහුවෙලා." ඒ වෙලාවේ භෝජනාගාරයක් පසු කරගෙන ගිය අපිට පළවෙනි රාක්ෂයාව දකින්න ලැබුණා. ඒ යම බල්ලෙක්- ඉදිරි ගාත් දෙක කෑම කවුළුව උඩ තබාගෙන සිටි කළු මස්ටිෆ් බල්ලා තැම්බූ බිත්තර පිඟානක හොම්බ ඔබාගෙන සිටියා. ඌ තවමත් පැටියෙක් වෙන්න ඇති, මොකද ඌ වැඩී සිටියේ වලහෙක් තරමට විතරයි.

ඒ වුණත්, ඌව දැකලා මගේ ඇඟේ ලේ වතුර වුණා. මීට කලිනුත් මම ඒ ජාතියේ එකෙක්ගෙන් මැරුම් කන්න ගියා. අමුතුම දේ වුණේ, කෑම කවුළුවේ යක්ෂ බල්ලා ළඟන්ම මැදි වයසේ යුවළක්

බිත්තර ගන්න තමන්ගේ වාරය එන තුරු ඉවසිල්ලෙන් බලා සිටීමයි. එයාලට නම් එතැන කිසිම අසාමාන්‍ය දෙයක් පෙනිලා නැහැ වගෙයි.

"මගේ බඩගින්නත් ගියා," ටයිසන් කෙඳිරුවා.

ඇනබෙත්ට හෝ මට එයට උත්තර දෙන්න ලැබෙන්න කලින්, කොරිඩෝවේ එහා කෙළවරෙන් සර්පයෙක් පිඹිනවා වගේ හඬක් ඇසුණා. "ඊ...යේ තවා...ත්..ස් හය දෙනෙක්..ස් එක...තු වුණා..."

ඇනබෙත් නොඉවසිල්ලෙන් ළඟම වූ සැඟවිය හැකි තැන පෙන්වූවා- කාන්තාවන්ගේ විවේකාගාරයක්- අපි තුන්දෙනාම ඒක ඇතුළට රිංගුවා. බය වැඩිකමට මට ලැජ්ජාවත් අමතක වුණා. මොකෙක් හරි- නැත්නම් මොක්කු හරි දෙන්නෙක්- බුමුතුරුණේ වැලි කඩදාසි අතුල්ලනවා වගේ හඬක් නගමින් නාන කාමරයේ දොර පසු කරමින් බඩ ගාගෙන ගියා.

"ඔව්..ස්." දෙවෙනි සර්ප හඬ කිවුවා. "එයා උන්ව ඇදගත්තා... ඉක්මනට අපි ශක්..ස්..තිමත් වෙයි." භෝජනාගාරය පසු කරමින් ඇදී ගිය උන් සර්ප හිනාවක් වියහැකි දුෂ්ට සූ.. හඬක් පිටකළා.

ඇනබෙත් මගේ දෙස බැලුවා. "අපි මෙතැනින් එළියට යන්න ඕනෑ."

"ඔයා හිතන්නේ මම ගෑනු අයගේ නාන කාමරේට වෙලා ඉන්න ආසයි කියලද?"

"මම කිවුවේ නැවෙන්, පර්සි! අපි මේ නැවෙන් පැන ගන්න ඕනෑ."

"තපුරු ගඳයි," ටයිසන් එකඟ වුණා. "ඒ මදිවට බල්ලෝ බිත්තර ඔක්කොම කනවා. ඇනබෙත් හරි. අපි ඉක්මනට මේ නාන කාමරෙනුයි, නැවෙනුයි එළියට යන්න ඕනෑ."

මාව වෙවුලුවා. ඇනබෙතුයි ටයිසනුයි ඇත්තටම දෙයකට එකඟ වෙනවා නම්, මමත් ඒකට ඇහුම්කන් දෙන එක හොඳයි කියලා මට හිතුණා.

ඒත් එක්කම මට පිටතින් තවත් කටහඬක් ඇහුණා- රාක්ෂ හඬවලටත් වඩා මාව හිරිවට්ටන හඬක්.

"- තව ටික කාලයයි. මට බල කරන්න එපා, ආග්‍රියස්!"



කිසිම සැකයක් නැහැ, ඒ ලූක්. එයාගේ හඬ මට කවදාවත් අමතක වෙන්නේ නැහැ.

"මං ඔයාට බල කරනවා නෙවෙයි!" තවත් කෙනෙක් ගෙරෙව්වා. ලූක්ගේ හඬටත් වඩා ගැඹුරු සහ තරහවෙන් පිරුණු හඬක් එයාට තිබුණා. "මං කියන්නේ, මේ සුදුවෙන් ලැබෙන දෙයක් නැ- "

"තියෙනවා," ලූක් කඩා පැන්නා. "එයාලා මේ ඇම ගිලියි. දැන්, එනවා, අපි මෙහෙයුම් කාර්යාලෙට ගිහින් මිනී පෙට්ටිය පරීක්ෂා කරලා බලන්න ඕනෑ."

එයාලාගේ හඬ කොරිඩෝවේ ඈතින් මැකී ගියා.

"දැන් යමුද?" ටයිසන් අඬන්න වගේ ඇහුවා.

නිහඬ එකඟතාවයකට එමින් ඇනබෙත් සහ මම බැල්මක් හුවමාරු කරගත්තා.

"අපිට යන්න බැහැ," මම ටයිසන්ට කිවුවා.

"ලූක් කරන්න යන්නෙ මොනවද කියලා අපිට හොයාගන්න වෙනවා," ඇනබෙත් එකඟ වුණා. "ඒ වගේම, පුළුවන්කමක් තිබුණොත් අපි එයාට ගහලා, දම්වැල්වලින් බැඳලා, ඔලිම්පස් කන්දට ඇදගෙන යනවා."

## 09

# මට අත්විඳින්න ලැබුණු නරකම නෑදෑ හමුව

අදෘශ්‍යමාන කැප් එක තියෙන නිසා තනියම යන්න ඇනබෙත් ඉදිරිපත් වුණත්, ඒක අවදානම් වැඩක් කියලා මම එයාට ඒත්තු ගැන්වූවා. එක්කෝ අපි ඔක්කොම එකට යන්න ඕනෑ, නැත්නම් කවුරුවත්ම යන්නෙ නැහැ.

"කවුරුවත්ම යන්නේ නැතුව ඉමුකෝ!" ටයිසන් ඡන්දය දුන්නා. "අනේ?"

ඒත් අන්තිමේදී, බයෙන් නියපොතු හපමින් එයත් අපිත් එක්ක ආවා. අපේ කැබිනය ළඟ නැවතුණු අපි, අපේ බඩු-මුට්ටු එකතු කරගත්තා. මොන දේ සිද්ධ වුණත්- අපිට ඩොලර් මිලියනයේ තෑග්ග දුන්නත්, තවත් රැයක් මේ පිල්ලි පිරුණ නැවේ ගත නොකරන්න අපි තීරණය කළා. රිප්ටයිඩ් මගේ සාක්කුවේ තියෙන බවත්, හර්මීස් දුන් විටමින් බෝතලය සහ උණු වතුර බෝතලය මගේ ගමන් මල්ලේ උඩින්ම තියෙන බවත් මම සැක හැර දැනගත්තා. අපේ ගමන් මලු ටයිසන් ගෙන යනවාට මම කැමති නොවුණත්, එයාට එහෙම කරන්නම ඕනෑ වුණා. ඒ ගැන වද වෙන්න එපා කියලා ඇනබෙත් මට කිවුවා. මම අත් බෑගයක් ගෙනයනවා තරම් පහසුවෙන් ටයිසන් ලොකු කැන්වස් මලු තුන ගෙන ගියා.

නැවේ තැනින් තැන ගසා තිබුණු මග සලකුණු අනුව අපි හොර රහසේම කොරිඩෝ හරහා මෙහෙයුම් කාර්යාලය සොයාගෙන ගියා. ඇනබෙත් අදෘශ්‍යමානව ඔත්තු බලමින් ඉදිරියෙන් ගියා. කවුරුහරි ළඟින් යන හැම වතාවකදිම අපි සැඟවුණත්, අපිට දකින්න ලැබුණු වැඩි දෙනෙක් වීදුරු ඇස් තිබුණු පිල්ලි මගියෝයි. මෙහෙයුම්



කාර්යාලය තිබිය යුතු තට්ටු අංක දහතුනේ පඩිපෙළ නැග අවසන් වෙද්දිම, "හැංගෙන්න!" දත් අතරින් කෙඳිරූ ඇනබෙත් අපිව සැපයුම් ගබඩා කුටියකට තල්ලු කළා. ශාලාව හරහා ඇවිද එන කොල්ලෝ දෙන්නෙකුගේ හඬවල් මට ඇසුණා.

"ඔයා නැව් ගබඩාවෙ ඉන්න ඉතියෝපියන් ඩ්‍රැකන්ව (මකරුන්ට වඩා වසර දහස් ගණනක් පැරණි, යෝධ සර්පයෙක් වැනි රාක්ෂයෙක්.) දැක්ක ද?" එක් අයෙක් අසද්දි අනෙකා මහ හඬින් හිනාවුණා. "ඔව්, ඒකා නම් මරු."

තවමත් අදෘශ්‍යමානව සිටියත්, ඇනබෙත් මගේ අත තදින් මිරිකුවා. දෙවෙනියාගේ කටහඬ මම දැන සිටිය යුතු බව මට හැඟුණා.

"තවත් එවුන් දෙන්නෙක් එනවලු," හුරුපුරුදු හඬ කිවුවා. "උන් මේ වගේ එනවා නම්, ඔන්, අපිට කිසිම සටනක් නැහැ, බං!"

ඒ හඬවල් කොරිඩෝරුවේ ඈතින් නැසී ගියා.

"ඒ ක්‍රිස් රොඩ්‍රිගස්!" කැප් එක ගැලවූ ඇනබෙත් දෘශ්‍යමාන වුණා. "ඔයාට මතකද- කැබින් එකොළහේ හිටියේ."

කලින් ගිම්හානයේ සිටි ක්‍රිස්ව මට යාන්තමින් මතක තිබුණා. ඔලිම්පියානු අම්මා හෝ තාත්තා එයාට හිමිකම් නොකියූ නිසා එයත් හර්මීස් කැබිනයේ හිරවුණ 'තීරණය නොකළ' කඳවුරුකරුවන්ගෙන් කෙනෙක් වුණා. දැන් ඒ ගැන කල්පනා කරද්දි, මේ ගිම්හානයේ එයාව කඳවුරේ දකින්න නොලැබුණු බව මට සිහි වුණා. "තවත් අර්ධ-ලෝහිතයෙක් මෙහෙ මොනවද කරන්නේ?"

ඇනබෙත් ඔළුව හෙල්ලුවේ පැහැදිලිවම අන්දමන්ද වෙලයි.

අපි දිගටම කොරිඩෝරුවේ පහළට ගියා. ලූක්ට කිට්ටු වන බව දැනගන්න මට තවදුරටත් සිතියම්, මග සලකුණු ඕනෑ වුණේ නැහැ. මොකක්දෝ සීතල සහ අප්‍රසන්න දෙයක් මට දැනුණා- දුෂ්ට දෙයක් ඉදිරියේ ඇති හැඟීමක්.

"පර්සි," ඇනබෙත් හදිසියේම නැවතුණා. "බලන්න."

නැව මධ්‍යයේ තට්ටු කිහිපයක් හරහා සෑදූ ආවාටයක් වටා තිබුණු වීදුරු බිත්තිය ඉදිරියේ එයා සිටගත්තා. එය පතුලේ සාප්පු සංකීර්ණයක් තිබුණා, ඒත් ඇනබෙත්ගේ අවධානය ගෙන තිබුණේ එය නෙවෙයි.

රස කැවිලි කඩයක් ඉදිරියේ රැස්වෙලා සිටියේ රාක්ෂයෝ රංචුවක්: ඩොඩ්ජ්බෝලවලින් මාව මරන්න හැදුව එවුන් වගේ ලයිස්ට්‍රිගෝනියානු යෝධයෝ දුසිමක්, යම බල්ලෝ දෙන්නෙක් සහ අමුතු විදිහේ සත්තු කීප දෙනෙක්- කකුල් වෙනුවට සර්ප වලිග ඇති මිනුෂ්‍යං ගැහැනු.

"ස්කයිතියන් ඩ්‍රැකනෙයි," ඇනබෙත් කොඳුරා කිවුවා. "මකර කාන්තාවෝ." පිදුරුවලින් සැදූ පඹයෙක් පෙති ගහන, ග්‍රීක යුද සන්නාහයෙන් සැරසුණ තරුණ කොල්ලෙක් වටේට අඩ කව හැඩේට රාක්ෂයින් සිටගෙන සිටියා. ඒ පඹයාට අන්දවා තිබූ තැඹිලි පාට අර්ධ-ලෝහිත කඳවුරු ටී-ෂර්ට් එක දකිද්දි මගේ උගුරේ ගුලියක් හිරවෙනවා වගෙයි මට දනුණේ. අපි බලා ඉන්න අතරේ, පඹයාගේ බඩට ඇන්න කොල්ලා එය උඩු අතට ඉරා දැමුවා. පිදුරු හැම තැනම විසිරුණා. වටේ සිටි රාක්ෂයෝ ප්‍රීති ඝෝෂා කරමින් උඩු බුරන්න ගත්තා.

වීදුරුවෙන් මෑත් වූ ඇනබෙත්ගේ මුහුණ අළු පාට වෙලා.

"මෙහෙ එන්න," දනුණාට වඩා නිර්භීත බවක් අඟවමින් මම එයාට කතා කළා. "අපි පුළුවන් ඉක්මනට ලූක්ව හොයාගන්න තරමට හොඳයි." කොරිඩෝව කෙළවර වූ දෙපළු ඕක් දොරට තිබුණේ ඊට පිටුපසින් වැදගත් තැනක් සඟවාගෙන ඉන්න පෙනුමක්. අපි එයට අඩි තිහක් විතර ඈතින් ඉන්නකොට, හිටි හැටියේම ටයිසන් නැවතුණා. "ඇතුළේ කතා කරනවා."

"ඔයාට මෙච්චර දුරට ඒවා ඇහෙනව ද?" මම ඇසුවා.

ටයිසන් ඇස් පියාගත්තේ හිත එකඟ කරගන්න වගෙයි. ඊට පස්සේ එයාගේ කටහඬ වෙනස් වෙලා, ලූක්ගේ ගොරෝසු හඬට සමාන වුණා, "-අනාවැකිය අපිමයි. කොයි පැත්තට හැරෙන්නද කියලා ඒ මෝඩයන්ට හිතා ගන්නත් බැරි වෙයි."

මම එයට ප්‍රතිචාර දක්වන්නත් කලින්, ටයිසන්ගේ හඬ ආපහු වෙනස් වෙලා, තවත් ගැඹුරු සහ කර්කශ වුණේ භෝජනාගාරය ළඟදී ලූක්ට කතා කරනවා ඇසුණු කෙනාගේ හඬ ලෙසටයි. "නාකි අස්ස මිනිහා යන්නම ගිහින් කියලා ඔයා ඇත්තටම හිතනව ද?"

ටයිසන් ලූක්ගේ හඬින් හිතා වුණා. "එයාලට එයාව විශ්වාස කරන්න බැහැ. එයාගේ වැරැද්දත් එක්ක බැහැ. ගහට වස දාපු එක තමයි අන්තිම තුරුම්පුව."



ඇනබෙත් වෙවුලුවා. "ඕක නවත්තන්න, ටයිසන්! ඔයා කොහොමද එහෙම කරන්නේ? එක් බය හිතෙනවනේ." ඇස් ඇරිය ටයිසන් පැටලුණු බැල්මෙන් බැලුවා. "ඉතින්, මං අහගෙන හිටියා විතරයි නේ."

"නතර කරන්න එපා," මම කිවුවා. "තව මොනවද එයාලා කියන්නේ?" ටයිසන් ආයෙමත් ඇස් වසාගත්තා.

එයා කර්කශ මිනිහාගේ හඬින් පිම්බා: "සද්ද කරන්න එපා!" ඊට පස්සේ ලූක්ගේ හඬින් කෙඳිරුවා: "ඔයාට විශ්වාස ද?"

"ඔව්," ටයිසන් කර්කශ හඬින් කිවුවා. "කාමරෙන් එළියේ." සිද්ධ වෙන්නේ මොනවාද කියලා මම තේරුම් ගනිද්දි පරක්කු වැඩියි.

"දුවන්න!" මට කියාගන්න ලැබුණේ එච්චරයි, ඒත් එක්කම වේගයෙන් ඇරුණු දොරෙන් ලොම් පිරුණු යෝධයෝ දෙන්නෙක් පිරිවරාගෙන ලූක් එළියට ආවා. යෝධයෝ දෙන්නා අත දරාගෙන සිටි හෙලිවල ලෝකඩ තුඩු කෙලින්ම අපේ පපුවලට එල්ල වුණා.

"හොඳයි," කපටි හිනාවක් පාමින් ලූක් කිවුවා. "මං කැමතිම නෑයෝ දෙන්නා නේ. ඇතුළටම එන්න."

ඒ කාමරය ලස්සනයි, වගේම බිහිසුණුයි.

ලස්සන කොටස වුණේ: නැවේ අවරයට මුහුණලා, පිටුපස බිත්තිය පුරා වක් වෙමින් විශාල ජනේල තිබුණා. කොළ පාට මුහුදත්, නිල් පාට අහසත් ඈත ක්ෂිතිජය දක්වාම ඇදී යන ආකාරය එයින් පෙනුණා. පර්සියානු පලසකින් පොළොව වැසී තිබුණා. කාමරය මැද සේද රෙද්දෙන් කළ සෝපා දෙකකුත්, එක් කෙළවරක වියන් ඇඳකුත්, අනෙක් කෙළවරේ මහෝගනී ලීයෙන් කළ කෑම මේසයකුත් තිබුණා. කෑම මේසය කෑමවලින් පිරිලා- පීසා පෙට්ටි, සෝඩා බෝතල් වගේම රිදී පිඟන්වල අට්ටි ගැසූ බදින ලද මස් සැන්ඩ්විච්සුත් එතැන තිබුණා.

බිහිසුණු කොටස වුණේ: කාමරය පිටුපස වූ පුංචි විල්ලුද වේදිකාව මත අඩි දහයක් දිග, රනින් සෑදූ මිනී පෙට්ටියක් තැන්පත් කර තිබුණා. එහි දෙපස ගිනි ගන්නා නගරවලත්, බිහිසුණු මරණවලට මුහුණ පෑ වීරයන්ගේත් පෞරාණික ග්‍රීක දර්ශන කැටයම් කර තිබුණා. ජනේල හරහා කාමරය තුළට ඉර එළිය ගලා ආවත් මිනී පෙට්ටිය මුළු කාමරයම සීතල කර තිබුණා.

"හොඳයි," ආඩම්බරයෙන් දැත් දෙපසට දිගු කරමින් ලූක් කිවුවා. "කැබින් එකොළහට වඩා ටිකක් ලස්සනයි, නේ?" පහුගිය ගිම්හානයෙන් පස්සේ එයා සෑහෙන වෙනස් වෙලා. බර්මියුඩා කොට කලිසම් සහ ටී-ෂර්ට් වෙනුවට බොත්තම් පියවන කමිසයකිනුත්, කාකි කොට කලිසමකිනුත්, ලෙදර් සපත්තු කුට්ටමකිනුත් එයා සැරසී සිටියා. ඉස්සර නොහික්මුණු ලෙස වැවී තිබුණු එයාගේ වැලි පාට කොණ්ඩය දත් කොටටම කපලා. එයාව පෙනුණේ මේ අවුරුද්දේ හාර්වඩ් විශ්වවිද්‍යාලයට යන පේන්තුකාර දූෂ්ටයෙක් සැරසිය යුතු විලාසිතාව පෙන්වන මෝස්තර නිරූපණ ශිල්පියෙක් වගෙයි.

එයාගේ ඇඟට යටින් වූ තුවාල කැළැල- මකරෙක් සමග කළ සටනෙන් ලැබුණු සුදු පාට කඩ ඉර, තවමත් තිබුණා. සෝපාවකට හේත්තු කර තිබුණු එයාගේ මායා කඩුව, බැක්බයිටර්ගේ මනුෂ්‍ය අමනුෂ්‍ය ඕනෑම කෙනෙක් මැරිය හැකි අර්ධ-වානේ, අර්ධ-දිව්‍යමය ලෝකඩ තලය අසාමාන්‍ය ලෙස දිස්නය දුන්නා.

"වාඩි වෙන්න," එයා අපිට කිවුවා. එයා අත වනද්දි කෑම මේසයේ පුටු තුනක් කාමරයේ මැදට ඇදී ආවා.

අපි කවුරුවත් වාඩි වුණේ නැහැ.

ලූක්ගේ යෝධ යාළුවෝ තවමත් එයාලගේ හෙලි අපිට එල්ල කරගෙන සිටියා. තිවුන්නු වගේ පෙනුණත්, එයාලා මිනිස්සු නම් නෙවෙයි. අඩි අටක් විතර උස එයාලා හැඳ සිටියේ නිල් පාට කලිසම් විතරයි. පෙනුණු හැටියට, ඒකට හේතුව වෙන්න ඇත්තේ එයාලගේ අති විශාල පපුව දුඹුරු පාට ඝන ලොම්වලින් වැසී තිබුණ නිසා වෙන්න ඇති. ඇඟිලිවල නියපොතු වෙනුවට නිය පහුරුත්, සතුන්ගේ වගේ කකුලුත් තිබුණු එයාලට හොම්බක් වගේ නහයකුත්, උල් දතුත් පිහිටා තිබුණා.

"මගේ ආචාරශීලීකම කොහේ ගියා ද?" ලූක් මෘදුව කිවුවා. "මේ ඉන්නේ මගේ ගෝලයෝ, ආග්‍රියස් සහ ඔරෙයස්. බාගදා, මේ දෙන්නා ගැන ඔයාලට අහන්න ලැබිලත් ඇති."

මම මුකුත් කියන්න ගියේ නැහැ. හෙලි මානාගෙන සිටියත්, මාව බය කළේ ඒ වලස් තිවුන්නු දෙන්නා නෙවෙයි. පහුගිය ගිම්හානයේ ලූක් මාව මරන්න උත්සාහ කළ දවසේ ඉඳන් ආයෙමත් එයාව මුණගැහෙන විදිහ මම බොහෝ වතාවක් හිතෙන් මවාගෙන තිබුණා. මම එඩිතරව එයා ඉදිරියේ හිටගෙන, එයාට ද්වන්ධ සටනකට



අභියෝග කරන්න හිතාගෙන හිටියා. ඒත් දැන් අපි මුහුණට-මුහුණ හමුවුණාම මගේ අත් දෙක වෙවුලන්නේ නැතුව තියාගන්න පවා මට ගොඩක් අමාරු වුණා.

"ආග්‍රියස්ගෙයි ඔරෙයස්ගෙයි කතන්දරේ ඔයාලා දන්නේ නැද්ද?" ලූක් ඇහුවා. "එයාලගේ අම්මා... මෙහෙමයි, ඒක දුක හිතෙන කතාවක්, ඇත්තමයි. ඒ තරුණ ගෑනු කෙනාට ආදර සම්බන්ධයක් ඇතිකරගන්න ඇෆ්‍රොඩයිට් නියම කළා. එයා ඒකට අකමැති වෙලා උදවු ඉල්ලගෙන ආර්ටෙමිස් ළඟට දිව්වා. එයාගේ කන්‍යා දඩයක්කාරියන්ට එකතු වෙන්න ආර්ටෙමිස් එයාට ඉඩ දුන්නා, ඒත් ඇෆ්‍රොඩයිට් කොහොමහරි එයාගේ පළිය ගත්තා. තරුණ ගෑනු ළමයට වලහෙක් එක්ක ආදරෙන් බැඳෙන්න එයා වශී ගුරුකමක් කළා. ආර්ටෙමිස් මේ ගැන දැනගත්තම කෙල්ල ගැන කලකිරීලා, එයාව අත ඇරියා. ඒක දෙවිවරුන්ගෙ හැටි නේ, නැද්ද මං කියන්නේ? එයාලා එක එක්කෙනා ඇනකොටා ගනිද්දි, අසරණ මිනිස්සු මැද හිර වෙනවා. ඒ ගෑනු ළමයට ලැබුණ තිවුන් පුතාලා දෙන්නා තමයි මේ ආග්‍රියස් සහ ඔරෙයස්. එයාලගෙ හිතේ ඔලිම්පස්වලට නම් කිසිම ආදරයක් නැහැ. ඒ වුණත්, එයාලා අර්ධ-ලෝහිතයන්ට නම් ටිකක් කැමතියි..."

"දවල් කෑමට," ආග්‍රියස් ගෙරෙව්වා. කලින් ලූක් එක්ක කතා කරනවා ඇසුණු කර්කශ හඬේ අයිතිකාරයා එයායි.

"හි...හි! හි...හි!" එයාගේ සහෝදරයා ඔරෙයස් හිනාවෙමින් ලොම්වලින් වට වූ තොල් ලෙවකන්න වුණා. වලිප්පුව හැදිලා වගේ දිගින් දිගටම හිනාවුණ එයා දිහා අන්තිමට ලූක්, ආග්‍රියස් දෙන්නම රවා බැලුවා.

"කට වහගන්නවා, මෝඩයා!" ආග්‍රියස් ගෙරෙව්වා. "යනවා, ගිහින් ඔහේටම දඬුවම් කරගන්නවා!" ඔරෙයස්ට කෙඳිරි ගෑවුණා. කාමරේ කෙළවරකට ගාටමින් ගිය එයා ස්ටූලයක් උඩට ඇද වැටිලා, කෑම මේසයේ ඔළුව ගහගන්න වුණා. ලූක් නම් බලා සිටියේ ඒක හරිම සාමාන්‍ය හැසිරීමක් වගෙයි. සෝපාවක සැප පහසුවට වාඩිවුණ එයා කෝපි මේසය උඩ කකුල් තබාගත්තා. "ඉතින්, පර්සි, ඔයාට තවත් අවුරුද්දක් ජීවත් වෙන්න අපි ඉඩ දුන්නා. මං හිතන්නේ ඔයාට ඒ ගැන සතුටු ඇති. අම්මා එහෙම සනීපෙන් ද? ඉස්කෝලෙ කොහොම ද?"

"ඔයා තාලියාගේ ගහට වස දුම්මා."

ලූක් සුසුමක් පිට කළා. "එකපාර ප්‍රධාන කාරණාවටම බහිනවද, ඔහ්? කමක් නෑ, ඇත්තටම මම ගහට වස දැම්මා තමයි. ඉතින් මොකද?"

"ඔයා කොහොමද ඒක කළේ?" ඇනබෙත්ගේ හඬ කොයි තරම් කේන්තියෙන් පිරී තිබුණා ද කියනවා නම්, එයා දත් පුපුරයි කියලා මට හිතුණා. "තාලියා ඔයාගේ ජීවිතේ බේරුවා! අපේ ජීවිත! ඔයා කොහොමද එයාට අගෞරව කළේ- "

"මම එයාට අගෞරව කළේ නෑ!" ලූක් කඩා පැන්නා. "දෙවිගොල්ලොයි එයාට අගෞරව කළේ, ඇනබෙත්! තාලියා තවමත් ජීවත් වෙලා හිටියා නම්, එයත් මගේ පැත්ත ගන්නවා!"

"බොරුකාරයා!"

"ඉස්සරහට වෙන්නේ මොනවද කියලා ඔයා දැනගෙන හිටියා නම්, ඔයා තේරුම් ගනී-"

"මට හොඳට තේරෙනවා, ඔයාට ඕනෑ කඳවුර විනාශ කරන්න!" එයා මොරදුන්නා. "ඔයා යක්ෂයෙක්!" ලූක් ඔළුව හෙල්ලුවා. "දෙවිවරු ඔයාව අන්ධ කරලා තියෙන්නේ. එයාලා නැති ලෝකයක් ඔයාට හිතේ මවාගන්න බැරි ද, ඇනබෙත්? ඔයා ඉගෙන ගන්න පරණ ඉතිහාසයෙන් ඇති වැඩේ මොකක් ද? අවුරුදු තුන්දාහක් පරණ පොදි! බටහිරකරණය අරටුවට යනකල්ම කුණුවෙලා තියෙන්නේ. ඒක විනාශ කරලා දාන්න ඕනෑ. මට එකතු වෙන්න! අලුතින්ම ලෝකයක් පටන් ගන්න අපිට පුළුවන්. අපිට පුළුවන් ඔයාගේ බුද්ධියෙන් වැඩක් ගන්න, ඇනබෙත්."

"මොකද ඔයාට එහෙම එකක් නැතේ!"

එයාගේ ඇස්දෙක හීනි වුණා. "මං ඔයාව දන්නවා, ඇනබෙත්. කඳවුර බේරගන්න වැඩකට නැති ගවේෂණයක එල්ලිලා යනවට වඩා වැඩි දෙයක් ඔයාට ලැබෙන්න ඕනෑ. තව මාසයක් ඇතුළත අර්ධ-ලෝහිත කන්ද රාක්ෂයන්ගෙන් වැහිලා යයි. ජීවිත බේරගන්න වීරයන්ට අපිට එකතු වෙන්න හරි, විනාශ වෙලා යන්න හරි සිද්ධ වෙනවා. පැරදෙන පිලේ ඉන්න ඔයාට ඇත්තටම ඕනෑ ද... මේ වගේ අය එක්ක?" ලූක් ටයිසන්ට ඇඟිල්ල දිගු කළා. "සයික්ලොප්ස්ලා එක්ක සවාරි යනවා," ලූක් දොස් කිවුවා. "මහ ලොකුවට තාලියාගේ මතකයට අගෞරව කරන එක ගැන කියවනවා! මට නම් ඔයා ගැන පුදුමයි, ඇනබෙත්. අනිත් හැමෝම අතරින් ඔයා-"



"ඕක නවත්තනවා!" ඇනබෙත් කෑගැසුවා.

ලූක් කියෙවුවේ මොනවා ගැනද කියලා මම දැන නොසිටියත්, ඇනබෙත් මූහුණ අත් දෙකේ සඟවාගත්තේ අඬන්න වගෙයි.

"එයාට පාඩුවේ ඉන්න දෙනවා," මම කිවුවා. "ඒ වගේම ටයිසන්වත් මේකට ගාවගන්න එපා." ලූක් හිනා වුණා. "ඔහ්, ඔව්නේ. මට අහන්න ලැබුණා. ඔයාගේ තාත්තා මෙයාට හිමිකම කිවුවලු නේ." පුදුමයට පත්වූ පෙනුමක් මගෙන් පේන්න ඇති, මොකද ලූක්ගේ මූණට හිනාවක් ආවා. "ඔව්, පර්සි, මම ඒවා ඔක්කොම දන්නවා. තව, ඔයාලගේ රන් සළුව හොයාගන්න සැලසුම. එතකොට, අර ඛණ්ඩාංක ටික.... 30, 31, 75, 12? ඔයාට පේනවා නේ, කඳවුරේ තවමත් මගේ යාළුවෝ ඉන්නවා."

"ඔය කියන්නේ, ඔත්තුකාරයෝ."

එයා උරහිස් ඇකිළුවා. "ඔයාගේ තාත්තාගෙන් ලැබෙන අපහාස කොච්චරක් ඔයාට දරාගෙන ඉන්න පුළුවන් ද, පර්සි? ඔයා හිතන්නේ එයා ඔයාට කළගුණ සලකනවා කියල ද? ඔයා හිතන්නේ පොසෙයිඩන් මේ රාක්ෂයාට සලකනවට වඩා ඔයාට සලකනවා කියල ද?" අත්මිට් කරගත් ටයිසන් උගුර යටින් ගෙරවුම් හඬක් පිට කළා. ලූක් කෙකර ගෑවා. "දෙවිවරු ඔයාව පාවිච්චි කරනවා, පර්සි. දාසයවෙනි උපන් දිනේට ළඟා වුණොත් ඔයාට ලැබෙන්න තියෙන දේ ගැන අදහසක්වත් ඔයාට තියෙනව ද? අඩු තරමේ අනාවැකිය ගැන කයිරොන් ඔයාට කියලවත් තියෙනව ද?" ලූක්ගේ හොම්බට දෙකක් ඇනලා, කට පියාගන්න කියන්න මට ඕනෑ වුණා, ඒත් සුපුරුදු විදිහටම, මාව අවුල් කරන විදිහ එයා දැනගෙන හිටියා.

දාසයවෙනි උපන් දිනේ?

මං කියන්නේ, අවුරුදු ගාණකට කලින් කයිරොන්ට ඔරකල්ගෙන් අනාවැකියක් ලැබුණු බව මම දන්නවා. ඒකේ කොටසක තියෙන්නේ මං ගැන කියලත් මම දන්නවා. ඒත්, මම දාසයවෙනි උපන් දිනේට ළඟා වුණොත්? ඒ කතාව නම් මගේ හිතට ඇල්ලුවේ නැහැ.

"දැනගන්න උවමනා දේවල් මම දන්නවා," මට කියාගන්න හැකි වුණා. "හරියට, මගේ හතුරෝ කවුද කියන එක වගේ."

"එහෙනම් ඔහේ මෝඩයෙක්."

ටයිසන් ළගම වූ පුටුව පතුරුවලට කුඩු කළා. "පර්සි මෝඩයෙක් නෙවෙයි!" මම එයාව නවත්වන්න කලින් එයා ලූක්ට පහර දෙන්න පැන්නා. එයාගේ මුෂ්ටි පහරක් ලූක්ගේ ඔළුවට පාත්වුණා. ටයිටේනියම් වුණත් සිදුරු කළ හැකි තරමේ තද පහරක්- ඒත් වලස් තිවුන්නු එයාව බාධා කළා. එයාගේ අත් දෙකෙන් අල්ලා ගත් එයාලා ටයිසන්ව නතර කළා. එයාලා ටයිසන්ව පිටුපසට තල්ලු කරද්දි එයා වැටුණු වේගයට නැව් කට්ටුවම සෙලවුණා.

"හරිම නරකයි, සයික්ලොප්ස්," ලූක් කිවුවා. "පේන හැටියට නම් මගේ වලස් යාළුවෝ දෙන්නා එකතු වුණාම ඔයාට ඕනැවටත් වඩා වැඩියි වගේ. සමහරවිට, මම එයාලට ඉඩ දුන්නොත්-"

"ලූක්," මම මැදට පැන්නා. "මං කියන දේ අහන්න. අපිව එව්වේ ඔයාගෙ තාත්තා." එයාගේ මූණ තද රතු පාටට හැරුණා.

"එයාව මතක් කරන්නවත් එපා."

"අපිට මේ නැවට එන්න කිවුවේ එයා. මං හිතුවේ අපිට ගමන යන්න උදවුවට විතරයි කියලා. ඒත් එයා අපිව මෙහෙට එව්වේ ඔයාව හොයාගන්න. එයා කිවුවා එයා කවදාවත් ඔයාව අත අරින්නේ නෑ කියලා, ඔයා කොයි තරම් කේන්තියෙන් හිටියත්."

"කේන්තියෙන්?" ලූක් ගිගුරුවා. "මාව අත අරින්නෙ නෑ? එයා මාව අතරමං කළා, පර්සි! මට ඕනෑ ඔලිම්පස් විනාශ කරලා දාන්න! හැම සිංහාසනයක්ම කුඩු කරලා දාන්න! ඒක ඒ විදිහටම සිද්ධ වෙනවා කියලා ඔයා හර්මීස්ට කියන්න. අර්ධ-ලෝහිතයෙක් අපිට එකතුවෙන හැම වතාවකදිම ඔලිම්පියානුවෝ දුර්වල වෙලා, අපි ශක්තිමත් වෙනවා. එයා ශක්තිමත් වෙනවා." ලූක් රන් මිනී පෙට්ටිය පෙන්වමින් කිවුවා.

පෙට්ටිය දකිද්දි මගේ ඇගම හිරිවැටුණත්, ඒ බව නොපෙන්වා ඉන්න මම අධිෂ්ඨාන කරගත්තා. "ඉතින්?" මම ප්‍රශ්න කළා. "මොකක්ද ඕකෙ ඇති විශේෂත්වේ..."

ඒත් එක්කම එය මගේ හිතට වැදුණා, මිනී පෙට්ටිය ඇතුළේ ඇත්තේ මොනවා ද? එක්වරම කාමරයේ උෂ්ණත්වය අංශක විස්සකින් පහළ වැටුණා වගෙයි දැනුණේ. "වෝහ්, ඔයා කියන්නේ-"

"එයා ප්‍රතිසංස්කරණය වෙනවා," ලූක් කිවුවා. "ටිකෙන් ටික, අපි එයාගේ ජීව බලය ආවාටයෙන් එළියට කැඳවනවා. අපේ පැත්තට



ප්‍රතිඥා දෙන හැම අලුත් හටයෙක් එක්කම, තවත් පුංචි කොටසක් මතු වෙනවා - "

"ඒක නම් අප්පිරියයි!" ඇනබෙත් කිවුවා.

ලූක් අවඥාවෙන් එයා දිහා බැලුවා. "ඔයාගේ අම්මා ඉපදුණේ සියුස්ගේ හිස්කබල පැළුණ තැනකින්, ඇනබෙත්. මං ඒ ගැන කියන්නෙ නෑ. ඉක්මනටම ටයිටන් උතුමාව සම්පූර්ණ කරන්න ඇති තරම් අපිට ලැබේවි. අපි එකතු වෙලා එයාට අලුත් සිරුරක් හදනවා, හෙෆාස්ටස්ගේ කම්මල්වලින්වත් හදන්න බැරි විදිහේ එකක්."

"ඔයාට පිස්සු," ඇනබෙත් කිවුවා.

"අපිට එකතු වුණොත් ඔයාටත් තැගි ලැබේවි. අපිට බලවත් යාළුවෝ ඉන්නවා, මේ සංචාරක නැවයි තවත් ගොඩාක් දේවලුයි අරන් දෙන්න තරම් පෝසත් අනුග්‍රාහකයෝ ඉන්නවා. පර්සි, ඔයාගෙ අම්මට ආයේ කවදාවත් වැඩට යන්න ඕනෑ වෙන්නෙ නෑ. එයාට මන්දිරයක් අරන් දෙන්න ඔයාට පුළුවන්. ඔයාට බලය, ප්‍රසිද්ධිය- ඕනෑම දෙයක් ලබාගන්න පුළුවන්. ඇනබෙත්, ගෘහ නිර්මාණ ශිල්පියෙක් වෙන හීනය හැබෑ කරගන්න ඔයාට පුළුවන්. අවුරුදු දහස් ගාණක් පවතින ස්මාරකයක් හදන්න ඔයාට පුළුවන්. ඊළග යුගයේ අධිපතියෝ වෙනුවෙන් දේවස්ථානයක්!"

"ටාටරස්වලටම මකබෑවෙයන්," ඇනබෙත් කිවුවා.

ලූක් සුසුමක් හෙළුවා. "මොන ලැජ්ජාවක් ද?"

රූපවාහිනී දුරස්ථ පාලකයක් වගේ දෙයක් අතට ගත් එයා රතු පාට බොත්තමක් එබුවා. තත්පර ගාණක් තුළදී, ඇරුණු දොරෙන් ඇතුළට ආවේ බැටන් පොලු අතින් ගත්, නිල ඇඳුමෙන් සැරසුණු නාවිකයෝ දෙන්නෙක්. මට දකින්න ලැබුණු අනෙක් මිනිස්සු වගේම එයාලාගේ ඇසුත් විදුරු පෙනුම ගත්තා. ඒත් එයින් සටනකදි එයාලගේ අනතුරුදායක බව අඩු වෙයි කියලා නම් මට හිතුණේ නැහැ.

"අහ්, හොඳයි, සෙකියුරිටි," ලූක් කිවුවා. "මට පේන්නේ කට්ටියක් අපේ නැවට හොරෙන් රිංගලා."

"ඔව්, සර්," එයාලා හීනෙන් වගේ කිවුවා.

ලූක් ඔරෙයස් වෙතට හැරුණා. "ඉතියෝපියන් ඩ්‍රැකන්ට කන්න දෙන්න වෙලාව හරි. මේ මෝඩයෝ ටික පහළට අරන් ගිහිල්ලා, ඒක කරන විදිහ පෙන්නලා දෙන්න."

ඔරෙයස් මෝඩ තාලෙට හිනා වුණා. "හි...හී! හි...හී!"

"මටත් යන්න දෙන්න," ආග්‍රියස් ගෙරෙව්වා. "මගේ සහෝදරයා වැඩකට නැහැ. අර සයික්ලොප්ස්-"

"ඒ ගැන බය වෙන්න දෙයක් නෑ," ලූක් කිවුවා. "එයා ආපසු රන් මිනී පෙට්ටිය දෙසට බැල්මක් හෙළුවේ, එයාගේ හිතට යමක් වද දෙනවා වගෙයි. "ආග්‍රියස්, මෙතැන ඉන්න. අපිට වැදගත් සාකච්ඡාවක් කරන්න තියෙනවා."

"ඒත්-"

"ඔරෙයස්, වැඩේ වරද්දන්න එපා. එතැනම ඉඳලා, බූකන් හොඳට කැවද කියලා බලන්න."

ඔරෙයස් හෙල්ලයෙන් අනිමින් අපිව කාමරයෙන් පිටට දක්කාගෙන යද්දි, ඊට පිටුපසින් මිනිස් සෙකියුරිටිලා දෙන්නත් ආවා.

ඔරෙයස්ගේ හෙලි පහරවල් පිටුපසින් ඇනෙමින් ඉදිරියට යද්දි ලූක් කියූ දෙයක් ගැන මම කල්පනා කළා- වලස් නිවුන්නු දෙන්නා එකතු වුණාම නම් ටයිසන්ට ඕනෑවටත් වඩා වැඩියි. ඒත් සමහරවිට වෙන වෙනම...

නැව මැද කොරිඩෝවෙන් පිට වූ අපි ජීවිතාරක්ෂක බෝට්ටු පෙළ ගසා තිබූ විවෘත නැව් තට්ටුවක් හරහා ගියා. නැව ගැන හොඳින්ම දන්නා නිසාම, අපිට ඉර එළිය දකින්න ලැබෙන අන්තිම අවස්ථාව මේය බව මම තේරුම් ගත්තා. අපි අනෙක් පැත්තට ගියාම, එතැනින් විදුලි සෝපානයකට නැගලා පහළ නැව් ගබඩාවට යන්න වේවි. එච්චරම තමයි. ටයිසන් දිහා බැලූ මම, "දැන්," කිවුවා.

දෙයියන්ට ස්තුති වෙන්න, එයාට ඒක තේරුණා. ආපසු හැරුණු එයා ඔරෙයස්ට ගහපු පාරට අඩි තිහක් පස්සට විසිවුණ එයා, නාන තටාකයේ සංචාරක පිල්ලි පවුල මැද්දට ඇදගෙන වැටුණා.

"ආහ්!" ළමයි ටික එකටම මොරදුන්නා. "අපිට සතුටු නෑ!" එක් සෙකියුරිටි ගාඩ් කෙනෙක් බැටන් පොල්ල ඇදලා ගත්තත්, ඈනබෙත් කල්-යල් බලා ගැසූ පයින් පාරට එයාගේ හුළං බැස්සා. අනෙක් ගාඩ් ළඟම තිබුණු අනතුරු ඇඟවීමේ සංඥා පෙට්ටිය වෙතට දිව්වා.

"එයාව නවත්තන්න!" ඈනබෙත් මොරදුන්නත්, එතකොට පරක්කු වැඩියි.



මම අකුළනා පුටුවකින් එයාගේ ඔළුවට දමලා ගහන්න තත්පරයකට කලින් එයා අනතුරු ඇඟවීමේ සංඥාව නාද කළා. රතු එළි දැල්වෙන්න ගත්තා. සයිරන් හඬවල් විලාප දුන්නා.

"ජීවිතාරක්ෂක බෝට්ටුව!" මම කෑගැසුවා.

අපි ළඟම තිබුණු බෝට්ටුවට දිව්වා.

අපි එහි කවරය ගලවා අවසන් වෙද්දි, රාක්ෂයෝ සහ නවත් සෙකියුරිටි ගාඩ්ලා සංචාරකයෝ සහ නිවර්තන බීම බන්දේසි අල්ලාගෙන සිටි අවන්හල් සේවකයන්ව තල්ලු කරමින් නැව් තට්ටුවට පිරුණා. ග්‍රීක යුධ සන්නාහයකින් සැරසුණ කොල්ලෙක් කඩුව පිටතට අදිමින් පහර දෙන්න දුවගෙන ආවත්, නැව් තට්ටුව උඩ හැලී තිබුණ අන්නාසි බීම ගොඩක ලිස්සලා එයා ඇදගෙන වැටුණා. අපිට ඉහළින් වූ නැව් තට්ටුවට රැස්වුණ ලයිස්ට්‍රිගෝනියානු දුනුවායෝ, එයාලගේ යෝධ දුනුවලට ඊතල අමුණන්න වුණා.

"මේක වතුරට ගන්නෙ කොහොමද?" ඈනබෙත් බෙරිහන් දුන්නා.

යම බල්ලෙක් මගේ ඇඟට පැන්නා, ඒත් ටයිසන් ගිනි නිවනයකින් ගහලා උංව පැත්තකට දැමුවා.

"බෝට්ටුවට නගින්න!" මම මොරදුන්නා. රිප්ටයිඩ්ගේ කොපුව ගැලවූ මම, අපිට එල්ල වූ පළමු ඊතල මුරය ගුවනේදීම කපා දැමුවා. දැන් ඕනෑම තත්පරයක අපිව හතුරන්ගෙන් යට වෙන බව මට තේරුණා.

ජීවිතාරක්ෂක බෝට්ටුව මුහුදට ගොඩාක් උඩින්, නැවේ පැත්තක එල්ලෙමින් තිබුණා. කප්පිය නිදහස් කරගන්න දඟලපු ඈනබෙත්, ටයිසන් දෙන්නට ඒකට වාසනාවක් නැහැ වගෙයි.

මමත් බෝට්ටුව ඇතුළට පැන්නා.

"හයියෙන් අල්ලගන්න!" මොරදුන් මම කඹ කපා දැමුවා.

ඊතල වැස්සක් උරුවම් බාමින් අපේ හිස්වලට උඩින් ඇදී යද්දී, අපි සාගරය දෙසට ඇද වැටුණා.

# 10
# අපි මැරුණු සෙබළු එක්ක යාත්‍රා කළා

"උණු වතුර බෝතලේ!" පහළට වැටෙද්දී මම බෙරිහන් දුන්නා.

"මොකක්?" මගෙ මොළේ අවුල් වෙලා කියලා ඇනබෙත් හිතන්න ඇති. ආදරණීය ජීවිතේ රැකගන්න එයා බෝට්ටුවේ එල්ලී සිටිද්දී, එයාගේ කොණ්ඩය පන්දමක ගිනිදලු වගේ කෙලින්ම උඩට පියෑඹුවා.

ඒත් ටයිසන්ට තේරුණා. බෝට්ටුවෙන් එළියට වැටෙන්නේ නැතිව මගේ කැන්වස් මල්ල ඇරලා, හර්මීස්ගේ මායා උණු වතුර බෝතලය පිටට ගන්න එයාට පුළුවන් වුණා.

ඊතල සහ හෙලි අපේ හිස්වලට ඉහළින් ඇදී ගියා.

මම උණු වතුර බෝතලය අතට ගත්තේ මම කරන දේ හරියන්න ප්‍රාර්ථනා කරමින්. "හයියෙන් අල්ල ගන්න!"

"අල්ලගෙන තමයි ඉන්නේ!" ඇනබෙත් මොරදුන්නා.

"තව හයියෙන්!"

හුළං පිරවූ බෝට්ටු පතුලේ කකුල් හිරකරගත් මම, ටයිසන් ඇනබෙත්ගේත් මගේත් කමිස පිටුපසින් තදින් අල්ලා ගනිද්දීම උණු වතුර බෝතලයේ පියන හතරෙන් එකක් ඇරියා. එසැණින්ම උණු වතුර බෝතලයෙන් අධිවේගයෙන් පිටවූ සුදු පාට සුළං ධාරාවකින් වේගයෙන් හරස් අතට විසිවුණ අපිව අංශක හතලිස් පහක් ඇලේ මුහුදේ වැදුණා.



උණු වතුර බෝතලයෙන් නිදහස් වෙන්න ලැබුණාට සතුටෙන් හුළඟ හිනාවෙනවා වගෙයි පෙනුණේ. මුහුදේ වැදුණු අපේ බෝට්ටුව පැතලි ගලක් වතුර මතුපිට පොලා පනිනවා වගේ වතාවක් දෙකක් උඩ විසිවෙලා, ඊට පස්සේ තෙරක් නොපෙනෙන දියඹට අධිවේග බෝට්ටුවක් වගේ ඇදෙන්න ගත්තේ ලුණු මිශ්‍ර හිරිකඩවලින් අපිව නාවමින්.

දරාගන්න බැරි කේන්තියෙන් විලාප දෙන හඬක් අපිට පිටුපස නැවෙන් ඇසුණා, ඒත් ඒ වෙද්දී අපි ආයුධ වදින සීමාවෙන් පිටවෙලයි සිටියේ. සුදු පාට සෙල්ලම් නැවක් තරම් පොඩියට ඈතින් පෙනුණ ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා, ඉන්පසුව නොපෙනීම ගියා.

අපි මුහුද හරහා ඉදිරියට ඇදෙන අතරේ, කයිරොන්ට අයිරිස්-පණිවුඩයක් යවන්න ඇනබෙත් සහ මම උත්සාහ කළා. ලූක් කරන්නේ මොනවා ද කියලා කාටහරි දන්වලා තියෙන එක හොඳයි කියලා අපි හිතුවා, ඒත් ඒක කියන්න වෙන විශ්වාසවන්ත කෙනෙක්ව හිතාගන්න අපිට බැරි වුණා.

උණු වතුර බෝතලයේ සුළඟෙන් විසිරුණු හිරිකඩ හරහා ඉර එළිය වැටී අයිරිස්- පණිවුඩයකට හරියටම ගැළපෙන දේදුන්නක් මැවූවා- ඒ වුණත් සම්බන්ධතාවය ඒ තරම් පැහැදිලි වුණේ නැහැ. ඇනබෙත් මීදුම තුළට රන් ඩ්‍රැච්මාවක් වීසි කරලා, අපිට කයිරොන්ව පෙන්වන්න කියලා දේදුන්නට අධිපති දෙවඟනට කන්නලව් කළාම, කයිරොන්ගේ මුහුණ සතුටුදායක මට්ටමකින් පේන්න පටන් ගත්තා. ඒත් පසුබිමේ අමුතු විදිහේ කැරකෙන පාට පාට විදුලි එළිත්, මහ හඩින් වාදනය වුණ රොක් සංගීතයත් තිබුණේ හරියට එයා ඩාන්ස් ක්ලබ් එකක ඉන්නවා වගෙයි.

අපි කඳවුරෙන් හොරෙන් පැනලා ආව හැටිත්, ලූක් සහ ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැව ගැනත්, ක්‍රෝනොස්ගේ ඉතුරු කෑලි දාපු රත්තරන් පෙට්ටිය ගැනත් අපි එයාට කිවුවා, ඒත් එයාගේ පැත්තෙන් ඇසුණු ඝෝෂාවත්, අපේ පැත්තෙන් ඇසුණු සුළඟේ සහ වතුරේ හඬත් නිසා එයාට කොච්චරක් ඇහුණද කියලා නම් මට විශ්වාස නැහැ.

"පර්සි," කයිරොන් මොරගැහුවා, "ඔයා හොඳට ඇහැ ගහගෙන ඉන්න ඕනෑ- " පිටුපසින් ඇසුණු ඝෝෂාවකට එයාගේ හඬ යටපත් වුණා- හරියට යුද හටයෝ ජයඝෝෂා නඟනවා වගේ හඬක්.

"මොකක් ද?" මම ආපසු කෑගැසුවා.

"මගේ නැයන්ට හෙණ ගහපි!" පියඹා ආ පිඟානකින් බේරෙන්න කයිරොන් ඔළුව පාත් කරද්දී ඒක කොහෙදෝ වැදිලා බිඳෙන හඬ ඇසුණා. "ඇනබෙත්, ඔයාට තිබ්බේ පර්සිට කඳවුරෙන් පිටවෙන්න නොදී ඉන්න! ඒත් ඔයාලට රත් සළුව හම්බවුණොත්-"

"නියමයි, බබෝ!" කයිරොන්ට පිටුපසින් කවුදෝ කෑගැසුවා. "වූහ් - හෝ..!"

සංගීතයේ තීව්‍රතාවය කොයිතරම් වැඩි වුණා ද කියනවා නම් අපේ බෝට්ටුව පවා දෙදරන්න ගත්තා.

"-මියාමි," කයිරොන් මොරදෙමින් සිටියා. "සෝදිසියෙන් ඉන්න මම බලන්න- " අපේ මීදුම් තිරය කුඩුවුණේ හරියට එහා පැත්තේ සිටි කවුරුහරි ඒකට බෝතලයකින් දමලා ගැහුවා වගෙයි. කයිරොන්ව නොපෙනී ගියා.

ඊට පැයකට පසුව අපිට ගොඩබිමක් පේන්න ගත්තා- උස හෝටල් පෙළ ගැසුණු දිග වෙරළක්. මාළු බෝට්ටු සහ තෙල් පටවන නැව්වලින් වතුර ජනාකීර්ණ වුණා. අපිව පසු කරගෙන ගිය වෙරළාරක්ෂක බෝට්ටුවක රැකවලා, ආපසු බෝට්ටුව හරවා ගත්තේ අපිව හොඳින් බලාගන්න උවමනාවෙන් වගෙයි. මං හිතන්නේ පැයට නාවික සැතපුම් සියයක වේගයෙන් යන, එන්ජිමක් නැති කහ පාට ජීවිතාරක්ෂක බෝට්ටුවක් පදවන ළමයි තුන්දෙනෙක්ව දකින්න එයාට හැමදාම අවස්ථාවක් ලැබෙන්නේ නැතිව ඇති.

"ඒ වර්ජිනියා වෙරළ!" අපි වෙරළ අද්දරට ළං වෙද්දී ඇනබෙත් කිව්වා. "ඔහ්, දෙවියනේ, ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා එක රැකට මෙච්චර දුරක් ආවේ කොහොමද? ඒක හරියට-"

"නාවික සැතපුම් පන්සිය තිහක දුරක්," මම කිව්වා.

එයා කන්න වගේ මගේ දිහා බලන් හිටියා. "ඔයා කොහොමද දන්නේ?"

"ම-මටත් විශ්වාස නැහැ."

ඇනබෙත් මොහොතක් කල්පනා කළා. "පර්සි, අපේ පිහිටීම මොකක්ද?"



"අංශක 36න්, උතුරට විනාඩි 44යි; අංශක 76න්, බටහිරට විනාඩි 2යි." මම ඉක්මනින් කිව්වා. ඊට පස්සේ මම ඔළුව හෙල්ලුවා. "වාව්, මම කොහොමද ඒක දන්නේ?"

"ඔයාගෙ තාත්තා නිසා," ඇනබෙත් අනුමාන කළා. "මුහුදට බැස්සම ඔයාට දිශාව ගැන සම්පූර්ණ අවබෝධයක් තියෙනවා. ඒක නම් නියමයි."

මට නම් එහෙම හිතුණේ නැහැ. මොකද, මිනිස් මාලිමාවක් වෙන්න මට ඕනෑ වුණේ නැහැ. ඒත් මම කිසිවක් කියන්න කලින්, ටයිසන් මගේ උරහිසට තට්ටු කළා. "අනිත් බෝට්ටුව එනවා." මම හැරී බැලුවා. වෙරළාරක්ෂක බෝට්ටුව දැන් නම් අපිව ලුහුබඳිනවා වගෙයි. එහි එළි දැල්වෙමින්, වේගය වැඩි කරමින් ආවා.

"අපිව අල්ල ගන්න එයාලට ඉඩ දෙන්න බැහැ," මම කිව්වා. "එයාලා ඕනෑ නැති ප්‍රශ්න අහයි."

"චෙසපීක් බොක්කට දිගටම යමු," ඇනබෙත් කිව්වා. "අපිට හැංගෙන්න පුළුවන් තැනක් මම දන්නවා."

ඒ කතාවේ තේරුමවත්, මේ පළාත ගැන ඕච්චර හොඳට දන්නෙ කොහොමද කියලාවත් මම එයාගෙන් අහන්න ගියේ නැහැ. මම උණු වතුර බෝතලයේ පියන තව වුට්ටක් අරින අවදානම ගත්තා, ඒත් එක්කම පිට පැන්න නැවුම් හුළං ධාරාව වර්ජිනියා වෙරළේ උතුරු තුඩුව වටෙන් චෙසපීක් බොක්කට අපිව රොකට් වේගයෙන් රැගෙන ගියා. වෙරළාරක්ෂක බෝට්ටුව ඈත පිටුපසින් නැති වුණා. බොක්ක දෙපස වෙරළවල් පටුවන තුරුම අපි වේගය අඩු කළේ නැහැ. අපි ගං මෝය කටකින් ඇතුළු වූ බව මට තේරුණා.

කරදියේ සිට මිරිදියට මාරුවීම මට හොඳින්ම දැනුණා. හදිසියේම මට මහන්සියකුත් අබලන් ගතියකුත් දැනෙන්න ගත්තේ හරියට මගේ රුධිරයේ සීනි මට්ටම එකවර පහළ බැස්සා වගෙයි. මම ඉන්නේ කොහෙද කියලවත්, බෝට්ටුව ගෙන යායුත්තේ කොයි පැත්තට ද කියලාවත් තවදුරටත් මම දැන සිටියේ නැහැ. හොඳ වෙලාවට පාර කියන්න ඇනබෙත් හිටියා.

"අතන," එයා කිව්වා. "ඔය වැලි ඉවුර පහුවුණාම."

වගුරු තණවලින් වැසුණු ගොහොරු පෙදෙසකට අපි හැරුණා. යෝධ සයිප්‍රස් ගහක් පාමුල මම බෝට්ටුව ගොඩ කළා.

වැල්වලින් වැසුණු ගස් අපිට ඉහළින් අතුපතර විහිදාගෙන සිටියා. කැලයේ කුරුමිණියෝ හඬගෑවා. වාතයේ උණුසුම්, තෙත් බවක් ඇති කරමින් ගඟෙන් වාෂ්ප ඉහළ නැගුණා. සරලව කියනවා නම් මේ මැන්හැටන් නෙවෙයි, ඒ වගෙම මම මෙතැනට කැමති වුණේ නැහැ.

"මෙහෙට එන්න." ඇනබෙත් කතා කළා. "ඒක මේ ඉවුර පහළින්මයි තියෙන්නේ."

"මොකක්ද ඒ?" මම ඇසුවා.

"පාවුවෙ එන්නකෝ." එයා කැන්වස් මල්ලක් අතට ගත්තා. "අපි බෝට්ටුව වහලා දැම්මොත් හොඳයි. කාගෙවත් අවධානය ගන්න අපිට උවමනාවක් නැහැනේ."

කොළ අතුවලින් බෝට්ටුව වසා දැමුවාට පස්සේ ටයිසනුයි මමයි මඩේ කකුල් එරෙමින් ඇනබෙත් පසුපස ගියා. මගේ සපත්තුව උඩින් ලිස්සා ගිය සර්පයෙක් තණ පඳුරක් තුළට රිංගුවා.

"හොඳ තැනක් නෙවෙයි," කෑම පෝලිමක ඉන්නවා වගේ අතේ වහන මදුරුවෝ තලමින් ටයිසන් කිවුවා.

"මෙතන," විනාඩි කීපයකට පස්සේ ඇනබෙත් කිවුවා.

මට දකින්න ලැබුණේ කටු ඇඹිල්ල පඳුරක් විතරයි. ඒත් එක්කම ඇනබෙත් අතුවලින් වියූ රවුමක් පැත්තකට කළා, ඒක හරියට දොරක් වගෙයි. මම බලා ඉන්නේ ආවරණය කළ නවාතැනක් දිහා බව මට තේරුම් ගියා.

ඒක ඇතුළේ තුන්දෙනෙකුට සෑහෙන ඉඩක් තිබුණා- අඩු තරමේ තුන්වැන්නා ටයිසන් වුණත්. එහි බිත්ති සාදා තිබුණේ රතු ඉන්දියානු කූඩාරමක් වගේ තණ පඳුරුවලින් වුණත් ඒවාට වතුර නොඅල්ලන පෙනුමක් තිබුණා. කැලෑබද කඳවුරක ජීවත් වෙන්න උවමනා කරන හැම දෙයක්ම මුල්ලක ගොඩගසා තිබුණා- නිදන මලු, බ්ලැන්කට්ටු, අයිස් පෙට්ටියක් සහ භූමිතෙල් ලාම්පුවක්. එතැන උපදේවිවරුන්ගේ බඩුත් තිබුණා- ලෝකඩ හෙලිතුඩු, ඊතල පිරුණු කොපුවක්, අමතර කඩුවක් සහ ඇම්බ්‍රෝසියා පෙට්ටියක්. එතැනින් පුස් ගඳක් වහනය වුණේ දිගු කාලයක් පුරා හිස්ව තිබිලා වගෙයි.

"අර්ධ-ලෝහිත තිප්පොලක්," මම ඇනබෙත් දිහා බැලුවේ විමතියෙන්. "මෙතැන හැදුවෙ ඔයා ද?"

"තාලියයි මමයි," එයා හෙමීට කිවුවා. "ලූක්යි."



හරි නම් ඒක මට ප්‍රශ්නයක් නොවෙන්න ඕනැ. මං අදහස් කළේ, ඇනබෙත් පුංචි කාලේ තාලියා සහ ලූක් එයාව බලාගත් බව මම දැනගෙන හිටියා. ග්‍රෝවර් එයාලාව හොයාගෙන, අර්ධ-ලෝහිත කන්දට කැඳවාගෙන යන්න උත්සාහ කරන්න කලින් එයාලා එකටම පලායමින්, රාක්ෂයින්ගෙන් හැංගෙමින්, තනියම ජීවිත ගැටගහගත් බවත් මම දැන සිටියා. ඒ වුණත්, ඇනබෙත් එයාලා සමග ගතකළ කාලය සිහිපත් කරන හැම වෙලාවකම මට දැනුණේ... අනේ මන්දා, අපහසුකාරී හැඟීමක් ද?

නෑ. හරි වචනය ඒක නෙවෙයි.

ගැළපෙනම වචනය තමයි ඉරිසියාව.

"ඉතින්..." මම කිවුවා. "ලූක් අපිව හොයාගෙන මෙතැනට එයි කියලා ඔයා හිතන්නෙ නැද්ද?" එයා ඔළුව හෙල්ලුවා. "අපි මේ වගේ තැන් දුසිමක් විතර හදලා තියෙනවා. ලූක්ට අඩු තරමේ ඒවා තිබුණ තැන්වත් මතකද කියලා මට සැකයි. එයාට ඒවගෙන් වැඩක් නැහැ."

බ්ලැන්කට්ටු උඩට ඇද වැටුණු එයා, එයාගේ කැන්වස් මල්ල අවුස්සන්න ගත්තා. එයා හැසිරුණ විදිහෙන් මට පැහැදිලි වුණේ එයාට කතා කරන්න උවමනා නැති බවයි.

"මේ, ටයිසන්" මම කතා කළා. "ඔයා කැමති නැද්ද වටපිටාවේ ඔත්තු බලලා එන්න? හරියට, ළඟපාතක කැලෑ කඩයක් එහෙම තියෙනවද කියලා?"

"කැලෑ කඩයක්?"

"ඔව්. පොඩි පොඩි කෑම ටිකක් ගන්න. ඩෝනට්ස් එහෙම. හැබැයි ගොඩක් ඈතට යන්න නම් එපා."

"ඩෝනට්ස්," ටයිසන් උනන්දුවෙන් කිවුවා. "මම කැලේ ඩෝනට්ස් තියෙනවද බලන්න යනවා."

එයා කෑගසමින් එළියට ගියා, "ඩෝනට්ස්, මම එනවෝ!"

එයා ගියාට පස්සේ මම ඇනබෙත් ඉදිරියේ වාඩි වුණා. "හේයි, මට කණගාටුයි, ඔයා දන්නවනේ, ලූක්ව මුණගැහුණට."

"ඒක ඔයාගෙ වැරැද්දක් නෙවෙයි," කොපුවෙන් කිණිස්ස ඇදගත් එයා රෙදිකඩකින් ඒක පිරිසිදු කරන්න ගත්තා.

"එයා හරිම ලේසියෙන් අපිට පැනගන්න ඉඩ දුන්නා," මම කිවුවා.

ඒක මගේ හිතලුවක් විතරක් වේවා කියලා මම බලාපොරොත්තු වුණත්, ඇනබෙත් ඔළුව වැනුවා. "මමත් හිතහිතා හිටියේ ඒකම තමයි. සුදුවන් ගැන එයා කියනවා ඇහුණා මතක ද, 'එයාලා ඇම ගිලියි...' කියලා එයා කිවුවා. මං හිතන්නෙ එයා ඒ කිවුවේ අපි ගැන."

"රන් සළුව ද ඇම? නැත්නම් ග්‍රෝවර් ද?"

එයා පිහියේ මුවහත පරීක්ෂා කළා. "මං දන්නෑ, පර්සි. සමහරවිට එයාට රන් සළුව අයිති කරගන්න ඕනැ වෙලා ඇති. සමහරවිට එයා හිතනවා ඇති අපි අමාරු වැඩ ටික කළාම ඒක අපෙන් හොරකම් කරගන්න. මට තවමත් අදහගන්න බැරි එයා ගහට වස දැම්මා කියලා."

"ඇයි එයා කිවුවේ තාලියාත් එයාගෙ පැත්ත ගනී කියලා," මම ඇසුවා.

"එයා වැරදියි."

"ඔයා කියන්නෙ එච්චර විශ්වාසෙකින් නෙවෙයි වගේ."

ඇනබෙත් මට රවවා. එයා කිණිස්ස අතේ තියන් ඉන්න වෙලාවෙ ඒක ඇහුවේ අපරාදෙ කියලා මට හිතෙන්න ගත්තා.

"පර්සි, ඔයාව දකිද්දි මට වැඩියෙන්ම මතක් වෙන්නෙ කාවද දන්නව ද? තාලියාව. ඔය දෙන්නා කොච්චර එක වගේ ද කියනවා නම් ඒක බය හිතෙනවා. මං කිවුවේ, එක්කෝ ඔය දෙන්නා හොඳම යාළුවෝ වෙයි, නැත්නම් ඔයාලා දෙන්නා බෙලි මිරිකා ගනී."

"අපි 'හොඳම යාළුවෝ' වෙයි කියලා විතරක් හිතමු."

"තාලියා සමහර වෙලාවට එයාගේ තාත්තා ගැන කේන්ති ගන්නවා. ඔයත් එහෙමයි. ඒ හේතුව නිසා ඔයා ඔලිම්පස්වලට විරුද්ධව වැඩ කරනව ද?"

මම මුල්ලක වූ ඊතල කොපුව දෙස බලා සිටියා. "නැහැ."

"හරි, එහෙනම්. එයත් එහෙම නැහැ. ලූක් වැරදියි." ඇනබෙත් දූවිලි තුළට කිණිසි තලය බැස්සවූවා.

ලූක් මතක් කළ අනාවැකිය ගැනත්, මගේ දාසයවෙනි උපන් දිනය සමග එහි ඇති සම්බන්ධය ගැනත් මට අහන්න හිතුණා. ඒත් එයා ඒක කියන්නෙ නැති බව මට තේරුණා. දෙවිවරු තීරණය වෙනස්



කළොත් මිසක්, ඒක මට අහන්න අවසර නැහැ කියලා කයිරොන් පැහැදිලිවම කියලයි තිබුණේ.

"එතකොට, ලූක් සයික්ලොප්ස්ලා ගැන කියපු කතාවෙ තේරුම මොකක්ද?" මම ඇසුවා. "එයා කිවුවේ අනිත් හැමෝම අතරින් ඔයා-"

"එයා කිවුවේ මොකක්ද කියලා මං දන්නවා. එයා... එයා කතා කළේ තාලියාට මැරෙන්න වුණ නියම හේතුව ගැන." මොනවා කියන්න ද හිතාගන්න බැරුව මම බලා සිටියා.

ඇනබෙත් සැලෙන හුස්මක් ගත්තා. "ඔයාට කවදාවත් සයික්ලොප්ස් කෙනෙක්ව විශ්වාස කරන්න බැහැ, පර්සි. අවුරුදු හයකට කලින්, ග්‍රෝවර් අපිව අර්ධ-ලෝහිත කන්දට එක්කගෙන ගිය රෑ-"

එයාගෙ කතාවට බාධා කරමින් පැලේ දොර කිරිකිරි හඬින් ඇරුණා. ටයිසන් ඇතුළට බඩගෑවා.

"ඩෝනට්ස්!" එයා පේස්ට්‍රි පෙට්ටියක් පෙන්වූයේ ආඩම්බරෙන්.

ඇනබෙත් එයා දිහා පුදුමයෙන් බැලුවා. "ඔයාට කොහෙන්ද ඕක හම්බ වුණේ? අපි ඉන්නෙ මහ කැලයක් මැද. මේ ළඟපාත කොහෙවත්-"

"අඩි පනහක් දුරින්," ටයිසන් කිවුවා. "රාක්ෂ ඩෝනට් කඩයක්-කන්ද උඩ තියෙන්නේ!"

"මේක නම් හොඳ දෙයක් නෙවෙයි," ඇනබෙත් කෙඳිරුවා.

* * * * * *

අපි ගහක් පිටුපස වකුටුවෙලා, කැලේ මැද ඇති ඩෝනට් කඩේ දිහා බලන් හිටියා. දීප්තිමත්ව දැල්වෙන ජනේල, රථගාල සහ වනාන්තරයෙන් පිටට දිවෙන පුංචි පාරත් එක්ක ඒ කඩයට තිබුණේ අති නවීන පෙනුමක්. ඒත් වටපිටාවේ වෙන කවුරුවත් පේන්න හිටියේ නැහැ, රථ ගාලේ එකම වාහනයක්වත් නැහැ. අපිට දකින්න ලැබුණේ මුදල් කවුළුව පිටුපස සඟරාවක් කියවමින් සිටි එක සේවකයෙක් පමණයි. කඩය උඩ මට වුණත් කියවිය හැකි ලොකු, කළු අකුරින් නම ගසා තිබුණා: රාක්ෂ ඩෝනට්.

කාටුන් රාක්ෂයෙක් එහි 'ර' අකුරේ බෝලයෙන් කැල්ලක් කන්න වගේ හිටියා. එතැනින් හැමුවේ හොඳ සුවඳක්- හරියට දුන් පෝරණුවෙන් බැව වොකලට් ඩෝනට් වගෙයි.

"මේක මෙතැන තියෙන්න බැහැ," ඇනබෙත් රහසින් කිවුවා. "ඒක වැරදියි."

"මොකක්?" මම ඇහුවා. "ඒක ඩෝනට් කඩයක් නේ."

"ෂ්..ෂ්..!"

"ඔයා මොකද රහසින් කතා කරන්නේ? ටයිසන් ඒකෙන් දුසිමක්ම අරන් ආවේ. එයාට මුකුත් වුණායෑ."

"එයා රාක්ෂයෙක්."

"අයියෝ, මොකක්ද, ඇනබෙත්. රාක්ෂ ඩෝනට් කිවුවට ඒවා තියෙන්නෙ රාක්ෂයින්ට නෙවෙයි! ඒක කඩවල් ජාලයක්. නිව්යෝක්වලත් එකක් තියෙනවා."

"කඩවල් ජාලයක්," එයා එකඟ වුණා. "ඔයා ටයිසන්ට ඩෝනට්ස් ගේන්න කියපු ගමන් මේක මතුවුණ එක අමුතුයි කියලා හිතෙන්නැද්ද? මේ මහ කැලේ මැද හරියටම මෙතැනම?" මම ඒ ගැන කල්පනා කළා. ඒක ටිකක් අද්භූතයි වගේ පෙනුණා තමයි. ඒත්, මං කියන්නේ, ඩෝනට් කඩවල් කියන්නේ මගේ දුෂ්ට බලවේග ලැයිස්තුවේ උඩින්ම තිබුණ එකක් නෙවෙයි නේ.

"ඒක කූඩුවක් වෙන්න පුළුවන්," ඇනබෙත් විස්තර කළා.

ටයිසන් කෙඳිරිගෑවා. ඇනබෙත් කියූ දේවල් මට තේරුණ තරමටවත් ටයිසන්ට තේරුණාද කියලා මට විශ්වාස නැතත්, ඇනබෙත් කතා කළ ස්වරය එයාව කලබල කළා.

පෙට්ටියේ වූ ඩෝනට්ස්වලින් බාගයකටම වගකියපු එයාගේ කට වටේ සීනි කුඩු තට්ටුවක්ම තැවරී තිබුණා.

"මොන කූඩුවක්ද?" මම ප්‍රශ්න කළා.

"ප්‍රසිද්ධ ව්‍යාපාර ජාලවල ශාඛා බිම්මල් පිපෙනවා වගේ මතුවෙන්නේ කොහොමද කියලා ඔයාට කවදාවත් කල්පනා වෙලා නැද්ද?" එයා ඇහුවා. "ඊයේ හිස්ව තිබුණ තැන පහුවදා වෙද්දී අලුත් බර්ගර් කඩයක් හරි කෝපි ෂොප් එකක් හරි දාලා? ඉස්සෙල්ලම එක



කඩයයි, ඊට පස්සේ දෙකයි, ඊට පස්සේ හතරයි- එක වගේම කඩවල් රට පුරා පැතිරෙන්නෙ කොහොමද?"

"ම්, නෑ. මම කවදාවත් ඒ ගැන හිතුවෙ නෑ."

"පර්සි, සමහර ජාලයන් ගොඩාක් වේගයෙන් පැතිරෙන්නේ ඒවාගේ පිහිටුම් මායා බලයකින් රාක්ෂයෙකුගේ ජීව බලයකට සම්බන්ධ කරලා තියෙන නිසා. එක්දාස් නමසිය පනස් ගණන්වලදී හර්මීස්ගේ ළමයි කීපදෙනෙක් මේ ක්‍රමේ හොයාගත්තා. එයාලා බෝ කළා-"

එයවරම එයා ගල් ගැහුණා.

"මොකක්ද?" මම ප්‍රශ්න කළා. "මොකක්ද එයාලා බෝ කළේ?"

"හෙල්ලෙන්න එපා," ඇනබෙත් කිවුවේ එයාගේ ජීවිතය රැඳිලා තියෙන්නේ ඒක උඩ වගෙයි. "හෙමීට, අනිත් පැත්ත හැරෙන්න."

ඒත් එක්කම මට ඒක ඇහුණා: සීරෙන හඬක්, හරියට ලොකු සතෙකුගේ බඩ කොළ රොඩුවල ඇතිල්ලෙනවා වගෙයි. අනෙක් පැත්ත හැරුණ මට දකින්න ලැබුණේ රයිනෝ කෙනෙක් තරම් ලොකු සතෙක් ගස්වල හෙවණැලි යටින් එන හැටියි. සූ හඬ නැගූ සතාගේ ඉදිරි කය හැම දිසාවකටම ඇඹරෙමින් තිබුණා. මේ දකින්නේ මොකක්ද කියලා මට මුලින්ම තේරුම් ගන්න බැරි වුණා. ඌට බෙලි ගොඩාක් තියෙන බව මට තේරුම් ගියේ ඊටත් පස්සෙයි- අඩු තරමේ බෙලි හතක්වත් තිබුණු ඌට ඒ හැම බෙල්ලකම කෙළවර දිව දිගු කරමින් පිඹින සර්ප ඔළුව බැගින් තිබුණා. ඌට පදම් කළා වගේ හමකුත්, හැම බෙල්ලකම එල්ලූ 'මම රාක්ෂ ඩෝනට් ළමයෙක්!' සටහන් කළ ප්ලාස්ටික් බිබ් එක බැගිනුත් තිබුණා.

මම, මගේ බෝල්පොයින්ට් පෑන එළියට ගත්තා. ඒත් ඇනබෙත් නිහඬ අනතුරු ඇඟවීමක් එක්ක මගේ ඇස් දෙස එක එල්ලේ බැලුවා. දන්ම එපා. මට තේරුණා. හුඟක් රාක්ෂයින්ගේ ඇස් පෙනීම හරිම දුර්වලයි. සමහරවිට හයිඩ්‍රා (සර්ප ගති ලක්ෂණ ඇති පුරාණ ග්‍රීක ජලජ රාක්ෂයෙක්) අපිව නොදැකම යන්නත් ඉඩ තිබුණා. ඒත් මම දැන් කඩුව පිටට ගත්තොත්, ලෝකඩ දිස්නයට ඌගේ අවධානය යොමු වෙනවා. ඒ නිසා අපි බලා සිටියා.

හයිඩ්‍රා සිටියේ අඩි කීපයක දුරකින්. ඌ පොළොවත්, ගසුත් ඉව කරමින් ආවේ දඩයමක් හුහුබඳිනවා වගෙයි. ඒත් එක්කම මට දකින්න ලැබුණේ ඌගේ ඔළු දෙකක් දෙපසට අදිමින් තිබුණු කැන්වස් මල්ලයි-

අපේ ගමන් මලුවලින් එකක්. මේ සතා දැනටමත් අපේ තිප්පොලට ගිහිල්ලා. දැන් ඇවිත් තිබුණේ අපේ ඉව පසුපසයි.

මගේ පපුව පිටි කොටන්න ගත්තා. සංරක්ෂණය කළ හයිඩ්‍රා හිසක් මම කඳවුරේදී දැක තිබුණා. ඒත් මේ ඇත්ත සතා එක්ක බලද්දී ඒක මොකක්ද. උගේ හැම ඔළුවක්ම රැට්ල්ස්නේක් (විෂඝෝර ඇමරිකානු නයෙක්) වගේ දියමන්ති හැඩය ගත්තා, ඒත් උගේ කටවල් තුළ තිබුණේ මෝර දත් වගේ තියුණු, උල් දත් ගොඩක්.

ටයිසන් වෙවුලන්න වුණා. එයා අඩියක් පස්සට තියද්දී කකුලට පෑගුණ කෝටුවක් බිඳුණා, එසැණින්ම, ඔළු හතම අපේ පැත්තට හැරිලා පිඹින්න ගත්තා.

"අයින් වෙන්න!" මොර දුන් ඇනබෙත් දකුණු පැත්තට පැන්නා.

මම වම් පැත්තට පෙරළුණා. එක් හයිඩ්‍රා හිසක් විදින ලද කොළ පාට දියරයක් මගේ උරහිස ළඟින්ම ගොස් එල්ම් ගහක වැදුණා. ගහේ කඳ දුම් දමමින් කැලි ගැලවෙන්න ගත්තා. ඉදිරියේ සිටි රාක්ෂයා දකලා ගල් ගැහුණ ටයිසන්ගේ ඇඟට මුළු ගහම ඇද වැටෙන්න ගත්තා.

"ටයිසන්!" උපරිම වෙර දාලා එයා එක්ක පොර බැදුව මම හයිඩ්‍රා පනිද්දිම එයාව පැත්තකට තල්ලු කළා. හයිඩ්‍රාගේ ඔළු දෙකක් වප්ප කරමින් ගහ ඇද වැටුණා.

ආපස්සට පැකිළී වැටුණු හයිඩ්‍රා ඔළු දෙක ගස්සා ඉවත් කරගෙන, ඇද වැටුණු ගහත් එක්ක කේන්තියෙන් විලාප නැගුවා. ඔළු හතෙන්ම ඇසිඩ් පිට වෙද්දී, එල්ම් ගහ දුම් දමන කසළ ගොඩකට දියවී ගියා.

"අයින් වෙන්න!" ටයිසන්ට කියූ මම පැත්තකට දුව ගොස් රිප්ටයිඩ්ගේ කොපුව ගැලෙව්වේ රාක්ෂයාගේ අවධානය ගන්න බලාපොරොත්තුවෙන්.

ඒක වැඩ කළා.

හුඟක් රාක්ෂයින්ට දිව්‍යමය ලෝකඩ පෙනෙන්න බැහැ. මගේ දිලිසෙන කඩු තලය මතු වූ හැටියේම දත් විලිස්සා ඔළු ගෙඩි සියල්ලෙන්ම පිඹිමින් හයිඩ්‍රා මගේ ඉදිරියට පැන්නා. හොඳ ආරංචිය තමයි: ටයිසන් මොහොතකට අනතුරෙන් ගැලවුණා. නරක ආරංචිය: මම හොද්දක් වෙන්න කිට්ටු වුණා.



සතාගේ එක ඔළුවක් මාව පරීක්ෂා කරන්න වගේ හපා කන්න පැන්නා. මම දෙවරක් නොහිතා කඩුව වැනුවා.

"එපා!" ඇනබෙත් මොර දුන්නා.

පරක්කු වැඩියි. මම හයිඩ්‍රාගේ ඔළුව වෙන් වෙන්නම කපා දැමුවා. කසයක් වගේ වැනෙන බෙලි කොටය ඉතිරි කරමින් ඔළුව තණගොල්ලකට පෙරළී ගියා. ලේ ගැලීම ඉක්මනින්ම නැවතුණු තුවාලය බැලූනයක් වගේ ඉදිමෙන්න පටන් ගත්තා. තත්පර කීපයක් තුළදී බෙල්ල තුවාල වුණු තැනින් දෙකට බෙදිලා, සම්පූර්ණ ප්‍රමාණයේ බෙලි දෙකක් වුණා. දැන් මම බලා සිටියේ ඔළු අටක් ඇති හයිඩ්‍රාවෙක් දෙසයි.

"පර්සි!" ඇනබෙත් දොස් කිවුවා. "ඔයා මේ දැන් තවත් කොහේ හරි රාක්ෂ ඩෝනට් කඩයක් ඇරියා!" ඇසිඩ් පහරකින් බේරෙන්න මම අහකට පැන්නා.

"මම මේ මැරෙන්න යද්දි ඔයා වද වෙන්නේ ඒ ගැන ද? අපි මේකව මරන්නේ කොහොමද?"

"ගින්දර!" ඇනබෙත් කිවුවා. "අපිට ගින්දර ඕනෑ වෙනවා!" එයා ඒක කියද්දිම, මට කතන්දරේ මතක් වුණා. හයිඩ්‍රාගේ ඔළු වැඩීම නතර වෙන්නේ ඒක වර්ධනය වෙන්න කලින් බෙලිවලට ගිනි තැබුවොත් විතරයි. කොහොමහරි, හෙරකල්ස් කළේ එහෙමයි. ඒත් අපි ගින්දර කොහෙන් හොයන්න ද?

මම ගඟ දිහාවට පහු බහිද්දී හයිඩ්‍රා මාව លුහුබැන්දා.

මගේ වම් පැත්තට ආ ඇනබෙත් කිණිස්සෙන් දත් පහරවල් වලකමින් එක් ඔළුවක අවධානය ගන්න උත්සාහ කළා. ඒත් පොල්ලක් වගේ පැත්තකට වැනුණු තවත් ඔළුවක පහර වැදිලා ඇනබෙත් මඩ ගොඩකට වැටුණා.

"මගේ යාළුවන්ට ගැහුවොත් බලාගෙනයි!" දුවගෙන ආව ටයිසන් හයිඩ්‍රාත් ඇනබෙතුත් අතරට පැන්නා. ඇනබෙත් දෙපයින් නැගිටින අතරේ, ටයිසන් මිට් කරගත් අත්වලින් රාක්ෂයාගේ ඔළු වප්ප කරන්න ගත්තේ මට හිතාගන්නවත් බැරි වේගයකින්. ඒත් සදහටම හයිඩ්‍රාගෙන් ආරක්ෂා වෙන්න ටයිසන්ටත් බැරි වුණා.

ඇසිඩ් පහරවල් මග අරිමින්, හපාකන්න පනින ඔළු කපා දමන්නේ නැතිව පසෙකට හරවමින් අපි අඟලෙන් අඟල පසු බැස්සා.

ඒත් අපි මේ කරන්නේ මරණය කල් දැමීමක් විතරක් බව මම දැන සිටියා. අන්තිමේදී, අපිටත් අත්වැරදීමක් වේවි, ඊට පස්සේ ඌ අපිව මරා දමාවි.

ඒ වෙලාවේ මට අමුතු හඬක් ඇහුණා- වග්-වග්-වග්. මම මුලින්ම හිතුවේ ඒ මගේ හද ගැස්ම කියලයි. ඒක කොයිතරම් ප්‍රබල ද කියනවා නම් එයින් ගං ඉවුර පවා සෙලවුණා.

"මොකක්ද ඒ සද්දේ?" හයිඩ්‍රාගෙන් ඇස් ඉවතට නොගෙනම ඈනබෙත් කෑගැසුවා.

"වාෂ්ප එන්ජිමක්," ටයිසන් කිවුවා.

"මොකක්?" මගේ ඔළුවට උඩින් ගිය ඇසිඩ් පාරකින් බේරෙන්න මම පහත් වුණා.

ඒත් එක්කම අපිට පිටුපස ගඟෙන් හුරුපුරුදු ගැහැනු කටහඬක් ඇසුණා- "අතන! තිස්-දෙකේ තුවක්කුවක් ලෑස්ති කරන්ඩ!" හයිඩ්‍රාගෙන් ඇස් ඉවතට හරවන්න තරම් මම නිර්භීත නොවුණත්, අපිට පිටුපසින් ඉන්නා කෙනාව මම අනුමාන කළා හරි නම්, දැන් මගේ දෙපැත්තෙන්ම සතුරෝ ඉන්න බව මම තේරුම් ගත්තා.

ගොරෝසු පිරිමි හඬක් උත්තර දුන්නා, "එයාලා කිට්ටු වැඩියි, මැතිනිය!"

"වීරයෝ මකබැවුනදෙන්!" කෙල්ල කිවුවා. "සම්පූර්ණ හුමාල බලෙන් ඉස්සරහට යමු!"

"එහෙමයි, මැතිනිය!"

"කැමති වෙලාවක වෙඩි තියන්ඩ, කැප්ටන්!"

මට වඩා තත්පරේකින් පංගුවකින් ඈනබෙත් සිදුවන දේ තේරුම් ගත්තා. "පාත් වෙන්න!" එයා මොර දුන්නා.

පොළොව දෙරන 'බූම්' හඬක් ගඟ දෙසින් දෝංකාර දෙද්දී අපි බිම දිගාවුණා. ක්ෂණික එළි දහරාවකුත්, දුම් කඳකුත් එක්ක අපේ ඇස් ඉදිරියේම හයිඩ්‍රා පුපුරා ගියේ ජරා කොළ පාට සෙවෙල ගොඩකින් අපිව නාවමින්. සාමාන්‍ය රාක්ෂ පිළිවෙළටම ඒවාත් අපේ වැදුණු හැටියේම වාෂ්ප වුණා.

"ඊයා!" ඈනබෙත් බෙරිහන් දුන්නා.

"වාෂ්ප නැව!" ටයිසන් මොරදුන්නා.



ගං ඉවුර හරහා පෙරළී ගිය වෙඩි බෙහෙත් දුම් වලාවේ සැරට කහිමින් මම නැගිට්ටා. ගඟ පහළ සිටි අපි දෙසට දුර්වල එන්ජිමක බොල් හඬ නගමින් ඇදී ආවේ මෙතරම් කාලයකට මම දැකපු අමුතුම නැවයි. සබ්මැරීනයක් වගේ වතුරටම පහත් වී යාත්‍රා කළ එහි නැව් තට්ටුව යකඩ තහඩුවලින් සාදා තිබුණා. එහි මැද කාලතුවක්කු සඳහා දෙපසින් ලෝහ පතුරු සවි කළ ත්‍රපීසියාකාර හැඩ සන්නද්ධ කුටියක් තිබුණා. එය මුදුනේ කොඩියක් ලෙළ දුන්නා- ලේ රතු පසුබිමක ඇති වල් ඌරු ඔළුවක් සහ හෙල්ලයක්. නැව් තට්ටුවේ පෙළ ගැසී සිටියේ අළු පාට තිල ඇඳුමෙන් සැරසුණු පිල්ලි ටිකක්- හිස්කබල යාන්තමින් ආවරණය වෙන දිලිසෙන සමක් ඇති මැරුණු සොල්දාදුවෝ. හරියට පාතාල ලෝකයේ හේඩීස්ගේ මාලිගාව මුර කරන්න සිටි භූතයෝ වගෙයි.

ඒ නැවම යකඩ තහඩුවලින් ආවරණය කර තිබුණා. ඒක ලෝක යුද සමයේ යුද නැවක්. දිය සෙවෙල් බැඳුණු නැව් ඇණියේ පින්තාරු කර තිබුණු නම මට යාන්තමින් කියවා ගත හැකි වුණා: සී.එස්.එස්. බර්මින්ග්හැම්.

තව පොඩ්ඩෙන් අපිව කුඩු කරන්න ගිය දුම් දමන කාලතුවක්කුව ළඟ සම්පූර්ණ ග්‍රීක යුද සන්නාහයෙන් සැරසී සිටියේ ක්ලැරිස්. ''මැට්ටෝ," එයා විරිත්තුවා. "මට පේන්නේ මට ඔහේලව බේරගන්න වෙයි. නැවට නගිනවලා."

# 11

# ක්ලැරිස් හැමදේම පුපුරවා හැරියා

"ඔහෙලා ඉන්නෙ ලෝක අමාරුවක," ක්ලැරිස් කිවුවා.

අපි මැරුණු නාවිකයෝ පිරී ඉතිරෙන අඳුරු කාමර හරහා අපිට උවමනා නොවුණ 'නැව වටේ රවුමක්' ගිහින් ආවා විතරයි. අපිට ගල් අඟුරු ගබඩාව, බොයිලේරුව සහ දත් පුපුරයි වගේ ගොරවමින් දුම් පිඹින එන්ජිමත් දකින්න ලැබුණා. තව, නියමු කුටියත්, වෙඩි බෙහෙත් ගබඩාවත්, කාලතුවක්කු තට්ටුවත් (ක්ලැරිස් ආසම තැන) අපි දකබලා ගත්තා. ඒ තට්ටුවේ නැවේ වම්-දකුණු පැතිවලට මුහුණලා ඩාල්ග්‍රෙන් ස්මූත්බෝර් වර්ගයේ කාලතුවක්කු දෙකකුත්, ඉදිරි-පසු පැතිවලට මුහුණලා බෲක් වර්ගයේ අගල් නමයේ රයිෆල් තුවක්කුත් සවිකර තිබුණා. මේ හැම එකක්ම දිව්‍යමය ලෝකඩ උණ්ඩ වෙඩි තැබිය හැකිවීමට විශේෂයෙන් අලුත්වැඩියා කර තිබුණා.

අපි කොහැනට ගියත්, එතැන මැරුණු සෙබළු අපේ දිහා බලන් හිටියා. එයාලගේ හිස්කබල්වලට උඩින් රැවුල් වැවූ අවතාර මුහුණු දිලිසුණා. ඇනබෙත් ආවේ වර්ජිනියාවලින් කියලා දැනගත්තාම එයාලා ඇනබෙත්ව අනුමත කළා. මගේ නම ජැක්සන්- ඒ කියන්නේ හිටපු දක්ෂිණ ජනරාල් කෙනෙකුගේත් නම- කියලා දැනගත්තාම එයාලා මං ගැනත් උනන්දුවක් දක්වුවා. ඒත්, මම ආවේ නිව්යෝක්වලින් කියලා කියන්න ගිහින් මම ඒක විනාශ කරගත්තා. එයාලා හැමෝම පිඹිමින්, යැන්කියන්ට දෙස් දෙවොල් තියන්න ගත්තා.

ටයිසන් එයාලට ගොඩාක් බය වුණා. මුළු ගමන පුරාවටම එයාගේ අතින් අල්ලගෙන ඉන්න කියලා එයා ඇනබෙත්ට බල කළා. ඒත් ඇනබෙත් නම් ඒකට සතුටු වුණ පාටක් පෙනුණේ නැහැ.



අන්තිමේදී, අපිව රෑ කෑමට කැඳවාගෙන ගියා. සී.එස්.එස්. බර්මින්ග්හැම් කැප්ටන්ගේ කාමරය ලොකු අල්මාරියක් තරම් ඇති, ඒ වුණත් නැවේ ලොකුම කාමරය වුණේ එයයි. කෑම මේසය සුදු ලිනන් රෙදිවලිනුත් පිගන් බඩුවලිනුත් සරසා තිබුණා. පීනට් බටර් සහ ජෙලි සැන්ඩ්විච්, බැදපු අල පෙති සහ සිසිල් බීම අරන් ඇටසැකිලි නාවිකයෝ ආවා. භූතයෝ පිළිගන්වන කිසිම කෑමක් කන්න මට ඕනෑ වුණේ නැහැ. ඒත් මගේ බය පරදලා බඩගින්න උඩට ආවා.

"ටන්ටලස් ඔහේලව සදාකාලයටම පිටුවහල් කළා." ක්ලැරිස් උදාසීනව කිවුවා. "මිස්ටර් ඩී කිවුවා ඔහේලා එක්කෙනෙක් හරි කඳවුර පැත්ත පළාතෙ ආවොත් ඔහේලව ලේනුන්ට හරවලා, එයාගෙ කාර් එකෙන් යට කරලා දානවා කියලා."

"මේ නැව ඔයාට දුන්නේ එයාලද?" මම ඇසුවා.

"අපොයි නෑ. මගෙ තාත්තා දුන්නේ."

"ඒරිස්?"

ක්ලැරිස් විරිත්තුවා. "ඔහේ හිතන්නේ මුහුදේ බලය තියෙන්නේ ඔහෙගෙ තාත්තට විතරයි කියලද? හැම යුද්ධයකම පරදින පිලේ ආත්ම ඒරිස්ට ණයගැතියි. ඒක තමයි පැරදුණාට එයාලට ලැබෙන ශාපය. මුහුදු යන්න නැවක් දෙන්න කියලා මං තාත්තට යාඥා කළාම එයා මේක දුන්නා. මේ කට්ටිය මම කියන ඕනෑම දෙයක් කරනවා. එහෙම නේද, කැප්ටන්?"

පිටුපසින් සිටගෙන සිටි කැප්ටන්ට තිබුණේ දරදඬු හා තරහා ගිය පෙනුමක්. එයාගේ දිලිසෙන කොළ පාට ඇස් දෙක කෑදර රැවීමක් එක්ක මගේ ළඟ නතර වුණා. "ඒකෙන් මේ එපා කරපු යුද්ධය ඉවරයක් වෙනවා නම්, මැඩම්, අන්තිමේදී සාමය ලැබෙනවා නම්, අපි ඕනෑම දෙයක් කරනවා. ඕනෑම කෙනෙක්ව විනාශ කරනවා."

ක්ලැරිස් හිනාවුණා. "'ඕනෑම කෙනෙක්ව විනාශ කරනවා.' මං ඒකට කැමතියි."

ටයිසන් මහ හඬින් ගිල්ලා.

"ක්ලැරිස්," ඇනබෙත් කතා කළා. "ලූක් රන් සළුව හොයනවා වගෙයි. අපි එයාව දැක්කා. එයාට ඛණ්ඩාංක ලැබිලා, දත් දකුණට යනවා. එයාට රාක්ෂයෝ පුරවපු සංචාරක නැවක් තියෙනවා-"

"නියමයි! මං එයාව වතුරේදීම කුඩු කරනවා."

"ඔයාට තේරෙන්නෑ." ඇනබෙත් කිව්වා. "අපි අපේ බලය එකට එකතු කරන්න ඕනෑ. ඔයාට උදවු කරන්න අපිට ඉඩ දෙන්න."

"නෑ!" ක්ලැරිස් මේසයට ගැහුවා. "මේක මගේ ගවේෂණය, පණ්ඩිත ආච්චී! අන්තිමේදී වීරයෙක් වෙන්ඩ මටත් අවස්ථාවක් ලැබුණා, ඒක මගෙන් හොරකම් කරගන්ඩ ඔහේලා දෙන්නට බැහැ."

"කෝ ඔයාගෙ කැබින් එකේ අනිත් අය?" මම ඇහුවා. "තව යාළුවෝ දෙන්නෙක් හවුල් කරගන්න ඔයාට අවසර ලැබුණා, නේද?"

"එයාලා ආවේ... මං එයාලව තියලා ආවා. කඳවුර ආරක්ෂා කරන්ඩ."

"ඔයා කියන්නේ, ඔයාගෙම කැබින් එකේ අයවත් ඔයාට උදවු කරන්නේ නැද්ද?"

"කට වහගන්නවා, ප්‍රිසී! මට උන්ව ඕනෑ නෑ! ඔහේලව ඕනැත් නෑ!"

"ක්ලැරිස්," මම කිව්වා. "ටන්ටලස් ඔයාව පාවිච්චි කරනවා. එයාට කඳවුරෙන් වැඩක් නෑ. අපි විනාශ වෙනවා දකින්න එයා හරිම කැමති ඇති. ඔයාගේ වැඩේ වරදින තැනට එයා සැලසුම් හදලා."

"නෑ! ඔරකල් කිව්ව ඒවා මං ගණන් ගන්නෑ- " එයා, එයාවම නවතාගත්තා.

"මොකක්ද?" මම ඇහුවා. "ඔරකල් ඔයාට මොනවද කිව්වේ?"

"මුකුත් නෑ." ක්ලැරිස්ගේ කන් දෙක රෝස පාට වුණා. "මම මේ ගවේෂණය සම්පූර්ණ කරනවා, ඒ වගේම මම ඔහේලගේ උදවු ගන්නෑ කියන එක විතරක් දැනගත්තම ඇති. අනිත් අතට, මට ඔහේලට යන්ඩ අරින්නත් බැහැ..."

"එතකොට, අපි සිරකාරයෝද?" ඇනබෙත් ඇහුවා.

"අමුත්තෝ, දැනට." සුදු ලිනන් මේස රෙද්ද උඩ කකුල් තියාගත් ක්ලැරිස් තවත් සිසිල් බීම බෝතලයක් විවෘත කළා. "කැප්ටන්, මෙයාලව පහළට අරන් යන්ඩ. එයාලට නිදන මැදිරියේ හැමොක් ඇඳන් වෙන් කරලා දෙන්ඩ. එයාලා හැසිරෙන්ඩ දන්නෙ නැත්නම්, අපි හතුරු ඔත්තුකාරයන්ට සලකන විදිහ එයාලට පෙන්වන්ඩ."

* * * * * *



මම නින්දට වැටුණු හැටියේම හීන මාව හොයාගෙන ආවා.

ග්‍රෝවර් රෙදි වියන යන්ත්‍රය ළඟ වාඩිවෙලා, කලබලෙන් මංගල සළුවේ නූල් ලිහද්දී, දොරට තැබූ ගල් කුට්ටිය පසෙකට තල්ලු කරපු සයික්ලොප්ස් ගිගුරුවා, "අහා!"

ග්‍රෝවර් බයෙන් කෑගැහුවා. "රත්තරන්! මම නෙවෙයි- ඔයා සද්ද නැතුව ආවනේ!"

"නූල් ලිහනවා!" පොලිෆීමස් ගෙරෙව්වා. "එහෙනම් ඒක තමයි ප්‍රශ්නේ!"

"ඔහ්, නෑ. ම-මම එහෙම කළේ නෑ-"

"එනවා!" ග්‍රෝවර්ගේ ඉණෙන් අල්ලාගත් පොලිෆීමස් ගල් ගුහාවේ ලෙන් හරහා එයාව බාගෙට ඔසවාගෙන, බාගෙට ඇදගෙන ගියා. ග්‍රෝවර්, එයාගේ කුර දෙක අඩි උස සපත්තු තුළ රඳවාගන්න දඟලුවා. එයාගේ වේල්පට ගැලවෙන්න ඔන්න-මෙන්න වගේ ඔළුවේ පැත්තක එල්ලෙමින් තිබුණා.

බැටළු සුන්බුන්වලින් සැරසූ, බඩු ගබඩාවක් තරම් විශාල ලෙනකට සයික්ලොප්ස් එයාව ඇදගෙන ගියා. එතැන බැටළු ලොම්වලින් වැසූ හාන්සි පුටුවකුත්, බැටළු ලොම්වලින් ආවරණය කළ රූපවාහිනියකුත්, හැඩයක් නැති රාක්කයක ඇසිරූ බැටළු සිහිවටන- බැටළු මුහුණක හැඩය ගත් කෝපි මග්, බැටළු ආකෘති, බැටළු ක්‍රීඩා පුවරු සහ පින්තූර පොත් තිබුණා. එහි පොළොව බැටළු ඇටකටු සහ තවත් ඇටකටුවලින්- පෑන්ව සොයා දූපතට ආ සැටර්ලාගේ ඇටකටුවලින් හැඩිවී තිබුණා.

තවත් යෝධ ගල් කුට්ටියක් පසෙකට කරන්න විතරක් පොලිෆීමස් ග්‍රෝවර්ව බිමින් තැබුවා. දහවල් එළිය ගුහාව තුළට ගලා එද්දී ග්‍රෝවර් ආසාවෙන් කෙඳිරි ගෑවා. නැවුම් වාතය!

සයික්ලොප්ස් එයාව ඇදගෙන ගියේ මේ තරම් කාලයකට මට දකින්න ලැබුණු ලස්සනම දූපත හොඳින්ම දැකබලාගත හැකි කඳු මුදුනකටයි.

එයට තිබුණේ පොරොවකින් දෙකට කැපූ සෑදලයක පෙනුමක්. එහි දෙපස සාරවත් කොළ පාට කඳු ගැට දෙකකුත්, මැදින් පළල් නිම්නයකුත් තිබුණා. නිම්නය මැද වූ ගැඹුරු පැල්ම දෙපසින් යා කරමින් ලණු පාලමක් එල්ලුණා. ආගාධයේ කෙළවරට ගලාගිය

ලස්සන දිය දහරා දෙදුනු පාට දිය ඇලි ලෙසින් පහළට ඇද හැළුණා. ගස් අතර හිරවුන් පියාඹුවා. රෝස සහ දම් පාට මල් පඳුරුවල පිපී තිබුණා. තණ පිටිවල උලා කමින් සිටි සිය ගාණක් බැටළුවන්ගේ ලොම් තඹ සහ රිදී කාසි වගේ අසාමාන්‍ය ලෙස දිස්නය දුන්නා.

දූපත මැද, ළඳු පාලම ළඟම වූ ඇඹරී ගිය ඕක් ගහේ පහළම අත්තේ යමක් දිලිසුණා.

රන් බැටළු ලොම් සළුව.

එහි බලය දූපත පුරා පැතිරෙමින් තණකොළවල කොළ පැහැයත්, මල්වල ලස්සනත් වැඩි කරන ආකාරය මට සිහිනයෙන් පවා දැනුණා. සොබාදහම් මායාව ක්‍රියා කරන සුවඳත් මට දැනුණා. මේ සුවඳ සැටර් කෙනෙකුට කොයි තරම් තදින් දැනෙනවා ඇති ද, මට හිතාගන්න පුළුවන් වුණා.

ග්‍රෝවර් කෙඳිරි ගෑවා.

"ඔව්," පොලිෆිමස් ආඩම්බරයෙන් කිවුවා. "අතන දැක්ක ද? මගේ එකතුවේ වටිනාම දේ තමයි රන් සළුව! කාලෙකට කලින් වීරයන්ගෙන් හොරකම් කරගත්තා, එදා ඉඳන්- කෑම නොමිලේ! ලෝකෙ වටේම ඉන්න සැටර්ලා මෙහෙට ඇදෙන්නේ ගින්දරට ඇදෙන සලබයෝ වගේ. සැටර්ලා හොඳ කෑමක්! එතකොට දැන්-"

පොලිෆිමස් නපුරු පෙනුමක් ඇති ලොම් කපන ලෝකඩ කතුරු කුට්ටමක් අහුලා ගත්තා.

ග්‍රෝවර් බයෙන් කෑගැසුවා, ඒත් ළඟ සිටි බැටළුවෙක්ව පුළුන් පිරවූ සෙල්ලම් සතෙක් වගේ අතට ගත් පොලිෆිමස් ඌගේ ලොම් බූගෑවා. එයා ඒ ලොම් ගොඩ ග්‍රෝවර් අතින් තැබුවා.

"ඔය ටික නූල් කටින රෝදෙට දාන්ඩ!" එයා ආඩම්බරයෙන් කිවුවා. "මැජික්. ආයේ අවුල් වෙන්නේ නෑ."

"ඔහ්... හොඳයි නේ..."

"පව් මගේ නෝනී පොඩ්ඩ!" පොලිෆිමස් විරිත්තුවා. "වියන්ඩ දන්නෑ. හා-හා! දුක් වෙන්ඩෙපා. ඔය නූල් ප්‍රශ්නේ විසඳයි. හෙට වෙද්දී මඟුල් සළුව ඉවර කරනවා!"

"ඒක නම්... මොළේ ඇති වැඩක්!"

"හී-හී!"



"ඒත් - ඒත්, රත්තරන්," ග්‍රෝවර් කඳින් කෙළ ගිල්ලා. "කවුරුහරි මේ දූපතට බේරගන්න... මං කිවුවේ මේ... පහර දෙන්න ආවොත්?" ග්‍රෝවර් කෙලින්ම මගේ දෙස බලද්දී, එයා ඒක ඇසුවේ මගේ ප්‍රයෝජනයට බව මම දැනගත්තා. "එයාලා ඔයාගේ ගල් ගුහාවටම කඩාගෙන-බිඳගෙන එන එක කොහොමද නවත්වන්නේ?"

"නෝනි බයවෙලා! හරී ෂෝයි! බය වෙන්ඩෙපා! පොලිෆිමස්ට හොඳ ආරක්ෂක පද්ධතියක් තියෙනවා. එයාලට මගේ හුරතල්ලු පහු කරගෙන එන්ඩ වෙනවා."

"හුරතල්ලු!"

ග්‍රෝවර් දූපත හරහා බැල්මක් හෙළුවත්, සාමකාමීව උලා කන බැටළුවෝ හැර වෙන මොකෙක්වත් පේන්න තිබ්බේ නැහැ.

"ඊට පස්සේ," පොලිෆිමස් ගෙරෙව්වා, "එයාලට මාවත් පහු කරගෙන එන්ඩ වෙයි!" එයා අත මිටි කරලා ළඟ වූ ගලට ගැසුවාම, ඒක ඉරිතලා දෙකට පැළුණා. "දැන්, එනවා!" එයා කෑගැසුවා. "ආපහු ගුහාවට!"

ග්‍රෝවර් හිටියේ දත් අඩන්න වගෙයි- නිදහස අත ළඟම තිබුණත්, බලාපොරොත්තු තියාගන්න බැරි තරම් දුරයි. ගඳ ගහන සයික්ලොප්ස් ගුහාව ඇතුළේ පන්දම් එළි පමණක් දැල්වෙන අන්ධකාරය තුළ එයාව හිර කරමින් ගල් දොර වැසී යද්දී ග්‍රෝවර්ගේ ඇස්වල කඳුළු පිරුණා.

නැව පුරාම අනතුරු අඟවන සීනු නාදවන හඬට මම ඇහැරුණා.

කැප්ටන්ගේ රළු හඬ: "හැමෝම නැව් තට්ටුවට වරෙල්ලා! ක්ලැරිස් මැතිනියව හොයපල්ලා! කොහෙද ඒ කෙල්ල!" ඒ වෙලාවේ හොල්මන් මූණක් මට උඩින් මතුවුණා. "නැගිටිනවා, යැංකියා. ඔහේගේ යාළුවෝ දැනටමත් උඩට ගිහින් ඉවරයි. අපි ඇතුළුවීමට ළං වෙනවා."

"මොකට ඇතුළුවීම ද?"

එයා මට ඇටසැකිලි හිනාවක් පෑවා. "රාක්ෂ සයුරට. ඇත්ත වශයෙන්ම."

මම හයිඩ්‍රාගෙන් බේරුණු මගේ අඩුම-කුඩුම ටික ඔලොගුවකට දමා කරේ එල්ලා ගත්තා. මොන විදිහෙන් හෝ මම තවත් රැයක් නම්

Scanned with CamScanner

සී.එස්.එස්. බර්මින්ග්හැම් හි ගත නොකරාවී කියන සැකය මගේ හිතට මෝදුවී තිබුණා.

උඩ තට්ටුවට යන අතරේ යම් කිසි දෙයකට මාව උත් තැනම ගල් ගැසුණා. ළඟපාතකින් දුනුණු හුරුපුරුදු හා අප්‍රසන්න දෙයක්, කිසිම හේතුවක් නැතිව මට රණ්ඩුවකට පැටලෙන්න ඕනෑ වුණා. මට මැරුණු සොල්දාදුවෙක්ගේ හොම්බට අනින්න හිතුණා. මේ විදිහේ කේන්තියක් මට අන්තිම වතාවට දැනුණේ... ඉහළට යනවා වෙනුවට, වා කවුළුව අද්දරට බඩගා ගිය මම බොයිලේරු තට්ටුවට එබී බැලුවා.

මට කෙලින්ම පහළින් සිටගෙන සිටි ක්ලැරිස් බොයිලේරුවෙන් පිටවෙන වාෂ්පවලින් සැදුණු රූපයකට කතා කරමින් සිටියා- මෝටර් බයිසිකල්කරුවන් අඳින කළු ලෙදර් ඇඳුමකින් සැරසී, කලවයක පිහියක් බැඳගෙන, රතු පාට අව් කණ්ණාඩි දමාගත්, හමුදා මෝස්තරයට කොණ්ඩය කැපූ හැඩිදැඩි කෙනෙක්.

මගේ අත් මිට මෙළවුණා. එයා තමයි මට පේන්නම බැරි ඔලිම්පියානුවාඃ ඒරිස්, යුද්ධයට අධිපති දෙවියා.

"මට සමාවට කාරණා ඕනෑ නෑ, පුංචි කෙල්ල!" එයා ගර්ජනා කළා.

"ඔ-ඔව්, තාත්තේ," ක්ලැරිස් කෙඳිරුවා.

"මට කේන්ති යනවා දකින්න ඔහේට ඕනෑ නෑ, නේද?"

"නෑ, තාත්තේ."

"සෑ, තාත්තේ," ඒරිස් ඇද කළා. "ඔහේ වැඩකට නැහැ. මට තිබුණේ මගේ පුතාලගෙන් කෙනෙක්ව මේ ගවේෂණයට යවන්න."

"මම දිනනවා!" ක්ලැරිස් වෙවුලන හඬින් පොරොන්දු වුණා. "මම ඔයාට ආඩම්බර හිතෙන විදිහට වැඩ කරනවා."

"එහෙම කරනවා නම් තමයි හොඳ," එයා අනතුරු ඇඟෙව්වා. "ඔහේමයි මේ ගවේෂණය මගෙන් ඉල්ලුවේ, කෙල්ලේ. අර මෝඩ ජැක්සන් කොලුවට ඒක ඔහේගෙන් අරගන්න ඔහේ ඉඩ දුන්නොත්-"

"ඒත් ඔරැකල් කිවුවේ-"

"ඒකා මොනවා කිවුවත් මට කමක් නෑ!" ඒරිස් කොයිතරම් තදින් ගිගුරුවා ද කියනවා නම් එයාගේ රූපය පවා සැලුණා. "ඔහේ මේකෙන් දිනනවා. එහෙම නොකළොත්..." එයා තර්ජනාංගුළිය



පෙන්නුවා. එයා හුමාලයෙන් සැදුණ රූපයක් පමණක් වුණත් ක්ලැරිස් බයෙන් ඇකිළුණා.

"දැන් අපි එකිනෙකාව තේරුම් ගත්ත ද?" ඒරිස් ගෙරෙව්වා.

අනතුරු ඇඟවීමේ සීනු නැවතත් නාද වුණා. කටහඬවල් මගේ පැත්තට එනවාත්, කාලතුවක්කු සූදානම් කරන්න නියෝග කරමින් නිලධාරියෝ මොර දෙනවාත් ඇසුණා.

වා කවුළුව ළඟින් ආපස්සට බඩගෑ මම උඩ තට්ටුවේ සිටි ඇනබෙත්ට සහ ටයිසන්ට එකතු වුණා.

"මොකක්ද ප්‍රශ්නේ?" ඇනබෙත් මගෙන් ඇසුවා. "තවත් හීනයක් ද?" මම ඔළුව වැනුවත්, මුකුත් කියන්න ගියේ නැහැ. පහළදී දකින්න ලැබුණු දේ ගැන මොනවා හිතන්න ද කියලා මට තේරුණේ නැහැ. මම ග්‍රෝවර් ගැන දකපු හීනය තරමටම එයත් මගේ හිතට වධ දුන්නා. මගේ පිටුපසින්ම වගේ ක්ලැරිසුත් උඩට ආවත්, එයා දෙස නොබලා ඉන්න මම උත්සාහ කළා. පිල්ලි නිලධාරියෙක් අත තිබුණු දුර බලන කණ්ණාඩියක් උදුරාගත් එයා ක්ෂිතිජය දෙස බැලුවා. "ඇති යන්තම්. කැප්ටන්, සම්පූර්ණ හුමාල බලෙන් ඉස්සරහට යමු!"

එයා බලමින් සිටි ඉසව්වට ඇස් යොමු කළත් මට ඒ තරම් දෙයක් පෙනුණේ නැහැ. අහස වලාකුළින් වැහිලා. වාතයේ තෙත් සහ මීදුමෙන් බර ගතියක් තිබුණේ හරියට රත් වූ යකඩයකින් නැගෙන වාෂ්ප වගෙයි. තදින්ම ඇස් වපර කර බැලුවොත් විතරක් ඈතින් ඈති ලොකු, අඳුරු පැල්ලම් දෙකක් දැකගන්න මට හැකි වුණා.

මගේ නාවික දැනීම මට කිවුවේ අපි උතුරු ෆ්ලොරිඩා වෙරළෙන් මෙපිට කොතැනක හෝ ඉන්න බවයි. ඒ කියන්නේ එක රැයකට අපි සෑහෙන දුරක් ඇවිල්ලා, කිසිම මනුෂ්‍ය නැවකට යාත්‍රා කරන්න බැරි තරම් දුරක් ඇවිල්ලා. අපේ වේගය වැඩි කරද්දී එන්ජිම කෙඳිරිගෑවා.

ටයිසන් බයෙන් වගේ කොඳුරන්න ගත්තා, "පිස්ටන්වල පීඩනය වැඩියි. ගැඹුරු වතුරට හදපුවා නෙවෙයි." එයා ඒක දැනගත්තේ කොහොමද මට විශ්වාස නැතත්, එයින් මමත් කලබල වුණා.

තවත් විනාඩි කීපයකට පස්සේ අපිට ඉදිරියෙන් වූ අඳුරු ලප දෙක ඇස් මානයට ආවා. උතුරු දෙසින්, යෝධ ගල් කුළක් සාගරයෙන් ඉහළට නැගී සිටියා- අඩු තරමේ අඩි සියයක්වත් උස ප්‍රපාතයක් ඇති

දූපතක්. ඊට සැතපුම් බාගයක් විතර දකුණින් වූ අනෙක් අඳුරු ලප වුණේ කැකැරෙන කුණාටුවක්. එතැන අහසත් සයුරත් එකට පැසවමින් ගිගුම් දුන්නා.

"කුණාටුවක්?" ඇනබෙත් ඇසුවා.

"නෑ," ක්ලැරිස් කිවුවා. "කැරිබ්ඩිස්."

ඇනබෙත් සුදුමැලි වුණා. "ඔයාට පිස්සු ද?"

"රාක්ෂ සයුරට යන්න තියෙන එකම පාර. කෙලින්ම කැරිබ්ඩිසුයි, එයාගේ සහෝදරී ස්කයිලායි මැදින්." ක්ලැරිස් ප්‍රපාතය මුදුනට අත දිගු කළා. ඊත් එක්කම මට හැඟුණේ මට මුණගැහෙන්න ඕනෑ නැති කෙනෙක් එතැන ජීවත් වෙන බවයි.

"ඒ එකම පාර කියලා ඔයා කිවුවේ ඇයි?" මම ඇසුවා. "මුහුද හැම පැත්තෙන්ම ඇරිලා තියෙන්නේ! එයාලා වටෙන් ගියාම ඉවරයි නේ." ක්ලැරිස් ඇස් කැරකුවා.

"ඔහේ කිසිම දෙයක් දන්නැද්ද? මම එයාලා වටෙන් යන්ඩ හැදුවොත්, එයාලා ආයෙමත් මගේ පාරෙන් මතුවෙයි. රාක්ෂ සයුරට ඇතුළු වෙන්ඩ ඕනෑ නම්, එයාලා මැදින් යන්ඩම වෙනවා."

"එතකොට හැප්පෙන ගල් පර්වත?" ඇනබෙත් ඇසුවා. "ඒක තවත් දොරක් නේ. ජේසන් පාවිච්චි කළේ ඒක."

"මගේ කාලතුවක්කුවලින් ගල් පුපුරුවන්න බැහැ," ක්ලැරිස් කිවුවා. "අනෙක් අතට, රාක්ෂයෝ..."

"ඔයාට නම් පිස්සු," ඇනබෙත් තීරණය කළා.

"බලන් ඉඳලා ඉගෙන ගන්ඩ, පණ්ඩිත ආච්චි." ක්ලැරිස් කැප්ටන් දෙසට හැරුණා. "කැරිබ්ඩිස් පැත්තට හරවන්ඩ!"

එන්ජිම මහ හඬින් ගෙරෙව්වා, යකඩ තහඩු වෙවුලුවා. ඊත් එක්කම නැවේ වේගය වැඩිවෙන්න ගත්තා.

"ක්ලැරිස්," මම කතා කළා, "කැරිබ්ඩිස් මුහුද උරලා බොනවා. එහෙම නේද කතාවෙ තියෙන්නේ?"

"ඊට පස්සේ ආපහු එළියට වමාරනවා, ඔව්."

"එතකොට ස්කයිලා?"



"අර පර්වතේ මුදුනේ ගල් ගුහාවක එයා ජීවත් වෙන්නේ. අපි ගොඩක් ළඟට ගියොත්, එයාගේ සර්ප ඔළු පහළට දික්වෙලා, නැවේ ඉන්න අයව උදුරන්න පටන් ගනී."

"එහෙනම් මම තෝරගන්නේ ස්කයිලාව," මම කිවුවා. "හැමෝම පහළ තට්ටුවේ හැංගිලා, එතැන පහු කරන්න අපිට පුළුවන්."

"නෑ!" ක්ලැරිස් තදින්ම කිවුවා. "ස්කයිලාට අපිව ලේසියෙන් කන්න බැරිවුණොත් එයා අපේ නැවම ගිලින්ඩ ඉඩ තියෙනවා. ඇරත්, එයා ඉන්නේ හොඳ ඉලක්කයක් ගන්ඩ බැරි තරම් උසක. මගේ කාලතුවක්කුවලින් එච්චර උඩට වෙඩි තියන්ඩ බැහැ. කැරිබ්ඩිස් කරන්නේ එයාගේ සුළිය මැද ඉඳගෙන ඉන්න එක විතරයි. අපි කෙලින්ම එයාගේ ඉස්සරහට ගිහිල්ලා, අපේ තුවක්කුවලින් එයාව වාටරස්වලටම යන්ඩ කුඩු කරනවා!"

එයා ඒක රස කරමින් කියූ විදිහට මටත් එයාව විශ්වාස කරන්න ඕනෑ වුණා.

එන්ජිම කංකෙදිරි ගෑවා. බොයිලේරු ගිනියම් වෙලා මගේ දෙපතුල් යටින් නැව් තට්ටුව පවා රත් වෙනවා මට දැනුණා. දුම් කවුළු දුම් රැලි පිඹබා. රතු පාට ඒරිස් කොඩිය සුළඟේ ලෙළ දුන්නා. අපි රාක්ෂයින්ට ළං වෙද්දී, කැරිබ්ඩිස්ගේ හඬ ටිකෙන් ටික වැඩි වුණා-හරියට මේ මන්දාකිණියේ ලොකුම වැසිකිළියට වතුර දානවා වගේ භයානක ගර්ජනයක්. කැරිබ්ඩිස් ඉහළට අදින හැම වතාවකම නැව වෙවුලා ඉදිරියට ඇදුණා. එයා පහළට හෙළන හැම වතාවකදීම අපිව වතුරෙන් උඩට එසවිලා, අඩි දහයක් උස රැළිවල හැප්පුණා.

දිය සුළියට ගතවන කාලය ගණනය කරන්න මම උත්සාහ කළා. මට තේරුම් ගිය තරමට, සැතපුම් බාගයක අරයක ඇති සෑම දෙයක්ම උරාගෙන විනාශ කරන්න කැරිබ්ඩිස්ට ගතවුණේ විනාඩි තුනක පමණ කාලයක්. එයාව මග අරින්න නම්, අපිට ස්කයිලාගේ ගල් පර්වතය අද්දරටම යන්න වෙනවා. ඒ වගේම, ස්කයිලා කොච්චර නරකයි කිවුවත්, මට නම් ඒ ගල් පර්වත හොඳයි හිතුණා.

මළවුන්ගෙන් නැගිටපු නාවිකයෝ නැව් තට්ටුව හරහා සන්සුන්ව එයාලගේ වැඩවලට ගියා. මීට කලිනුත් පැරදුණු පිලට සටන් කරලා තිබුණ නිසා, ඒක එයාලට ප්‍රශ්නයක් නොවෙන්න ඇති කියලා මම අනුමාන කළා. එහෙම නැත්නම් සමහරවිට, එයාලා දැනටමත් මැරිලා ඉන්න නිසා ආයෙමත් විනාශ වුණාට කමක් නැතුව ඇති. ඒ

Scanned with CamScanner

එක සිතුවිල්ලකින්වත් මගේ හිත සැනසුනේ නම් නැහැ. මගේ ළඟින්ම සිටගත් ඇනබෙත් අත්වැට අල්ලා ගත්තා. "ඔයාගේ තුළං පුරවපු උණු වතුර බෝතලේ තාම තියෙනව ද?" මම ඔළුව වැනුවා.

"ඒත් මේ වගේ සුළියක් ළඟදී ඒක පාවිච්චි කරන එක ගොඩාක් අනතුරුදායකයි. තුළගෙන් මේක තවත් නරක අතට හැරෙන්න ඉඩ තියෙනවා."

"වතුර පාලනය කරන්න බැරි ද?" එයා ඇහුවා. "ඔයා පොසෙයිඩන්ගේ පුතා නේ. ඔයා මීට කලිනුත් එහෙම කරලා තියෙනවා."

එයා කිවුවා හරි. ඇස් වසාගත් මම මුහුද සන්සුන් කරන්න උත්සාහ කළා. ඒත් මට සිත එකඟ කරගන්න බැරි වුණා. කැරිබ්ඩිස් ගොඩාක් ඝෝෂාකාරියි වගේම කලබලකාරියි. ඉතින් මුහුදු රළ මට ප්‍රතිචාර දක්වූයේ නැහැ.

"ම-මට බැහැ," මම දුකෙන් කිවුවා.

"අපිට වෙන සැලසුමක් ඕනෑ," ඇනබෙත් කිවුවා. "මේක හරි යන පාටක් නෑ."

"ඇනබෙත් හරි," ටයිසන් කිවුවා. "එන්ජිම හොඳ නෑ."

"ඒ කිවුවේ?" ඇනබෙත් ඇසුවා.

"පීඩනය. පිස්ටන් හරිගස්සන්න ඕනෑ."

එයාට විස්තර කරන්න අවස්ථාවක් ලැබෙන්න කලින් විශ්වයේ ලොකුම වැසිකිළිය මහා ගොරොද්දයක් නගමින් වතුර ඇදලා ගත්තා! නැව ගැස්සී ඉදිරියට ඇදෙද්දී මාව නැව් තට්ටුවට විසිවුණා. අපිව දිය සුළියට හසුවෙලා.

"සම්පූර්ණයෙන්ම ආපස්සට!" ක්ලැරිස් ඝෝෂාවට ඉහළින් බෙරිහන් දුන්නා. නැව් තට්ටුවට ඉහළින් රැළි නංවමින් අපි වටේටම මුහුද කැලතුණා. ගිනියම් වී තිබුණු යකඩ තහඩුවලින් දුන් හුමාලය පවා නැගෙන්න ගත්තා. "අපිව වෙඩි තියන්න තරම් කිට්ටුවට ගෙනියනවා! දකුණු පැත්තේ කාලතුවක්කු ලෑස්ති කරනවා!"

මැරුණු සෙබළු ඉදිරියටත් පසුපසටත් කඩිමුඩියේ දිව්වා. අවර පෙත්ත ආපස්සට කරකවමින්, නැවේ ගමන බාල කරන්නට උත්සාහ කළත් අපිව දිගටම සුළියේ මැදට ලිස්සා ගියා.



ඇතුළු දොරෙන් පිටට පැන්න පිල්ලි හැවියෙක් ක්ලැරිස් ළඟට දිව්වා. එයාගේ අළු පාට නිල ඇඳුමෙන් දුම් දැමුවා. එයාගේ රැවුලටත් ගිනි ඇවිළිලා. "බොයිලේරු කාමරේ ඕනෑවටත් වඩා රත් වෙනවා, මැඩම්! ඒක පුපුරන්නයි යන්නේ!"

"හොඳයි, එහෙනම් පහළට ගිහිල්ලා ඒක හරිගස්සනවා!"

"බැහැ!" නාවිකයා මොරදුන්නා. "ඒ රස්නෙට අපිව වාෂ්ප වෙනවා." ක්ලැරිස් සන්නද්ධ කුටියේ බඳට ගැසුවා. "අපිට ඕනෑ තව විනාඩි දෙක තුනක් විතරයි! වෙඩි වදින සීමාවට ළං වෙනකල් විතරයි!"

"අපි යන වේගය හොඳටෝම වැඩියි," කැප්ටන් සැර පරුෂ ලෙස කිවුවා. "මැරෙන්න ලෑස්ති වෙනවලා."

"නෑ!" ටයිසන් ගර්ජනා කළා. "මට ඒක හදන්න පුළුවන්."

ක්ලැරිස් විශ්වාස නොකරන බැල්මෙන් එයා දිහා බැලුවා. "ඔහේ?"

"එයා සයික්ලොප්ස් කෙනෙක්," ඇනබෙත් කිවුවා. "එයා ගින්දරට ඔරොත්තු දෙනවා. එයා මිකැනික් වැඩත් දන්නවා."

"යනවා!" ක්ලැරිස් මොර දුන්නා.

"ටයිසන්, එපා!" මම එයාගේ අතකින් අල්ලා ගත්තා. "ඒක ගොඩක් අනතුරුදායකයි!" එයා මගේ අතට තට්ටුවක් දැමුවා. "මේක තමයි එකම විදිහ, සහෝදරයා." එයාගේ මුහුණෙන් පළවූ අධිෂ්ඨානය සහ විශ්වාසය මුසු පෙනුම මීට කලින් කවදාවත් මම එයාගෙන් දැකලා තිබුණේ නැහැ. "මම ඒක හදලා, ඉක්මනට ආපහු එන්නම්." ගිනි ගන්නා නාවිකයා පසුපස එයා නැව තුළට යද්දී මට භයානක හැඟීමක් දැනෙන්න ගත්තා. මට එයා පස්සේ දුවන්න ඕනෑ වුණා, ඒත් නැව ආයෙමත් ඉදිරියට ගැස්සුණා- ඒත් එක්කම මම කැරිබ්ඩිස්ව දැක්කා. යාර සිය ගාණකට ඈතින් මීදුමෙන් සහ වතුරෙන් සෑදුණු දිය සුළිය මැද එයා සිටියා. මුලින්ම මට දකින්න ලැබුණේ ගල් පරයක්- කළු පාට කොරල්වලින් සෑදුණ පර්වතය උඩ අත්තික්කා ගසක් එල්ලී තිබුණා, මේ දිය සුළිය මැදට නොගැළපෙන, සාමකාමී දෙයක්. ඒක වටේටම වතුර පුනීලයක් වගේ කැරකුණේ හරියට කළු කුහරයකට ආලෝකය ඇදී යනවා වගෙයි. ඊට පස්සේ, දිය ඉමට පහළින් කොරල් පරයේ එල්ලී සිටි භයානක සතාව මට දකින්න ලැබුණා- සෙවෙල බැඳුණු තොල් සහ ඔරුවක් තරම් ලොකු සෙවෙල බැඳුණු දත් ඇති අති විශාල

කටක්. ඊටත් වඩා නරක වුණේ මළ බැඳී දිරාපත් වූ ලෝහ සමග මාළු කැලි, ලී කැලි සහ පාවෙන කුණු ගොඩවල් ඒ දත් අතර සිරවී තිබීමයි.

කැරිබ්ඩිස් කියන්නේ දත් දොස්තර කෙනෙකුගේ නරක හීනයක් වගෙයි. එයාට තිබුණේ කළු පාට යෝධ කෑම බොක්කක් සහ ඇද වුණ, බොල්ලෑ දත් පේළි දෙකක් විතරයි. සියවස් ගාණක් පුරාවට එයා කරලා තිබුණේ කෑමෙන් පසු දත් මදින්නේ නැතිව කන එක විතරයි. මම බලා ඉද්දිම වටේ තිබුණු මුහුද හිස් වෙන්නම එයා උරාගත්තා- මෝරු, මාළු රැන්, යෝධ දැල්ලෙක්. තවත් තත්පර ගාණකින් සී.එස්.එස්. බර්මින්ග්හැම්ටත් අත් වෙන්නේ ඒ ඉරණම ම බව මට තේරුණා.

"ක්ලැරිස් මැතිනිය," කැප්ටන් කෑගැසුවා. "දකුණු පැත්තෙයි ඉස්සරහයි තුවක්කු ලෑස්තියි!"

"වෙඩි තියනවා!" ක්ලැරිස් නියෝග කළා.

රාක්ෂයාගේ කෑම බොක්ක ඉලක්ක කර වෙඩිමුර තුනක් තිකුත් වුණා. එක් වෙඩිල්ලකින් ඉදිරි දතක කෙළවරක් කැඩී ගියා. තවත් උණ්ඩයක් ගල නාළය තුළ නොපෙනී ගියා. ග්‍රාහකයක රැඳුණු තුන්වෙනි උණ්ඩය ආපසු අපේ පැත්තටම විදුණේ ඊරිස්ගේ කොඩිය කණුවෙන්ම කඩා දමමින්.

"ආපහු!" ක්ලැරිස් නියෝග කළා. කාලතුවක්කුකරුවෝ නැවතත් වෙඩි බෙහෙත් පිරෙව්වත්, එය වැඩකට නැති බව මම දැන සිටියා. රාක්ෂයාට දැනෙන තරමේ හානියක් කරන්න නම් තවත් වෙඩි සියයක්වත් තියන්න වෙයි, ඒත් අපිට ඒතරම් කාලයක් තිබුණේ නැහැ. අපිව අධිවේගයෙන් කටට ඇදී යමින් තිබුණා.

ඒ වේලාවේ නැව් තට්ටුවේ වෙවුලීම වෙනස් වුණා. එන්ජිමේ හඬ ශක්තිමත් සහ ඒකාකාර වුණා. නැව ගැස්සී, කටෙන් ඈතට ඇදෙන්න පටන් ගත්තා.

"ටයිසන් ඒක කළා!" ඇනබෙත් කිවුවා.

"ඉන්න!" ක්ලැරිස් කිවුවා. "අපි කිට්ටුවෙන්ම ඉන්ඩ ඕනෑ!"

"අපිට මැරෙන්න වෙයි!" මම කිවුවා. "අපි මෙතැනින් ඈතට යන්න ඕනෑ."

උරා ඇදගැනීමට විරුද්ධව නැව සටන් කරද්දී මම අත්වැට තදින් අල්ලා ගත්තා. කැඩුණු ඊරිස් කොඩිය අපිව පසු කරගෙන විසි වී ගිහින් කැරිබ්ඩිස්ගේ දත් කුණු අතර ලැගුම් ගත්තා. අපිට වැඩි දුරක්



ඉදිරියට යන්න බැරි වුණත් අඩු තරමේ අපි එක තැන රැදී සිටියා. නැව උරාගන්න නොදී රඳවාගන්න අවශ්‍ය තරම් බලය ටයිසන් අපිට ලබා දී තිබුණා.

එක්වරම, කට සම්පූර්ණයෙන් වැසී ගියා. මුහුද මුළුමනින්ම නිසල වුණා. කැරිබ්ඩිස් වතුර යටට ගියා.

ඊට පස්සේ වැසුණු වේගයෙන්ම වගේ කට පුපුරා හැලෙමින් ආපසු ඇරුණේ මහ වතුර කඳකුත්, අපේ කාලතුවක්කු උණ්ඩ ඇතුළු කෑමට නුසුදුසු සියල්ලත් පිටට විදිමින්. විසි වී ආ එක් කාලතුවක්කු උණ්ඩයක් සී.එස්.එස්.බර්මින්ග්හැම්ගේ පැත්තක වැදුණේ සැණකෙළි ක්‍රීඩාවක සීනුවක් වගේ 'ඩින්ග්' හඬ නගමින්. අපිව ආපස්සට තල්ලු කළ රළ ගෙඩිය අඩුම තරමින් අඩි හතළිහක්වත් උස් වෙන්න ඇති. නැව නොපෙරළී තියාගන්න මම, මගේ මුළු අධිෂ්ඨාන ශක්තියම පාවිච්චි කළා. ඒත් අපි තවමත් පාලනයක් නැතිව කැරකෙමින්, සමුද්‍ර සන්ධියේ අනෙක් පැත්තේ වූ ගල් පර්වතය දෙසට විසිවෙමින් සිටියා.

ඒ අතරේ තවත් ගිනිගත්තා නාවිකයෙක් දුවගෙන ඇවිත් ක්ලැරිස්ගේ ඇගේ හැපුණු වේගයට තව පොඩ්ඩෙන් දෙන්නවම නැවෙන් පිටට වැටෙනවා. "එන්ජිම පුපුරන්නයි යන්නේ!"

"ටයිසන් කොහෙ ද?" මම තදින් ඇසුවා.

"තවම පහළ," නාවිකයා කිවුවා. "කොහොමදෝ ඒක රඳවගෙන ඉන්නවා, ඒත් කොච්චර වෙලාවකට ද කියලා නම් මම දන්නෙ නෑ."

"අපිට නැව අත අරින්න වෙනවා," කැප්ටන් කිවුවා.

"නෑ!" ක්ලැරිස් මොරදුන්නා.

"අපිට වෙන කරන්න දෙයක් නෑ, මැතිනිය. නැව් කඳ දැනටමත් පුපුරන්න පටන්ගෙන! ඒක තවත්- " එයාට වාක්‍ය සම්පූර්ණ කරන්න ලැබුණේ නැහැ. විදුලි වේගයෙන් අහසින් පහළට ආ දුඹුරු, කොළ පාට යමක් කැප්ටන්ව ඩැහැගත්තා. ඉතුරු වුණේ එයාගේ ලෙදර් බූට් ජෝඩුව විතරයි.

"ස්කයිලා!" සේලරුවෙක් මොරදෙද්දී, කඳු බෑවුමෙන් පහළට විදුණු තවත් සර්ප කඳක් එයාවත් ඩැහැගත්තා. ඒක කොයිතරම් වේගයෙන් සිදුවුණා ද කියනවා නම්, රාක්ෂයෙක් දිහා බලන් ඉන්නවට වඩා ලේසර් කිරණ කඳක් දිහා බලන් ඉන්නවා වගෙයි දැනුණේ. විදුලි

වේගයෙන් එන-යන දත් සහ කොරපොතු ගොඩක් ඇර සතාගේ මුහුණවත් බලාගන්න මට ඉඩක් ලැබුණේ නැහැ.

රාක්ෂයා තවත් නාවිකයෙක් අරගෙන යද්දී රිප්ටයිඩ් අරන් පහර දෙන්න මම උත්සාහ කළත් මම ඒ සතාට වඩා ගොඩාක් මන්දගාමියි.

"හැමෝම පහළට යන්න!" මම මොර දුන්නා.

"අපට බැහැ!" ක්ලැරිස් කඩුව ඇදලා ගත්තා. "පහළ තට්ටුව ගිනි ගන්නවා."

"ජීවිතාරක්ෂක බෝට්ටුවලට!" ඇනබෙත් කිවුවා. "ඉක්මන් කරන්න!"

"ඒවාගෙන් ගල් කන්ද පහු කරන්න අපිට කවදාවත් බැරි වෙයි." ක්ලැරිස් කිවුවා. "අපි හැමෝවම කාලා දායි."

"ඒත් අපිට උත්සාහ කරලා බලන්න වෙනවා. පර්සි, උණු වතුර බෝතලේ."

"මට ටයිසන්ව දාලා යන්න බැහැ!"

"අපි බෝට්ටු ලැස්ති කරගන්න ඕනෑ!"

ක්ලැරිස් ඇනබෙත්ගේ අණ පිළිපැද්දා. තවත් සේලරුවෝ දෙන්නෙක් සමග එයා හදිසි ආපදා බෝට්ටු දෙකෙන් එකක කවරය ගලවන අතරේ, උල්කා වැස්සක් වගේ අහසෙන් පාත්වෙන ස්කයිලාගේ ඔළු නාවිකයෝ එකින් එකාව ගොදුරු කරගත්තා.

"අනිත් බෝට්ටුව ගන්න." මම ඇනබෙත්ට උණු වතුර බෝතලය දුමුවා. "මම ටයිසන්ව හොයාගෙන එන්නම්."

"ඔයාට බැහැ!" එයා කිවුවා. "රස්නෙට ඔයාව අඟුරු වෙයි!" ඒත් මම ඇහුම්කන් දුන්නේ නැහැ. මම බොයිලේරු කාමරයේ දොර දෙසට දිව්වා. ඒත් එක්වරම මගේ කකුල් නැව් තට්ටුවෙන් ඉහළට එසවුණා. මම කෙලින්ම උඩට පියාඹමින් සිටියා. මගේ කන් තුළ සුළඟ උරුවම් බාද්දී, ප්‍රපාතයේ බිත්තිවල හැපෙන තරමට මම කිට්ටු වුණා.

කොහොමහරි ස්කයිලා මගේ ඔලොගුවෙන් මාව අල්ලගෙන, එයාගේ බෙනය දෙසට ඔසවමින් සිටියා. මම දෙවරක් නොසිතාම මගේ කඩුව පසුපසට කරකවා සතාගේ කහ පාට පබළු ඇහැකට ඇන්නා. ගෙරවූ රාක්ෂයා මාව අත ඇරියා.



මම සිටියේ අඩි සියයක් විතර ඉහළ වාතයේ නිසා, පහළට වැටීම සෑහෙන දරුණු වෙන්න තිබුණා. ඒත් මම වැටෙන අතරේ පහළින් සී.එස්.එස්. බර්මින්ග්හැම් පුපුරා ගියා.

ඩෝංංංංං!!

එන්ජින් කාමරය පුපුරා යද්දී යකඩ තහඩු කොටස් හැම පැත්තටම පියඹා ගියේ ගිනියම් වූ තටු වගෙයි.

"ටයිසන්!" මම මොර දුන්නා.

නැවෙන් ඉවත් වෙන්න ජීවිතාරක්ෂක බෝට්ටුවලට හැකිවී තිබුණත් ඒවා ගොඩාක් ඈතට ගොස් තිබුණේ නැහැ. ගිනි ගත්තා සුන්බුන් වැසි වැස්සා. ක්ලැරිස් සහ ඇනබෙත් කුඩු වෙන්න ඇති, නැත්නම් පිච්චෙන්න ඇති. එහෙමත් නැත්නම් ගිලෙන නැව් කඳේ බලයට හසුවෙලා මුහුදු පතුලට ඇදී යන්න ඇති. එහෙම හිතන්න වෙන්නෙත් එයාලා ස්කයිලාගෙන් ගැලවුණා කියලා සුභවාදීව හිතුවොත් විතරයි.

ඊට පස්සේ මට වෙනත් විදිහක පිපුරුමක් ඇසුණා- හර්මීස්ගේ මායා උණු වතුර බෝතලය ඕනෑවට වඩා වැඩියෙන් විවර කළ හඬ. ජීවිතාරක්ෂක බෝට්ටු සීසීකඩ විසුරුවමින් පිට පැන්න සුදු පාට හුළං ධාරා වැටෙමින් සිටි මාව ඔසවා, මුහුද හරහා වේගයෙන් ඉදිරියට තල්ලු කළා. මට කිසිම දෙයක් නොපෙනී ගියා. මම වාතයේ කරණම් ගසද්දී මගේ ඔළුව මොකකදෝ තදින් වැදුණා. ඊට පස්සේ මාව වතුරේ හැපුණු වේගයට, මම සමුද්‍ර දෙවියන්ගේ පුතා නොවුණා නම් ඇගේ හැම ඇටයක්ම කුඩු වෙන්න තිබුණා.

මට අන්තිමට මතක: ටයිසන් සදහටම යන්න ගිය නිසා, මටත් ගිලිලා මැරෙන්න පුළුවන්කම තිබුණා නම්, සිතමින් ගිනි ගන්න මුහුද තුළට මම කිඳා බැස්ස හැටියි.

Scanned with CamScanner

# 12

# අපි සී.සී. ගේ ස්පා ඇන්ඩ් රිසෝර්ට් හි නවාතැන් ගත්තා

අළු පාට නිල ඇඳුම් රෙදිවලින් මැසූ රුවලක් ඇති බෝට්ටුවක් තුළ මම ඇහැරුණා. සුළඟට රුවල් හරවමින් ඇනබෙත් මගේ ළඟම සිටියා.

හිඳගන්න උත්සාහ කරද්දි මට ඉසේ කරකැවිල්ලක් දැනුණා.

"විවේක ගන්න," එයා කිවුවා. "ඔයාට ඒක ඕනෑ වෙනවා."

"ටයිසන්..."

එයා ඔළුව හෙල්ලුවා. "පර්සි, මට හරිම දුකයි."

රළවලින් අපිව ඉහළ-පහළ ගැස්සෙද්දි අපි නිහඬව සිටියා.

"එයා ජීවිතේ බේරගන්න ඇති," එයා විශ්වාසයක් නැතිව කිවුවා. "මං කිවුවේ, ගින්දරට එයාව මැරෙන්නෙ නෑනේ." මම ඔළුව වැනුවත්, ඒ ගැන බලාපොරොත්තු ඇති කරගන්න තරම් හේතුවක් මට පෙනුණේ නැහැ. පිපුරුමට හසු වූ ඝන යකඩ තහඩු පවා ඉරී යනවා මට දකින්න ලැබුණා. ටයිසන් සිටියේ පහළ බොයිලේරු කාමරයේ නම් එයාගේ ජීවිතය බේරෙන්න කිසිම අවස්ථාවක් නැහැ. එයා අපි වෙනුවෙන් ජීවිතය පූජා කළා, ඒත් මගේ සිහියට නැඟුණේ මම එයාව ලැජ්ජාවට කාරණයක් කර ගත් හැටි සහ අපි දෙන්නා සහෝදරයෝ බව ප්‍රතික්ෂේප කළ හැටි විතරයි.

මුහුදු රැල්ල හෙමින් හෙමින් බෝට්ටුවේ වැදුණා. සුන්බුන් අතරින් බේරාගන්නට හැකි වූ දේවල් ඇනබෙත් මට පෙන්වූවා-



හර්මීස්ගේ උණු වතුර බෝතලය (දැන් මුළුමනින්ම හිස්), ඇම්බ්‍රෝසියා පිරවූ වතුර නොයන මල්ලක්, නාවිකයන්ගේ කමිස දෙකක් සහ සිසිල් බීම බෝතලයක්. මාව සයුරෙන් ගොඩට බාගත් එයාට ස්කයිලාගේ දත් පහරට ඉරුණු මගේ ඔලොගුවත් සොයාගන්න හැකි වී තිබුණා. මගේ බඩු බොහෝමයක් ගසාගෙන ගිහින් තිබුණත්, හර්මීස් දුන් විටමින් බෝතලය තවමත් ඉතිරිව තිබුණා. ඒ වගේම රිප්ටයිඩ් මගේ ළඟ තිබුණා. මම ඒක කොහේ නැති කරගත්තත් ඒ බෝල්පොයින්ට් පෑන ආපසු මගේ කලිසම් සාක්කුවේ මතු වුණා.

අපි පැය ගාණක් යාත්‍රා කළා. දැන් අපි රාක්ෂ සයුරේ සිටි නිසා, වතුර හයිඩ්‍රාගේ ඇසිඩ් වගේ දීප්තිමත් කොළ පාටින් බැබළුණා. හමා ආ සුළඟේ ලුණු මිශ්‍ර නැවුම් සුවඳක් තිබුණත්, එයට අමුතු ලෝහමය ගඳකුත් මුසු වී තිබුණේ හරියට අකුණු කුණාටුවක් ළඟ එනවා වගෙයි. නැත්නම් ඊටත් වඩා අනතුරුදායක දෙයක්. අපි යා යුතු දිශාව මම දැන සිටියා. අපේ ගමනාන්තයේ සිට හරියටම නාවික සැතපුම් එකසිය දහතුනක් බටහිරෙන් අපි සිටින බවත් මම දැන සිටියා. ඒත් එයින් මට දැනුණු අතරමං වූ හැඟීම අඩු වුණේ නම් නැහැ. අපි කොයි දිසාවට හැරුණත්, ඉර කෙලින්ම මගේ ඇස් ඇතුළේ දිලිසෙනවා වගෙයි පෙනුණේ. අපි, අපිට පුළුවන් තරමින් රුවලේ සෙවණැල්ලට මුවාවෙලා, බීම බෝතලයෙන් උගුර බැගින් මාරුවෙන් මාරුවට පානය කළා. ඒ අතරේ මම දැකපු ග්‍රෝවර්ගේ අලුත්ම හීනය ගැන අපි කතා කළා.

ඇනබෙත්ගේ ගණනය කිරීම්වලට අනුව ග්‍රෝවර්ව හොයාගන්න අපිට තිබුණේ තවත් පැය විසි හතරකටත් අඩු කාලයක්. ඒකත්, මගේ හීනය නිවැරදියි කියලත්, සයික්ලොප්ස් පොලිෆිමස්ගේ හිත වෙනස් වෙලා කලින්ම ග්‍රෝවර්ව කසාද බැඳගන්න තීරණය නොකරාවි කියලත් හිතුවොත් විතරයි.

"ඔව්," මම ඉවසගන්න බැරි දුකෙන් කිවුවා. "ඔයාට කවදාවත් සයික්ලොප්ස් කෙනෙක්ව විශ්වාස කරන්න බැහැ නේ." ඇනබෙත් සයුර දෙසට ඇස් හරවාගත්තා. "මට කණගාටුයි, පර්සි. මම ටයිසන් ගැන හිතුව විදිහ වැරදියි, හොඳ ද? එයාට ඒක කියන්න තිබුණා නම් කියලා මට හිතෙනවා."

දිගටම එයා එක්ක තරහෙන් ඉන්න මම උත්සාහ කළත්, ඒක ලේසි වුණේ නැහැ. අපි දෙන්නා ගොඩක් දේවල්වලට එකට මුහුණදීලා

තිබුණා. එයා බොහෝ වතාවක් මගේ ජීවිතය බේරලා තිබුණා. ඉතින්, එයා එක්ක අමනාප වෙලා ඉන්න එක මං කරන අලුත්ම තේරුමක්.

මම, අපේ වැදගැම්මකට නැති දේපොළ දෙසට බැල්මක් හෙළුවා- හිස් හුළං- උණු වතුර බෝතලය, විටමින් පෙති බෝතලය. තාත්තා ගැන කියන්න මම උත්සාහ කළ වේලාවේ ලූක්ගේ මුහුණට ආ වියරු කේන්තිය මට සිහි වුණා.

"ඇනබෙත්, කයිරොන්ගේ අනාවැකිය මොකක් ද?"

එයා තොල් දෙක තද කරගත්තා. "පර්සි, මට ඒක කියන්න-"

"මං දන්නවා. ඒක මට කියන්නෑ කියලා කයිරොන් දෙවිගොල්ලන්ට පොරොන්දු වුණා. ඒත් ඔයා එහෙම පොරොන්දුවක් වෙලා නෑ, නේ?"

"දැනුම හැමවෙලාවෙම ඔයාට හොඳක් කරන්නේ නෑ."

"නුවණට අධිපති ඔයාගේ අම්මා නේ!"

"මං දන්නවා! ඒත් අනාගතය ගැන දැනගත්ත හැම වීරයෙක්ම ඒක වෙනස් කරන්න උත්සාහ කරනවා, ඒත් ඒක කවදාවත් හරියන්නෙ නෑ."

"මම ලොකු වුණාම කරන දෙයක් ගැනයි දෙවිවරු වද වෙන්නේ." මම අනුමාන කළා. "මට අවුරුදු දාසය වුණාම කරන දෙයක් ගැන."

ඇනබෙත් අතේ තිබුණු යැන්කි කැප් එක ඇඹරුවා. "පර්සි, මමත් සම්පූර්ණ අනාවැකියම දන්නෙ නෑ. ඒත් ඒකෙන් අනතුරු අඟවනවා ලොකු තුන්කට්ටුවේ අර්ධ-ලෝහිත දරුවෙක්- ඊළඟට අවුරුදු දාසය පිරෙනකම් ජීවත් වෙන දරුවා ගැන. දෙවෙනි ලෝක යුද්ධයෙන් පස්සේ සියුස්, පොසෙයිඩන්, හේඩීස් තුන්දෙනා ආයේ ළමයි හදන්නේ නැහැ කියලා දිවුරුම් දෙන්න ඇත්තටම හේතුව වුණෙත් ඒකයි. ලොකු තුන්කට්ටුවේ අවුරුදු දාසය ලබන ඊළඟ දරුවා භයානක ආයුධයක් වෙනවා."

"ඒ ඇයි?"

"මොකද, ඒ වීරයා ඔලිම්පස්වල අනාගතය තීරණය කරනවා. දෙවිවරුන්ගේ යුගය ආරක්ෂා කරනව ද, නැත්නම් විනාශ කරනව ද කියන තීරණය 'ඔහු හෝ ඇය' අතේ රැඳෙනවා."



මම එය සිතට කාවදින්න ඉඩ හැරියා. සාමාන්‍යයෙන් මට මුහුදු කලන්තය හැදෙන්නේ නැති වුණත්, හදිසියේම මට අසනීප ගතියක් දැනෙන්න ගත්තා. "එහෙනම්, ගිය ගිම්හානෙදි ක්‍රෝනොස් මාව මැරුවෙ නැත්තෙ ඒකයි."

එයා ඔළුව වැනුවා. "එයාට ඔයාව සෑහෙන ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්. ඔයාවත් එයාගේ පැත්තට එකතු කරගන්න එයාට පුළුවන් වුණොත්, දෙවිවරු ලොක අමාරුවක වැටෙනවා"

"ඒත් අනාවැකියේ කියන්නේ මං ගැනම නම්-"

"අපිට ඒක දැනගන්න ලැබෙන්නේ ඔයා තව අවුරුදු තුනක් ජීවත් වුණොත් විතරයි. අර්ධ-ලෝහිතයෙක්ට ඒකත් සෑහෙන ලොකු කාලයක්. කයිරොන් මුලින්ම තාලියා ගැන දැනගත්තට පස්සෙ, අනාවැකියෙ ඉන්නේ එයා කියලා හිතුවා. අන්න ඒ නිසයි තාලියාව පරිස්සමින් කඳවුරට ගේන්න එයා දත කෑවේ. ඒත් එයා සටනකින් මැරෙන්න වැටිලා, පයින් ගහකට හැරුණා. ඊට පස්සේ ඔයා එළියට එනකල්ම අපිට කිසි දෙයක් හිතාගන්න බැරුව හිටියේ."

අපේ වම් පැත්තෙන්, අඩි එකොළහක් විතර දිග, කොළ පාට මාළුවෙක් උඩ පැනලා, ආයෙමත් වතුර තුළට අතුරුදහන් වුණා.

"මේ අනාවැකියේ ඉන්න ළමයා... එයා සයික්ලොප්ස් කෙනෙක් වෙන්න බැරිද?" මම ඇහුවා. "ලොකු තුන්කට්ටුවට රාක්ෂ ළමයි මහ ගොඩක් ඉන්නවා නේ."

ඇනබෙත් ඔළුව හෙල්ලුවා. "ඔරකල් කිවුවේ 'අර්ධ-ලෝහිතයෙක්' කියලා. ඒකෙන් හැම වෙලාවෙම අදහස් වෙන්නේ අර්ධ-මිනිස්, අර්ධ-දේව කියන එක. ඔයා ඇරෙන්න එහෙම වෙන කෙනෙක් ජීවතුන් අතර නැහැ."

"එහෙනම් ඇයි දෙවිවරු මට ජීවත් වෙන්නවත් ඉඩ දීලා තියෙන්නේ? මාව මරලා දාන එක ඊට වඩා පරිස්සම් නේ."

"ඔයා හරි."

"ගොඩාරියක් ස්තූතියි."

"පර්සි, මාත් දන්නෑ. මං හිතන්නේ ඔයාව මරලා දාන්න සමහර දෙවිවරු කැමතියි, ඒත් එයාලා පොසෙයිඩන්ව තරහා කරගන්න බය ඇති. ඉතුරු අය... සමහරවිට, ඔයා මොන විදිහේ වීරයෙක් වෙයි ද කියලා තීරණය කරන්න බලාගෙන එයාලා තවමත් ඔයා ගැන

සොඳිසියෙන් ඉන්නවා ඇති. කොහොම වුණත්, ඔයා එයාලගේ පැවැත්ම රකින ආයුධය වෙන්නත් ඉඩ තියෙනවනේ. වැදගත්ම ප්‍රශ්නය තමයි... තව අවුරුදු තුනකින් ඔයා මොනවා කරයි ද? ඔයා මොන තීරණය ගනීවි ද?"

"අනාවැකියෙන් ඒ ගැන ඉඟියක්වත් දීලා නැද්ද?"

ඇනබෙත් පැකිළුණා.

සමහරවිට, එයා ඒ ගැන මට තව දේවල් කියන්න ඉඩ තිබුණා, ඒත් ඒ වෙලාවෙම කොහෙන්දෝ එතැනට පාත් වුණ මුහුදු ලිහිණියෙක් අපේ බෝට්ටුවේ වැහුවා. ඌ ඇනබෙත්ගේ ඔඩොක්කුවට පොඩි කොළ රොඩු පොකුරක් අත අරිද්දී ඇනබෙත් ගැස්සිලා බැලුවා.

"ගොඩබිමක්." එයා කිවුවා. "ළඟපාතකම ගොඩබිමක් තියෙනවා!"

මම සිටගත්තා. කිවුවත් වගේම ඈතින් නිල්-දුඹුරු පාට තීරයක් පෙනෙන්න ගත්තා. තවත් විනාඩියකට පස්සේ, මට කඳුවැටියක් ඇති දූපතක් දකගන්න ලැබුණා. එහි දීප්තිමත් සුදු පාට ගොඩනැගිලි රාශියකුත්, පාම් ගස්වලින් තිත් වැටුණු වෙරළකුත්, එක එක වර්ගයේ බෝට්ටු පිරුණු වරායකුත් තිබුණා.

උෂ්ණ කලාපීය පාරාදීසයක් වගේ පෙනුණු ඒ දෙසට මුහුදු රළ අපේ බෝට්ටුව තල්ලු කළා.

"සාදරයෙන් පිළිගන්නවා!" පුවරුවක ඇමුණු කඩදාසි කිහිපයක් අතේ තබාගෙන සිටි ගැහැනු කෙනෙක් කිවුවා.

එයාට තිබුණේ ගුවන් සේවිකාවකගේ පෙනුමක්- නිල් පාට ව්‍යාපාරික ඇඳුම් කට්ටලයකින් සැරසිලා, අංග සම්පූර්ණ මේකප් එකක් දමාගෙන සිටි එයා කොණ්ඩය පෝනිටේලයකට ගැට ගසා තිබුණා. අපි වරාය අංගනයට ගොඩ වෙද්දීම එයා අපිට අතට-අත දුන්නා. එයා අපිට පෑ දීප්තිමත් හිනාව දකිද්දී, අපි ගොඩ බැස්සේ කැඩුණු බෝට්ටුවකින් ද නැත්නම් ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාගෙන් ද කියලා සැකයක් වුණත් ඔයාගේ හිතට එන්න ඉඩ තිබුණා. ඒත් එහෙම බලද්දී, තොටුපළේ තිබුණු අද්භූතම යාත්‍රාව අපේ බෝට්ටුව නෙවෙයි. විනෝද යාත්‍රා පොකුරක් සමඟ එතැන ඇමරිකානු නාවික හමුදා සබ්මැරීනයකුත්, ඇඟුල් කීපයකුත්, පරණ පන්නයේ කුඹ ගස් තුනක් ඇති රුවල් නැවකුත් තිබුණා. 'චැනල් ෆයිව්' නාලිකාවට අයත් හෙලිකොප්ටරයක් ගොඩබෑ හෙලිකොප්ටර් අංගනයකුත්, ලියර්ජෙට්



යානාවක් හා දෙවෙනි ලෝක යුද සමයේ ප්‍රහාරක යානයක පෙනුම ඇති කුඩා ගුවන් යානයක් නවතා ඇති ගුවන් යානා ධාවන පථයකුත් එතැන දකින්න ලැබුණා. සමහරවිට ඒවා සංචාරකයින්ට බලන්න හදපු ආකෘති වෙන්න ඇති.

"ඔයාලා අපි ළඟට ආවේ මුල්ම වතාවට ද?" ගැහැනු කෙනා ඇසුවා. ඇනබෙතුයි මමයි මුහුණෙන් මුහුණ බලා ගත්තා.

ඇනබෙත් කට ඇරියා, "මේ..."

"ස්පා එකට ආව මුල්ම වතාව." කඩදාසියේ සටහන් කරමින් ගැහැනු කෙනා කිවුවා. "කෝ බලමු..." එයා අපේ හිසේ සිට දෙපතුලටම බරපතළ බැල්මක් හෙළුවා. "මේ තරුණ නෝනට ඖෂධීය දැවටීමකින් පටන් ගමු. ඒ වගේම, තරුණ මහත්තයාට නම් සම්පූර්ණ සුද්ධයක් දෙන්න වෙනවා."

"මොකක්?" මම ඇසුවා.

එයා උත්තර දෙන්න බැරි තරම් සටහන් ලියාගන්න කාර්යබහුල වෙලයි සිටියේ.

"හරි!" මද හිනාවක් පාමින් එයා කිවුවා. "හොඳයි, සාදයට කලින් ඔයාලා එක්ක පුද්ගලිකවම කතා කරන්න සී.සී.ට ඕනැ වෙයි. කරුණාකරලා, මෙහෙන් එන්න."

දන්, මෙහෙමයි වැඩේ. ඇනබෙත්ටයි මටයි උගුල්වලට අහුවෙලා හොඳට පුරුදුයි. සාමාන්‍යයෙන් ඒ උගුල් මුලින්ම පේන්නේ ගොඩක් හොඳයි වගෙයි. ඉතින්, මේ ගැහැනු කෙනාත් ඕනෑම විනාඩියක සර්පයෙක්ට හරි පිශාචයෙක්ට හරි හැරෙනකල් මම බලන් හිටියා. ඒත් අනෙක් අතට, අපි දවසින් වැඩි හරියක් බෝට්ටුවක පාවෙමින් ගත කළේ. මම හිටියේ තැම්බිලා, මහන්සි වෙලා වගේම බඩගිනි වෙලයි. ඉතින් මේ ගැහැනු කෙනා සාදයක් ගැන මතක් කළාම, මගේ බඩ බල්ලෙක් වගේ පස්සා ගාත් දෙකෙන් ඉඳගෙන කෑම ඉල්ලන්න ගත්තා.

"මං හිතන්නේ ඒකෙන් කරදරයක් වෙන්නෙ නැති වෙයි," ඇනබෙත් කෙඳිරුවා.

අනිවාර්යයෙන්ම වෙන්න පුළුවන්, ඒ කොහොම වුණත් අපි ගැහැනු කෙනා පසුපස ගියා. මගේ එකම මායා ආරක්ෂාව- හර්මීස්ගේ විටමින් බෝතලය සහ රිජ්ටයිඩ්- සඟවා තිබුණු කලිසම් සාක්කුවලින් මම අත් පිටතට ගත්තේම නැහැ. ඒත් අපි එතැනින් ඇතුළට යන්න යන්න, මට ඒවා අමතක වුණා.

Scanned with CamScanner

ඒ තැන පුදුමාකාර ලස්සනයි. මම බලන බලන අත දකින්න ලැබුණේ කිරිගරුඬ සහ නිල් පාට වතුරයි. කන්දේ එක පැත්තක ඉහළට මේ සාදා තිබුණේ, ඒ හැම මළවකම තාන තටාකය බැගින් තිබෙන ලෙසයි. ඒ හැමෙකක්ම වෝටර්ස්ලයිඩ්, දියඇලි සහ දිය යටින් ඇදෙන බටවලින් එකිනෙකට සම්බන්ධ කර තිබුණේ ඕනෑම කෙනෙක්ට ඒවා හරහා පිහිනිය හැකි වෙන්නයි. අහසට විදුණු වතුර මල්වලින් පියාඹන රාජාලියෝ, පිම්මේ දුවන අශ්වයෝ වගේ පුදුමාකාර රටා මැවුවා.

ටයිසන් අශ්වයින්ට ආසයි, ඒ නිසා එයා ඒ වතුර මල්වලටත් ආසා වෙයි කියලා මට හිතුණා. එයාගේ මුහුණෙන් පලවෙන හැඟීම දකබලා ගන්න මම හැරෙන්න හදනකොටම මතක් වුණේ ටයිසන් යන්නම ගිහින්.

"ඔයා හොඳින් ද?" ඇනබෙත් ඇසුවා. "ඔයා සුදුමැලි මෙලා වගේ."

"මට අවුලක් නෑ." මම බොරුවක් කිව්වා. "නිකං... අපි දිගටම යමු."

සෑම වර්ගයකම හීලෑ සතුන් පසු කරමින් අපි ගියා. තුවා ගොඩක් උඩ නිදා ඉන්නා කැස්බැවෙක්, කිම්දුම් පුවරුවක් උඩ දිග ඇදී ඉන්නා දිවියෙක්. මේ නවාතැන්පොලේ අමුත්තෝ- මට දකින්න ලැබුණු තරමට, ඒ හැමෝම තරුණ ගැහැනු අය විතරයි- අකුළන පුටුවල වාඩිවෙලා, පලතුරු බීම තොලගාමින් හෝ සඟරා කියවමින් ඉන්න අතරේ එයාලගේ මුහුණුවල බෙහෙත් කොළ තවරා පිටින් වියළෙමින් තිබුණා. ඒ අතරේ සුදු නිල ඇඳුමෙන් සැරසුණු නිය අලංකරණ ශිල්පිනියෝ එයාලගේ නියපොතු හැඩ කළා. ප්‍රධාන ගොඩනැගිල්ල වගේ පෙනුණු තැනකට අපි පඩිපෙළක් නැගගෙන යද්දී, මට ගැහැණු කෙනෙකුගේ ගායනාවක් ඇසුණා. එයාගේ හඬ නැළවිල්ලක් වගේ සුළඟේ පාවී ආවා. එයා කියූ වචන පෞරාණික ග්‍රීකවලට වඩා වෙනස් වුවත්, ඒ තරමටම පැරණි වුණා- සමහරවිට, ලෝකඩ යුගයට හෝ ඊට ආසන්න කාලයකට අයත් ඇති. එයාගේ ගායනාවේ තේරුම මට තේරුම් ගන්න හැකිවුණා- ඔලිව් අරඹකට වැටුණු සඳරැස්, පායා එන ඉර එළියේ ඇති පැහැයන් සහ මායාවන්. මායාවන් ගැන මොකක්දෝ කතාවක්. එයාගේ කටහඬ මාව පොළොවෙන් ඉහළට ඔසවා, එයා දෙසට ඇදගන්නවා වගෙයි පෙනුණේ.

ඉදිරිපස බිත්තිය මුළුමනින්ම ජනේලවලින් සැදූ විශාල කාමරයකට අපි ඇතුළු වුණා. එහි පිටුපස බිත්තිය කණ්ණාඩිවලින්



ආවරණය කර තිබූ නිසා ඒ කාමරය අනන්තය දක්වාම විහිදෙනවා වගෙයි පෙනුණේ. එතැන මිල අධික ගෘහ භාණ්ඩ ගොන්නකුත්, කෙළවරක කම්බිවලින් සැදූ විශාල සුරතල් සතුන්ගේ කූඩුවකුත් තිබුණා. ඒ කූඩුව එතැනට නොගැළපෙන බවක් පෙනුණත්, මම ඒ ගැන වැඩිය හිතන්න ගියේ නැහැ. මොකද ඒ වෙලාවේ ගී ගයමින් සිටි ගැහැනු කෙනාව මගේ ඇස ගැටුණා... වාව්!

පුළුල් තිර රූපවාහිනියක් තරම් විශාල රෙදි වියන යන්ත්‍රයක් ළඟ වාඩි වී සිටි එයා පාට පාට නූල්වලින් ඉදිරියටත් පසුපසටත් වියමින් සිටියේ හිතාගන්නවත් බැරි තරම් දක්ෂකමකින්. ඒ ගෙත්තම නළියමින් දිලිසුණේ ත්‍රිමාන රූපයක් වගෙයි- ඒ දිය ඇල්ල කොයිතරම් ස්වභාවිකව පෙනුණා ද කියනවා නම්, එහි වතුර ගලා යනවාත්, ගෙත්තම හරහා වලාකුළු පාවී යනවාත් දක ගත හැකි වුණා. ඇනබෙත් හිල්ලුවා. "ඒක ගොඩාරියක් ලස්සනයි."

ගැහැනු කෙනා හැරී බැලුවා. එයා ගෙත්තමටත් වඩා ලස්සනයි. එයාගේ දිග, කළු කොණ්ඩය රන් කෙඳි සමග ගොතා තිබුණා. විනිවිද යන කොළ පාට ඇස් ඇති එයා හැඳ සිටි කළු පාට සේද ගවුමේ මෝස්තරය චලනය වෙනවා වගෙයි පෙනුණේ. සතුන්ගේ හෙවණැලි, කළු පාට මතින් කළු පාටට පෙනුණේ හරියට මහ රෑක කැලේ මැදින් මුවෙක් දුවනවා වගෙයි.

"මේ ගෙත්තම ලස්සනයි කියලා ඔයාට හිතෙනවා ද, මගෙ දරුවෝ?" ගැහැනු කෙනා ඇසුවා.

"අනේ, ඔව්, මැඩම්!" ඇනබෙත් කිව්වා. "මගේ අම්මා තමයි-" එයා කියන්න දේ නතර කරගත්තා. රෙදි වියන යන්ත්‍රය සොයාගත් ඇතීනා ඔයාගේ අම්මා කිය කියා ඔයාට වටේ ඇවිදින්න බැහැ. ඒක අහන වැඩි දෙනෙක් ඔයාව පිස්සන් කොටුවක හිර කරන්න ඉඩ තියෙනවා. අපේ සත්කාර කරන්නිය හිනා වුණා විතරයි. "ඔයාට හොඳ රසයක් තියෙනවා, මගෙ දරුවෝ. ඔයා ආවට මට හරිම සතුටුයි. මගේ නම සී.සී."

කෙලවරේ වූ කූඩුවේ සිටි සතුන් බයෙන් හඬගාන්න පටන් ගත්තා. ඒ සද්දෙ හැටියට නම් උන් රට හාවෝ වෙන්න ඕනෑ.

අපි සී.සී.ට අපිව හඳුන්වා දුන්නා. එයා මගේ දිහා අමනාපයෙන් බැලුවේ මම මොකක්හරි ප්‍රශ්නයකින් අසමත් වෙලා වගෙයි. එයින්

Scanned with CamScanner

මගේ හිතට අමාරු වුණා. මොකක්දෝ හේතුවකට, මේ ගැහැනු කෙනාව සතුටු කරවන්න මට තදින්ම ඕනෑ වුණා.

"ඔත්, දරුවෝ," එයා සුසුමක් හෙළුවා. "ඔයාට මගේ උදවු ඕනෑ."

"මැඩම්?" මම ඇසුවා.

සී.සී. ව්‍යාපාරික ඇඳුමෙන් සැරසී සිටි ගැහැනු කෙනාට කතා කළා. "හයිලා, ඇනබෙත්ව රවුමක් එක්කගෙන යන්නකෝ? අපි ළඟ තියෙන දේවල් එයාට පෙන්වන්න. එයාගේ ඇඳුම් අපිට වෙනස් කරන්න වෙයි. එතකොට කොණ්ඩේ, මගෙ දෙවියනේ. මම මේ තරුණ මහත්තයට කතා කරලා ඉවර වුණාම අපි සම්පූර්ණ රූපලාවන්‍ය උපදෙස් සාකච්ඡාවක් කරමු."

"ඒත්..." ඇනබෙත්ගේ හිත රිදිලා වගෙයි. "මගේ කොණ්ඩේ තියෙන වැරැද්ද මොකක් ද?" සී.සී. දයාබර හිනාවක් පෑවා. "මගෙ දරුවෝ, ඔයා ලස්සනයි. ඇත්තටම! ඒත් ඔයා, ඔයාගේ පෙනුමවත්, දක්ෂකම්වත් පිටට ප්‍රදර්ශනය කරන්නෙම නැති තරම්. ගොඩක් වටිනා හැකියාවන් නාස්ති වෙන්න ඇරලා!"

"නාස්ති වෙනවා?"

"හොඳයි, ඔය ඉන්න විදිහ ගැන ඔයා සතුටු නැතුව ඇති! මගෙ දෙවියනේ, එහෙම සතුටු වෙන එක්කෙනෙක්වත් නැහැ. ඒත් දුක් වෙන්නෙපා. අපිට මේ ස්පා එකේදී ඕනෑම කෙනෙක්ව වැඩි දියුණු කරන්න පුළුවන්. මම කියන්නේ මොකක්ද කියලා හයිලා ඔයාට පෙන්වලා දෙයි. ඔයා, මගෙ දරුවෝ, ඔයාගේ සැබෑ ස්වරූපය පිටට ගන්න ඕනෑ!"

ඇනබෙත්ගේ ඇස් ආශාවෙන් දිලිසුණා. එයා කතා කරගන්න වචන නැතිව ඉන්නවා මීට කලින් කවදාවත් මට දකින්න ලැබිලා නැහැ. "ඒත්... එතකොට පර්සි?"

"ඔහ්, පැහැදිලිවම," සී.සී. මට දුක්බර බැල්මක් හෙළමින් කිවුවා. "පර්සිට මගේ පෞද්ගලික අවධානය උවමනායි. එයාට ඔයාට වඩා ගොඩක් දේවල් කරන්න ඕනෑ වෙනවා."

වෙන වෙලාවක නම් කවුරුහරි මට එහෙම කිවුවොත් මම කේන්ති ගන්න තිබුණා. ඒත් සී.සී. එහෙම කිවුවම මට දුක හිතුණා. මම එයාව කලකිරවලා.



රට හාවෝ බඩගිනි වෙලා වගේ හඬගෑවා.

"හොඳයි..." ඇනබෙත් කිවුවා. "මං හිතන්නේ..."

"මේ පැත්තෙන් එන්න, කෙල්ලේ," හයිලා කිවුවා. පිටත දිය ඇලිවලින් හැඩවුණ උයන්වලට එයාව කැඳවාගෙන යන්න ඇනබෙත් ඉඩ හැරියා.

මගේ අත ගත් සී.සී. කණ්ණාඩි සවිකළ බිත්තිය ඉදිරියට මාව කැඳවාගෙන ගියා. "ඔයාට පේනවනේ, පර්සි... ඔයාගේ විභවයන් පිටට මුදා හරින්න නම්, ඔයාට ගොඩක් උදවු ඕනෑ වෙනවා. ඒකට පළවෙනි පියවර විදිහට ඔයා ඉන්න විදිහ ගැන සතුටු නැහැ කියලා ඔයා පිළිගන්න ඕනෑ."

මම කණ්ණාඩිය ඉදිරියේ කැපිච්ච පණුවෙක් වගේ ඇඹරුණා. මගේ පෙනුම ගැන හිතන එකම මට පෙනෙන්න බැහැ- හරියට, මේ වාරය මුල දී මගේ නහය උඩ මතුවුණ පළවෙනි කුරුලෑව, මගේ ඉදිරි දත් දෙක සම්පූර්ණයෙන්ම සමතලා නැතිවීම, එහෙමත් නැත්නම්, මගේ අකීකරු කොණ්ඩය කොයිම වෙලාවකවත් පහළට නොපිහිටීම වගේ දේවල්. සී.සී.ගේ හඬ මේ හැමදෙයක්ම මගේ හිතට ගෙනාවේ හරියට එයා මාව අන්වීක්ෂයකින් පරීක්ෂා කරනවා වගෙයි. ඒ වගේම, මගේ ඇඳුම්වලත් කිසිම ගතියක් නැහැ. මම ඒක දැන සිටියා.

කවුද ඕවා ගැන හිතන්නේ? මගේ හිතේ පැත්තක් තර්ක කළා. ඒත් සී.සී.ගේ කණ්ණාඩිය ඉදිරියේ ඉන්නකොට, මගේ හොඳක් දකින්න නම් අමාරු වුණා.

"ඔන්න, ඔන්න," සී.සී. මාව අස්වැසුවා. "අපි... මේ උත්සාහ කරලා බැලුවොත් කොහොම ද?" එයා අසුරක් ගසද්දී අහස් නිල් පාට තිරයක් කණ්ණාඩිය පහළට පෙරළුණා. රෙදි වියන යන්ත්‍රයේ තිබුණු රෙදි වගේම ඒකත් නළියමින් දිලිසුණා.

"ඔයාට මොනවද පේන්නේ?" එයා ඇසුවා.

මම නිල් තිරය දෙස බැලුවේ එයා මොනවා කියනවද හිතාගන්න බැරුවයි. "මට මුකුත්-" ඒත් එක්කම එහි පාට වෙනස් වුණා. මට මාවම පේන්න ගත්තා- හැබැයි ඒ මගේ ප්‍රතිබිම්බයක් නෙවෙයි. ඒ තිරය මත දිලිසෙමින් සිටියේ පර්සි ජැක්සන්ගේ වඩාත් කඩවසම් සංස්කරණයක්- හරියටම ගැළපෙන ඇඳුම් හැඳගෙන, ආත්ම විශ්වාසයෙන් පිරුණු හිනාවකින් මුහුණ පුරවාගෙන මම සිටියා. මගේ දත් දෙකත් සමතලා වෙලා. කුරුලෑත් නැතිවෙලා. හමට ලස්සන දුඹුරු

පාටක් ඇවිත්. ක්‍රිඩාශීලී පෙනුම වැඩි වෙලා. අඟල් දෙකක් විතර උස ගිහිල්ලත් වගේ. එතැන සිටියේ අඩුපාඩු කිසිවක් නැති මමයි.

"වාව්," මට කියවුණා.

"ඔයාට ඒක ඕනෑ ද?" සී.සී. ඇසුවා. "නැත්නම් මම වෙන එකක් උත්සාහ-"

"නෑ," මම කිවුවා. "ඒක... ඒක නම් මාරයි. ඔයාට ඇත්තටම පුළුවන් ද-"

"ඔයාව සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න මට පුළුවන්," සී.සී. පොරොන්දු වුණා.

"මොනවද කරන්න තියෙන්නේ?" මම ඇසුවා. "මට විශේෂ කැළැක්වත් කන්න වෙනව ද?"

"ඔත්, ඒක ගොඩක් ලේසියි," සී.සී. කිවුවා. "අලුත් පලතුරු ගොඩක් කන්න ඕනෑ, නව ව්‍යායාම වැඩසටහනක් තියෙනවා, ඒ වගේම... මෙන්න මේක."

එයා මේසයක් ළඟට ගිහින් වතුර වීදුරුවක් පුරවා ගත්තා. ඊට පස්සේ බීම මිශ්‍රණයක් ඇති පැකැට්ටුවක් කැඩූ එයා එයින් රතු පාට කුඩක් වතුරට හැලුවා. මිශ්‍රණය දිලිසෙන්න පටන් ගත්තා. එය වියැකී ගියාම බීම වීදුරුව පේන්න ගත්තේ ස්ට්‍රෝබෙරි මිල්ක් ෂේක් එකක් වගෙයි.

"මෙයින් එකක් කෑම වේලක් වෙනුවට ගන්න ඕනෑ," සී.සී. කිවුවා. "ඔයාට ඉක්මනින් ම ප්‍රතිඵල බලාගන්න පුළුවන් කියලා මං සහතික වෙනවා."

"ඒක වෙන්නෙ කොහොම ද?"

එයා මහ හඬින් හිනාවුණා. "ඇයි ප්‍රශ්න කරන්නේ? මං කියන්නේ, ඔයාට දන්මම අංග සම්පූර්ණ රූපය ඕනෑ නැද්ද?" මගේ හිතේ කොණක මොකක්දෝ කොනිති ගසන්න වුණා. "මේ ස්පා එකේ වෙන පිරිමි කවුරුවත් නැත්තේ ඇයි?"

"ඔත්, එයාලා ඉන්නවා," සී.සී. සහතික වුණා. "ඔයාට ඉක්මනින්ම එයාලව මුණගැහේවි. මේ මිශ්‍රණේ බීලා බලන්නකෝ. ඔයාට පෙනෙයි."

මම තිල් ගෙත්තම් තිරයේ වූ මගේ නොවුණ මගේ රූපය දෙස බැලුවා.



"දන්, පර්සි," සී.සී. සැර කළා. "රූපය වෙනස් කරන ක්‍රියාවලියේ අමාරුම කොටස තමයි පාලනය අත ඇරීම. ඔයාට තීරණය කරන්න වෙනවාः ඔයා විශ්වාස කරන්නේ ඔයාගේ පෙනුම ගැන ඔයාගේ තීන්දුව ද, මගේ තීන්දුව ද?"

මගේ උගුර වේළිලා වගේ දැනුණා. "ඔයාගේ තීන්දුව," මගේ කටින් පිට වෙනවා මට ඇසුණා. හිනාවක් පෑ සී.සී. වීදුරුව මගේ අතට දුන්නා. මම ඒක තොල් ළඟට ගත්තා.

ඒකේ රසයත් පෙනුම වගේමයි- ස්ට්‍රෝබෙරි මිල්ක් ෂේක්. එසැණින්ම මගේ බඩවැල් පුරා උණුසුම් හැඟීමක් පැතිරී ගියාः මුලින්ම ප්‍රියජනකව දැනුණු එය ඊට පස්සේ වේදනාකාරී ලෙස රත් වෙමින් පිළිස්සුණේ බීම මගේ ඇඟ ඇතුළේ කැකෑරෙනවා වගෙයි.

වීදුරුව අත ඇරිය මම දෙකට නැමිලා බඩ අල්ලගත්තා. "ඔයා මොනවද... මොනවද කළේ?"

"බය වෙන්නෙපා, පර්සි," සී.සී. කිවුවා. "ඔය කැක්කුම අඩු වෙලා යයි. බලන්න! මම පොරොන්දු වුණත් වගේ, ඉක්මන් ප්‍රතිඵල."

මොකක්හෝ භයානක වැරැද්දක් වෙලා.

තිරය බිමට වැටුණාම කණ්ණාඩිය හරහා මට දකින්න ලැබුණේ මගේ අත් ඇකිළී රැලිගැහෙමින්, වකුටු වෙමින්, දිග, සියුමැලි නිය පහුරු වැඩෙන ආකාරයයි. මගේ මුහුණෙත්, කමිසයට යටිනුත්, ඇඟේ අනෙක් හැම තැනකමත් ලෝම මතුවෙන්න ගත්තා. මගේ කට ඇතුළේ දත් ඕනෑවටත් වඩා බරට දැනුණා. මගේ ඇඳුම් එන්න එන්නම ලොකු වුණා. සී.සී.ත් උස යනවා වගෙයි- නෑ, මාව ඇකිළෙනවා.

භයානක ක්ෂණික එළියක් සමඟ මාව අඳුරු රෙදි ගුහාවක කොටු වුණා. මම, මගේම කමිසයට යට වෙලා. මම දුවන්න හැදුවත්, අත් දෙකක් මාව අල්ලගත්තා- මං තරමටම ලොකු අත් දෙකක්. උදව් ඉල්ලා කෑගහන්න මම උත්සාහ කළා. ඒත් මගේ කටෙන් පිටවුණේ එක හඬක් විතරයි, "රී...ට්, රී...ට්...ට්, රී...ට්!"

යෝධ අත් දෙක මගේ බඩ මැදින් මිරිකා අල්ලාගෙන, මාව ඉහළට එසවූවා. මම දඟලමින්, හොඳටෝම කෙටිවෙලා තිබුණු මගේ අත්-පාවලින් ගැසුවා. ඊට පස්සේ මම තැතිගැන්විලා බලා සිටියේ සී.සී.ගේ සද්දන්ත මුහුණ දෙසයි.

"නියමයි!" එයාගේ හඬ දෝංකාර දුන්නා. මම බයවෙලා දඟලද්දී එයා මගේ ලොම් පිරුණු බඩ වටා තිබුණු ග්‍රහණය දැඩි

Scanned with CamScanner

කළා. "ජේනවද, පර්සි? ඔයා, ඔයාගේ සැබෑ ස්වරූපය පිටට ගත්තා" එයා මාව කණ්ණාඩිය දෙසට හැරවූවා. එයින් මට දකින්න ලැබුණු දෙයින් හිතියට පත්වුණ මම මරහඬ දුන්නා. "ඊ...ට්, ඊ...ට්, ඊ...ට්" කණ්ණාඩියෙන් පෙනුණේ සී.සී. ලස්සනට හිනාවෙමින්, උල් දතුත් පුංචි නිය පහුරුත් ඇති සුදු-තැඹිලි ලෝම පිරුණු සතෙක්ව අතේ තියාගෙන ඉන්නවායි. මම ඇඹරෙද්දී කණ්ණාඩියේ සිටි බූල් පිරුණු සතාත් ඒකම කළා. මම... මම...

"රට හාවෙක්," සී.සී. කිවුවා. "හරිම හුරතල්, නේද? පිළිම කියන්නේ උාරෝ, පර්සි ජැක්සන්. මම කලින් නම් කළේ එයාලව ඇත්තම උාරන්ට හරවපු එක. ඒත් එතකොට එයාලා හරියට ගඳ ගහනවා. ලොකු නිසා තියාගන්නත් කරදරයි. ඇත්තටම නම්, එයාලා කලින් හිටියට වඩා වෙනසක් නැහැ. හැබැයි රට හාවෝ ඊට වඩා පහසුයි! දැන් එන්න, අනිත් පිරිමි අයව මුණගැහෙන්න."

"ඊ..ට්!" මම විරෝධය පාමින් එයාව හූරන්න හැදුවා, ඒත් සී.සී. කොයි තරම් තදින් මාව මිරිකුවා ද කියනවා නම් මට සිහිය නැතිවෙන්න ගියා.

"දඟ වැඩ බැහැ, පොඩි එකෝ," එයා තරවටු කළා, "නැත්නම් මං ඔයාව බකමූණන්ට කන්න දානවා. දැන්, හොඳ චූටි පැටියා වගේ කුඩුවට යන්නකෝ. හෙට, හොඳට හැසිරුණොත් ඔයාට යන්න පුළුවන්. අලුත් රට හාවෙක්ව උවමනා පන්ති කාමරයක් හැම වෙලාවෙම තියෙනවා."

මගේ චූටි හදවත තරමටම මගේ හිතත් වේගයෙන් වැඩ කරන්න වුණා. බිම වැටිලා තියෙන මගේ ඇඳුම් ළඟට මම යන්න ඕනෑ. ඒක කරන්න පුළුවන් නම්, මට පුළුවන් සාක්කුවෙන් රිප්ටයිඩ් එළියට අරගෙන... මොනවා කරන්නද? මට පෑනේ කොපුව ගලවාගන්නවත් බැහැ. එහෙම කරගන්න පුළුවන් වුණත්, මම කොහොමද කඩුව ඔසවන්නේ. සී.සී. මාව කූඩුව ළඟට ගෙන ගොස් කම්බිවලින් සෑදූ දොර විවර කරද්දී මම අසරණව දඟලුවා.

"පර්සි, මේ ඉන්නේ හැසිරෙන්න දන්නෙ නැති අය," එයා අනතුරු ඇඟවීමක් කළා. "එයාලා කවදාවත් හොඳ පන්ති කාමර සුරතල්ලු වෙන්නේ නැහැ, ඒත් එයාලා ඔයාට හැසිරෙන්න ඕනෑ විදිහ කියලා දෙයි. මෙයාලගෙන් වැඩි දෙනෙක් අවුරුදු තුන්සීයක් විතර තිස්සේ මේ කූඩුවේ ඉන්නවා. ඔයාටත් හැමදාටම එයාලා එක්ක ඉන්න



ඕනෑ නම්, මං ඔයාට කියන්නේ-" ඒ වෙලාවෙම ඇනබෙත්ගේ හඬ ඇහුණා. "මිස් සී.සී.?"

සී.සී. පෞරාණික ග්‍රීක භාෂාවෙන් ශාප කළා. මාව කූඩුවට විසි කළ එයා දොර වැසුවා. මම මරහඬ දෙමින් යකඩ පොලු පහුරු ගෑවත් වැඩක් වුණේ නැහැ. ඇනබෙත් ඇතුළට එද්දීම සී.සී. මගේ ඇඳුම් ටික රෙදි වියන යන්ත්‍රය යටට කකුලෙන් තල්ලු කරනවා මම බලා සිටියා.

මට එයාව හඳුනා ගන්නත් අමාරු වුණා. සී.සී. හැද සිටි මෝස්තරයේ අත් නැති, සුදු පාට සේද ගවුමකින් එයා සැරසී සිටියා. එයාගේ තඹ පාට කොණ්ඩය සෝදා පිරිසිදු කර, රන් කෙඳි සමග කරලකට ගොතා තිබුණා. නරකම දේ වුණේ, මම කවදාවත් ඇනබෙත්ව දකින්න බලාපොරොත්තු නොවුණ විදිහට එයා මේකප් දමාගෙන සිටියා. මං අදහස් කළේ, එයාගේ පෙනුම හොඳයි. ඇත්තටම හොඳයි. පෙනුණු හැටියට නම් රීට්-රීට් ගානවා ඇර වෙන කිසිවක් කියන්න හැකියාව තිබුණත්, එයාව දැකලා මට කතා කරගන්න බැරිවෙන්න ඉඩ තිබුණා. ඒත් එතැන මොකක්දෝ ලොකු වරදක් තිබුණා. එයා පරණ-පුරුදු ඇනබෙත් නෙවෙයි.

කාමරය වටේ බැල්මක් හෙළූ එයා ඇහිබැම් අකුළා ගත්තා. "පර්සි කොහෙ ද?" මම මහ හඬින් කෑගැසුවත්, එයාට මාව ඇහුණේ නැහැ වගෙයි.

සී.සී. හිනාවුණා. "එයා අපේ ප්‍රතිකාරයක් ගන්නවා. මගෙ දරුවෝ. බය වෙන්නෙපා. ඔයා හරිම ලස්සනයි නේ! වටපිටාව දැකලා මොකද හිතුණේ?"

ඇනබෙත්ගේ ඇස් දීප්තිමත් වුණා. "ඔයාගෙ පුස්තකාලය හරිම ෂෝක්!"

"ඔව්, ඇත්තටම," සී.සී. කිවුවා. "පහුගිය අවුරුදු තුන්දාහට තිබුණු හොඳම දැනුම. ඔයාට ඕනෑම දෙයක් ඉගෙනගෙන, කැමති ඕනෑම කෙනෙක් වෙන්න පුළුවන්, මගෙ දරුවෝ."

"ගෘහ නිර්මාණ ශිල්පියෙක්?"

"පුහ්!" සී.සී. කිවුවා. "ඔයාට, මගෙ දරුවෝ, මායාකාරියෙක් වෙන්න උවමනා හැකියාව තියෙනවා. හරියට මම වගේ." ඇනබෙත් අඩියක් පස්සට තැබුවා. "මායාකාරියක්?"

"ඔව්, මගෙ දරුවෝ." සී.සී. අතක් දිගු කළාම අත්ල මැද ගිනි දැලුවක් මතුවෙලා, ඇඟිලි තුඩු හරහා නැළවෙන්න වුණා. "මගේ

අම්මා තමයි හෙකේටි, මායාවට අධිපති දෙවඟන. ඇතීනාගේ දූවෙක්ව දක්කම මට අඳුනගන්න පුළුවන්. ඔයයි, මමයි අතරේ වැඩි වෙනසක් නැහැ. අපි දෙන්නම දැනුම හොයන අය. අපි දෙන්නම උසස්බව අගය කරනවා. අපි දෙන්නටම පිරිමින්ගේ හෙවණැල්ලට යටවෙලා ඉන්න ඕනෑකමක් නැහැ."

"ම-මට තේරුණේ නැහැ."

ආයෙමත්, මම ඇති විරියෙන් හඬගාමින් ඇනබෙත්ගේ අවධානය ගන්න උත්සාහ කළා. ඒත් එක්කෝ එයාට මාව ඇහුණේ නැහැ, නැත්නම් ඒ හඬවල්වල වැදගත්කමක් ඇති කියලා එයා හිතුවේ නැහැ. මේ අතරේ, තම තමන්ගේ කූඩුවල සිටි අනෙක් රට හාවෝ මාව පරීක්ෂා කරන්න එළියට එන්න ගත්තා. රට හාවන්ට අධම පෙනුමක් තියෙවි කියලා මම කවදාවත් හිතලා තිබුණේ නැතත්, මෙයාලට නම් තිබුණේ එහෙම පෙනුමක්. කැඩුණු දතුත්, රතු පාට පබළු ඇසුත් ඇති, කිලිටි ලෝම පිරුණු හාවෝ දුසිමක් එතැන සිටියා. යතු කූඩුවලින් වැසී සිටි එයාලාගේ සිරුරුවලින් හැමුවේ මේ කූඩුව පිරිසිදු නොකර, එයාලා ඇත්තටම මෙතැන අවුරුදු තුන්සියක් ඉඳලා වගේ ගඳක්.

"මාත් එක්ක නවතින්න," සී.සී. ඇනබෙත්ට කියමින් සිටියා. "මාත් එක්ක ඉගෙන ගන්න. ඔයාට අපේ කාර්ය මණ්ඩලයට එකතු වෙලා, මායාකාරියක් වෙලා, අනිත් අයව තමන්ගේ කැමැත්තට නම්මා ගන්නේ කොහොමද කියලා ඉගෙන ගන්න පුළුවන්. ඔයා අමරණීය වේවි!"

"ඒත්-"

"ඔයා ගොඩාක් බුද්ධිමත්, මගෙ දරුවෝ," සී.සී. කිවුවා. "අර මෝඩ කදවුරු වීරයන්ව විශ්වාස කරලා වැඩක් නැහැ කියලා ඔයා දන්නවා. ශ්‍රේෂ්ඨ අර්ධ-ලෝහිත වීරවරියෝ කීදෙනෙක්ව ඔයාට නම් කරන්න පුළුවන් ද?"

"ම.. ඇටලන්ටා, ඇමිලියා ඉයහාට-"

"පුහ්! හැම කීර්තියක්ම අයිති කරගන්නේ පිරිමි විතරයි." සී.සී. අත්ල අකුළද්දී ගිනි දැල්ල නිවී ගියා. "ගැහැනු අයට බලය ලබාගන්න තියෙන එකම ක්‍රමය මායාවන් විතරයි. මීඩියා, කැලිප්සෝ, අන්න එයාලා තමයි බලවත් ගැහැනු! ඒ වගේම, මම, ඇත්තටම. හැමෝගෙන්ම ශ්‍රේෂ්ඨ කෙනා."

"ඔයා... සී.සී.... සර්සි!"



"ඔව්, මගෙ දරුවෝ."

ඇනබෙත් පස්සට යද්දී සර්සි මහ හඬින් හිනාවුණා. "ඔයාට බය වෙන්න දෙයක් නැහැ. මම ඔයාට කිසිම කරදරයක් කරන්නේ නැහැ."

"ඔයා පර්සිට මොනවද කළේ?"

"එයාගේ නියම ස්වරූපය පිටට ගන්න උදවු කළා විතරයි."

ඇනබෙත් කාමරය පුරා විමසිලිමත් බැල්මක් හෙළුවා. අන්තිමේදී එයා කූඩුවත්, යකඩ පොල්ලක් ලෑටිගාන මාවත්, මාව වට කරගෙන බලා සිටි අනෙක් රට හාවෝ ටිකත් දැක්කා. එයාගේ ඇස් දෙක ලොකු වුණා.

"එයාව අමතක කරන්න," සර්සි කිවුවා. "මාත් එක්ක එකතු වෙලා මායාවන් ඉගෙන ගන්න."

"ඒත්-"

"ඔයාගේ යාළුවාව හොඳට බලාගන්නවා. අපි එයාව හොඳම නවාතැනකට යවනවා. බාලාංග පන්තිවල ළමයි එයාට ගොඩාක් ආදරේ වෙයි. ඒ අතරේ, ඔයා ගොඩාක් බුද්ධිමත් වගේම බලවත් කෙනෙක් වෙයි. ඔයාට උවමනා කරපු හැමදේම ඔයාට ලැබෙයි."

ඇනබෙත් තවමත් මගේ දෙස බලා සිටියත් එයාගේ මුහුණේ තිබුණේ සිහිනයක ඉන්නවා වගේ බැල්මක්. එයා සිටියෙත් රට හා මිල්ක් ෂේක් බොන්න සර්සි මාව වශී කළ වෙලාවේ මම සිටි විදිහටමයි. එයින් ගැලවෙන්න කියලා එයාට අනතුරු අඟවන්න උත්සාහ කරමින් මම කෑගසමින් පහුරු ගෑවත්, ඒවායින් වැඩක් වුණේ නැහැ.

"මට ඒක ගැන හිතලා බලන්න ඉඩ දෙන්න," ඇනබෙත් මිමිණුවා. "මට... තනියම ඉන්න විනාඩියක් දෙන්න. මෙයාට සමු දෙන්න."

"අනිවාර්යයෙන්ම, මගෙ දරුවෝ," සර්සි නැළවෙමින් කිවුවා. "විනාඩියයි. ඔහ්... ඔයාට සම්පූර්ණයෙන්ම පුද්ගලික නිදහස දෙන්නම්..." එයා අත් වනද්දී ජනේල හරහා යකඩ පොලු වැටුණා. එයා කාමරයෙන් පිටවී යද්දී එයාට පිටපුසින් දොරේ අගුල වැටෙන හඬ මට ඇසුණා.

Scanned with CamScanner

ඇනබෙත්ගේ මුහුණේ තිබුණු සිහින දකින පෙනුම දියවී ගියා. එයා මගේ කුඩුව ළඟට දුවගෙන ආවා. "හරි, දැන් එතකොට කොයි එක්කෙනා ද ඔයා?"

මම කෑගැහුවා, ඒත් ඉතින් අනෙක් රට හාවෝ ටිකත් ඒකම කරන්න ගත්තනේ. ඇනබෙත්ගේ බලාපොරොත්තු සුන්වුණා වගෙයි. කාමරය හරහා බැල්මක් හෙළූ එයා රෙදි වියන යන්ත්‍රය යටින් පිටට පැන තිබූ මගේ කලිසමේ වාටියක් දැක්කා. අන්න හරි!

එතැනට දිවූ එයා මගේ කලිසම් සාක්කු අවුස්සන්න වුණා.

ඒත් රිස්ටයිඩ් පිටට ගන්නවා වෙනුවට එයා කළේ හර්මීස්ගේ විටමින් පෙති බෝතලය හොයාගෙන, ඒකේ පියන ගලවන්න ඔට්ටු වුණ එකයි.

මේක අතිරේක පෝෂණේ ගන්න වෙලාවක් නෙවෙයි කියලා එයාට කෑගහන්න මට ඕනෑ වුණා! එයා කඩුව ගන්නයි ඕනෑ!

එයා ලෙමන් රසැති පෙත්තක් කටේ දමා ගනිද්දීම වේගයෙන් ඇරුණු දොරෙන් ව්‍යාපාරික ඇඳුම් කට්ටලයකින් සැරසුණ දෙන්නෙක් පිරිවරාගෙන සර්සි ඇතුළට ආවා.

"හොඳයි," එයා සුසුමක් හෙළුවා. "විනාඩියක් යන ඉක්මන. ඔයාගේ උත්තරේ මොකක් ද, මගෙ දරුවෝ?"

"මේක," කියූ ඇනබෙත් කිණිස්ස ඇදලා ගත්තා.

මායාකාරිය අඩියක් පස්සට ගියත්, එයාගේ විමතිය ඉක්මනින්ම දියවී ගියා. එයා අවඥාවෙන් බැලුවා. "ඇත්තට, පුංචි කෙල්ලේ, මගේ මායාවන්ට විරුද්ධව කිණිස්සක්? ඒක මොළේ ඇති වැඩක් ද?"

සර්සි, එයාගේ පරිවාරක ගැහැනු දිහා බලද්දී, එයාලා හිනා වුණා. එයාලා අත් එසෙව්වේ මන්තරයක් මතුරන්න සූදානම් වෙනවා වගෙයි.

දුවන්න! ඇනබෙත්ට කියන්න මට ඕනෑ වුණත්, මට කරන්න පුළුවන් එකම දේ වුණේ රීට්-රීට් හඬගෑම විතරයි. මරහඬ දුන් අනෙක් රට හාවෝ කූඩුව පුරා දඩිබිඩියේ දුවන්න ගත්තා. බය වී සිටි මටත් හැංගෙන්න ආසාවක් ආවා, ඒත් මම මොනවාහරි කල්පනා කරන්න ඕනෑ! ටයිසන් වගේ ඇනබෙත්වත් නැති වෙනකල් බලාගෙන ඉන්න මට බැහැ.



"අපි ඇනබෙත්ව මොකෙක්ටද හරවන්නේ?" සර්සි කල්පනා කළා. "මොකෙක්හරි චූටි, ඉක්මනට කේන්ති යන එකෙක්ට. මං දන්නවා... ඌරු මීයෙක්ට!"

එයාගේ ඇඟිලි තුඩුවලින් පිට පැන්න නිල් පාට ගින්න සර්පයෝ වගේ ඇනබෙත් වටේ වෙළෙන්න ගත්තා. බයෙන් තැතිගත් මම බලා සිටියා. ඒත් කිසිවක් සිද්ධ වුණේ නැහැ. ඇනබෙත් තවමත් ඇනබෙත්මයි, හැබැයි හිටියටත් වඩා කේන්ති ගිහින්. ඉදිරියට පැන්න එයා කිණිසි තුඩ සර්සිගේ බෙල්ලට තද කළා. "එහෙම නැත්නම් මාව දිවියෙකුට හැරෙව්වොත් කොහොම ද? නියපොතුවලින් ඔහේගෙ බෙල්ල පහුරුගාන එකෙක්ට!"

"කොහොම ද!" සර්සි වේදනාවෙන් මොරදුන්නා.

ඇනබෙත් මායාකාරියට පේන්න මගේ විටමින් බෝතලය එසවූවා.

සර්සි වියරුවෙන් උඩු බිරුවා. "හර්මීස්ටයි, එයාගේ විටමින්වලටයි හෙණ ගහපි! ඒක මහා පිස්සුවක්! ඒවාගෙන් ඔයාට මොනවත් වෙන්නෙ නෑ."

"පර්සිව ආපහු මනුස්සයෙක්ට හරවනවා, නැත්නම්!" ඇනබෙත් තර්ජනය කළා.

"මට බැහැ!"

"එහෙනම් ඔයාම තමයි මේක ඉල්ලගත්තේ."

සර්සිගේ සේවිකාවෝ ඉදිරියට ආවත්, එයාලගේ ස්වාමිදූව එයාලව නතර කළා. "පස්සට වෙන්න! අර ජරා විටමින් ඇගේ තියෙනකල් එයාට මායාවලින් බලපෑමක් නැහැ."

සර්සිව රට හා කූඩුව ළඟට ඇදගෙන ආ ඇනබෙත් පියන තල්ලු කරලා, ඉතිරි විටමින් සියල්ලම ඇතුළට හැලුවා.

"එපා!" සර්සි බෙරිහන් දුන්නා.

මුලින්ම විටමින් පෙත්තක් අල්ලගත්තේ මමයි, ඒත් එළියට දුවගෙන ආව අනෙක් රට හාවෝ ටිකත් මේ අලුත් කෑම පරීක්ෂා කරන්න වුණා.

මුල්ම ලෑටි ගෑමෙන්ම මගේ ඇඟ ඇතුළ මුළුමනින්ම ගිනි ගන්නවා වගේ දැනෙන්න ගත්තා. ඒ පෙත්ත ලොකුවට පෙනෙන එක නතර වෙන තුරු මම දිගටම ලෑටිගෑවා. ටිකෙන් ටික කූඩුව පොඩි

වෙන්න ගත්තා. ඊට පස්සෙ එක පාරටම, ඩෝං! කුඩුව පුපුරා ගියා. නැවතත් මනුස්සයෙකුට හැරිලා මම හිඳගෙන සිටියා- ඒ, දෙවියන්ට ස්තුති වෙන්න කොහොමහරි ආපහු මගේ ඇඳුම් ටිකත් හැඳගෙනමයි. මගේ වටේට තවත් පිරිමි හය දෙනෙක් තදින් ඇහිපිය ගසමින්, කොණ්ඩාවලින් යතුකුඩු ගසා දමමින්, අන්දමන්ද වෙලා බලා සිටියා.

"නෑ!" සර්සි බෙරිහන් දුන්නා. "ඔයාට තේරෙන්නෑ! එයාලා තමයි නරකම අය!"

එක් පිරිමියෙක් සිටගත්තා- හැඩපලු ගෙතුණු දිග කළු රැවුලකුත්, ඒ පාටම දතුත් ඇති යෝධ පිරිමියෙක්. එයා වූල් සහ ලෙදර්වලින් සෑදූ නොගැළපෙන ඇඳුම් හැඳගෙන, දණහිස-උසට ඇති බූට් සහ වැනෙන පෙල්ට් තොප්පියක් පැලඳගෙන සිටියා. අනෙක් පිරිමි ඊට වඩා සරලව - සරුවාල සහ පැල්ලම් වැටුණු සුදු කමිසවලින් සැරසී සිටියා. එයාලා කාටවත් සපත්තු තිබුණේ නැහැ.

"අර්ග්හ්!" යෝධ මිනිහා ගිගුරුවා. "අර යක්දෙස්සි මට මොනවද කළේ!"

"නෑ!" සර්සි විලාප දුන්නා.

ඇනබෙත් හිල්ලුවා. "මම ඔයාව දන්නවා! එඩ්වඩ් ටීච්, ඒරිස්ගේ පුතෙක්?"

"එහෙයි, කෙල්ලේ," යෝධ මිනිහා ගෙරෙව්වා. "ඒත් ගොඩක් අය මට කියන්නේ කළු රැවුලා කියලා! කොල්ලනේ, අර ඉන්නේ අපිව අල්ලගත්ත මායාකාරි. ගිහිල්ලා එයාව අල්ලගනිල්ලා, ඊට පස්සේ මට කන්න සැල්දිරි කොළ පිඟානක් ඕනෑ! ආර්ග්හ්!"

සර්සි බෙරිහන් දුන්නා. මුහුදු මංකොල්ලකරුවෝ පන්නද්දී, එයයි, එයාගේ සේවිකාවෝ දෙන්නයි කාමරයෙන් එළියට දිව්වා.

කිණිස්ස කොපුවේ දමාගත් ඇනබෙත් මට රැව්වා.

"ස්තූතියි..." මට ගොත ගැසුණා. "මට ඇත්තටම සමා වෙන්න-"

මහ මෝඩයෙක් වගේ වැඩ කළාට සමාව ඉල්ලන්නේ කොහොමද කියලා මම හිතාගන්නත් කලින් මාව තදින් බදාගත් එයා, ඊ ඉක්මනින්ම වගේ ආපහු ඈත් වුණා. "ඔයා දැන් රට හාවෙක් නෙවෙයි නිසා මට හරිම සතුටුයි."

"මටත් එහෙමයි," මට දැනුණු තරමටම මගේ මුහුණ රතුවෙලා තියෙන්න එපා කියලා මම ප්‍රාර්ථනා කළා.



එයා කොණ්ඩයේ වූ රන් කෙඳි ගලවා දැමුවා.

"මෙහෙ එනවා, පාසි මොළේ," එයා කිවුවා. "සර්සි කලබලෙන් ඉන්න වෙලාවේ අපි මෙහෙන් පැන ගන්න ඕනෑ." බෙරිහන් දෙන සේවිකාවනුත්, රිසෝට් එක කොල්ලකන මුහුදු මංකොල්ලකරුවනුත් පසු කරගෙන, කඳු බෑවුමේ මළ හරහා අපි පහළට දිවුවා. කළු රැවුලාගේ මිනිස්සු සාදයට සූදානම් කර තිබූ පන්දම් කඩා දමමින්, ඖෂධ දවටන නාන තටාකවලට විසි කරමින්, තුවා ගොඩ ගසා තිබූ මේසවලට පයින් ගසමින් පෙරළුවා.

මේ කමකට නැති මංකොල්ලකාරයන්ව නිදහස් කළේ අපරාදෙ කියලා මට හිතුණත්, සියවස් තුනක් තිස්සේ කූඩුවක සිරවී සිටි එයාලට විනෝදය ඇති කරන දෙයක් ලැබිය යුතුයි කියලා මට පසුව හිතුණා.

"කොයි නැව ද?" අපි තොටුපළට ළඟා වුණාම ඇනබෙත් ඇසුවා.

ඒ ගැන අදහසක් නැතිව මම වටපිට බැලුවා. අපිට, අපේ බෝට්ටුව අරගෙන යන්න බැහැ. අපි හැකි තරම් ඉක්මනින් මේ දූපතෙන් ඈතට යන්න ඕනෑ, ඒත් අපි පාවිච්චි කරන්නේ මොකක් ද? සබ්මැරීනය? ෆයිටර් ජෙට් එක? මේ එකක්වත් මෙහෙයවන්න මම දන්නේ නැහැ. ඒ වෙලාවේ මට ඒක දකින්න ලැබුණා.

"අරක," මම කිවුවා.

ඇනබෙත් තදින් ඇහිපිය ගැසුවා. "ඒත්-"

"මට ඒක පදවන්න පුළුවන්."

"කොහොම ද?"

මට ඒක පහදා දෙන්න පුළුවන් වුණේ නැහැ. මට හොඳින්ම ගැළපෙන්නේ පරණ රුවල් නැව බව මම කොහොමදෝ දැන සිටියා විතරයි. ඇනබෙත්ගේ අතින් අල්ලාගත් මම කුඹ ගස් තුනක් ඇති නැව දෙසට එයාව ඇදගෙන දිවුවා. නැව් ඇණියේ පින්තාරු කර තිබූ නම මට කියවා තේරුම් ගන්න හැකිවුණේ පසුවයිඃ ක්වීන් ඈන්'ස් රිවෙන්ජ් (ඈන් රැජිනගේ පළිගැනීම.)

"ආර්ග්හ්!" පිටුපස කොහෙදෝ සිටි කළු රැවුලා මොරදුන්නා. "අර ගැටවු දෙන්නා මගේ රුවල් නැවට ගොඩවෙලා! කොල්ලනේ, උන්ව අල්ලගනිල්ලා!"

"අපිට වෙලාවට යාගන්න තීයටවත් බැරි වෙයි!" අපි නැව් තට්ටුවට ගොඩ වෙද්දී ඇනබෙත් මොර ගැහුවා. මම වටේ තිබුණු රුවල්, කඹ අවුල් ජාලය දෙසට බැල්මක් හෙළුවා. අවුරුදු තුන් සියයක් පරණ රුවල් නැවක් ලෙසට ඒක ඉතාමත් හොඳ තත්වයේ තිබුණා. ඒ වුණත් ඒක ගමනේ යොදවන්න නම් නාවිකයෝ පනස් දෙනෙකුට පැය ගාණක් කරන්න වැඩ තිබුණා. පත්දම් සහ සැල්දිරි දඬු වනමින් මංකොල්ලකරුවෝ පඩිපෙළ පහළට දුව එනවා මට පෙනුණා.

ඇස් පියාගත් මම නැව් කඳේ වදින රළවලට, මුහුදේ දියවැල්වලට සහ වටේට හමන සුළඟට සිත යොමු කළා. එක්වරම, නිවැරදි වචනය මගේ හිතට ආවා. "මිසන්මාස්ට්!" මම මොර දුන්නා.

මට පිස්සු හැදිලා වගේ ඇනබෙත් මගේ දිහා බැලුවත්, ඊළඟ තත්පරයේදී කඹ තදින් ඇදෙන, කැන්වස් දිග හැරෙන සහ ලී කප්පි කැරකෙන හඬවලින් සුළඟ පිරුණා.

ඉදිරියට ආ කේබලයක් නොවදින්න ඇනබෙත් පහත් වෙද්දී, එයාගේ ඔළුවට උඩින් ගිය එය නැව් බඳෙන් ඉදිරියට දිගු වී ඇති රිටේ ගැට ගැසුණා.

"පර්සි, කොහොමද..."

එයාට දෙන්න උත්තර මට තිබුණේ නැහැ, ඒත් මේ නැව මගේ ඇඟේම කොටසක් වගේ මට ප්‍රතිචාර දක්වනවා දැනුණා. රුවල් දිග ඇරෙන්න මම නියෝග කරද්දී, මගේ අතක් දිග ඇරෙනවා තරම් පහසුවෙන් එය සිදුවුණා. මම සුක්කානමට කැරකෙන්න නියම කළා. ක්වීන් ඈන්ස් රිවෙන්ජ් තොටුපළෙන් ඉවතට යාත්‍රා කළා. මුහුදු මංකොල්ලකරුවන් තොටුපළට ළඟා වෙද්දී, අපි රාක්ෂ සයුර බලා ගමන් ආරම්භ කරලා.

## 13

# ඇනබෙත් ගෙදර බලා පිහිනන්න උත්සාහ කළා

මම ඇත්තටම කරන්න දක්ෂ දෙයක් අන්තිමේදී හොයාගන්න ලැබුණා.

ක්වීන් ඈන්ස් රිවෙන්ජ් මගේ හැම නියෝගයකටම ප්‍රතිචාර දැක්වූවා. එසවිය යුත්තේ කොයි කඹය ද, නැංවිය යුත්තේ කොයි රුවල ද, නැව හැසිරවිය යුත්තේ කොයි දිසාවට ද මම දැන සිටියා. මට තේරුම් ගත හැකි වූ ආකාරයට අපි නාවික සැතපුම් දහයක පමණ වේගයෙන් රළ දෙබෑ කරගෙන ඉදිරියට ඇදුණා. එය කොයිතරම් වේගයක් ද කියලා මට වුණත් තේරුණා. රුවල් නැවකට ඒ වේගය හොඳටෝම ප්‍රමාණවත්. මගේ මුහුණේ වදින සුළඟ, නැව් ඇණියේ වැදී බිඳෙන රළ- මේ සෑම දෙයක්ම දැනුණේ අංග සම්පූර්ණවයි. ඒත්, දැන් අපි අනතුරින් මිදුණාට පස්සේ, මට කල්පනා වුණේ ටයිසන් නැතිව මට කොච්චර පාළුයි ද කියලත්, මම ග්‍රෝවර් ගැන කොයිතරම් වද වෙනව ද කියලත් විතරයි.

සර්සිගේ දූපතේදී මම හැමදේම අවුල් කරගත් හැටි හිතෙන් අමතක කරන්න මට බැරි වුණා. ඇනබෙත් නොහිටින්න මම තවමත් රට හාවෙක් වෙලා, හුරතල් බූල් මංකොල්ලකාරයෝ රොත්තක් එක්ක කූඩුවේ හැංගිලා ඉඳීවි. සර්සි කියූ දෙයක් ගැන මම කල්පනා කළා: පේනවද, පර්සි? ඔයා, ඔයාගේ සැබෑ ස්වරූපය පිටට ගත්තා!

මට දැනුණේ මම තවමත් වෙනස් වගෙයි. ඒ සලාද ගස් කන්න මට හදිසි පෙරේතකමක් දැනුණ නිසා විතරක් ම නෙවෙයි. මට

ඉක්මනින් කලබල වෙන ගතියක් දැනුණේ හරියට බයගුලු පුංචි සතෙක් මගේම කොටසක් වෙලා වගෙයි. සමහරවිට, මීට කලිනුත් එය මගේ ඇතුළේ තියෙන්න ඇති. මගේ හිතට ඇත්තටම වධ දුන්නේ අන්න ඒ කාරණයයි.

අපි මුළු රෑය පුරාම යාත්‍රා කළා.

ඇනබෙත් මට උදවු කරන්න උත්සාහ කළත්, නැවක යාත්‍රා කිරීම එයාට හරියන වැඩක් වුණේ නැහැ. ඉස්සරහට-පස්සට පැද්දෙමින් පැය කීපයක් ගත කරද්දී එයාගේ මූණ කොළ පාටට හැරුණා. ඉතින්, පහළ තට්ටුවට ගිහින් හැමොක් ඇඳක වැතිරී ඉන්න එයාට සිද්ධ වුණා.

ක්ෂිතිජය දෙස විපරමෙන් බලා සිටි මට කීප වතාවක්ම රාක්ෂයෝ දකින්න ලැබුණා. තට්ටු ගොඩනැගිල්ලක් තරම් උස වතුර කඳක් හඳ එළියට විදිමින් තිබුණා. කොළ පාට දඟර පේළියක් රළ අතරින් ලිස්සා ගියා- පෙනුණු හැටියට අඩි සියයක් විතර දිග සර්පයෝ රැළක්. ඒ ගැන හොයා බලන්න මට කොහෙත්ම ඕනෑ වුණේ නැහැ. වතාවක් දිලිසෙන ගැහැනු ආත්ම- ඒ කියන්නේ මුහුදු දෙවඟනෝ මට දකින්න ලැබුණා. මම එයාලට අත වනන්න උත්සාහ කළත්, එයාලා ගැඹුරු මුහුදේ නොපෙනී ගියේ එයාලා මාව දැක්කා ද, නොදැක්කා ද කියන සැකය මට ඉතිරි කරමින්. රෑ මැදියම පසුවී ටිකකින් ඇනබෙත් නැව් තට්ටුවට ආවා. ඒ වෙලාවේ අපි සිටියේ දුම් දමන ගිනිකඳු දූපතක් පසු කරමින්. වෙරළට කිට්ටුව මුහුද බුබුළු දමමින් හුමාලය පිට කළා.

"හෙෆාස්ටස් කම්මල්වලින් එකක්," ඇනබෙත් කිවුවා. "ලෝහ රාක්ෂයෝ හදන තැනක්."

"ලෝකඩ ගොන්නු වගේ?"

එයා ඔළුව වැනුවා. "වටෙන් යමු. පුළුවන් තරම් ඈතින්."

එයා දෙවරක් කියන තුරු මම බලා සිටියේ නැහැ. අපි දූපතෙන් හැකි තරම් ඈතට නැව රැගෙන ගියා. ඉක්මනින්ම ඒ දූපත අපිට පිටුපසින් රතු පාට මීදුම් පටලයක් පමණක් වුණා.

මම ඇනබෙත් දෙස බැලුවා. "ඔයා සයික්ලොප්ස්ලාට ඔච්චර වෛර කරන හේතුවයි... තාලියා ඇත්තටම මැරුණ හේතුවයි. එදා මොනවද සිද්ධ වුණේ?"

කළුවරට එයාගේ මුහුණෙන් පළ වූ හැඟීම් දකගන්න අමාරු වුණා.



"මං හිතන්නේ ඒක දැනගන්න ඔයාට අයිතියක් තියෙනවා," අන්තිමේදී එයා කිවුවා. "ග්‍රෝවර් අපිව කඳවුරට එක්කගෙන ගිය රෑ, එයා කලබල වෙලා වැරදි පාරකට හැරිලා තිබුණා. එයා ඒ ගැන ඔයාට කිවුවා මතක ද?" මම ඔළුව වැනුවා.

"හොඳයි, තරකම වැරදි පාර වුණේ බෲක්ලින්වල තිබුණු සයික්ලොප්ස් තිප්පොලකට හැරුණු එකයි."

"බෲක්ලින්වලත් සයික්ලොප්ස්ලා ඉන්නව ද?" මම ඇසුවා.

"කොච්චරක් ඉන්නව ද කියලා ඔයාට හිතාගන්නවත් බැරිවෙයි, ඒත් ඒක නෙවෙයි කාරණේ. මේ සයික්ලොප්ස් අපිව රැවැට්ටුවා. ෆ්ලැට්බුෂ්වල පරණ ගෙයක් ඇතුළේ වංකගිරියක් වගේ තිබුණු කොරිඩෝවලදී එයා කොහොමහරි අපිව වෙන් කළා. එයාට ඕනෑම කෙනෙක්ගේ හඬින් කතා කරන්න පුළුවන්, පර්සි. හරියට ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැවේදි ටයිසන් කළ විදිහටම. එක පාරකට එක්කෙනා ගාණේ එයා අපිව ඇමට අහු කරගත්තා. තාලියා හිතුවේ එයා දුවන්නේ ලූක්ව බේරගන්න කියලා. ලූක් හිතලා තිබුණේ මම උදවු ඉල්ලලා කෑගහනවා එයාට ඇහුණා කියලා. එතකොට මම... මම කළුවරේ තනි වුණා. එතකොට මට අවුරුදු හතයි. මට අඩු තරමේ පිටවෙන දොරවත් හොයාගන්න බැරි වුණා."

එයා මුහුණට වැටුණු කෙස් රොදක් ඉවත් කළා. "මම ප්‍රධාන කාමරය හොයාගෙන ගියා මතකයි. එතැන පොළොව පුරාම ඇටකටු විසිරිලා. තාලියා, ලූක්, ග්‍රෝවර් තුන්දෙනාව ගැට ගහලා, කටවල් බැඳලා දුම් වදින්න එල්ලපු මස් කෑලි වගේ සිවිලිමේ එල්ලලා තිබුණා. සයික්ලොප්ස් කාමරේ මැද ගිනි ගොඩක් පත්තු කර කර හිටියා. මම, මගේ කිණිස්ස ඇදලා ගත්තා, ඒත් එයාට මාව ඇහුණා. එයා හැරිලා බලලා හිනා වුණා. එයා කතා කළා, එයා කොහොමදෝ මගේ තාත්තගේ කටහඬ දැනගෙන හිටියා. මං හිතන්නේ එයා ඒක මගේ හිතෙන් හොයාගන්න ඇති. 'අනේ, ඇනබෙත්, ඔයා බය වෙන්න එපා. මං ඔයාට ආදරෙයි. ඔයාට මෙහෙ මාත් එක්ක ඉන්න පුළුවන්. ඔයාට හැමදාටම නවතින්න පුළුවන්.' කියලා එයා කිවුවා."

මාව වෙවුලා ගියා. එයා ඒක කියපු විදිහට- අවුරුදු හයකට පසුව, දැන් වුණත්- මීට කලින් අහපු කිසිම හොල්මන් කතාවකටත් වඩා මට බය හිතුණා. "ඔයා මොකද කළේ?"

"මං එයාගේ කකුලට ඇන්නා."

Scanned with CamScanner

මම පුදුමයෙන් එයා දිහා බලා සිටියා. "ඔයා විහිළු කරනව ද? අවුරුදු හතේ ඔයා ලොකු සයික්ලොප්ස් කෙනෙක්ගේ කකුලට ඇන්නා?"

"ඔව්, එයාට මාව මරන්න ඕනෑ තරම් ඉඩ තිබුණා. ඒත් මම එයාව පුදුම කළා. ඒකෙන් මට තාලියා ළඟට දුවලා, එයාගේ අත් ගැටගහලා තිබුණ ලණු කපන්න තරම් වෙලාව ලැබුණා. එතැන ඉඳන් තාලියා හැමදේම බලාගත්තා."

"ඔව්, ඒ වුණත්... ඒක නම් හරිම නිර්භීත වැඩක්, ඇනබෙත්."

එයා ඔළුව හෙල්ලුවා. "අපි පණපිටින් පැනගත්තේ බොහොම අමාරුවෙන්. මම තවමත් හීනෙන් බය වෙනවා, පර්සි. ඒ සයික්ලොප්ස් මගේ තාත්තගේ කටහඬෙන් කතා කරපු හැටි. එයා නිසා තමයි අපිට කඳවුරට යන්න ගොඩක් පරක්කු වුණේ. අපේ පස්සෙන් රාක්ෂයෝ ඔක්කොටම අපිව අල්ලගන්න වෙලාව ලැබුණා. අන්න ඒ නිසයි තාලියා මැරුණේ. ඒ සයික්ලොප්ස් නොහිටියා නම් තාලියා තවමත් ඉන්නවා."

නැව් තට්ටුව උඩ ඉඳගත් අපි රෑ අහසේ පායා එන හර්කියුලිස්ගේ තරු රටාව දෙස බලා සිටියා.

"පහළට යන්න," අන්තිමේදී ඇනබෙත් මට කිවුවා. "ඔයා ටිකක් විවේක ගන්න ඕනෑ." මම ඔළුව වැනුවා. මගේ ඇස් බර වෙලයි තිබුණේ. ඒත් පහළට ගිහින් හැමොක් ඇඳක් හොයාගත්තට පස්සේ, මට නින්දට වැටෙන්න සෑහෙන වෙලාවක් ගියා. ඇනබෙත්ගේ කතාව මගේ හිතේ පෙරළි කරමින් තිබුණා. මම එයා වුණා නම්, මේ ගවේෂණයට එකතු වෙලා, තවත් සයික්ලොප්ස් තිප්පොලකට කෙලින්ම යාත්‍රා කරන්න තරම් ධෛර්යයක් මට තියේවි ද හිතලා මම පුදුම වුණා.

ඒ නින්දේදී මට ග්‍රෝවර් ගැන හීන කිසිවක් පෙනුණේ නැහැ.

ඒ වෙනුවට, මම ආපසු ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැවේ ලූක්ගේ කාමරයට ගිහින් ඉන්නවා දැක්කා. එහි ජනෙල් තිර ඇර දමා තිබුණා. පිටතින් පෙනුණේ රෑ කළුවරයි. සෙවණැලිවලින් වාතය කැලඹුණා. මගේ වටේටම හඬවල් කෙඳිරුවා- මළවුන්ගේ ආත්ම.

පරිස්සමෙන්, එයාලා කෙඳිරුවා. උගුල්. වංචාවල්.

ක්‍රෝනොස්ගේ රන් මිනී පෙට්ටිය යාත්තමින් දිලිසුණා- කාමරයේ තිබුණු එකම එළිය එයයි. කෲර හිනා හඬකින් මාව තිගැස්සුණා. නැවේ සිට සැතපුම් ගාණක් පහළින් ඒ හඬ මතු වෙනවා



වගෙයි පෙනුණේ. නුඹට ධෛර්යයක් නෑ, පොඩි එකෝ. මාව නවත්වන්න නුඹට බැහැ.

කළ යුතු දේ මම දැන සිටියා. මට ඒ මිනී පෙට්ටිය අරින්න වෙනවා.

මම රිප්ටයිඩ්ගේ කොපුව ගැලවූවා. අවතාර මාව වට කරගෙන ටොනේඩෝවක් සුළි නංවන්න ගත්තා. පරිස්සමෙන්!

මගේ හදවත වේගයෙන් සැලුණා. මට, මගේ කකුල් සොලවන්න බැරි වුණා. ඒත් මම ක්‍රෝනොස්ව නවත්වන්න ඕනෑ. ඒ පෙට්ටිය ඇතුළේ තියෙන දේ මම විනාශ කරන්න ඕනෑ.

ඒ වෙලාවේ, මට එහා පැත්තෙන් ගැහැනු ළමයෙක් කතා කළා: "හොඳයි, පාසි මොළේ?" ඇනබෙත්ව දකින බලාපොරොත්තුවෙන් මම හැරී බැලුවත් එතැන සිටියේ ඇනබෙත් නෙවෙයි. වැදගැම්මකට නැති මෝස්තරයක ඇඳුම් හැඳ සිටි එයා අතේ රිදී දම්වැල් ඔතාගෙන සිටියා. එයාට කළු කුරු කොණ්ඩයකුත්, අඳුරු අයි-ලයිනර්වලින් හැඩ කළ කැලඹෙන නිල් පාට ඇස් දෙකකුත්, නහය හරහා විසිරුණු ලප ගොඩකුත් තිබුණා. එයාගේ පෙනුම හුරුපුරුදු වුණත්, ඒ ඇයි කියලා මට හිතාගන්න බැරි වුණා.

"ඉතින්?" එයා ඇසුවා. "අපි එයාව නතර කරනවද, නැද්ද?"

මට උත්තර දෙන්න බැරි වුණා. මට හෙලවෙන්නවත් බැරි වුණා.

ගැහැනු ළමයා ඇස් දෙක කැරකුවා. "හොඳයි, මටයි ඒගිස්ටයි මේ වැඩේ බාරදෙන්න." එයා මැණික් කටුවට තට්ටු කරද්දී රිදී දම්වැල් වෙනස් වෙන්න ගත්තා- සමතලා වෙමින් පැතිරුණු ඒවා ලොකු පලිහකට හැරුණා. රිදී සහ ලෝකඩින් සාදා තිබුණු එය මැදින් මෙඩූසාගේ රාක්ෂ මුහුණ පිටට නෙරා තිබුණා. එය පෙනුණේ මෙඩූසාගේ මුහුණ ඇත්තටම ලෝහයට ඔබ්බවලා වගෙයි. මාව ගල් කරවන්න ඒකට හැකියාව තිබුණ ද කියලා මම දැන සිටියේ නැතත්, මම අහක බලාගත්තා. එය ළඟ හිඳීමෙන් පවා මාව බයෙන් හිරිවැටුණා. නියම සටනකදී මේ පලිහ දරාගෙන ඉන්න කෙනාව පරදවන්න කොහෙත්ම බැරි වෙයි කියලා මට හිතුණා. හොඳ සිහියෙන් ඉන්න ඕනෑම හතුරෙක් අනෙක් පැත්ත හැරිලා දුවන්න ගනීවි. කඩුව ඇදගත් ගැහැනු ළමයා මිනී පෙට්ටිය ඉදිරියට ගියා. පලිහෙන් විහිදුණු රැස් මාලාව ඉදිරියේ සීසීකඩ විසිරුණු සෙවණැලි ආත්ම එයාට යන්න ඉඩ දී දෙපසට වුණා.

Scanned with CamScanner

"එපා," එයාට අනතුරු අඟවන්න මම උත්සාහ කළා.

ඒත් එයා ඇහුම්කන් දුන්නේ නැහැ. මිනී පෙට්ටිය වෙතට කෙලින්ම ගිය එයා එහි රන් පියන පැත්තකට තල්ලු කළා.

මොහොතක් ගතවන තුරු එයා එතැනම සිටගෙන, පෙට්ටිය තුළ වූ දෙය දෙස ඕනෑකමින් බලා සිටියා. මිනී පෙට්ටිය දිලිසෙන්න ගත්තා.

"නෑ," ගැහැනු ළමයාගේ හඬ වෙවුලුවා. "එහෙම වෙන්න බැහැ." මුහුදු පතුලේ සිට මහ හඬින් හිනාවුණු ක්‍රෝනොස්ගේ හඬට නැව සැලුණා.

"නෑ!" මිනී පෙට්ටියෙන් නිකුත් වූ රන් පාට එළියක් ගැහැනු ළමයාව ගිල ගනිද්දී එයා බෙරිහන් දුන්නා.

"ආහ්!" වේගයෙන් නැගිටපු මම, මගේ හැමොක් ඇදේ වාඩි වුණා.

ඇනබෙත් මාව සොලවමින් සිටියා. "පර්සි, ඔයා හීනෙන් බය වෙලා. ඔයා දැන් නැගිටින්න ඕනෑ."

"මො-මොකක්ද ඒ?" මම ඇස් පොඩි කළා. "මොකක්ද අවුල?"

"ගොඩබිමක්," එයා කරදරෙන් වගේ කිව්වා. "අපි දිය කිඳුරියන්ගේ දූපතට ළං වෙනවා."

අපිට ඉදිරියෙන් වූ ගොඩබිම මට යාන්තමින් දැකගන්න හැකි වුණේ මීදුම අතරේ අඳුරු පැල්ලමක් වගෙයි.

"ඔයා මට උදව්වක් කරන්න ඕනෑ," ඇනබෙත් කිව්වා. "මේ කිඳුරියෝ... එයාලගේ ගායනා ඇහෙන ඉසව්වට අපි ඉක්මනින්ම ළං වෙයි."

මට දිය කිඳුරියන්ගේ කතාව මතක් වුණා. එයාලා කොයිතරම් මිහිරිව ගායනා කරනවා ද කියනවා නම්, එයාලගේ හඬට වශීවෙන නාවිකයන්ව එයාලා මර උගුලට හසු කරගන්නවාලු.

"ප්‍රශ්නයක් නෑ," මම එයාව අස්වැසුවා. "අපිට, අපේ කන් වහගන්න පුළුවන්. පහළ තට්ටුවේ ඉටිපන්දම් කිරි බාල්දියක්ම තිබුණා- "

"මට ඒවා අහන්න ඕනෑ."

මම තදින් ඇහිපිය ගැසුවා. "මොකට ද?"



"කතාවක් තියෙනවා කිඳුරියෝ ගායනා කරන්නේ ඔයාගේ ඇත්තම ආශාවන් ගැනලු. ඔයා ගැන ඔයාවත් තේරුම්ගෙන නැති දේවල් එයාලා ඔයාට කියනවලු. අන්න ඒ නිසයි ඒවට හිත් වශී වෙන්නේ. ඔයාට ජීවිතේ බේරගන්න ලැබුණොත්... ඔයා ගොඩක් බුද්ධිමත් කෙනෙක් වෙනවා. මටත් ඒවා අහන්න ඕනෑ. මේ අවස්ථාව මට ආයේ ලැබෙයි ද?"

වෙන කවුරුහරි මේ කතාව කිව්වා නම්, ඒක තේරුමක් නැති කතාවක් වෙනවා. ඒත් ඇනබෙත්ගේ වැඩ ඒ වගෙයි- මෙහෙමයි, පෞරාණික ග්‍රීක ගෘහ නිර්මාණ පොත් එක්ක ඔට්ටු වෙන්නත්, ඉතිහාසය පෙන්වන නාලිකාවල වාර්තා වැඩසටහන් බලලා විනෝද වෙන්නත් එයාට පුළුවන් නම්, කිඳුරියන්ගේ ගායනාවලුත් එයාට දිරවගන්න පුළුවන් වෙයි කියලා මම හිතුවා. එයා මට එයාගේ සැලසුම කිව්වා. අකමැත්තෙන් වුණත්, එයාට සූදානම් වෙන්න මම උදවු කළා.

දූපතේ ගලින් වටවුණු මුහුදු තීරය පෙනෙන මානයට ආ හැටියේම, ඇනබෙත්ගේ ඉණ වටේ එතිලා, එයාව ඉදිරි කුඹ ගහට ගැට ගසන්න මම කඹයකට අණ කළා.

"මොනවා සිද්ධ වුණත්, මං කොච්චර කංකෙඳිරි ගෑවත් මාව ලිහන්න නම් එපා," එයා කිව්වා. "කෙලින්ම අතනට ගිහිල්ලා, ගිලිලා මැරෙන්න මට ඕනෑ වෙයි."

"ඔයා මාව අවුස්සන්න ද හදන්නේ?"

"හා-හා."

එයාව හොඳින් බලාගන්න මම පොරොන්දු වුණා. ඊට පස්සේ ලොකු ඉටි පන්දම් කිරි ගුළි දෙකක් ගත් මම ඒවායින් ඇබ දෙකක් හදලා, කන් දෙකේ ගසා ගත්තා.

ඇනබෙත් උපහාසයෙන් ඔළුව වැනුවේ කන් ඇබ නියම විලාසිතාවක් කියලා අඟවන්න වගෙයි. මම එයාට ඇද කරලා සුක්කානම වෙතට හැරුණා.

ඒ නිශ්ශබ්දතාවය බය උපදවන්නක් වුණා. මගේ ඔළුව ඇතුළේ ලේ ගලන හඬ ඇරෙන්න වෙන කිසිවක් මට ඇසුණේ නැහැ. අපි දූපතට ළං වෙද්දී රළු ගල්කුළු මීදුම අතරින් මතුවුණා. ඒවායින් ඈත් වී වටෙන් යාත්‍රා කරන්න මම ක්වීන් ඈන්'ස් රිවෙන්ජ්ට නියෝග කළා. අපි තව ටිකක් හරි කිට්ටුවෙන් යාත්‍රා කළා නම් ඒ ගල්කුළු

ඇඹරුම් යන්ත්‍රයක තල වගේ අපේ නැව් කඳ තීරුවලට ඉරා දමන්න ඉඩ තිබුණා.

මම ආපසු හැරී බැලුවා. මුලින්ම, ඇනබෙත් කිසිම අවුලක් නැතිව ඉන්නවා වගෙයි පෙනුණේ. ඊට පස්සේ එයාගේ මුහුණට අන්දබූත වුණ පෙනුමක් ආවා. එයාගේ ඇස් ලොකු වුණා.

එයා කඹ ගලවාගන්න දඟලුවා. එයා මගේ නම කියමින් කතා කළා- ඒක මම තේරුම් ගත්තේ එයාගේ තොල් සෙලවෙන දෙස බලා හිඳිමෙනුයි. එයාගේ මුහුණෙන් පළ වූ අදහස හරිම පැහැදිලියි: එයාට එතැනින් ගැලවෙන්න ඕනෑ. ඒක ජීවිතයත් මරණයත් අතර දෙයක්. මම මේ දන්ම එයාව කඹවලින් ගලවන්න ඕනෑ.

එයා කොච්චර බැගෑපත් බැල්මෙන් බැලුවා ද කියනවා නම්, එයාගේ බැමි නොකපා ඉන්න මට හරි අමාරු වුණා. වෙනතක් බලාගන්න මම, මටම බල කළා. මම ක්වීන් ඈන්'ස් රිවේන්ජ්ට හැකි උපරිම වේගයෙන් යන්න නියම කළා. මට තවමත් දූපතේ වැඩි දෙයක් දකගන්න ලැබුණේ නැහැ- තිබුණේ මීදුම සහ ගල්කුළු විතරයි. ඒත් වතුරේ පාවෙමින් ආ දේවල් අතර ලී කැලි, ෆයිබර් ග්ලාස්, පරණ නැව්වල සුන්බුන් වගේම ගුවන්යානාවල පාවෙන කොට්ටත් තිබුණා.

සංගීතයෙන් මේ තරම් ජීවිත ගාණක් නොමඟ යවන්නේ කොහොම ද? මං කියන්නේ, ඇත්තටම සමහර සින්දු ඇහෙද්දී මටත් ගුවන් යානයකින් බිමට පනින්න හිතිලා තියෙනවා තමයි. ඒ වුණත්... මේ කිඳුරියෝ ගායනා කරනවා ඇත්තේ මොනවා ගැන ද?

එක බිහිසුණු මොහොතකට, මට ඇනබෙත්ගේ කුතුහලය තේරුම් ගියා. කන් ඇබ ගලවා දමා, ගීතවලට සවන් දෙන්න මට පෙළඹවීමක් ඇති වුණා. කිඳුරියන්ගේ හඬ නැවේ ලී තුළින් කම්පනය වෙමින්, මගේ හද ගැස්මේ හඬ සමඟ කන් තුළ රැව් දෙනවා මට ඇසුණා.

ඇනබෙත් මට පිංසෙණ්ඩු වෙන්න ගත්තා. එයාගේ කම්මුල් දිගේ කඳුළු වැල් බේරුණා. එයා කඹවලින් ගැලවෙන්න දඟලුවේ හරියට ඒවා එයා ආදරය කරන හැමදෙයකින්ම එයාව වෙන්කරලා වගෙයි. ඔයා කොහොමද ඔච්චර නපුරු වෙන්නේ? එයා මගෙන් අහනවා වගේ පෙනුණා. මං හිතුවේ ඔයා මගේ යාළුවා කියලා. මම මීදුමෙන් පිරුණු දූපතට රැව්වා. මට, මගේ කඩුව පිටට ගන්න ඕනෑ



වුණා, ඒත් එතැන සටන් කරන්න මොකෙක්වත් නෑ. මම කොහොමද සින්දුවක් එක්ක සටන් කරන්නේ?

මම ඇනබෙත් දෙස නොබලා ඉන්න තදින්ම උත්සාහ කළා. විනාඩි පහක් විතර එහෙම ඉන්න පුළුවන් වුණා. මම කළ ලොකුම වැරැද්ද එයයි.

තවදුරටත් ඉවසාගෙන ඉන්න බැරිම තැන මම හැරිලා බලද්දී දකින්න ලැබුණේ... කඹ කැලි ගොඩක්. හිස් කුඹ ගහක්. ඇනබෙත්ගේ ලෝකඩ කිණිස්ස නැව් තට්ටුව උඩ වැටී තිබුණා. කොහොමහරි, ඒක අතට ගන්න එයාට පුළුවන් වෙලා. එයාව නිරායුධ කරන්න මට සම්පූර්ණයෙන්ම අමතක වුණා නේ.

නැවේ පැත්තකට දිවූ මට එයා පිස්සුවෙන් වගේ දූපතට පිහිනනවා දකින්න ලැබුණා. සැඩ රළ එයාව රළු ගල්කුළු දෙසට ගෙනයමින් සිටියා.

මම එයාගේ නම කියමින් බෙරිහන් දුන්නා, එයාට මාව ඇහුණත් එයින් වැඩක් වුණේ නැහැ. එයා හරිම ආසාවෙන් එයාගේ මරණය වෙතට පිහිනමින් සිටියා.

නැවේ සුක්කානම දෙස බැලූ මම මොරදුන්නා, "නවතින්න!"

ඊට පස්සේ මම වතුරට පැන්නා.

වතුර දෙබෑ කරමින් කිමිදුන මම, දියවැල්වලට මගේ වටේ එති, මාව වේගයෙන් ඉදිරියට තල්ලු කරන්න නියම කළා.

මම වතුර මතුපිටට ඇවිත් ඇනබෙත් සිටි තැන සොයාගත්තා, ඒත් රැල්ලක් එයාව අල්ලාගෙන, දැලිපිහි වගේ තියුණු ගල්කුළු දෙකක් අතරින් ඇදගෙන ගියා.

මට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. මම එයා පසුපස පිහිනන්න පටන් ගත්තා.

සුන්බුන් වූ නැව් කඳක් යටින් කිමිදුන මම දම්වැල්වලින් ගැට ගැසූ පාවෙන ලෝහ බෝල අතරින් රිංගමින් ගියා- ඒවා බිම් බෝම්බ බව මට තේරුණේ පසුවයි. ගලක හැපී චප්ප නොවී ඉන්නත්, වතුරේදී මතුපිටට කිට්ටුවෙන් වූ කටු කම්බි දැලක නොපැටලී ඉන්නත්, මට ඇති සියලුම බලයත් පාවිච්චි කරන්න මට සිදුවුණා.

Scanned with CamScanner

දළිපිහි වගේ තියුණු ගල්කුළු දෙක අතරින් වේගයෙන් ගිය මම ඇතුළු වුණේ අඩ හඳක හැඩයේ මුහුදු බොක්කක් තුළටයි. එතැන ගල්කුළු, හැව්වල සුන්බුන් සහ පාවෙන බෝම්බ වැඩි වැඩියෙන් තිබුණා. කළු ගිනිකඳු වැල්ලෙන් වෙරළ වැසිලා.

මම ඈනබෙත්ව දකින්න බලාපොරොත්තුවෙන් හැමතැනම බැලුවා.

අන්න එයා ඉන්නවා.

වාසනාවකට හෝ අවාසනාවකට, එයා හොඳ පිහිනුම්කාරියක්. ඉතින්, බෝම්බ සහ ගල්කුළු පසු කරගෙන එයා කොහොමහරි ඇවිල්ලා, එයා කළු වෙරළටම ළං වෙමිනුයි සිටියේ.

ඊත් එක්කම තුනී වූ මීදුම අතරින් මට එයාලව දකින්න ලැබුණා- සිදුරියෝ.

මිනිස්සු තරම් විශාල ගිජු ලිහිණියෝ රැනක් හිතේ මවා ගන්න- කිලුටු කළු පිහාටු, අළු පාට නිය සහ රැලි වැටුණු රෝස පාට බෙලි ඇති එවුන්. දැන් ඒ බෙලි උඩ මිනිස් ඔළු තිබනවා හිතේ මවා ගන්න, හැබැයි ඒ මිනිස් ඔළු සැරින් සැරේට වෙනස් වෙනවා.

මට එයාලව නැසුණත්, එයාලා ගායනා කරන බව මට පෙනුණා. එයාලගේ කටවල් සෙලවෙද්දී, එයාලගේ මුහුණු මම දන්න-කියන අයගේ මුහුණුවලට මාරුවුණා- මගේ අම්මා, පොසෙයිඩන්, ග්‍රෝවර්, ටයිසන්, කයිරොන්. මට වැඩිපුරම දකින්න ඕනෑවුණු හැම දෙනාම. මට ඉදිරියට එන්න ආරාධනා කරමින් එයාලා මාව දිරිමත් කරන සිනා පෑවා. ඒත්, එයාලා මොන පෙනුම ගත්තත් එයාලගේ කටවල්වල කලින් කාපු කෑම කොටස් තට්ටු බැඳී තිබුණා. ගිජු ලිහිණියෝ වගේ එයාලත් කෑම කනවා ඇත්තේ මුහුණුවලින්. පෙනුණු හැටියට එයාලා කාලා තිබුණේ රාක්ෂ ඩෝනට් නම් නෙවෙයි.

ඈනබෙත් එයාලා දෙසට පිහිනුවා.

එයාට වතුරෙන් ගොඩට යන්න ඉඩ දෙන්න බැරි බව මම දැන සිටියා. මට අවස්ථාවක් ලැබෙන්නේ මුහුදේ දී විතරයි. මුහුද හැම වෙලාවෙම මාව ආරක්ෂා කරනවා. මම වේගයෙන් ඉදිරියට තල්ලු වී එයාගේ වළලුකර ඩැහැගත්තා.



මම එයාව ඇල්ලූ මොහොතේ මගේ ඇඟ පුරා කම්පනයක් ඇතිරුණේ, ඈනබෙත් සිදුරියන්ව දකිමින් සිටි ආකාරය මටත් දකින්න සලස්වමින්.

මධ්‍යම උද්‍යානයේ එලූ පික්නික් බ්ලැන්කෙට්ටුවක් මත තුන්දෙනෙක් වාඩි වී සිටියා. එයාලා ඉදිරියේ කෑම-බීම ගොඩක් අතුරා තිබුණා. ඈනබෙත් මට පෙන්වා තිබූ ඡායාරූපවලින් මම එයාගේ තාත්තාව හඳුනාගත්තා- ක්‍රීඩාශීලී පෙනුමකුත්, වැලි පාට කොණ්ඩයකුත් ඇති, හතලිස් ගණන්වල පසුවෙන පිරිමියෙක්. එයා ඈනබෙත්ගේ පෙනුමම ඇති ලස්සන ගැහැනු කෙනෙක් සමග අත් අල්ලාගෙන සිටියා. ඒ ගැහැනු කෙනා සාමාන්‍ය ඇඳුම්වලින්- නිල් කලිසමක්, ඩෙනිම් කමිසයක් සහ ගමනට පලඳින බූට්වලින් සැරසී සිටියත් එයාගෙන් බලයේ රැස් විහිදුණා. මම බලා සිටියේ ඇතීනා දෙවඟන දිහා බව මට තේරුණා. එයාලා ළඟින්ම තරුණ කොල්ලෙක් වාඩි වී සිටියා... ලූක්.

මුළු දර්ශනයම උණුසුම්, ප්‍රියජනක එළියකින් දිලිසුණා. ඒ තුන්දෙනා හිනාවෙමින්, කතා කරමින් සිටියා. ඈනබෙත්ව දැක්කම එයාලගේ මුහුණු සතුටින් එළිය වුණා. ඈනබෙත්ගේ අම්මයි තාත්තයි එයාට අත දිගු කළා. කට කොණකින් හිනාවුණ ලූක්, එයා ළඟින් වාඩිවෙන්න ඈනබෙත්ට සන් කළා- හරියට එයා කවදාවත් ඈනබෙත්ට ද්‍රෝහි වුණේ නැහැ වගෙයි, හරියට එයාලා තවමත් හොඳම යාළුවෝ වගෙයි. මධ්‍යම උද්‍යානයේ ගස්වලට පිටුපසින් නගරයක් නැගී සිටියා. ඒක දකිද්දී මට හුස්ම ගන්නත් අමතක වුණා. මොකද, ඒ නගරය මැන්හැටන් වුණත්, දකලා පුරුදු මැන්හැටන් නෙවෙයි. දීප්තිමත් කිරිගරුඬවලින් ඒ නගරය තිබුණාටත් වඩා විශාලව හා ගාම්භීරව නැවත ගොඩ නංවලා. රන් පාට ජනේල සහ ගොඩනැගිලි මුදුන්වල සැඳූ උයන් ඇති ඒ නගරය නිව්යෝක්වලටත් වඩා ලස්සනයි. අඩු තරමේ ඔලිම්පස් කන්දටත් වඩා ලස්සනයි.

මේ සියල්ල ඈනබෙත් නිර්මාණය කළ ඒවා බව මම ඉක්මනින්ම තේරුම් ගත්තා. අලුතින් ගොඩනැගෙන ලෝකය නිර්මාණය කළ නිර්මාණ ශිල්පියා එයයි. එයාගේ දෙමව්පියන්ව නැවත එකතු කරන්න එයාට හැකි වෙලා. එයා ලූක්වත් බේරගෙන. එයාට උවමනා කළ හැමදේම එයා කරලා තිබුණා.

මම නදින් ඇස් පියාගත්තා. ආපසු ඇස් අරිද්දි මට දකින්න ලැබුණේ කිඳුරියෝ ටික විතරයි- තවත් ගොදුරක රස බලන්න සූදානමෙන් ඉන්නා, මිනිස් මුහුණු ඇති වැරහැලි වගේ ගිජු ලිහිණියෝ.

මම ඇනබෙත්ව ආපසු රැල්ලට ඇදලා ගත්තා. මට ඇහුණේ නැතත්, එයා බෙරිහන් දෙන බව මට තේරුණා. එයා මගේ මුහුණට පයින් ගැසුවත්, මම අත නොහැර ම සිටියා.

අපිව මුහුදු බොක්කෙන් පිටට ගෙනයන්න මම දියවැල්වලින් ඉල්ලුවා. ඇනබෙත් මිට මොළවාගත් අත්වලින් සහ කකුල්වලින් ගසමින්, මට වැඩේ තවත් අමාරු කළා. එයා කොච්චර දඟලුවා ද කියනවා නම්, තව පොඩ්ඩෙන් අපි පාවෙන බෝම්බයක හැප්පෙනවා. මොනවා කරන්න ද මට හිතාගන්න බැරි වුණා. මේ විදිහට එයා දිගටම පොර බැදුවොත් අපිට පණපිටින් නැවට යන්න නම් ලැබෙන්නේ නැහැ. අපි වතුර යටට යද්දි ඇනබෙත්ගේ දඟලිල්ල නතර වුණා. එයාගේ මුහුණට පැටලුණු පෙනුමක් ආවා. ඒත් එක්කම අපේ හිස් වතුරෙන් උඩට මතු වෙද්දි එයා ආයෙම පොර බදන්න පටන් ගත්තා.

වතුරේ වතුර ඇතුළේ දී ශබ්ද තරංග හොඳින් ගමන් කරන්නේ නැහැ. මට එයාව වතුර යට ගිල්වා තියාගන්න පුළුවන් වුණොත්, සංගීත වශිය බිඳින්න මට පුළුවන් වෙයි. ඇත්තටම, ඇනබෙත්ට හුස්ම ගන්න නම් බැරි වෙයි තමයි, ඒත් ඒ වෙලාවේ හැටියට ඒක එච්චර ප්‍රශ්නයක් නෙවෙයි වගෙයි පෙනුණේ.

එයාගේ ඉණ වටෙන් අත දමා අල්ලගත් මම, අපිව පහළට තල්ලු කරන්න රළවලට අණ කළා. අපි මුහුදේ ගැඹුරට කිඳා බැස්සා- අඩි දහයක්, අඩි විස්සක්. ඇනබෙත්ට වඩා මට පීඩනය දරාගන්න පුළුවන් නිසා මම පරිස්සම් වෙන්න ඕනෑ බව මම දන සිටියා. අපි වටේන්ම බුබුළු ඉහළ නගිද්දි එයා හුස්ම ගන්න දඟලුවා.

බුබුළු.

මම සිටියේ හරිම දරුණු අවස්ථාවකට මැදි වෙලයි. මම කොහොමහරි ඇනබෙත්ව පණපිටින් තියාගන්න ඕනෑ. මුළු මුහුදේම ඇති බුබුළු මම සිතේ මවාගත්තා- නිතරම කැලතෙමින් ඉහළ නගින බුබුළු. ඒවා සියල්ල එකට එකතු වෙලා, මගේ දෙසට ඇදෙනවා මම සිතේ මවාගත්තා.

සයුර මට කීකරු වුණා. සුදු පාට කැලතීමක් එක්ක, කිති කැවෙන හැඟීමක් මගේ වටේටම දැනුණා. ඊට පස්සේ මගේ පෙනීම



පැහැදිලි වෙද්දි, ඇනබෙත්ව සහ මාව වට කරගෙන යෝධ වායු බුබුළක් සෑදී තිබුණා. එයින් පිටට පැන තිබුණේ අපේ කකුල් විතරයි.

නදින් හුස්මක් ඇදගත් එයා කැස්සා. එයාගේ මුළු ඇඟම වෙවුලුවා. ඒත් එයා දිහා බලද්දි, එයාගේ වශිය බිඳී ගිහින් කියලා මට තේරුණා.

එයා ඉකි ගහන්න පටන් ගත්තා- මං අදහස් කළේ දරුණු, ඉවසන්න බැරි දුකෙන් කරපු ඉකිගැසීමක්. එයා මගේ උරහිසේ ඔළුව තියාගත්තා.

අපිව බලන්න මාළුවෝ රැස් වුණා- බැරකියුඩා මාළු රැනක්ම, ඔපාදූප හොයන මාර්ලින් මාළුවෝ කීප දෙනෙක්. යනවා යන්න! මම එයාලට කිවුවා.

එයාලා ආපසු පිහිනා ගියත්, ඒ කැමැත්තෙන් නෙවෙයි කියලා මට තේරුණා. එයාලගේ හිතේ තිබුණු අදහස මට තේරුණා කියලා දිවුරන්න වුණත් පුළුවන්. එයාලා ලෑස්ති වුණේ පොසෙයිඩන්ගේ පුතායි, තවත් ගැහැනු ළමයෙකුයි කිඳුරු බොක්ක පතුලේ ඉන්නවා කියන කටකතාව මුළු මුහුද පුරාම පතුරවන්නයි.

"මම ඔයාව නැවට අරන් යන්නම්," මම එයාට කිවුවා. "බය වෙන්න එපා. මාව අල්ලගෙනම ඉන්න." එයාට දන් ප්‍රශ්නයක් නැති බව පෙන්වන්න ඔළුව වැනූ ඇනබෙත්, ඊට පස්සේ මොනවදෝ මිමිණුවත් මගේ කන්වල ඉටි නිසා ඒක ඇහුණේ නම් නැහැ.

හෙමින් සීරුවේ දූපතෙන් ඉවතට ඇදෙන ක්වීන් ඈන්ස් රිවෙන්ජ් දෙසට ගල්කුළු සහ කටු කම්බි අතරින් දියවැල් අපේ අරුම පුදුම පුංචි වායු සබ්මැරීනය ගෙන ගියා.

කිඳුරු ගායනා ඇහෙන මානයෙන් පිටවූ බව සහතික වන තුරුම අපි වතුර යට රැඳුණා. ඉන්පසු අපි වතුරෙන් උඩට මතු වෙද්දි අපේ වායු බුබුළ පුපුරා ගියා.

මගේ නියෝගයෙන් පහළට වැටුණු ලණු ඉණිමග දිගේ නැගලා අපි නැව් තට්ටුවට ගොඩ වුණා. වැඩි ආරක්ෂාවට මම කන් ඇබ නොගලවාම සිටියා. දූපත සම්පූර්ණයෙන් නොපෙනී යන තුරු අපි යාත්‍රා කළා. ඇනබෙත් බ්ලැන්කට්ටුවක් ඇගේ ඔතාගෙන නැව් තට්ටුව උඩ වාඩි වුණා. දුකෙන් ඇස් අඳුරු කරගෙන සිටි එයා අන්තිමේදි මගේ දිහා බලලා ඉඟි කළා, දන් පරිස්සම්.

මම කන් ඇබ ගලවා දැමුවා. ගායනා කිසිවක් නැහැ. නැව් බඳේ රළ වදින හඬ ඇර හවස් වරුවම නිහඬ වුණා. මීදුම පහ වී ගිහින් නිල් අහස මතුවුණේ හරියට කිඳුරු දූපත කිසිදාක නොතිබුණා වගෙයි.

"ඔයා හොඳින් ද?" මම ඇහුවා. ඒක මගේ කටින් පිටවුණු මොහොතේම, ඒක කොයි තරම් මෝඩ ප්‍රශ්නයක් ද කියලා මටම තේරුණා. ඇත්තටම එයා සිටියේ හොඳින් නෙවෙයි.

"මට කලින් තේරුම් ගන්න බැරි වුණා," එයා මිමිණුවා.

"මොනවද?"

එයාගේ ඇස් දෙකත් කිඳුරු දූපතේ පැතිරී තිබූ මීදුමේ පාට ගත්තා. "ඒ පෙලඹවීම කොච්චර බලගතු වෙයි ද කියලා."

කිඳුරියෝ එයාට පොරොන්දු වූ දේවල් මම දුටු බව පිළිගන්න මට ඕනෑ වුණේ නැහැ. මට දැනුණේ මම වැරැද්දක් කළා වගෙයි. ඒ කොහොම වුණත් මම ඒ ගැන ඇනබෙත්ට කියන්නම ඕනෑ බව මම දැන සිටියා.

"ඔයා මැන්හැටන් අලුතෙන් හැදුව විදිහ මම දැක්කා," මම එයාට කිව්වා. "තව ලූක්වයි, ඔයාගෙ අම්මවයි තාත්තවයි දැක්කා."

එයාගේ කම්මුල් රතු වුණා. "ඔයා ඒක දැක්ක ද?"

"අලුතෙන්ම ලෝකය පටන් ගමු කියලා ප්‍රින්සස් ඇන්ඩ්‍රොමිඩාවේදි ලූක් ඔයාට කියපු කතාව... ඒක ඇත්තටම ඔයාගේ හිතට වැදිලා, නේ?"

එයා බ්ලැන්කට්ටුව තවත් තදින් ඔතා ගත්තා. "මගේ මාරක වැරැද්ද. ඒක තමයි කිඳුරියෝ මට පෙන්නුවේ. මගේ මාරක වැරැද්ද තමයි හියුබ්‍රිස්."

මම තදින් ඇසිපිය ගැසුවා. "අර වෙජී සැන්ඩ්විච්වලට උඩ ගාන දුඹුරු පාට ජාතිය?" එයා ඇස් කැරකුවා. "නෑ, පාසි මොළේ. ඒ හුමුස්. හියුබ්‍රිස් ඊට වඩා නරකයි."

"හුමුස්වලටත් වඩා නරක වෙන්න පුළුවන් මොනව ද?"

"හියුබ්‍රිස් කියන්නේ මාරාන්තික උඩඟුකමට, පර්සි. වෙන කාටත් වඩා හොඳට ඔයාට වැඩ කරන්න පුළුවන් කියලා හිතන එක... දෙවිවරුන්ටත් වඩා හොඳට."

"ඔයාට දැනෙන්නේ ඒ විදිහට ද?"



එයා බිම බලාගත්තා. "ඔයාට කවදාවත් හිතිලා නැද්ද, ඇත්තටම මේ ලෝකේ අවුල් ගොඩක් වෙලා නම් කියලා? අපිට අලුතෙන්ම ඒක ආයේ පටන් ගන්න පුළුවන් නම් කියලා? කිසිම යුද්ධයක් නැති, අනාථයෝ නැති, ගිම්හාන නිවාඩුවට ඉස්කෝලෙන් ගෙදර වැඩ දෙන්නෙ නැති ලෝකයක්."

"මං අහගෙන ඉන්නේ."

"මං කියන්නේ, මිනිස් වර්ගයා කරපු හොඳම දේවල්වලින් ගොඩක් ඉදිරිපත් වෙන්නේ බටහිරෙන්- අන්න ඒකයි ගින්න තවමත් දැල්වෙන්නේ. ඒ නිසයි ඔලිම්පස් තවමත් තියෙන්නේ. ඒත් සමහර වෙලාවට ඔයාට දකින්න ලැබෙන්නේ නරක දේවල් විතරයි. ඔයා දන්නව ද? අන්න ඒ වෙලාවට ඔයත් ලූක් වගේ හිතන්න පටන් ගන්නවා: 'මේ ඔක්කොම කඩලා දාන්න පුළුවන් නම්, මීට වඩා හොඳට කරන්න පුළුවන්.' ඔයාට කවදාවත් එහෙම හිතිලා නැද්ද? ඔයා මේ ලෝකේ පාලනය කළා නම් මීට වඩා හොඳට කරන්න පුළුවන් කියලා?"

"ම්... නෑ. මම මේ ලෝකේ පාලනය කරන්න ගියොත් මොනවයින් මොනවා වෙයි ද දන්නෑ."

"එහෙනම් ඔයා වාසනාවන්තයි. ඔයාගේ මාරක වැරැද්ද උඩඟුකම නෙවෙයි."

"එහෙනම් මොකක් ද?"

"මම දන්නෑ, පර්සි. ඒත් හැම වීරයෙකුටම එකක් තියෙනවා. ඔයා ඒක මොකක්ද කියලා හොයාගෙන, ඒක පාලනය කරන්න ඉගෙන ගත්තේ නැත්නම්... මෙහෙමයි, එයාලා ඒකට 'මාරක' කියලා කියන්නේ නිකං නෙවෙයි නේ."

මම ඒ ගැන කල්පනා කළා. ඒකෙන් මගේ හිත නම් සැනසුනේ නැහැ.

ඇනබෙත් වෙනස් කරගන්න හිතන පෞද්ගලික දේවල් ගැන වැඩි දෙයක් නොකියූ බවත් මට තේරුම් ගියා- හරියට එයාගේ දෙමව්පියන්ව ආයෙමත් එකතු කරන එක, ලූක්ව බේරගන්න එක වගේ. මට එය තේරුම් ගන්න හැකි වුණා. මගේ අම්මවයි තාත්තවයි ආයෙමත් එකතු කරන්න මමත් කොච්චර හීන මවලා තියෙනව ද කියලා පිළිගන්න මම කැමති වුණේ නැහැ.

මම, මගේ අම්මගෙ රූපය හිතේ මවා ගත්තා, තැගෙනහිර ඉහළ කොටසේ තියෙන අපේ පුංචි ගෙදර එයා තනියම ඉන්නවා ඇති. එයා හදන නිල් පාට වැෆල්වල සුවඳ මතක් කරන්න මම උත්සාහ කළා. ඒත් ඒක දුර ඈතකට ගිහින් වගෙයි දැනුණේ.

"එතකොට, ඒක වටිනව ද?" මම ඇනබෙත්ගෙන් ඇසුවා. "ඔයාට දුන් හිටියට වඩා... බුද්ධිමත් කියලා දැනෙනව ද?"

එයා දුර ඈතට ඇස් හරවා ගත්තා. "මට විශ්වාසයක් නැහැ. ඒත් අපි කඳවුර බේරගන්න ඕනෑ. අපි ලූක්ව නතර කළේ නැත්නම්..."

එයාට වාක්‍ය සම්පූර්ණ කරන්න උවමනා වුණේ නැහැ. ලූක් හිතන විදිහට ඇනබෙත්වූ පවා පොලඹවා ගන්න පුළුවන් නම්, තව අර්ධ-ලෝහිතයෝ කීදෙනෙක් එයාට එකතු වෙයි ද කියලා හිතාගන්නවත් බැහැ.

මම හීනෙත් දකපු ගැහැනු ළමයයි, රන් මිනී පෙට්ටියයි ගැන කල්පනා කළා. එහි තේරුම මට නොතේරුණත්, මොකක් හෝ මග ඇරුණු හැඟීමක් මට දැනුණා. මොකක්හරි ක්‍රෝනොස් සැලසුම් කරන බිහිසුණු දෙයක්. මිනී පෙට්ටියේ පියන විවෘත කළාම ගැහැනු ළමයාට දකින්න ලැබුණේ මොකක් ද?

හදිසියේම ඇනබෙත්ගේ ඇස් ලොකු වුණා. "පර්සි."

මම හැරිලා බැලුවා.

අපිට ඉදිරියෙන් තිබුණේ ගොඩබිමක පැල්ලමක්- කොළ පාට දෙණිබිම්, සුදු පාට වැල්ල ඇති සැදලයක හැඩය ගත් දූපතක්.

මගේ නාවික දැනීම එය තහවුරු කළා. අංශක 30න් උතුරට විනාඩි 31යි. අංශක 75න් බටහිරට විනාඩි 12යි. අපි සයික්ලොප්ස්ගේ නිවහනට ළඟා වෙලා.

# 14

# අපිට විනාශයේ බැටළුවෝ මුණගැසුණා

'රාක්ෂ දූපතක්' කියද්දී ඔයාගේ හිතේ මැවෙනවා ඇත්තේ කිඳුරු දූපත වගේ ගල්කුළු සහ ඇටකටු හැමතැනම විසිරුණු වෙරළක් ඇති දූපතක්.

ඒත් සයික්ලොප්ස් දූපත එහෙම තැනක් නෙවෙයි. මං කියන්නේ, මෙහෙමයි, ඒකේ ආගාධය හරහා ලණු පාලමක් තිබුණු එක නම් හොඳ ලකුණක් නෙවෙයි. ඊට වඩා හොඳයි 'මෙහෙ දුෂ්ට රාක්ෂයෙක් ඉන්නවා' කියලා ලොකු දැන්වීමක් එල්ලුවා නම්. ඒත් ඒ ඇර ඒ දූපත පෙනුණේ තැපැල් පතක ඇති බටහිර ඉන්දීය කොදෙව් දූපතක පින්තූරයක් වගෙයි. එතැන නිවර්තන කලාපීය පලතුරු ගස් පිරුණු කොළ පාට පිට්ටනිත්, සුදු වැල්ලෙත් වැසුණු වෙරළෙනුත් හැඩ වී තිබුණා. අපි වෙරළ දෙසට යාත්‍රා කරද්දී, ඇනබෙත් මිහිරි සුළඟෙන් පපුව පුරවා ගත්තා. "රන් බැටළු ලොම් සළුව," එයා කියද්දී මම ඔළුව වැනුවා. තවමත් රන් සළුව දැකගන්න නොලැබුණත්, එහි බලය මට දැනුණා. එයට ඕනෑම දෙයක්- වස කැවුණු තාලියාගේ ගස පවා සුවපත් කරන්න හැකි වෙයි කියලා මට විශ්වාසයක් දැනුණා. "අපි ඒක අරගෙන ගියොත්, මේ දූපත මැරිලා යයි ද?" ඇනබෙත් ඔළුව හෙල්ලුවා. "ඒක මැලවිලා යයි. මේ දූපත කලින් තිබුණේ කොහොමද, ඒ වගේ වෙයි."

මේ පාරාදීසය විනාශ කරන්න යාම ගැන මට වරදකාරී හැඟීමක් දැනුණත්, අපිට වෙන විකල්පයක් නැති බව මම, මටම මතක් කර දුන්නා. අර්ධ-ලෝහිත කඳවුර කරදරේක වැටිලා. ඒ වගේම ටයිසන්... මේ ගවේෂණය නොතිබුණා නම් ටයිසන් තවමත් අපිත් එක්ක ඉන්න තිබුණා.

Scanned with CamScanner

ගිරිකඳුර පාමුල දෙණිබිමේ බැටළුවෝ දූසිම කීපයක් එහෙ මෙහෙ කැරකෙමින් සිටියා. උන්ට සාමකාමී පෙනුමක් තිබුණත්, උන් හිපපොටේමස්ලා තරම් ලොකුවට වැඩී සිටියා. උන් අසලින් කන්ද දෙසට දිවෙන අඩි පාර තිබුණා. අඩි පාර මුදුනේ, ආගාධයේ කෙළවරට ආසන්නයෙන් මම හීනෙන් දුටු යෝධ ඕක් ගස තිබුණා. එහි අත්තක මොකක්දෝ රන් පාටින් දිලිසුණා.

"ඒක හරිම ලේසියි නේ," මම කිව්වා. "අපිට තියෙන්නේ කන්ද මුදුනට නැගලා ඒක ගන්න විතර ද?" ඇනබෙත්ගේ ඇස් හීනි වුණා. "හරිනම් මෙතැන රාක්ෂයෙක් ඉන්න ඕනෑ. මකරෙක් හරි..." පඳුරු අතරින් මුවෙක් මතුවුණේ ඒ වෙලාවේදියි. ඌ දෙණිබිමට හැල්මේ දිවුවේ තණකොළ කන්න වෙන්නැති. ඒත් එක්කම බැටළුවෝ හඬගාමින් මුවා දෙසට දිවුවා. ඒ සිදුවීම කොයිතරම් වේගයෙන් සිදුවුණා ද කියනවා නම් පැකිලී වැටුණු මුවාව ලොම් සහ කුර ගොඩක් අතරේ සැඟවුණා. තණකොළ, ලොම් පොකුරු ගුවනට විසි වුණා.

තත්පරේකට පස්සේ බැටළුවෝ එතැනින් ඉවත් වී, සුපුරුදු ලෙසටම ඉබාගාතේ යන්න පටන් ගත්තා. මොහොතකට කලින් මුවා සිටි තැන දැන් ඉතිරිව තිබුණේ පිරිසිදු සුදු පාට ඇටකටු ගොඩක් විතරයි.

ඇනබෙතුයි මමයි බැල්මක් හුවමාරු කරගත්තා.

"උන් හරියට පිරන්හා මාළුවෝ වගේ," එයා කිව්වා.

"ලොම් තියෙන පිරන්හාලා. අපි කොහොම ද-"

"පර්සි!" ඇනබෙත් හුල්ලමින් මගේ අත අල්ලගත්තා. "බලන්න." එයා වෙරළ දෙසට අත දිගු කළා. බැටළු

දෙණිබිමට පහළින්, වෙරළේ පුංචි බෝට්ටුවක් ගොඩකර තිබුණා... සී.එස්.එස්. බර්මින්ග්හැම් නැවේ අනෙක් ජීවිතාරක්ෂක බෝට්ටුව.

මස් කන බැටළුවෝ පසුකර යන්න අපිට පුළුවනකමක් නැහැ කියලා අපි තීරණය කළා. අදෘශ්‍යමාන වෙලා, අඩි පාර දිගේ හොරෙන් ගිහින් රන් සළුව ගන්න ඇනබෙත්ට ඕනෑ වුණා. ඒත් එහෙම කළොත් මොකක්හරි වැරැද්දක් වෙන්න ඉඩ තියෙන බව මම එයාට පෙන්වා දුන්නා. බැටළුවන්ට එයාගේ ඉව දැනෙන්න පුළුවන්. තවත් ආරක්ෂකයෙක් මතු වෙන්න පුළුවන්. ඒ වගේ මොනවාහරි වෙන්න



ඉඩ තිබුණා. එහෙම දෙයක් වුණොත්, එයාට උදවු කරන්න බැරි තරම් මම දුරයි.

ඇරත්, අපේ මුල්ම රාජකාරිය වෙන්නේ ග්‍රෝවර්වයි, ජීවිතාරක්ෂක බෝට්ටුවෙන් ආව අයවයි- එයාලට බැටළුවෝ පහු කරගෙන යන්න ලැබිලා නම්- හොයාගන්න එකයි. වයිසන් තවමත් ජීවතුන් අතර ඇති කියලා මම යටි හිතෙන් බලාපොරොත්තු වුණා.

අපි ක්වීන් ඈන්'ස් රිවෙන්ජ් නැව දූපත පසුපසට ගෙන ගියා. ඒ පැත්තේ කඳු ප්‍රපාතය අඩි දෙසීයක් තරම් ඉහළට නැග තිබුණා. එතැන දී අපේ නැව පිටට පෙනෙන්න ඇති ඉඩ අඩු බව මම හිතුවා. කඳු ප්‍රපාතය දිගේ අමාරුවෙන් නැගිය හැකි බව අපිට පෙනුණා- හරියට කඳවුරේ ඇති ලෝදිය බිත්තිය වගෙයි. අඩු තරමේ එතැන බැටළුවෝ නැහැ. පොලිෆිමස් මිනී කන කඳුකර එළුවෝ ඇති කරන්නේ නැතිව ඇති, මම බලාපොරොත්තු වුණා. ජීවිතාරක්ෂක බෝට්ටුවක නැගී ප්‍රපාතය අද්දරට ගිය අපි හෙමින් සීරුවේ ඉහළ නගින්න පටන් ගත්තා. අපි දෙන්නාගෙන් හොඳම කඳු නගින්නා වූ ඇනබෙත් මුලින්ම ගියා.

අපි මැරෙන්න ඔන්න-මෙන්න ආවේ හය-හත් වතාවක් විතරයි, මං හිතන්නේ ඒක හොඳ ප්‍රගතියක්. වතාවක් මගේ ග්‍රහණය අත ඇරිලා, ගල් පිරුණු මුහුදට අඩි පනහක් ඉහළ ගැටියක තනි අතින් එල්ලී ඉන්න මට සිද්ධ වුණා. ඒත් අල්ලගන්න තැනක් සොයාගත් මම ආපසු නගින්න පටන් ගත්තා. විනාඩියකට විතර පස්සේ දිය සෙවෙල ගොඩක් උඩ පය තැබූ ඇනබෙත් ලිස්සුවා. වාසනාවට, ඒ වෙනුවට කකුල තියන්න තැනක් එයා හොයාගත්තා. අවාසනාවට, එයා හොයාගත් තැන මගේ මුහුණයි.

"සමා වෙන්න," එයා මිමිණුවා.

"ඒකට කමක් නෑ," මම ගෙරෙව්වත්, ඇනබෙත්ගේ ස්නිකර් සපත්තුවල රස දැනගන්න මට කවදාවත් ඕනෑ වුණේ නැහැ.

අන්තිමේදී, මගේ ඇඟිලි උණු වූ ඊයම් වගේ දැනෙද්දී, මගේ අත්වල පේශි අධික වෙහෙසට වෙවුලද්දී, ප්‍රපාතයේ මුදුනෙන් එහා පැත්තට ඇදුණු අපි පොළොවේ වැතිරුණා.

"අහ්," මම කිව්වා.

"ඌහ්," ඇනබෙත් කෙඳිරි ගෑවා.

"ගර්ර්ර්!" තවත් හඬක් ගෙරෙව්වා.

එතරම් මහන්සි වී නොසිටියා නම්, මම තවත් අඩි දෙසීයක් උඩ යන්න ඉඩ තිබුණා. මම වේගයෙන් කැරකී බැලුවත් හඬ නැඟූ කෙනාව දකගන්න ලැබුණේ නැහැ.

මගේ කට අතින් වැසූ ඇනබෙත් අත දිගු කර පෙන්වූවා.

අපි වාඩි වී සිටි ගැටිය මම සිතුවාටත් වඩා පටුයි. එහි අනෙක් පැත්තටත් බෑවුමක් තිබුණා. හඬ ආවේ එතැනින්- හරියටම අපිට පහළින්.

"ඔහේ චූටි චණ්ඩියෙක් නේ!" ගැඹුරු හඬක් ගර්ජනා කළා.

"මාත් එක්ක සටනට එනවා!" කිසිම සැකයක් නෑ, ඒ ක්ලැරිස්ගේ හඬ. "මට, මගේ කඩුව ආපහු දෙනවා, මම ඔහේට සටන් කරන හැටි පෙන්වන්නම්!"

රාක්ෂයාගේ හිනා හඬ ගිගුම් දුන්නා.

ඇනබෙත් සහ මම කෙළවරටම බඩගෑවා. අපි සිටියේ සයික්ලොප්ස් ගුහාවට ඇතුළුවන දොරට ඉහළින්. අපිට පහළින් පොලිෆිමස් සහ තවමත් මංගල ගවුම හැඳ සිටි ග්‍රෝවර් සිටගෙන සිටියා. ක්ලැරිස්ගේ අත්-පා ගැටගසා උතුරන වතුර හැළියකට ඉහළින් එල්ලා සිටියා. එතැන ටයිසන්වත් දකින්න මගේ හිතේ පොඩි බලාපොරොත්තුවක් තිබුණා. එයා අනතුරක වැටී සිටියත්, අඩු තරමේ එයා තවමත් ජීවතුන් අතර ඉන්නවා දකින්න මම බලාපොරොත්තු වුණා. ඒත් එයාගේ ලකුණක්වත් නැහැ.

"හ්ම්ම්," පොලිෆිමස් ඕනෑකමින් කල්පනා කළා. "මේ කට හැකර කෙල්ලව දැන්ම කනව ද, නැත්නම් අපේ මංගල භෝජනේට තියාගන්නව ද? මගේ මනමාලි මොකද හිතන්නේ?" එයා ග්‍රෝවර් දෙසට හැරෙද්දී, පස්සට ගිය ග්‍රෝවර්, එයා සම්පූර්ණ කර තිබූ මංගල සළුවේ පැටලී වැටෙන්න ගියා. "ඔහ්, මේ, මට බඩගිනි නෑ, වස්තුවේ. සමහරවිට-"

"ඔහේ කිවුවේ මනමාලි කියල ද?" ක්ලැරිස් ප්‍රශ්න කළා. "කවුද- ග්‍රෝවර් ද?" මට එහා පැත්තේ, ඇනබෙත් කොඳුරන්න ගත්තා. "කට වහගන්න. එයා කට වහගන්න ඕනෑ."

පොලිෆිමස් ගෙරෙව්වා. "මොකාද 'ග්‍රෝවර්'?"

"ඔය සැටර්!" ක්ලැරිස් මොරදුන්නා.



"ඔහ්!" ග්‍රෝවර්ට කෑගැසුණා. "මේ අසරණීගේ මොළේ උණු වතුරට තැම්බිලාද කොහෙද. එයාව පහළට ගන්න, වස්තුවේ!"

පොලිෆිමස්ගේ ඇසිපිය එයාගේ බියකරු කිරිපාට ඇහැ වටා ඇකිළුණේ එයා ක්ලැරිස්ව තවත් පැහැදිලිව බලාගන්න උත්සාහ කරනවා වගෙයි.

සයික්ලොප්ස්ගේ පෙනුම මම හීනෙන් දුටුවටත් වඩා අන්තයි. ඒකට එක හේතුවක් වුණේ එයාගේ කුණු ගඳ දැන් හොඳින්ම දැනෙමින් තිබීමයි. තවත් හේතුවක් වුණේ එයා මුළු මංගල උත්සවයක්ම හම ගහලා වගේ මංගල ඇඳුම් කට්ටලයකින්- ගොරහැඩි කිල්ට් එකකින් (ස්කොට්ලන්ත වැසියන් අඳින දණහිස දක්වා දිගු සායක් වැනි ඇඳුම.), උරහිස් ආවරණයකින් සහ ලා නිල් පාට කබායකින් සැරසී සිටි නිසයි.

"මොන සැටර් ද?" පොලිෆිමස් ඇසුවා. "සැටර්ලා රස කෑමක්. ඔහේ මට සැටර් කෙනෙක් ගෙනාව ද?"

"නෑ, මෝඩ තඩියෝ!" ක්ලැරිස් ගිගුරුවා. "අර සැටර්! ග්‍රෝවර්! ඔය මගුල් ඇඳුමක් ඇඳගෙන ඉන්න එකා!" මට ක්ලැරිස්ගේ බෙල්ල මිරිකන්න හිතුණත්, දැන් පරක්කු වැඩියි. මට කරන්න ඉතිරිව තිබුණේ පොලිෆිමස් ග්‍රෝවර්ගේ මංගල වේලය ඉරද්දී එයාගේ කැරලි කොණ්ඩය, අපිරිසිදු දූලි රැවුල සහ චූටි අං දෙක එළියට මතු වූ හැටි බලා හිඳීම විතරයි.

කේන්තිය පාලනය කරන්න උත්සාහ කරමින් පොලිෆිමස් තදින් හුස්ම ගත්තා. "මට හොඳට පේන්නෑ." එයා ගෙරෙව්වා: "අවුරුදු ගාණකට කලින් තවත් වීරයෙක් මගේ ඇහැට ඇන්න දවසේ ඉඳලා එහෙමයි. ඒත් ඔහේ ගෑනු සයික්ලොප්ස් කෙනෙක් නම් නෙවෙයි!" ග්‍රෝවර්ගේ ගවුමෙන් අල්ලාගත් සයික්ලොප්ස් එය ඉරා දැමුවා. ඊට යටින්, කලිසමකින් සහ ටී-ෂර්ට් එකකින් සැරසුණු පරණ ග්‍රෝවර්ව මතු වුණා. කෑගැසූ එයා රාක්ෂයාගේ අත ඔළුවට උඩින් ඇදී යද්දී පහත් වුණා.

"නවත්තන්න!" ග්‍රෝවර් බැගෑපත් වුණා. "මාව අමුවෙන් කන්න එපා! ම-මගේ ළඟ හොඳ කෑම වට්ටෝරුවක් තියෙනවා!"

මම, මගේ කඩුව ගන්න ලෑස්ති වුණත්, ඇනබෙත් පිම්බා, "ඉන්න!"

තමන්ගේ මනාලිය කරගන්න සිටි කෙනාව චප්ප කරන්න ගල් ගෙඩියක් අතට ගෙන සිටි පොලිෆිමස් පසුබට වුණා.

"වට්ටෝරුවක්?" එයා ග්‍රෝවර්ගෙන් ඇහුවා.

"ඔහ්, ඔ-ඔව්! ඔයාට මාව අමුවෙන්න කන්න ඕනෑ වෙන්නෙ නෑ. ඔයාට ටී-කෝලි, බොතුලිනියාව වගේ ගොඩක් දරුණු ලෙඩ හැදෙයි. මාව මද ගින්නේ රෝස් කරලා ගත්තොත් ඊට වඩා රස වෙයි. අඹ චට්නිත් එක්ක! ඔයාට පහළ කැලේට ගිහිල්ලා අඹ ටිකක් කඩාගෙන එන්න පුළුවන්. මම මෙතැනටම වෙලා ඉන්නම්." රාක්ෂයා මේ ගැන සිතා බැලුවා. මගේ හදවත ඉළ ඇට කූඩුවට මිටි පහර දෙන්න ගත්තා. මම දුන් පහර දෙන්න පැන්නොත් මැරෙන්න වෙන බව මට තේරුණා. ඒත් රාක්ෂයාට ග්‍රෝවර්ව මරන්න ඉඩ දීලා මම බලාගෙන ඉන්නේ කොහොම ද?

"අඹ චට්නිත් එක්ක රෝස් කරපු සැටර් කෙනෙක්," පොලිෆිමස් කල්පනා කළා. එයා උණු වතුර හැළියට උඩින් එල්ලෙන ක්ලැරිස් දිහා බැලුවා. "ඔහෙත් සැටර් කෙනෙක් ද?"

"නෑ, මෝඩ ගොම ගොඩ!" එයා මොරදුන්නා. "මම කෙල්ලෙක්! ඒරීස්ගෙ දුවෙක්! දැන් මාව ලිහනවා, එතකොට මට පුළුවන් ඔහෙගේ අත් දෙක ඉරලා දාන්ඩ!"

"මගේ අත් දෙක ඉරලා දාන්ඩ!" පොලිෆෙමසුත් ඒකම කිවුවා.

"ඊට පස්සෙ ඒවා ඔහෙගෙ කටේ ඔබන්ඩ!"

"ඔහේට හිතේ හයිය තියෙනවා."

"මාව පහළට ගන්නවා!"

පොලිෆිමස් හිතුවක්කාර බලු පැටියෙක් වඩා ගන්නවා වගේ ග්‍රෝවර්ව ඩැහැගත්තා. "බැටළුවෝ ටිකට තණකොළ කවන්න ගෙනියන්ඩ තියෙනවා. මංගල්ලේ අද රෑට කල් දානවා. ඊට පස්සේ අපිට ප්‍රධාන කෑමට සැටර්ව කන්ඩ පුළුවන්!"

"ඒත්... ඔයා කසාද බඳින්න ද යන්නේ?" ග්‍රෝවර් කතා කළේ හිත රිදිලා වගෙයි. "කවුද මනමාලි?" පොලිෆිමස් උතුරන වතුර හැළිය දෙස බැලුවා.

ක්ලැරිස් බෙල්ල හිරවෙලා වගේ හඬක් නැගුවා. "ඔහ්, නෑ! ඔහේ විහිළු කරනවා. මම-" ඇනබෙත් හෝ මම කිසිවක් කරන්න



කලින්, පොලිෆිමස් ඉදුණු ඇපල් ගෙඩියක් කඩනවා වගේ ක්ලැරිස්ව කඹයෙන් කඩාගෙන, එයාවත් ග්‍රෝවර්වත් ගුහාව ඇතුළට විසි කළා. "සුව පහසුවට ඉන්නවා! අපේ මංගල්ලෙට මං ඉර බහින වෙලාවට එනවා!"

ඊට පස්සේ සයික්ලොප්ස් උරුවම් බාදී එළුවෝ සහ බැටළුවෝ-මස් කන බැටළුවන්ට වඩා පොඩි- රැළක් ගුහාවෙන් එළියට දුවගෙන ආවා. උන් තණ බිමට යද්දී සමහරකගේ පිටට තට්ටු කළ පොලිෆිමස් බෙල්ට්බස්ටර්, ටමානි, ලොක්හාට් වගේ නම් කියමින් උන්ට කතා කළා. අන්තිම බැටළුවාත් ගාටමින් පිටවූ පසු එයා ශීතකරණයක දොර වහනවා තරම් පහසුවෙන් ලොකු ගල් කුට්ටියක් ගුහා කට ඉදිරියට තල්ලු කර දොර ආවරණය කළේ ග්‍රෝවර් සහ ක්ලැරිස් බෙරිහන් දෙන හඬ මුළුමනින්ම ආවරණය කරමින්.

"අඹ," පොලිෆිමස් තනියම කියෙවුවා. "මොනවද අඹ කියන්නේ?" ලා නිල් පාට මංගල ඇඳුමෙන් සැරසී සිටි සයික්ලොප්ස් කන්ද පහළට බැස ගියේ උතුරන වතුර හැළියකුත්, ටොන් හයක ගල් කුට්ටියකුත් සමග අපිව තනි කරමින්.

අපි කරන්න පුළුවන් හැමදේම කරලා බැලුවත් ගල් කුට්ටිය සෙලවුණේවත් නැහැ. ඉරිතැළුම් හරහා මොරදෙමින්, ගලට තට්ටු කරමින් ග්‍රෝවර්ට සංඥාවක් දෙන්න අපි උත්සාහ කළත්, ග්‍රෝවර්ට ඒවා ඇහුණා ද, අපිට දැනගන්න බැරි වුණා.

හාස්කමකින් වගේ අපිට පොලිෆිමස්ව මරන්න පුළුවන් වුණත්, එයින් වෙන හොඳක් නැහැ. එතකොට ග්‍රෝවර්ටයි ක්ලැරිස්ටයි ගුහාව ඇතුළේම මැරෙන්න සිද්ධ වේවි. ගල එතැනින් ඉවත් කරන්න තියෙන එකම ක්‍රමය සයික්ලොප්ස් එය කරන තුරු හිඳීම විතරයි.

තරහෙන් පිපුරුණ මම රිප්ටයිඩ්ගෙන් ගලට කෙටුවා. තලය ගලේ වැදෙද්දී ගිනි පුපුරු විසිවුණත් වෙන කිසිවක් වුණේ නැහැ. ලොකු ගල් කුට්ටියක් කියන්නේ මායා කඩුවකින් සටන් කරලා පරදවන්න හැකි හතුරෙක් නෙවෙයි. බලාපොරොත්තු සුන් කරගත් අපි වැටිය අද්දර වාඩිවෙලා ඈත බැටළු රංචු අතරේ ඇවිදින සයික්ලොප්ස්ගේ ලා නිල් පාට රුව දෙස බලා සිටියා. එයා බුද්ධිමත් ලෙස සාමාන්‍ය සතුන් සහ මස් කන බැටළුවන් ගොඩවල් දෙකකට බෙදලා දූපත වෙන් කරන විශාල පැළම දෙපසට දමා තිබුණා. එය හරහා යා හැකි එකම

Scanned with CamScanner

මග වූ ලණු පාලමේ ලෑලි අතර පරතරය බැටළු කුරවලට දුර වැඩි වුණා.

එහා කෙළවරේ සිටි මස් කන රළ අසලට පොලිෆිමස් යනවා අපි බලා සිටියා. අවාසනාවකට, උන් එයාව කෑවේ නැහැ. ඇත්ත වශයෙන් කියනවා නම්, උන් එයාට කිසිම කරදරයක් කළේ නැහැ. එයා ලොකු වේවැල් කූඩයකින් මස් කුට්ටි අරන් බැටළුවන්ට කන්න දමනවා දකිද්දී, සර්සි මාව රට හාවෙක්ට හැරවූ වෙලාවේ ඉඳන් මගේ හිතේ වැඩ කළ අදහස - ඒ කියන්නේ ග්‍රෝවර්ට එකතු වෙලා ශාක භක්ෂකයෙක් වෙන්න ඕනෑ කියන හැඟීම තවත් ශක්තිමත් වුණා.

"උපායක්," ඇනබෙත් තීරණය කළා. "අපිට එයාව ශක්තියෙන් පරදවන්න බැරි නිසා, ඒකට උපායක් පාවිච්චි කරන්න වෙනවා."

"හරි," මම කිවුවා. "මොකක්ද උපාය?"

"මං තාම ඒක හිතුවේ නෑ."

"නියමයි."

"බැටළුවන්ට ඇතුළට යන්න පොලිෆිමස්ට ගල පැත්තකට කරන්න වෙනවා."

"ඉර බහින වෙලාවට," මම කිවුවා. "ඒ කියන්නේ එයා ක්ලැරිස්ව කසාද බැඳගෙන, ග්‍රෝවර්ව රෑ කෑමට ගන්න වෙලාවට. ඒ දෙකෙන් නරකම කොයි එක ද කියලා මට හිතාගන්න බැහැ."

"මට ඇතුළට යන්න පුළුවන් වෙයි," එයා කිවුවා. "පේන්නෙ නැතිව."

"එතකොට මම?"

"බැටළුවෝ," ඇනබෙත් කල්පනා කළා. නිතරම මාව බය ගන්වන කපටි බැල්මෙන් එයා මගේ දිහා බැලුවා. "ඔයා බැටළුවන්ට කොච්චර කැමති ද?"

* * * * * *

"අත අරින්නෙ නැතුව ඉන්න!" මගේ දකුණු පස කොහෙන්දෝ අදෘශ්‍යමානව සිටි ඇනබෙත් කිවුවා. එයාට නම් කියන්න ලේසියි. බැටළුවෙකුගේ බඩේ මුණින් අතට එල්ලිලා ඉන්නෙ එයා නෙවෙයි නේ. දැන්, මම හිතුව තරම් ඒක අමාරු වුණේ නැහැ කියලා මං පිළිගන්න ඕනෑ. මීට කලින් මම අම්මට තෙල් මාරු කරලා දෙන්න කාරයට යටට



බඩ ගාලා තිබුණා. මේකත් ඊට වඩා ගොඩක් වෙනස් වුණේ නැහැ. බැටළුවා මං ගැන සැලකිල්ලක් දැක්වූයේ නැහැ. සයික්ලොප්ස්ගේ පුංචිම බැටළුවාත් මගේ බර දරාගන්න තරම් ලොකුයි, ඒ වගේම උන්ට ඝන ලොම් තට්ටුවකුත් තිබුණා. මට කරන්න තිබුණේ ලොම් පොකුරු දෙකක් අඹරා අත්වාරු ලෙස අල්ලා ගන්නත්, බැටළුවාගේ පසු ගාත් දෙකේ මගේ කකුල් පටලවා ගන්නත් විතරයි. බැටළු ලොම් තහගේ කටේ යවා නොගෙන ඉන්න උත්සාහ කරමින්, බැටළුවාගේ පපුවේ එල්ලී සිටි මට දැනුණේ අම්මගේ බඩේ එල්ලී යන වූටි රිලා පැටියෙක් වගෙයි.

බැරිවෙලාවත් ඔයාට පුදුම හිතෙනවා නම්, බැටළුවෙකුගේ යටි පැත්තේ ආසා හිතෙන සුවඳක් නම් නැහැ. මඩ ගොඩක ඇදගෙන ගිය ස්වෙටරයක් සතියක් විතර සෝදන්නේ නැතිව තිබුණාම එන සුවඳ හිතේ මවා ගන්නකෝ. මේකත් අන්න ඒ වගෙයි.

ඉර බැස යමින් තිබුණා.

මම ස්ථානගත වෙලා සුළු මොහොතකින්ම සයික්ලොප්ස් ගෙරෙව්වා, "ඔහොයි! එළුවනේ! බැටළුවනේ!" සත්තු රළ සුවච කීකරුව කන්ද නැගගෙන ගුහාව දෙසට ගාටන්න පටන් ගත්තා.

"දැන් තමයි වෙලාව," ඇනබෙත් කෙඳිරුවා. "මම ළඟම ඉන්නවා, බය වෙන්නෙපා." මෙතැනින් පණ බේරගන්න ලැබුණොත්, ඇනබෙත් ශ්‍රේෂ්ඨ බුද්ධිමතෙක් කියලා එයාට කියන බවට මම දෙවිවරුන්ට හිතෙන් බාරයක් වුණා. බියකරුම දේ වුණේ, දෙවිවරු මට ඒක කරන්නම සලස්වන බව මම දැන සිටීමයි.

මගේ බැටළු කුලී රිය කන්ද උඩට අමාරුවෙන් ඇද්දුවා. යාර සියයක් විතර යද්දී, එල්ලී හිඳීමෙන් මගේ අත් කකුල් රිදෙන්න ගත්තා. මම බැටළුවාගේ ලොම් තවත් තදින් අල්ලා ගනිද්දී සතා කෙඳිරිලි හඬක් නැගුවා. ඌට දොස් කියන්න මට බැහැ. මොකද, කවුරුහරි මගේ කොණ්ඩයේ එල්ලිලා ඔන්චිලි පදිනවට මම වුණත් කැමති වෙන්නෙ නැහැ නේ. ඒත් මම තදින් අල්ලාගෙන නොසිටියොත්, මාව රාක්ෂයා ඉදිරියේම ඇද වැටේවි කියලා මට විශ්වාස වුණා.

"හැසන්පෙෆර්!" මට ඉදිරියෙන් සිටි බැටළුවෙකුට තට්ටු කරමින් සයික්ලොප්ස් කිවුවා. "අයින්ස්ටයින්! විජට්- මේ ඉන්නේ, විජට්!" පොලිෆිමස් මගේ බැටළුවාට තට්ටු කළ වේගයට තව පොඩ්ඩෙන් මාව බිමට වැටෙනවා. "උඹේ මස් වැඩි වෙලාද?"

අයියෝ, මම හිතුවා. මං ඉවරයි.

ඒත් පොලිෆිමස් කළේ මහ හඬින් හිනාවෙලා, අපිව ඉදිරියට තල්ලු වෙන්න බැටළුවාගේ පස්සට අතින් පහරක් ගැසීම විතරයි. "යනවා, තඩියෝ! ඉක්මනටම පොලිෆිමස් උඹව උදේ කෑමට ගන්නවා."

ඒ විදිහට, මම ගුහාව ඇතුළට ගියා.

අන්තිම බැටළුවාත් ගුහාවට ඇතුළු වෙනවා මට දකින්න ලැබුණා. ඇනබෙත් ඉක්මනින්ම එයාගේ උපාය ක්‍රියාත්මක කළේ නැත්නම්...

සයික්ලොප්ස් ගල් දොර ආපසු තිබුණු තැනටම පෙරළන්න සූදානම් වෙද්දී, පිටත කොතැනදෝ ඇනබෙත් කෑගැසුවා. "හෙලෝ, කැතයෝ!"

පොලිෆිමස් කෙලින් වුණා. "කවුද ඒක කිවුවේ?"

"කවුරුවත් නෑ!" ඇනබෙත් මොර දුන්නා.

එයින් ඇනබෙත් බලාපොරොත්තුවෙන් සිටි ප්‍රතිචාරයම ලැබුණා. රාක්ෂයාගේ මූහුණ ක්‍රෝධයෙන් රතු වුණා.

"කවුරුවත් නෑ!" පොලිෆිමස් ආපසු මොර දුන්නා. "මට ඔහේව මතකයි!"

"කාවවත් මතක තියාගන්න බැරි තරම් ඔහේ මෝඩයි." ඇනබෙත් ඇනුම්පද කිවුවා. "ඉතින් කොහෙද 'කවුරුවත් නෑ' ව මතක තියාගන්නේ." කතා කරන අතරේ එයා සිටි තැනින් ඉවත් වෙන්න ඇති කියලා මම බලාපොරොත්තු වුණා. මොකද, කෝපයෙන් ගර්ජනා කළ පොලිෆිමස් ළඟම තිබුණ ගල් කුට්ටිය (එයාගේ ලෙන් දොර) අරන් ඇනබෙත්ගේ හඬ ආ දිසාවට විසි කළා. ගල් කුට්ටිය කෑලි දහස් ගාණකට කුඩු වී යන හඬ මට ඇසුණා.

එක බිහිසුණු මොහොතකට, පිටත මුළුමනින්ම නිහඬ වුණා. ටිකකින් ඇනබෙත් කෑගැසුවා. "ඔහේ හරියට ගලක් විසි කරන්නවත් ඉගෙනගෙන නැහැ!"

පොලිෆිමස් උඩු බිරුවා. "මෙහෙ එනවා. මට ඔහේව මරන්න දෙනවා, කවුරුවත් නෑ!"



"කවුරුවත් නැත්නම් මරන්නෙ කාව ද, මෝඩ තඩියෝ." ඇනබෙත් එයාව ඇවිස්සුවා. "ඇවිල්ලා මාව හොයාගන්නවා!" පොලිෆිමස් හඬ ආ දිසාවට පල්ලම් බහින්න ගත්තා.

දැන්, මේ 'කවුරුවත් නෑ' කතාව කාටවත් තේරුම් ගන්න බැරුව ඇති. ඒත්, සියවස් ගාණකට කලින් පොලිෆිමස්ව රවටන්න ඔඩිසියස් පාවිච්චි කළේ ඒ නම කියලා ඇනබෙත් මට කිවුවා. ඔඩිසියස් රත් වූ විශාල කෝටුවකින් පොලිෆිමස්ගේ ඇහැට ඇන්නේ එදායි. ඒ නම ගැන පොලිෆිමස්ට තවමත් කෝන්තරයක් ඇති කියලා ඇනබෙත් කල්පනා කළා, ඇත්තටම එයා හිතුවා හරි. පරණ හතුරා හොයාගන්න වියරු වැටුණ පොලිෆිමස්ට ගුහා දොර වසා දමන්න සම්පූර්ණයෙන්ම අමතක වුණා. පෙනුණු හැටියට නම්, මුල්ම 'කවුරුවත් නෑ' පිරිමියෙක් වුණත්, ඇනබෙත්ගේ කටහඬ ගැහැනු හඬක් බව කල්පනා කරන්නවත් එයා නැවතුනේ නැහැ. අනෙක් අතට බලද්දී එයාට ග්‍රෝවර්ව විවාහ කරගන්න ඕනෑ වුණා නේ. ඉතින් ගැහැනු/පිරිමි භේදය ගැන එයාට ඒ හැටි තේරුමක් නැහැ වගෙයි.

මට ග්‍රෝවර්ව සහ ක්ලැරිස්ව සොයාගන්න කාලය ලැබෙන තුරු පණ බේරගෙන, රාක්ෂයාව රවටන්න ඇනබෙත්ට හැකි වේවා කියලා මම ප්‍රාර්ථනා කළා.

බිමට පැන්න මම විජ්ටිගේ ඔළුවට තට්ටු කරලා සමාව ඉල්ලුවා. මම ප්‍රධාන කාමරය සෝදිසි කළත්, ග්‍රෝවර්ගේ හෝ ක්ලැරිස්ගේ ලකුණක්වත් පෙනෙන්න තිබුණේ නැහැ. බැටළුවෝ සහ එළුවෝ රැළ මැදින් තෙරපෙමින් මම ගුහාව තුළට ගියා.

මීට කලින් හීනෙන් දැක තිබුණත්, මේ වංගගිරිය තුළ පාර හොයාගන්න මට ලේසි වුණේ නැහැ. ඇටකටු විසිරුණ කොරිඩෝ හරහා දිවූ මම බැටළු හම් පලස් සහ මෙඩූසාගේ නිර්මාණ වූ ජීව ප්‍රමාණයේ සිමෙන්ති බැටළු ප්‍රතිමා තිබූ කාමර පසු කරගෙන ගියා. එතැන බැටළු ටී-ෂර්ට් එකතුවක්; ලැනොලින් ( බැටළු ලොමින් ලබා ගන්නා තෙල් වර්ගයක්) ක්‍රීම් බාල්දි සහ ලොම් කබා, මේස් වගේම බැටළු අං සවිකළ තොප්පිත් තිබුණා. අන්තිමේදී මට නූල් කටින කාමරය සොයාගන්න ලැබුණා. එහි මුල්ලක ගුළි වී සිටි ග්‍රෝවර් ආරක්ෂිත කතුරකින් ක්ලැරිස්ගේ බැමි කපන්න උත්සාහ කරමින් සිටියා.

"ඒකෙන් වැඩක් නෑ," ක්ලැරිස් කිවුවා. "මේ කඹ යකඩ වගේ!"

"තව විනාඩි දෙක-තුනයි!"

"ග්‍රෝවර්," එයා කේන්තියෙන් කෑගැසුවා. "ඔයා දැන් පැය ගාණක් තිස්සෙ ඕක කරන්නේ!" ඒත් එක්කම එයාලා මාව දැක්කා.

"පර්සි?" ක්ලැරිස් කිවුවා. "ඔහේ පිපිරිලා මළේ නැද්ද!"

"ඔයාවත් දකින්න ලැබුණට සතුටුයි. දැන් හෙලවෙන්නැතුව ඉන්න මම-"

"පර්ර්ර්සි!" හඬගෑ ග්‍රෝවර් මාව බදාගත්තා. "ඔයාට මාව ඇහිලා! ඔයා ආවා!"

"ඔව්, බං," මම කිවුවා. "මම ආවා."

"ඇනබෙත් කොහෙ ද?"

"එළියේ," මම කිවුවා. "ඒත් දැන් කතා කර-කර ඉන්න වෙලාවක් නැහැ. ක්ලැරිස්, හෙලවෙන්නැතුව ඉන්න." මම රිප්ටයිඩ්ගේ කොපුව ගලවා එයාගේ බැමි කපා දැමුවා. එයා අතේ මැණික් කටු පිරිමදිමින් දරදඬුව සිටගෙන සිටියා. මොහොතක් යන තුරු මට රවාගෙන සිටි එයා ඊට පස්සේ බිම බලාගෙන මිමිණුවා, "ස්තුතියි."

"ඒකට කමක් නෑ," මම කිවුවා. "දැන්, ඔයාගේ බෝට්ටුවේ තව කවුරුහරි හිටිය ද?" ඒ ප්‍රශ්නයෙන් ක්ලැරිස් පුදුම වුණා වගෙයි. "නෑ, මං විතරයි. බර්මින්ග්හැම්වල හිටිය අනිත් අය... මෙහෙමයි, ඔහේලවත් බේරෙන්න ඇති කියලා මං හිතුවෙ නෑ."

මම බිම බලාගත්තේ ටයිසන් ජීවතුන් අතර ඉන්නවා දකින්න මගේ හිතේ තිබුණු අන්තිම බලාපොරොත්තුවත් සුන් වූ බව විශ්වාස නොකර ඉන්න උත්සාහ කරමින්. "හරි. එහෙනම්, දැන් යමු. අපි උදව් කරන්න-"

මුළු ගුහාවම දෙදුරුම් කවමින් ඇසුණු පිපුරුමකුත් සමග නැගුණු මරහඬ මට කිවුවේ අපි පරක්කු වැඩි ද කියලයි. අපිට ඇසුණේ ඇනබෙත් බයෙන් කෑගැසූ හඬයි.

# 15

# රන් සළුව ගත්තේ කවුරුවත් නෑ

"මට කවුරුවත් නෑ අනුවුණා!" පොලිෆිමස් උදම් ඇනුවා.

ගුහා කට අසලට බඩගාගෙන ගිය අපිට දකින්න ලැබුණේ හිස් අවකාශය අතින් අල්ලාගෙන, දුෂ්ට ලෙසින් දත් නියවමින් සිටි සයික්ලොප්ස්වයි. රාක්ෂයා මිට මොළවාගෙන සිටි අත සොලවද්දී බේස්බෝල් කැප් එකක් බිමට වැටුණා. ඒත් එක්කම, යටිකුරු අතට කකුල්වලින් එල්ලී සිටි ඇනබෙත් දෘශ්‍යමාන වුණා.

"හාහ්!" සයික්ලොප්ස් හඬ නැගුවා. "නරක, ජේත්තේ නැති කෙල්ල! දැනටමත් නෝනා කරගන්ඩ චණ්ඩි කෙල්ලෙක්ව ලැබිලා ඉවරයි. ඒ කියන්නේ ඔහේට අඹ චට්නි එක්ක රෝස් වෙන්ඩ වෙනවා!"

ඇනබෙත් ඇඟලුවත්, එයා සිටියේ තෝන්තුවෙන් වගෙයි. එයාගේ නළලේ දරුණු කැපුමක් දකින්න ලැබුණා. එයාගේ ඇස් මලානික වෙලා.

"මං එයා ගැන බලාගන්නම්," මම ක්ලැරිස්ට කෙඳිරුවා. ''අපේ නැව දූපත පිටිපස්සේ තියෙනවා. ඔයයි ග්‍රෝවර්යි-"

"කීයටවත් බැහැ," ඒ දෙන්නම එකවර කිවුවා. සයික්ලොප්ස් ගුහාවේ තිබූ බැටළු අං හෙල්ල එකතුවකින් ක්ලැරිස් සන්නද්ධ වුණා. ග්‍රෝවර් බැටළු කලවා ඇටයක් සොයා ගත්තා, ඒ ගැන වැඩි සතුටක් නොපෙන්වූවත්, ඒක මුගුරක් වගේ අල්ලාගත් එයා සටනට සූදානම් වුණා.

"අපි එකතු වෙලා එයාව ඉවර කරමු," ක්ලැරිස් ගෙරෙව්වා.

Scanned with CamScanner

"ඔව්," කියූ ග්‍රෝවර් ඊට පස්සේ තදින් ඇහිපිය ගැසුවේ මේ දන් එයා ක්ලැරිස් කියූ දේකට එකඟ වුණා කියලා අදහන්න බැහැ වගෙයි.

"හරි එහෙනම්," මම කිවුවා. " 'මැසිඩෝනියා පහර දීමේ සැලසුමට වැඩ කරමු."

එයාලා ඔළුව වැනුවා. අර්ධ-ලෝහිත කඳවුරේදී අපි හැමෝම හැදෑරුවේ එකම පුහුණුවීම් පාඨමාලා යි. ඉතින් මම කියන්නේ මොනවා ගැන ද කියලා එයාලා දනගෙන සිටියා. මම සයික්ලොප්ස් ඉදිරියට ගිහින්, එයාගේ අවධානය හරවා ගන්නා අතරේ, ඒ දෙන්නා හොර රහසේ දෙපැත්තෙන් ගිහින් සයික්ලොප්ස්ගේ ඇලපත්වලට පහර දේවි. සමහරවිට මේකේ ප්‍රතිඵලය මම විතරක් මැරෙනවා වෙනුවට අපි හැමෝටම මැරෙන්න සිද්ධ වීම වෙන්නත් පුළුවන්. ඒ කොහොම වුණත් උදවු ලැබීම ගැන මම ගොඩක් සතුටු වුණා.

කඩුවේ බර වාරු කරගත් මම කෑගැසුවා, "හේයි, කැතයෝ!"

යෝධයා වේගයෙන් මගේ පැත්තට හැරුණා. "තවත් එකෙක්? ඔහේ කවුද?"

"මගේ යාළුවාව බිමින් තියෙනවා. ඔහේට බැන්නේ මමයි."

"ඔහේ කවුරුවත් නෑ?"

"අන්න හරි, ගඳ ගහන හොටු ගොඩ!" ඒවා ඇනබෙත්ගේ අපහාස තරම් හොඳ වුණේ නැතත්, ඒ වෙලාවේ මට මතක් වුණේ එච්චරයි. "මම කවුරුවත් නෑ, ඒ වගේම මට ඒ ගැන ආඩම්බරයි! දන්, එයාව බිමින් තියලා මෙහාට එනවා. මට ඔහේගේ ඇහැට ආයෙමත් අනින්න ඕනෑ."

"රා..ර්!" එයා ගර්ජනා කළා.

හොඳ ආරංචිය: එයා ඇනබෙත්ව බිමට දැම්මා. නරක ආරංචිය: එයා ඇනබෙත්ව ඔළුව මුලින්ම වදින්න ගලක් උඩට අත හැරියා. බිමට වැටුණු ඇනබෙත් රෙදි බෝනික්කෙක් වගේ සෙලවීමක්වත් නැතිව වැතිරී සිටියා.

අනෙක් නරක ආරංචිය: පොලිෆිමස් මගේ පැත්තට වේගයෙන් එන්න ගත්තා. ගඳ ගහන සයික්ලොප්ස් රාත්තල් දහස් ගාණකට විරුද්ධව සටන් කරන්න මට තිබුණේ චූටි කඩුවක් විතරයි.



"පැන් වෙනුවෙන්!" ග්‍රෝවර් දකුණු පසින් දුවගෙන ආවා. එයා බැටළු ඇටයෙන් දමා ගැසුවත් රාක්ෂයාගේ නළලේ වැදුණු එය කිසිම හානියක් නොකර පැත්තකට විසි වුණා. වම් පසින් දුව ආ ක්ලැරිස් නියම වෙලාවට හෙල්ලය පොළොවේ ගැසුවේ සයික්ලොප්ස්ගේ කකුලේ ඇනෙන්නයි. වේදනාවෙන් විලාප දෙන රාක්ෂයාට නොපෑගී ඉන්න ක්ලැරිස් පැත්තකට පැන ගත්තා. ඒත්, කකුලේ ඇනුණු කටුවක් ගලවනවා වගේ හෙල්ලය ගලවා දැමූ සයික්ලොප්ස් නොනැවතී මගේ ඉදිරියට ආවා.

මම රිප්ටයිඩ් සමග පැත්තකට පැන්නා.

රාක්ෂයා මාව ඩැහැගන්න උත්සාහ කළත්, පැත්තකට පෙරළුණු මම එයාගේ කලවයකට ඇන්නා. එයාව කුඩු වී යනවා දකින්න මම බලාපොරොත්තු වුණත්, මේ රාක්ෂයාගේ විශාලත්වය සහ ශක්තිය වැඩියි.

"ඇනබෙත්ව ගන්න!" මම ග්‍රෝවර්ට මොර දුන්නා.

ක්ලැරිස් සහ මම පොලිෆිමස්ගේ අවධානය ගන්න උත්සාහ කරන අතරේ, දිවගිය ග්‍රෝවර් ඇනබෙත්ගේ අදෘශ්‍යමාන කැප් එක ඩැහැගෙන, ඇනබෙත්ව ඔසවා ගත්තා.

මම පිළිගන්න ඕනෑ, ක්ලැරිස් ගොඩක් නිර්භීතව සටන් කළා. එයා නැවත නැවතත් සයික්ලොප්ස්ට පහර දුන්නා. රාක්ෂයා මිට මොළවාගත් අතින් පොළොවට ගසමින්, එයාව පාගන්න උත්සාහ කළත් ක්ලැරිස් ඊට වඩා වේගවත් වුණා. එයා පහරදීමක් කළ සැණින්ම මමත් රාක්ෂයාගේ කකුලේ ඇඟිල්ලකට, වළලුකරට හෝ අතට ඇන තුවාල කළා. ඒත් මේ වැඩේ දිගටම කරගෙන යන්න [illegible]ට පුළුවන්කමක් තිබුණේ නැහැ. අන්තිමේදී අපිව වෙහෙසට පත්වේවි, නැත්නම් රාක්ෂයාට අහඹු අවස්ථාවක් ලැබේවි. අපිව මරන්න එයාට ඕනෑ වෙන්නේ එක පහරයි.

ග්‍රෝවර් ලණු පාලම හරහා ඇනබෙත්ව රැගෙන යනවා මම ඇස් කොණකින් දුටුවා. අනෙක් පැත්තේ සිටි මස් කන බැටළුවෝ නිසා මගේ මුල්ම තේරීම ඒක නොවෙන්න තිබුණා, ඒත් ඒ වෙලාවේ ආගාධයේ මේ පැත්තට වඩා ඒ පැත්ත සැහෙන හොඳයි වගෙයි පෙනුණේ. ඒත් එක්කම මට අදහසක් පහළ වුණා.

"පස්සට යන්න!" මම ක්ලැරිස්ට කිවුවා.

Scanned with CamScanner

අසල වූ ඔලිව් ගසක් සයික්ලොප්ස්ගේ පහරින් විනාශ වෙද්දී එයා පසෙකට පෙරළුණා. පොලිෆිමස් අපේ පස්සෙන් පන්නද්දී අපි ලණු පාලම වෙතට දිවුවා. කැපී තුවාල වී සිටි රාක්ෂයා හොඬ ගැසුවත්, අපි කරලා තිබුණේ එයාගේ වේගය අඩු කිරීමත්, කේන්තිය වැඩි කිරීමත් විතරයි.

"ඔහේව අඹරලා බැටළු කෑම හදනවා!" එයා දිවුරුවා. "කවුරුවත් නෑ ට ශාප වෙයන්!"

"තව හයියෙන්!" මම ක්ලැරිස්ට කිවුවා.

අපි කන්ද පහළට දිව්වා. අපිට තිබුණු එකම අවස්ථාව ලණු පාලම විතරයි. දැන් අනෙක් පැත්තට ගොස් සිටි ග්‍රෝවර් ඇනබෙත්ව බිම හාන්සි කරවමින් සිටියා. යෝධයා අපිව අල්ලගන්න කලින් අපි අනෙක් පැත්තට පැන ගන්න ඕනෑ.

"ග්‍රෝවර්!" මම මොරදුන්නා. "ඇනබෙත්ගේ කිණිස්ස ගන්න!"

අපිව ලුහුබඳින සයික්ලොප්ස්ව දකිද්දී එයාගේ ඇස් ලොකු වුණත්, මම කියූ දේ තේරුම් ගත්තා වගේ එයා ඔළුව වැනුවා. ක්ලැරිස් සහ මම අමාරුවෙන් පාලම හරහා යන අතරේ ග්‍රෝවර් ලණු කපන්න පටන් ගත්තා. පළවෙනි පොට හඬ නගමින් කැඩී ගියා.

අපිට පිටුපසින් පොලිෆිමස් පාලමට ගොඩ වෙද්දී පාලම තවත් තදින් පැද්දෙන්න ගත්තා.

දැන් පාලමේ ලණු බාගක්ම කපලා ඉවරයි. ක්ලැරිස් සහ මම ග්‍රෝවර් අසල ගන පොළොවට පැන ගත්තා. මගේ කඩුවෙන් වියරු පහරක් ගැසූ මම ඉතිරි ලණු පොටවලුත් කපා දැමුවා.

පාලම ආගාධය තුළට කඩා වැටෙද්දී සයික්ලොප්ස් සතුටින් උඩු බිරුවා. මොකද, එයා සිටගෙන සිටියේ... අපි ළඟමයි.

"පැරදුණා!" එයා උඩ පැන පැන මොරදුන්නා. "කවුරුවත් නෑ පැරදුණා!" ක්ලැරිස් සහ ග්‍රෝවර් එයාට පහර දෙන්න උත්සාහ කළත් රාක්ෂයා එයාලව මැස්සෝ වගේ අතින් ගසා විසි කළා.

මම කේන්තියෙන් පුපුරා ගියා. මම මේ තරම් දුරක් ගෙවාගෙන ඇවිත්, ටයිසන්වත් නැති කරගෙන දුක් වින්දේ ලා නිල් පාට සායක් ඇඳගත්ත, තඩි මෝඩ රාක්ෂයෙක් ළඟ පරාද වෙන්න ද, මට විශ්වාස කරන්න බැරි වුණා. මැස්සෝ තළනවා වගේ මගේ යාළුවන්ට ගහන්න පුළුවන් කවුරුවත් නෑ. මං කිවුවේ, 'කවුරුවත් නෑ' නෙවෙයි කවුරුවත්



නෑ. ආන්, මං කියපු දේ ඔයාට තේරෙනවා නේ. මගේ ඇඟ පුරා ශක්තිය ගැලුවා. ඒ යෝධයා එක්ක බලද්දී මම අඟුටුමිට්ටෙක් බව අමතක කරලා මම, මගේ කඩුව අරන් පහර දෙන්න පැන්නා. මම සයික්ලොප්ස්ගේ බඩට ඇන්නා. එයා දෙකට නැමෙද්දී මම කඩු මිටෙන් එයාගේ නහය මැද්දට ගැසුවා. මෙලෝ සිහියක් නැතිව කඩුවෙන් කොටමින්, පයින් ගසමින්, පොඩි පට්ටම් කරපු මට ඊළඟට තේරුම් ගියේ උඩුබැලි අතට බිම වැටී, අවසිහියෙන් කෙඳිරිගාන පොලිෆිමස්ට උඩින් මම සිටගෙන කඩු තුඩ එයාගේ ඇහැට එල්ල කරගෙන සිටින බවයි.

"උෆ..න්..න්!" පොලිෆිමස් විලාප නැගුවා.

"පර්සි!" ග්‍රෝවර් තදින් හුස්මක් ගත්තා. "ඔයා කොහොම ද-"

"කරුණාකරලා, එපා!" දුක හිතෙන විදිහට මගේ දිහා බලාගෙන සයික්ලොප්ස් අඳෝනා දුන්නා. එයාගේ නහයෙන් ලේ ගැලුවා. එයාගේ බාගෙට අන්ධ ඇහැ කෙළවර කඳුළු පිරුණා. "ම-මගේ බැටළුවන්ට මාව ඕනෑ. මගේ බැටළුවෝ ටික පරිස්සම් කරන්ඩ හැදුවා විතරයි!"

එයා ඉකි ගහන්න පටන් ගත්තා.

එයා දිනුවා. මට කරන්න තිබුණේ එක ඇනීමක් විතරයි- එක වේගවත් කඩු පහරක් විතරයි.

"එයාව මරනවා!" ක්ලැරිස් මොර දුන්නා. "ඔහේ මොනවට ද බලාගෙන ඉන්නේ?"

සයික්ලොප්ස්ගේ හඬ ගොඩාක් දුක්බර වුණා. හරියට.... හරියට ටයිසන් වගෙයි.

"එයා සයික්ලොප්ස් කෙනෙක්" ග්‍රෝවර් අනතුරු ඇඟෙව්වා. "එයාව විශ්වාස කරන්න එපා!"

එයා නිවැරදි බව මම දැන සිටියා. ඇනබෙත් වුණත් ඒ කතාවම කියාවි කියලත් මම දැන සිටියා. ඒත් පොලිෆිමස් ඉකි ගසද්දී... එයත් පොසෙයිඩන්ගේ පුතෙක් කියන අදහස මගේ හිතට කාවැදුණා. ටයිසන් වගේ. මං වගේ. මම කොහොමද හිතක් පපුවක් නැති කෙනෙක් වගේ එයාව නිකංම මරලා දාන්නේ?

"අපිට ඕනෑ රන් සළුව විතරයි," මම රාක්ෂයාට කිවුවා. "අපිට ඒක අරන් යන්න ඔයා ඉඩ දෙනව ද?"

"නෑ!" ක්ලැරිස් කෑගැසුවා. "ඒකාව මරනවා!"

Scanned with CamScanner

රාක්ෂයා නහය ඉහළට ඇද්දා. "මගේ ලස්සන සළුව, මගේ එකතුවේ වටිනාම දේ. ඒක ගන්නවා, දූෂ්ට මිනිහා. ඒක අරන් පාඩුවේ යනවා."

"මම හෙමින් පස්සට යනවා," මම රාක්ෂයාට කිවුවා. "නිකං හරි හෙලවුණොත්..." මං කී දේ තේරුම් ගත්තා වගේ පොලිෆිමස් ඔළුව වැනුවා.

මම පසුපසට අඩියක් තැබුවා... ඒත් එක්කම නාගයෙක් වගේ වේගයෙන් පොලිෆිමස් මාව ප්‍රපාතය අද්දරට තල්ලු කළා.

"මෝඩ මනුස්සයා!" එයා දෙපයින් නැගිටිමින් ගර්ජනා කළා. "මගේ රන් සළුව ගන්ඩ? හා! ඊට කලින් මං ඔහේව කනවා." එයා යෝධ කට අරිද්දී, මට දකින්න ලැබෙන අන්තිම දසුන එයාගේ හක්කේ හරක් වුණ දත් ටික කියලා මම දැනගත්තා.

ඒ වෙලාවේ මගේ ඔළුවට උඩින් වූෂ් හඬින් ඇදී ගිය යමක් වේගයෙන් වැදුණා- තම්ප්!

පැසිපන්දුවක් තරම් ලොකු ගල් ගෙඩියක් පොලිෆිමස්ගේ උගුරට ඇදුණා- ලකුණු තුනක අගනා පහරක්. බලාපොරොත්තු නොවූ ලෙස උගුරේ හිරවුණ ගුලිය ගිලීමට සයික්ලොප්ස් උත්සාහ කළා. එයා පස්සට අඩියක් තබා සමබර වෙන්න හැදුවත් එතැන අඩිය තියන්න තැනක් තිබුණේ නැහැ. කකුල ලිස්සා ආගාධයට ඇද වැටෙද්දී යෝධ පොලිෆිමස් කුකුළෙක් වගේ අත්තටු ගැසුවත් ප්‍රපාතයෙන් උඩට පියාඹන්න ඒක උදවුවක් වුණේ නම් නැහැ.

මම හැරිලා බැලුවා.

පහළ වෙරළ කිට්ටුව මිනීමරු බැටළු රංචුව මැද කිසිම කරදරයක් නැතිව සිටගෙන සිටියේ පරණ යාළුවෙක්.

"නරක පොලිෆිමස්," ටයිසන් කිවුවා. "අපිට පේන තරම් හැම සයික්ලොප්ස්ම හොඳ නෑ."

සිදුවූ සියල්ල ටයිසන් අපිට කෙටියෙන් පැහැදිලි කළා: රේන්බෝ හිපොකැම්පස්- පෙනුණු හැටියට, ටයිසන් එක්ක සෙල්ලම් කරන්න බලාගෙන ලෝන්ග් අයිලන්ඩ් අසල මුහුදේ ඉඳලම අපේ පස්සෙන් ඇවිල්ලා- සී.එස්.එස්.බර්මින්ග්හැම් නැවේ සුන්බුන් සමග ගිලෙමින් සිටි ටයිසන්ව ආරක්ෂිතව ගොඩට අරගෙන. ඒ වෙලාවේ ඉඳන් එයයි, ටයිසනුයි අපිව හොයාගන්න උත්සාහ කරමින් රාක්ෂ



පදුර පුරා සෝදිසි කරලා. ඒ අතරේදී එයාට දැනුණු බැටළු ඉව දිගේ ඇවිත් මේ දූපත සොයාගෙන තිබුණා.

මේ මෝඩ තඩියව බදාගන්න මට ඕනෑ වුණත්, එයා හිටියේ මස් කන බැටළු රංචුව මැද නේ. "ටයිසන්, දෙවියන්ට ස්තූති වේවා. ඇනබෙත්ට තුවාලයි!"

"එයාට තුවාල වුණාට ඔයා දෙවියන්ට ස්තූති කරනව ද?" එයා ඇසුවේ පටලවාගෙනයි.

"නෑ!" ඇනබෙත් ළඟ දණ ගසාගත් මට දකින්න ලැබුණු දෙයින් මම හොඳටෝම බය වුණා. එයාගේ නළලේ තිබුණු තුවාලය මම හිතුවටත් වඩා දරුණුයි. එයාගේ කොණ්ඩය ලේවලින් එකට ඇලිලා. එයාගේ හම සුදුමැලි වෙලා.

මම ග්‍රෝවර් සමග සැක සහිත බැල්මක් හුවමාරු කරගත්තා. ඒත් එක්කම මට අදහසක් ආවා. "ටයිසන්, බැටළු ලොම් සළුව. ඔයාට පුළුවන් ද මට ඒක ගෙනත් දෙන්න?"

"කොයි එක ද?" එයා ඇසුවේ වටේ සිටි සිය ගාණක් බැටළුවෝ දෙස බලමින්.

"ගහ උඩ!" මම කිවුවා. "රත්තරන් එක!"

"ඔහ්. ලස්සන එක. හා."

බැටළුවෝ නොපාගන්න උත්සාහ කරමින් එයා අමාරුවෙන් එතැනට ගියා. අපෙන් වෙන කෙනෙක් සළුවට කිට්ටු වෙන්න උත්සාහ කළා නම් අපිව පණපිටින් කාලා දාන්න ඉඩ තිබුණා, ඒත් මට හිතෙන හැටියට බැටළුවෝ ටයිසන්ට කිසිම කරදරයක් නොකළේ එයත් පොලිෆිමස් වගේ ගඳ ගැහුව නිසා වෙන්න ඇති. උන් එයාට තුරුළු වෙලා හුරතල් වෙමින් බෑ ගෑවේ ලොකු වේවැල් කූඩයෙන් බැටළු සංග්‍රහයක් ලැබෙයි හිතාගෙන වගෙයි. ගහට නැගපු ටයිසන් රන් සළුව අත්තෙන් ගලවාගත්තා. එසැණින්ම ඕක් ගහේ කොළ කහ පාටට හැරුණා. ටයිසන් මම සිටි දිසාවට එන්න පටන් ගත්තත්, මම මොරදුන්නා, "වෙලාවක් නෑ! ඕක මෙහාට දාන්න!" රන් සළුව දිලිසෙන කවපෙත්තක් වගේ වාතය හරහා පාවී ආවා. ඒක අල්ලා ගනිද්දී මට කෙඳිරි ගෑවුණා. මම බලාපොරොත්තු වුණාට වඩා ඒක ගොඩාක් බරයි- රාත්තල් හැට හැත්තෑවක් බර වටිනා රන් ලෝම. ඇනබෙත්ගේ

මුහුණ හැර ඉතිරි සියල්ල වැසෙන්න එය පෙරවූ මම, මගේ මතකයට ආ සියලු දෙවිවරුන්ට, මම අකමැති අයට පවා සිතෙන් යාඥා කළා.

අනේ, කරුණාකරලා.

එයාගේ මුහුණ නැවතත් පාට වැටුණා. එයාගේ ඇහිපිය සැලෙමින් ඇරුණා. නළලේ වූ කැපුම වැහෙන්න පටන් ගත්තා. ග්‍රෝවර් දෙස බැලූ එයා දුර්වල හඬින් කතා කළා, "ඔයා... කසාද බැන්දෙ නැද්ද?" ග්‍රෝවර් විරිත්තුවා. "නෑ, මගේ යාළුවෝ ඒක කඩාකප්පල් කළා නේ."

"ඇනබෙත්," මම කතා කළා. "හෙලවෙන්නැතිව වැතිරිලාම ඉන්න."

ඒත් අපේ විරෝධය මැදම එයා නැගිටලා, වාඩි වුණා. එයාගේ නළලේ වූ කැපුම දැන් මුළුමනින්ම වගේ සුව වී ඇති බව මට දකින්න ලැබුණා. එයාට දැන් සැහෙන හොඳයි වගෙයි. ඇත්ත වශයෙන් කියනවා නම්, කවුරුහරි එයාට දිලිසෙන දියරයක් එන්නත් කරලා වගේ එයා නිරෝගීකමෙන් බැබළුණා.

මේ අතරවාරයේ ටයිසන්ට බැටළුවන්ගෙන් කරදර වෙන්න පටන් ගත්තා. "බහිනවා!" කෑම සොයමින් එයාගේ ඇගේ නගින්න උත්සාහ කරන බැටළුවන්ට එයා කෑගැසුවා. තවත් කීප දෙනෙක් අපි සිටි දිසාව ඉව කරන්න ගත්තා.

"නෑ. බැටළුවෝ. මේ පැත්තට! මෙහෙ එනවා!"

එයාට ඇහුම්කන් දුන්නත්, උන් සිටියේ බඩගින්නේ බව පැහැදිලිවම පෙනුණා. ඒ වගේම ටයිසන් ළඟ උන්ට කන්න දෙයක් නැති බව බැටළුවෝ ටිකෙන් ටික තේරුම් ගත්තා. අලුත් මස් ළඟපාතක තියෙද්දී, ඒවා ගැන අවධානය නොදක්වා වැඩි වෙලාවක් ඉන්න උන්ට බැරිවේවි.

"අපි දැන් යන්න ඕනෑ," මම කිවුවා. "අපේ නැව..." ක්වීන් ඈන්'ස් රිවෙන්ජ් තිබුණේ දුර ඈතකයි. එයට යා හැකිව තිබූ කෙටිම මග වූ ලණු පාලම දැන් ටිකකට කලින් අපි විනාශ කර දැමුවා. ඉතිරිව තිබුණු එකම මග වුණේ බැටළුවෝ හරහා යාමයි.

"ටයිසන්," මම කතා කළා, "බැටළු රංචුව පුළුවන් තරම් ඈතට අරන් යන්න ඔයාට පුළුවන් ද?"

"මේ බැටළුවන්ට කෑම ඕනෑ වෙලා."



"මං දන්නවා! එයාලට ඕනෑ මිනිස්සු කන්න! එයාලව පාරෙන් ඈතට අරන් යන්නකෝ. අපිට වැල්ලට යන්න වෙලාවක් දෙන්න. ඊට පස්සෙ ඔයත් එතැනට එන්න."

ටයිසන්ගේ මුහුණට සැක සහිත බැල්මක් ආවත්, එයා උරුවම් බෑවා. "එනවා, බැටළුවෝ! මීම්, මෙහෙට ආවොත් මිනිස්සු කන්න පුළුවන්!" බැටළුවෝ පිරිවරාගෙන එයා තණ පිට්ටනිය දෙසට දිවුවා.

"සළුව ඇගේ ඔතාගෙනම ඉන්න," මම ඇනබෙත්ට කිවුවා. "ඔයා තවම හොඳටම සනීප වෙලා නැති ද දන්නෑ. ඔයාට නැගිටින්න පුළුවන් ද?"

නැගිටින්න උත්සාහ කරද්දී එයාගේ මුහුණ නැවතත් සුදුමැලි වුණා. "ඔහ්හ්. හොඳටම සනීප වෙලා නැහැ." පහත් වූ ක්ලැරිස් ඇනබෙත්ගේ පපුව අල්ලා බලද්දී එයා තදින් හුස්මක් ගත්තා.

"ඉළ ඇට කැඩිලා," ක්ලැරිස් කිවුවා. "ඒවා හොඳ වෙනවා. හැබැයි, ටක්කෙටම කැඩිලා."

"ඔයා කොහොමද දන්නේ?" මම ඇසුවා.

ක්ලැරිස් මට රැව්වා. "මොකද, මමත් දෙක-තුනක්ම කඩාගෙන තියෙනවා, මැට්ටෝ! මට එයාව උස්සගෙන යන්ඩ වෙනවා."

මම එයට ප්‍රතිචාර දක්වන්නත් කලින් පිටි ගෝනියක් වගේ ඇනබෙත්ව ඔසවාගත් ක්ලැරිස් වෙරළ දෙසට අමාරුවෙන් පල්ලම් බහින්න ගත්තා. ග්‍රෝවර් සහ මම එයාගේ පසුපසින් ගියා.

අපි වතුරට ළඟා වූ හැටියේම මම ක්වීන් ඈන්'ස් රිවෙන්ජ් වෙතට සිත ඒකාග්‍ර කළා. එහි නැංගුරම් එසවී, මා වෙතට එන්න මම නියෝග කළා. අසහනකාරී විනාඩි කීපයකට පසුව දූපතේ තුඩුව වටෙන් නැව එනවා දකින්න ලැබුණා.

"මෙන්න එනවෝ!" ටයිසන් මොරදුන්නා. එයා උඩ පනිමින් අපේ දිහාවට දුවගෙන එද්දී, ඊට යාර පනහකට විතර ඈතින් බැටළු රැළ දුවගෙන ආවේ, සයික්ලොප්ස් යාළුවා කෑම නොදීම මාරුවීම ගැන හිත් අමාරුවෙන් කෑගසමිනුයි.

"සමහරවිට උන් අපේ පස්සෙන් වතුරට පනින්නේ නැති වෙයි," මම අනෙක් අයට කිවුවා. "අපිට කරන්න තියෙන්නේ පීනගෙන නැවට යන එක විතරයි."

"ඇනබෙත් මෙහෙම ඉඳිද්දි?" ක්ලැරිස් විරෝධය පෑවා.

"අපිට මේක කරන්න පුළුවන්." මම තදින් කියා සිටියා. මගේ ආත්ම විශ්වාසය නැවතත් ඉහළ නගිමින් තිබුණා. මගේ ගෙදර- මුහුදට මම ආපසු ඇවිත් සිටියා. "නැවට නැග ගත්තට පස්සෙ, අපි කෙලින්ම ගෙදර." අපි ඒ කිට්ටුවටම ඇවිත් සිටියේ.

ගිරිකඳුරට ඇතුළුවන තැන පසු කරද්දීම ඇසුණු මහා ගර්ජනාවට හැරී බලද්දී අපිට දකින්න ලැබුණේ නැළී, සීරී සිටියත් තවමත් පණපිටින් ඉන්නා පොලිෆිමස්, එයාගේ කඩමාලු වූ මඟුල් ඇඳුම පිටින් ගල් කුට්ටි දෙකක් දෑතට අරන් අපේ දිහාවට දුවගෙන එන හැටියි.

## 16
# මම නැව සමග මුහුදුබත් වුණා

"මං හිතුවේ එයාගෙ ගල් ඉවර ඇති කියලා." මම කෙඳිරුවා.

"පීනලා යමු!" ග්‍රෝවර් කිවුවා.

එයයි ක්ලැරිසුයි රළ අතරට පැන්නා. ක්ලැරිස්ගේ බෙල්ලේ එල්ලී සිටි ඇනබෙත් එක අතකින් හබල් ගාන්න උත්සාහ කළත්, තෙමුණු රන් සළුවේ බරට ඒක පහසු වුණේ නැහැ.

ඒත් රාක්ෂයාගේ අවධානය යොමු වී තිබුණේ සළුවට නෙවෙයි.

"ඔහේ, සයික්ලොප්ස් පැටියෝ!" පොලිෆිමස් ගර්ජනා කළා. "ඔහේගේ ජාතියට ද්‍රෝහියෙක්!" ටයිසන් සිටි තැනම ගල් ගැසුණා.

"එයා කියන ඒවා අහන්නෙපා!" මම ආයාචනා කළා. "අපි යමු." මම ටයිසන්ගේ අතින් ඇද්දා, ඒත් කන්දක් ඇද්දා නම් ඊට වඩා හොඳයි මට හිතුණා. එයා වැඩිමල් සයික්ලොප්ස් දෙසට හැරුණා. "මම ද්‍රෝහියෙක් නෙවෙයි."

"ඔහේ මිනිස්සුන්ට ගැතිකම් කරනවා!" පොලිෆිමස් කෑගැසුවා. "හොරකම් කරන මිනිස්සුන්ට!" එයා පළවෙනි ගලෙන් දමා ගසද්දී ටයිසන් මුෂ්ටි පහරක් දී එය පසෙකට දැමුවා.

"ද්‍රෝහියෙක් නෙවෙයි." ටයිසන් කිවුවා. "ඔයා මගේ ජාතියේ කෙනෙකුත් නෙවෙයි."

"මැරෙනවා නැත්නම් දිනනවා!" පොලිෆිමස් රළ අතරට කඩා පැන්නා, ඒත් එයාගේ කකුල් තුවාල වෙලයි තිබුණේ. ඉක්මනින්ම පය

Scanned with CamScanner

පටලාගත් එයා මුණින් අතට ඇද වැටුණා. ඒක හිනා යන වැඩක් වෙන්න තිබුණත්, ඊට කලින් එයා යුණු වතුර කටින් පිඹිමින් නැගිට්ටා.

"පර්සි!" ක්ලැරිස් මොරදුන්නා. "ඉක්මන් කරන්න!"

එයාලා රන් සළුව සමග නැව ළඟටම ගොස් සිටියා. තව පොඩි වෙලාවක් මට රාක්ෂයාව කලබල කරලා තියාගන්න පුළුවන් නම්...

"යන්න," ටයිසන් මට කිවුවා. "මම තඩි කැතයව බලා ගන්නම්."

"නෑ! එයා ඔයාව මරලා දායි." මම දැනටමත් එක වතාවක් ටයිසන්ව නැති කරගෙනයි සිටියේ. තවත් වතාවක් එහෙම වෙන්න ඉඩ දෙන්න මම සූදානම් වුණේ නැහැ. "අපි දෙන්නම එකතු වෙලා එයාව පරද්දමු."

"දෙන්නම එකට," ටයිසන් එකඟ වුණා.

මම, මගේ කඩුව ඇදලා ගත්තා.

පරිස්සමෙන් ඉදිරියට ආ පොලිෆිමස් පෙරටත් වඩා තදින් තොණ්ඩි ගැසුවා. ඒත් එයාගේ විසි කරන අතට නම් කිසිම ආබාධයක් වෙලා නැහැ. එයා දෙවෙනි ගල් කුට්ටියත් දැමුවා. මම පැත්තකට පැන්නා. ඒත් ගල කුඩු වෙන්න වැදුණු ටයිසන්ගේ මුෂ්ටි පහර නොතිබෙන්න මාව චප්ප වෙන්න තිබුණා.

මම මුහුදට ඉහළ නැගෙන්න නියෝග කළා. ඒත් එක්කම අඩි විස්සක් උසැති රළ කඳක් මතුවුණේ එහි මුදුනට මාව ඔසවමින්. සයික්ලොප්ස් ඉදිරියට රළ පැදගෙන ගිය මම එයාගේ ඇහැට පයින් ගසා, රැල්ල එයාව වැල්ලට සමතලා කරද්දී එයාගේ ඔළුවට උඩින් පැන්නා.

"ඔහේව විනාශ කරනවා!" පොලිෆිමස් කියෙවුවා. "ලොම් සළු හොරා!"

"රන් සළුව හොරකම් කළේ ඔහේ නේ!" මම ආපසු මොර දුන්නා. "ඔහේ ඒක සැටර්ලව මර උගුලට ඇදගන්න ඇමක් විදිහට පාවිච්චි කළා!"

"ඉතින්? සැටර්ලා රස කෑමක් නේ!"

"රන් සළුව පාවිච්චි කරන්න ඕනෑ ලෙඩ හොඳ කරන්න! ඒක අයිති දෙවිවරුන්ගේ දරුවන්ට!"



"මමත් දෙවිවරුන්ගේ දරුවෙක් තමයි!" පොලිෆිමස් මාව ඩැහැගන්න උත්සාහ කළත්, මම පැත්තකට අඩිය තැබුවා. "පොසෙයිඩන් තාත්තේ, මේ හොරාට ශාප කරන්ඩෝ!" දැන් එයා තදින් ඇහිපිය ගසමින් සිටියේ කිසිම දෙයක් පෙන්නේ නැහැ වගෙයි. එයා මාව ඉලක්ක කරන්නේ මගේ කටහඬෙන් බව මම ඒ වෙලාවේ තේරුම් ගත්තා.

"පොසෙයිඩන් මට ශාප කරන්නෑ," සයික්ලොප්ස්ට වාතය ඩැහැගන්න ඇරලා පස්සට යමින් මම කිවුවා. "මමත් එයාගේ පුතෙක්. එයා කැමතිම කෙනාව තෝරන එකක් නෑ."

පොලිෆිමස් ගිගුරුවා. කඳු බෑවුමෙන් ඔලිව් ගසක් උගුලුවා ගත් එයා මීට මොහොතකට කලින් මම සිටි තැනට ගැසුවා. "මිනිස්සු එක වගේ නැහැ! නපුරු. කපටි. බොරුකාරයෝ!"

ග්‍රෝවර් ඇනබෙත්ට නැවට ගොඩවෙන්න උදවු කරමින් සිටියා. මට අඬගසමින් ක්ලැරිස් පිස්සුවෙන් වගේ අත වැනුවා. ටයිසන් පොලිෆිමස් වටේ යමින්, එයාගේ පිටුපසට යන්න උත්සාහ කරමින් සිටියා.

"පොඩි එකෝ!" ලොකු සයික්ලොප්ස් කතා කළා. "ඔහේ කොහේ ද? මට උදවු කරන්ඩ!" ටයිසන් නැවතුණා.

"ඔහේව හරියට හදලා නෑ!" ඔලිව් ගස් මුගුර සොලවමින් පොලිෆිමස් විලාප තැබුවා. "අසරණ, අනාථ මල්ලි! මට උදවු කරන්ඩ!"

තුන්දෙනා සිටි තැන්වලම නතර වුණා. මුහුදේ හඬත්, මගේ පපුව ගැහෙන හඬත් ඇර වෙන කිසිවක් නෑසී ගියා. ඊට පස්සේ, ටයිසන් ආරක්ෂාවට අත් ඔසවාගෙන අඩියක් ඉදිරියට තැබුවා. "රණ්ඩු කරන්නෙපා, සයික්ලොප්ස් අයියා. ඕක බිමට දා- " පොලිෆිමස් එයාගේ හඬ ආ දිසාවට හැරුණා.

"ටයිසන්!" මම කෑගැසුවා.

ඔලිව් ගහ කොයිතරම් වේගයෙන් එයාගේ වැදුණා ද කියනවා නම්, ඒ පාර මට වැදුණොත් මාව වැඩිපුර ඔලිව් දාපු පර්සි පීසා එකක් වෙනවා. වැල්ලේ අගලක් හාරගෙන ටයිසන් පිටුපසට විසි වුණා. පොලිෆිමස් එයාට ආයෙම පහර දෙන්න පැන්නත්, "එපා!" කෑගැසූ මම රිප්ටයිඩ් අතින් අරන් හැකි උපරිම දුරට පැන්නා. පොලිෆිමස්ගේ

කලවයට අනින්න මම ඉලක්ක කළත්, ඊට වඩා චුට්ටක් විතර උඩට අනින්න මට පුළුවන් වුණා.

"බිලා...හ්!" බැටළුවෝ කෑගහන විදිහටම කෑගැසූ පොලිෆිමස්, එයාගේ ගඟෙන් මට ගැසුවා. මම පහත් වුණත්, ගහේ කැඩුණු අතු දූසිම ගාණකින් මගේ පිට සීරී ගියා. තුවාලවලින් ලේ ගලද්දී, මම මහන්සියෙන් හෙම්බත් වුණා. මගේ ඇතුළේ සිටි රට හාවට පැනලා දුවන්න ඕනෑ වුණත් මම, මගේ බය ගිල ගත්තා.

පොලිෆිමස් නැවතත් ගහෙන් ගැසුවත්, ඒ වතාවේ මම සූදානම් වෙලයි සිටියේ. මගේ ළඟින් යද්දීම ගහේ අත්තක් අල්ලාගත් මම අහස දෙසට විසි වෙද්දී අත්වලට දැනුණු වේදනාව නොසලකා හරිමින්, සයික්ලොප්ස්ට මාව ඉහළට ඔසවන්න ඉඩ හැරියා. අඩ කවය මුදුනේ දී මම අත්ත අත ඇර යෝධයාගේ මුහුණ උඩට කෙලින්ම වැටුණා- ගොඩබෑසීමේ දී දැනටමත් තුවාල වී තිබුණු යෝධයාගේ ඇහැ උඩට දෙපා තියන්න මම වගබලා ගත්තා.

පොලිෆිමස් වේදනාවෙන් උඩු බිරුවා. ඒ අතරේ ටයිසන් පොර බදලා එයාව බිම දැමුවා. කඩුව අතින් ගත් මම එයාලා අසලම බිමට පැන්නා- රාක්ෂයාගේ හදවත හරහා කඩු පහරක් දිය හැකි තරම් ළඟට. ඒත් ටයිසන්ගේ ඇස් දිහා බලද්දී මට එය කරන්න බැරි බව මම දැනගත්තා. එහෙම කරන එක වැරදියි.

"එයාට යන්න දෙන්න," මම ටයිසන්ට කිවුවා. "දුවන්න."

අන්තිම වතාවටත් ප්‍රබල ආයාසයකින් ලොකු සයික්ලොප්ස්ව පැත්තකට පෙරළා දැමූ ටයිසන් මාත් එක්ක රළ අතරට දුවගෙන ආවා.

"මම ඔහේලව පොඩි පට්ටම් කරනවා." වේදනාවෙන් දෙකට නැමීගෙන පොලිෆිමස් මොර දුන්නා. එයා යෝධ අත්වලින් ඇහැ වසාගෙන සිටියා.

ටයිසනුයි මමයි රළ අතරට පැන්නා.

"ඔහේ කොහේ ද?" පොලිෆිමස් බෙරිහන් දුන්නා. ගහ අතට ගත් එයා ඒක වතුරට විසි කළා. ඒක අපේ දකුණු පැත්තේ කොහේනටදෝ වැටුණා.

අපේ උදවුවට මම දියවැල් කැඳවද්දී අපේ වේගය ටිකෙන් ටික වැඩි වුණා. අපිට නැවට යාගන්න පුළුවන් වේවි කියලා මට



බලාපොරොත්තුවක් දැනෙද්දී, ක්ලැරිස් නැව් තට්ටුව උඩ ඉඳගෙන කෑගහන්න ගත්තා, "ඔව්, ජැක්සන්! ඔහේගෙ මූණ උඩ, සයික්ලොප්ස්!"

කට වහගන්නවා, මට කෑගහන්න ඕනෑ වුණා.

"රා...ර්ර්!" පොලිෆිමස් ගල් කුට්ටියක් අහුලා ගත්තා. ක්ලැරිස්ගේ හඬ ඇසුණු දිසාව ඉලක්ක කරගෙන එයා ඒක විසි කළත්, එතරම් දුර නොගිය ගල් ගෙඩිය මාවත් ටයිසන්වත් තුලෙන් මග අරිමින් වතුරට වැටුණා.

"හූ, හූ!" ක්ලැරිස් ඇද කළා. "ඔහේ ගලක් විසි කරන්ඩවත් දන්නෑ! මාව කසාද බැඳගන්ඩ හැදුවට හොඳ පාඩමක් උගන්නනවා, මෝඩ තඩියා!"

"ක්ලැරිස්!" ඉවසගෙන ඉන්න බැරිම තැන මම මොරදුන්නා. "කට වහගන්න!" පරක්කු වැඩියි. පොලිෆිමස් තවත් ගලකින් ගැසුවා. මේ වතාවේ මගේ ඔළුවට උඩින් පියඹා ගිය ගල් කුට්ටිය ක්වීන් ඈන්ස් රිවෙන්ජ් ගේ බඳ කඩාගෙන යන දෙස අසරණව බලා ඉන්න මට සිද්ධ වුණා. නැවකට කොයිතරම් වේගයෙන් ගිලෙන්න පුළුවන් ද කියලා ඔයා විශ්වාස කරන්නෙත් නැති වෙයි. කිරිකිරි හඬ නගමින් කෙඳිරි ගෑ නැව ඉදිරියට ඇලවුණේ ළමා උයනක ලිස්සන බෑවුමේ රූටනවා වගෙයි.

ශාප කළ මම, අපිව තවත් වේගයෙන් ඉදිරියට තල්ලු කරන්න මුහුදෙන් ඉල්ලුවත්, නැවේ කුඹ ගස් දැනටමත් යට යමින් තිබුණා.

"කිමිදෙන්න!" මම ටයිසන්ට කිවුවා. තවත් ගල් ගෙඩියක් අපිට ඉහළින් පියඹා යද්දී අපි වතුර යටට එබුණා. වේගයෙන් ගිලෙමින් සිටි මගේ යාළුවෝ නැවේ සුන්බුන් අතරින් ඉහළ නැගෙන බුබුළු පාර දිගේ පිහිනන්න උත්සාහ කළත්, වාසනාව එයට හරස් කැපුවා.

ගිලෙන නැවක් වතුර බහින බේසමක සිදුර වගේ ක්‍රියාකරමින් අවට ඇති සියලු දේ පහළට ඇදගෙන යන බව දන්නේ ටික දෙනයි. දක්ෂ පිහිනුම්කාරියක් වූ ක්ලැරිස්ටවත් එයින් ඈතට පිහිනන්න බැරි වුණා. ග්‍රෝවර් පිස්සුවෙන් වගේ කුර ගසමින් දඟලුවා. ඇනබෙත් එල්ලී සිටි රන් සළුව වතුර යට දී අලුත් රන් කාසි වගේ දිලිසුණා.

මගේ යාළුවන්ව ගොඩට ගන්න මගේ ශක්තිය ප්‍රමාණවත් නැති බව දැන දැනම මම එයාලා දෙසට පිහිනුවා. නරකම දේ වුණේ එයාලා වටේට ලී කොටන් සුළි නංවමින් තිබුණු එකයි; මේ ලී කඳන්

එයාලගේ ඔළුවේ වැදුණොත් මට තියෙන එක බලයකින්වත් එයාලට උදවු කරන්න බැරි වේවි.

අපිට උදවු ඕනෑ, මම හිතුවා.

ඔව්. ටයිසන්ගේ හඬ පැහැදිලිව මගේ ඔළුව ඇතුළේ ඇසුණා.

මම එයා දිහා බැලුවේ පුදුමයට පත්වෙලයි. ජල දෙවඟනෝ සහ තවත් වතුරේ බලවේග වතුර යට දී කතා කරනවා මට ඇහිලා තිබුණා. ඒත් මේ ගැන මම කවදාවත් හිතලා තිබුණේ නැහැ... ටයිසන් කියන්නෙත් පොසෙයිඩන්ගේ පුතෙක්. ඒ කියන්නේ අපි දෙන්නා අතරේ අදහස් හුවමාරු කරගන්න පුළුවන්.

රේන්බෝ්, ටයිසන් කිවුවා.

ඔළුව වැනූ මම ඇස් වසාගෙන, සිත ඒකාග්‍ර කරමින් මගේ හඬ ටයිසන්ගේ හඬට එකතු කළා. රේන්බෝ! අපිට උදවු ඕනෑ!

එසැණින්ම, පහළ අඳුර තුළින් දිලිසෙන රූප පෙනෙන්න ගත්තා- මාළු වරල් ඇති අශ්වයෝ ඩොල්ෆින්ලාටත් වඩා වේගයෙන් ඉහළට පිහිනා ආවා. අපේ දෙසට බැල්මක් හෙළූ රේන්බෝටත්, එයාගේ යාළුවන්ටත් අපේ හිත් කියවන්න පුළුවන් වුණා වගෙයි. සුන්බුන් අතරට වේගයෙන් රිංගූ එයාලා මොහොතකට පසුව බුබුළු වලාවක් මැදින් උඩට මතු වුණා- ග්‍රෝවර්, ඇනබෙත් සහ ක්ලැරිස් හිපොකැම්පස්ලාගේ කරවල්වල එල්ලී සිටියා.

එයාලාගෙන් ලොකුම කෙනා වූ රේන්බෝ ක්ලැරිස්ව දරාගෙන සිටියා. අපි ළඟට ආ එයා ටයිසන්ට එයාගේ කේශරවලින් අල්ලගන්න ඉඩ දුන්නා. ඇනබෙත්ව දරාගෙන සිටි එයාගේ යාළුවා මටත් ඒකම කළා.

වතුරෙන් උඩට මතුවුණ අපි පොලිෆිමස්ගේ දූපතෙන් ඉවතට වේගයෙන් ඇදුණා. අපිට පිටුපසින් සයික්ලොප්ස් ජය සමරමින් ගර්ජනා කරන හඬ මට ඇසුණා. "මම ඒක කළා! අන්තිමේ දී කවුරුවත් නෑ ගිලිලා මළෝ!" එයා වැරදි බව කවදාවත් එයාට දැනගන්න ලැබෙන්න එපා කියලා මම ප්‍රාර්ථනා කළා.

අපි සයුර හරහා වේගයෙන් යද්දී පුංචි තිතක් තරමට ඇකිළුණු දූපත ඉන්පසුව නොපෙනීම ගියා.



"ඒක කළා," ඇනබෙත් මහන්සියෙන් හෙම්බත් වී කෙඳිරුවා. "අපි..." හිපොකැම්පස්ගේ බෙල්ල උඩට ඇද වැටුණු එයා එසැණින්ම නින්දට වැටුණා.

හිපොකැම්පිලාට අපිව කොයිතරම් දුර ගෙනියන්න හැකි වෙයි ද මම දැන සිටියේ නැහැ. අපි යන්නේ කොහෙද කියලාවත් මම දැන සිටියේ නැහැ. ඇනබෙත්ව මුහුදට නොවැටෙන්න රැකුල් දුන් මම, අපි දහදුක් විඳලා සොයාගත් රන් සළුව එයාට පොරවලා, දෙවිවරුන්ට නිහඬ ස්තූතියක් කළා.

ඒ වෙලාවේ මට මතක් වුණේ... මම දෙවිවරුන්ට වුණ බාරයක් ඔප්පු කරන්න තිබුණා නේ.

"ඔයා ගොඩාක් බුද්ධිමත් කෙනෙක්," මම හෙමිහිට ඇනබෙත්ට කිවුවා.

ඊට පස්සේ රන් සළුව උඩින් ඔළුව තියාගත් මට දන්නෙම නැතුව නින්ද ගිහිල්ලා.

Scanned with CamScanner

# 17
# මියාමි වෙරළේදී අපිට ලැබුණු පුදුම කිරීම

"පර්සි, නැගිටින්න."

ලුණු වතුර මගේ මුහුණට ඉසුණා. ඇනබෙත් මගේ උරහිසෙන් සොලවමින් සිටියා.

ඈතින්, නගරයක ගොඩනැගිලිවලට පිටුපසින් ඉර බැස යමින් තිබුණා. දෙපස පාම් ගස් පෙළ ගැසුණු මුහුදුබඩ අධිවේගී මාර්ගයකුත්, නිල්-රතු නියෝන් එළිවලින් ඉදිරිපස ආලෝකමත් කළ කඩ සාප්පු, සංචාරක නැව් සහ රුවල් බෝට්ටු පිරුණු වරායකුත් මට දකින්න ලැබුණා.

"මං හිතන්නේ, ඒ මියාමි," ඇනබෙත් කිවුවා. "ඒත් මේ හිපොකැම්පියෝ හැසිරෙන විදිහ හරි අමුතුයි." කිවුවත් වගේම, අපේ මාළු යාළුවෝ පිහිනමින් සිටි වේගය අඩු කරලා, වතුර ඉව කරමින් එක තැන රවුමට පිහිනමින් සිටියා. එයාලා සිටියේ සතුටින් නෙවෙයි වගෙයි. එක් කෙනෙකුට කිවුහුමක් ගියා. එයාලගේ සිතුවිලි මට තේරුණා.

"මෙතැනින් එහාට එයාලට අපිව අරන් යන්න බැහැ," මම කිවුවා. "මිනිස්සු ගොඩයි. වතුරත් ගොඩාක් අපිරිසිදුයි. අපිට පීනගෙන වෙරළට යන්න වෙනවා." අපි කවුරුවත් ඒක බලාපොරොත්තු වුණේ නැහැ, ඒ කොහොම වුණත් අපිව මේ තරම් දුරක් අරගෙන ආවට අපි රේන්බෝටත්, එයාගේ යාළුවන්ටත් ස්තුති කළා. ටයිසන් නම් චුට්ටක් වීතර ඇඬුවත් එක්ක. බර්මින්ග්හැම් සුත්බූත් අතරින් එයා ගොඩගෙන තිබූ ආම්පන්න කට්ටලයත්, තවත් බඩු දෙක-තුනකුත් දැමීමට එයා සෑ



සැදලය ගලවාගත් ටයිසන් රේන්බෝගේ බෙල්ල බදාගෙන, දූපතෙන් අහුලාගත් ගොහොදු අඹ ගෙඩියක් එයාට දීලා, සමු දුන්නා.

හිපොකැම්පිලාගේ සුදු පාට කේශර මුහුදේ නොපෙනී ගියාට පසු අපි වෙරළට පිහිනුවා. අපිව ඉදිරියට තල්ලු කළ රැල්ලේ උදවුවෙන් ටික වෙලාවකින්ම අපි සාමාන්‍ය ලෝකයට ඇතුළු වුණා. යාත්‍රා පෙළ ගැසුණු තොටුපළ දිගේ, නිවාඩු ගත කිරීමට එන සෙනග අතරින් අපි ඉබාගාතේ ඇවිද්දා. බඩු පැටවූ කරත්ත තල්ලු කරගෙන පෝටර්වරු තඩිමුඩියේ එහෙ මෙහෙ ගියා. ස්පාඤ්ඤ බසින් එකිනෙකාට කෑමොර දිගත් කුලී රථ රියැදුරෝ මගීන්ව අල්ලා ගැනීමට පොර කෑවා. අපිව-මෙ දැන් රාක්ෂයෙක් එක්ක සටන් කරලා වගේ පෙනෙන, තෙත බේරෙන ළමයි පස්දෙනෙක්- කාගේ හෝ අවධානයට හසුවුණා නම්, එයාලා ඒ බවක් ඇගෙව්වේ නැහැ.

දැන්, අපි සාමාන්‍ය මිනිස්සු අතර සිටි නිසා ටයිසන්ගේ තනි ඇහැ මීදුමෙන් බොඳ වී පෙනුණා. ග්‍රෝවර්, එයාගේ කැප් එකත්, ස්නිකර් ජෝඩුවත් පැලඳ ගත්තා. රන් සළුව පවා සාක්කුව මත දිලිසෙන ලොකු ඔමේගා ලකුණක් ඇති රතු සහ රන් පාට උසස් පාසල් ජැකට්ටුවකට හැරුණා. ළඟම වූ පත්තර තට්ටුවක් අසලට දිවූ ඇනබෙත් මියාමි හෙරල්ඩ් පත්තරයේ වූ දිනය පරීක්ෂා කළා. එයාගේ කටින් ශාපයක් පිටවුණා. "ජූනි දහ අට! අපි කඳවුරෙන් පිටවෙලා දවස් දහයක් ගිහින්!"

"ඒක වෙන්න බැහැ!" ක්ලැරිස් කිවුවා.

ඒත් ඒක වෙන්න පුළුවන් කියලා මම දන සිටියා. රාක්ෂයින් අරක්ගත් තැන්වලදී කාලය ගත වෙන්නේ වෙනස් ලෙසටයි.

"දැන් නම් තාලියාගේ ගහ හොඳටම මැරිලා ඇති," ග්‍රෝවර් විලාප දුන්නා. "අපි අද රෑම සළුව අරගෙන යන්න ඕනෑ."

ක්ලැරිස් පදික වේදිකාව මතට කඩා වැටුණා. "අපි කොහොම ද ඒක කරන්නේ?" එයාගේ හඬ සැලුණා. "අපි හැතැප්ම සිය ගාණක් ඈත ඉන්නේ. අතේ සතයක්වත් නෑ. යන්න වාහනයකුත් නෑ. මේක හරියට ඔරැකල් කිවුවා වගේමයි. ඒක ඔහේගේ වැරැද්ද, ජැක්සන්! ඔහේ මැදට පනින්නැතුව හිටියා නම්- "

"පර්සිගෙ වැරැද්ද!" ඇනබෙත් පුපුරා ගියා. "ක්ලැරිස්, ඔයා කොහොම ද එහෙම කියන්නේ? ඔයා තමයි ලොකුම-"

"ඔක නතර කරන්න!" මම කිවුවා.

Scanned with CamScanner

ක්ලැරිස් අත් දෙකේ ඔළුව ගසාගත්තා. ඇනබෙත් කේන්තියෙන් අඩිය පොළොවේ ගැප්පුවා. ප්‍රශ්නය වුණේ මේ ගවේෂණය ක්ලැරිස්ගේ බව මට සහමුලින්ම අමතක වුණ එකයි. එක බිහිසුණු මොහොතකට, එයාගේ පැත්තෙන් මම මේ දේවල් දුටුවා. මගේ ගවේෂණය මැද්දට වීරයෝ රංචුවක් කඩා වැදිලා, මම වැඩකට නැති කෙනෙක් වගේ පේන්න සැලැස්වුවොත් මට කොහොම දැනේවි ද?

සී.එස්.එස්.බර්මින්ග්හැම් බොයිලේරු කාමරයේ දී අහන්න ලැබුණු දේ ගැන මම කල්පනා කළා- අසාර්ථක වෙන්න එපා කියලා ඒරීස් ක්ලැරිස්ට මොරගහපු හැටි. ඒරීස්ට කඳවුරෙන් වැඩක් නැහැ, ඒත් ක්ලැරිස් එයාට ලැජ්ජා වෙන විදිහට වැඩ කළොත්...

"ක්ලැරිස්," මම කතා කළා, "ඇත්තටම ඔරැකල් ඔයාට කිවුවේ මොනවද?" එයා මගේ දිහා බැලුවා. එයා මට බනින්න යනවා කියලා හිතුණත්, ඒ වෙනුවට ගැඹුරු හුස්මක් ගත් එයා අනාවැකිය කටපාඩමෙන් කියාගෙන ගියා:

"නුඹට ඇට්සැකිලි භටයෝ සමග යකඩ නැවක යාත්‍රා කිරීමට සිදු වේවි,

නුඹ සොයනා දේ ලබාගෙන, එය නුඹගේ කරගනීවි,

එහෙත් ගල් අතර වැළලී, නුඹගේ බලාපොරොත්තු සුන් වේවි,

මිතුරන් නැතිව අසාර්ථක වෙන නුඹට තනිවම නිවස බලා පියාසර කිරීමට සිදු වේවි."

"අයියෝ," ග්‍රෝවර් මිමිණුවා.

"නෑ," මම කිවුවා. "නෑ.... පොඩ්ඩක් ඉන්න. මට ඒක තේරුණා." සල්ලි සොයා මගේ කලිසම් සාක්කු ඇද බැලූ මට සොයාගන්න ලැබුණේ රන් ඩ්‍රච්මාවක් විතරයි. "ඔයාලා කාගෙවත් ළඟ සල්ලි තියෙනව ද?"

ඇනබෙත් සහ ග්‍රෝවර් මුහුණු එල්ලාගෙන, ඔළුව හෙල්ලුවා. තෙතබරිත වූ ඩොලරයේ නෝට්ටුවක් සාක්කුවෙන් පිටට ගත් ක්ලැරිස් සුසුමක් හෙළුවා.

"සල්ලි?" ටයිසන් අදිමදි කරමින් ඇසුවා. "අර... කොළ පාට කඩදාසි කෑලි ද?" මම එයා දිහා බැලුවා. "ඔව්."

"අර කැන්වස් මලු අස්සෙ තිබුණා වගේ ඒවා?"

"ඔව්. ඒත් ඒ මලු දවස් ගාණකට කලින් අපි න්-නැ-නැ- "



මට ගොන ගැසුණේ ටයිසන් සෑදල මල්ල අවුස්සා, හර්මීස් අපේ සැපයුම් මලුවලට දමා තිබූ නෝට්ටු පිරුණු වතුර නොයන මල්ලක් පිටට ගන්නවා දැකලයි.

"ටයිසන්!" මම කිවුවා. "ඔයා කොහොම ද-"

"මං හිතුවේ මේකෙ රේන්බෝට කන්න දෙයක් තියෙයි කියලා," එයා කිවුවා. "මුහුදේ පාවෙවී තියෙද්දි හොයාගත්තේ, ඒත් ඇතුළේ තිබුණේ කඩදාසි කෑලි විතරයි. සමා වෙන්න."

එයා සල්ලි ටික මට දුන්නා. එතැන පහේ සහ දහයේ නෝට්ටුවලින් අඩු තරමේ ඩොලර් තුන් සියයක් විතර තිබුණා. ගැටි බැම්ම ළඟට දිවූ මම ඒ මොහොතේ එතැනට ආ කුලී රියක් නවත්වා ගත්තා.

"ක්ලැරිස්," මම අඬගැසුවා. "ඉක්මනට එන්න. ඔයා දැන් එයාපෝර්ට් එකට යනවා. ඇනබෙත්, එයාට සළුව දෙන්න." මම ඇනබෙත් අතින් රන් සළුව අරගෙන, සාක්කුවට සල්ලි ටික ඔබලා, ඒක ක්ලැරිස්ගේ අතට දෙද්දි වැඩිපුර පුදුම වුණේ ඒ දෙන්නාගෙන් කවුද කියලා නම් මට හරියටම කියන්න බැහැ. ක්ලැරිස් කතා කළා, "ඔහේ මට දෙනව ද-"

"මේක ඔයාගේ ගවේෂණය," මම කිවුවා. "අපිට සල්ලි තියෙන්නෙ එක ප්ලේන් ටිකට් එකකට විතරයි. ඇරත්, මට උඩින් ගමන් යන්න බැහැ නේ. සියුස් මාව කෑලි මිලියනයකට විතර කුඩු කරලා දායි. අන්න ඒකයි අනාවැකියෙ කියන්නේ: මිතුරෝ නැතිව අසාර්ථක වෙනවා, ඒ කියන්නෙ ඔයාට අපේ උදවු ඕනෑ. ඒත් ඔයාට තනියම පියාසර කරන්න වෙනවා. ඔයා රන් සළුව පරිස්සමෙන් අරන් යන්න ඕනෑ."

එයාගේ හිත වැඩ කරනවා මට පෙනුණා- මුලින්ම, මම මොන වගේ උගුලක් අටවන්න හදනව ද හිතලා සැකයක්, ඊට පස්සේ මම කිවුවේ ඇත්තටමයි කියලා තීරණයක්.

එයා කුලී රිය ඇතුළට පැන්නා. "ඔහේට මං ගැන බලාපොරොත්තු තියාගන්න පුළුවන්. මං මේක වරද්ද ගන්නෑ."

"එහෙනම් හොඳයි."

දුම් වලාවක් මැදින් කුලී රිය ඉවතට ඇදුණා. රන් සළුව නැවතත් ගමනේ.

Scanned with CamScanner

"පර්සි," ඇනබෙත් කතා කළා. "ඒක නම් මාර-"

"ත්‍යාගශීලීකමක්?" ග්‍රෝවර් යෝජනා කළා.

"මිස්සු වැඩක්," ඇනබෙත් නිවැරදි කළා. "අද රෑ වෙද්දී ක්ලැරිස් රන් සළුව පරිස්සමෙන් අරන් යයි හිතලා ඔයා මුළු කඳවුරේම අයගේ ජීවිත ඔට්ටුවට තියනව ද?"

"ඒක එයාගේ ගවේෂණය," මම කිවුවා. "එයාටත් අවස්ථාවක් ලැබෙන්න ඕනෑ."

"පර්සි හරිම හොඳයි," ටයිසන් කිවුවා.

"පර්සි ඕනෑවටත් වඩා හොඳයි," ඇනබෙත් අවලාද නැගුවා. ඒත් මට හිතුණේ සමහරවිට, සමහරවිට එයා චුට්ටක් විතර පුදුම වුණා කියලයි. ඒක කරන්න ලේසි-පහසු වැඩක් නෙවෙයි.

"එන්න යමු," මම, මගේ යාළුවන්ට කිවුවා. "අපි ගෙදර යන්න වෙන විදිහක් හොයා ගමු."

අනෙක් පැත්ත හැරුණු මට දකින්න ලැබුණේ මගේ බෙල්ලට එල්ල වී ඇති කඩු තුඩක්.

"හේයි, මචං," ලූක් කිවුවා. "ගොඩබිමට සාදරෙන් පිළිගන්නවා." එයාගේ වලස්-මිනිස් මැරයෝ දෙන්නා අපේ දෙපැත්තෙන් මතු වුණා. එක්කෙනෙක් ඇනබෙත්ගෙත් ග්‍රෝවර්ගෙත් ටී-ෂර්ට් කොලර්වලින් අල්ලගත්තා. අනෙකා ටයිසන්ව අල්ලගන්න උත්සාහ කළත්, එයාව ගමන් මලු ගොඩක් උඩට ඇද වැටෙන්න පහරක් දුන් ටයිසන් ලූක්ට ගෙරෙව්වා.

"පර්සි," ලූක් සන්සුන්ව කිවුවා, "ඔයාගෙ යෝධයට කියන්න පස්සට වෙන්න කියලා, නැත්නම් ඔයාගේ යාළුවෝ දෙන්නගෙ ඔළු දෙක එකට හප්පන්න කියලා මම ඔරෙයස්ට කියනවා."

දත් නියවූ ඔරෙයස් පයින් ගහමින් බෙරිහන් දෙන ඇනබෙත්වත් ග්‍රෝවර්වත් පොළොවෙන් උඩට එසවූවා.

"ඔහේට මොනවද ඕනෑ, ලූක්?" මම ගෙරෙව්වා.

එයා හිනා වෙද්දී කම්මුලේ තුවාල කැළැල රැළි ගැසුණා.

එයා තොටුපළේ ඇත කෙළවරට අත දිගු කරද්දී, මම කලින් තේරුම් ගත යුතුව තිබුණු දෙයක් මට දකින්න ලැබුණා. වරායේ වූ ලොකුම යාත්‍රාව ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩායි.



"ඇයි, පර්සි," ලූක් හිනා වුණා. "මට ඕනෑ තව ටිකක් ආගන්තුක සත්කාර කරන්න, ඇත්තමයි." වලස් නිවුන්නු දෙන්නා අපිව ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැවට තල්ලු කරගෙන ගියා. නැව් තට්ටුව පිටුපස, වතුර විදින මලක් ඇති නාන තටාකයක් අසලට එයාලා අපිව දැමුවා. ලූක්ගේ එක එක වර්ගයේ මෝඩයෝ- සර්ප මිනිස්සු, ලයිස්ට්‍රිගෝනියානුවෝ, යුද සන්නාහවලින් සැරසුණු උප දෙවිවරු- දුසිමක් විතර එතැනට රැස් වුණේ අපිට 'ආගන්තුක සත්කාර' කරනවා බලන්නයි.

"ඉතින් එතකොට, රන් බැටළු ලොම් සළුව," ලූක් කල්පනා කළා. "ඒක කොහේ ද?" කඩු තුඩෙන් මගේ කමිසයට අනිමින්, ග්‍රෝවර්ගේ කලිසම ඔබා බලමින් එයා අපිව සෝදිසි කළා.

"හේයි!" ග්‍රෝවර් මොරදුන්නා. "මේක ඇතුළේ තියෙන්නේ ඇත්තම එළු ලොම්!"

"සමා වෙන්න, පරණ යාළුවා." ලූක් හිනා වුණා. "මට රන් සළුව දෙන්නකෝ, ඊට පස්සෙ මම ඔයාගේ, අහ්, චූටි පරිසර ගවේෂණය කරන්න යන්න දෙන්නම්."

"බිලා-හා-හා!" ග්‍රෝවර් අමනාපය පෑවා. "පරණ යාළුවෙක්ලු!"

"සමහරවිට ඔයාට මං කියපු දේ ඇහෙන්න නැතුව ඇති," ලූක්ගේ හඬ අනතුරුදායක ලෙස සන්සුන් වුණා. "රන්-බැටළු-ලොම්-සළුව-කොහේ ද?"

"මෙතන හොයලා වැඩක් නෑ," මම කිවුවා. මට තිබුණේ එයාට කිසිවක් නොකියා ඉන්නයි, ඒ වුණත් එයාගේ මූණටම ඇත්ත කියලා දාන්න මට ලොකු ආසාවක් ආවා. "අපි ඒක අපිට කලින් යැව්වා. ඔයා හැමදේම අනාගත්තා." ලූක්ගේ ඇස් දෙක හීනි වුණා. "ඔයා කියන්නෙ බොරු. ඔයාට බැහැ..." බිහිසුණු ඇත්ත තේරුම් යද්දී එයාගේ මුහුණ රතු වුණා. "ක්ලැරිස්?"

මම ඔළුව වැනුවා.

"ඔයා විශ්වාස කළා... ඔයා දුන්නා..."

"ඔව්."

"ආග්‍රියස්!"

වලස් යෝධයා ගැස්සුණා. "ඇ-ඇයි?"

"පහළට ගිහින් මගේ අශ්වයා ලෑස්ති කරනවා. ඒකව නැව් තට්ටුව උඩට අරන් එනවා. මම මියාමි එයාපෝර්ට් එකට පියාඹන්න ඕනෑ, ඉක්මනට."

"ඒත්, ලොක්කා-"

"කියපු දේ කරනවා!" ලූක් බෙරිහන් දුන්නා. "නැත්නම් මම ඔහේව ඩ්‍රැකන්ට කන්න දානවා!" තදින් කෙළ ගිල්ල වලස්-මිනිසා හෙමින් හෙමින් පඩිපෙළ බහින්න ගත්තා. ලූක් පෞරාණික ග්‍රීක භාෂාවෙන් දෙස්-දෙවොල් තියමින්, නාන තටාකය ඉදිරියේ ඇවිදින්න ගත්තා. එයා කොයිතරම් තදින් කඩු මිට මිරිකුවා ද කියනවා නම් එයාගේ ඇඟිලි කෙළවර සුදු පාටට හැරුණා. ලූක්ගේ ඉතිරි නාවිකයෝ ටික නොසන්සුන් වුණා. සමහරවිට, එයාලගේ ලොක්කා මේ තරම් සිහිය විකල් වෙලා ඉන්නවා එයාලා දකලා තියෙන්න නැතුව ඇති.

මම කල්පනා කරන්න පටන් ගත්තා... මට ලූක්ගේ කේන්තියෙන් ප්‍රයෝජන ගන්න පුළුවන් නම්; එයාට කතා කරන්න සලස්වලා, එයාගේ උම්තු සැලසුම් හැමදෙනාටම අහන්න සලස්වන්න පුළුවන් නම්...

මම නාන තටාකය දෙස බැලුවා, එහි වතුර මලෙන් ඉහළට විසිරුණු හිරිකඩ හරහා සැන්දෑ ඉර එළිය පෙරී ඇවිත් දේදුන්නක් මැවුණා. හදිසියේම මට අදහසක් පහළ වුණා.

"මෙච්චර කාලයක් ඔහේ කළේ අපිව සෙල්ලමකට ගත්ත එක," මම කිවුවා. "ඔහේට ඕනෑ වුණේ අපි ලවා රන් සළුව ගෙන්න ගන්න. එතකොට ඔහේට කරදර වෙන්න ඕනෑ නැතේ." ලූක් තරහෙන් රවා බැලුවා. "ඇත්තටම ඔව්, මෝඩයෝ! ඒත් ඔහේ ඔක්කොම අවුල් කළා!"

"ද්‍රෝහියා!" මගේ සාක්කුවේ තිබූ අන්තිම රන් ඩ්‍රච්මාව අතට ගත් මම එයින් ලූක්ට ගැහුවා. මම බලාපොරොත්තු වූ ලෙසටම, එයා පහසුවෙන් එය මග ඇරියා.

කාසිය දේදුනු පාට හිරිපොද තුළට පියෑඹුවා.

නිහඬව කරන යාඥා වලංගු වේවි කියලා ප්‍රාර්ථනා කළ මම මුළු හදවතින්ම යාඥා කළා: අහෝ දේවතාවියනි, මගේ පූජාව පිළිගන්න.

"ඔහේ අපි හැමෝවම රැවැට්ටුවා!" මම ලූක්ට මොරගැසුවා. "අර්ධ-ලෝහිත කඳවුරේ ඩයනයිසියස්-වත්!" ලූක්ට පිටුපසින් දිය උල්පත දිලිසෙන්න පටන් ගත්තා. ඒත් හැමදෙනාගේම අවධානය



මගේ දෙසට යොමු කරගන්න ඕනෑ නිසා මම රිප්ටයිඩ්ගේ කොපුව ගැලෙව්වා.

ලූක් මගේ දිහා අවඥාවෙන් බැලුවා. "මේක වීරකම්වලට වෙලාවක් නෙවෙයි, පර්සි. ඔය ඇඹිට්ටිල්ලං කඩුව පැත්තකට දානවා, නැත්නම් මට කල් අරින්නේ නැතුව දත්මම ඔහේව ඉවරයක් කරන්න වෙයි."

"තාලියාගේ ගහට වස දැම්මේ කවුද, ලූක්?"

"ඇත්තටම, මම තමයි," එයා දත් නියවා ගෙරෙව්වා. "මම කලිනුත් ඔහේට කිවුවා නේ. මං පාවිච්චි කළේ ටාටරස්වල ගැඹුරුම තැනින් ගෙනාව වැඩිමල් පොළොං විෂ."

"ඒකට කයිරොන්ගේ කිසිම සම්බන්ධයක් නැද්ද?"

"හා! එයා කවමදාකවත් එහෙම කරන්නෑ කියලා ඔයා දන්නවා නේ. ඒ නාකි මෝඩයට එච්චර දහිරියක් නෑ."

"ඔයා ඒකට කියන්නේ දහිරිය කියලද? ඔයාගේ යාළුවන්ට ද්‍රෝහි වෙන එකට? මුළු කඳවුරම අනතුරේ දාන එකට?" ලූක් කඩුව එසෙව්වා. "ඔයාට මේකෙන් බාගයක්වත් තේරෙන්නෙ නෑ. ඔයාට සළුව අරන් යන්න දෙන්නයි මම හිටියේ... මගේ වැඩේ ඉවර වුණාම."

ඒ කතාවෙන් මම පසුබට වුණා. මට රන් සළුව අරන් යන්න එයා ඉඩ දෙන්නේ ඇයි? එයා බොරු කියනවා වෙන්න ඇති. ඒත් එයාගේ අවධානය මගෙන් ගිලිහෙන්න ඉඩ අරින්න බැහැ.

"ඔයා ක්‍රෝනොස්ව සනීප කරන්නයි ලෑස්ති වුණේ," මම කිවුවා.

"ඔව්! රන් සළුවේ මායා බලයෙන් එයාගේ ප්‍රතිසංස්කරණය වෙන වේගය දහ ගුණයකින් විතර වැඩි වෙන්න තිබුණා. ඒත් ඔයා අපිව නැවැත්තුවා කියලා හිතන්නෙපා, පර්සි. ඔයා අපේ වේගය වුට්ටක් අඩු කළා විතරයි."

"ඒ කියන්නේ ඔයා ගහට වස දාලා, තාලියාට ද්‍රෝහි වෙලා, දෙවිවරු විනාශ කරන්න ක්‍රෝනොස්ට උදවු කරන්න අපිව පාවිච්චි කළා."

ලූක් දත්මිටි කෑවා. "ඔයා ඒක දන්නවා! ආයෙ ආයෙත් ඒ ගැන අහන්නේ මොකට ද?"

Scanned with CamScanner

"මොකද, අපේ ප්‍රේක්ෂකයන්ට ඒක ඔයාගේ කටින්ම අහන්න සලස්වන්න මට ඕනෑ."

"මොන ප්‍රේක්ෂකයො ද?"

ඒත් එක්කම එයාගේ ඇස් පටු වුණා. එයා පසුපස හැරී බලද්දී, එයාගේ පිරිවරත් ඒකම කළා. මහ හඬින් හීල්ලුව එයාලා පස්සෙන් පස්සට ගියා.

තටාකයට ඉහළින්, දේදුනු හිරිපොද අතරේ සැලෙමින් තිබුණේ භෝජන මණ්ඩපයට රැස් වූ ධයනයිසියස්, ටන්ටලස් ඇතුළු මුළු කඳවුරේම අයිරිස්-පණිවුඩ දර්ශනයක්. එයාලා විමතියෙන් ගොළු වී අප දෙස බලා සිටියා.

"හොඳයි," ධයනයිසියස් නීරස හඬින් කිවුවා, "ඒක කලින් සැලසුම් නොකළ විනෝද වැඩසටහනක්."

"මිස්ටර් ඩී, ඔයාට එයා කියපු දේවල් ඇහුණා නේද?" මම ඇසුවා. "ඔයාලා හැමෝටම ලූක්ගේ කතාව ඇහෙන්න ඇති. ගහට වස දාපු එක කයිරොන්ගේ වැරැද්දක් නෙවෙයි."

මිස්ටර් ඩී සුසුමක් හෙළුවා. "මටත් හිතෙන්නෙ එහෙම තමයි."

"ඔය අයිරිස්-මැසේජ් එක ප්‍රෝඩාවක් වෙන්න පුළුවන්," ටන්ටලස් යෝජනා කළා, ඒත් එයාගේ අවධානය වැඩි වශයෙන් යොමු වී තිබුණේ අත් දෙකින්ම අල්ලා ගැනීමට උත්සාහ කරමින් සිටි චීස් බර්ගරයටයි.

"මට නම් එහෙම හිතෙන්නෙ නෑ," ටන්ටලස්ව නුරුස්සන බැල්මක් හෙළමින් මිස්ටර් ඩී කිවුවා. "පෙනෙන හැටියට, මට කයිරොන්ව ක්‍රියාකාරකම් අධ්‍යක්ෂක විදිහට නැවත සේවයේ පිහිටුවන්න වෙනවා. තාකි අස්සයාගේ කාඩ් සෙල්ලම් නැතුව මම හරි පාළුවෙන් හිටියේ." ටන්ටලස් චීස් බර්ගරය ඩැහැගත්තා. මේ වතාවේ ඒක එයාගෙන් ඈතට පැනලා දිව්වේ නැහැ. එයා ඒක පිඟානෙන් ඉහළට ඔසවා, විස්මයෙන් බලා සිටියේ ඒක ලෝකයේ ලොකුම දියමන්තිය වගෙයි. "මං ඒක අල්ලගත්තා!" එයා කෙකර ගෑවා.

"අපිට තවදුරටත් ඔයාගේ සේවය උවමනා වෙන්නෙ නෑ, ටන්ටලස්," මිස්ටර් ඩී නිවේදනය කළා. එයින් ටන්ටලස් තිගැස්සුණා. "මොනවා? ඒත්-"



"ඔයාට දූත් ආපහු පාතාල ලෝකෙට යන්න පුළුවන්, ඔයාව සේවයෙන් අස් කළා."

"නෑ! ඒත්- එපා..!"

එයාව ධූමාරයකට දියවී යද්දී, ඇඟිලි අතර සිරවී තිබුණු චීස් බර්ගරය කට අසලට ගන්න එයා උත්සාහ කළා. ඒත් පරක්කු වැඩියි. එයා මුළුමනින්ම අතුරුදහන් වෙද්දී චීස් බර්ගරය ආපසු පිඟානටම වැටුණා. කඳවුරුකරුවෝ අතරේ ජය ඝෝෂාවක් පුපුරා ගියා.

ලූක් ක්‍රෝධයෙන් ගර්ජනා කළා. එයා වතුර මලට කඩුවෙන් කොටද්දී අයිරිස්-පණිවුඩය විසිරී ගියා. ඒත් එයින් විය යුතුව තිබුණු දේ සිදු වී හමාරයි.

මට, මං ගැනම සතුටක් දැනුණත්, ආපසු හැරුණු ලූක් මට හෙළූ බැල්මෙන් එය දියවී ගියා.

"ක්‍රෝනොස් කිවුවා හරි, පර්සි. ඔහේ විශ්වාසය තියන්න පුළුවන් ආයුධයක් නෙවෙයි. ඔහේගෙ තැනට වෙන කෙනෙක් පත් කරන්න ඕනෑ." එයා අදහස් කළ දේ මට නොතේරුණත්, ඒ ගැන කල්පනා කරන්න මට වෙලාවක් ලැබුණේ නැහැ. එයාගේ පිරිවරෙන් එකෙක් පිත්තල නළාවක් පිඹිද්දී, නැව් තට්ටුවේ දොරවල් වේගයෙන් ඇරුණා. දිලිසෙන තුඩු ඇති පිත්තල හෙලි අතින් ගත් තවත් යුද භටයෝ දුසිමක් විතර පිටව ඇවිත් අපිව වට කරගත්තා.

ලූක් මට හිනා වුණා. "ඔහේට පණ පිටින් නම් මේ බෝට්ටුවෙන් එළියට යන්න ලැබෙන්නේ නැහැ."

# 18

# පාටි පෝනි ආක්‍රමණය

"මත් එක්ක තනියම සටනට එනවා," මම ලූක්ට අභියෝග කළා. "ඔහේ මොකටද බය වෙන්නේ?"

ලූක් තොල වකුටු කළා. අපිව මරන්න සූදානමින් සිටි සොල්දාදුවෝ අණ ලැබෙන තුරු දෙපැත්තට වැනෙමින් සිටියා. එයාට කිසිවක් කියන්න ලැබෙන්න කලින් වලස්-මිනිහා, ආග්‍රියස් පියාඹන අශ්වයෙක් මෙහෙයවමින් නැව් තට්ටුවට කඩා වැදුණා. මට දකින්න ලැබුණු මුල්ම තනි කළු පෙගසස් වූ එයාට යෝධ කපුටු තටු වගේ පියාපත් තිබුණා. පෙගසස් වෙළඹ උද්දාමයෙන් හේෂාරාවය කළා. මට එයාගේ සිතුවිලි තේරුම් ගත හැකි වුණා. එයා ආග්‍රියස්ටත්, ලූක්ටත් බැණ වදින්න පාවිච්චි කළ තරක වචන කයිරොන්ට ඇහුණා නම් එයාගේ තොම්බ සැදල සබන් දාලා සෝදාවි.

"සර්!" පෙගසස්ගේ කුර පහරක් මග අරිමින් ආග්‍රියස් කතා කළා. "ඔයාගේ අශ්වයා ලෑස්තියි!" ලූක්ගේ ඇස් මගෙන් ඉවතට ගියේ නැහැ.

"මම ගිය ගිම්හානෙදිත් ඔයාට කිවුවනේ, පර්සි." එයා කිවුවා. "මාව සටනට පොලඹවා ගන්න ඔයාට බැහැ."

"ඔයා කොහොමහරි ඒක මග අරිනවා," මම කිවුවා. "ඔයා ලූටි කන විදිහ ඔයාගේ සෙබළු දකියි කියලා බය ද?" එයා පිරිවර දෙසට බැල්මක් හෙළද්දී, මගේ උගුලට හසු වූ බව එයා තේරුම් ගත්තා. දැන් පසු බැස්සොත් එයා දුර්වලයෙක් වගේ පෙනේවි. මාත් සමග සටනට ආවොත්, ක්ලැරිස්ව ලුහුබඳින්න තියෙන වටිනා කාලය නාස්ති වේවි.



මගේ පැත්තෙන්, මට බලාපොරොත්තු විය හැකි උපරිම දේ වුණේ එයාගේ හිත අවුල් කරලා, මගේ යාළුවන්ට පැනලා යන්න අවස්ථාවක් ලබා දීමයි. මෙතැනින් පැනගන්න සැලසුමක් හදන්න කාටහරි පුළුවන් නම්, ඒ ඇනබෙත්ටයි. අනෙක් අතට බලද්දී, ලූක් කඩු සටන්වලට කොයිතරම් දක්ෂයි ද කියලා මම දන සිටියා.

"මං ඉක්මනට ඔහේව ඉවරයක් කරලා දානවා," තීරණය කළ එයා කඩුව එළෙව්වා. බැක්බයිටර් මගේ කඩුවට වඩා තවත් අඩියක් විතර දිගින් වැඩියි. මිනිස් වානේ සහ දිව්‍යමය ලෝකඩ එකට වාත්තු කර සාදා තිබූ කඩු තලය දුෂ්ට අළු-රන් එළියකින් දිස්නය දුන්නා. එකට බඳින ලද ප්‍රතිවිරුද්ධ කාන්දම් දෙකක් වගේ කඩු තලය, එයට විරුද්ධවම අරගල කරනවා වගෙයි මට දැනුණේ. එය සෑදූ ආකාරය දැන නොසිටියත්, එය ඛේදවාචකයක් විය යුතු බව මට හැඟුණා. එය සාදද්දී කාටහරි මැරෙන්න සිද්ධ වෙන්න ඇති. ලූක්, එයාගේ සහචරයෙකුට උරුවම් කෑද්දී, එයා රවුම් ලෙදර්-ලෝකඩ පලිහක් ලූක්ට දුන්නා.

ලූක් දුෂ්ට ලෙස මට දත් නිලෙව්වා.

"ලූක්," ඇනබෙත් කතා කළා. "අඩු තරමේ එයාට පලිහක්වත් දෙන්න."

"කණගාටුයි, ඇනබෙත්," එයා කිවුවා. "මේ පාටියට උවමනා ආම්පන්න තම තමන්ම අරන් එන්න ඕනෑ."

පලිහ ඇත්තෙන්ම ප්‍රශ්නයක් වුණා. කඩුව පමණක් පාවිච්චි කරමින් දෑතින්ම සටන් කරද්දී ඔයාට වැඩි බලයක් ලැබුණත්, පලිහක් දරාගෙන එක් අතකින් පමණක් සටන් කරනවා නම් ඔයාට වැඩි ආරක්ෂාවකුත් පහසුවෙන් හැරෙන්න හැකියාවකුත් ලැබෙනවා. එතකොට වැඩි චලන ප්‍රමාණයක් කරන්නත්, විකල්ප වැඩි ගණනකට යන්නටත්, පහර දීමට වැඩි ක්‍රම ගණනකුත් ලැබෙනවා. මගේ හිත කයිරොන් වෙතට දිව්වා: මොන දේ සිදුවුණත් කඳවුරෙන් පිට නොයා, සටන් කරන්න ඉගෙන ගන්න කියලයි එයා මට උපදෙස් දුන්නේ. එයා කී දේ නෑහුවාට මම දැන් වන්දි ගෙවන්නයි යන්නේ. ලූක් ඉදිරියට පැන දුන් පළවෙනි පහරෙන්ම මම මැරෙන්න ගියා. මගේ අතට යටින් ගිය එයාගේ කඩුව මගේ කමිස අත දෙපළු කරමින්, ඉළ ඇට කූඩුවේ ගෑවීගෙන ගියා.

පස්සට පැන්න මම රිප්ටයිඩ්ගෙන් ප්‍රතිප්‍රහාර එල්ල කළා, ඒත් ලූක් මගේ කඩු තලය පලිහෙන් ඉවතට හැරෙව්වා.

Scanned with CamScanner

"අනේ, පර්සි," ලූක් දොස් කිවුවා. "ඔයාගේ පුහුණුව හොඳටම මදි නේ." නැවතත් ඉදිරියට පැන්න එයා මගේ ඔළුවට කඩුවෙන් කොටද්දී, ඒ පහර මග ඇරිය මම මුළු වැර යොදා එයාට ඇන්නත්, එයා පහසුවෙන් එය මග ඇරියා.

මගේ ඇලපතේ වූ කැපුම වේදනා දුන්නා. මගේ හදවත වේගයෙන් සැලුණා. ලූක් ආපසු පහර දෙන්න පනිද්දි, පිටුපස වූ තටාකයට පැන්න මට රැල්ලක් වගේ ශක්තිය සිරුර පුරා පැතිරෙනවා දැනුණා. වතුරෙන් පුනීලයක් වැනි සුළියක් සැදෙන සේ කැරකෙමින් වතුර යටට ගිය මම පතුලේ දී එය කෙලින්ම ලූක්ගේ මුහුණට පුපුරවා හැරියා.

ජල ධාරාවේ බලය එයාව බිමට සමතලා කරද්දි එයාට කිසිවක් නොපෙනී ගියා. ඊත් පහර දෙන්න මට අවස්ථාවක් ලැබෙන්න කලින් පැත්තකට පෙරළුණු ලූක් නැවතත් දෙපයින් සිටගත්තා.

මම එල්ල කරපු වේගවත් කඩු පහරින් එයාගේ පලිහේ කෙළවරක් කැපී වෙන් වුණත් එයින් ලූක් සැලුනේවත් නැහැ. පහළට නැමුණු එයා මගේ කකුලට ඇන්නා. හදිසියේම මගේ කලවය ගිනි ගන්නවා වගේ දැනුණු වේදනාව කොයි තරම් තදබල වුණා ද කියනවා නම් මම බිමට ඇද වැටුණා. මගේ කලිසමේ දණහිසට උඩින් පැළිලා. මට තුවාල වෙලා. ඊත් ඒක කොයිතරම් බරපතළ ද කියන්න මම දැන සිටියේ නැහැ. ලූක්ගේ කඩුව පහළට ඇදී එද්දි මම අකුළන පුටුවක් පිටුපසට පෙරළුණා. මම නැගිටින්න උත්සාහ කළත්, මගේ කකුලට බර දරාගන්න බැරි වුණා.

"පර්ර්ර්සි!" ග්‍රෝවර් මොරගෑවා.

ලූක්ගේ කඩුවෙන් අකුළන පුටුව දෙපළු වෙද්දි මම නැවතත් වෙනතකට පෙරළුණා. සිහිසුන් නොවී ඉන්න තදින් උත්සාහ කරමින් මම තටාකය දෙසට බඩගෑවා. මට එච්චර දුරක් යන්න ලැබෙන්නෙ නැහැ. ලූක් එය දැන සිටියා. හිනාවක් පාමින් එයා හෙමින් සීරුවේ ඉදිරියට ආවා. එයාගේ කඩු තුඩ රතු පාට වෙලා.

"මැරෙන්න කලින් ඔහේට එක දෙයක් දකින්න සලස්වන්න ඕනෑ, පර්සි." තවමත් ග්‍රෝවර්ව සහ ඇනබෙත්ව කර මුලින් අල්ලගෙන සිටි වලස්-මිනිහා, ඔරෙයස් දෙස එයා බැලුවා. "ඔයාට දැන් ඔයාගේ රෑ කෑම කන්න පුළුවන්."



"හී-හී! හී-හී!" වලස්-මිනිහා දත් විළිස්සාගෙන මගේ යාළුවන්ව උඩට එසෙව්වා. සියල්ල කණපිට හැරුණේ අන්න ඒ වෙලාවේදියි.

වූෂ්!

රතු පිහාටුවක් ඇමුණු ඊතලයක් ඔරෙයස්ගේ කටින් පිටට මතු වුණා. එයාගේ ලොම් පිරුණු මුහුණ පුරා විමතියක් පැතිරෙද්දි, එයා නැව් තට්ටුව මතට කඩා වැටුණා.

"මල්ලී!" ආග්‍රියස් විලාප දුන්නා. එයාගේ අතින් පෙගසස්ගේ තෝන් ලණුව ලිහිල් වෙද්දි, අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් කළු වෙළඹ ආග්‍රියස්ගේ ඔළුවට පයින් ගසා, මියාමි බොක්කට ඉහළ අහසට පියඹා ගියා.

තත්පරයකින් පංගුවක් ගතවන තුරු කිසිවක් කරගත නොහැකි තරමට පුදුම වී සිටි ලූක්ගේ සෙබළු නිවුන්නු දෙන්නා දුමකට විසිරී යන දෙස බලා සිටියා.

ඊත් එක්කම වියරු රණ ඝෝෂා හා ලෝහ මත කුර ගැටෙන හඬින් වාතය පිරුණා. ප්‍රධාන පඩිපෙළ අසලින් නරාශ්වයෝ දුසිමක් විතර එතැනට පැන්නා.

"පෝනියෝ!" ටයිසන් සතුටින් උඩ පැන්නා.

දකින්න ලැබුණු සියල්ල එකවර තේරුම් ගන්න මගේ මොළයට අපහසු වුණා. ඒ සෙනග අතරේ කයිරොනුත් සිටියා. ඊත් එයාගේ නෑදෑයෝ නම් එයාට වඩා හාත්පසින්ම වෙනස්. එතැන කළු අරාබි අශ්ව සිරුරු ඇති නරාශ්වයෝත්, රන්වන් ලොම් වැස්මක් ඇති අයත්, පින්තාරු කළා වගේ තැඹිලි-සුදු පැල්ලම් ඇති අයත් සිටියා. එයාලා සමහරෙක් හැඳ සිටි දීප්තිමත් ටී-ෂර්ට්වල 'පාටි-පෝනියෝ: දකුණු ෆ්ලොරිඩා පිළ' මුද්‍රණය කර තිබුණා. එයාලා දුනු, බේස්බෝල් පිති වගේම තීන්ත විදින තුවක්කුත් අත දරාගෙන සිටියා. රතු ඉන්දියානු රණශූරයෙක් වගේ මුහුණ පින්තාරු කරගෙන සිටි එක් අයෙක් අංක එක පෙන්වන තැඹිලි පාට ස්ටයිරොෆෝම් අතක් වනමින් සිටියා. උඩුකය නිරුවත්ව සිටි තවත් අයෙක් මුළු ඇඟේම කොළ පාට තවරාගෙන සිටියා. තවත් කෙනෙක් ඇස් බෝල දෙකක් දෙපසින් වැනෙන ගුග්ලි-ඇස් කණ්ණාඩි දෙකක් සහ සෝඩා කෑන් ඇමුණු බේස්බෝල් කැප් එකක් පැළඳගෙන සිටියා. එයාලා කොයි තරම් රෞද්‍රව සහ වර්ණවත්ව නැව් තට්ටුවට කඩා වැදුණා ද කියනවා නම් ලූක් පවා මොහොතකට ගල් ගැසුණා. එයාලා ඇවිත් තිබුණේ විනෝද වෙන්න ද, නැත්නම්

පහර දෙන්න ද, මට හිතාගන්න බැරි වුණා. පෙනුණු විදිහට ඒ දෙකටම වගෙයි. හට කණ්ඩායම් රැස් කරන්න ලූක් කඩුව ඔසවද්දීම එක නරාශ්වයෙක් ලෙදර් බොක්සිං අත්වැසුමක් කෙළවර සවි කළ ඊතලයක් එයාට විද්දා. ඒක ලූක්ගේ මුහුණේ වැදුණු වේගයට එයාව තටාකයට ඇද වැටුණා.

එයාගේ යුද හටයෝ ඔළුව හැරුණු අත දිවුවා. එයාලට දොස් කියන්නත් බැහැ. කුලප්පු වුණ අශ්වයෙකුට මුහුණ දෙන එකම බය හිතෙන වැඩක්. ඒ මදිවට සෝඩා කෑන් අමුණපු තොප්පි දාගෙන, දුන්නක් අතින් අරන් එන නරාශ්වයෙකුට මුහුණ දෙන්න වුණොත් නිර්භීතම රණශූරයෙක් වුණත් පැනලා දුවනවා.

"එනවා දෙන්නම්!" එක පාටි පෝනියෙක් මොරදුන්නා.

එයාලා තීන්ත විදින තුවක්කු මුදා හැරියා. ලූක්ගේ රණශූරයෝ දෙසට විසිරුණු නිල් සහ කහ රැල්ලක් එයාලව අන්ධ කරමින් ඉස් මුදුනේ සිට දෙපතුලටම පාට කළා. දුවන්න උත්සාහ කළත් එයාලට සිද්ධ වුණේ ලිස්සා ඇද වැටෙන්නයි.

ඇනබෙත් සහ ග්‍රෝවර් අසලට පිම්මේ ගිය කයිරොන්, ඒ දෙන්නව පිළිවෙළට නැව් තට්ටුවෙන් උදුරාගෙන, එයාගේ පිට මත තබාගත්තා.

මම නැගී සිටින්න උත්සාහ කළත්, මගේ තුවාල වුණ කකුල තවමත් ගිනි ගන්නවා වගෙයි දැනුණේ. ලූක් තටාකයෙන් එළියට බඩගාගෙන ආවා.

"ගහපල්ලා, මෝඩයිනේ," එයා හට කණ්ඩායම්වලට නියෝග කළා. නැව් තට්ටුවට පහළින් කොතැනදෝ ලොකු අනතුරු ඇඟවීමේ සීනුවක් නාද වුණා.

ඕනෑම තත්පරයක අපිව ලූක්ගේ සේනාවෙන් යටවෙන බව මම දන සිටියා. දනටමත්, එයාගේ හටයෝ පුදුමයෙන් මිදිලා කඩු සහ හෙලි අරන් නරාශ්වයෝ දෙසට එන්න පටන්ගෙන තිබුණා. එයින් දුසිම බාගයකට විතර කනේ පාරවල් ගැසූ ටයිසන් එයාලව මුර වැටෙන් එහා මියාමි බොක්කට විසි කළා. ඒත් යුද හටයෝ වැඩි වැඩියෙන් පඩිපෙළ ඉහළට එන්න ගත්තා.

"පසු බහිමු, සහෝදරයිනේ!" කයිරොන් කිවුවා.



"ඔහේට මෙතැනින් පැන ගන්න ලැබෙන්නෑ, අශ්ව-මිනිහෝ!" ලූක් කෑගැසුවා. එයා කඩුව එසෙව්වත්, මුහුණ පුරවා වැදුණු තවත් බොක්සිං අත්වැසුම් ඊතල පහරකට එයාව අකුළන පුටුවක ඉන්දවුණා.

රන්වන් පැල්මිනෝ නරාශ්වයෙක් මාව ඔසවා එයාගේ පිට මතින් තියාගත්තා. "මචෝ, ඔයාගේ තඩි යාළුවත් ගමු!"

"ටයිසන්!" මම මොරගැසුවා. "ඉක්මනට එන්න!"

එකට ගැට ගහන්න ගිය සෙබළු දෙන්නව බිම දාලා ටයිසන් අපේ පස්සෙන් දුවගෙන ආවා. එයා නරාශ්වයාගේ පිටට පැන්නා.

"අම්මෝ!" ටයිසන්ගේ බරට දෙකට නැමෙන්න ගිය නරාශ්වයා මැසිවිලි නැගුවා. "ඔයාට කෑම අඩු කරන්න එහෙම කවදාවත් හිතිලා නැද්ද, ආ?"

ලූක්ගේ සෙබළු පහර දෙන්න සූදානම් වුණා. ඒත් එයාලා පහර දෙන්න කලින් නැව් තට්ටුව කෙළවරට හැල්මේ ගිය නරාශ්වයෝ මුර වැටට උඩින් තට්ටු දහයක් පහළ පොළොවට පැන්නේ කඩුල්ලක් උඩින් පනිනවා වගෙයි. අපි මැරෙන්න යන බව මට නම් සහතික වුණා. තොටුපොළ දෙසට අපිව වේගයෙන් ඇද වැටුණත්, යන්තමින් දැනෙන-නොදැනෙන තරමට ගැස්සෙමින් ගල්තාර උඩට වැටුණු නරාශ්වයෝ මියාමි වීදි හරහා එක පිම්මට දුවන්න ගත්තේ ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැවට ඇනුම්පද කියමිනුයි.

නරාශ්වයින් වේගය වැඩි කරද්දි වීදි සහ ගොඩනැගිලි බොඳ වී පෙනෙන්න පටන් ගත්තා. ඒක දැනුණේ හරියට අවකාශය එකට ඇකිළෙනවා වගෙයි- හරියට නරාශ්වයෙකුගේ එක පියවරකින් අපිව සැතපුම් ගාණක් දුරට යනවා වගෙයි. නොබෝ වේලාවකින්ම, අපිට පිටුපසින් නගරය නොපෙනී ගියා. උස් තණ වැවුණු වගුරු බිම්, පොකුණු සහ කුරු ගස් පසුකරගෙන අපි හැල්මේ දිවුවා. අන්තිමේදී, රූපවාහිනී, කුඩා විලක් අසබඩ වූ ට්‍රේලර් ගාලක අපි නැවතුණා. රූපවාහිනී, කුඩා ශීතකරණ සහ මදුරු දැල්වලින් සැරසුණු ඒවා අශ්වයෝ අදින ට්‍රේලරයි. අපි ගිහින් තිබුණේ නරාශ්ව කඳවුරකටයි.

"මචෝ!" බඩු බාන අතරේ පාටි පෝනියා කිවුවා. "ඔයාලා අර වලස්-පොරව දැක්ක ද? එයා හිටියේ නිකන්: 'වාව්, මගේ කටේ ඊතලයක් ඇවිල්ලා!' කියන්න වගෙයි."

ගුග්ලි-ඇස් කණ්ණාඩි දමාගෙන සිටි නරාශ්වයා මහ හඬින් හිනාවුණා. "ඒක නම් සුපිරි!" එකිනෙකා වෙතට වේගයෙන් දිවගිය

නරාශ්වයෝ දෙන්නා මුළු වෙර යොදා ඔළු හප්පගත්තා. ඊට පස්සේ දෙපසට විසිරී ගිය ඒ දෙන්නගේ මුහුණුවල දකින්න ලැබුණේ පිස්සු හිනාවක්.

කයිරොන් සුසුමක් හෙළුවා. එයා පික්නික් බ්ලැන්කෙට්ටුවක් මත සිටි මගේ අසලින්ම ඇනබෙත්වත් ග්‍රෝවර්වත් බැස්සුවා. "මගේ නෑදෑයෝ ඔය විදිහට ඔළුගෙඩි හප්පගන්නෙ නැත්නම් මම කැමතියි. එයාලට නාස්ති කරන්න තරම් මොළේ වැඩිපුර නැහැ."

"කයිරොන්," මම කතා කළේ එයා මෙතැන හිදීම ගැන තවමත් පුදුමයෙන්. "ඔයා අපිව බේරගත්තා." එයා මට වියළි හිනාවක් පෑවා. "හොඳයි ඉතින්, ඔයාලට මැරෙන්න ඉඩ අරින්න මට බෑනේ, විශේෂයෙන්ම ඔයා මගේ නමත් සුද්ධ කරාට පස්සේ."

"ඒත් අපි හිටිය තැන ඔයා හොයාගත්තෙ කොහොමද?" ඇනබෙත් ඇහුවා.

"දියුණු සැලසුම්වලින්, මගෙ දරුවෝ. රාක්ෂ සයුරෙන් පණපිටින් පිට වෙන්න ලැබුණොත් ඔයාලා මියාමි වෙරළට ගොඩ ගහාවි කියලා මම හිතුවා. සාමාන්‍යයෙන් අමුතු දේවල් ඔක්කොම වගේ ගොඩ ගහන්නේ මියාමි වැල්ලට නේ."

"අනේ, ඇත්ත ද," ග්‍රෝවර් කෙඳිරුවා.

"නෑ, නෑ," කයිරොන් කිවුවා. "මම අදහස් කළේ ඒක නෙවෙයි... ඔන්, කමක් නෑ. ඔයාව දකින්න ලැබුණට මට හරිම සතුටුයි, මගේ සැටර් කොල්ලෝ. වැදගත්ම කාරණේ තමයි, මට පර්සිගේ අයිරිස්-මැසේජ් එකට හොරෙන් කන් දීලා, සංඥා එන තැන හොයාගන්න ලැබුණා. අයිරිසුයි මමයි සියවස් ගාණක ඉඳන් යාළුවෝ. මේ පැත්තේ වැදගත් පණිවුඩ හුවමාරුවක් වුණොත් මට දන්වන්න කියලා මම එයාට කියලා තිබුණා. ඊට පස්සේ ඔයාට උදවු කරන්න මගේ නෑදෑයෝ ටික එකතු කරගන්න වුට්ටක්වත් අමාරු වුණේ නැහැ. ඔයාට පේනවත් වගේ, උවමනා වෙලාවට සෑහෙන වේගයෙන් ගමන් යන්න නරාශ්වයින්ට පුළුවන්. අපිට දුර දැනෙන්නේ මිනිස්සුන්ට දැනෙනවට වඩා වෙනස්වට."

කඳවුරු ගිනිමැලයෙන් එහා, පාටි පෝනියෝ තුන්දෙනෙක් ටයිසන්ට තීන්ත විදින තුවක්කුවක් ක්‍රියා කරවන්න උගන්වන දෙස මම බැලුවා. එයාලට වෙන්න යන දේ ගැන තේරුමක් තියෙනව නම් හොඳයි කියලා මට හිතුණා.



"එතකොට දැන්?" මම කයිරොන්ගෙන් ඇහුවා. "අපි නිකංම යුක්ව යන්න දෙනව ද? එයා නැවේ ක්‍රෝනොස්ව තියාගෙන ඉන්නවා. අඩු තරමේ එයාගේ කෑලි ටිකක් හරි."

කයිරොන්, එයාගේ ඉදිරි කකුල් පරිස්සමෙන් නමමින් දණ ගසාගත්තා. ඉණ පටියේ තිබුණු බෙහෙත් මල්ල විවෘත කළ එයා මගේ තුවාලවලට ප්‍රතිකාර කරන්න පටන් ගත්තා. "මට හිතෙන්නෙ, පර්සි, අද දවස කාටවත්ම දිනුමක් නැති දවසක්. ඒ නැව අල්ලගන්න අපිට හිටිය පිරිස මදි වුණා. අපිව ලුහුබඳින්න තරම් ලූක් සංවිධානය වෙලා හිටියෙත් නැහැ. ඉතින් කවුරුවත් දිනුවේ නැහැ."

"ඒත් රන් සළුව අපි ළඟ!" ඇනබෙත් කිවුවා. "ඒක කඳවුරට අරගෙන ක්ලැරිස් දැනටමත් මග යනවා."

කයිරොන් ඔළුව වැනුවා, ඒත් එයා තවමත් නොසන්සුන් වගෙයි. "ඔයාලා තමයි හැබෑම වීරයෝ. පර්සි ලැස්ති වුණ ගමන්ම ඔයාලා අර්ධ-ලෝහිත කන්දට ආපහු යන්න ඕනෑ. නරාශ්වයෝ ඔයාලව අරගෙන යාවි."

"ඔයත් එනවා නේ?" මම ඇහුවා.

"අහ්, ඔව්, පර්සි. ගෙදර යන්න ලැබෙන එක හරිම සහනයක් වෙයි. මගේ සහෝදරයෝ ඩීන් මාර්ටින්ගේ සංගීතය අගය කරන අය නෙවෙයි. ඇරත්, මට මිස්ටර් ඩී එක්ක කතා කරන්න දේවල් තියෙනවා. ගිම්හානයේ ඉතිරි කාලයට සැලසුම් හදන්න ඕනෑ. පුහුණු කිරීම ගොඩකුත් කරන්න තියෙනවා. ඒ වගේම මට බලන්න ඕනෑ... රන් සළුව ගැන මගේ හිතේ තියෙන්නේ ලොකු කුතුහලයක්." එයා අදහස් කළ දේ මට හරියටම නොතේරුණත්, එයින් ලූක් කියූ දෙයක් මගේ මතකයට නැගුණා: ඔයාට සළුව අරන් යන්න දෙන්නයි මම හිටියේ... මගේ වැඩේ ඉවර වුණාම.

ඒක එයා කටට ආ පළියට කියපු බොරුවක් ද? සාමාන්‍යයෙන් ක්‍රෝනොස්ගේ සැලසුමක් ඇතුළේ තවත් සැලසුමක් තියෙන බව මට ඉගෙන ගන්න ලැබී තිබුණා. ටයිටන් රජාට 'කපටි තැනැත්තා' කියන්නේ නිකං නෙවෙයි නේ. තමන්ට උවමනා දේවල් එයා මිනිස්සු ලවා කරවාගන්නේ එයාගේ සැබෑ අරමුණ කාටවත් නොතේරෙන්නයි.

කඳවුරු ගිනිමැලයට එපිටින් සිටි ටයිසන්, එයාගේ තීන්ත විදින තුවක්කුවෙන් විද්දා. එයින් නිකුත් වූ නිල් පාට ධාරාව එක් නරාශ්වයෙකුගේ වැදුණේ එයාව විලට තල්ලු කරමින්. වගුරු මඩවලින්නුත්

ගිල් ක්‍රිස්ටෝෆර්සන් නැවී ගොඩ ආ කටරන්ඩියා ගිනාවක් පාමින් දැනෙම මහපැටිම්ලි ඔහුව පටිසනට සතුට කළ කළා.

"ඇතමෙන්," කයිරොන් කතා කළා. "මගේදා, ඔයා ලෙව්ව් එක්ක ගිහිල්ලා රෙමිකපුයි මගේ නැගෝ ටිකයි. අන්, තවත් නරක දේවල් පටිසනකට උනන්ට යන්න කලින් ආම්මිස් කරගත්තොත් හොඳ නැද්ද?"

ඇතමෙන් එයාගේ ඇස් දෙස බැලුවා. ඒ දෙන්නා අතරේ මොකක්දෝ අවබෝධතාවයක් හුවමාරු වුණා.

"හොඳයි, කයිරොන්," ඇතමෙන් කිව්වා. "එනවා යන්න, එව කොල්ලෝ."

"එත් මම බීන්න විදිහටට ආස නැතේ."

"නෑ, ඔයා ආසයි." ලෙව්ව්ව කුරවලින් සිටවූ ඇතමෙන් එයාව කළුවර මිනිමැලය දෙසට ඇදගෙන ගියා. කයිරොන් මගේ කකුලට වෙවම් දමා අවසන් කළා. "පර්සි, මෙහෙට එන අතරමගදී ඇතමෙනුයි මමයි ටිකක් කතා කළා. අනාවැකිය ගැන."

අයියෝ, මම හිතුවා.

"ඒකට ඇතමෙන්ට දොස් කියන්න එපා," මම කිව්වා. "ඒක කියන්න කියලා මමයි එයාට බල කළේ." එයාගේ ඇස්වල කොපිස්සුමක් දැල්වුණා. එයා මාව දඩුවමදේ නොවී කියලා මට හිතුණත්, විකසින් එයාගේ බැල්ම දුක්බර වුණා. "මට හිතෙන්නේ ඒක රහසක් විදිහට සඳහටම රැකගන්න මට බැරි වෙයි."

"එහෙනම්, අනාවැකියේ ඉන්න කෙනා මම ද?"

කයිරොන් ඉසිට වෙරම්වට මල්ලට රඹුවා. "මමත් ඒක දන්නෑ, පර්සි. ඔයාට තවම දාසයක් වුණේ නැහැ. දැනට අපිට කරන්න තියෙන්නේ පුළුවන් උපරිමෙන් ඔයාව පුහුණු කරවලා, අනාගතය ඉරණමට බාර දීලා බලාගෙන ඉන්න විතරයි."

ඉරණම. ඒ නාම නැගූ ඇන්දෙනා ගැන මම සැහෙන කාලෙකින් හිතලා තිබුණේ නැහැ. එත් කයිරොන් එයාලව මතක් කළ හැටියෙම, මගේ පරණ මතකයක් ඇවිස්සුණා.

"ඒක තමයි අරකේ තේරුම," මම කිව්වා.

කයිරොන් නළල රැලි කරගත්තා. "මොකක් තේරුම ද?"



"මිය ගිහිනෙතයේ ඉරණම මට පෙන්වපු කොටිමිනිස්සු දී, එයාලා කාගෙදෝ ජීවිත නෙත්ද කපනවා මම දැක්කා. මං හිතුවේ ඒකේ අදහස මම ඒ කාලෙම මැරෙන්න යනවා කියලා. එත් ඒක ටිටිට වඩා නරකයි. ඒකයි ඔයාගේ අනාවැකියයි අතරේ සම්බන්ධයක් තියෙනවා වෙයි. එයාලා කාන්තර කියපු මරණය- ඒක සිද්ධ වෙන්නේ මට දිවුරපු දාසය පිරුණම."

කයිරොන්ගේ වලිගය කණ අතරේ කලබලෙන් සැලුණා. "මගේ කොල්ලෝ, ඔයාට ඒ ගැන සහතික වෙන්න බැහැ. අනාවැකියේ කියන්නේ ඔයා ගැන ද කියලවත් අපි දන්නේ නැ."

"එත් ලොකු කුන්කට්ටුවේ වෙන අර්ධ-දේවිත ළමයෙක් නැතේ."

"ඒක නම් අපි දන්නවා."

"ඒ මදිවට ක්‍රෝනොස් හෙමින් හෙමින් නැගිටිනවා. එයා ඔලිම්පස් කන්ද විනාශ කරන්න යන්නේ."

"එයා උත්සාහ කරාවී," කයිරොන් එකඟ වුණා. "අපි එයාව නැවැත්තුවේ නැත්නම් එයා එත් එක්කම බටහිර ශිෂ්ටාචාරයක් විනාශ කරාවී. එත් අපි එයාව නවත්තනවා. ඒ සටනේදී ඔයා තනි වෙන්නෙ නෑ."

මගේ හිත හදන්න එයා උත්සාහ කරන බව මම දන හිටියා. ඒ වුණත් ඇතමෙන් කියා තිබුණු දෙයක් මගේ සිහියට නැඟුණා. අන්තිමේ දී ඒක එක වීරයෙකුගේ අතට එවී. එයා බටහිර ශිෂ්ටාචාරය බේරාගන්න හෝ විනාශ කරන්න තීරණයක් ගනීවී. ඉරණම මට කළේ ඒ ගැන අනතුරු ඇඟවීමක් බව මට විශ්වාස වුණා. මට හෝ මගේ මිත්‍රයෙකුට මොකක්හරි භයානක දෙයක් සිදුවේවි.

"මම තවම ළමයෙක් නේ, කයිරොන්," මම දුකල හඬින් කිව්වා. "ක්‍රෝනොස් වගේ කෙනෙක්ට විරුද්ධව එක ලොව්ට වීරයෙක්ගෙන් ඇති වැඩේ මොකක් ද?"

කයිරොන්ගේ මුහුණට හිනාවක් මතු වුණා. "එක ලොව්ට වීරයෙක්ගෙන් ඇති වැඩේ මොකක් ද? කාගෙවත් උදවුවක් නැතිව සිවිල් යුද්ධයේ පෙරළියක් කරන්න විකකට කලින්, ජෝශුවා ලෝරන්ස් චැම්බර්ලේන්ත් මාත් එක්ක ඔය වගේම කතාවක් කිව්වා."

ඊ කොපුවෙන් ඊතලයක් පිටට ගත් එයා එහි තියුණු තුඩ හිනිමැලයේ ආලෝකය දෙසට හැරවූවා.

"දිව්‍යමය ලෝකඩ, පර්සි. අමරණීය අයගේ ආයුධයක්, මේකෙන් මනුෂ්‍යයෙක්ට විද්දොත් මොනවා වෙයි ද?"

"මුකුත් නැහැ," මම කිවුවා. "ඒක එයාට කිසිම තුවාලයක් නොකර විනිවිද යාවි."

"අන්න හරි," එයා කිවුවා. "මනුෂ්‍ය වර්ගයා ඉන්නේ අමරණීය අය ඉන්න මට්ටමේ නෙවෙයි. අපේ ආයුධවලින් එයාලට හානියක් කරන්න බැහැ. ඒත් ඔයා, පර්සි- ඔයාගේ කොටසක් දිව්‍ය, කොටසක් මනුෂ්‍ය. ඔයා මේ ලෝක දෙකේම ජීවත් වෙනවා. මේ දෙකෙන්ම ඔයාට හානියක් වෙන්න පුළුවන් වගේම, මේ දෙකටම බලපෑම් කරන්නත් ඔයාට පුළුවන්. අන්න ඒ නිසයි වීරයෝ ගොඩක් විශේෂ අය වෙන්නේ. සදාකාලික රාජධානියට මනුෂ්‍යත්වයේ බලාපොරොත්තු ගෙනයන්නේ ඔයාලයි. රාක්ෂයෝ කවදාවත් මැරෙන්නේ නැහැ. ශිෂ්ටාචාරය යට හැම වෙලාවෙම බුබුළු දමමින් තියෙන ව්‍යාකූලත්වයෙන් සහ ම්ලේච්ඡත්වයෙන්- ඒ කියන්නේ ක්‍රෝනොස්ව වඩාත් ශක්තිමත් කරවන දේවල්වලින් එයාලා ආයෙමත් ඉපදෙනවා. එයාලව නැවත නැවතත් පරාද කරමින්, දිනන්න නොදී වළක්වලා තියාගන්න ඕනෑ. වීරයෝ බිහිවෙලා තියෙන්නේ අන්න ඒ අරගලයටයි. මනුෂ්‍යත්වය ජය ගත යුතුම යුද්ධවලට හැම පරම්පරාවකම ඔයාලා සටන් කරනවා, ඔයාට තේරෙනව ද?"

"මං... මං දන්නෑ."

"ඔයා උත්සාහ කරන්නම ඕනෑ, පර්සි. මොකද, අනාවැකියේ කියවෙන දරුවා ඔයා වුණත්, නැතත්, ක්‍රෝනොස් හිතන්නේ ඒ ඔයා කියලා. අදින් පස්සේ, ඔයාව එයාගේ පැත්තට හරවගන්න තිබුණු බලාපොරොත්තුව එයා අත් ඇරලා දාවි. ඔයා දන්නව නේ, එයා මෙච්චර කාලයක් ඔයාව නොමරා හිටියේ ඒ හේතුව නිසා. එයාට ඔයාව පාවිච්චි කරන්න බැරි බව සහතික වුණ හැටියෙම එයා ඔයාව විනාශ කරලා දායි."

"ඔයා කතා කරන්නේ හරියට එයාව දන්නවා වගෙයි නේ."

කයිරොන් තොල් තද කරගත්තා. "ඇත්තටම මම එයාව දන්නවා."



මම එයා දිහා පුදුමයෙන් බලා සිටියා. සමහර වෙලාවට කයිරොන්ට කොච්චර වයසයිද කියන එක මට අමතක වෙනවා. "ඒ නිසා ද ගහට වස දාපු එකට මිස්ටර් ඩී ඔයාට දොස් කිවුවේ? සමහරු ඔයාව විශ්වාස කරන්නේ නැහැ කිවුවේ?"

"ඇත්තටම."

"ඒත්, කයිරොන්... මං කියන්නේ, හිතන්නකෝ! ඔයා කවදාවත් ක්‍රෝනොස්ගේ පැත්ත අරන් කඳවුරට ද්‍රෝහි වෙයි කියලා එයාලා හිතන්නේ ඇයි?"

කයිරොන්ගේ දුඹුරු පාට ඇස් අවුරුදු දහස් ගාණක දුක් දොම්නස්වලින් පිරී තිබුණා. "පර්සි, ඔයාගේ පුහුණුව මතක් කරගන්න. පුරාණ ප්‍රවාදවලට ඔයා ඉගෙන ගත්ත ඒවා මතක් කරගන්න. ටයිටන් රජාට මගේ තියෙන සම්බන්ධය මොකක් ද?"

මම මතක් කරන්න උත්සාහ කළත්, මට තිබුණේ කලවම් අච්චාරුවක් වගේ පුරාණ දේවකතා දැනුමක්. දැනටත්, ඒවා කොයිතරම් සැබෑවක් වුණත්, මගේ ජීවිතයට ඒවා ගොඩාක් වැදගත් වුණත්, ඒ නම්-ගම් හරියට මතක තියාගන්න මට අමාරු වුණා. මම ඔළුව හෙල්ලුවා. "ඔයා, අහ්, ක්‍රෝනොස්ට ණයක්වත් වෙලා තියෙනව ද? එයා ඔයාගේ ජීවිතේ බේරගත්ත ද?"

"පර්සි," කයිරොන් කතා කරද්දී එයාගේ කටහඬ අසාමාන්‍ය ලෙස මෘදු වුණා. "ටයිටන් ක්‍රෝනොස් කියන්නේ මගේ තාත්තා."

## 19

# නොසිතූ ලෙස අවසන් වූ කරත්ත තරගය

තරාශ්වයින්ගේ ධාවන හැකියාවට පින් සිද්ධ වෙන්න, ක්ලැරිස් එක්කම වගේ අපිත් ලෝන්ග් අයිලන්ඩ්වලට ළඟා වුණා. මම කයිරොන්ගේ පිටේ නැග ගියත්, අපි අතරේ වැඩි කතාබහක් සිදුවුණේ නැහැ- විශේෂයෙන්ම ක්‍රෝනොස් ගැන. ඒක මට කියන්න කයිරොන්ට සෑහෙන අමාරු වෙන්න ඇති. ඉතින් තවත් ප්‍රශ්න අහලා එයාට රිදවන්න මට ඕනෑ වුණේ නැහැ. මං කියන්නේ, මට නරක දෙමව්පියෝ ඕනෑ තරම් මුණගැහිලා තියෙනවා. ඒත් ක්‍රෝනොස්, බටහිර ශිෂ්ටාචාරය විනාශ කරන්න දඟලන දුෂ්ට ටයිටන් රජා? ඉස්කෝලේ ගුරු-දෙගුරු හමුවකට ආරාධනා කරන්න වටින තාත්තා කෙනෙක් නෙවෙයි.

අපි කඳවුරට ගියාට පස්සේ, තරාශ්වයෝ ආසාවෙන් බලා සිටියේ ඩයනයිසියස්ව මුණගැහෙන්නයි. එයා පිස්සු පාටි දමන බව එයාලට අහන්න ලැබී තිබුණා. ඒත් එයාලගේ බලාපොරොත්තු සුන් වුණා. මුළු කඳවුරම අර්ධ-ලෝහිත කඳු මුදුනට රැස්ව සිටි වෙලාවේ වයින්වලට අධිපති දෙවියා හිටියේ සතුට සමරන මුහුණුවරකින් නෙවෙයි. කඳවුරේ අය දුෂ්කර සති දෙකක් ගතකර තිබුණා. ඩ්‍රැකෝ අයොනියස් කෙනෙකුගේ ප්‍රහාරයකින් (මට තේරුම් ගත හැකි වුණු තරමට, ඒ ලතින් නමේ තේරුම 'බඩු මුට්ටු-පුපුරුවන-හුස්ම හෙළන-ලොකුම ලොකු කටුස්සා') කලා ශිල්ප කැබිනය දැවී අළු වෙලා. තුවාල ලැබූ අයගෙන් මහ ගෙදර කාමර පිරී ඉතිරෙමින් තිබුණා. දක්ෂම වෙදුන් වූ ඇපලෝ කැබිනයේ ළමයි ප්‍රථමාධාර දෙමින් අතිකාල සේවා



කරමින් සිටියා. අපි තාලියාගේ ගහ වටා රැස් වෙද්දී හැමෝගෙම මුහුණුවල දකින්න ලැබුණේ මහන්සියෙන් හෙම්බත් වූ පෙනුමක්.

ක්ලැරිස් පහළම අත්තේ රන් බැටළු ලොම් සළුව පැළඳූ මොහොතේම හද එළිය වඩාත් දීප්තිමත් වෙලා, පරිසරය වසා සිටි අළු පාට ගලා යන රිදී පාටට හැරෙනවා වගේ පෙනෙන්න ගත්තා. සීතල සුළඟක් අතු රිකිලි සොලවමින් තණගොල්ලේ රැලිති නංවාගෙන දෙණිබිම පුරා පැතිරුණා. හැමදේම වඩාත් තියුණු ලෙසින් දැනෙන්න වුණා- පහළ කැලයේ දිලිසුණු කලාමැදිරි එළි, ස්ට්‍රෝබෙරි යායේ සුවඳ, වෙරළේ රළ වදින හඬ.

ටිකෙන් ටික, පයින් ගහේ ඉඳිකටු වැනි පත්‍ර දුඹුරු පාටින් කොළ පාටට හැරෙන්න ගත්තා. හැමදෙනාම ප්‍රීති ඝෝෂා කළා. මන්දගාමීව සිදුවුණත්, එය සිදුවෙමින් පැවතුණු බවට කිසිම සැකයක් නැහැ- ගහට කාන්දු වූ මායා බලය වස පිට කරමින්, අලුත් බලයකින් පුරවමින් ගහ පුරා ගලා ගියා.

රන් සළුව ආරක්ෂා කිරීමට සුදුසු රාක්ෂයෙක් සොයාගන්නා තුරු විසි හතර පැය පුරා කඳු මුදුන මුර කරන්න කයිරොන් නියෝග කළා. රාක්ෂයෙක් සොයා වහාම ඔලිම්පස් වීක්ලි පත්තරේ දැන්වීමක් පළ කරන බව එයා කිවුවා.

ඒ අතරතුරේ, ක්ලැරිස්ව කරමතින් රංගාවාටයට ගෙන ගිය එයාගේ කැබින් සගයෝ එයාට ලෝරල් මල්මාල පලඳවා, කඳවුරු ගිනිමැලය වටේ ප්‍රීති උත්සව රාශියක් සැමරුවා.

කිසිවෙක් මගේ දිහා හෝ ඇනබෙත් දිහා දෙවරක් බැලුවේ නැහැ. ඒක හරියට අපි කඳවුරෙන් පිට වුණේවත් නැහැ වගෙයි. එක අතකින්, කාටහරි අපිට කරන්න පුළුවන් හොඳම ස්තුතිය ඒකයි කියලා මට හිතුණා. මොකද, මේ ගවේෂණය කරන්න අපි කඳවුරෙන් හොරෙන් පැනලා ගිය බව එයාලා පිළිගත්තොත්, එයාලට අපිව පිටුවහල් කරන්න සිද්ධ වෙනවා. ඒ වගේම ඇත්තටම, මට තවත් අවධානය ලබාගන්න ඕනෑ වුණේ නැහැ. ඉඳහිට වතාවක් හරි සාමාන්‍ය කඳවුරුකාරයෙක් වෙන්න ලැබීම හිතට සහනයක්.

රෑ බෝවී, අපි මාෂ්මෙලෝස් පුළුස්සමින්, දුෂ්ට රජෙක්ව බිහිසුණු පේස්ට්‍රිස් විසින් කෑමට ගත් ආකාරය ගැන ස්ටොල් සහෝදරයෝ කියූ හොල්මන් කතාවට සවන් දෙන අතරේ, මාව පිටුපසින් තල්ලු කළ ක්ලැරිස් මගේ කනට කෙඳිරුවා: "ඔහේ එක පාරක් හොඳට

Scanned with CamScanner

හැසිරුණාට. ජැක්සන්, ඒරීස් ඔහේව අත ඇරියා කියලා හිතන්නෙපා. ඔහේව වප්ප කරලා දාන්න හරි වෙලාවක් එනකල් මම තවමත් බලන් ඉන්නවා."

මම එයාට එදිරිවාදී හිනාවක් පෑවා.

"මොකද?" එයා ප්‍රශ්න කළා.

"මුකුත් නෑ," මම කිවුවා. "ආපහු ගෙදර එන්න ලැබුණු එක හොඳයි."

පසුදා උදේ, පාර් පෝනියෝ නැවතත් ෆ්ලොරිඩා බලා පිටත් වුණාට පස්සේ, කයිරොන් පුදුම හිතෙන නිවේදනයක් කළා: කලින් සැලසුම් කර තිබුණු ආකාරයටම කරත්ත තරග ඉදිරියටත් පැවැත්වීමට නියමිතයි.

අපි හිතුවේ ටන්ටලස් එක්ක ඒකත් කඳවුරේ ඉතිහාසයට එකතු වුණා කියලයි. කොහොම වුණත්, එය සම්පූර්ණ කිරීම කළ යුතුම දෙයක් වගේ අපිට දැනුණා, විශේෂයෙන්ම කයිරොන් ආපහු ඇවිත්, කඳවුර ආරක්ෂිත වී තිබුණු නිසා.

මුල් වතාවේ ලැබුණු අද්දැකීම් නිසා ආපහු කරත්තයට නගින්න ටයිසන් නම් වැඩි උනන්දුවක් දැක්වූයේ නැහැ, ඒත් මට ඇනබෙත් එක්ක කණ්ඩායම් වෙන්න එයා සතුටින් ඉඩ දුන්නා. මම රිය පදවන්නත්, ඇනබෙත් ආරක්ෂාව ගැන බලා ගන්නත්, ටයිසන් අපේ පිටියේ සහකාරයා ලෙස කටයුතු කරන්නත් එකඟ වුණා. මම අශ්වයින් සමග වැඩ කරන අතරේ, ඇතීනාගේ කරත්තය අලුත්වැඩියා කළ' ටයිසන්, එයට විශේෂ අංගෝපාංග පොකුරක්ම අලුතෙන් එකතු කළා.

ඊළඟ දවස් දෙකේ අපි පිස්සුවෙන් වගේ පුහුණුවීම් කළා. අපි දිනුවොත් ලැබෙන තෑග්ග- මාසයක් පුරා කඳවුරේ වැඩවලින් නිදහස ලැබීම- අපේ කැබින් දෙක අතරේ බෙදාගන්න ඇනබෙතුත් මමත් එකඟ වුණා. ඇතීනාට වැඩිපුර කඳවුරුකරුවෝ සිටි නිසා නිදහස් කාලය එයාලට වැඩිපුර ලැබීම මට ප්‍රශ්නයක් වුණේ නැහැ. මට තෑග්ගෙන් වැඩක් නැහැ. මට ඕනෑ වුණේ දිනන්න විතරයි.

තරගයට කලින් දවසේ මම ගොඩාක් රෑ වෙන තුරු ඉස්තාලයේ රැඳී සිටියා. අපේ අශ්වයින්ව අන්තිම වතාවටත් පිසදාමින්, එයාලා එක්ක කතා කරකර ඉන්න අතරේ මට පිටුපසින් කවුදෝ කතා කළා.



"ලස්සන සත්තු, අශ්වයෝ. එයාලා ගැන අදහස මට ආවා නම් හොඳයි හිතෙනවා."

ලියුම් බෙදන්නෙකුගේ ඇඳුමින් සැරසුණු මැදිවියේ පිරිමියෙක් ඉස්තාලයේ දොරට හේත්තු වී සිටියා. කැරලි ගැසුණු කොණ්ඩයක් ඇති හීන්දෑරි කෙනෙක් වූ එයා සුදු පාට හිස්වැසුමක් පැළඳගෙන, ලියුම් මල්ලක් කරේ එල්ලගෙන සිටියා.

"හර්මීස්?" මට ගොත ගැසුණා.

"හලෝ, පර්සි, මගේ ව්‍යායාම ඇඳුම් නැතුව මාව අඳුනගන්න බැරි වුණා ද?"

"අහ්..." මම එයා ඉස්සරහ දණ ගහන්න ඕනෑ ද නැත්නම් එයාගෙන් මුද්දර ටිකක් මිල දී ගන්න ඕනෑ ද කියලා මට හිතාගන්න බැරි වුණා. ඒත් එක්කම, එයා මෙතැනට එන්න ඇති හේතුව මට තේරුම් ගියා. "ඔහ්, අහන්න, හර්මීස් උතුමාණෙනි, ලූක් ගැන..."

දෙවියා ඇහිබැම් ඇකිළුවා.

"අහ්, මෙහෙමයි, අපි එයාව දැක්කා," මම කිවුවා. "ඒත්-"

"එයාට කතා කරලා හරි පාරට ගන්න ඔයාට බැරි වුණා?"

"හොඳයි, අපි දෙන්නා ද්වන්ධ සටනකින් මරාගන්න උත්සාහ කළා වගේ දෙයක් තමයි වුණේ."

"මට තේරෙනවා. ඔයා උපායශීලීව ළං වෙන්න උත්සාහ කරලා."

"මට ඇත්තටම කණගාටුයි. මං කියන්නේ, ඔයා අපිට අර පුදුමාකාර තෑගි එහෙමත් දුන්නා. ඒ වගේම ලූක්ව ආපහු ගෙන්වා ගන්න ඔයාට ඕනෑ වුණා කියලත් මං දන්නවා. ඒත්... එයා නරක් වෙලා. හොඳටෝම නරක් වෙලා. එයා කිවුවා එයාට දැනෙන්නේ ඔයා එයාව අතරමං කළා කියලයු."

හර්මීස්ට යකා වැහෙනකල් මම බලන් හිටියා. එයා මාව උෟරු මීයෙකුටවත් හරවයි ද හිතලා මම බය වුණා, මොකද මට ආයෙත් නම් චූටි සතෙක් වෙලා එක තත්පරයක්වත් ඉන්න ඕනෑ වුණේ නැහැ.

ඒත් ඒ වෙනුවට එයා කළේ ලොකු සුසුමක් හෙළීම විතරයි. "ඔයාගේ තාත්තා ඔයාව අතරමං කළා කියලා ඔයාට කවදාහරි දැනිලා තියෙනව ද, පර්සි?"

ඔන්, කොල්ලෝ. මට කියන්න ඕනෑ වුණේ, "දවසකට තුන්-හාරසිය වතාවක් විතරයි." කියලා. පහුගිය ගිම්හානෙන් පස්සෙම මම පොසෙයිඩන් එක්ක කතා කරලා නැහැ. එයාගේ මුහුදු පතුලේ මාලිගාවට යන්න මට කවදාවත් අවස්ථාවක් ලැබිලා නැහැ. ඒ මදිවට, ටයිසන් නිසා වෙච්ච දේවල්- කලින් දැනුම් දීමක් නැහැ, කිසිම විස්තර කිරීමක් නැහැ. එක පාරටම, බූම්! මෙන්න ඔයාට සහෝදරයෙක් ඒ වගේ දේකට පස්සේ අඩු තරමේ දුරකථන ඇමතුමක්වත් දෙන්න වටිනවා කියලා ඔයාට වුණත් හිතෙනවා නේද.

ඒ ගැන වැඩිදුර කල්පනා කරද්දී මගේ කේන්තියත් වැඩි වුණා. මම සම්පූර්ණ කර තිබුණු ගවේෂණයට පිළිගැනීමක් ඕනෑ බව මට තේරුණා, ඒත් ඒ අනෙක් කඳවුරුකරුවන්ගෙන් නෙවෙයි. මට ඕනෑ වුණේ මගේ තාත්තා මට මොනවාහරි කියනවා අහන්න. එයාගේ සැලකිල්ලට මාව ලක් වෙනවා දකින්න.

හර්මීස් කරේ එල්ලාගෙන සිටි ලියුම් මල්ල නැවත සකස් කළා. "පර්සි, දෙවියෙක් වුණාම තියෙන අමාරුම දේ තමයි නිතරම වගේ ඔරෝ වැඩ කරන්න වෙන එක, විශේෂයෙන්ම තමන්ගේ ළමයි සම්බන්ධ වැඩවලදී. අපේ ළමයෙක්ට ප්‍රශ්නයක් එන හැම වතාවකදීම අපි මැදිහත් වෙන්න ගියොත්... හොඳයි, ඒකෙන් වෙන්නේ තවත් ප්‍රශ්න ඇති වෙන එකයි, තරහකාරයෝ වැඩි වෙන එකයි විතරයි. ඒත් මං විශ්වාස කරන්නේ, ටිකක් කල්පනා කරලා බැලුවොත් ඔයාට පෙනෙයි පොසෙයිඩන් ඔයාගේ යාඥාවලට ප්‍රතිචාර දැක්වූවා. මම බලාපොරොත්තු වෙන්නේ කවදාහරි දවසක ලූක්ටත් එහෙම මං ගැන තේරුම් ගන්න පුළුවන් වෙයි කියලා. සාර්ථක වුණා කියලා ඔයාට දැනුණත්, නැතත්, එයා කවුද කියලා ඔයා ලූක්ට මතක් කරලා දුන්නා. ඔයා එයාට කතා කළා."

"මං එයාව මරන්න හැදුවා."

හර්මීස් උරහිස් ඇකිළුවා. "පවුල්වල ඔය වගේ අවුල් තියෙනවා. අමරණීය පවුල්වල සදාකාලික අවුල් තියෙනවා. සමහර වෙලාවට අපිට කරන්න පුළුවන් හොඳම දේ තමයි හොඳින් හෝ නරකින් අපි නෑයෝ කියන එක මතක් කරලා දීලා... ඇනකොටාගෙන මරාගන්න හදන එක පුළුවන් තරම් අඩු කරගන්න බලන එක."

අංගසම්පූර්ණ පවුලක් හදන්න හොඳම ක්‍රමය ඒක වගේ නම් පෙනුණේ නැහැ. ඒත් ආපහු මම, මගේ ගවේෂණය ගැන හිතද්දී,



සමහරවිට හර්මීස් හරි ඇති කියලා මට හිතුණා. පොසෙයිඩන් අපේ උදව්වට හිපොකැම්පිලා එවා තිබුණා. මීට කලින් මම කවදාවත් දැන නොසිටි බලයක් මුහුද පාලනය කරන්න එයා මට දීලා තිබුණා. ඒ වගේම ටයිසන්. පොසෙයිඩන් අපි දෙන්නව එකතු කළේ මොකක්හරි අරමුණක් හිතේ තියාගෙන ද? මේ ගිම්හානයේදී ටයිසන් කී වතාවක් මගේ ජීවිතේ බේරුවා ද?

ඈතින් හක් ගෙඩිය නාද වුණේ ඇඳිරි නීතියට වෙලාව අඟවමින්.

"ඔයා දැන් ඇඳට යන්න ඕනෑ," හර්මීස් කිවුවා. "මේ ගිම්හානෙදි ඔයාට ඇති තරම් කරදරවලට පැටලෙන්න මම දැනටමත් උදවු කරලා තියෙනවා නේ. ඇත්තටම මං ආවේ බාරදීමක් කරන්න විතරයි."

"බාරදීමක්?"

"මම දෙවිවරුන්ගේ පණිවුඩකාරයා නේ, පර්සි." තැපැල් මල්ලෙන් ඉලෙක්ට්‍රොනික අත්සන් පෑඩයක් ගත් එයා ඒක මගේ අතට දුන්නා. "කරුණාකරලා, මේක අත්සන් කරන්න."

මම පන්හිඳ අතට ගන්නට පස්සෙයි ඒක වටේ එතිලා හිටිය කොළ පාට සර්පයෝ දෙන්නව දැක්කේ. "ආහ්!" මම පෑඩය අත ඇරියා.

''ඌයි,'' ජෝර්ජ් කිවුවා.

''ඇත්තටම, පර්සි.'' මාර්තා දොස් කිවුවා. ''අශ්ව ඉස්තාලෙක බිම වැටෙන්න ඔයා වුණත් කැමති ද?''

"ඔහ්, අයියෝ, සමා වෙන්න." සර්පයෝ අල්ලන්න හිත දුන්නේ නැතත්, මම ආපහු පන්හිඳ සහ පෑඩය අහුලගත්තා. මගේ ඇඟිලි අතරේ ඇඹරුණු මාර්තා සහ ජෝර්ජ්, දෙක වසරේදී මගේ විශේෂ ගුරුවරිය මට පාවිච්චි කරන්න දුන් පැන්සලක් වගේ හැඩ ගැහුණා.

''ඔයා මට මීයෙක් ගෙනාව ද?'' ජෝර්ජ් ඇසුවා.

"නෑ..." මම කිවුවා. "අහ්, අපිට එකෙක්වත් හොයාගන්න බැරි වුණා."

''එහෙනම් රට හාවෙක්?''

Scanned with CamScanner

''ජෝර්ජ්!'' මාර්තා සැර කළා. ''පොඩි එකාව විහිළුවට ගන්නෙපා.''

එම, මගේ නම අක්සත් කරලා පැඩය ආපසු හර්මීස් අතට දුන්නා.

හුවමාරුවට, එයා මට මුහුදු නිල් පාට ලියුම් කවරයක් දුන්නා.

මගේ ඇඟිලි වෙවුලුවා. විවෘත කරන්න කලින්ම, ඒක මගේ තාත්තාගෙන් බව මට කියන්න පුළුවන් වුණා. සීතල නිල් පාට කඩදාසියේ එයාගේ බලය මට දැනුණේ හරියට ඒක මුහුදු රළවලින් හදලා වගෙයි.

"හෙට වැඩේට සුබ පැතුම්," හර්මීස් කිවුවා. "ඔයාට ඉන්නේ හොඳ අශ්වයෝ කණ්ඩායමක්. ඒ වුණත් මම හර්මීස් කැබින් එකට හුරේ දම්මොත් ඔයා තරහා වෙන්නෙපා."

''ඒ වගේම ඕක කියවලා අධෛර්යය වෙන්න එපා, දරුවෝ,'' මාර්තා මට කිවුවා. ''එයාගේ හිතේ ඔයාට ලැදියාවක් තියෙනවා.''

"ඒ කිවුවේ?" මම ඇහුවා.

''එයා කියන ඒවා ගණන් ගන්නෙපා,'' ජෝර්ජ් කිවුවා. ''ඊළඟ වතාවේ මතක තියාගන්න. සර්පයෝ වැඩ කරන්නේ සන්තෝසම්වලට.''

"නවත්තගන්න, ඔය දෙන්නා," හර්මීස් කිවුවා. "දැනට සමු දෙන්නම්, පර්සි." එයාගේ හිස්වැසුම දෙපැත්තෙන් සුදු පාට චූටි තටු දෙකක් මතු වුණා. එයා දිලිසෙන්න පටන් ගනිද්දී, එයා සැබෑ දිව්‍යමය ස්වරූපෙට පත්වෙන්න කලින් මගේ ඇස් ආවරණය කරගන්න තරම් මම දෙවිවරු ගැන දැන සිටියා. දීප්තිමත් සුදු එළියක් එක්ක එයා යන්න ගියේ මාව අශ්වයෝ සමඟ තනි කරමින්.

මගේ අතේ තිබුණු නිල් පාට ලියුම් කවරය දෙස මම බලා සිටියා. ගිය ගිම්හානයේ දී පොසෙයිඩන් මට එවූ පාර්සලයෙන් දැක තිබුණු තද, ලස්සන අත් අකුරින් එහි ලිපිනය ලියා තිබුණා:

පර්සි ජැක්සන්,

අර්ධ-ලෝහිත කඳවුර හාරේ,

ගොවිපොළ පාර 3.141,

ලෝන්ග් අයිලන්ඩ්,

නිව්යෝක් 11954.



මගේ තාත්තාගෙන් ඇත්තම ලියුමක්. සමහරවිට, රත් සළුව හොයාගන්න මම කළ දේ එයා අගේ කරලා ඇති. එයා ටයිසන් ගැනත් පැහැදිලි කරලා ඇති. නැත්නම් ළඟදී මට කතා නොකළාට සමාව ඉල්ලලා ඇති. ඒ ලියුමෙන් කියවෙනවා දකින්න උවමනා ගොඩක් දේවල් මට තිබුණා.

ලියුම් කවරය විවෘත කළ මම එහි වූ කඩදාසිය දිග ඇරියා.

කඩදාසිය මැද තිබුණේ මුද්‍රණය කරපු සරල වචන දෙකක් විතරයි: පටි තද කරගන්න.

*　　*　　*　　*　　*　　*

ඊළඟ උදයේ හැමදෙනාම කරත්ත තරඟය ගැන කතා කරමින් සිටියත්, එයාලා සැරින් සැරේ අහස දිහාවට සැක සහිත බැලුම් හෙළුවේ ස්ටයිම්ෆලියන් කුරුල්ලෝ එකතු වෙනව ද කියන බිය ඇරගන්න වගෙයි. උන් එකෙක්වත් ආවේ නැහැ. එදා පිරිසිදු නිල් අහසේ ඉර පැයූ ලස්සන දවසක්. කඳවුර, තිබිය යුතු ආකාරයට නැවත හැඩගැහෙමින් තිබුණා: සාරවත් කොළ පාට තණබිම්; ග්‍රීක ගොඩනැගිලිවල දිස්නය දෙන කුලුනු; වනාන්තරේ සතුටින් සෙල්ලම් කරන රුක් දෙවිවරු.

මේ සියල්ල අතරේ මම විතරක් අන්ත මූසලයෙක් වගේ හිටියා. පොසෙයිඩන්ගේ අනතුරු ඇඟවීම ගැන හිතලම මට රෑ නින්ද ගියෙත් නැහැ. පටි තද කරගන්න.

මං අහන්නේ, ලියුමක් ලියන්න තරම් කරදර වුණ එයාට ලියන්න තිබුණේ වචන දෙක ද?

මාර්තා නම් මට කිවුවේ අධෛර්යය වෙන්න එපා කියලා. සමහරවිට ඔච්චර නොපැහැදිලි වෙන්න පොසෙයිඩන්ට හේතුවක් ඇති. සමහරවිට මට අනතුරු අඟවන දේ ගැන එයත් හරියටම දන්නේ නැතුව ඇති, ඒ වුණත් මොකක්හරි ලොකු දෙයක් වෙන්න යන බව එයාට දැනෙන්න ඇති- කලින් සූදානම් වෙලා නොහිටියොත් මාව උඩ යන්න පුළුවන් විදිහේ දෙයක්. කොයි තරම් අමාරු වුණත් මම, මගේ හිත තරඟයට යොමු කළා.

ඇනබෙත් සහ මම ධාවන පථයට කරත්තය දක්කාගෙන යද්දී, ඇතීනාගේ කරත්තයට ටයිසන් දමා තිබූ වැඩ අගේ නොකර ඉන්න මට බැරි වුණා. මුළු ගැලම ලෝකඩින් දිලිසුණා. රෝද මායා

වෙලඹිනයකින් නැවත සවිකර තිබුණු නිසා පහසුවෙන්ම ලිස්සා ගිය අපිට පාරේ ගැස්සීම් දැනුණේම නැති තරම්. අශ්වයින් දෙන්නාව එකට ඇදා තිබුණු ලීය කොයිතරම් සමබර වුණා ද කියනවා නම්, තෝත් ලණුවල පුංචිම සංඥාවටත් ඒ දෙන්නා හැරුණා. ඒ වගේම ටයිසන් අපිට හෙල්ල දෙකකුත් සාදා දුන්නා. ඒවාගේ බඳේ වූ බොත්තම් තුනෙන් මුල්ම බොත්තම එබූ විට එහි තුඩ ගැටෙන තැන පුපුරා ගොස් දැලිපිහි වගේ තියුණු කම්බියක් නිදහස් වෙන්නේ ප්‍රතිවාදී කරත්තයේ එය පැටලී ඒවා තීරුවලට ඉරී යන ලෙසයි. දෙවැනි බොත්තමෙන් නිදහස් වුණේ මොට්ට (එහෙත් ගොඩක් වේදනාකාරී) ලෝකඩ හෙලි හිසක්. එය නිර්මාණය කර තිබුණේ ප්‍රතිවාදී රියැදුරාව කරත්තයෙන් එළියට විසි වෙන්න පාරක් දෙන්නයි. තුන්වෙනි බොත්තමෙන් පිට පැන්න ඇඹුළුම් කොක්ක සතුරු කරත්තයකට පිටුපසින් ඇමිණීමට හෝ එය පසුපසට තල්ලු කර දැමීමට පාවිච්චි කළ හැකි වුණා. තරගයක් දීමට සෑහෙන හොඳ තත්ත්වෙක අපි ඉන්න බව හිතුණා, ඒත් කෝකටත් අපිට පරිස්සම් වෙන්න කියලා ටයිසන් අනතුරු ඇඟෙව්වා. මොකද අනෙක් කරත්ත කණ්ඩායම්වල අයත් හොඳ හොඳ සෙල්ලම් ගොඩක් හංගාගෙනයි හිටියේ.

"මෙන්න," තරගය පටන් ගන්න මොහොතකට කලින් ටයිසන් මට අත් ඔරලෝසුවක් දුන්නා. ඒකේ කිසිම විශේෂත්වයක් තිබුණේ නැහැ- සාමාන්‍ය සුදු සහ රිදී මුහුණතකුත් කළු ලෙදර් පටියකුත් ඇති එකක්- ඒත් ඒක දැකපු හැටියේම, මුළු ගිම්හානය පුරාවට එයා සාදමින් සිටියේ මෙය බව මට තේරුණා.

මම ඔරලෝසු පලඳින්න කැමති කෙනෙක් නම් නෙවෙයි. වෙලාව ගැන හිත හිතා වද වෙන්නේ කවුද? ඒත් ටයිසන්ට එපා කියන්න මට බැරි වුණා.

"ස්තූතියි, කොල්ලෝ," ඒක අතේ බැඳගත්තාම මට තේරුණේ ඒක හිතුවටත් වඩා සැහැල්ලු සහ සුවපහසුයි කියලයි. ඒක පැලඳගෙන ඉන්නවා කියලා මට දැනුණෙවත් නැහැ.

"ගමන යන්න කලින් ඕක හදලා ඉවර කරන්න බැරි වුණා," ටයිසන් කෙඳිරුවා. "සමා වෙන්න, සමා වෙන්න."

"අයියෝ, ඒකට කමක් නෑ."

"තරගෙදි ඔයාට ආරක්ෂාවක් ඕනෑ වුණොත්," එයා උපදෙස් දුන්නා, "බොත්තම ඔබන්න."



"අහ්, හරි." වෙලාව බලන එක ලොකු උදවුවක් වෙන්නේ කොහොමද කියලා මට පෙනුණේ නැතත්, ටයිසන් ඒ ගැන සැලකිල්ලක් දක්වීම මගේ හිතට වැදුණා. ඔරලෝසුව අමතක කරන්නේ නැහැ කියලා මම එයාට පොරොන්දු වුණා. "එතකොට, මේ, ටයිසන්...."

එයා මගේ දිහා බැලුවා.

"මට කියන්න ඕනෑ වුණේ, මේකයි...." ගවේෂණයට යන්න කලින් එයා ගැන ලැජ්ජා වුණාටත්, එයා මගේ ඇත්තම සහෝදරයා නෙවෙයි කියලා හැමෝටම කියපු එකටත් සමාව ඉල්ලන්න ක්‍රමයක් හොයාගන්න මම උත්සාහ කළා. ඒකට ගැළපෙන වචන හොයාගන්න ලේසි වුණේ නැහැ.

"ඔයා මට කියන්න හදන්නෙ මොනවද කියලා මං දන්නවා," ටයිසන් කිවුවේ ලැජ්ජාවෙන් වගෙයි. "කොහොම වුණත්, පොසෙයිඩන් මං ගැන හොයලා බැලුවා නේ."

"අහ්, හොඳයි-"

"එයා මට උදවු කරන්න ඔයාව එව්වා. මං ඉල්ලුව විදිහටම."

මම තදින් ඇහිපිය ගැසුවා. "ඔයා පොසෙයිඩන්ගෙන්.... මාව ඉල්ලුවා?"

"යාළුවෙක්ව," ටයිසන් කිවුවේ ටී-ෂර්ට් එකේ කොණක් අඹරවමින්. "පොඩි සයික්ලොප්ස්ලා පාරවල්වල තනියම ලොකු වෙනවා. අහක දාන දේවල්වලින් අපි එක එක දේවල් හදන්න ඉගෙන ගන්නවා. ජීවිතේ ගැටගහගන්න ඉගෙන ගන්නවා."

"ඒත් ඒක හරිම නපුරුයි නේ!"

එයා උනන්දුවෙන් ඔළුව හෙල්ලුවා. "ඒකෙන් අපි පොලිෆිමස් වගේ පෙරේත, ජරා, තඩියෝ වෙන්නැතුව ලැබෙන හොඳ දේවල්වල අගේ තේරුම් ගන්නවා. ඒත් මම බය වුණා. රාක්ෂයෝ ගොඩාක් වෙලාවට මගේ පස්සෙන් පැන්නුවා, සමහර වෙලාවට මගේ පිටත් පහුරු ගෑවා-"

"ඔයාගේ පිටේ තියෙන තුවාල කැළැල්?"

එයාගේ ඇහේ කඳුළක් පිරුණා. "හත්තෑ දෙවෙනි වීදියේ හිටපු ස්ෆින්ක්ස්. ලොකු වණ්ඩියෙක්. මම උදවු ඉල්ලලා තාත්තිට යාඥා කළා. ඊට පස්සෙ ඉක්මනටම මෙරිවෙදර්වල කට්ටිය මාව හොයාගත්තා.

Scanned with CamScanner

ඔයාව මුණගැහුණා. ජීවිතේට වුණ හොඳම දේ, පොසෙයිඩන් තරකයි කිවුවට මට සමා වෙන්න. එයා මට අයියා කෙනෙක් එච්චා."

ටයිසන් මං වෙනුවෙන් හැදූ ඔරලෝසුව දිහා මම බලා සිටියා.

"පර්සි!" ඇනබෙත් කතා කළා. "ඉක්මන් කරන්න!"

හක් ගෙඩිය පිඹින්න සූදානමින් කයිරොන් ආරම්භක සීමාවට ඇවිත් සිටියා.

"ටයිසන්..." මම කතා කළා.

"යන්න," එයා කිවුවා. "ඔයා දිනනවා!"

"මම- ඔව්, හරි, ලොකු යාළුවා. අපි ඔයා වෙනුවෙන් දිනනවා." කරත්තයට ගොඩවුණු මම නියමිත තැනට එද්දීම කයිරොන් ආරම්භක සංඥාව නාද කළා.

කළ යුතු දේ අශ්වයෝ දන සිටියා. අපි ඉදිරියට ඇදුණු වේගයට, මම අත් දෙකේ ලෙදර් තෝන් පටි පටලවාගෙන නොහිටියා නම් මාව කරත්තයෙන් පිටට විසිවෙන්න තිබුණා. ඇනබෙත් රාමු පටියේ තදින් එල්ලී සිටියා. රෝද අපූරුවට ලිස්සා ගියා. හර්මීස් කරත්තයේ ස්ටොල් සහෝදරයන්ගෙන් එල්ල වුණු හෙලි පහරක් වළක්වා ගන්න ක්ලැරිස් දන කහ අතරේ, එයාගෙන් සම්පූර්ණ කරත්ත දිගක පරතරයක් තබාගෙන අපි මුල්ම හැරවුම ගත්තා.

"අපි එයාලව ඇල්ලුවා!" මම මොර දුන්නා. ඒත් මගේ කට ඉස්සර වුණා වැඩියි.

"ඔන්න එනවා!" ඇනබෙත් මොර ගැහුවා. එයා ඇවුළුම් කොකු මාදිලියෙන් මුල්ම හෙල්ලය විසි කළේ, අපි දෙන්නවම පැටලෙන්න ඉඩ තිබුණු ඊයම් බරැ එල්ලූ දැලක් පසෙකට ඇද දමමින්. ඇපලෝගේ කරත්තය අපේ ළඟටම ඇවිත් තිබුණා. ඇනබෙත්ට නැවත අවි ගන්න අවස්ථාවක් ලැබෙන්න කලින් ඇපලෝ යුද භටයා අපේ දකුණු රෝදයට හෙල්ල පහරක් එල්ල කළා. හෙල්ලය කුඩු වී ගියේ අපේ ස්පෝක් කීපයකුත් කඩාගෙනමයි. අපේ කරත්තය වැනෙමින් පැත්තකට ඇල වුණා. මුළු රෝදයම කඩා වැටෙයි කියලා මම හිතුවත්, කොහොමදෝ අපි නොනැවතී ඉදිරියට ගියා.

වේගය වැඩි කරන්න මම අශ්වයින්ට සත් කළා. අපි සිටියේ ඇපලෝ සමග කරට-කර සටනකයි. හෙෆාස්ටස්ලත් ළඟ ළඟම ආවා.



පසුපසට වුණු ඒරීස් සහ හර්මීස් කරත්ත දෙක එක්ව ධාවනය වෙද්දී ක්ලැරිස් කොනර් ස්ටොල් සමග කඩු-හෙලි සටනකට පිවිසුණා.

අපේ රෝදයට තව එක ප්‍රහාරයක් හෝ වැදුණොත් අපිව පෙරළෙන බව මම දන සිටියා.

"ඔයා මගේ!" ඇපලෝ රියැදුරා මොර ගැහුවා. එයා කඳවුරේ මුල් අවුරුද්ද ගත කරන කෙනෙක්. එයාගේ නම මට මතක නැති වුණත්, එයා තමන් ගැන දැඩි ආත්ම විශ්වාසයකින් ඉන්න බව නම් පැහැදිලිවම පෙනුණා.

"අන්න හරි!" ඇනබෙත් ආපස්සට කෑගැහුවා.

එයා දෙවැනි හෙල්ලයත් අරන්- අපිට තවත් වටයක්ම සම්පූර්ණ කරන්න තිබුණු නිසා ඒක සෑහෙන අවදානමක් වුණත්- එයින් ඇපලෝ රියැදුරාට දමලා ගැහුවා. ඇනබෙත්ගේ ඉලක්කය අති විශිෂ්ටයි. රියැදුරාගේ පපුවේ වදිද්දීම බර හෙලි-හිසකට හැරුණු එය රියැදුරාව, එයාගේ සගයාගේ ඇඟට තල්ලු කළා. එයාලා දෙන්නම කරණම් ගහමින් කරත්තයෙන් පිටට පෙරළුණා. තෝන් ලණු බුරුල් වෙනවා දැනුණු අශ්වයෝ දෙන්නා දුවන්න පටන් ගත්තා. උඩ විසිවෙන රත්වන් කරත්තය ඇදගෙන අශ්වයෝ දෙන්නා එනවා දකිද්දී මුවාවෙන්න තැනක් හොයාගන්න සෙනග පොරකෑවා. මුණින් හැරුණු කරත්තයත් එක්ක අශ්වයෝ ඉස්තාලය දෙසට පිම්මේ දිවුවා.

දකුණු රෝදයේ කංකෙදිරිය මැද්දේම දෙවැනි හැරවුම තෙක් මම අපේ කරත්තය අල්ලගෙන සිටියා. ආරම්භක සීමාව පසු කළ අපි, අපේ අන්තිම වටයට එළඹුණා. කරත්තයේ අක්ෂ දණ්ඩ කිරි කිරි හඬින් අඳෝනා නැගුවා. මගේ හැම නියෝගයකටම ප්‍රතිචාර දක්වමින්, හොඳින් තෙල් දාපු මැෂිමක් වගේ අශ්වයෝ දෙන්නා දිවුවත්, වැනෙන රෝදය අපේ වේගය අඩු කළා. හෙෆාස්ටස් කණ්ඩායම තවමත් වේගය වැඩි කරමින් ආවා.

බෙකන්ඩොර්ෆ් දත් නියවමින් නියාමක පුවරුවේ බොත්තමක් තද කළා. ඒත් එක්කම එයාගේ යාන්ත්‍රික අශ්වයින්ගේ ඉදිරියෙන් පිට පැන්න වානේ කම්බි පොටවල් අපේ පිටුපස ගරාදිය වටේ එතුණා.

බෙකන්ඩොර්ෆ්ගේ දබර පද්ධතිය ක්‍රියාත්මක වෙද්දී අපේ කරත්තය වෙවුලුවා- එයින් අපිව ආපස්සට අදින අතරේ බෙකන්ඩොර්ෆ් ඉදිරියට ඇදුණා.

ශාපයක් කළ ඇනබෙත්, එයාගේ කිණිස්ස ඇදලා ගත්තා. එයා කම්බිවලට කෙටුවත් ඒවා සතකම වැඩියි.

"ඒවා කපන්න බැහැ." එයා මොර දුන්නා.

දැන් බෙකන්ඩොර්ෆ්ගේ කරත්තය අනතුරුදායක ලෙස ළඟටම ඇවිත්, එයාගේ අශ්වයෝ අපිව පාගලා යට කරගෙන යාවි වගෙයි.

"මාත් එක්ක මාරු වෙන්න!" මම ඇනබෙත්ට කිවුවා. "තෝන් ලණු අල්ලගන්න!"

"ඒත්-"

"කිවුව දේ කරන්නකෝ!"

ඉදිරියට ආව එයා තෝන් ලණු අල්ලගත්තා. මම ආපසු හැරිලා, පය තදින් රඳවාගන්න උත්සාහ කරමින්ම රිප්ටයිඩ්ගේ කොපුව ගැලවූවා.

මගේ කඩු පාරට කම්බි පොටවල් සරුංගලේක නූල වගේ කැපී ගියා. අපිව ඉදිරියට විසිවුණත්, ඒත් එක්කම බෙකන්ඩොර්ෆ්ගේ රියැදුරා අපේ වම් පසට කරත්තය පදවා අපිට සමාන්තරව ආවා.

බෙකන්ඩොර්ෆ් කඩුව ඇදලා ගත්තා. එයා ඇනබෙත්ට පහර දෙද්දී මම ඒ පහර වැළැක්වූවා.

අපි අන්තිම හැරවුමට ළං වෙමින් සිටියා. අපිට ඒක කරන්න ලැබෙන පාටක් නැහැ. මම හෙෆාස්ටස් කරත්තය අබල කරලා පාරෙන් අයින් කරන්න ඕනෑ. ඒත් මට ඇනබෙත්ව ආරක්ෂා කරන්නත් තිබුණා. බෙකන්ඩොර්ෆ් හොඳ කොල්ලෙක් වුණ පලියට අපි, අපේ ආරක්ෂාව අඩු කළොත් එයා අපිව අසනීප කාමරේට නොයවා ඉඳීවි හිතන්න බැහැනේ.

දැන් අපි කරට-කර ධාවනය කරද්දී, නැතිවුණු වෙලාව අල්ලමින් ක්ලැරිස් පිටුපසින් ආවා.

"පස්සේ හම්බ වෙමු, පර්සි!" බෙකන්ඩොර්ෆ් මොර දුන්නා.

"මෙන්න මගෙන් පුංචි තෑග්ගක්!" එයා අපේ කරත්තය ඇතුළට ලෙදර් පසුම්බියක් විසි කළා. ඉක්මනින් පොළොවේ ඇලවුණ එය කොළ පාට දුම් පිට කරන්න ගත්තා.

"ග්‍රීක ගින්දර!" ඇනබෙත් කෑගැහුවා.



මම ශාප කළා. ග්‍රීක ගින්දරවලට කළ හැකි දේ ගැන කතන්දර මම කලින් අහලා තිබුණා. ඒක පුපුරන්න කලින් අපිට ඇත්තේ තත්පර දහයක් විතර වගෙයි.

"ඒක අයින් කරන්න!" ඇනබෙත් කෑගැහුවත්, මට කරන්න බැරි වුණා. එයාලගේ පුංචි තෑග්ග පුපුරණව ද කියලා තහවුරු කරගන්න අන්තිම තත්පරය වෙන තුරු හෙෆාස්ටස් කරත්තය පසෙකින් ඇදෙමින් තිබුණා. බෙකන්ඩොර්ෆ්, එයාගේ කඩුවෙන් මාව කාර්යබහුල කළා. ග්‍රීක ගින්දර සමග ගනුදෙනු කරන්න තරම් කාලයකට මම, මගේ ආරක්ෂාව පහත හෙළුවොත් ඇනබෙත්ව පෙති ගැහිලා, අපිව පොඩි පට්ටම් වෙලා යාවි. ලෙදර් පසුම්බියට පයින් ගහන්න මම උත්සාහ කළත්, ඒක තදින්ම ඇලවී තිබුණා.

ඒ වෙලාවේ මට ඔරලෝසුව මතක් වුණා.

එයින් මොන විදිහේ උදවුවක් ලැබෙයි ද කියලා මම දැනගෙන හිටියේ නැති වුණත්, ඔරලෝසුවේ විරාම බොත්තම ඔබන්න මට හැකි වුණා. එසැණින්ම, ඔරලෝසුව වෙනස් වෙන්න ගත්තා. පරණ තාලේ කැමරා ඇසක් වගේ ලෝහ පට්ටම සර්පිලාකාරව පිටතට විහිදෙද්දී, ලෙදර් පටියක් මගේ අත වටේ එතුණා. මොහොතකට පසු මගේ අතේ තිබුණේ අඩි හතරක් පළල රවුම් යුද පලිහක්. එයට මෘදු ලෙදර්වලින් සෑදූ ඇතුළු පැත්තකුත්, ඔප දමා කැටයම් කළ ලෝකඩ මතුපිටකුත් තිබුණත්, ඒ කැටයම් පරීක්ෂා කරන්න වෙලාවක් මට නැති වුණා.

මම දැන සිටි එකම දේ: ටයිසන් අපිව බේරාගත්තා. මම පලිහ ඔසවද්දී, බෙකන්ඩොර්ෆ්ගේ කඩුව එහි ගැටුණා. කඩු තලය පොඩි පට්ටම් වුණා.

"මොනවා?" එයා කෑගැහුවා. "කොහොම ද-"

එයාට වැඩි දෙයක් කියාගන්න නොලැබුණේ මම, මගේ අලුත් පලිහෙන් එයාගේ පපුව මැද්දට තද පහරක් දුන් නිසයි. කරත්තයෙන් එළියට පියඹා ගිය එයා දූවිලි ගොඩේ පෙරළුණා.

රිප්ටයිඩ්ගෙන් රියැදුරාටත් පහරක් දෙන්න මම සූදානම් වෙද්දී ඇනබෙත් මොරදුන්නා, "පර්සි!"

ග්‍රීක ගින්දර පසුම්බියෙන් ගිනි පුපුරු විසිරෙමින් තිබුණා. මම කඩු තුඩ ලෙදර් පසුම්බිය යටින් රිංගවා ඉහළට එසෙව්වා. එතැනින්

ඇලවුණු ගිනි බෝම්බය පියඹා ගිහින් හෙෆාස්ටස් කරත්ත රියැදුරාගේ පාමුල වැටුණා. එයා කෑගැහුවා.

තත්පරේකින් පංගුවකදී රියැදුරා නිවැරදි තෝරා ගැනීම කළා: එයා කරත්තයෙන් ඉවතට පැන්නා. ඒත් එක්කම පැත්තකට ඇලවුණු කරත්ත පුපුරා ගොස් කොළ පාට ගිනි ජාලාවකින් වැසුණා. ලෝහ අශ්වයින්ගේ පරිපථ අක්‍රමවත් වුණා වගෙයි. ආපහු හැරුණු උන් ගිනිගන්නා සුන්බුන් ගොඩ ඇදගෙන ක්ලැරිස් සහ ස්ටොල් සහෝදරයන්ගේ ඉදිරියට යද්දී, එය මඟ ඇරීමට එයාලට වැරදි පැත්තට හරවන්න සිද්ධ වුණා.

ඇනබෙත් අවසාන හැරවුම ගැනීමට තෝන් ලණුව ඇද්දා. අපිව දුන් පෙරළෙයි හිතමින් මම තදින් අල්ලගෙන සිටියා, ඒත් කොහොමහරි අපිව ඉදිරියටම රැගෙන ගිය ඇනබෙත් තරගාවසාන සීමාව හරහා අසුන් පැන්නුවා. සෙනඟ අතරේ ජයඝෝෂාවක් පුපුරා ගියා. කරත්තය නැවතුණු හැටියේම, අපේ යාළුවෝ අපිව වසාගත්තා. එයාලා අපේ නම් කියමින් කෑගහන්න ගත්තත් ඒ ඝෝෂාවට ඉහළින් ඇනබෙත් කෑගැසුවා: "පොඩ්ඩක් ඉන්න! අහන්න! මේක කළේ අපි දෙන්නා විතරක් නෙවෙයි!"

පිරිසට නිශ්ශබ්ද වෙන්න ඕනෑ වුණේ නැතත්, ඇනබෙත් හැමදෙනාටම ඇහෙන්න කතා කළා: "තවත් කෙනෙක් නොහිටින්න, අපිට මේක කරන්න ලැබෙන්නේ නැහැ! අපිට මේ තරගයෙන් දිනන්නවත්, රන් සළුව අරන් එන්නවත්, ග්‍රෝවර්ව බේරාගන්නවත්, කිසිම දෙයක් කරගන්න ලැබෙන්නේ නැහැ! අපි අපේ ජීවිතවලින් ණයගැතියි ටයිසන්ට, පර්සිගේ..."

"සහෝදරයා!" මම කිවුවේ හැමදෙනාටම ඇහෙන හඬින්. "ටයිසන්, මගේ මල්ලියා." ටයිසන් රතු වුණා. සෙනඟ ඔල්වරසන් හඬ දුන්නා. ඇනබෙත් මගේ කම්මුලට හාද්දක් දුන්නා. ඊට පස්සේ ඝෝෂාව තවත් වැඩි වුණා. මුළු ඇතීනා කැබිනයේම අය මාවත්, ඇනබෙත්වත්, ටයිසන්වත් ඔසවාගෙන ජයග්‍රාහකයින්ට ලෝරල් පිළිගැන්වීමට සූදානමින් කයිරොන් බලා සිටි වේදිකාවට රැගෙන ගියා.

# 20

# රන් සළුවේ මායාව ඕනෑවටත් වඩා හොඳින් වැඩ කළා

එදා හවස් වරුව මම කඳවුරේ ගත කරපු සතුටුම හවස් වරුවක්, සමහරවිට එහෙම දැනෙන්න ඇත්තේ ඔයාගේ ලෝකේ කොයි වෙලාවේ කුඩුවෙලා යාවි ද කියන්න බැරි බව මට හොඳින්ම දනවන්න වෙන්න ඇති.

පැන්ව සොයා යන ගවේෂණය නැවත පටන් ගන්න කලින් ගිම්හානයේ ඉතිරිය අපිත් එක්ක ගත කරන්න පුළුවන් කියලා ග්‍රෝවර් නිවේදනය කළා. එයා මගදී මැරුණේ නැති එකත්, අනාගත සොයන්නෝ වෙනුවෙන් එයා මඟ පිරිසුදු කළ එකත් විදාරින වැඩිහිටියන්ගේ මණ්ඩලේ එයාගේ ලොක්කෝ ටිකට සැහෙන හිතට වැදිලා. ඒ නිසාම එයාලා ග්‍රෝවර්ට මාස දෙකක නිවාඩුවකුත්, අලුත් බට නළා කුට්ටමකුත් පිරිනමා තිබුණා. එකම නරක ආරංචිය වුණේ: ඒ බට නළා කුට්ටම මුළු හවස් වරුව පුරාම වාදනය කරන්න ග්‍රෝවර්ට උවමනා වුණා. ඒත් එයාගේ සංගීත හැකියාවන් නම් වුට්ටක්වත් දියුණු වෙලා තිබුණේ නැහැ. එයා ඒවායින් ගීතයක් වාදනය කරද්දී පිස්සු වැටෙන්න පටන් ගත් ස්ට්‍රෝබෙරි පැළ අපේ කකුල් වටේ එතෙන්න ගත්තේ හරියට අපේ බෙලි මිරිකන්න හිතිලා වගෙයි. ඒවාට දොස් කියන්නත් බැහැ කියලා මට හිතුණා.

දැන් අපි මූණට-මූණ ඉන්න නිසා අපි දෙන්නා අතරේ ඇති සහකම්පන සම්බන්ධය අවලංගු කරන්න පුළුවන් කියලා ග්‍රෝවර් මට කිවුවා. ඒත් එයාට කමක් නැත්නම් මම ඒක තියාගන්න කැමතියි කියලා මම එයාට කිවුවා. බට නළා බිමින් තියපු එයා මාව කන්න වගේ බලන්

Scanned with CamScanner

හිටියා. "ඒත්, මම ආයෙමත් කරදරේක වැටුණොත් ඔයාවත් අනතුරේ වැටෙයි. පර්සි! ඔයාව මැරෙන්න වුණත් ඉඩ තියෙනවා!"

"ඔයා ආයෙමත් කරදරේ වැටුණොත් මට දැනගන්න ඕනෑ. එතකොට ඔයාට උදවු කරන්න මට ආයෙමත් එන්න පුළුවන් නේ, එළි-කොල්ලෝ. ඒක වෙනස් කරන්න මට ඕනෑ නෑ."

අන්තිමේදී සම්බන්ධතාවය කඩා නොදමන්න එයා එකඟ වුණා. එයා ආපහු ස්ට්‍රෝබෙරි පැළවලට වාදනය කරන්න පටන් ගත්තා. ඒක පැළවලට දැනෙන විදිහ තේරුම් ගන්න මට සහකම්පන සම්බන්ධ උවමනා වුණේ නැහැ. පස්සේ, දුනු ශිල්ප පන්තිය වෙලාවේදී මාව පැත්තකට ඇදගෙන ගිය කයිරොන් මෙරිවෙදර් ඉස්කෝලෙ මට තිබුණු ප්‍රශ්න එයා විසඳුව බව කිවුවා. ක්‍රීඩාගාරය වැනසුවාට එයාලා තවදුරටත් මට දොස් කියන්නේ නැලු. පොලිසියෙන් තවදුරටත් මාව හොයන්නෙත් නැලු.

"ඔයා කොහොමද ඒක කළේ?" මම ඇසුවා.

කයිරොන්ගේ ඇස් දිලිසුණා. "එදා ඒ මිනිස්සු දකින්න ඇත්තේ වෙන දෙයක් වෙන්නැති කියලා මම එයාලට නිකං කියලා බැලුවා- උඳුනක් පුපුරන එක ඔයාගෙ වැරැද්දක් නෙවෙයි නේ."

"ඔයා එහෙම කිවුවම එයාලා නිකංම ඒක පිළිගත්ත ද?"

"මම මීදුම මෙහෙයවූවා. කවදාහරි දවසක, ඔයා ලෑස්ති වුණාම, ඒක කරන විදිහ මම ඔයාට පෙන්වන්නම්."

"ඔයා කියන්නේ, මට ලබන අවුරුද්දේ මෙරිවෙදර් ඉස්කෝලෙට යන්න පුළුවන් කියල ද?"

කයිරොන් ඇහිබැම ඉහළට එසවූවා. "ඔහ්, නෑ. එයාලා ඒත් ඔයාව අස් කරලා. ඔයාලගේ විදුහල්පති, මිස්ටර් බොන්සායි කියනවා ඔයාට තියෙන්නේ- කොහොමද එයා ඒක කිවුවේ?- ඉස්කෝලේ අධ්‍යාපනික රැස් මඩල කඩාකප්පල් කරපු කරුමයක්ලු. ඒත් ඔයාට නීතිමය කරදර මොකවත් නැහැ, ඔයාගේ අම්මට නම් ඒක ලොකු සහනයක්. ඔහ්, අම්මා ගැන කියද්දී මතක් වුණේ..."

ඊ කොපුවෙන් ජංගම දුරකථනයක් ගත් එයා ඒක මගේ අතට දුන්නා. "එයාට කතා කරන්න මේක තමයි හොඳම වෙලාව."



පටන් ගැන්ම තමයි නරකම- "පර්සි-ජැක්සන්-ඔයා-මොනවා-කරනවා-කියලද-හිතන්නේ-මම-කොච්චර-බය-වුණාද-කියලා-දන්නවද-අවසර-නැතුව-කඳවුරෙන්-පැනලා-ගිහින්-භයානක-ග වේෂණවලට-ගිහිල්ලා-මාව-මැරෙන්න-බය-කළා-" කොටස. ඒත් අන්තිමේදී එයා හුස්මක් ගන්න නතර වුණා. "ඔහ්, ඔයා පරිස්සමෙන් ආවට මට හරිම සතුටුයි!" ඒක තමයි මගේ අම්මගේ හොඳම දේ. එයට වැඩි වෙලාවක් තරහෙන් ඉන්න බැහැ. එයා ඒකට උත්සාහ කළත්, ඒක එයාගේ ස්වභාවය නෙවෙයි.

"මට සමා වෙන්න, අම්මේ," මම එයාට කිවුවා. "මම ආයෙත් නම් ඔයාව බය කරන්නේ නෑ."

"බැරි දේවල් පොරොන්දු වෙන්නෙපා, පුතේ. ඔයා හොඳටම දන්නව නේ ඒක තවත් නරක අතට හැරෙනවා විතරයි කියලා." වෙනසක් නොපෙන්වා කතා කරන්න එයා උත්සාහ කළත්, අම්මා සැහෙන කම්පනයකින් ඉන්න බව මට තේරුණා.

එයාගේ හිත හැදෙන දෙයක් කියන්න මට ඕනෑ වුණා, ඒත් එයා හරි කියලා මම දන සිටියා. අර්ධ-ලෝහිතයෙක් විදිහට මට කරන්න සිදුවෙන දේවල්වලින් නිතරම එයා බයට පත්වේවි. මම වයසින් වැඩෙද්දී අනතුරුත් ප්‍රබල වේවි.

"මම ටික කාලෙකට ගෙදර එන්නම්," මම යෝජනා කළා.

"නෑ, නෑ. කඳවුරට වෙලා ඉන්න. පුහුණුවීම් කරන්න. ඔයා කරන්න උවමනා දේවල් කරන්න. ඒ වුණාට ලබන අවුරුද්දේ ඉස්කෝලෙ යන්න ඔයා ගෙදර එනවා නේ?"

"ඔව්, අනිවාර්යයෙන්ම. අහ්, මාව බාරගන්න කැමති ඉස්කෝලයක් තියෙනවා නම්."

"ඔහ්, අපි මොකක්හරි හොයාගමු, පැටියෝ," මගේ අම්මා සුසුමක් හෙළුවා. "අපි ගැන තවමත් දන්නැති අය ඉන්න තැනක්."

* * * * * *

ටයිසන් ගැන කියනවා නම්, කඳවුරුකරුවෝ එයාට සැලකුවේ වීරයෙකුට වගෙයි. මගේ කැබින් සගයා විදිහට එයාව සදහටම තියාගන්න මම කැමති වුණා. ඒත් එදා හවස් වරුවේ, ලෝන්ග් අයිලන්ඩ් මුහුදු තීරයට මුහුණලා පිහිටි වැලිපරයක අපි වාඩිවෙලා ඉන්න අතරේ, මාව මුළුමනින්ම පුදුමයට පත් කළ නිවේදනයක් එයා කළා.

"ඊයේ රෑ තාත්තිගෙන් හීනයක් ආවා," එයා කිව්වා. "එයා මට එන්න කිව්වා." එයා විහිළුවක් කරනව ද හිතලා මම පුදුම වුණා. ඒත් ටයිසන් කියන්නේ ඇත්තටම විහිළු කරන්න දන්න කෙනෙක් නෙවෙයි නේ. "පොසෙයිඩන් ඔයාට සිහින පණිවුඩයක් එව්වා?"

ටයිසන් ඔළුව වැනුවා. "ගිම්හානේ ඉතුරු ටික වතුර යට ඉන්න එන්න කිව්වා. සයික්ලොප්ස් කම්මල්වල වැඩ ඉගෙන ගන්න. එයා ඒකට කිව්වේ ආධුක- ආධුනික-"

"ආධුනික පුහුණුවක් ද?"

"ඔව්."

මම ඒක හිතට කාවදින්න ඉඩ ඇරියා. ඇත්තම කියනවා නම්, මට පොඩි ඉරිසියාවක් දැනුණා. පොසෙයිඩන් කවදාවත් මට වතුර යටට ආරාධනා කරලා නැහැ. ඒත් මම ආයෙම ඒ ගැන හිතද්දී, ටයිසන් යන්න යනවා? මෙච්චර ඉක්මනට?

"ඔයා කවද ද යන්නේ?" මම ඇහුවා.

"දැන්."

"දැන්. ඒ කියන්නේ... මේ දැන්?"

"මේ දැන්."

ලෝන්ග් අයිලන්ඩ් වෙරළේ වදින රළ දිහා මම බලා සිටියා. බැස යන ඉර එළියට වතුර රතු පාටින් දිලිසුණා.

"මට ඔයා ගැන සතුටුයි, ලොකු යාළුවා." මම අමාරුවෙන් කියාගත්තා. "ඇත්තටම."

"මගේ අලුත් අයියව දාලා යන්න අමාරුයි," එයා කිව්වේ වෙවුලන හඬින්. "ඒත් මට එක එක දේවල් හදන්න ඕනෑ. කඳවුරට ආයුධ එහෙම. ඔයාට ඒවා ඕනෑ වෙයි."

අවාසනාවකට, එයා කියන්නේ ඇත්ත කියලා මම දැනගෙන සිටියා. කඳවුරේ සියලුම ප්‍රශ්න රන් සළුවෙන් විසඳුනේ නැහැ. ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැවේ හමුදාවක් එකතු කරමින් ලූක් තවමත් ඉන්නවා. ක්‍රෝනොස් රන් මිනී පෙට්ටිය ඇතුළේ ප්‍රතිසංස්කරණය වෙනවා. අවසානයේදී අපිට එයාලට එරෙහිව සටන් කරන්න දවසක් ඒවි.



"ලෝකෙ තියෙන හොඳම ආයුධ ඔයා හදාවි." මම ටයිසන්ට කිව්වා. මම මගේ ඔරලෝසුව ආඩම්බරයෙන් ඔසවා පෙන්නුවා. "මීනෑ ඔට්ටුවක්. ඒවා හොඳ වෙලාවත් පෙන්නාවි."

ටයිසන් නහය ඉහළට ඇද්දා. "සහෝදරයෝ එකිනෙකාට උදවු කරගන්නවා."

"ඔයා තමයි මගේ සහෝදරයා," මම කිව්වා. "ඒකෙ කිසිම සැකයක් නැහැ." එයා මගේ පිටට දාපු තට්ටුවට තව පොඩ්ඩෙන් මම වැලිපරයේ මූණ ඇනගන්නවා. ඊට පස්සේ කම්මුලට වැටුණු කඳුළු බිංදුවක් පිසදාගත් එයා යන්න නැගිට්ටා. "පලිහ හොඳට පාවිච්චි කරන්න."

"මම එහෙම කරනවා, ලොකු යාළුවා."

"කවදාහරි ඔයාගේ ජීවිතේ බේරයි."

හරියටම දන්න දෙයක් කියනවා වගේ එයා ඒක කියපු විදිහට මම පුදුම වුණේ එයාගේ සයික්ලොප්ස් ඇහැට අනාගතය දකින්න පුළුවන් ද හිතිලයි.

වෙරළට ඇවිදගෙන ගිය එයා උරුවම් බැව්වා. රේන්බෝ, හිපොකැම්පස් රළ අතරින් මතුවුණා. ඒ දෙන්නා පොසෙයිඩන්ගේ රාජධානියට ගමන් කරන දිහා මම බලා සිටියා. එයාලා යන්නම ගියාට පස්සේ මම, මගේ අලුත් අත් ඔරලෝසුව දිහා බැලුවා. මම එහි බොත්තම ඔබද්දීම ඒක පලිහේ ප්‍රමාණයට විහිදුණා. ලෝකඩ තුළට කැටයම් කර තිබුනේ පෞරාණික ග්‍රීක කැටයම්වල ආර ගත්, මේ ගිම්හානයේ අපේ වීර චාරිකාවේ චිත්‍රයි. එතැන ලයිස්ට්‍රිගෝනියානු ඩොඩ්ජ්බෝල් ක්‍රීඩකයාව මරා දමන ඇනබෙත්, අර්ධ-ලෝහිත කඳු මුදුනේ ලෝකඩ ගොනා සමග සටන් කරන මම, රේන්බෝගේ පිටේ නැගී ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා වෙතට යන ටයිසන්, කැරිබ්ඩිස්ට කාලතුවක්කු ප්‍රහාර එල්ල කරන සී.එස්.එස්. බර්මින්ග්හැම්- මේ සෑම දර්ශනයක්ම අපූරුවට කැටයම් කර තිබුණා. රාක්ෂ ඩෝනට් පෙට්ටියක් අතේ තියාගෙන හයිඩ්‍රා සමග පොර බදන ටයිසන්ගේ රූපය මතින් මම ඇඟිලි දිවෙව්වා.

හිතට දැනුණු දුක යටපත් කරගන්න මට බැරි වුණා. මුහුදු පතුලේදී ටයිසන්ට අපූරු කාලයක් ගත කරන්න ලැබෙන බව මම දැන සිටියා. ඒත් එයා නැතුව මට ගොඩාක් පාළු වෙයි- අග්වයින්ට එයා දක්වපු ආසාව, එයා කරන්න අලුත්වැඩියා කරන විදිහ, එයාගේ

Scanned with CamScanner

අත් දෙකෙන් ලෝහ නමන විදිහ, නැත්නම් නරක එවුන්ව එයා එකට ගැට ගහන විදිහ. අඩු තරමේ, මුළු රෑ පුරාම භූමි කම්පාවක් වගේ එයා ගොරවන හඬ නැතිවත් මට පාළු හිතෙයි.

"හේයි, පර්සි."

මම හැරිලා බැලුවා.

වැලිපරය මුදුනේ සිටගෙන සිටියේ ඇනබෙත් සහ ග්‍රෝවර්. මං හිතන්නේ ඒ වෙලාවේ මගේ ඇස්වලට වැලි ගිහින් තියෙන්න ඇති, මොකද මම සිටියේ ඕනෑවටත් වඩා ඇහිපිය ගසමින්.

"ටයිසන්..." මම එයාලට කිවුවා. "එයාට යන්න වුණා..."

"අපි දන්නවා." ඇනබෙත් මෘදුව කිවුවා. "කයිරොන් අපිට කිවුවා."

"සයික්ලොප්ස් කම්මල්වලට." ග්‍රෝවර් වෙවුලුවා. "මං අහලා තියෙන්නේ ඒවගේ කෑන්ටිම භයානකයිලු! ඒවගේ එන්චිලඩා ඇත්තෙම නැලු."

ඇනබෙත් අත දිගු කළා. "එන්න යමු, පාසි මොළේ. රෑ කෑම වෙලාව."

ඉස්සර පුරුදු විදිහටම, අපි තුන්දෙනා විතරක්, ආපහු කෑම මණ්ඩපය දෙසට ඇවිදගෙන ගියා.

එදා රෑ කුණාටු හැමුවත්, සුපුරුදු පරිදි ඒක අර්ධ-ලෝහිත කඳවුර වටෙන් බෙදිලා ගියා. ක්ෂිතිජය පුරා විදුලි කොටද්දී, මහා රළ ගෙඩි පෙරළී ඇවිත් වෙරළට තඩිබැවත් අපේ දෙණිබිමට එක වැහි බිඳුවක්වත් වැටුණේ නැහැ. රන් සළුවට ස්තුති වෙන්න, කඳවුරේ මායා බැම් ඇතුළේ නැවතත් අපි ආරක්ෂිතව සිටියා. ඒ වුණත්, මගේ හීන තවමත් කලබලකාරී වුණා. වාටරස් පතුලේ හිඳගෙන ක්‍රෝනොස් මට සරදම් කරන හඬ ඇසුණා: අන්ධ පොලිෆිමස්, එයාගේ ගුහාවේ ඉඳගෙන ඉන්නවා, පුංචි වීරයෝ. එයා හිතන්නේ එයා විශිෂ්ට ජයග්‍රහණයක් ලැබුවා කියලා. තුඹ රැවටිලා ඉන්නෙත් එහෙමයි නේද? ටයිටන්වරයාගේ කුරිරු හිනා හඬින් අන්ධකාරය පිරුණා.

ඊට පස්සේ මගේ හීනය මාරු වුණා. මම ටයිසන්ව ලුහුබඳිමින් මුහුදු පතුලට, පොසෙයිඩන්ගේ මාලිගාවට ගියා. නිල් එළියකින් පිරුණු කාන්තිමත් ශාලාවක් වූ එහි පොළොවට මුතු අල්ලා තිබුණා. කොරල්වලින් සෑදූ රාජාසනයක් මත කාකි කොට කලිසමකින් සහ



අව්වට පාට පිළිස්සුණු ටී-ෂර්ට් එකකින් සැරසී සරල ධීවරයෙක් වගේ මගේ තාත්තා සිටියා. එයාගේ අව්වට පිළිස්සුණු මුහුණ දෙස, එයාගේ ගැඹුරු කොළ පාට ඇස් දෙස මම බලද්දී එයා වචන දෙකක් කිවුවා: පටි තද කරගන්න.

මම ගැස්සිලා ඇහැරුණා.

කවුදෝ මගේ දොරට තඩිබාමින් සිටියා. අවසර ලැබෙන තුරු පමා නොවී ග්‍රෝවර් වේගයෙන් ඇතුළට ආවා. "පර්සි!" එයා ගොත ගැහුවා. "ඇනබෙත්... කන්ද උඩ... එයා..."

එයාගේ ඇස්වල වූ බැල්ම මට කිවුවේ මොකක් හෝ භයානක දෙයක් සිදුවී ඇති බවයි. එදා රෑ රන් සළුව ආරක්ෂා කරන්න මුරට සිටියේ ඇනබෙත්. එයාට මොනවාහරි වෙලා නම්- මම පොරෝනා පැත්තකට තල්ලු කළා. මගේ නහර ඇතුළේ ලේ අයිස්වලට හැරිලා වගෙයි දැනුණේ. මම ඇඳුමකට බහින අතරේ ග්‍රෝවර් සම්පූර්ණ වාක්‍යයක් හදලා කියන්න උත්සාහ කළත්, පුදුමයෙන් කම්පනය වී සිටි එයාට කතා කරන්න හුස්ම මදි වුණා. "එයා එතැන වැතිරිලා ඉන්නවා... නිකංම වැතිරිලා ඉන්නවා..."

කාමරයෙන් පිට පැන්න මම මැද මිදුල හරහා දුවද්දී ග්‍රෝවර් මගේ පස්සෙන්ම ආවා. යාන්තමින් එළිය වැටෙන්න පටන්ගෙන තිබුණත්, ඉරටත් කලින් මුළු කඳවුරම ඇහැරිලා වගෙයි පෙනුණේ. කටින් කට කතාව පැතිරුණා. මොකක්දෝ ලොකු දෙයක් සිද්ධ වෙලා. දැනටමත් කඳවුරුකරුවෝ කීප දෙනෙක් කන්ද මුදුනට යන්න පටන් ගෙන තිබුණා- යුද සන්නාහ සහ පිජාමාවලින් සැරසුණු සැටර්ලා, වන දේවතාවෝ සහ වීරයින්ගෙන් සෑදුමලත් අමුතු සංකලනයක්.

අපිට පිටුපසින් අශ්වයෙකුගේ කුර ගැටෙන ක්ලොප්-ක්ලොප් හඬක් ඇහුණා, ඒත් එක්කම අඳුරු කරගත් මුහුණින් කයිරොන් හැල්මේ එනවා පෙනුණා.

"ඒක ඇත්ත ද?" එයා ග්‍රෝවර්ගෙන් ඇහුවා.

තෝන්තුවෙන් සිටි ග්‍රෝවර් පිළිතුරු ලෙස ඔළුව වැනීමක් විතරක් කළා.

සිද්ධ වෙන්නේ මොනවද අහන්න මම උත්සාහ කළත්, මගේ අතින් අල්ලාගත් කයිරොන් කිසිම අපහසුවක් නැතිව මාව ඔසවා

එයාගේ පිටේ තබාගත්තා. අපි දෙන්නා දනටමත් සෙනඟ රැස්වෙමින් සිටි අර්ධ-ලෝහිත කඳු මුදුනට හැල්මේ ගියා.

පයින් ගහෙන් රන් සළුව අතුරුදහන් වී ඇති ආකාරය දකින්න මම බලාපොරොත්තු වුණා, ඒත් අරුණෝදයෙන් දිලිසෙමින් ඒක තවමත් එතැනම තිබුණා. කුණාටුව තුනී වූ අහස ලේ රතු පාට ගත්තා.

"ටයිටන් රජාට හෙණ ගහපි," කයිරොන් කිවුවා. "එයා අපිව ආයෙමත් රැවැට්ටුවා. දන් අනාවැකිය පාලනය කරන්න එයාට තවත් අවස්ථාවක් තියෙනවා."

"ඔයා මොකක්ද අදහස් කළේ?" මම ඇසුවා.

"රන් සළුව," එයා කිවුවා. "රන් සළුව, ඒකේ වැඩේ ඕනෑවටත් වඩා හොඳට කරලා." අපි ඉදිරියට පිම්මේ යද්දී හැමෝම අපේ පාරෙන් ඉවත් වුණා. ගහ පාමුල ගැහැනු ළමයෙක් සිහිසුන්ව වැතිරී සිටියා. ග්‍රීක සන්නාහයෙන් සැරසුණු තවත් ගැහැනු ළමයෙක් එයා ළඟ දණ ගසාගෙන සිටියා. මගේ කන් ඇතුළේ ලේ ගිගුරුවා. මට කිසිවක් පැහැදිලිව හිතාගන්න බැරි වුණා. ඇනබෙත්ට ප්‍රහාරයක් එල්ල වෙලා ද? ඒත් එහෙනම් රන් සළුව තවමත් මෙතැන තියෙන්නේ ඇයි?

රන් සළුවේ සාරය හාත්පස පැතිරුණු ගහ පිරිපුන්ව සහ නීරෝගීව නැගී සිටියා.

"ඒක ගහ හොඳ කරලා," කයිරොන් කියද්දී එයාගේ හඬට කලබලයක් එකතු වෙලා. "ඒකෙන් විරේක වෙලා තියෙන්නේ වස විතරක් නෙවෙයි."

ඒ වෙලාවේ මට තේරුම් ගියේ බිම වැතිරී ඉන්න කෙනා ඇනබෙත් නෙවෙයි කියලයි. සිහිසුන් ගැහැනු ළමයා ළඟ දණ ගසාගෙන සිටියේ එයායි. අපිව දකපු හැටියේ ඇනබෙත් කයිරොන් ළඟට දුවගෙන ආවා. "ඒක... එයා... එක පාරටම ගහෙන්..."

එයාගේ ඇස්වලින් කඳුළු දෝරේ ගැලුවා, ඒත් මට තවමත් කිසිදෙයක් තේරුම් ගන්න බැහැ. ඒ ගැන අවබෝධ කරගන්න බැරි තරමට මම පුදුම වෙලයි හිටියේ. කයිරොන්ගේ පිටෙන් බිමට පැනපු මම සිහිසුන් ගැහැනු ළමයා දෙසට දුවද්දී කයිරොන් කෑගැහුවා: "පර්සි, ඔහොම ඉන්න!"

මම එයා ළඟ දණ ගසාගත්තා. එයාට කළු පාට කෙටි කොණ්ඩයකුත් ලප විසිරුණු නහයකුත් තිබුණා. දිගු-දුර ධාවකයෙකුගේ



වගේ සුනම්‍ය සහ ශක්තිමත් සිරුරක් තිබුණු එයා රස්තියාදුකාර පෙනුමක් ඇති ඇඳුමෙන්- කළු ටී-ෂර්ට් එකකින්, කඩමාලු වූ කළු කලිසමකින් සහ මම කවදාවත් අහලා නැති සංගීත කණ්ඩායම්වල බොත්තම් පොකුරක් ඇති ලෙදර් ජැකට්ටුවකින් සැරසී සිටියා.

එයා කඳවුරුකාරියක් නම් නෙවෙයි. මෙහෙම කෙනෙක් එක කැබින් එකකවත් සිටියා මට මතක නැහැ. ඒ වුණත් මීට කලින් මම එයාව දකලා තියෙනවා වගේ හැඟීමක් මගේ හිතට වධ දුන්නා...

"ඒක ඇත්තක්," ග්‍රෝවර් කිවුවේ කන්ද උඩට දුව ආ මහන්සියට හති දමමින්. "මට විශ්වාස කරන්නත් බැහැ..." වෙන කවුරුවත් ගැහැනු ළමයා ළඟට ආවේ නැහැ.

මම එයාගේ නළලට අතක් තබා බැලුවා. එයාගේ හම සීතල වී තිබුණත්, මගේ ඇඟිලි පොපියන්න ගත්තේ හරියට ඒවා පිච්චෙනවා වගෙයි.

"එයාට නෙක්ටාරුයි ඇම්බ්‍රෝසියායි ඕනෑ," මම කිවුවා. කඳවුරුකාරියක් වුණත් නැතත් පැහැදිලිවම එයා අර්ධ-ලෝහිතයෙක්. එක ස්පර්ශයකින්ම මට ඒ බව කිවහැකි වුණා. මට නොතේරුණේ හැමදෙනාම මේ තරම් බය වෙලා ඉන්නේ ඇයි කියලයි.

මම එයාව උරහිස්වලින් අල්ලා හිඳි ඉරියව්වකට ඔසවා, එයාගේ ඔළුව මගේ උරහිසේ රඳවා ගත්තා.

"ඉක්මන් කරන්න!" මම අනෙක් අයට මොරදුන්නා. "ඔයාලට මොනවද වෙලා තියෙන්නේ? අපි මෙයාව මහ ගෙදරට අරන් යමු."

කිසිවෙක් සෙලවුණේවත් නැහැ, අඩු තරමේ කයිරොන්වත්. එයාලා හැමෝම හිරාන්තව බලා සිටියා විතරයි.

ඒ වෙලාවේ ගැහැනු ළමයා සැලෙන හුස්මක් ගත්තා. එයා කහිමින් ඇස් ඇරියා.

ඒ ඇස්වල තිබුණේ පුදුමාකාර නිල් පාටක්- විදුලි නිල් පාටක්.

වෙවුලමින් සිටි ගැහැනු ළමයා කලබලෙන් ඇස් ලොකු කරගෙන මගේ දිහා බැලුවා. "කවුද- "

"මම පර්සි," මං කිවුවා. "ඔයාට දන් කරදරයක් නැහැ."

"අමුතුම හීනයක්..."

"ඒකට කමක් නෑ."

"මැරෙනවා."

"නෑ," මම එයාව අස්වැසුවා. "ඔයා හොඳින්. ඔයාගෙ නම මොකක් ද?" ඒ වෙලාවෙදියි මම ඒක දැනගත්තේ. එයා කියන්නත් කලින්ම.

ගැහැනු ළමයාගේ නිල් ඇස් දෙක මගේ ඇස් තුළට කාවදිද්දී, රන් බැටළු ලොම් සළුව ගවේෂණයේ යටි අරුත මට වැටහුණා. ගහට වස කැවූ හේතුව. හැමදෙයක්ම. ක්‍රෝනොස් මෙය කළේ තවත් චෙස් ඉත්තෙක්ව තරගයට ගෙනෙන්නයි- අනාවැකිය පාලනය කරන්න තවත් අවස්ථාවක් ගන්නයි.

අඩු තරමේ කයිරොන්, ඇනබෙත් සහ ග්‍රෝවර්- මේ මොහොත සමරමින් සිටිය යුතු අය- පවා හොඳටෝම කම්පනය වෙලා, කල්පනා කරමින් සිටියේ මෙයින් අදහස් වෙන අනාගතය මොකක් වෙයි ද කියලයි. ඒ වෙලාවේ මම වාරු කරගෙන සිටියේ මගේ හොඳම යාළුවා හෝ තරකම හතුරා වීමට ඉරණම ලියවී තිබුණු කෙනාවයි.

"මම තාලියා," ගැහැනු ළමයා කිවුවා. "සියුස්ගේ දුව."

****

'පර්සි ජැක්සන් සහ ටයිටන්ගේ ශාපයෙන්' හමුවෙමු!

Scanned with CamScanner



පර්සි ජැක්සන් සහ

# රාක්ෂ සයුර

...මගේ ජීවිතේ පළවෙනි වතාවට පිටුවහල් නොවී, මුළු අවුරුද්දක්ම එකම ඉස්කෝලෙක ගත කරන්න මට පුළුවන් වුණා. අද්භූත අනතුරු නැහැ. පන්තියේ වලි දාගන්නෙත් නැහැ. කිසිම ගුරුවරයෙක් රාක්ෂයෙකුට හැරිලා විස දාපු කැපිරිම් කෑමවලින්වත්, පුපුරණ ගෙදර වැඩවලින්වත් මාව මරන්න උත්සාහ කළෙත් නැහැ. හෙට, මම මේ ලෝකෙ ආරක්ෂිතම තැනට - අර්ධ-ලෝහිත කඳවුරට යන්න පිටත් වෙනවා.

නම් එක දවසයි. අනිවාර්යයෙන්ම, ඒක අවුල් කරගන්න මටවත් බැරුව ඇති.

සාමාන්‍යයෙන් වගේම, එදාත් මම හිතුව විදිය නොවෙයි වෙච්චේ. දෙයියනේ මට අවබෝධයක්වත් තිබ්බේ නැහැ...

ආශිර්වාද ප්‍රකාශකයෝ
නො.70, සිරිලක්ෂ පාර, මීරිගම
033 2275419, 033 2276499

ISBN - 978-955-697-073-9
9789556970739
Rs. 550/=